**323 වන කාණ්ඩය - 14 වන කලාපය**
**தொகுதி 323 - இல. 14**
**Volume 323 - No. 14**

**2025 දෙසැම්බර් 03වන බදාදා**
**2025 டிசம்பர் 03, புதன்கிழமை**
**Wednesday, 03rd December, 2025**

# පාර්ලිමේන්තු විවාද
**(හැන්සාඩ්)**

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඉස්මායිල් මුත්තු මුහම්මදු මහතාගේ ඉල්ලා අස්වීම [තීරුව 2451]

**විගණකාධිපතිවරයාගේ වාර්තාව** [තීරුව 2452]

**රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව** [තීරුව 2454]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 2459-2470]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

දෙමළ රජවරුන්ගේ ඉතිහාසය පාසල් විෂය මාලාවට ඇතුළත් කිරීම [තීරුව 2470]

**ගරු රවී කරුණානායක මහතාගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම** [තීරුව 2474]

**විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත:**

පළමුවන වර කියවන ලදී [තීරුව 2475]

**වරප්‍රසාද යෝජනා:**

2025.11.10 දින ගරු සුජීව සේනසිංහ මහතා විසින් කරන ලද ප්‍රකාශය [තීරුව 2476]

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා විසින් 2025.11.21 දින ඉදිරිපත් කළ ලිපිය මඟින් මතු කරන ලද වරප්‍රසාද සම්බන්ධ කරුණු [තීරුව 2476]

**විසර්ජන පනත් කෙටුම්පත, 2026 - [දහනවවන වෙන් කළ දිනය]:**

[ශීර්ෂ 116, 295, 297-302 (වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන); ශීර්ෂ 135, 293, 337 (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම්); ශීර්ෂ 102, 237-252, 280, 296, 323, 324, 329, 333, 338 (මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන)] - කාරක සභාවේදී සලකා බලන ලදී - විවාදය කල් තබන ලදී [තීරු 2478-2653]

**පරිපූරක ඇස්තමේන්තුව: "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් ආපදාවට ලක් වූ ජනතාවට සහන** [තීරුව 2654]


# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புகள்:**

பாராளுமன்ற உறுப்பினர் மாண்புமிகு இஸ்மாயில் முத்து மொஹம்மட் அவர்களது இராஜினாமா [ப: 2451]

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை** [ப: 2452]

**அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை** [ப: 2454]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 2459-2470]

**தனி அறிவித்தல் மூல வினா:**

பாடசாலைப் பாடத் திட்டத்தில் தமிழ் மன்னர்களின் வரலாறுகளை உள்ளடக்குதல் [ப: 2470]

**மாண்புமிகு ரவி கருணாநாயக்கவினது சொந்த விளக்கம்** [ப: 2474]

**பல்கலைக்கழகங்கள் (திருத்தம்) சட்டமூலம்:**

முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 2475]

**சிறப்புரிமைப் பிரேரணைகள்:**

10.11.2025 அன்று மாண்புமிகு சுஜீவ சேனசிங்ஹவால் தெரிவிக்கப்பட்ட கூற்று [ப: 2476]

மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா அவர்களால் 2025.11.21ஆம் திகதி சமர்ப்பிக் கப்பட்ட கடிதத்தின்மூலம் எழுப்பப்பட்ட சிறப்புரிமை பற்றிய விடயம் [ப: 2476]

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2026 - [ஒதுக்கப்பட்ட பத்தொன்பதாம் நாள்]:**

[தலைப்புக்கள் 116, 295, 297-302 (வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி); தலைப்புக்கள் 135, 293, 337 (பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள்); தலைப்புக்கள் 102, 237-252, 280, 296, 323, 324, 329, 333, 338 (நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி)] - குழுவில் ஆராயப்பட்டது - விவாதம் ஒத்திவைக்கப்பட்டது [ப: 2478-2653]

**குறைநிரப்பு மதிப்பீடு: 'தித்வா' புயலால் பாதிப்புற்றவர்களுக்கான நிவாரணம்** [ப: 2654]


# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:

Resignation of Hon. Ismail Muththu Mohamed, Member of Parliament [Col. 2451]

AUDITOR-GENERAL'S REPORT [Col. 2452]

PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 2454]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 2459-2470]

QUESTION BY PRIVATE NOTICE:

Inclusion of History of Tamil Kings in School Curriculum [Col. 2470]

PERSONAL EXPLANATION BY HON. RAVI KARUNANAYAKE [Col. 2474]

UNIVERSITIES (AMENDMENT) BILL:

Read the First time [Col. 2475]

PRIVILEGE MOTIONS:

Remark Made by Hon. Sujeewa Senasinghe on 10.11.2025 [Col. 2476]

Matters of Privilege Raised by Hon. (Dr.) Ramanathan Archchuna through Letter Dated 21.11.2025 [Col. 2476]

APPROPRIATION BILL, 2026 - [Nineteenth Allotted Day]:

Considered in Committee - [Heads 116, 295, 297-302 (Trade, Commerce, Food Security and Co-operative Development); Heads 135, 293, 337 (Plantation and Community Infrastructure); Heads 102, 237-252, 280, 296, 323, 324, 329, 333, 338 (Finance, Planning and Economic Development)] - Debate Adjourned [Cols. 2478–2653]

SUPPLEMENTARY ESTIMATE: RELIEF FOR PERSONS AFFECTED BY CYCLONE "DITWAH" [Col. 2654]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2025 දෙසැම්බර් 03වන බදාදා***
*2025 டிசம்பர் 03, புதன்கிழமை*
*Wednesday, 03rd December, 2025*

**පූ.භා. 9.00ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.00 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඉස්මායිල් මුත්තු මුහම්මදු මහතාගේ ඉල්ලා අස්වීම
### பாராளுமன்ற உறுப்பினர் மாண்புமிகு இஸ்மாயில் முத்து மொஹம்மட் அவர்களது இராஜினாமா
RESIGNATION OF HON. ISMAIL MUTHTHU MOHAMED, MEMBER OF PARLIAMENT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඉස්මායිල් මුත්තු මුහම්මදු මහතා සිය පාර්ලිමේන්තු මන්ත්‍රී ධූරයෙන් ඉල්ලා අස්වීමේ ලිපිය පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරිය වෙත භාර දී ඇති බවත්, ඒ අනුව දසවැනි පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ධූරයක පුරප්පාඩුවක් ඇති වූ බවත් පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි.

එම ලිපිය දැන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරිය විසින් කියවනු ලැබේ.

***අනතුරුව පහත සඳහන් ලිපිය පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් කියවන ලදී:***
*அதன்பிறகு, செயலாளர் நாயகம் பின்வரும் கடிதத்தை வாசித்தார்:*
*Whereupon the Secretary-General of Parliament read the following letter:*

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
**PARLIAMENT**

"
28.11.2025

**The Secretary General of Parliament**
**Parliament of Sri Lanka**
**Sri Jayewardenepura Kotte**

Dear Secretary General,

**Resignation from the Position of Member of Parliament**

I hereby tender my resignation as a Member of Parliament of the Democratic Socialist Republic of Sri Lanka, appointed through the National List of the Samagi Jana Balawegaya (SJB), with immediate effect.

I wish to place on record my sincere gratitude to the Hon. Speaker, the Secretary General, the staff of Parliament, and my fellow Members of Parliament for the support extended to me during my tenure.

Kindly take the necessary steps to formalize this resignation lawfully..

Thank you.
Yours faithfully,

**Ismail Mutthu Mohamed,**
**Member of Parliament** "

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXXI හා XXXII කොටස්, තෙවැනි කාණ්ඩයේ XXI කොටස සහ නවවැනි කාණ්ඩයේ XVIII හා XIX කොටස් මම ඉදිරිපත් කරමි.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතු ය" යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## II

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දසවැනි කාණ්ඩයේ ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ - NIBM - පරිපාලිත සමාගමක් ලෙස පැවති ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව විද්‍යායතනය - NSBM - ඇපයෙන් සීමිත සමාගමක් ලෙස පරිවර්තනය කිරීමේ ක්‍රියාවලියේ අවිධිමත්භාවය හා එහි බලපෑම සම්බන්ධයෙන් සිදු කරන ලද විශේෂ විගණන වාර්තාව මම ඉදිරිපත් කරමි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතු ය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the Regulations made by the Minister of Finance, Planning and Economic Development under Section 71 of the Value Added Tax Act, No. 14 of 2002 regarding the Management of the Value Added Tax Refund Fund and published in Gazette Extraordinary No. 2460/44 of 31st October, 2025.

I move that these Regulations be referred to the Committee on Public Finance.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

- Proclamation made and published in Gazette Extraordinary No. 2464/29 of 28th November, 2025 and Schedule thereto, by virtue of the powers vested with the President in terms of Section 2 of the Essential Public Services Act, No. 61 of 1979; and
- Note on Supplementary Allocations from the Development Activities Programme appearing under Expenditure Head No. 240 of the Department of National Budget for the period from 01.10.2025 to 31.10.2025 in terms of Section 6(1) of the Appropriation Act, No. 3 of 2025. - [The Hon. (Dr.) Harini Amarasuriya]

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023/2024 වර්ෂය සඳහා සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

Hon. Speaker, I present the Report on the submission of observations and steps taken in terms of the Standing Order No. 119(4) of the Parliament with regard to the matters mentioned on the Department of Samurdhi Development in the report of the Committee on Public Accounts, which was presented to Parliament.

I move that this Report be referred to the Committee on Public Accounts.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු (ආචාර්ය) හර්ෂද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Hon. Speaker, I present the Report of the Committee on Public Finance on the -

- Citizens Budget - National Budget 2026;
- Key Expenditure Components by Ministry - Budget Estimates - 2026;

- Budget, Economic and Fiscal Position Report - 2026;
- Mid-Year Fiscal Position Report 2025;
- Tax Expenditure Statement - 2024/2025;
- Medium-Term Debt Management Strategy 2026-2030 and Annual Borrowing Plan - 2026;
- Major Public Investment Projects - 2026/2028;
- Cadre Information Public Sector - 2025;
- Regulations under Section 71 read with Section 52 of the Colombo Port City Economic Commission Act, No. 11 of 2021;
- Rules under Section 32 read with Section 25 of the Excise Ordinance (Chapter 52) regarding Excise License Fees;
- Regulations under Section 20 read with Sections 4 (1) and 14 of the Imports and Exports (Control) Act, No. 1 of 1969 as amended by Acts, No. 48 of 1985 and No. 28 of 1987 (Published in Gazette Extraordinary No. 2458/43 dated 15th October, 2025);
- Supplementary Estimate No. 4 of 2025, Head 243 - Programme 01 for the financial year commencing on 1st January, 2025 and ending on 31st December, 2025 under the Ministry of Finance, Planning and Economic Development;
- Strategic Development Projects (Amendment) Bill;
- Regulations under Section 20 read with Sections 4 (1) and 14 of the Imports and Exports (Control) Act, No. 1 of 1969 as amended by Acts, No. 48 of 1985 and No. 28 of 1987 (Published in Gazette Extraordinary No. 2459/46 dated 24th October, 2025);
- Order under Sections 2 and 5 of the Special Commodity Levy Act, No. 48 of 2007 relating to Special Commodity Levy;
- Resolution under Section 10 of the Customs Ordinance (Chapter 235) relating to Import Duties (Published in Gazette Extraordinary No. 2457/06 dated 09th October, 2025);
- Resolution under Section 10 of the Customs Ordinance (Chapter 235) relating to Import Duties (Published in Gazette Extraordinary No. 2461/40 dated 07th November, 2025);
- Regulation under Section 6 of the Value Added Tax Act, No. 14 of 2002, as amended by the Value Added Tax (Amendment) Act, No. 19 of 2019 relating to the value of goods imported; and
- Order under Section 3(3) of the Ports and Airports Development Levy Act, No. 18 of 2011,
- which were referred to the said Committee.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න.

ගරු කථානායකතුමනි, ඔබතුමා විශ්වාස කරනවා නම් විශ්වාස කරන්න, අපේ කමිටුව අද රැස් වෙන්නේ 50වැනි වතාවට. අපි public holidaysවලත් රැස් වුණා. ගරු අගමැතිතුමිය කමිටුවට ඉදිරිපත් කළා, හදිසි ප්‍රශ්නයක්. අපි ඒක සාකච්ඡාවට ගන්නවා. අපි ඒක හෙටම සාකච්ඡාවට අරගෙන ඔබතුමන්ලාට හෙටම සම්මත කරලා දෙනවා. ඒක කැබිනට් මණ්ඩලයෙන් පාස් කරන්න. කිසි අවුලක් නැහැ.

අද අපේ කමිටුව ආයෙත් කථා කළා. NMRA එකේ registration waiver එක සම්බන්ධයෙන් රැස්වෙලා තිබෙන්නේ සැප්තැම්බර් මාසයේ 09වෙනි දා. අපට පෙරේදා කථා කරලා කියනවා, හෙටට කලින් approve කරලා ඕනෑ කියලා. සැප්තැම්බර් මාසයේ 09වෙනි දා ඉඳන් අද වෙනකම් ඒ ප්‍රශ්නය තියෙනවා. අපි අවුරුද්දක් තිස්සේ ඉල්ලුවා. එක consultant කෙනයි ඉන්නේ. තව juniorsලා දෙන්නෙක් ඉන්නවා. ඒ juniorsලා දෙන්නාගේ පඩිත් හරියට ගෙවෙන්නේ නැහැ. ඉතින් කොහොමද වැඩ කරන්නේ?

Parliamentary Budget Office එකක් ඉල්ලලා, ඒකට allocation තිබෙන්නේ රුපියල් මිලියන 9යි. අපි වැඩ කරන්න සූදානම්. අපට ඒවාට අමතර පඩි ගෙවන්නේවත්, වාහන දෙන්නේවත්, staff දෙන්නේවත් ඒ මොකක්වත් නැහැ. අපි සම්පූර්ණයෙන් ස්වේච්ඡාවෙන් මේ වැඩේ කරන්නේ. රෑ 12.00, 1.00 විතර වෙනකම් අපි ඒ වැඩ කරනවා; අවුලක් නැහැ. හැබැයි කරුණාකරලා ඔබතුමන්ලාගේ සහයෝගය අපට දෙන්න. පණස් වතාවක් අපි රැස් වුණා.

අපි foreign delegations, World Bank, IMF, US Congress එක හම්බ වුණා. ඊට පස්සේ seminars කළා. Bills 10ක්, Orders17ක්, Regulations 28ක්, Reports 22ක්, Notifications 6ක්, Rules 3ක්, Resolutions 5ක්, Work Programmes 2ක්, Budget Estimates 2ක්, Supplementary Estimates 5ක් ගැන කටයුතු කළා ඒ වාගේ ඉදිරිපත් කරන නොයෙකුත් Regulations අපි pass කළා. Oversight reviews කළා, performance reviews කළා, Central Bank එක තුන් පාරක් හම්බ වුණා. ඊට පස්සේ Budget එකට අදාළ විශේෂ වාර්තා ඉදිරිපත් කළා. What I am saying, Hon. Speaker, is that we are happy to do those, but we need the support of Parliament to carry out the work. වෙනත් එකම කමිටුවක්වත් පණස් වතාවක් රැස් වෙලා නැහැ. අපි ආණ්ඩුවේද විපක්ෂයේද කියලා නැහැ, සියලු ගරු මන්ත්‍රීතුමන්ලා ඉතාම ඕනෑකමින් සම්බන්ධ වෙනවා මේ වැඩේට. ඒක මම කියන්න කැමැතියි. අපි කිසිම දේශපාලන භේදයකින් තොරව මේ කටයුත්ත කරගෙන යනවා. ඒ නිසා මම නැවත වාරයක් ඉල්ලනවා, ඊළඟ වතාවේ මට ආයෙත් මේක කියන්න නම් ඉඩ තියන්න එපා කියලා. ඒක තමයි මට කියන්න අවශ්‍ය වුණේ.

ගරු කථානායකතුමනි, අනෙක් කාරණය මේකයි. අපට ඕනෑ නම් මේවා "ටක්" ගාලා පාස් කරන්න පුළුවන්. අපි එහෙම කරන්නේ නැහැ. ඔබතුමා ඒක හොඳටම දන්නවා. අපි ඒවා study කරනවා; අපේ system එකක් තිබෙනවා. අලුතින් ආපු Consultant සහ Assistantsලා දෙදෙනා කමිටුවේ සෑම මන්ත්‍රීවරයෙකුටම ඒ තොරතුරු ලබා දෙනවා. ඒ වාගේම ඒවා study කරනවා.

මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. සමහරු මේ කමිටුවට එන්නේ නැහැ. ගරු චතුරංග අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමා මෙතැන ඉන්නවා. එතුමා කමිටුව රැස්වන හැම දිනයකම එනවා. ගරු නිශාන්ත ජයවීර නියෝජ්‍ය ඇමතිතුමා

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

කමිටුව රැස්වන හැම දිනයකම එනවා. ගරු විජේසිරි බස්නායක මන්ත්‍රීතුමා කමිටුව රැස්වන හැම දිනයකම එනවා. හැබැයි, කවුරු හරි එන්නේ නැත්නම් ඉවත් වෙලා, මේවාට සහභාගි වෙන අයට එන්න ඉඩ දෙන්න කියන්න. මොකද, එහෙම නැතුව මේ Committee එක කරගෙන යන්න බැහැ. තුන්වතාවක් ආවේ නැත්නම්, ගරු කථානායකතුමා, එතුමන්ලා ඉවත් කරලා දමන්න.

මම තව දෙයක් කියන්න ඕනෑ. මම වාර්තා 20ක් විතර ඉදිරිපත් කළා. එකක් ගැන කියන්නම්. වාහන 900ක් විතර හිර වෙලා තිබෙනවා, third country ඒවා. ඒ පිළිබඳ වාර්තාව අද අපි ඉදිරිපත් කළා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අවසන් කරන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මම ඒක ගැන විතරයි කියන්නේ. මම වාර්තා 20ක් විතර ඉදිරිපත් කළා. ඒවා debate එකකින් තොරව ගන්නේ. ඒ නිසා මට මේක ගැන විතරක් පැහැදිලි කරන්න ඉඩ දෙන්න. මාස දෙකකට විතර කලින් අපි Sri Lanka Customs එකට කිව්වා, මේවා re-export කරන්න එපා. මේවාට irrevocable LCs තිබෙන්නේ, ඒ නිසා වෙන ක්‍රමයක් හොයා ගන්න කියලා. ඒ අයගෙන් additional බද්දක් හෝ අය කරලා ඒවා release කරන්න කිව්වා. අවසානයේදී ඊයේ තීරණයක් ගත්තා වැඩිපුර බද්දක් අය කරලා release කරන්න. ගරු ඇමතිතුමා අහගෙන ඉන්නවා. ඔළුව වනලා ඒක පිළිගන්නවා. හැබැයි, ගරු කථානායකතුමනි, අපි ගරු ඇමතිතුමාට suggestion එකක් දෙනවා. ඒ තමයි, ඒ importersලා cash ගෙව්වා නම්, වාහනය release කරගෙන ගිහිල්ලා register කර ගන්න පුළුවන්. හැබැයි, Imports and Exports Control Department එකෙන් නීතියක් දමලා තිබෙනවා. ඒ නිසා irrevocable bank guarantee එකක් දුන්නත්, ඒ අයට ඒක register කර ගන්න බැහැ.

ඉතින් අපේ කාරක සභාවෙන් ගරු ඇමතිතුමාට ඊයේ හැන්දෑවේ යෝජනාවක් ඉදිරිපත් කළා, එහෙම නම් bank guarantee එක encash කරනකොට ඒකට අදාළ interest එකක් එකතු කරන්න කියලා. මා හිතන හැටියට release කරපු වාහන 17ක්ද කොහේද තමයි cash ගෙවලා තිබෙන්නේ. තව අටසිය හැත්තෑ ගණනක් තිබෙනවා release කරන්න. ඒ අයට cash ගෙවන්න පුළුවන් නම් ඒ cash ගන්න. Cash ගෙවන්න බැරි නම් bank guarantee එකක් අරගෙන ඒකට interest component එකක් add කරන්න. එතකොට ඒ වාහන 900ම release කර ගන්න පුළුවන්. ගරු කථානායකතුමනි, මම මේ කථාව කිව්වේ ඇයි කියලා ඔබතුමාත් දන්නවා.

එහෙම නම්, අපේ කමිටුවට අවශ්‍ය සහයෝගය ලබා දෙන්න කියලා මම පාර්ලිමේන්තුවෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.
බොහොම ස්තුතියි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවේ ඉතාම වැදගත් කාර්යභාරයක් කරන කාරක සභාවක්. එම කාරක සභාවේ සාමාජිකයන් වශයෙන් ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ මන්ත්‍රීවරු රාශියක් ඉන්නවා. කුමන දේශපාලන එදිරිවාදිකම් අපට එරෙහිව සිදු කළත්, අපි මීට කලිනුත් එම කාරක සභාවේ කටයුතු අගය කරලා තිබුණා. නමුත්, නිශ්චිත වශයෙන් ගත්තොත්, ඔය උපදේශකයන් පිළිබඳ කාරණය ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා හැම විටම මතු කර තිබෙනවා. ඒ උපදේශකයන් පිළිබඳව තීන්දුවක් ගත්තා. මොකද, ඔවුන් බඳවා ගන්න advertise කරද්දී, ඊට අදාළව පැවැති චක්‍රලේඛයේ අඩු වැටුප් තල තිබුණේ. ඊට පසුව අපි ගරු කථානායකතුමා මුලසුන දරන Staff Advisory Committee එකේදී ඒ අයගේ වැටුප් වර්තමාන තත්ත්වයට ගැළපුවා. ඒ අනුව, දැන් වැටුප් වැඩි කරලායි තිබෙන්නේ. එම නිසා ඒ උපදේශකයන් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම, අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලාත් එම කාරක සභාවට උපරිම වශයෙන් සම්බන්ධ වන බව අපට පෙනෙනවා. මා හිතනප විධියට, කාරක සභාවක් එසේ කටයුතු කළ යුතුයි. මොකද, පාර්ලිමේන්තුව අප කාටත් - ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය කියන දෙපැත්තටම - අයිති තැනක්. නිශ්චිත වශයෙන් මට කියන්න තිබෙන්නේ ඒ උපදේශකයන්ට අලුත්ම වැටුප් තල අනුව වැටුප් ගෙවා තිබෙන බවයි.

වාහන සම්බන්ධයෙන් ගත්තොත්, එතැන යම්කිසි තාක්ෂණික ගැටලුවක් තිබෙනවා. ඇත්තටම එය ඒ උපදේශකයන් විසින් නිරාකරණය කර ගත යුතු ඉතාම සරල කරුණක්. එය නිරාකරණය කර ගත්තාට පසුව ඒ වාහනත් ලබා දෙන්න අපට පුළුවන්. ඒක පාර්ලිමේන්තුවේ හෝ ආණ්ඩුවේ ප්‍රශ්නයක් නොවෙයි. COPE එක, Committee on Public Accounts ඇතුළු හැම කාරක සභාවක්ම මහන්සි වෙලා වැඩ කරනවා. මහන්සි වෙලා වැඩ කරන්න ඕනෑ. ඒ ගැන ඒ කාරණා ටික තමයි මට කියන්න තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මහජන පෙත්සම් පිළිගැන්වීම.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු කථානායකතුමනි, මට තත්පර 30ක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේක විවාදයක් කර ගන්න බැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
විවාදයකට යනවා නොවෙයි, ගරු කථානායකතුමනි. Sir, give me 30 seconds, please. මම කරදර කරන කෙනෙක් නොවෙයි නේ. මට තත්පර 30ක් දෙන්න, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, කියන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Thank you.

මම ගරු සභානායකතුමාගේ පිළිතුර අගය කරනවා. ඒ වාහන අපට නොවෙයි. ඒ වැඩ කරන උපදේශකයන්ටයි. එතුමන්ලාගේ ඒ ප්‍රශ්නය විසඳා දෙන්න කියා මා ඉල්ලා සිටිනවා. මොකද, ඒක අමාරු කාර්යයක් නොවෙයි. එච්චරයි මා ඉල්ලා සිටින්නේ. අපට වාහන අවශ්‍යත් නැහැ; අපට දීලාත් නැහැ.

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු ධර්මප්‍රිය දිසානායක මහතා**
(மாண்புமிகு தர்மப்பிரிய திசாநாயக்க)
(The Hon. Dharmapriya Dissanayake)
ගරු කථානායකතුමනි, වැල්ලව, හඳමාගම යන ලිපිනයෙහි පදිංචි විජේසිංහ වීරසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுவைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petition ordered to be referred to the Committee on Public Petitions.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, අද දවසේ ඉදිරි වැඩ කටයුතුවලට යන්නට පෙර මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. අයහපත් කාලගුණය හේතුවෙන් මේ මොහොත වන විට සිදුව ඇති දරුණු ඛේදවාචකය නිසා අපේ රටේ පුරවැසියෝ විශාල පිරිසක් ජීවිතක්ෂයට පත් වෙලා සිටිනවා. ඒ අයට ගෞරව කිරීමක් හැටියට මේ උත්තරීතර සභාවේ පක්ෂ, විපක්ෂ සියලුදෙනා එකතු වෙලා අඩුම තරමින් විනාඩියක නිහඬතාවක් පවත්වමු.

***[ඊට අනුකූලව විනාඩියක නිශ්ශබ්දතාවක් පවත්වන ලදී.]***
*[அதன்படி, ஒரு நிமிடம் மௌனம் அனுஷ்டிக்கப்பட்டது.]*
*[Whereupon one-minute silence was observed.]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න.

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1 -1087/2025- (1), ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

### එළුවතිව් දූපතේ සරවනබාව විද්‍යාලයේ සාමාන්‍ය පෙළ අයදුම්කරුවන්: විභාග මධ්‍යස්ථානය
### எழுவைதீவு சரவணபவா வித்தியாலய க.பொ.த. சாதாரண தர பரீட்சார்த்திகள்: பரீட்சை நிலையம்
### O/L APPLICANTS OF SARAWANABAWA VIDYALAYA, ELUVAITIVU ISLAND: EXAMINATION CENTRE

1183/2025

**2. ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) යාපනය දිස්ත්‍රික්කයේ, එළුවතිව් දූපතේ ඇති රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;
(ii) එළුවතිව් දූපතේ ඇති සරවනබවා විද්‍යාලයේ සිසුන් එම විද්‍යාලයේම පිහිටුවන ලද විභාග මධ්‍යස්ථානයේම අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට අවසාන වරට පෙනී සිටි වර්ෂය කවරේද;
(iii) ඉහත විද්‍යාලයේ සිසුන් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට මේ වන විට පෙනී සිටින විභාග මධ්‍යස්ථානය කවරේද;
(iv) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය එළුවතිව් දූපතේ පැවැත්වීමට ඇති බාධා කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) யாழ்ப்பாண மாவட்டத்தின் எழுவைதீவிலுள்ள அரசாங்கப் பாடசாலைகளின் எண்ணிக்கை எத்தனை என்பதையும்;
(ii) எழுவைதீவிலுள்ள சரவணபவா வித்தியாலயத்தின் மாணவர்கள் மேற்படி வித்தியாலயத்திலேயே அமைக்கப்பட்ட பரீட்சை நிலையத்தில் கடைசியாக எந்த ஆண்டில் க.பொ.த. (சாதாரண தரம்) பரீட்சைக்குத் தோற்றினார்கள் என்பதையும்;
(iii) மேற்படி வித்தியாலயத்தின் மாணவர்கள் தற்போது க.பொ.த. (சாதாரண தரம்) பரீட்சைக்குத் தோற்றும் பரீட்சை நிலையம் யாது என்பதையும்;
(iv) எழுவைதீவில் க.பொ.த. (சாதாரண தரம்) பரீட்சையை நடாத்துவதிலுள்ள தடைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House the -
(i) number of government schools on Eluvaitivu Island in the Jaffna District;
(ii) year in which the students of Sarawanabawa Vidyalaya on Eluvaitivu Island last sat for the GCE (Ordinary Level) Examination at the same examination centre established at that school;

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

(iii) name of the examination centre in which the students of the above-mentioned school are sitting for the GCE (Ordinary Level) Examination at present; and

(iv) obstacles to holding the GCE (Ordinary Level) Examination on the Eluvaitivu Island?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Hon. Speaker, the Answer is as follows:

(a) (i) There are two government schools on the Island of Eluvaitivu in the Jaffna District.

(ii) There has been a school called Sarawanabawa College on the Island of Eluvaitivu since 1999. It has not been designated as an examination centre.

(iii) The students who sit for the G.C.E. (Ordinary Level) Examination from the above school go to the examination centre at St. Anthony's College in Kayts to sit for their examinations.

(iv) The main reason for not declaring this school an exam centre is because of the low number of students. Sir, I can present their numbers.

| Year | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| Number of applicants | 19 | 18 | 19 | 9 | 13 | 8 | 9 | 10 | 8 | 5 |
| Number of people who sat for the exam | 19 | 18 | 18 | 9 | 13 | 8 | 9 | 10 | 8 | 5 |

Since 2015, there has been a decline in the number of students appearing for G.C.E. (Ordinary Level) Examination from the school. In 2022, there were 10 students, in 2023, there were eight students and in 2024, there were five students who applied to sit for the G.C.E. (Ordinary Level) Examination. That was the number of students who sat for the G.C.E. (Ordinary Level) Examination. For such a low number, we generally do not declare the school an examination centre. They are sent to the closest exam centre in Kayts.

(b) Does not arise.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ பிரதம அமைச்சர் அவர்களே, நீங்கள் சொன்னதுபோல, இந்தத் தீவிலுள்ள மாணவர்கள் ஊர்காவற்றுறை அந்தோனியார் வித்தியாலயத்துக்கு வந்துதான் பரீட்சை எழுதவேண்டும். அவர்கள் அங்கு வந்து தங்கியிருந்து பரீட்சை எழுதுவதில் பல்வேறு நெருக்கடிகளைச் சந்திக்கிறார்கள். எனவே, பரீட்சைக் காலங்களில் அவர்கள் வள்ளங்களில் வந்து போகக்கூடியவாறு விசேட போக்குவரத்து ஏற்பாட்டைச் செய்ய முடியுமா? என்பதை என்னுடைய முதலாவது மேலதிக வினாவாகக் கேட்கின்றேன்.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Certainly, Sir. If there is a need for better transport support for those students to travel to Kayts, we will look into it.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ பிரதம அமைச்சர் அவர்களே, நீங்கள் பிரதேச செயலாளர் மற்றும் அரசாங்க அதிபரின் உதவியை நாடி, பரீட்சை இடம்பெறும் காலப்பகுதியில் அந்த மாணவர்களுக்குச் சிறப்பானதோர் ஏற்பாட்டைச் செய்து கொடுக்கவேண்டும். அதற்கான வழிமுறை - mechanism ஒன்றை உருவாக்க முடியுமா? என்பதை என்னுடைய இரண்டாவது மேலதிக வினாவாகக் கேட்கின்றேன்.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Certainly, we will do so.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 3 -1219/2025- (1), ගරු සුරංග රත්නායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 4 -1317/2025- (1), ගරු කේ. කාදර් මස්තාන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 5 -1475/2025- (1), ගරු රොෂාන් අක්මීමන මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

## පෞද්ගලික අධ්‍යාපන ආයතන: නියාමනය
தனியார் கல்வி நிறுவனங்கள்: ஒழுங்குறுத்தல்
PRIVATE EDUCATION INSTITUTIONS: REGULATION

1087/2025

**1. ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා (ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා වෙනුවට)**
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன் - மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம் சார்பாக)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan on behalf of the Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පාසැල් අධ්‍යාපනයට සමගාමීව පෞද්ගලික අධ්‍යාපන ආයතනද අධ්‍යාපන සංවර්ධනයට සැලකිය යුතු දායකත්වයක් ලබා දෙන බවත්;

(ii) ඒවා නියාමනය කිරීම සඳහා නීතිමය යන්ත්‍රණයක් නොමැති වීමෙන් ගැටලු රාශියක් පැනනැඟී ඇති බවත්;

(iii) පෞද්ගලික අධ්‍යාපන ආයතනවලින් ලබා දෙන අධ්‍යාපනයේ ගුණාත්මකභාවය, ගුරුවරුන්ගේ අධ්‍යාපන මට්ටම, යටිතල පහසුකම්වල ගුණාත්මකභාවය සහ මූලික සෞඛ්‍ය පහසුකම් ආදිය සම්බන්ධයෙන් නිසි අවධානයක් යොමු නොවන බවත්;

එතුමිය පිළිගන්නේද?

(ආ) (i) එසේ නම්, මේ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(ii) ඒ සඳහා ගත වන කාලය කොපමණද;

යන්න එතුමිය සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) பாடசாலைக் கல்விக்கு இணையாகத் தனியார் கல்வி நிறுவனங்களும் கல்வியின் வளர்ச்சிக்குக் குறிப்பிடத்தக்களவு பங்களிப்புச் செய்கின்றன என்பதையும்;

(ii) அத்தகைய நிறுவனங்களை ஒழுங்கு படுத்துவதற்குச் சட்டரீதியான பொறிமுறை ஒன்று இல்லாமையால் பல பிரச்சினைகள் தோன்றியுள்ளன என்பதையும்;

(iii) தனியார் கல்வி நிறுவனங்களால் வழங்கப்படும் கல்வியின் தரம், ஆசிரியர்களின் கல்வி மட்டம், உட்கட்டமைப்பு வசதிகளின் தரம் மற்றும் அடிப்படைச் சுகாதார வசதிகள் என்பன தொடர்பில் உரிய கவனம் செலுத்தப் படுவதில்லை என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) (i) ஆமெனில், இவை தொடர்பில் மேற்கொள்ளப் படவுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(ii) இதற்கு எவ்வளவு காலம் எடுக்கும் என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she admit that -

(i) private education institutions, alongside school education, play a considerable contribution in educational development;

(ii) the lack of a legal mechanism to regulate those institutions has led to numerous issues; and

(iii) insufficient attention is given to the quality of education provided, the educational standards of teachers, the quality of infrastructure facilities and the availability of basic health facilities at private education institutions?

(b) Will she state -

(i) if so, the actions that will be taken in that regard; and

(ii) the time frame within which such actions will be implemented?

(c) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**

(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)

(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා සභාගත* කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:**

**சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

**Answer tabled:*

(අ) (i), (ii), (iii) සහ

(ආ) (i), (ii) - අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් පෞද්ගලික අධ්‍යාපන ආයතන දැනට නියාමනය නොකරන අතර, පෞද්ගලික අධ්‍යාපන ආයතන නියාමනයට අදාළ ප්‍රතිපත්තිය සකස් කිරීම ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වෙත පවරා ඇත. ඒ අනුව එම ප්‍රතිපත්තිය සකස් කිරීමෙන් පසු මේ සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග සිදු කළ හැකිය.

(ඇ) අදාළ නොවේ.

## කිරි ගොවීන් සහ කිරි නිෂ්පාදනය: විස්තර

## பால் உற்பத்தியாளர்களும் பாலுற்பத்தியும்: விபரம்

## DAIRY FARMERS AND MILK PRODUCTION: DETAILS

1219/2025

**3. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු සුරංග රත්නායක මහතා වෙනුවට)**

(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சுரங்க ரத்நாயக்க சார்பாக)

(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Suranga Rathnayaka)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ සිටින කිරි ගොවීන් සංඛ්‍යාව සහ දෛනික කිරි නිෂ්පාදනය ලීටර්වලින් කොපමණද;

(ii) අනුරාධපුර දිස්ත්‍රික්කයේ සිටින කිරි ගොවීන් සංඛ්‍යාව සහ එම දිස්ත්‍රික්කයේ දෛනික කිරි නිෂ්පාදනය ලීටර්වලින් කොපමණද;

(iii) මේ වනවිට කිරි ලීටරයක් සඳහා ගෙවනු ලබන මුදල කොපමණද;

(iv) එම මුදල මෑතකදී සංශෝධනය කරනු ලැබුවේද;

(v) එසේ නම්, ඊට හේතු කවරේද;

(vi) කිරි ගොවීන් නඟාසිටුවීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) 2025/2026 මහ කන්නයේදී රජය වී මිලදී ගැනීමට අපේක්ෂා කරන්නේද;

(ii) වී මිලදී ගැනීම සඳහා පෞද්ගලික ව්‍යාපාරිකයින්ට ණය ලබා දෙන්නේද;

(iii) වී අලෙවි මණ්ඩලයේ අසාදු ලේඛනගත ව්‍යාපාරිකයින්ටත් ණය ලබා දෙන්නේද;

(iv) වී කිලෝවක් සඳහා සාධාරණ මිලක් ලබා දෙන්නේද;

(v) එසේ නම්, එක් එක් වී වර්ගය අනුව එම මිල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள பால் உற்பத்தியாளர்களின் எண்ணிக்கை யாது என்பதையும்; நாளாந்த பால் உற்பத்தி லீற்றரில் எவ்வளவு என்பதையும்;

(ii) அநுராதபுரம் மாவட்டத்திலுள்ள பால் உற்பத்தியாளர்களின் எண்ணிக்கை யாது என்பதையும்; அம்மாவட்டத்தின் நாளாந்த பால் உற்பத்தி லீற்றரில் எவ்வளவு என்பதையும்;

(iii) தற்போது ஒரு லீற்றர் பாலுக்குச் செலுத்தப்படும் விலை யாது என்பதையும்;

(iv) அந்த விலை சமீபத்தில் திருத்தப்பட்டதா என்பதையும்;

(v) ஆமெனில், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(vi) பால் உற்பத்தியாளர்களைக் கட்டியெழுப்புவதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) 2025/2026 பெரும்போகத்தில் அரசாங்கம் நெல்லைக் கொள்வனவு செய்ய எதிர்பார்க்கின்றதா என்பதையும்;

(ii) நெல்லைக் கொள்வனவு செய்வதற்கு தனியார் வர்த்தகர்களுக்குக் கடன் வழங்கப்படுமா என்பதையும்;

(iii) நெல் சந்தைப்படுத்தல் சபையின் கறைநிரல் பட்டியலில் சேர்க்கப்பட்டுள்ள வியாபாரிகளுக்கும் கடன் வழங்கப்படுமா என்பதையும்;

(iv) ஒரு கிலோ நெல்லுக்கு நியாயமான விலை வழங்கப்படுமா என்பதையும்;

(v) ஆமெனில், ஒவ்வொரு நெல் வகைக்கும் ஏற்ப அந்த விலை வெவ்வேறாக யாது என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he state -

(i) the number of dairy farmers in Sri Lanka and the daily milk production in litres;

(ii) the number of dairy farmers in the Anuradhapura District and the daily milk production of the said district in litres;

(iii) the amount of money that is currently being paid per litre of milk;

(iv) whether the said amount has been revised recently;

(v) if so, the reasons for that; and

(vi) the steps that will be taken to uplift the livelihood of dairy farmers?

(b) Will he also state -

(i) whether the Government expects to purchase paddy during the 2025/2026 Maha Season;

(ii) whether loans will be provided to private businessmen for the purchase of paddy;

(iii) whether loans will also be provided to the businessmen who have been blacklisted by the Paddy Marketing Board;

(iv) whether a fair price will be given for a kilo of paddy; and

(v) if so, the price separately for each variety of paddy?

(c) If not, why?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ● ශ්‍රී ලංකාවේ සිටින කිරි ගොවීන් සංඛ්‍යාව 243,812කි.
● දෛනික කිරි නිෂ්පාදනය ලීටර් 1,103,273කි. (ලීටර් මිලියන 1.1කි)

(ii) ● අනුරාධපුර දිස්ත්‍රික්කයේ සිටින කිරි ගොවීන් සංඛ්‍යාව 31,826කි.
● දෛනික කිරි නිෂ්පාදනය ලීටර් 151,011කි. (ලීටර් මිලියන 0.15කි)

(iii) කිරි ලීටරයක් සඳහා ගෙවනු ලබන සාමාන්‍ය මිල වන්නේ,
●එළකිරි ලීටරයක් සඳහා රුපියල් 176.40කි.
●මීකිරි ලීටරයක් සඳහා රුපියල් 201.94කි.

(iv) නැත.

(v) වෙළෙඳ පොළ ඉල්ලුම හා සැපයුම අනුව කිරි ලීටරයක් සඳහා ගෙවනු ලබන මිල අදාළ කිරි එකතු කිරීමේ සමාගම් මඟින් තීරණය කෙරේ. කිරි ගොවීන් වෙත නිෂ්පාදන වියදමට සරිලන සාධාරණ මිලක් මේ වනවිට ලැබෙන බැවින්, රජය මඟින් මිල සීමාවක් පනවා නොමැත.

(vi) කිරි ගොවීන් නඟාසිටුවීමේ අරමුණින් යුතුව 2030 වසරේදී ශ්‍රී ලංකාව කිරිවලින් සියයට 75ක් දක්වා ස්වයංපෝෂිත කිරීම සඳහා Dairy Hub ව්‍යාපෘතිය හෙවත් කිරි ගොවීන් හා සැපයුම් දාමයේ භාණ්ඩ හා සේවා සපයන අනෙකුත් ව්‍යවසායකයින් පශු වෛද්‍ය කාර්යාල කේන්ද්‍ර කර ගනිමින් සංවිධානගත කිරීම ("Dairy Hubs" පිහිටුවීම) හා කිරි ගොවි ව්‍යවසායකයින් සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යෝජනා වී ඇත.

ඒ අනුව ලංකාව පුරා පශු වෛද්‍ය කොට්ඨාස මූලික කර ගනිමින් Dairy Hubs 300ක් ස්ථාපනය කිරීමට නියමිතය. මෙම වැඩසටහනට අනුව 2030 වසරේදී ලීටර් මිලියන 1,200ක වාර්ෂික කිරි නිෂ්පාදන ඉලක්කයක් හෙවත් දිනකට ලීටර් මිලියන 3.3ක නිෂ්පාදන ඉලක්කයක් අපේක්ෂා කෙරේ.

<u>Dairy Hub ව්‍යාපෘතිය යටතේ යෝජිත ජාතික කිරිගව සංවර්ධන වැඩසටහන</u>

● දැනට දිනකට ලීටර් 20ට වඩා අඩුවෙන් නිපදවන එහෙත් විභවතාව ඇති ගොවිපළ තෝරා දිනකට ලීටර් 20ක් නිපදවන ගොවිපළ දක්වා සංවර්ධනය කිරීමට වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

- දිනකට ලීටර් 40 දක්වා නිපදවීමට විභවතාව ඇති ගොවිපළ තෝරා දිනකට ලීටර් 40ක් නිපදවන, තරුණ කිරි නිෂ්පාදන ව්‍යවසායක ගොවිපළ දක්වා සංවර්ධනය කිරීමට වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
- දිනකට ලීටර් 40 දක්වා නිපදවීමට විභවතාව ඇති ගොවිපළ තෝරා දිනකට ලීටර් 40ක් නිපදවන, කාන්තා කිරි නිෂ්පාදන ව්‍යවසායක ගොවිපළ දක්වා සංවර්ධනය කිරීමට වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
- දිනකට ලීටර් 100 දක්වා නිපදවීමට විභවතාව ඇති ගොවිපළ තෝරා දිනකට ලීටර් 100ක් නිපදවන, මධ්‍ය පරිමාණ කිරි ගොවිපළ දක්වා සංවර්ධනය කිරීමට වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

<u>මහා පරිමාණ කිරි ගොවිපළ සංවර්ධන වැඩසටහන යටතේ යෝජිත වැඩසටහන්</u>

- දිනකට ලීටර් 1,000ට වැඩි නිෂ්පාදනයක් ලබා දෙන කිරි ගොවිපළ සංවර්ධන වැඩසටහන් පෞද්ගලික අංශය දිරිමත් කිරීම තුළින් ක්‍රියාත්මක කිරීම.
- දිනකට ලීටර් 10,000ක් නිපදවන කිරි ගොවිපළ ස්ථාපිත කිරීම සඳහා පෞද්ගලික අංශයේ ව්‍යවසායකයින් දිරිමත් කිරීම තුළින් සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

ඒ අනුව අපේක්ෂිත කිරි නිෂ්පාදන අගයන් පහත වගුවේ දැක්වේ.

| වැඩසටහන | 2026 | 2027 | 2028 | 2029 | 2030 |
|---|---|---|---|---|---|
| | ලීටර මිලියන | | | | |
| දැනට ක්‍රියාත්මක කිරි නිෂ්පාදන සංවර්ධන වැඩසටහන | 1.18 | 1.24 | 1.31 | 1.40 | 1.48 |
| Dairy Hub ව්‍යාපෘතිය යටතේ යෝජිත වැඩසටහන් | | | | | |
| 1. කුඩා පරිමාණ කිරි ගොවිපළ (ලීටර 20) සංවර්ධන වැඩසටහන | 0.09 | 0.18 | 0.27 | 0.36 | 0.45 |
| 2. තරුණ කිරි නිෂ්පාදන ව්‍යවසායක සංවර්ධන වැඩසටහන (ලීටර 40) | 0.06 | 0.12 | 0.18 | 0.24 | 0.30 |
| 3. කාන්තා කිරි නිෂ්පාදන ව්‍යවසායක සංවර්ධන වැඩසටහන (ලීටර 40) | 0.06 | 0.12 | 0.18 | 0.24 | 0.30 |
| 4. මධ්‍ය පරිමාණ කිරි ගොවිපළ සංවර්ධන වැඩසටහන (ලීටර 100) | - | 0.09 | 0.18 | 0.27 | 0.36 |
| Dairy Hub ව්‍යාපෘතිය යටතේ මුළු දෛනික කිරි නිෂ්පාදනය (ලීටර මිලියන) | 0.21 | 0.51 | 0.81 | 1.11 | 1.41 |
| මහා පරිමාණ කිරි ගොවිපළ සංවර්ධන වැඩසටහන යටතේ යෝජිත වැඩසටහන් | | | | | |
| 1. මහා පරිමාණ කිරි ගොවිපළ සංවර්ධන වැඩසටහන (ලීටර 1,000) | 0.01 | 0.03 | 0.05 | 0.07 | 0.09 |
| 2. ලීටර 10,000 නිපදවන කිරි ගොවිපළ සංවර්ධන වැඩසටහන | 0.05 | 0.10 | 0.15 | 0.20 | 0.25 |
| මහා පරිමාණ කිරි ගොවිපළ සංවර්ධන වැඩසටහන යටතේ මුළු දෛනික කිරි නිෂ්පාදනය (ලීටර මිලියන) | 0.06 | 0.13 | 0.20 | 0.27 | 0.34 |
| මුළු දෛනික කිරි නිෂ්පාදනය (ලීටර මිලියන) | 1.45 | 1.88 | 2.32 | 2.78 | 3.23 |

මේ ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට තෝරා ගත් ඉලක්කගත ගොවිපළ සඳහා පහත ක්‍රියාමාර්ග ගැනීමට සැලසුම් කර ඇත.

- ව්‍යාප්ති සේවා හා අඛණ්ඩ පුහුණු වැඩසටහන් මඟින් විශේෂයෙන් ආර්ථික තාක්ෂණික මොඩියුල හරහා ලීටර් 20, ලීටර් 40 සහ ලීටර් 100 නිෂ්පාදන විභවයක් සහිත ගොවිපළවල ධාරිතාව වැඩිදියුණු කිරීම.
- සතුන්ගේ සෞඛ්‍ය නිසි ආකාරයට පවත්වා ගැනීමට රෝග මර්දන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. මේ යටතේ කුර හා මුඛ රෝගය (FMD), කාල ගාත්‍රා රෝගය (BQ), ගව රක්තාශ්‍රවය (HS) වැනි රෝග සඳහා දැනට ක්‍රියාත්මක එන්නත්කරණ වැඩසටහන් තවදුරටත් කාර්යක්ෂමව හා ක්‍රමවත්ව යොදා ගැනීමට නියමිතය.
- කෘත්‍රිම සිංචන වැඩසටහන් තවදුරටත් ක්‍රමවත් කිරීම තුළින් හා ආනයනික ලිංග නිර්ණය කරන ලද ගව ශුක්‍රාණු භාවිතය වැඩි කිරීම මඟින් සත්ත්ව අභිජනන කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ ගැහැනු පැටවුන් සංඛ්‍යාව වැඩි කර ගැනීම.
- තවද, කෘත්‍රිම සිංචන වැඩසටහන යටතේ දැනට හිඟතාව පවතින ගව වර්ගවල ශුක්‍රාණු දේශීයව නිෂ්පාදනය සඳහා පාකිස්තානු රජය සමඟ සම්බන්ධ වීමෙන් මී ගව සහ එළ ගව පුං ගවයින් 07දෙනෙකු ආනයනය කිරීම.
- කිරි නිෂ්පාදනය වැඩි කිරීම සඳහා විශේෂිතවම බලපානු ලබන තෘණ වගාවන් සංවර්ධනය කිරීම සඳහා ඉලක්කගත වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. මේ යටතේ සතුන්ට ආහාර සැපයීම හා පෝෂණය වැඩිදියුණු කිරීම සඳහා උසස් තත්ත්වයේ රළු ආහාර හඳුන්වා දීම, සත්ත්ව ආහාර නිෂ්පාදකයින් අලුතින් බිහි කිරීම හා දිරිගැන්වීම, තෘණ ආශ්‍රිත ව්‍යවසායකයින් බිහි කිරීම හා පූර්ණ මිශ්‍රිත ආහාර ලබා දීමේ ක්‍රමය (TMR) තුළින් අඛණ්ඩව අවශ්‍ය තරම් සතුන්ගේ ආහාර හා පෝෂණය කාර්යක්ෂම කිරීම.
- තවද, කිරිවල ගුණාත්මක තත්ත්වය ඉහළ දමමින් ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා කිරිවල ගුණාත්මක තත්ත්වය වැඩිදියුණු කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම, දැනුවත් කිරීම හා ඒ ආශ්‍රිතව පර්යේෂණ කටයුතු කිරීම තුළින් ගුණාත්මකභාවය ඉහළ කිරි හා ආශ්‍රිත නිෂ්පාදන රට තුළ බහුල කිරීමටද, එමඟින් පාරිභෝගිකයින්ට දැරිය හැකි මිලකට කිරි හා කිරි නිෂ්පාදන ලබා ගැනීමටද ඉඩකඩ සැලසීමට සහ එමඟින් රටේ පවතින විශේෂයෙන්ම අවුරුදු 05ට අඩු ළමයින්ගේ මන්දපෝෂණය සැලකිය යුතු මට්ටමකින් පහළ දැමීම.
- කිරි ව්‍යවසායකයින් නඟාසිටුවීම සඳහා ඔවුන්ට සහනදායී ක්‍රම යටතේ මූල්‍ය පහසුකම්, ණය පහසුකම් හා උපකරණ සැපයීම හා අවශ්‍යතා හඳුනාගෙන ඔවුන්ට උපකාර කිරීම.
- පශු සම්පත් ක්ෂේත්‍රයේ අභිවෘද්ධියට අදාළව පර්යේෂණ කටයුතු වැඩිදියුණු කිරීම.
- කිරි නිෂ්පාදන ධාරිතාව අඩුවීමට හේතු වන බුරුලු ප්‍රදාහය රෝගය වැළැක්වීම සඳහා බුරුලු ප්‍රදාහය රෝග පාලන වැඩසටහන් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම.
- Dairy Hub ව්‍යාපෘතිය හරහා ඇති කරන ව්‍යවසායික කිරි ගොවිපළවල පහත සඳහන් යහපත් කළමනාකරණ පුරුදු ඇති කර ඒවා සම්පව ඇගැයීම.
  - පැය 24 පුරා සතුන්ට පානයට අවශ්‍ය පරිදි ජලය ලබා දීම.
  - තෘණ සංරක්ෂණය හා සයිලේජ් නිෂ්පාදනය කිරීම.
  - TMR ක්‍රමයට ආහාර ලබා දීම.
  - නිවැරදි ලෙස කිරි දෙනුන්ගේ සංක්‍රාන්ති සමය කළමනාකරණය කිරීම.
  - කිරි දෙනුන්ගෙන් දිනකට දෙවරක් කිරි දෙවීම.
- වැස්සි පැටවුන් ඇතිදැඩි කිරීමේ වැඩසටහන (Heifer Calf Rearing Programme) යටතේ ගැහැනු පැටවුන්ගේ පෝෂණය ඉහළ නැංවීම සඳහා සාන්ද්‍ර ආහාර ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- ලෝක බැංකු ණය ආධාර යටතේ ක්‍රියාත්මක අන්තර්ගතිකව සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය (Inclusive Connectivity Development Project - ICDP) සංරචක II මඟින් දිස්ත්‍රික්ක 12ක පශු වෛද්‍ය කොට්ඨාස ආවරණය වන පරිදි පහත වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.
  - තෘණ ව්‍යවසායකයින් බිහි කිරීම.

[ගරු බිමල් රත්නායක මහතා]

- බුරුලු ප්‍රදාහ රෝග පාලනය වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- කිරි ශීතකරණ පහසුකම් වැඩිදියුණු කිරීම.
- පශු වෘත්තිකයින්ගේ සහ ගොවීන්ගේ දැනුම වැඩි කිරීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- කිරිවල තත්ත්ව සහතිකකරණය සඳහා කිරි එකතු කරන මධ්‍යස්ථානවල පහසුකම් වැඩිදියුණු කිරීම.
- සවස් කාලයේ කිරි දෙවීම - evening milking - ප්‍රචලිත කිරීම සඳහා ව්‍යාප්ති වැඩසටහන් පැවැත්වීම.

(ආ) (i) ඔව්.

(ii) ඔව්. භාණ්ඩාගාරය විසින් සුළු හා මධ්‍ය පරිමාණ මෝල්හිමියන්ට වී මිලදී ගැනීම සඳහා සහනදායී පොලී අනුපාතික යටතේ ණය මුදල් ලබා දෙනු ලැබේ.

(iii) නැත.

(iv) ඔව්. වී සඳහා වැය වන නිෂ්පාදන වියදම ඇගැයීමෙන් පසු එම අගයට සියයට 30ක ලාභාංශයක් එකතු කිරීමෙන් වී කිලෝවක මිල ගණනය කරනු ලැබේ.

(v) මේ වනවිට 2025/26 මහ කන්නය සඳහා එක් එක් වී වර්ගය අනුව වී මිල තීරණය කර නොමැති අතර රජය විසින් එක් එක් වී වර්ගය අනුව ගොවීන්ට වාසිදායක වන අයුරින් වී මිලදී ගැනීමේ අවම මිල (Minimum purchasing price) තීරණය කරනු ලැබේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 -1317/2025- (1), ගරු කේ. කාදර් මස්තාන් මහතා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5 -1475/2025- (1), ගරු රොෂාන් අක්මීමන මහතා.

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)
ගරු කථානායකතුමනි, ගරු රොෂාන් අක්මීමන මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, පරිසර අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### දෙමළ රජවරුන්ගේ ඉතිහාසය පාසල් විෂය මාලාවට ඇතුළත් කිරීම
### பாடசாலைப் பாடத் திட்டத்தில் தமிழ் மன்னர்களின் வரலாறுகளை உள்ளடக்குதல்
### INCLUSION OF HISTORY OF TAMIL KINGS IN SCHOOL CURRICULUM

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27(2)இன் கீழ் பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமான மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய அவர்களிடம் என்னுடைய கேள்வியைக் கேட்க விரும்புகிறேன்.

இலங்கையில் சிங்கள மக்களைப்போல தமிழர்களும் வரலாற்று அடிப்படைகளைக்கொண்ட, இந்த மண்ணுக்குப் பூர்வீகமான சொந்த உரித்துக்கொண்ட தேசிய இனத்தவராகும். விஜயனும் தோழர்களும் இந்த நாட்டுக்கு வரும் முன்னரே பஞ்ச ஈச்சரங்களுடன் நாகர்களாக, இயக்கர்களாக தமிழர்கள் ஈழத்து மண்ணில் வாழ்ந்து வந்தார்கள் என்பதை மகாவம்சம் முதல் பல்வேறு ஆய்வாளர்களின் குறிப்புகளும் தெரிவிக்கின்றது. போர்த்துக்கேயர், ஒல்லாந்தர், ஆங்கிலேயர் இந்த மண்ணை வன்வளைப்புச் செய்து, அதிகார ஆட்சி செலுத்தியபோதும் தமிழர்கள் தீரத்துடன் அவர்களுக்கு எதிராகப் போராடியுள்ளார்கள். குறிப்பாக வடக்கு, கிழக்கு மண்ணில் அரசுகள் அமைத்து சங்கிலியன், பண்டார வன்னியன், பரராஜசேகரன் போன்ற மன்னர்கள் தீரத்துடன் தாயக தேசத்திற்காகப் போராடியுள்ளனர். நல்லநாச்சியார் போன்ற பெண் அரசிகளும் சிற்றரசர்களும்கூட இந்த மண்ணின் விடுதலைக்காகப் போராடித் தங்களை அர்ப்பணித்தவர்கள். 1920களின் பிற்பாடு தமது சமூகங்களுக்காகப் போராடிய அநகாரிக தர்மபால, ரி.பி. ஜாயா என்பவர்கள்போல, ஆறுமுகநாவலரும் சைவத்தையும் தமிழையும் காக்கப் போராடியுள்ளார்.

ஆனால், இலங்கையிலுள்ள கல்வி அமைச்சின் பாடத் திட்டங்களில் தமிழர் வரலாறு திட்டமிட்டே மறைக்கப்பட்டு வருவதை அவதானிக்க முடிகிறது. வரலாறு, சித்திரம் போன்ற பாடங்களில் தமிழ் மன்னர்களின் பெயர்கள், அக்கால இலச்சினைகள், கல்வெட்டுகள் திட்டமிட்டே மறைக்கப்பட்டுள்ளன. 1970களில் தமிழ், வரலாற்றுப் பாடநூல்களில் தமிழரின் வரலாறுகள் ஓரளவுக்கேனும் குறிப்பிடப்பட்டிருந்தன. 1982களில் இலவச பாடநூல் வழங்கும் திட்டம் உருவாக்கப்பட்ட பின் தமிழர்களின் வரலாறு திட்டமிட்டே மறைக்கப்பட்டும் அழிக்கப்பட்டும் வந்துள்ளதைக் காண முடிகிறது. கடந்த யுத்த காலங்களைப் பயன்படுத்தி சங்கிலியன், பண்டார வன்னியன், நல்லநாச்சியார், எல்லாளன் போன்ற தமிழ் மன்னர்களின் வரலாறுகள் இல்லாதொழிக்கப்பட்டுள்ளதை அமைச்சர் அறிவாரா என்று கேட்பதுடன், இது தொடர்பில் பின்வரும் வினாக்களையும் விடுக்க விரும்புகிறேன்:

1. இலங்கையின் விடுதலையின் பொருட்டுத் தீரத்துடன் போராடிய தமிழ் மன்னர்களின் வரலாறு பாட நூல்களில் உட்புகுத்தப்படுமா?

2. கல்வித் திட்டத்தில், வரலாற்றுப் பகுதியில் தமிழர் வரலாற்றுக்குரிய தனி அங்கீகாரம் வழங்கப்படுவதில் என்ன தடை இருக்கின்றது?

3. தமிழர் வரலாற்றின் இலச்சினைகள், கல்வெட்டுகள், ஓலைகள் இந்நாட்டில் பாதுகாப்பாகப் பேணப்படுகிறதா?

4. சங்கிலியன், பண்டார வன்னியன், நல்லநாச்சியார், எல்லாளன் போன்ற மன்னர்களின் வரலாறுகள் தமிழ், வரலாறு, சித்திரப் பாடங்களில் உள்ளடக்கம் பெற்றிருப்பதற்குத் தங்களால் உறுதிப்பாடு தரமுடியுமா?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු කථානායකතුමනි, ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. දැනට ක්‍රියාත්මක වන ඉතිහාසය විෂය නිර්දේශය තුළ දෙමළ ජාතික රජවරුන් පිළිබඳව අන්තර්ගත කර ඇත. 10 ශ්‍රේණියේ 7වන පාඩමෙහි යාපනය සහ වන්නියාර්වරු පිළිබඳව පරිච්ඡේදයක් වෙන් වී ඇත. එමෙන්ම, 10 ශ්‍රේණියේ 10වන පාඩමෙහි යාපනය රාජධානිය පිළිබඳව පරිච්ඡේදයක් වෙන් වී ඇති අතර, එහි සංකිළි රාජ්‍ය සමය පිළිබඳව අන්තර්ගත වී ඇත. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ 6 ශ්‍රේණියේ පොතේ සංකිළි රජුගේ රජ මාළිගයේ පින්තූරයක් ද අන්තර්ගත කර ඇත.

2. ඉතිහාසය එක් විෂයයක් ලෙස මිස, පාසල් සිසුන්ට සිංහල ඉතිහාසය, දෙමළ ඉතිහාසය ලෙස බෙදා වෙන්කර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා යොදා ගැනෙන්නේ නැත.

ගරු කථානායකතුමනි, අපි උගන්වන්නේ ශ්‍රී ලාංකික ඉතිහාසය කියලා පමණයි. එතැනදී විවිධ කාලපරිච්ඡේදවලට අදාළ රජවරු සහ ඒ රාජ්‍යයන් පිළිබඳව දරුවන්ට උගන්වනවා.

3. 
- ශ්‍රී ලංකාවේ ඉතිහාසය සුරක්ෂිත කිරීමේ සහ ප්‍රදර්ශනය කිරීමේ පුරෝගාමියා ලෙස ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් දමිළ ඉතිහාසය ප්‍රදර්ශනය කිරීම සඳහා ප්‍රදර්ශන මැදිරි තුළ ඉඩකඩ වෙන්කොට ඇත.
- කොළඹ කෞතුකාගාරයේ ශිලා පුරාවස්තු මැදිරිය තුළ දෙමළ ටැම්ලිපි හතරක් සහ පුවරු ලිපි දෙකක් ප්‍රදර්ශනයකොට ඇත. මෙම ලිපි උතුරු ඉන්දියාවේ රාජරාජ සහ රාජේන්ද්‍ර අධිරාජ්‍යයන්ගේ මෙරට නියෝජිතයන් විසින් සහ උතුරේ ආර්ය චක්‍රවර්ති පාලකයන් විසින් පිහිටුවා ඇති ලිපි වේ.
- තවද, කොළඹ ජාතික කෞතුකාගාරය සතුව ඇති දමිළ සෙල්ලිපි පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඇතුළත් ග්‍රන්ථයක් මහාචාර්ය එස්. පද්මනාදන් විසින් රචනාකොට ඇති අතර, දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන අංශය මඟින් එය අළෙවි කිරීම ද සිදු වේ.
- එසේම හින්දු ආගමට අයත් ශිව, පර්වතී, නටරාජ්, සුන්දරමූර්ති ඇතුළු තවත් බොහෝ ශෛලමය හා ලෝකඩ පිළිම සහ මූර්ති කොළඹ ජාතික කෞතුකාගාරයේ ප්‍රදර්ශනයකොට ඇති ආකෘති අතර වේ.
- මීට අමතරව යාපනය රාජ්‍යය තුළ භාවිත වූ සේතු කාසි - Setu coins - එකතුවක් ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් සුරක්ෂිතව ගබඩාකොට ඇත.
- තවද, කොළඹ ජාතික කෞතුකාගාරය සතු සංගම් යුගයට අයත් චෝල හා පාණ්ඩ්‍ය කාසි පිළිබඳ ආචාර්ය ක්‍රිෂ්ණමූර්ති සහ සෙනරත් වික්‍රමසිංහ විසින් රචිත ග්‍රන්ථයක් සංරක්ෂණය කර තිබේ.
- දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශිත ග්‍රන්ථ සහ සඟරා තුළ ද මේ සම්බන්ධ විවිධ ලිපි පළ කර තිබේ.
- මීට අමතරව මීට අදාළ ලේඛන යාපන කච්චේරි ලේඛන කාණ්ඩ 20 යටතේ පුස්කොළ පොත් පෙට්ටි 20ක් තැන්පත් කර ඇත.

4. චිත්‍ර කලා විෂය ප්‍රායෝගික කලා නිර්මාණ, ක්‍රියාකාරකම් සහ විශිෂ්ට කලා කෘති අධ්‍යයනය කිරීම්වලින් යුතු විෂයයකි. විෂය සකස් කිරීමේදී විශේෂයෙන්ම සර්ව ජාතික, සර්ව ආගමික, සර්ව භෞමික කලා කෘතීන් ඇතුළත් ජාත්‍යන්තර ප්‍රමිති හා කුසලතා සලකා බලන ලදී. ඒ අනුව චිත්‍ර කලා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදු කිරීමේදී මේ පිළිබඳ වඩාත් අවධානය යොමු කර ඇත. විශේෂයෙන්ම කලා කෘති අධ්‍යයනයට යොමු කිරීමේ දී සාම්ප්‍රදායික හා නූතන කලා නිර්මාණ අධ්‍යයනය සඳහා අවස්ථාව සලසා ඇත.

සම්ප්‍රදායික කලා නිර්මාණ ලෙස ලංකාව, ඉන්දියාව සහ යුරෝපය ආශ්‍රිත විවිධ කාල වකවානුවල නිර්මාණය වූ කලා කෘති තෝරා ගැනෙන අතර ඒවායේ කලාත්මක ලක්ෂණ අධ්‍යයනයට යොමු කෙරේ.

උදාහරණ වශයෙන් ඉන්දියාවේ ඉන්දු නිම්නයේ සිට ගුප්ත, පල්ලව, චෝල, මෝගල් සහ රාජ්පුට් ලෙස හඳුනා ගන්නා විවිධ වකවානුවලට අයත් කලා නිර්මාණත් ඒවා ලාංකීය නිර්මාණ සඳහා ආභාසය වූ ආකාරයත් චිත්‍ර කලාව නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළ අන්තර්ගත කර ඇත.

එමෙන්ම දකුණු ඉන්දියානු කලා ආභාසය සමඟ පොළොන්නරුව ශිව දේවාලය, හින්දු මූර්ති නිර්මාණ හා ඒවායේ ආභාසයෙන් බෞද්ධ නිර්මාණවල සිදු වූ වෙනස්කම් සහිත කලා ආකෘතික ලක්ෂණත් විෂය අන්තර්ගතය සඳහා ඇතුළත් කර ඇත.

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය ]

නූතන කලා නිර්මාණ ගැන අධ්‍යයනයේ දී දෙමළ නිර්මාණ ශිල්පීන් ලෙස තාවඩි මුත්තයියා තුරෙයිසාමි, පෙරියතම්බි සුබ්‍රමනියම්, කේ. කනකසභාපති, ඒ. මාක්, ශිවඥානසුන්දරම් (රමණි) වැනි ශිල්පීන්ගේ නිර්මාණ ද ඇතුළත් කර ඇත. මේ සියලු නිර්මාණ හඳුන්වා දීමේ දී සිංහල, දෙමළ, මුස්ලිම් සහ ක්‍රිස්තියානි ලෙස වාර්ගික හඳුන්වාදීමකින් තොරව ශ්‍රී ලාංකික කලා නිර්මාණ හා කලා ශිල්පීන් ලෙස පුළුල් දැක්මකින් යුතු ව විෂය නිර්දේශ සඳහා ඇතුළත් කර ඇත. 2015 වර්ෂයේ සිට ම හඳුන්වා දෙන ලද චිත්‍ර කලා විෂය නිර්දේශ හා විෂය අන්තර්ගතය සහ ගුරු මාර්ගෝපදේශ සැකසීම සඳහා චිත්‍ර කලාව හා සම්බන්ධ දෙමළ විද්වත් නියෝජනයක් හා අනුමැතියක් සමඟ සම්පත් දායකත්වයක් ද ලබා ගෙන ඇත. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ සකස් කරන ලද චිත්‍ර කලා විෂයමාලා ද්‍රව්‍ය (විෂය නිර්දේශ, මොඩියුල සහ ගුරු මාර්ගෝපදේශ) නැවත පරීක්ෂා කිරීමේ සමාලෝචන මණ්ඩල සඳහා ද, චිත්‍ර කලා විෂයට අදාළ දෙමළ මාධ්‍ය විද්වත් නියෝජනයක් සහිතව ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරමින් පවතී.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ பிரதம அமைச்சர் அவர்களே, உங்களுடைய நீண்ட விளக்கத்துக்கு நன்றி! நீங்கள் சொன்ன விளக்கத்தில் சிறு திருத்தம் செய்யவேண்டும். தமிழர் வரலாற்றுக் காலம் என்பது சங்க காலம், சங்கமருவிய காலம், சோழர் காலம், நாயக்கர் காலம் என நான்கு காலங்களைக் கொண்டது. அதில் சங்க காலம்தான் பாண்டிய மன்னர்களின் காலம்; சோழ மன்னர்கள் ஆண்ட காலம் சோழர் காலம். இராஜராஜ சோழனின் வரலாறு சோழர் காலத்துக்குரியது. இதைப்பற்றி நான் இப்போது விவாதிக்கவில்லை. ஆனால், அநேகமாக தமிழர்களுடைய வரலாற்று அடையாளங்கள் - இந்த மண்ணிலே குளக்கோட்ட மன்னன், பரராஜசேகரன், சங்கிலியன், பண்டார வன்னியன் போன்ற பல தமிழ் மன்னர்கள் ஆட்சிபுரிந்ததற்கான வரலாறுகள் - இல்லாமலாக் கப்பட்டிருக்கின்றது. பண்டார வன்னியனுக்கு Captain பண்டாரவன்னியன் என்ற பட்டத்தை - rankஐக்கூட பிரித்தானியர்கள் வழங்கியிருந்தார்கள். இப்போது அந்த மன்னனுடைய நினைவுக்குரிய நடுகல்லைக்கூடப் பிடுங்கி எறிந்துவிட்டார்கள். ஆகவே, ஏற்கனவே எமது பாடப் புத்தகங்களில் இருந்த, இந்த மண்ணிலே ஆட்சி செய்த எமது மன்னர்களின் வரலாறுகள் மீண்டும் கொண்டுவரப்பட வேண்டும். 1977ஆம் ஆண்டு நான் மூன்றாம் ஆண்டில் படிக்கின்றபோது, பண்டார வன்னியன் பற்றிய பாடம் இருந்தது. பாடப்பரப்பில் சங்கிலியன் பற்றிய வரலாறு தமிழ் பாடத்தில் தனியாக இருந்தது. இப்போது அகற்றப்பட்டுள்ள அந்த வரலாறுகள் மீண்டும் உள்வாங்கப்பட வேண்டு மென்பதே எங்களுடைய வேண்டுகோளாகும். ஆகவே, தமிழர் களுடைய அந்த வரலாற்றின் அடையாளமாக அதில் ஒரு பகுதியை மீண்டும் பாடத் திட்டத்தில் கொண்டுவர வேண்டுமென்பதை நான் வலியுறுத்துகிறேன்.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Sir, we will take the comments made by the Hon. Member into consideration. As you know, it is education experts who develop the curriculum and review the modules. We will convey your concerns to that course team, Hon. Member. Of course, when we present history, we present it as Sri Lankan history and look at the different periods in that context. All of what the Hon. Member said, we will take into consideration. But, we do not present it as Sinhala, Tamil or Muslim history but as Sri Lankan history, which includes all of these elements.

Thank you, Sir.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම, ගරු රවී කරුණානායක මහතා.

## ගරු රවී කරුණානායක මහතාගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම
## மாண்புமிகு ரவி கருணாநாயக்கவினது சொந்த விளக்கம்
## PERSONAL EXPLANATION BY HON. RAVI KARUNANAYAKE

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Speaker, I rise to bring to your notice a serious matter concerning violation of my rights and seek leave to make a Personal Explanation in terms of Standing Order No. 27.(8). I must confess at this moment, Hon. Prime Minister, that this bears no relevance at all to you and that I seek only a rectification of an injustice that had happened to me. It is not a matter of Privilege, but only a Personal Explanation.

Sir, on the 26th of November, 2025, during the Answers given in this House relating to the 2015 Treasury Bond issue, a matter pending before court for nearly five years, the Hon. Prime Minister made a statement which had the effect of attributing ministerial responsibility to me in a manner that is factually incorrect, misleading and damaging my reputation as a Member of Parliament.

In her Response, the Hon. Prime Minister stated that her position regarding those responsible for the Central Bank Bond transactions was based on "the recommendations contained in the Report of the Presidential Commission of Inquiry". Although that was precisely the second Question posed to the Hon. Prime Minister, she, instead of answering the same, unfortunately stated something else. Even though she did not expressly say that "the Central Bank came under Minister Ravi Karunanayake", the clear implication of her Answer, particularly when citing the Presidential Commission of Inquiry, was that I bore ministerial responsibility for the Central Bank and its actions during that period. That implication is entirely incorrect, it is unsupported by the Presidential Commission of Inquiry and is directly contradicted by the official gazette notifications issued under Article 44(1) of the Constitution. Therefore, I think it is time that I rectify it while appreciating the answering of that Question.

During the Prime Minister's Response, I was described as "the Minister in charge of Finance" at the time of the alleged Bond transaction, suggesting that ministerial authority over commercial banks was vested in me. That is false, misrepresents my official role, misleads the House and prejudices the ongoing judicial proceedings.

Sir, at no point during my tenure as Minister of Finance, was I assigned the subject of the Central Bank of Sri Lanka. This is the first time I am publicly mentioning it. At no given time, was I assigned that institution. The constitutional and administrative record - the gazette - is unambiguous. The Central Bank has, historically and at all times, been under the Minister of Finance, except, exceptionally, during the period when I held that office. I did not exercise ministerial oversight over the Central Bank, its Monetary Board or its regulatory actions during my tenure. Ministerial oversight over the Central Bank had been assigned to then Prime Minister and Minister of National Policies and Economic Affairs, the Hon. Ranil Wickremesinghe. Cabinet records, gazette notifications and administrative circulars confirm that position beyond any doubt.

Similarly, commercial banks, at the time in question, fell under the purview of the Minister of Public Enterprise Development, the Hon. Kabir Hashim. His portfolio included State banks and commercial banks including the Bank of Ceylon, the People's Bank, the National Savings Bank, the SME Bank and banking governance functions.

Sir, I must acknowledge and I acknowledge it with thanks that former President Ranil Wickremesinghe, on many occasions, had spoken of this matter, the last being the 02nd of May, 2025 during a media interview, where he categorically mentioned that he was fully responsible. I must also mention that the Hon. Sunil Handunnetti, who was the then Chairman of the COPE, would also bear testimony to what I said.

Sir, in conclusion, I would like to say that the Hon. Prime Minister stated that her answer was grounded on the recommendations contained in the Report of the Presidential Commission of Inquiry. That is factually incorrect and misleading because the Presidential Commission of Inquiry, in their entire Report, did not find me guilty of anything or find me wanting on any allegation whatsoever. Thank you, Sir.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත
### பல்கலைக்கழகங்கள் (திருத்தம்) சட்டமூலம்
### UNIVERSITIES (AMENDMENT) BILL

"A Bill to amend the Universities Act, No. 16 of 1978"

***පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය විසිනි.***

***2026 ජනවාරි 06වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமான மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2026 சனவரி 06, செவ்வாய்க்கிழமை இரண்டாம்முறை மதிப்பிடப் பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. (Dr.) Harini Amarasuriya, Prime Miniser and Minister of Education, Higher Education and Vocational Education; to be read a Second time upon*

*Tuesday, 06th January, 2026 and to be printed; and to be referred to the Ministerial Consultative Committee on Education, Higher Education and Vocational Education.*

## වරප්‍රසාද යෝජනා
## சிறப்புரிமைப் பிரேரணைகள்
## PRIVILEGE MOTIONS

### 2025.11.10 දින ගරු සුජීව සේනසිංහ මහතා විසින් කරන ලද ප්‍රකාශය
### 10.11.2025 அன்று மாண்புமிகு சுஜீவ சேனசிங்ஹவால் தெரிவிக்கப்பட்ட கூற்று
### REMARK MADE BY HON. SUJEEWA SENASINGHE ON 10.11.2025

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තු මන්ත්‍රිනී ගරු නිතිඥ හිරුනි විජේසිංහ මහත්මිය විසින් තමාගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2025 නොවැම්බර් 18 දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118 හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

### ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා විසින් 2025.11.21 දින ඉදිරිපත් කළ ලිපිය මඟින් මතු කරන ලද වරප්‍රසාද සම්බන්ධ කරුණු
### மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா அவர்களால் 2025.11.21ஆம் திகதி சமர்ப்பிக்கப்பட்ட கடிதத்தின்மூலம் எழுப்பப்பட்ட சிறப்புரிமை பற்றிய விடயம்
### MATTERS OF PRIVILEGE RAISED BY HON. (DR.) RAMANATHAN ARCHCHUNA THROUGH LETTER DATED 21.11.2025

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා විසින් 2025 නොවැම්බර් 21 දිනැති ලිපිය මඟින් ගරු කථානායකතුමා වෙත යොමු කරන ලද කරුණු, ගරු කථානායකතුමා විසින් 2025 දෙසැම්බර් 01 වැනි දින පාර්ලිමේන්තුවේදී ලබා දෙන ලද නියෝගය අනුව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය."

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීවරුනි, මේ වනවිට රට තුළ පවතින හදිසි ආපදා තත්ත්වය පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව 2025 දෙසැම්බර් 01වන දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව විසින් 2026 අය වැය කාරක සභා අවස්ථාවේ වැඩසටහනේ වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය යන අමාත්‍යාංශවල වැය ශීර්ෂ විවාදයට ගැනීමට නියමිතව තිබූ දින සංශෝධනය කරන ලද අතර එකී සංශෝධිත දින පිළිබඳව මෙම ගරු සභාවට දැනුවත් කිරීමට කැමැත්තෙමි.

ඒ අනුව 2025 දෙසැම්බර් 02වැනි අඟහරුවාදා විවාදයට ගැනීමට නියමිතව තිබූ වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ සහ වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ 2025 දෙසැම්බර් 03වැනි බදාදා, එනම් අද දින විවාදයට ගැනීමට නියමිත මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සමඟ අද දින පූර්ව භාග 10.30 සිට අපර භාග 6.00 දක්වා සහ 2025 දෙසැම්බර් 05වැනි සිකුරාදා පූර්ව භාග 10.30 සිට අපර භාග 6.00 දක්වා ද -සම්මත කිරීම අපර භාග 6.00ට- විවාදයට ගැනීමට නියමිත බව මෙම සභාවට දැන්වීමට කැමැත්තෙමි.

අද දින සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් වී නොමැති බැවින්, 2025 සැප්තැම්බර් 11වැනි දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ තීරණය ප්‍රකාරව අපර භාග 6.00 සිට අපර භාග 6.30 දක්වා සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව විවාද කිරීමට වෙන් කර ඇති කාලය ද විසර්ජන පනත් කෙටුම්පත කාරක සභා අවස්ථාවේ විවාදය සඳහා සභාවේ අවසරය ඇතිව යොදා ගන්නා බව දැනුම් දීමට කැමැත්තෙමි.

ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත, 2026 - කාරක සභා අවස්ථාව, දහනවවන වෙන් කළ දිනය.

## විසර්ජන පනත් කෙටුම්පත, 2026
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2026
## APPROPRIATION BILL, 2026

*කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.- [ප්‍රගතිය: දෙසැම්බර් 01]*

*[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.[*

*குழுவில் மேலும் ஆராயப்பெற்றது.- [தேர்ச்சி: டிசம்பர் 01]*
*[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered further in Committee.- [Progress: 01st December]*
*[HON. SPEAKER in the Chair.]*

**116 වන ශීර්ෂය.- වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 500,000,000

**தலைப்பு 116.- வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 500,000,000

HEAD 116.- MINISTER OF TRADE, COMMERCE, FOOD SECURITY AND CO-OPERATIVE DEVELOPMENT

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 500,000,000

**135 වන ශීර්ෂය.- වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 1,668,000000,

**தலைப்பு 135. - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 1,668,000.00

HEAD 135.- MINISTER OF PLANTATION AND COMMUNITY INFRASTRUCTURE

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs 1,668,000000,

**102 වන ශීර්ෂය.- මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා**

01 වන වැඩසටහන. - මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 242,642,000,000

**தலைப்பு 102.- நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 242,642,000,000

HEAD 102.- MINISTER OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 242,642,000,000

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

පළමුවන උපලේඛනය, වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය - වැය ශීර්ෂ අංක 116, 295 සහ 297 සිට 302; වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය - වැය ශීර්ෂ අංක 135, 293 සහ 337; මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය - වැය ශීර්ෂ අංක 102, 237 සිට 252, 280, 296, 323, 324, 329, 333 සහ 338.

සලකා බැලීම පූර්ව භාග 10.30 සිට අපර භාග 6.30 දක්වා.

කපා හැරීමේ යෝජනාව, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් ලැබෙනවා.

[පූ.භා. 9.42]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු සභාපතිතුමනි, "2026 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේදී අද දින, එනම් 2025.12.03වන බදාදා විවාදයට ගැනෙන අමාත්‍යාංශ සහ ඒවා යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනවලින්, අදාළ අංක 102, 237 සිට 252, 280, 296, 323, 324, 329, 333 සහ 338, 135, 293 සහ 337, 116, 295, 297 සිට 302 දරන වැය ශීර්ෂයන්ගෙන් සම්ප්‍රදායානුකූලව එක් එක් වැඩසටහන්හි සියලුම පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතුය" යි මම යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි, අපේ මන්ත්‍රීවරු තුන්දෙනෙක් විසින් අමාත්‍යාංශ තුනක් හැටියට කපා හැරීමේ යෝජනා ඉදිරිපත් කරන්න සිටියත්, මේ අවාසනාවන්ත තත්ත්වය යටතේ අද දවසේ අමාත්‍යාංශ තුනකම කපා හැරීමේ යෝජනා එකවර ඉදිරිපත් කරලා විවාද කරන්න අපට සිදු වුණා. මේ මොහොතේ රට තුළ ඇති වී තිබෙන තත්ත්වය පිළිබඳව සාකච්ඡා කරන්න අපි මීට පෙර අවස්ථාවක් ඉල්ලුවත්, රජයේ පාර්ශ්වයෙන් අපට ඊට අවශ්‍ය කාලය නොලැබුණු නිසා අදත්, හෙටත් විශේෂයෙන් මේ විපත සිදු වූ ප්‍රදේශවල මහජන නියෝජිතයන්ට ඒ ජනතාව වෙනුවෙන් අදහස් ඉදිරිපත් කිරීමට වැඩි කාලයක් ලබා දීමට අප තීරණය කළා.

අද මේ විවාදයේදී මම විශේෂයෙන් වැවිලි කර්මාන්තය පිළිබඳව අදහස් කිහිපයක්ම ප්‍රකාශ කරන්න බලාපොරොත්තුවෙන් හිටියා. අවුරුදු 159කට වැඩි දීර්ඝ ඉතිහාසයක් තිබෙන ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය මේ වෙනකොට මුහුණ දෙන ප්‍රශ්න, රටේ තේ නිෂ්පාදනයෙන් වැඩි නිෂ්පාදනයක් කරන කුඩා තේ වතු හිමියන්ගේ ගැටලු, ඒ වාගේම අවුරුදු 150ක දීර්ඝ ඉතිහාසයක් තිබෙන පොල් කර්මාන්තයේ සහ පොල් වගාවේ යෙදෙන අය මුහුණපාන ප්‍රශ්න, ලබන අවුරුද්දට අවුරුදු 159ක් පිරෙන රබර් කර්මාන්තය සහ රබර් වගාව පිළිබඳව තිබෙන ප්‍රශ්න රාශියක් ගැන මේ අවස්ථාවේදී කථා කළ යුතුව තිබුණා. නමුත්, ඒ සියල්ල පසෙකට දාලා අද ඇති වෙලා තිබෙන ආපදා තත්ත්වය සම්බන්ධයෙන් කරුණු දක්වන්න ඕනෑ කියලා මම හිතුවා.

අද මා නියෝජනය කරන දිස්ත්‍රික්කයටත් වඩා ඇත්ත වශයෙන්ම අනෙක් දිස්ත්‍රික්කවලට ඇති වූ හානිය විශාලයි, බරපතළයි. අපේ විපක්ෂයේ මන්ත්‍රීවරු ආපදා තත්ත්වය මත මේ වෙනකොට විවිධ ප්‍රදේශවල නොයෙකුත් සේවා ඉෂ්ට කරමින් සිටිනවා. ඒ අයට අදහස් ඉදිරිපත් කරන්න තිබෙන එකම තැන මේ පාර්ලිමේන්තු සභා ගර්භය නිසා මට නියමිත කාලය සම්පූර්ණයෙන්ම ආපදාවට පත් වෙච්ච ප්‍රදේශ නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට ලබා දෙන්න පුළුවන්ද කියලා තමයි කල්පනා කළේ.

මගේ කථාව අවසන් කරන්න ඉස්සෙල්ලා යුතුකමක් හැටියට මම මේ වෙලාවේදී සංවේගය පළ කිරීමකුත් කරන්න ඕනෑ. මේ වනකොට මේ ආපදාව නිසා ජීවිත රාශියක් අපට අහිමි වෙලා තිබෙනවා. තවත් විශාල පිරිසක් අතුරුදහන් වෙලා තිබෙනවා. මේ මොහොත වනවිටත් ලක්ෂ සංඛ්‍යාත පිරිසක් අවතැන්භාවයට පත් වෙලා තිබෙනවා. බොහෝදෙනෙකුට තමන්ගේ සමීපතමයන් අහිමි වෙලා තිබෙනවා. ඒ වාගේම, බොහෝ පිරිසකට උන්හිටි තැන් පවා අහිමි වෙලා තිබෙනවා. තමන්ගේ ගේ දොර, ඉඩකඩම්, ගොවිතැන් බත්, වගාවන් සහමුලින්ම විනාශ වෙලා තිබෙනවා. තවත් විශාල පිරිසක් ඉන්නවා, ඇඳිවත පමණක් ඉතුරු වෙච්ච. ඒ සියලුදෙනාටම අපේ සංවේගය පළ කරන ගමන්, මේ ආපදාව සිදු වුණු වෙලාවේ අපේ යුද හමුදාව, නාවික හමුදාව, ගුවන් හමුදාව, පොලීසිය ඒ වාගේම විශේෂ කාර්ය බලකාය -මේ සියලු ආරක්ෂක නිලධාරින් ඇතුළු අපේ විරෝදාර රණවිරුවන්- ජීවිත ආරක්ෂා කිරීමට, දේපළ රැක ගැනීමට ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කිරීම වෙනුවෙන් අපේ ගෞරවය මේ අවස්ථාවේදී පුද කළ යුතුව තිබෙනවා. ඒ වාගේම ග්‍රාම නිලධාරිවරයාගේ පටන් දිසාපති දක්වා නිලධාරින්, අමාත්‍යාංශ ලේකම්වරු ඇතුළු හැම කෙනෙක්ම විශාල කැපවීමකින් කටයුතු කළා.

ඒ වාගේම තවත් අපට අමතක කරන්න බැරි අංශ කිහිපයක් තිබෙනවා. විදුලිබල මණ්ඩලය, ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, වාරිමාර්ග සහ මහාමාර්ගවලට සම්බන්ධ ආයතන වාගේම ආපදා කළමනාකරණ ආයතන, විශේෂයෙන් වෛද්‍යවරු, හෙද හෙදියන් ඇතුළු සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සියලුදෙනා මම මේ අවස්ථාවේ සිහිපත් කරන්න ඕනෑ. තවත් නොයෙක් දෙනා ඇති. මගේ කථාව කෙටි කරන්න අවශ්‍ය නිසා ඒ සියලුදෙනා ගැන නොකිව්වත් ඒ හැම දෙනාම කරපු අමිල මෙහෙවර මම මේ අවස්ථාවේ සිහිපත් කරනවා.

ඒ වාගේම අපට පිහිට වන අපේ අසල්වාසී රටවල්, මිත්‍ර රටවල් අපට ආධාර කරන එක ගැන, පිහිටට ඉදිරිපත් වීම ගැන ඒ රටවල රාජ්‍ය නායකයන්ටත්, ඒ ජනතාවටත්, විශේෂයෙන් අපේ තානාපතිතුමන්ලාටත් අපේ ගෞරවය මේ අවස්ථාවේදී පුද කරනවා.

අපේ රටේ පොදු මහජනතාව තුළ තිබෙන විශේෂ ලක්ෂණයක් තමයි, කෙනෙක් විපතට පත් වුණාම ළඟි ළඟියේ ඉදිරිපත් වෙලා ඒ අයට උදව් කරන එක. අද රට පුරා ජනතාව පෙළගැහිලා ඉන්නවා, තමන්ට පුළුවන් මට්ටමින් යම් උපකාරයක් කරන්න. ඒ සියලුදෙනාට අපේ ගෞරවය පුද කරනවා. තමන්ගේ ගම්වල, තමන් දැකපු තැන්වල විපතට පත් මිනිසුන්ගේ ජීවිත බේරා ගන්න පොදු මහජනතාව පුදුම කැපවීමක් කළා. ඒ සියලුදෙනාටත් අපේ ගෞරවය මේ අවස්ථාවේ පුද කරනවා.

අද දවසේ කථා කරන්න තිබෙන විෂයයන්ට අදාළව ගැටලු රාශියක් තිබුණත්, මගේ දිස්ත්‍රික්කයට වඩා අනෙක් හැම දිස්ත්‍රික්කයකම තත්ත්වය බරපතළ නිසා ඒ දිස්ත්‍රික්කවල මන්ත්‍රීවරුන්ට අදහස් දැක්වීමට අද ප්‍රමුඛත්වය දෙනවා. ඒ මහජනතාවගේ තත්ත්වය ගැන, එතුමන්ලාගේ අත්දැකීම් ගැන, ඒ වාගේම ඉදිරිපත් කරන අලුත් යෝජනා ගැන අපි දෙපැත්තම එකතු වෙලා හොඳ සාර්ථක සාකච්ඡාවක් බවට මේ විවාදය පරිවර්තනය කර ගන්න කියලා ඉල්ලා සිටිමින්, මගේ ඉතුරු කාලය ආපදාවට පත් වෙච්ච ඒ ප්‍රදේශවල කථිකයන්ට ලබා දීමට කටයුතු කරන්න කියලා කරුණාවෙන් ඉල්ලමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු සභාපතිතුමනි, මම ඔබතුමාගෙන් කාරුණික ඉල්ලීමක් කරනවා. අදත් ආදායම් බදු දෙපාර්තමේන්තුවේ 2025 නොවැම්බර්-

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමනි, ඒක point of Order එකක් නොවෙයි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හදිසි නීතිය අනුව තිබෙන එකක්, මම ඉදිරිපත් කරන්නේ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඒක point of Order එකක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු සුගත් වසන්ත ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 9.49]

**ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)
ගරු සභාපතිතුමනි, අද දෙසැම්බර් 03වැනි දා. අපි ඉතාම අවාසනාවන්ත කාලපරිච්ඡේදයක් පහු කරමින් ඉන්නවා. ඒ, ස්වාභාවික විපතක් නිසා. 1980 ගණන්වල ස්වාභාවික නොවන කාර්මික අංශයේ වෙච්ච දැවැන්ත විපතක් නිසා දෙසැම්බර් 03වන දින ආබාධ සහිත ප්‍රජාව පිළිබඳ ජාත්‍යන්තර දිනය ලෙස ප්‍රකාශයට පත් කළා. එම ප්‍රජාව පිළිබඳ දිනය තමයි අද දෙසැම්බර් 03 දිනට යෙදිලා තිබෙන්නේ. මේක මුළුමහත් ශ්‍රී ලාංකීය ප්‍රජාවම ස්වාභාවික විපතකින් දුකට, කරදරයට, වේදනාවට පත් වෙලා සිටින මොහොතක්. ඒ ප්‍රජාව තුළ ආබාධ සහිත ප්‍රජාවත් සියයට 8.7ක් දුකට, වේදනාවට, අහිමිවීම්වලට පාත්‍ර වෙලා සිටිනවා. ඒ පිළිබඳව අපගේ හෘදයංගම ශෝකය ආබාධ සහිත තැනැත්තන් සඳහා වන පාර්ලිමේන්තු සංසදය විධියටත් පිරිනමන්නට කැමැතියි.

අද ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ ජාත්‍යන්තර දිනයේ එක්සත් ජාතීන්ගේ තේමාව වෙන්නේ, සමාජ ප්‍රගමනය උදෙසා, ආබාධ සහිත ප්‍රජාව අන්තර්කරණීය සමාජයක් ලෙස ගොඩ නැඟීමයි. ඒක ඉතාම මනාව මේ ආපදා තත්ත්වයත් එක්ක ගැළපෙන එකක්. ඒ ඉලක්කය සාක්ෂාත් කර ගන්න මේ කවර හෝ විපත්, බාධක තිබුණත් අපි ප්‍රජාවක් විධියට ආබාධිත ප්‍රජාව බලගැන්වීමටත්, ශක්තිමත්ව නැඟී සිටීමටත් සූදානම් පිරිසක්. මේ ආපදා තත්ත්වය හමුවේ ඔවුන් විශාල අහිමිවීම් රාශියකට මුහුණපාලා සිටිනවා. ඔවුන් ඉන් අත්මුදා ගැනීම සඳහා රජයක් හැටියට දැවැන්ත වැඩ පිළිවෙළක් දියත් කරලා තිබෙනවා.

විපතට පත් වෙච්ච ආබාධ සහිත ප්‍රජාවගෙන් අපි ඉතාම ඕනෑකමින් ඉල්ලා සිටිනවා, ඔබගේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමාජ සේවා නිලධාරිතුමා, සමෘද්ධි සංවර්ධන නිලධාරිතුමා, ග්‍රාම නිලධාරිතුමා ඇතුළු ක්ෂේත්‍රයේ සියලු නිලධාරින්ට ඔබගේ අවශ්‍යතා ඉදිරිපත් කරන්න කියලා. ඔබගේ පුනරුත්ථාපනය වීමේ අවශ්‍යතාව පැහැදිලි කරන්න. ඒ සඳහා සියලු සහයෝගය මානව සම්පත් විධියටත්, මූල්‍ය සම්පත් විධියටත් මුදා හරින්න රජය සූදානම්. කිසිදු ප්‍රතිපාදනමය ගැටලුවක් නැහැ. ඒ බව ගරු ජනාධිපතිතුමා ඇතුළු සියලු අමාත්‍යවරු ප්‍රකාශ කර තිබෙනවා. අපි රජයක් විධියට මේ ආපදාවෙන් ශ්‍රී ලාංකීය ප්‍රජාවත්, මේ රටත් ගොඩනැඟීමට සූදානම්. ඒ සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ දැන් දියත් කරලා තිබෙනවා. ඒ අනිවාර්යයෙන්ම මේ අවුරුද්ද පුරාම අපි අත්පත් කර ගත් ජයග්‍රහණ. ඒ වාගේම, ස්ථිරසාරව, කෙටි කාලයක් තුළ ඒවා සිද්ධ කරනවා. අහිමි වෙච්ච ජීවිත හැර අනෙක් සියල්ල මේ මිහිතලය මත ප්‍රතිනිර්මාණය කරන්න සූදානම් ශක්තිය සහ බලය අපි සතු බව ජනතාවත් විශ්වාස කරනවා, ඒ වාගේම ඒක අනාගතය විසින් සනාථ කරනවා ඇති.

ඊළඟට, මම තවත් කාරණාවකට යොමු වෙන්න කැමැතියි. මේ ආබාධ සහිත ප්‍රජාවට ජාත්‍යන්තරයෙන් දීලා තිබෙන ඉලක්කය සාක්ෂාත් කර ගන්න නම්, අපට අනිවාර්යයෙන්ම නෛතික පසුබිමක් තුළ අයිතිවාසිකම් සහිත ප්‍රජාවක් ගොඩ නඟන්න අවශ්‍ය වෙනවා. ඒක තමයි, අන්තර්කරණයේ පදනම හා මූලික හරය වන්නේ. ඒ සඳහා අපි ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ පනත යාවත්කාලීන කිරීමේ කර්තව්‍යයට ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒක ක්‍රියාවට නංවා තිබෙනවා. කලින් වතාවලදී සඳහන් කළා වාගේම, ඒක අනිවාර්යයෙන්ම ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට සමපාතයි, ඒ අයිතිවාසිකම්වලට සමපාතයි. ඔවුන් ඉදිරිපත් කරලා තිබෙන රාජ්‍ය ව්‍යුහවලට සමපාතව තමයි අපි ඒක ඉදිරිපත් කරලා තිබෙන්නේ.

අනෙක් පැත්තෙන් ඉතාම වැදගත් දෙයක් තමයි, බිහිරි ප්‍රජාව වෙනුවෙන් තිබෙන සංඥා භාෂා පනත. ඒ පනතත් නොබෝ දිනකින් පාර්ලිමේන්තුවේ සම්මත කරමින්, ආබාධ සහිත ප්‍රජාවගෙන් විශාල කණ්ඩායමක් වන බිහිරි ප්‍රජාවගේ සන්නිවේදන බාධාව ඉවත් කරන්න අපි කටයුතු කරනවා. ගරු සභාපතිතුමනි, ඒ එක්කම ඉතාම වැදගත් කාරණාවක් ඔබතුමාට කියන්න කැමැතියි. ඒ තමයි, ආපදාවට ලක් වෙච්ච බිහිරි ප්‍රජාවට පණිවුඩ සන්නිවේදනය කරන්න, ජාතික රූපවාහිනිය ඇතුළු සමහර මාධ්‍ය නාළිකා යම් මට්ටමක උත්සාහයක් දැරුවා. හැබැයි, සංඥා භාෂාවෙන් ඒ පණිවුඩය පෘථුල විධියට ව්‍යාප්ත වෙන්න අවකාශය තිබුණේ නැහැ. ජනමාධ්‍ය ආයතනවලින් ඉතාම ඕනෑකමින් මේ දේ ඉල්ලන්න කැමැතියි. මේ බිහිරි ප්‍රජාවට ඔබ කියන වචන ඇහෙන්නේ නැහැ. නමුත් ඔබ පෙන්වන රූපවලින් යම් තේරුමක් ගන්න පුළුවන්. හැබැයි, අපි යෝජනා කරනවා, ආපදා තත්ත්වයක් හමුවේ සියලු නාළිකාවලින් සංඥා භාෂාවෙන් ප්‍රවෘත්ති ප්‍රචාරය වෙනවා නම්, ලක්ෂ 4කට අධික බිහිරි ප්‍රජාවට මේ ආපදා තත්ත්වය තේරුම් ගන්න, ඉන් අත් මිදෙන්න අවකාශ සැලසෙයි කියලා. දැනුත් ඊට ප්‍රමාද නැහැ. රජයක් විධියට සමස්ත ශ්‍රී ලාංකීය ප්‍රජාවට දෙන සහන සහ ඔවුන් පුනරුත්ථාපනය කරන්න, ඔවුන් බලගන්වන්න, ඔවුන්ට නැවත ජීවිතය ලබාදෙන්න දරන

උත්සාහය සංඥා භාෂාවෙන්ද ප්‍රචාරය කරන්න කියලා ජනමාධ්‍ය ආයතනවලින් ඉතාම ඕනෑකමින් ඉල්ලා සිටිනවා. ඇත්ත තමයි, ඔබ ජනමාධ්‍යවේදීන් විධියට විශාල උත්සාහයක් දරනවා විපතට පත් වෙච්ච ප්‍රජාව ඉන් අත්මුදා ගන්න. සහනාධාර එකතු කරමින්, ඒවා බෙදා හරිමින් ඔවුන්ට අවශ්‍ය පණිවුඩ ලබා දෙමින් ඔබ විශාල කර්තව්‍යයක් කරනවා. ඒකට අපේ ගෞරවය පිරිනමන ගමන්ම ආබාධ සහිත ප්‍රජාව අතර සිටින බිහිරි ප්‍රජාවට මේ පණිවුඩය සම්ප්‍රේෂණය කරන්නත් ඉදිරිපත් වෙන්න කියා මම ඉතාම ඕනෑකමින්, ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. අනෙක් පැත්තෙන්, ක්ෂේත්‍ර නිලධාරින්ගෙන් මා විශේෂ ඉල්ලීමක් කරන්න ඕනෑ. ආබාධ සහිත පුද්ගලයා ඔබ වෙතට එන්න කලින් ඔබ ඔවුන් වෙතට යන්න. ඔවුන්ට මේ ස්වාභාවික විපත්තිය හේතුවෙන් පැමිණ තිබෙන භෞතික බාධා එක්ක ඒ තත්ත්වය ඉතාම උග්‍ර කරලා තිබෙනවා. මහාමාර්ග පද්ධති විනාශ වෙලා, පාලම් විනාශ වෙලා ප්‍රවාහනය අඩාළ වෙලා තිබෙනවා. එම නිසා ඔබ ඔවුන් වෙත යන්න. ඔවුන්ගේ අවශ්‍යතා හඳුනා ගනිමින් ඒවා අමාත්‍යාංශයට වාර්තා කරන්න; රජයට වාර්තා කරන්න; අත්‍යවශ්‍ය කාරණාවලට මැදිහත් වෙන්න; රාජ්‍ය ආයතනවලට අදාළ යොමු කිරීම් කරන්න. ඒ හරහා මේ විපතට පත් වෙච්ච ප්‍රජාව අතර සිටින අන්ත විපතට පත් වෙච්ච ප්‍රජාව වන ආබාධ සහිත ප්‍රජාවට ජීවිතය ලබා දෙන්න ඔබට පුළුවන්; සහනය ලබා දෙන්න පුළුවන්; අස්වැසිල්ල ලබා දෙන්න පුළුවන්. ඒක අපේ වගකීමක්.

ඒ වගකීම රාජ්‍ය නිලධාරින් විසින් ඉතාම ඉහළින් ඉටු කරමින් පවතින බව අපට වාර්තා වෙනවා. දිසාපතිවරුන්, ක්ෂේත්‍ර නිලධාරින් සහ අමාත්‍යාංශවල සියලු නිලධාරින් ඒ ප්‍රජාව කෙරෙහි විශේෂ අවධානයකින් වැඩ කරන බව අපි දන්නවා. හැබැයි, මා නැවත නැවත ඉල්ලා සිටින්නේ ඒ අවධානය තව තවත් ගැඹුරු කරමින්, තව තවත් පෘථුල කරමින් අවධාරණාත්මකව ඔවුන් වෙත යන්න කියලායි. ඔවුන් ඔබ එනතුරු බලාගෙන ඉන්නවා. එළඹී තිබෙන මේ ආපදා තත්ත්වය හමුවේ ඔවුන්ට ඔබ වෙත පැමිණීමට ඇති නොහැකියාව හැම තැනින්ම ප්‍රකාශයට පත් වෙනවා. ඒ බාධක ඉවත් කරන්න ඔබටයි ප්‍රවේශ විය හැක්කේ. ඒ සඳහා මා ඔබට ගෞරවයෙන් ආරාධනා කර සිටිනවා, ආබාධ සහිත පුද්ගලයන්ගේ ජාත්‍යන්තර දිනය වන අද දවසේ. ඒ හරහා තමයි අපට අර කියපු සමාජය ගොඩ නඟන්න පුළුවන් වෙන්නේ; අන්තර්කරණය ගොඩ නඟන්න පුළුවන් වෙන්නේ; ආබාධ සහිත ප්‍රජාව කිසිසේත් අත් නොහැර යන ගමනක සන්ධිස්ථාන සලකුණු කරන්න සහතික කරන්න පුළුවන් වෙන්නේ. ඒ සඳහා රජයේ කැපවීම, රජයේ මැදිහත්වීම තීරණාත්මකව සිද්ධ වන අතර, සමස්ත රාජ්‍ය යන්ත්‍රණය, ස්වේච්ඡා සංවිධාන, ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ සංවිධාන යන මේ සියලු කණ්ඩායම් එක මිටට එකතු වෙලා මේ විපත්තියෙන් ආබාධ සහිත කණ්ඩායම් බේරා ගනිමු. ඔවුන්ට හුදෙකලා වෙන්න අවස්ථාව නොදී ඔවුන් අපේ තුරුලට ගනිමු. අපි සියලුදෙනා -ශ්‍රී ලාංකීය ප්‍රජාව- මේ විපතින් පරාජයට පත් නොවී, විනාශයට පත් නොවී, එකම ජාතියක් විධියට, එකම ජන සමූහයක් විධියට අනිවාර්යයෙන් ගොඩ නැඟෙමු. ඒ ආදර්ශය සැපයීමේ ගාමක බලවේගය, විභව ශක්තිය ශ්‍රී ලාංකීය ජනතාව තුළ තිබෙන බවත්, ඒ සඳහා අවශ්‍ය දේශපාලන නායකත්වය ගරු ජනාධිපතිතුමා ඇතුළු ජාතික ජන බලවේගය රජය සපයන බවත් සහතික කරමින්, මට මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් බෙහෙවින්ම ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Mujibur Rahuman. You have 10 minutes.

[පූ.භා. 10.00]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු සභාපතිතුමනි, ස්තුතියි මට මේ අවස්ථාව ලබා දුන්නාට.

විශේෂයෙන්ම "දිට්වා" සුළි කුණාටුව සමඟ රටේ ඇති වෙලා තිබෙන ගංවතුර ව්‍යසනයෙන් මේ වනකොට මරණ 465ක් වාර්තා වෙනවා; අතුරුදහන්වීම් 366ක් වාර්තා වෙනවා; ලක්ෂ 15කට වැඩි පිරිසක් අවතැන් වෙලා සිටිනවා; පීඩාවට පත් වෙලා සිටිනවා. ඒ පවුල්වල සියලුදෙනාට මේ අවස්ථාවේ අපේ ශෝකය පළ කරනවා. ඒ වාගේම, මෙම අවස්ථාවට මැදිහත් වෙලා ජනතාව මුදා ගන්න කටයුතු කරපු සිවිල් සංවිධාන, රාජ්‍ය නිලධාරින්, හමුදාව, පොලීසිය ඇතුළු සියලු අයට අපි මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා.

ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව යම් යම් කරුණු කාරණා මාධ්‍යවල පළ වෙන්න පටන්ගෙන තිබෙන බව අපි දකිනවා. ඒ අනුවත් අපට පෙනෙන්න තිබෙනවා, මේ කාරණය කලින් දැනගෙන හිටියාද, නොදැන හිටියාද කියන විවාදයක් මතු වෙලා තිබෙන බව. නොවැම්බර් මාසයේ 12වැනි දා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා යම් යම් මාධ්‍යවලට ප්‍රකාශයක් කරනවා අපි දැක්කා, මෙවැනි සුළි කුණාටුවක් එන්න තිබෙනවා කියලා. ඒ වාගේම ජාත්‍යන්තර මාධ්‍යවල - BBC, CNN වාගේ මාධ්‍යවල - පවා කිව්වා, ලංකාවට ලැබෙන්න යන වර්ෂාපතනය පිළිබඳව. ඔවුන් අදහස් දැක්වූවා, මිලිමීටර් 500ක වර්ෂාපතනයක් ලැබෙන්න පුළුවන් කියලා. අපට තිබෙන ප්‍රශ්නය තමයි, එහෙම නම් ආණ්ඩුව මේක දැනගෙන හිටියාද නැද්ද කියන එක. ඒ වාගේම කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් ආණ්ඩුවට මේ ගැන වාර්තා කළාද නැද්ද කියන එක. ඒ සම්බන්ධයෙන් ආණ්ඩුව පැත්තෙන් තවම නිල වශයෙන් නිසියාකාර උත්තරයක් දෙන්නේ නැහැ. ආණ්ඩුව මේ සම්බන්ධයෙන් නිශ්ශබ්දතාව රකිනවා. ඒ කාල පරිච්ඡේදය තුළ - 27වැනි දා වනකල්- ජනාධිපතිතුමා මේ සම්බන්ධයෙන් ගත්තා වූ ක්‍රියාමාර්ගයක් ගැන මාධ්‍ය තුළින් අපි දැක්කේ නැහැ. විශේෂයෙන් ජනාධිපතිතුමා හිටියේ නොයෙකුත් ආකාරයේ සාකච්ඡාවල. සිනමාකරුවන් එක්ක සාකච්ඡාවල එතුමා හිටියා. එතුමා නොයෙකුත් විෂයයන් සම්බන්ධ සාකච්ඡාවල හිටියා මිසක්, මේ තත්ත්වය ඇති වුණාට පසුව ඇති වූ සාකච්ඡාවල හිටියා මිසක් මේ තත්ත්වය ඇති වෙන්න කලින් පෙර සූදානමක් ගැන සාකච්ඡාවක හිටියේ නැහැ, සාකච්ඡා කළේ නැහැ. ඒ හින්දා තමයි අපි මේ දේවල් අහන්නේ.

දැන් තිබෙන ප්‍රශ්නය මොකක්ද? අපි සියලුදෙනාම දන්නවා, මේ වාගේ ස්වාභාවික විපත් අපට නවත්වා ගන්න බැහැ කියලා. ඒක ඇත්ත. ලෝකයේ දියුණු තාක්ෂණය තිබෙන ඇමෙරිකාව වාගේ රටවල පවා මේ වාගේ සුළි කුණාටු ඇති වෙලා විශාල හානි සිදු වෙනවා. දියුණු තාක්ෂණය තිබුණත් එහෙම වෙනවා. අපට කරන්න තිබුණු එකම දේ ඒකෙන් වන හානිය අවම කර ගන්න පුළුවන් වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන එක විතරයි. නමුත් ඒක අවම කර ගන්න පුළුවන් සාකච්ඡාවක් ආණ්ඩුව තුළ ඇති වුණාද, නැද්ද කියන එක තමයි තිබෙන ගැටලුව. එහෙම නැතුව, මේ සුළි කුණාටුව වෙන කොහේට හරි හරවන්න තිබුණා, එහෙම නැත්නම් ඒක එන එක නවත්වන්න තිබුණා වාගේ කථා නොවෙයි අපි මේ කියන්නේ. අපි අහන්නේ, මේ වෙච්ච හානිය අවම කර ගන්න පුළුවන් සැලැස්මක් ආණ්ඩුවට තිබුණාද කියලායි. එහෙම සැලැස්මක් තිබුණේ නැහැ. ඒ හින්දා තමයි දැන් අපට සොයන්න වෙලා තිබෙන්නේ කොහොමද එහෙම වුණේ කියන එක. මේ ගැන නිලධාරින් ආණ්ඩුවට කිව්වේ නැද්ද, නිලධාරින් කියලාත්

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

රජය ක්‍රියාත්මක වුණේ නැද්ද කියන එක හොයන්න විශේෂ කාරක සභාවක් පත් කරන්න කියලා මේ පාර්ලිමේන්තුවට මම යෝජනා කරනවා, ගරු සභාපතිතුමනි. විශේෂ කාරක සභාවක් පත් කරලා, කොහෙන්ද මේ වරද සිද්ධ වුණේ කියන එක හොයන්න. මොකද, අනාගතයේදී මෙවැනි දේවල් නොවන ලෙස කටයුතු කරන්න ඒ කරුණු කාරණා හෙළිදරව් කර ගැනීම අපට වැදගත් වෙන නිසා.

අපි දන්නවා මුළු රටම අද මේ ව්‍යසනයට ලක් වෙලා තිබෙන බව. සමහර තැන්වල ගම්මාන යට වෙලා තිබෙනවා; ගම්මාන පිටින් නැති වෙලා තිබෙනවා. තවම අපි හරියටම දන්නේ නැහැ, මරණ කීයක් සිද්ධ වෙලා තිබෙනවාද කියන එක. දැන් තමයි ටික ටික කරුණු කාරණා එළියට එන්නේ. මේක මේ රටේ ඇති වෙච්ච ඉතාම බරපතළ තත්ත්වයක්. ඒ හින්දා මේකට වග කියන්න ඕනෑ කට්ටිය කවුද, මේ දේ දැනගෙන ක්‍රියාත්මක නොවුණේ කවුද කියන එක දැන ගැනීමේ අයිතිය මේ රටේ ජනතාවට තිබෙනවා. ඒක රටේ ජනතාව දැන ගන්න ඕනෑ. ඒ වාගේම මේ පාර්ලිමේන්තුවේ ඉන්න 225දෙනාටත් ඒ අයිතිය තිබෙනවා. අපිත් දැන ගන්න ඕනෑ, ඇයි ඒ වෙනුවෙන් ක්‍රියාත්මක නොවුණේ කියන එක. ගරු සභාපතිතුමනි, මම යළිත් යෝජනා කරනවා, ඒ පිළිබඳව සොයන්න විශේෂ කාරක සභාවක් පත් කරන්න කියලා.

ගරු සභාපතිතුමනි, 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත තිබෙනවා. දැන් මා අතේ මේ තිබෙන්නේ ඒ පනත. මේ පනතේ තමයි තිබෙන්නේ, ව්‍යසන කළමනාකරණය කරන්නේ කොහොමද, ඒ මුදල් එකතු කරන්නේ කොහොමද, මුදල් ලැබෙන්නේ කොහොමද කියන හැම එකක් ගැනම. මේ පනතේ 17, 17 (ඇ), 18 යන වගන්තිවල ඒ සියලු දේවල් සඳහන් කරලා තිබෙනවා. විශේෂයෙන්ම මුදල් එකතු කිරීම හා මුදල් වියදම් කිරීම සම්බන්ධව මෙහි සඳහන් කරලා තිබෙනවා. ඒ වාගේම මේ පනතේ තිබෙනවා, ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාවේ ඉන්න ඕනෑ කවුද කියන එකත්. දැන් එවැනි දේවල් තිබියදී තමයි ජනාධිපතිතුමා 'Rebuilding Sri Lanka' කියලා අරමුදලක් හදන්න කණ්ඩායමක් පත් කරලා තිබෙන්නේ. මේ පනතේ අරමුදලක් ගැන කියලා තියෙද්දී එතුමා පත් කරපු ඔය 'Rebuilding Sri Lanka' කියන අරමුදල පිළිබඳව නීතිමය ගැටලුවක් තිබෙනවා. මොකද, අපේ රටේ ආපදා කළමනාකරණය කරන්න මේ පාර්ලිමේන්තුව හදපු නීතිමය පනතක් තිබියදී, ජනාධිපතිතුමා තමන්ගේ බලය, තමන්ගේ විධායක බලය පාවිච්චි කරලා ඊට පිටින් ගිහිල්ලා හදනවා වෙන අරමුදලක්. ඒකේ කවුද ඉන්නේ? ඒකට වෙනම කට්ටියක් එතුමා පත් කරලා තිබෙනවා. විශේෂයෙන්ම එතුමාගේ උපදේශකයෝ ටිකක්, එතුමා එක්ක ඉන්න ව්‍යාපාරිකයෝ ටිකක් ඒකට දාලා තිබෙනවා. එහි ඉන්නවාද, විශේෂයෙන් ආපදා පිළිබඳ දැනුමක් තිබෙන විශේෂඥයන්? එහෙම අය නැහැ. එහි වෛද්‍යවරු නැහැ, ඉංජිනේරුවරු නැහැ. එහි සංයුතිය දිහා බැලුවාම පෙනෙනවා, අඩුම ගාණේ Auditor-Generalවත් නැති බව. එතුමා අනිවාර්යයෙන්ම ඉන්න ඕනෑ. අඩුම ගාණේ විශ්‍රාම ගිය විගණකාධිපතිවරයෙකු හරි ඉන්න ඕනෑ. එහෙම කෙනෙක්වත් එහි නැහැ. ඒ වාගේම, පීඩාවට පත් වෙච්ච කෙනෙක්වත් එහි නැහැ. ඒ කියන්නේ, පීඩාවට පත් වෙච්ච අයගේ නියෝජිතයෙක්වත් එහි නැහැ.

ඉස්සර ඡන්ද කාලේ තමුන්නාන්සේලා කිව්වා, "එක මිටට කාන්තාවන් අනුරට" කියලා. මෙහිදී දැන් එක මිටට කාන්තාවන් අතහැර දාලා තිබෙනවා. දැන් එක මිටට කාන්තාවන් නැහැ. ඒ අය අතහැර දාලා තිබෙනවා. කවුද ඒකට පත් කරලා ඉන්නේ? ව්‍යාපාරිකයෝ. ධාරිතාව වෙනස් කරලා වාහන ගෙනැල්ලා දැන් උසාවියේ නඩු යන ව්‍යාපාරිකයෝත් එහි ඉන්නවා. වාහනවල ධාරිතාව වෙනස් කරලා ගේමක් ගහන්න ගිහිල්ලා අහු වුණා. එහෙම අහු වෙලා දැන් Appeal Court එකේ නඩු යනවා. දැන් එයාත් ඉන්නවා ඔය කමිටුවේ. ඒ චෝදනාවට ලක් වුණු කෙනෙක්. ඊළඟට, මන්නාරමේ සුළං විදුලි බලාගාර හදන්න ගිහිල්ලා, පරිසරය දූෂණය කළාය කියන චෝදනාවට ලක් වෙච්ච අයත් ඒක ඇතුළේ ඉන්නවා. ඒ ඔක්කෝම ඉන්නවා. ධම්මික පෙරේරා විතරයි නැත්තේ. *[බාධා කිරීමක්]* මම දන්නේ නැහැ ජනාධිපතිතුමාට ඇයි ධම්මික පෙරේරා අමතක වුණේ කියලා. *[බාධා කිරීමක්]* හේලීස් එකේ එක්කෙනෙක් දාලා තිබෙනවා. නමුත් ධම්මික පෙරේරා නේ එතුමාගේ ළඟම මිත්‍රයා. එතුමාත් දා ගන්න තිබුණා, නේද?

දැන් මේ හදලා තිබෙන කමිටුව බැලුවාම, මේකේ නීත්‍යානුකූලභාවය පිළිබඳ ගැටලුවක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, අපට අත්දැකීම් තිබෙනවා. අපි දන්නවා, "Helping Hambantota"ට මොකද වුණේ කියලා. ඒක, අපි සියලුදෙනාම දන්නවා. ගෝඨාභය රාජපක්ෂත් මේ වාගේම fund එකක් හැදුවා, "Itukama" කියලා. ඒ fund එකට මොකද වුණේ? ඒකේ සල්ලි තිබෙනවාද නැද්ද? ඒක කොවිඩ් වසංගතය කාලයේ හැදුවේ. දැන් ඒක තිබෙනවාද? ඒ වාගේම අපි කවුරුත් නොදන්න, fund එකකුත් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, you have two more minutes.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු ගයන්ත මන්ත්‍රීතුමනි, මට තව විනාඩි කිහිපයක් ලබා දෙන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු මන්ත්‍රීතුමාට විනාඩි 2ක් ලබා දෙනවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
අපි නොදන්න fund එකක් තිබෙනවා. සුනාමි කාලයේ හැදුවා "රතු තරුව" කියලා සුනාමි අරමුදලක්. දැන් ඒකත් නැහැ. ඒකේ website එක වැඩ කරන්නෙත් නැහැ. ඒ fund එකට මොකද වුණේ? ඒ විධියට අපට මේ funds ගැන අත්දැකීම් තිබෙනවා. එක එක්කෙනා ඇවිල්ලා funds හදලා, වෙන වෙන දේවල් කරනවා. පාර්ලිමේන්තුව විසින් අනුමත කරපු නීති සම්ප්‍රදායක් මේ රටේ තිබෙනවා. ඒ නීති අනුව වැඩ කරන්න කියලා අපි ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, පසුගිය 28වැනි දා හදිසි නීතිය දැම්මා. හදිසි නීතිය දමලා ජනාධිපතිතුමා ජාතිය අමතලා කිව්වා, අපි හදිසි නීතිය පාවිච්චි කරන්නේ මේ මේ දේවල් කරන්න කියලා. ඒ වාගේම කිව්වා, මේ සහන සේවා මර්දනය කරන්න එය පාවිච්චි කරන්නේ නැහැ කියලා. අපි වටගල නියෝජ්‍ය ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මොකද, එතුමා ඊයේ බංකු අරගෙන ආපු නිලධාරින් ළඟින් තබාගෙන හදිසි නීතිය ගැන කියලා දුන්නා. නිලධාරින් බංකු අරගෙන ගිහිල්ලා වටගල නියෝජ්‍ය ඇමතිතුමා කියන දේවල් අහගෙන හිටියා. එතුමා කියන්නේ මොකක්ද? එතුමා පොලිස් නිලධාරින්ට උපදෙස් දුන්නා, සමාජ මාධ්‍යවලට සහ අනෙකුත් මාධ්‍යවලට විරුද්ධව action ගන්න කියලා. ඒ ඇයි?

අපට පෙනෙනවා, ජනාධිපතිතුමා ජනතාවට එකක් කියලා, ඇමතිවරු දෙන්නෙක් යවනවා පොලිස් නිලධාරීන් දැනුවත් කරන්න ආණ්ඩුවට විරුද්ධව මාධ්‍යවල පළකරන ඒවා වෙනුවෙන් action ගන්න. ඒක ඉතාම භයානකයි. මේ මොකක්ද කරන්න හදන්නේ? මේ කරන්න හදන්නේ, සාමාන්‍ය නීතියෙන් කරන්න බැරි දේ හදිසි නීතිය යටතේ කරන්න. ආණ්ඩුවට විරුද්ධව කථා කරන ඒවා, කරුණු හෙළිදරව් කරන ඒවා මර්දනය කරන්න තමයි මේ ලෑස්ති වෙන්නේ. මේක ඉතාම භයානක ගමනක්.

ගරු සභාපතිතුමනි, අපි පසුගිය කාලයේ දැක්කා, මේ ඉස්සරහ පේළියේ ඉන්න ඔක්කෝම ඇමතිවරු ශානි ළඟට දුවපු හැටි. අඬාගෙන ගියා, "ශානි, මේ බලන්නකෝ අපට කරලා තිබෙන දේවල්" කියලා. හැබැයි, ශානි මොකුත් කළේ නැහැ. මොකද, ශානි දන්නවා මේවා කරන්න ගියොත් ගා ගන්න වෙනවා කියලා. ඒ නිසා ශානි මොකුත් කළේ නැහැ. ඒ නිසා මේගොල්ලන්ට තේරුණා ශානි ළඟට ගිහිල්ලා වැඩක් වෙන්නේ නැහැ කියලා. ඒ නිසා මේගොල්ලෝ බලනවා, හදිසි නීතිය පාවිච්චි කරලා මේ රටේ මාධ්‍ය නිදහස සහ ජනතාවගේ කථා කිරීමේ නිදහස යටපත් කරලා, ඇත්ත තොරතුරු වසන් කරලා, සමාජ මාධ්‍යවල ක්‍රියාකාරීන් සහ අනෙකුත් මාධ්‍ය භය කරන්න. ඒකට ඉඩ දෙන්න බැහැ ගරු සභාපතිතුමනි. මේ ආණ්ඩුව විශේෂයෙන්ම ජනතාවට දීපු පොරොන්දුවක් තමයි, මාධ්‍යයට තිබෙන තහංචි අයින් කරනවා කියන එක, Online Safety Act එක අයින් කරනවා කියන එක. මේවා තමයි මැතිවරණ වේදිකාවල කිව්වේ. දැන් අපට පෙනෙනවා, මර්දන නීති ඉවත් කරනවා කියපු ආණ්ඩුව, මේ නීති පාවිච්චි කරලා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය, මාධ්‍ය නිදහස සහ කථා කිරීමේ නිදහස හකුළන්න උත්සාහ ගන්න බව. ඒ නිසා ගරු සභාපතිතුමනි, අපි ආණ්ඩුවට කියන්න ඕනෑ,-

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is over.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු සභාපතිතුමනි, මම ඉක්මනින් අවසන් කරනවා.

ජනාධිපතිතුමා මාධ්‍යවලට ඇවිල්ලා හැමතිස්සේම කියනවා, එතුමාට සහයෝගය දෙන්න, එතුමා එක්ක වැඩ කරන්න කියලා. ගරු සභාපතිතුමනි, අපි මේ වෙලාවේ මේ රට ගොඩ නඟන්න විපක්ෂය හැටියට ඕනෑම කැපකිරීමක් කරන්න ලෑස්තියි. අපි ජනාධිපතිතුමාට යෝජනා කරනවා, විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන්ටත් මේ රට ගොඩ නඟන්න පුළුවන් විධියේ වැඩසටහනක් එක්ක පොදු යන්ත්‍රණයක් ගොඩ නඟන්න කියලා. එසේ කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The next speaker is the Hon. Kathiravelu Shanmugam Kugathasan. You have ten minutes.

[மு.ப. 10.11]

**ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා**
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)
மாண்புமிகு தவிசாளர் அவர்களே, நிதி திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சைப் பற்றிப் பேசுவதற்கு முன்பு, தற்போது திருகோணமலையில் ஏற்பட்டிருக்கின்ற நிலவரம் தொடர்பாக ஓரிரு மணித்துளிகள் பேசிவிட்டு, அதைத் தொடரலாம் என நினைக்கின்றேன். அண்மையில் ஏற்பட்ட டித்வா புயல் மற்றும் வெள்ளப்பெருக்கு ஆகியவற்றால் திருகோணமலை மாவட்டத்தில் உள்ள 11 பிரதேச செயலாளர் பிரிவுகளும் பாதிக்கப்பட்டுள்ளன. அண்ணளவாக, 23,000 குடும்பங்களைச் சேர்ந்த 75,000 பேர் பாதிக்கப்பட்டுள்ளனர். இவர்களில் 18,000 குடும்பங்களைச் சேர்ந்த 60,000 பேர் இடைத்தங்கல் முகாம்களுக்குச் செல்லாது நண்பர்கள், உறவினர்கள் வீடுகளிலும் மற்றும் பாதுகாப்பான இடங்களிலும் தங்கியுள்ளார்கள். 6,615 குடும்பங்களைச் சேர்ந்த 11,260 பேர் 75 இடைத்தங்கல் முகாம்களில் தங்கியுள்ளார்கள். 620 வீடுகள் பகுதியாக அல்லது முழுமையாகச் சேதமடைந்துள்ளன. 23,000 வீடுகளுக்குள் நீர் புகுந்து, அந்த வீட்டில் இருந்த பொருட்கள் அனைத்தும் பாவனைக்கு ஒவ்வாத நிலையை அடைந்துள்ளன. அண்ணளவாக ஓரிலட்சம் ஏக்கரில் மேற்கொள்ளப்பட்ட நெற்செய்கை முழுமையாக அழிந்துபோயுள்ளது. சில ஆயிரக்கணக்கான கால்நடைகள் வெள்ளத்தில் அடித்துச்செல்லப்பட்டுள்ளன. இந்தச் சூழலில் வெள்ளத்தால் பாதிக்கப்பட்ட கிழக்கு மாகாண மக்களுக்கு உடனடியாக நிவாரணப் பொருட்களை அனுப்பிவைத்த இந்திய அரசுக்கு எனது உளமார்ந்த நன்றியைத் தெரிவித்துக்கொள்ளுகின்றேன். அதேபோல, இலங்கை அரசானது பேரிடருக்கான நிவாரணத்துக்கான நிதியை ஒதுக்கியமைக்கு மிகுந்த நன்றியைக் கூறிக்கொள்ளுகின்றேன். எனினும், இந்த உதவிகள் மக்களைச் சென்றடைவதில் பல சிக்கல்கள் காணப்படுகின்றது. எடுத்துக்காட்டாக, திருகோணமலை மாவட்டத்தில் கிராம அலுவலர் பற்றாக்குறை காரணமாக ஒரு கிராம அலுவலர் ஒன்றுக்கு மேற்பட்ட கிராம அலுவலர் பிரிவுகளுக்குப் பொறுப்பாக உள்ளார். அவரால் இந்தப் பேரிடர் காலத்தில் இரண்டு பிரிவுகளில் உள்ள மக்களுக்கும் வினைத்திறனான சேவையை வழங்க முடியாதுள்ளது. இந்தக் கிராம அலுவலர் பற்றாக்குறையைத் தீர்க்க அரசு உடனடியாக ஆவன செய்யவேண்டும் என்று கேட்டுக்கொள்ளுகின்றேன்.

இந்தப் பேரிடர் காரணமாக மூதூர், குச்சவெளி, வெருகல், கிண்ணியா சேருவில ஆகிய 5 பிரதேச செயலாளர் பிரிவுகள் மிக மோசமாகப் பாதிக்கப்பட்டுள்ளன. இப்பகுதியில் வழமையாகப் பணி செய்கின்ற கிராம அலுவலர், பொருளாதார அபிவிருத்தி அலுவலர், அனர்த்த முகாமைத்துவ அலுவலர் முதலியோரால் தரவுகளைத் திரட்டுதல், சேதங்களை மதிப்பிடுதல், நிவாரணங்களை வழங்குதல் முதலிய பணிகளைக் குறுங்காலத்தில் வினைத்திறனோடு செய்ய முடியாதுள்ளது. எனவே, பிற திணைக்களங்களிலுள்ள அரச அதிகாரிகளைத் தற்காலிகமாக இவர்களோடு இணைத்துப் பணியாற்ற அனுப்பி, சிக்கலைத் தீர்க்க விரைவாக ஆவன செய்யவேண்டும் என்று அரசைக் கேட்டுக்கொள்ளுகின்றேன்.

பேரிடரால் ஏற்பட்ட வெள்ளப்பெருக்கு இப்பொழுது வடியத் தொடங்கியுள்ளது. வெள்ளம் வடிந்த பின்னர் தொற்றுநோய்கள் பரவுவதற்கான வாய்ப்புகள் அதிகம் உள்ளதாக மருத்துவர்கள் கூறுகின்றார்கள். எனவே, இதனை வருமுன் காக்க சுகாதார அமைச்சு ஆவன செய்யவேண்டும். சுகாதார அமைச்சானது தனது ஊழியர்களை அவசரகால நிலை அடிப்படையில் பணியாற்றப் பணியகம் அமைத்திருக்க வேண்டும் என்று கூறி, இந்த மக்களுடைய இடரைத் துடைக்க அயராது பாடுபடுகின்ற அதிகாரிகள் அனைவருக்கும் நன்றி தெரிவித்துக்கொண்டு, இன்றைய விவாதத்துக்குச் செல்லலாம் என்று நினைக்கின்றேன்.

[ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා]

மாண்புமிகு தவிசாளர் அவர்களே, நிதி திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சானது அரச நிறுவனங்களுக்கான நிதியை மதிப்பிடுதல், முன்னுரிமை அளித்தல், விடுவித்தல், கருவூல உத்தரவாதங்களை வழங்குதல், அரசின் கடன்கள் மற்றும் கடன் திருப்பிச் செலுத்துதல் தொடர்பாக நுட்பமாகக் கணக்கிடுதல் முதலிய முதன்மையான பொறுப்புகள்மூலம் நாட்டின் சீரான பொருளாதாரச் செயற்பாட்டை உறுதி செய்கின்றது. இந்த அரசால் முன்வைக்கப்பட்டுள்ள 2026ஆம் ஆண்டுக்கான பாதீட்டில், நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சுக்கு மீண்டெழும் செலவுக்காக 344 பில்லியன் ரூபாயும் மூலதனச் செலவுக்காக 291 பில்லியன் ரூபாயுமாக மொத்தம் 635 பில்லியன் ரூபாய் நிதி ஒதுக்கப்பட்டுள்ளது. இது மொத்தப் பாதீட்டில் 14.3 வீதமாகும். கடந்த ஆண்டோடு ஒப்பிடும்பொழுது இது 0.9 வீத வீழ்ச்சியைக் காட்டுகின்றது. இதனைப் பணவீக்க நிலைமைக்குச் சீராக்கும்பொழுது இதன் வீழ்ச்சி இன்னும் அதிகமாகும். இந்தக் குறைப்பானது, ஒட்டுமொத்தத்தில் அரசு பேரினப் பொருளாதார உறுதிப்பாட்டை ஏற்படுத்தும் நோக்கோடு செலவுக் குறைப்பையும், அதிகரித்த முதலீட்டு அபிவிருத்தி இலக்கை அடிப்படையாகக் கொண்டு இறைக் கொள்கையையும் மேற்கொண்டிருப்பதைக் காட்டுகின்றது.

மாண்புமிகு தவிசாளர் அவர்களே, இந்த அமைச்சானது பொருளாதார உறுதிப்படுத்தல் மற்றும் சமூக நலன்களை இலக்காகக் கொண்டுள்ளது. சமூகப் பாதுகாப்பு மற்றும் நலன்புரி 'அஸ்வெசும' திட்டத்தின்மூலம் குறைந்த வருமானம் கொண்ட குடும்பங்களுக்கான நிதி உதவித் திட்டத்தை மேலும் வலுப்படுத்தவும், பயனாளிகளின் எண்ணிக்கையை அதிகரிக்கவும் நிதி ஒதுக்கீடு செய்யப்பட்டுள்ளமை வரவேற்கத்தக்க ஒன்றாகும். எனினும், வட, கிழக்குப் பிரதேசங்களைப் பொறுத்தவரையில் அண்ணளவாக 90,000 பெண் தலைமைதாங்கும் குடும்பங்கள் உள்ளன. இவர்களை இத்திட்டத்தில் உள்வாங்குவதற்கான சிறப்பு வேலைத்திட்டங்கள் இப்பாதீட்டில் உள்ளடக்கப்படாமை ஒரு பெரும் குறைபாடாகும்.

அரச கடன் பெறல் வரையறையைக் குறைப்பதற்கான முன்மொழிவானது அரசாங்கத்தின் நிதி ஒழுக்கத்தைக் குறிக்கிறது. இது பன்னாட்டுக் கடன் வழங்குநர்கள் மற்றும் முதலீட்டாளர்களுக்கு நம்பிக்கையை ஏற்படுத்தும். சுய தொழில் மற்றும் சிறு மற்றும் நடுத்தரத் தொழில் முயற்சிகளுக்குக் கடன்கள் மற்றும் நிதியுதவி வழங்குவதற்குக் குறிப்பிடத்தக்க ஒதுக்கீடுகள் உள்ளன. இது உள்ளூர்ப் பொருளாதார வளர்ச்சிக்கு ஊக்கமளிக்கும். மேலும், எண்மியப் பொருளாதாரத்தை ஊக்குவிப்பதற்கான புதிய நிதியங்களை நிறுவுதல் மற்றும் மெய்நிகர் சிறப்புப் பொருளாதார வலயங்களை உருவாக்குதல் முதலிய திட்டங்கள் நாட்டை நவீன மயமாக்குவதற்கும் வெளிநாட்டு முதலீட்டை ஈர்ப்பதற்கும் உதவலாம்.

உள்நாட்டு இறைவரித் திணைக்களத்தை ஒரே வளாகத்துக்குள் கொண்டுவர 2,000 மில்லியன் ரூபாய் ஒதுக்கீடு செய்திருப்பது, வரிச் சேகரிப்புச் செயன்முறையை எளிதாக்கி, நிருவாகத் திறனை மேம்படுத்தும். புதிய மற்றும் திருத்தப்பட்ட வரி விதிப்பு முறைகள்மூலம் அரசின் வருவாயை அதிகரிப்பதற்கான கவனம் செலுத்தப்பட்டுள்ளது. இது நாட்டின் நிதிநிலை உறுதித் தன்மைக்கு இன்றியமையாத தாகும். எனினும், பின்வரும் விமர்சனங்களையும் நான் முன்வைக்க விரும்புகிறேன்.

போரினால் பாதிக்கப்பட்ட வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களுக்கான முதன்மையான உட்கட்டமைப்பு அபிவிருத்தி மற்றும் பொருளாதார மீட்சித் திட்டங்களுக்கு நேரடியான பெயர்குறித்த ஒதுக்கீடுகள் குறைவாகவே உள்ளன அல்லது பொதுத் திட்டங்களுக்குள் அடக்கப்பட்டுள்ளன. இந்த மாகாணங்களுக்கான சிறப்புத் தேவைகளான மீள்குடியேற்றச் செயற்பாடுகளை விரைவுபடுத்தல், தொழில்வாய்ப்புகளை உருவாக்குதல், கைத்தொழில் மயமாக்கல் ஆகியவற்றுக்கான போதுமானளவு திட்டங்கள் உள்வாங்கப்படாமை அப்பகுதி மக்களுக்குப் பாரிய ஏமாற்றமளிப்பதாகவே காணப்படுகின்றது.

அரசின் வருவாயை அதிகரிக்கக் கொண்டுவரப்பட்டுள்ள புதிய வரிகள் மற்றும் வரித் திருத்தங்கள் பொதுமக்கள் மற்றும் தனியார் துறையினர்மீது அதிக வரிச் சுமையை ஏற்படுத்தலாம். குறிப்பாக, வருமான வரி மற்றும் சேர் பெறுமதி வரி உயர்வுகள், மக்களின் நுகர்வு மற்றும் சேமிப்புகளில் பாதிப்புகளை ஏற்படுத்தலாம் என அஞ்சப்படுகிறது. வாழ்க்கைச் செலவு அதிகரித்துள்ள நிலையில், பாதீட்டில் கொடுக்கப்பட்ட நிவாரணங்கள் போதுமானதாக இல்லை என்பதும், வரிச் சுமையால் அந்த நிவாரணங்களின் பலன் குறைந்துவிடும் என்பதும் பொதுவான விமர்சனமாகக் காணப்படுகின்றது. அந்த வகையில் பாதீட்டில் உள்ள பல்வேறு திட்டங்கள் மற்றும் ஒதுக்கீடுகளை வினைத் திறனுடனும் ஊழல் இல்லாமலும் உரிய காலத்துக்குள் நடைமுறைப்படுத்துவது இலங்கைக்கு ஒரு பெரிய அறைகூவலாக உள்ளது.

நிதி, திட்டமிடல் அமைச்சு மற்றும் பாதுகாப்பு அமைச்சுக்கு மிக அதிக நிதி ஒதுக்கீடு செய்யப்பட்டுள்ளது. இது சமூக நலன்புரித் திட்டங்கள் அல்லது ஏனைய இன்றியமையாத துறைகளுக்கான நிதியில் சமமற்ற நிலையை உருவாக்கலாம். அரசின் பாதீட்டு நிதி இலக்குகள் இருக்கும்பொழுதிலும் இந்தப் பாதீட்டால் ஏற்படும் நிதிப் பற்றாக்குறை இன்னும் அதிகமாகுமென எதிர்பார்க்கப்படுகின்றது. இதனால் எதிர்காலத்தில் அரசாங்கம் உள்நாட்டுக் கடன்களைச் சார்ந்திருக்க வேண்டிய நிலை ஏற்படலாம்.

அரசிறைக் கட்டுப்பாட்டைப் பேணும் அதேவேளையில், புதிய உள்நாட்டு மற்றும் வெளிநாட்டுத் தனியார் முதலீடுகளை ஈர்ப்பதற்கும் தொழில்வாய்ப்புகளைப் பெருக்குவதற்கும் தேவையான சலுகைகள் அல்லது புதுமையான தூண்டல்கள் பற்றிப் பாதீட்டு உரையில் போதுமான தெளிவின்மை காணப்படுவது பெரும் பலவீனமாக உள்ளது. எனவே, இதற்கான பரிந்துரைகளையும் குறிப்பிட விரும்புகிறேன்.

பொதுமக்களின் இன்றியமையாத தேவைகளுக்கான பொருட்களின்மீது விதிக்கப்படும் மதிப்புக்கூட்டு வரியைப் பகுதியளவில் குறைப்பது அல்லது கட்டுப்படுத்துவது குறித்து அரசு பரிசீலிக்க வேண்டும். இது நுகர்வோர்மீதான உடனடிச் சுமையைக் குறைக்கும். புதிய வரிகளைச் சேர்ப்பதைவிட, இப்போதுள்ள வரி முறைகளில் உள்ள கசிவுகளை அடைப்பதற்கும் வரி நிருவாகத்தின் வினைத்திறனை அதிகரிப்பதற்கும் முன்னுரிமை அளிக்கப்படவேண்டும். வரி நிருவாகத்தின் எண்மிய மயமாக்கல்மூலம் வரி ஏய்ப்பைத் தடுக்க முடியும்.

புதிய ஏற்றுமதி சார்ந்த தொழில்கள் மற்றும் தகவல் தொழில்நுட்பம் போன்ற சேவைத் துறைகளுக்கான வரிச் சலுகைகளை இலக்கிட்டு வழங்குவது, வெளிநாட்டு முதலீடுகளை ஈர்க்கவும் வேலைவாய்ப்பை உருவாக்கவும்

உதவும். அத்தியாவசியமற்ற பொதுச் செலவுகளை மேலும் குறைப்பதற்கான கடுமையான நடவடிக்கைகளை அரசு எடுக்கவேண்டும். உயர்மட்ட அமைச்சுக்களுக்கு அதிக நிதி ஒதுக்குவதைத் தவிர்த்து, நிதிப் பற்றாக்குறையைக் குறைக்கச் செலவுக் கட்டுப்பாட்டைப் பேணுவது அவசியமாவதோடு, உள்நாட்டுக் கடன் சுமையைக் குறைப்பதை இதன்மூலம் சாத்தியமாக்கலாம்.

பாதீட்டில் அறிவிக்கப்பட்ட திட்டங்களைச் செயற்படுத்துவதற்கான காலக்கெடு சார்ந்த, வெளிப்படையான கண்காணிப்புப் பொறிமுறையை நிறுவவேண்டும். இது திட்டச் செலவு அதிகரிப்பையும் ஊழலையும் தடுக்க உதவும். பொதுச் சேவைகளை விரைவாக எண்மிய மயமாக்குவதன்மூலம், அரசின் செயற்பாட்டுச் செலவுகளை கணிசமாகக் குறைப்பதோடு, சேவைகளின் வினைத்திறனையும் அதிகரிக்கலாம்.

நாட்டின் வெளிநாட்டு நாணய மாற்று வருவாயை அதிகரிக்கப் புதிய சந்தைகளோடு சார்ந்த வர்த்தக ஒப்பந்தங்களை உருவாக்குதலும் ஏற்றுமதியாளர்களுக்குச் சலுகை வட்டி வீதத்தோடுகூடிய கடன்களை வழங்குவதும் நன்மைபயக்கும். அரசானது, புலம்பெயர் சமூகத்தின் முதலீட்டுக்கான ஆதரவைப் பெறுவதற்கான முயற்சிகளை முன்னெடுக்க வேண்டும். இத்தகைய வெளிநாட்டு நேரடி முதலீடானது, எதிர்கால பொருளாதார உறுதிப்பாட்டுக்கும் நாட்டின் பொதுப்படுகடனை மீளச் செலுத்துவதை உறுதிசெய்வதற்கும் வழிவகுக்கும்.

இந்தியா போன்று மிக வேகமாக வளர்ச்சியடைந்து வருகின்ற அரசுகள் நிறுவனத் துறைகளில் பெரிதான முதலீடுகளைச் செய்கின்றன. இதனால், அந்நாடுகளின் நிதியமைச்சு பொது நிதி ஒழுங்கைக் கட்டமைத்து, வருவாய் வலுப்படுத்தலையும் முன்னெடுக்க முடியும். சில தென்னாசிய நாடுகள் குறிப்பாக, நேபாளமானது போதுமான தொழில்நுட்ப உதவியுடன் மூலதனச் செலவை அதிகரித்து, தனியார் முதலீட்டை ஈர்க்கும் திட்டங்களுக்கு முன்னுரிமை அளித்துள்ளது.

'இலங்கையின் மூலதனச் செலவானது மொத்த உள்நாட்டு உற்பத்தியின் 4% இலக்கு' பற்றிப் பேசப்பட்டாலும், மூலதனச் செலவின் நடைமுறைச் செயற்பாடு மற்றும் திட்டத் தயாரிப்புகளின் திறன் பற்றிய கவலைகள் உள்ளன. பாதீட்டில் மீண்டெழும் செலவுக்கான ஒதுக்கீடு அதிகமாகக் காணப்படுவதால், நிதி அமைச்சின் புதிய வளர்ச்சித் திட்டங்களுக்கான முன்னுரிமை வழங்கலில் சிரமம் காணப்படுகின்றது. நிதி அமைச்சின் பாதீட்டு ஒதுக்கீடுகள் நாட்டின் பொருளாதாரக் கொள்கைகளை நேரடியாகப் பிரதிபலிக்கின்றன. இலங்கையின் 2026ஆம் ஆண்டுக்கான பாதீட்டுக் கொள்கை, வருவாய் மையப்படுத்தல், நிதி ஒழுங்கு மற்றும் பொது முதலீட்டை முன்னுரிமைப்படுத்துகின்றது.

இறுதியாக, இந்த முன்மொழிவுகளைச் செயற்படுத்துவதில் துணிச்சலான நடவடிக்கைகளை எடுக்குமாறு நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சைக் கேட்டுக் கொண்டு, உரையை நிறைவுசெய்கின்றேன்.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Next, the Hon. (Dr.) Upali Pannilage. You have 16 minutes.

[පූ.භා. 10.22]

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

ගරු සභාපතිතුමනි, අද දින කාරක සභා අවස්ථාවේදී විවාදයට ගැනෙන්නේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය සහ වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය කියන අමාත්‍යාංශවල වැය ශීර්ෂයි.

ඒ පිළිබඳව කථා කිරීමට ප්‍රථමයෙන් වර්තමානයේ රට තුළ ඇති වෙලා තිබෙන තත්ත්වය ගැන කරුණු කිහිපයක් මේ ගරු සභාවට ඉදිරිපත් කරන්න මා කැමැතියි. විශේෂයෙන්ම පසුගිය සතිය පුරා අපේ රටේ ඇති වුණු අයහපත් කාලගුණ තත්ත්වය හමුවේ විවිධාකාරයෙන් ආපදාවට පත් වූ අපේ රටේ සියලු ජනතාවට රජය වෙනුවෙන් අපගේ බලවත් ශෝකය නැවත වතාවක් ප්‍රකාශ කරන්නට මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

ගරු සභාපතිතුමනි, අද විවාදයට ගනු ලබන අමාත්‍යාංශ පිළිබඳව මගේ අදහස් දැක්වීමට ප්‍රථම, අද දිනය විශේෂයෙන්ම මා වගකීම දරන අමාත්‍යාංශයට ඉතා වැදගත් දිනයක් බව සඳහන් කරන්න කැමැතියි. විශේෂයෙන්ම මා වගකීම දරන ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ විෂය පථය යටතට ගැනෙන ආබාධ සහිත තැනැත්තන් සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර දිනය ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රකාශයට පත් කර තිබෙන්නේ සෑම වර්ෂයකම දෙසැම්බර් 03වැනි දායි. මේ සම්බන්ධයෙන් ගරු සුගත් වසන්ත ද සිල්වා මන්ත්‍රීතුමාත් අදහස් ඉදිරිපත් කළා. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ආබාධ සහිත පුද්ගලයන්ගේ ජාත්‍යන්තර දිනය වෙනුවෙන් මෙවර තේමාව විධියට ඉදිරිපත් කර තිබෙන්නේ "සමාජ ප්‍රගමනය සඳහා ආබාධ සහිත පුද්ගලයන් අන්තර්කරණය වූ සමාජයක් ගොඩනැඟීම" කියන අදහසයි. මේ තේමාව යටතේ විශේෂයෙන්ම අපේ අමාත්‍යාංශය වැඩසටහන් ගණනාවක් සංවිධානය කර තිබුණා. කෙසේ වෙතත්, ඇති වූ ආපදා තත්ත්වය යටතේ, ඒ ජනතාවට දක්වන ගෞරවයක් විධියට ඒ සමහර වැඩසටහන්වල සැලසුම් නැවත වෙනස් කරන්නට අපට සිද්ධ වුණා. අපේ රටේ ජීවත් වන මිලියන 1.6ක් පමණ වන ආබාධ සහිත පුද්ගලයන් අන්තර්කරණය වූ සමාජයක් වෙනුවෙන් අපේ රජයේ කැපවීම නැවත වතාවක් තහවුරු කරන්නට එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රකාශයට පත් කර තිබෙන ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ ජාත්‍යන්තර දිනය වන අද දිනය යොදා ගැනීමටත් මා මෙය අවස්ථාවක් කරගන්නවා.

ගරු සභාපතිතුමනි, ඔබතුමාත් දන්නා පරිදි පසුගිය සතියේ ඇති වුණු අයහපත් කාලගුණ විපර්යාසයත් සමඟ අපේ රට තුළ ඇති වූ ඒ සුළි කුණාටුවෙන් රටේ විශාල ජනතාවක් පීඩාවට පත් වුණා. අපේ රටේ තිබෙන පරිපාලන දිස්ත්‍රික්ක 25ම සැලකිය යුතු මට්ටමකට ඒ බරපතළ අර්බුදයට මුහුණ දුන්නා. ඒ අතරින් දිස්ත්‍රික්ක 22ක ජනතාවට මේ ආපදා තත්ත්වයෙන් සෘජු බලපෑමක් ඇති වුණා. ඒ ආපදා තත්ත්වයෙන් පසුව ජන ජීවිත යථා තත්ත්වයට පත් කිරීමේ ක්‍රියාවලියේදී අපේ රටේ දේශපාලන අධිකාරිය, ජනාධිපතිතුමා ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය, පක්ෂ-විපක්ෂ භේදයකින් තොරව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයන් සහ අනෙකුත්

[ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා]

ක්‍රියාකාරීන් දායක වුණා. ඒ වාගේම, ග්‍රාම නිලධාරිවරයාගේ සිට අමාත්‍යාංශ ලේකම්වරයා දක්වා වූ රාජ්‍ය නිලධාරින් රාජකාරිමය වශයෙන් ඔවුන්ට තිබෙන වගකීමෙන් ඔබ්බට ගිහිල්ලා, දිවා රෑ නොබලා කටයුතු කරමින් ඉන්නවා. ඒ සියලුදෙනාට රජය වෙනුවෙන් විශේෂ ගෞරවයක්, ස්තුතියක් පුද කරන්නත් මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

ගරු සභාපතිතුමනි, ඔබතුමාත් දන්නවා, මේ තත්ත්වය දැනගන්නට ලැබුණු මොහොතේ සිටම අපි රජයක් වශයෙන් ජනතාවට සිදු වන හානි අවම කිරීම සඳහා කටයුතු කළා වාගේම හානි වෙච්ච ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීමේ ක්‍රියාවලිය සඳහාත් විශාල මැදිහත්වීමක් කරමින් ඉන්න බව. ඒ ක්‍රියාවලියේදී විදේශීය රාජ්‍යයන් ගණනාවක් මේ වන විට අපට උදව් උපකාර කරමින් ඉන්නවා. ඒ වාගේම අපට උදව් උපකාර කරලාත් තිබෙනවා. ඒ විදේශීය රාජ්‍යවලටත් අපේ සුහදත්වයේ දෑත් දිගු කරන්න අපි මෙය අවස්ථාවක් කර ගන්නවා. ඔවුන් අප වෙත දක්වන ආධාර උපකාර අපි ඉතාම ගරුකොට සලකනවා.

මේ සිදුවීමෙන් පස්සේ ගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් අපි මේ රටේ ව්‍යාපාරික ක්ෂේත්‍රයේ පිරිස්, ඒ වාගේම සිවිල් සංවිධාන නියෝජිතයන් සමඟ සාකච්ඡා කරමින්, ආපදාවට ලක් වූ ප්‍රදේශ ප්‍රතිනිර්මාණය කිරීමේ ක්‍රියාවලියට, ප්‍රතිසංස්කරණය කිරීමේ ක්‍රියාවලියට ඔවුන්ගේ දායකත්වය ලබා ගනිමින් ඉන්නවා. ඔවුන් විශාල වශයෙන් අප සමඟ ස්වේච්ඡාවෙන් එකතු වෙලා ඉන්නවා. ව්‍යාපාරිකයන් වෙන්න පුළුවන්, ස්වේච්ඡා සංවිධාන, සිවිල් සංවිධාන වෙන්න පුළුවන්, සාමාන්‍ය ජනතාව වෙන්න පුළුවන් ඒ සියලුදෙනාම මැදිහත් කරගෙන මේ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට අපි දායක වෙමින් ඉන්නවා. ගරු සභාපතිතුමනි, දැන් අපට කරන්න තිබෙන්නේ නැවත වතාවක් අපේ ශ්‍රී ලංකාව ගොඩනඟා ගන්න එක. ඒක තමයි මේ වනකොට අපේ රට හමුවේ තිබෙන ප්‍රමුඛතම කාර්යභාරය වන්නේ. ඒ කාර්යභාරයේදී අපේ ජනාධිපතිතුමාත්, කැබිනට් මණ්ඩලයත්, අදාළ අනෙකුත් නිලධාරිනුත් ජනතාවට උපරිම වශයෙන් සහන සැලසීමේ ක්‍රියාවලියට මැදිහත් වෙලා ඉන්නවා. ගරු සභාපතිතුමනි, ඔබතුමාත් දන්නා විධියට මෙතෙක් නිකුත් කරලා තිබුණු චක්‍රලේඛ අබිබවා ගිහිල්ලා ජනතාවට අවශ්‍ය සහන ලබා දෙන්න, ඔවුන් පත්වෙලා ඉන්න ආපදා තත්ත්වයෙන් මුදාගන්න ත්‍රිවිධ හමුදාව, රාජ්‍ය නිලධාරින්, සිවිල් ජනතාව සම්බන්ධ කරගෙන පසුගිය දින කිහිපය තිස්සේ අපි දැවැන්ත මෙහෙයුමක් ක්‍රියාත්මක කරමින් ඉන්නවා.

ගරු සභාපතිතුමනි, කියන්න ඉතාම සතුටුයි, අද වනකොට අපේ රටේ දස දහස් ගණනක් ජනතාව, විශේෂයෙන්ම දකුණේ ජනතාව ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වෙලා, මධ්‍යම කඳුකරයේ තිබෙන බදුල්ල, මහනුවර, නුවරඑළිය, කෑගල්ල, මාතලේ වාගේ දිස්ත්‍රික්කවලට ගිහිල්ලා, බිඳ වැටුණු මං මාවත්, පාලම් වැනි යටිතල පහසුකම් ප්‍රතිනිර්මාණය කිරීමේ කටයුතුවලට දායක වෙලා ඉන්නවා. අන්න ඒ ක්‍රියාවලිය මෑත ඉතිහාසයේ අපි දැකපු ඉතාම විශිෂ්ට ක්‍රියාවලියක්, ගරු සභාපතිතුමනි. ඒ වාගේම ආපදාවට පත් වූ ජනතාවට සහනාධාර ලබා දීමේදී අපි මෙතෙක් තිබුණු චක්‍රලේඛ අබිබවා ගිහිල්ලා කටයුතු කරමින් ඉන්නවා. ඒ වාගේම මේ ආපදා තත්ත්වය නිසා සුරක්ෂිතතා මධ්‍යස්ථානවල හෝ වෙනත් ස්ථානවල සිටින ජනතාවට පිසූ ආහාර ලබා දීම සඳහා ලබා දෙන මුදල් ප්‍රමාණයත් වැඩි කළා. වියළි ආහාර ද්‍රව්‍ය සඳහා ලබා දෙන මුදල් ප්‍රමාණයත් වැඩි කළා. ඒ වාගේම ඔවුන් නැවත පදිංචි කරවීම සඳහා මෙතෙක් ලබා දුන් රුපියල් 10,000ක මුදල රුපියල් 25,000ක් දක්වා දෙගුණයකට වඩා වැඩි කරලා අපි ඊයේ අලුතින් චක්‍රලේඛයක් නිකුත් කළා. ඒ ආකාරයට මේ ආපදාවෙන් විපතට පත් වෙච්ච ජනතාව මුදාගැනීමේ ක්‍රියාවලියට අපි සක්‍රියව මැදිහත් වන බව සඳහන් කරන්න කැමැතියි, ගරු සභාපතිතුමනි.

අද විවාදයට ගැනෙනවා, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය, ඒ වාගේම වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය යන අමාත්‍යාංශවල වැය ශීර්ෂත්. නමුත් ඒ විෂයයන්වලට අදාළ අපේ අමාත්‍යවරුන් පවා අද මේ පාර්ලිමේන්තුවට පැමිණීමට වඩා ආපදා තත්ත්වයට ප්‍රමුඛතාව දීලා, ජනතාවත් එක්ක ඒ ප්‍රතිසංස්කරණ කටයුතුවලට සක්‍රියව මැදිහත් වෙලා ඉන්නවා, ගරු සභාපතිතුමනි.

විශේෂයෙන්ම වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයට විශාල කාර්යභාරයක් තිබෙනවා, මධ්‍යම කඳුකරය ආශ්‍රිතව. අපේ රටේ විශාල වශයෙන් කෙරෙන තේ වගාවත්, අනෙක් පැත්තෙන් පහත් බිම්වල කෙරෙන පොල් වගාව වැනි වගාවන් සුරක්ෂිත කර ගැනීම සඳහා, ඒවා සංවර්ධනය කර ගැනීම සඳහා, ඒවා වැඩිදියුණු කර ගැනීම සඳහා පසුගිය වර්ෂයක කාලයක සිට මේ අමාත්‍යාංශ විශාල කාර්යභාරයක් කළා ගරු සභාපතිතුමනි. විශේෂයෙන්ම අපි බලයට පත් වුණාට පසුව ප්‍රථමයෙන්ම අපට මුහුණ දෙන්න වුණු ප්‍රධාන ප්‍රශ්නයක් තිබුණා.

2024 නොවැම්බර් 21වැනි දා අපි පාර්ලිමේන්තුවේ දිවුරුම් දුන්නා. නමුත් දෙසැම්බර් මුල් සතිය වනකොට අපේ රටේ සහල් හිඟයක් ඇති වුණා, ගරු සභාපතිතුමනි. අපේ රටේ ජනතාවගේ පරිභෝජනය සඳහා දළ වශයෙන් සහල් මෙට්‍රික්ටොන් මිලියන 2.5ක ප්‍රමාණයක් අවශ්‍යයි. ගරු සභාපතිතුමනි, අපි දළ වශයෙන් හෙක්ටෙයාර ලක්ෂ 8ක විතර වී වගා කරනවා. අපි සහලින් ස්වයංපෝෂිතයි කිව්වාට, කුමන හෝ හේතුවක් නිසා අපට අවශ්‍ය සහල් ප්‍රමාණය අදටත් නිපදවා ගන්න නොහැකි වෙලා තිබෙනවා ගරු සභාපතිතුමනි. මෙන්න මේ අභියෝගය අපට අද තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම මේ අමාත්‍යාංශ මැදිහත් වෙලා, කෘෂිකර්ම අමාත්‍යාංශයත් එක්ක සම්බන්ධ වෙලා මේ අභියෝගය ජය ගැනීම සඳහා පසුගිය වසර තුළ අපි විශාල කාර්යභාරයක් කළා. අපි දළ වශයෙන් හෙක්ටෙයාරයකින් ලබා ගන්නා වී මෙට්‍රික්ටොන් 4.3ක අස්වැන්න වැඩි කිරීම සඳහා ගොවීන්ට පොහොර සහනාධාරය ලබා දීලා, අවශ්‍ය තාක්ෂණික පහසුකම් ලබා දීලා, අවශ්‍ය බීජ නිසි පරිදි ලබා දීලා ඒ කටයුතු පසුගිය වසරක කාලය තුළ ක්‍රියාත්මක කළා.

ගරු සභාපතිතුමනි, මේ වනකොටත් විශේෂයෙන්ම මධ්‍යම කඳුකරය විශාල වශයෙන් හානියට පත් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම අපේ රටේ තේ වගාව හානියට පත් වෙලා තිබෙනවා. අපේ රටේ තේ වගාවෙන් අපට දළ වශයෙන් වාර්ෂිකව ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් බිලියන 1.3ක වාගේ ආදායමක් ලැබෙමින් තිබුණා. නමුත්, 2019දී පැවති ආණ්ඩුව මඟින් කරපු පොහොර සහනාධාර කප්පාදුවත් එක්ක මේ මුදල් ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් මිලියන 840ට වාගේ ප්‍රමාණයකට පහතට කඩාගෙන වැටුණා. නමුත්, මේ ක්ෂේත්‍රය ප්‍රතිසංස්කරණය කිරීමේ ක්‍රියාවලිය පසුගිය වසරක කාලය තුළ අපි නැවත ආරම්භ කළා ගරු සභාපතිතුමනි. ඒ ක්‍රියාවලියේ එක පියවරක් විධියට තමයි, විශේෂයෙන්ම මලෙයහම් ප්‍රදේශවල ඉන්න ජනතාව ඇතුළු වතු කම්කරුවන්ගේ දෛනික වැටුප - තේ දළු නෙළන ජනතාවගේ දෛනික වැටුප - පවා වැඩි කරන්නට 2026 අය වැයෙන් අපි යෝජනා කර තිබෙන්නේ. විශේෂයෙන්ම පසුගිය වසර තුළ අපි තේ කර්මාන්තයේ දියුණුව වෙනුවෙන් අඩිතාලමක් දැම්මා. අපි තේ වගාව ප්‍රතිසංස්කරණය කරලා තේ කර්මාන්තය තුළින් ඇමෙරිකානු ඩොලර් බිලියන 3ක වාගේ ආර්ථිකයක් දක්වා යෑමට අවශ්‍ය සැලසුම් සකස් කරලා ක්‍රියාත්මක කරමින් හිටියා. අන්න එහෙම සිටින අවස්ථාවක තමයි මේ කාලගුණික විපර්යාසය ඇති වෙලා ඒ හරහා මේ වගාවලට යම්කිසි හානියක් වුණේ.

ඒ හානි වූ වගා බිම් ප්‍රතිසංස්කරණය කරලා අපේ රටේ තේ වගාවෙන් ඉහළම අස්වැන්නක් ලබා ගැනීමේ ක්‍රියාවලියට අවශ්‍ය මූලික පදනම සහ ඒකට අවශ්‍ය සැලසුම් මේ වනකොටත් අපි සකස් කරමින් ඉන්නවා, ගරු සභාපතිතුමනි.

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ විෂය පථයට පොල් වගාවත් අයිති වනවා. තේ, පොල් හා රබර් අපේ සාම්ප්‍රදායික අපනයන භෝග වුණාට, ඒ ඔස්සේ අපට විදේශ විනිමය ගෙනාවාට, පසුගිය කාලයේ අපට විශාල වශයෙන් පොල් හිඟයකට මුහුණ දෙන්න සිද්ධ වුණා. එයට විශේෂයෙන්ම බලපෑ හේතු තිබෙනවා. එකක් තමයි, වර්ෂ ගණනාවක් තිස්සේ ක්‍රියාත්මක කළ අව්‍යිමත් සංවර්ධනය ව්‍යාපෘති සඳහා පොල් ඉඩම් කට්ටි කරලා විකිණීම. ඒ හරහා පොල් වගාව විශාල වශයෙන් විනාශ වෙලා තිබුණේ. එම නිසා අපේ අමාත්‍යාංශය පසුගිය වසරක පමණ කාලය තුළ පොල් වගාව ව්‍යාප්ත කිරීම වෙනුවෙන් මැදිහත් වුණා. විශේෂයෙන්ම පොල් වගාකරුවන්ට අවශ්‍ය පොහොර සහනාධාර ලබා දීලා, පොල් වගාව නැවත ව්‍යාප්ත කිරීම සඳහා විශේෂ වැඩසටහනක් ආරම්භ කළා. විශේෂයෙන්ම "උතුරු පොල් ත්‍රිකෝණය" වැඩසටහන දියත් කර නැවත පොල් වගා කිරීමේ ක්‍රියාවලියට එම ප්‍රදේශවල ජනතාව යොමු කළා. ඒ වාගේම මා වගකීම දරන අමාත්‍යාංශය යටතේ ඇති සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවත් එක්ක අවබෝධතා ගිවිසුමකට එකඟ වෙලා කුඩා පරිමාණයෙන් පොල් වගා කිරීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබා දීමේ ක්‍රියාවලියක් ආරම්භ කළා. ඒ ඔස්සේ අපේ රටේ පොල් වගාව ව්‍යාප්ත කරන්න බලාපොරොත්තු වනවා.

ගරු සභාපතිතුමනි, අපේ රටේ පොල් ගහකින් සාමාන්‍යයෙන් වාර්ෂිකව ලැබෙන්නේ ගෙඩි 68ක් විතර. නමුත්, අපි හරියට තාක්ෂණය භාවිත කරනවා නම් අපට පොල් ගහකින් සාමාන්‍යයෙන් ගෙඩි 100ක් දක්වා අස්වැන්නක් ලබාගන්න පුළුවන්. අන්න ඒ වෙනුවෙන් අවශ්‍ය ව්‍යාප්ති සේවා යොදාගෙන, ගොවි ජනතාවට අවශ්‍ය තාක්ෂණය ලබා දීලා, ඒ කටයුතු පසුගිය වසරක කාල සීමාව තුළ ගරු අමාත්‍යතුමා ඇතුළු නිලධාරින් සියලුදෙනා ඉටු කරමින් හිටියා. ඒ ක්‍රියාවලිය අපි දිගටම කරගෙන යනවා. මේ ව්‍යසනයෙන් ඇති වුණු හානිය ගැනත් රජය මේ වනකොට තක්සේරුවක් ලබා ගනිමින් තිබෙනවා. මේ ගොඩනැඟීමේ ක්‍රියාවලිය හරහා තිබුණාටත් වඩා හොඳින් අපේ රටේ වගා බිම් ප්‍රතිසංස්කරණය කිරීමේ ක්‍රියාවලියට මේ වනකොට අමාත්‍යාංශය අවශ්‍ය සැලසුම් සකස් කරමින් ඉන්නවා, ගරු සභාපතිතුමනි.

මෙම ව්‍යසනයේදී විශාල අභියෝගයට මුහුණ දෙන තවත් අමාත්‍යාංශයක් තමයි, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය. ගරු සභාපතිතුමනි, ජනතාවගේ ආහාර සුරක්ෂිතතාව කියන්නේ අත්‍යවශ්‍ය කාරණයක්. වර්තමාන රජය එය ප්‍රමුඛතම කාර්යභාරයක් විධියට සලකා ආහාර සුරක්ෂිතතාව පිළිබඳව වෙනම කමිටුවක් ගොඩනැඟුවා. එම කමිටුව මඟින් අවශ්‍ය නිර්දේශ ලබාගෙන ආහාර සුරක්ෂිතතාව සහ ජනතාවගේ ආහාර අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා වැඩකටයුතු රාශියක් පසුගිය වසරක කාල සීමාව තුළ අපි ඉටු කරමින් හිටියා. එම ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් විධියට හිඟයකින් තොරව ජනතාවට පහසුවෙන් ආහාර ලබා ගැනීමේ හැකියාව ඇති කරලා තිබුණා. හැබැයි, අත්‍යවශ්‍ය අවස්ථාවලදී ආහාර ආනයනය කිරීමේ ක්‍රියාවලියටත් රජය ගියා. ඒ වෙලාවේ ගොවියාත්, අනෙක් පැත්තෙන් පාරිභෝගිකයාත් කියන දෙදෙනාම සමබරව ආරක්ෂා කර ගනිමින් තමයි අපේ මේ අමාත්‍යාංශයේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළේ. ගරු සභාපතිතුමනි, මේ ආපදා අවස්ථාවේදීත් ආහාර හිඟයක් ඇති නොවන විධියට කටයුතු කරමින් ජනතාවට අත්‍යවශ්‍ය ආහාර අපේ සතොස ජාලය හරහා වාගේම අනෙකුත් වෙළෙඳ ව්‍යාපාර හරහාත් ලබා දීමේ ක්‍රියාවලියට අපි සක්‍රියව මැදිහත් වෙන බව ඔබතුමා දන්නවා. අපේ කෘෂිකර්ම අමාත්‍යාංශයත්, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයත්, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයත් කියන තුනම එකතු වෙලා, මේ රටේ ජනතාවගේ ආහාර සුරක්ෂිතතාව වෙනුවෙන් අවශ්‍ය ආහාර හිඟයකින් තොරව වැඩි මිලක් නැතුව ලබා දීමේ ක්‍රියාවලියට අපි මැදිහත් වෙලා තිබෙනවා. අපට මේ ආපදා අවස්ථාවේදී වාර්තා වුණා, සමහර වෙළෙඳුන් ආහාර මිල ගණන් වැඩි කරනවා කියලා. ඒවාට අවශ්‍ය නීති අපි මේ වනවිටත් හඳුන්වා දීලා, ඒ පිළිබඳව සොයන්න රට පුරා මෙහෙයුමක් දියත් කරලා තිබෙනවා. එහෙම වැඩි මිලට ආහාර විකුණන්න අපි ඉඩ දෙන්නේ නැහැ. පාරිභෝගිකයන් ආරක්ෂා කර ගැනීමේ ක්‍රියාවලියට අපි මැදිහත් වෙනවා, ගරු සභාපතිතුමනි.

විශේෂයෙන්ම මම සඳහන් කරන්න ඕනෑ, මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය අපේ රජය භාර ගන්නකොට විශාල අර්බුදයකට මුහුණ දෙමින් තිබුණු බව. විශේෂයෙන්ම අපේ ආර්ථිකය ස්ථාවර කර ගැනීමේ ක්‍රියාවලියට තමයි පසුගිය වසරක කාලය තුළ අපි කටයුතු කරමින් හිටියේ, ගරු සභාපතිතුමනි. ඒ ඔස්සේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය අපට අවසන් කර ගන්නට තිබුණා. අපි ඒ ක්‍රියාවලිය ඉතාම සාර්ථකව අවසන් කර ගත්තා. අපට ඉතුරු වෙලා තිබුණු ඉතා කුඩා මට්ටමේ ආයතන කිහිපයක ණයත් -විශේෂයෙන්ම ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් වාගේ- ප්‍රතිව්‍යුහගත කර ගැනීමට පසුගිය කාල සීමාව තුළ අපට හැකියාවක් ලැබුණා. ඒ ස්ථාවර කරපු ආර්ථිකය ඔස්සේ උද්ධමනය පාලනය කරලා, ආර්ථික වර්ධනය සියයට 4කට, සියයට 5කට ආසන්න මට්ටමකට ගෙනැල්ලා, 2026 සඳහා අපි අය වැය ඉදිරිපත් කළේ සියයට 5කට ආසන්න ආර්ථික වර්ධනයක් ඇති කර ගැනීමේ බලාපොරොත්තුවෙන්. විශේෂයෙන් ගරු ජනාධිපතිතුමා සහ අපේ නියෝජ්‍ය ඇමතිවරු දෙදෙනෙක් වගකීම දරන මේ අමාත්‍යාංශය ඒ ක්‍රියාවලිය වෙනුවෙන් කටයුතු කළා. ඒ අර්බුදයේදී වාගේම නැවත ශ්‍රී ලංකාව ගොඩනැඟීමේ මේ ක්‍රියාවලියේදීත් අපේ ආර්ථිකය නැවත කඩාගෙන වැටෙන්න දෙන්නේ නැතුව අපි ආරක්ෂා කළා.

2004දී සුනාමියක් ඇවිල්ලා ආර්ථිකය කඩා වැටුණා වාගේ, 2019-2020 කොවිඩ් වසංගතය ඇවිල්ලා ආර්ථිකය කඩා වැටුණා වාගේ මේ රටේ නැවත වතාවක් ආර්ථික අර්බුදයක් ඇති නොවන විධියට ආර්ථිකය ඉතා මැනවින් කළමනාකරණය කර ගනිමින් ඒවාට අවශ්‍ය දේශීය හා විදේශීය දානපතියන්ගේ ආධාර හා උපකාර ලබා ගනිමින් අපි ආර්ථිකය ඉතා හොඳින් කළමනාකරණය කරමින් ඉන්නවා, ගරු සභාපතිතුමනි. අපි 2026 වර්ෂයට අපේ අය වැය ඉදිරිපත් කරලා තිබුණත්, මෙවර එය සමාලෝචනය කරමින් මේ ව්‍යසනයෙන් අපේ රට මුදා ගැනීමේ ක්‍රියාවලිය තමයි අපේ ප්‍රමුඛතම කාර්යභාරය වෙන්නේ. ඒ වෙනුවෙන් අපි රජය හැටියට කටයුතු කරනවා, කැප වෙනවා කියන කාරණය මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බෙහෙවින් ස්තුතියි, ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

The next speaker is the Hon. Sajith Premadasa. You have 27 minutes.

The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[පූ.භා. 10.39]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු සභාපතිතුමනි, අද දින ඇත්තවශයෙන්ම සිදු විය යුතුව තිබුණේ රට මුහුණ දුන් මේ බරපතළ ආපදාව පිළිබඳව සාකච්ඡා කිරීමයි. නමුත්, ඒ ආපදා තත්ත්වය නොසලකා හරිමින් ඒ පිළිබඳව සාකච්ඡා කරන්නට අවස්ථාවක් ලබා නොදී අය වැය විවාදය හරහා මේ අදහස් ඉදිරිපත් කරන්නට අපට සිදුවීම ගැන අපි ඇත්තවශයෙන්ම කනගාටු වනවා. ඒ ආකාරයට ආපදාවෙන් විපතට පත් වෙච්ච ලක්ෂ ගණනක් ජනතාව ගැන ඒ තරම් නොතැකීම පිළිබඳව අපි ඇත්තවශයෙන්ම කනගාටු වනවා.

ඒ කෙසේ වෙතත්, මෙය වසර 7ක් තුළ අපේ රටට සිදු වුණු හතරවැනි ඛේදවාචකය. ඒ ඛේදවාචක තමයි, පාස්කු ඉරු දින ප්‍රහාරය, කොවිඩ් වසංගතය, රට බංකොලොත්වීම සහ "දිට්වා" සුළි කුණාටුව.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය අද පෙර වරු 6.00ට නිකුත් කළ සංඛ්‍යාලේඛනවලට අනුව, පවුල් 437,507ක් සහ පුද්ගලයන් 1,558,919ක් විපතට පත් වෙලා තිබෙනවා. පුද්ගලයන් 465ක් මරණයට පත් වී, 366ක් අතුරුදහන් වී, නිවෙස් 783ක් පූර්ණ හානියට ලක් වී, නිවෙස් 31,417ක් අර්ධ හානියට ලක් වී තිබෙනවා. ඒ වාගේම කඳවුරු 1,433ක, පවුල් 61,875ක පුද්ගලයන් 232,752ක් මේ මොහොතේ අවතැන් වෙලා සිටිනවා. විශේෂයෙන්ම මේ ආපදාවට පත් වෙලා ජීවිත අහිමි වුණු, දේපළ අහිමි වුණු, ජීවනෝපාය අහිමි වුණු, අවතැන් වුණු, අනාථ වුණු, අසරණභාවයට පත් වුණු සියලුදෙනාට අපගේ බලවත් ශෝකය මේ අවස්ථාවේදී පළ කරනවා. මේ විපතට පත් වුණු අය පිළිබඳව කථා කරන්නට විවාදයක් ලබා දෙන්නට රජය අපොහොසත් වුණත් මම යෝජනා කරනවා, මේ ව්‍යසනයෙන් විපතට පත් වුණු, අවතැන් වුණු සියලුදෙනා වෙනුවෙන් අඩුම ගාණේ ජාතික ශෝක දිනයක්වත් ප්‍රකාශයට පත් කරන්න කියලා.

අපි සියලුදෙනාගේම වගකීම වන්නේ විපතට පත් වුණු සැමදෙනා රැක බලා ගැනීමයි. ඒක ජාතික යුතුකමක්. මනුෂ්‍යත්වයේ නාමයෙන් අපි ඒ පූජනීය කර්තව්‍යය ඉටු කළ යුතුයි. විශේෂයෙන්ම අසරණභාවයට වාගේම විපතට පත් වුණු ජනතාව මුදා ගන්නට කටයුතු කළ යුද හමුදාවේ, නාවික හමුදාවේ, ගුවන් හමුදාවේ, පොලීසියේ, සිවිල් ආරක්ෂක බලකායේ, විශේෂ කාර්ය බලකායේ සියලුදෙනා සොල්දාදුවන් නොවෙයි, රණ විරුවන්. අද ඉඳලාවත් අපි හැමෝම ඒ වචනය පාවිච්චි කරමු. ඒ රණ විරුවන් වෙනුවෙන් අපගේ ප්‍රණාමය සහ උත්තමාචාරය පළ කරනවා.

විශේෂයෙන්ම මම මතක් කරන්නට ඕනෑ, වලෙයි ප්‍රදේශයේ මෝය කට පුළුල් කිරීමේ මෙහෙයුමක නිරතව සිටි නාවික හමුදා නිලධාරින් පස්දෙනෙකු අභාවයට පත් වුණු බව. ලුණුවිල ප්‍රදේශයේ සිදු වූ හෙලිකොප්ටර් අනතුරින් මිය ගිය වින්ග් කමාන්ඩර් නිර්මාල් සියඹලාපිටිය මගේ හිතවතෙක්. ඔහු ජනාධිපතිවරණ සමයේ රැස්වීම් ගණනාවකට මා හෙලිකොප්ටරයෙන් ගෙන ගිය Pilot Captain කෙනෙක්. ඒ වාගේම තමයි, කොටහේන පොලිස් ස්ථානයට අනුයුක්තව හිටපු උප පොලිස් පරීක්ෂක හේරත් මැතිතුමා. මේ වීරෝදාර රණ විරුවන් ඇතුළු විශේෂයෙන්ම ජනතාව මුදා ගැනීමේ ක්‍රියාන්විතයට උර දුන් සියලු රණ විරුවන් අපි බොහොම ගෞරවයෙන් මතක් කරනවා. ඒ අයට අපේ ගෞරවය සහ ශීර්ෂ ප්‍රණාමය පුද කරනවා.

ඒ වාගේම අපේ රටේ රාජ්‍ය නිලධාරින් අභියෝග, අපහසුතා, ගැටලු සහ විවිධ ප්‍රශ්න රැසක් මැද්දේ මෙහිදී අතිවිශිෂ්ට කාර්යභාරයක් ඉෂ්ට කරලා තිබෙනවා. ප්‍රංචිම රාජ්‍ය නිලධාරියාගේ ඉඳලා, ගම් මට්ටමේ, බිම් මට්ටමේ ඉඳලා, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඒ වාගේම පළාත් කාර්යාල ඇතුළු සියලු රාජ්‍ය ආයතනවල සමස්ත රාජ්‍ය නිලධාරින්ට අපගේ ස්තුතිය, අපගේ ගෞරවය, අපගේ උත්තමාචාරය මේ අවස්ථාවේ පුද කර සිටිනවා. ඒ අය අදටත් නිදි වරාගෙන කැප කිරීම් කරනවා, පරිත්‍යාගශීලිව වැඩ කටයුතු කරනවා, අභියෝග රැසක් මැද්දේ, අමාරුකම් රැසක් මැද්දේ සහන ටික ලබා දෙනවා. එම නිසා රට දැය වෙනුවෙන්, පීඩාවට පත් ජනතාව වෙනුවෙන් ඔබ කරන්නා වූ ඒ සේවාව අපි අගය කරනවා. ඔබට නැවත නැවතත් අපේ ගෞරවය සහ ප්‍රණාමය පුද කර සිටිනවා.

රටක් හැටියට අභියෝග රැසකට මුහුණ දෙන මේ මොහොතේ, විපක්ෂයක් හැටියට අපි අපේ වගකීම්, යුතුකම් අනිවාර්යයෙන්ම ඉෂ්ට සිද්ධ කරනවා. ජාති, ආගම්, කුලමල, පන්ති, පක්ෂ, ගෝත්‍ර, තරාතිරම්වලින් සහ භේද භින්නවලින් තොරව, ඒ වාගේම දේශපාලනය පැත්තකට දමලා රටේ ජනතාව බලාපොරොත්තු වන විශිෂ්ට සේවාව ඉෂ්ට සිද්ධ කරන්න අපි වැඩ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. මේ මොහොත වන විට ජපාන තානාපතිතුමා, South Korean Ambassador, the European Union Ambassador, ඉන්දියානු මහ කොමසාරිස්තුමා, ඉතාලියේ සහ ජර්මනියේ Ambassadorsලා, ඒ වාගේම ලෝක බැංකුවේ ප්‍රධානීන් සියලුදෙනාම හමුවෙලා අපි ලබා දුන් ප්‍රධානතම පණිවුඩය තමයි, අපේ රටට ලබා දෙන සියලු සහන, සියලු ආධාර උපරිම ප්‍රමාණයෙන් ලබා දෙන්නට කටයුතු කරමින්, විශේෂයෙන්ම විපතට පත් වුණු සියලුදෙනාටම ඒ ආධාර නිර්ව්‍යාජව, විනිවිදභාවයෙන් යුක්තව, පාරදෘශ්‍ය ක්‍රමයකින් - transparently, විවෘත, සාධාරණ සහ කාර්යක්ෂම වැඩ පිළිවෙළක් යටතේ ලබා දෙන්න කියන එක. ඒ පණිවුඩය අපි එදා දවසේත් ලබා දුන්නා, අද දවසේත් ලබා දෙනවා. රට වෙනුවෙන්, ජනතාව වෙනුවෙන්, විශේෂයෙන්ම විපතට පත් වූ ප්‍රජාව වෙනුවෙන් හෙට දිනයේත් අපි ඒ යුතුකම ඉෂ්ට කරනවා.

අපි විශ්වාස කරන ආකාරයට, "6 R" කියන එක තමයි මේ මොහොතේ අවශ්‍ය වෙලා තිබෙන්නේ. ඒ කියන්නේ, Respond, Relief, Rehabilitation, Recover, Reconstruct, Rebuild. ප්‍රතිචාර දක්වන්නට ඕනෑ, සහන දෙන්නට ඕනෑ, පුනරුත්ථාපන වැඩ කටයුතු කරන්නට ඕනෑ, අහිමි වුණු දේ ආපසු ලබා ගන්නට ඕනෑ, නැවත ඉදි කරන්නට ඕනෑ, ප්‍රතිසංස්කරණය ක්‍රියාත්මක කරන්නට ඕනෑ. විපතට පත් වුණු පවුල්වලට සහ ජනතාවට ඒ තුළින් උපරිම සහන ලබා දෙන්නට කටයුතු කරන්නට ඕනෑ. ජීවිත අහිමි වුණු පවුල්වලට, අවතැන් වුණු පවුල්වලට, ජීවිකාව විනාශ වුණු පවුල්වලට උපරිම ප්‍රතිපාදන වෙන් කරන්නට ඕනෑ. ඒ සඳහා ඒකාබද්ධ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නට ඕනෑ. ඒ අයගේ නිවෙස් ඇතුළු දේපළ අහිමි වුණා, ජීවනෝපාය අහිමි වුණා, ස්වයං රැකියාව අහිමි වුණා. කෘෂි කර්මාන්තයේ නියැළෙන වී ගොවියාට, එළවලු, භවභෝග, පලතුරු, තේ, පොල්, රබර් ඇතුළු අපනයන භෝග කියන මේ හැම කෘෂි කර්මාන්ත ක්‍රියාවලියකම හිටපු අසරණභාවයට පත් වුණු ඒ ප්‍රජාවට අපි සහන ලබා දෙන්නට ඕනෑ. අද ඒ ගොවි බිම් විනාශ වෙලා, වැව් අමුණු විනාශ වෙලා, වගා බිම් විනාශ වෙලා, මාර්ග පද්ධති විනාශ වෙලා. විපතට පත් වූ බලප්‍රදේශවල විදුලි පහසුකම් තිබෙන්නේ යම් යම් ප්‍රදේශවලට පමණයි. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ගැටලු තිබෙනවා. කාන්තාවන්, මව්වරුන්, දරුවන් ඇතුළු පුරවැසියන්ගේ සෞඛ්‍ය සම්පන්නභාවය ශක්තිමත් කරන්නට ඕනෑ.

ඒ වාගේම සංචාරක කර්මාන්තය අපි තවදුරටත් දිරි ගන්වන්නට ඕනෑ. ඒක අමාරු තත්ත්වයක්. මේ tourist season එක. විශේෂයෙන්ම ඒ tourist cancellations වළක්වාලන්නට අපි වැඩිපුර අවධානයක් යොමු කරන්නට ඕනෑ. මේ දැන් මට ලැබුණා, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන් උදෑසන 10ට ලැබෙන වාර්තාව. එන්න එන්නම විපතට පත් ප්‍රමාණය වැඩි වෙනවා. මේ මොහොත වන විට විපතට පත් වූ ප්‍රජාව පුද්ගලයන් හැටියට ගත්තොත්, 1,586,329යි.

විශේෂයෙන්ම ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන්ට, ඒ කර්මාන්තශාලා හරහා රැකියා ලබා දුන්නු ඒ ව්‍යවසායකයන්ට ලබා දිය යුතු සහන ටික අපි ලබා දෙන්නට ඕනෑ. දැන් ණය වාරික ගෙවීම අත්හිටුවීමේ ක්‍රමයක්, ලීසිං ගෙවීම අත්හිටුවීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කරන්න ඕනෑ. කරුණාකරලා මේ ව්‍යසනය තුළ පරාටේ නීතිය ක්‍රියාත්මක කරලා ඔවුන්ගේ දේපළ වෙන්දේසි කරන්නට කටයුතු කරන්නට එපා. මේ රටේ ජනතාවට ජීවත් වීමේ අයිතිය ලබා දෙන්න. විපතට පත් ජනතාවට සහන ලබා දෙන්න. චක්‍රලේඛවලට ලඝු කරලා ජනතාවට ලැබෙන්න තිබෙන සහන ටික අහිමි කරන්නට එපා. මේ යල් පැන ගිය චක්‍රලේඛ වෙනස් කරන්න. අපේ රාජ්‍ය නිලධාරින්ට අත පය දිග හැරලා මේ රටේ ජනතාවට උදවු කරන්නට අවශ්‍ය නීතිමය පද්ධතිය නිර්මාණය කරන්න.

අද මේ මොහොත වන විට මේ ආපදාව නිසා අපේ රටේ ලක්ෂ 220ක් වූ පාරිභෝගික ජනතාව ගසා කන කළු කඩ මාෆියාව නිර්මාණය වෙලා තිබෙනවා. ඒ නිසා වහාම මිල පාලනයක් ක්‍රියාත්මක කරන්න. ජීවිත විනාශ වෙලා, ජන ජීවිත කඩා වැටිලා, ගම් පිටින්, නගර පිටින් නැති වෙලා තිබෙනවා. විපතට පත් මේ ජනතාව පිළිබඳව සංවේදී වන්න. ඒ අයගේ දුක දිහා බලන්න. ඒ අයගේ හදවතේ කැකෑරෙන දුක, කඳුළ, වේදනාවට වචනවලින් නොවෙයි සහනවලින්, ක්‍රියාවෙන් ශක්තිය ලබා දෙන්න. ඒ අයට උත්තර සපයන්න, විසඳුම් ලබා දෙන්න. අපි ප්‍රශ්නවලින් පැනලා යන්න හොඳ නැහැ. මේක අපේම ප්‍රශ්නයක් කර ගෙන විපතට පත් ප්‍රජාවට සහන ලබා දෙන්නට කැප වෙන්න කියන යෝජනාව මම කරනවා.

අපි කිසි දවසක මේ ආපදාව දේශපාලනයට ලඝු කර ගන්නට හොඳ නැහැ; අපි "cyclone" politics කරන්නට හොඳ නැහැ. ජීවිත හානි වුණු, දේපළ හානි වුණු ඒ ජනතාව මුල් කර ගෙන දේශපාලන වශයෙන් ජනප්‍රිය වන ක්‍රියාදාමවලට අපි යොමු වෙන්න හොඳ නැහැ. විපතට පත් ජනතාවට, ජීවිත අහිමි වුණු ජනතාවට කරන ලොකුම යුතුකම තමයි, නැවත හැරිලා බලලා, මේ හානිය අවම කර ගන්න අපට තිබුණා නේද, ඇයි අපට ඒ දේ කර ගන්න බැරි වුණේ, ඇයි ආපදාව කළමනාකරණය වෙනවා වෙනුවට ආපදාව ප්‍රවර්ධනය වුණේ, වැරදුණු තැන් මොනවාද කියලා කල්පනා කරලා ඒ අවශ්‍ය කටයුතු කරන එක. අපි දේශපාලන ඇඟිලි දිගු කිරීමක් නොවෙයි කරන්නේ.

මහා නායයෑම් නිසා පස් කඳුවලට යට වෙලා වටිනා මිනිස් ජීවිත ගණනාවක් අහිමි වෙලා තිබෙනවා. ඒ වාගේම වටිනා ජන ජීවිත බිඳ වැටිලා, පහළොස් ලක්ෂයකට වැඩි ජනතාවක් අද මේ මොහොත වනකල්ම පීඩා විඳිනවා. ඒ අය වෙනුවෙන් අපට කරන්න පුළුවන් ලොකුම යුතුකම වන්නේ, අපට අඩුපාඩු සිදු වුණු තැන්වල නිවැරදි වීමයි. මරණ පෙන්නලා ජනප්‍රිය වෙන එක නොවෙයි කරන්නට ඕනෑ. නැවත වරක් මේ වාගේ තත්ත්වයක් උදා නොවන අයුරින් අප මේ රට මෙහෙයවන්නටයි ඕනෑ. අපි නින්දිත, පහත් දේශපාලනයෙන් බැහැර වෙලා, සදාචාර සම්පන්න දේශපාලන සංස්කෘතියක් තුළ සිටිමින් විපතට පත් ජනතාවට ශක්තිය ලබා දෙන්නට ඕනෑ. මේ වාගේ භයානක තත්ත්වයක් නිර්මාණය වෙනවා කියලා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව පුන පුනා කියද්දීත්, වගකිව යුත්තන් නිද්‍රාශීලී වුණේ ඇයි? ඒවා ගණන් ගත්තේ නැත්තේ ඇයි? මෙහෙම නිදිමත ගතියෙන් කටයුතු කළේ ඇයි? කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ විශිෂ්ටයින් ටික මේ රටට ලබා දුන්නු ඒ අවදානම් තත්ත්වය පිළිබඳ කරුණු කාරණා ඇතුළත් ලේඛනය මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මේ අවස්ථාවේ අපේ වගකීම තමයි වැරදි හදා ගන්න එක; අඩුපාඩු හදා ගන්න එක. රට ගොඩ නැඟීම සඳහා ලබා දිය යුතු උපරිම සහයෝගය, උපරිම ශක්තිය ලබා දෙන්නට අප ඇප කැප වෙනවා, ලක්ෂ 220ක් වෙනුවෙන් අප අපේ යුතුකම ඉටු කරනවා කියන කාරණය මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

ජනතාව අහන ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව අනාවැකි ඉදිරිපත් කරද්දීත් ඒවා කාර්යක්ෂමව බිම් මට්ටමේ ජනතාවට සන්නිවේදනය නොවුණේ ඇයි? අපි අහලා තිබෙනවා, පළාතේ යන්ත්‍රණය තිබෙනවා, දිස්ත්‍රික්කයේ යන්ත්‍රණය තිබෙනවා, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ යන්ත්‍රණය තිබෙනවා, ග්‍රාම නිලධාරි වසම්වල යන්ත්‍රණය තිබෙනවා කියලා. මේ කියන යන්ත්‍රණ තිබුණා නම් ඇයි මේ තොරතුරු සන්නිවේදනය නොවුණේ? පීඩාවට පත් වීම අඩුම ගාණේ අවම කරන්නට, ආපදා කළමනාකරණ සැලැස්ම ඇයි නිසියාකාරයට නිර්මාණය වුණේ නැත්තේ? ආපදා කළමනාකරණ පනතේ තිබුණු අඩු පාඩුකම් ඇයි නිසියාකාරයට නිවැරදි වුණේ නැත්තේ? ඇයි රටට අවශ්‍ය Doppler Radar systems ටික ස්ථාපනය කරන්න බැරි වුණේ? ආපදා තත්ත්වයේ බැරෑරුම්කම දැන දැනත් ඇයි හදිසි ආපදා තත්ත්වයක් ප්‍රකාශයට පත් නොකළේ? අපි මේ ප්‍රශ්න අහන්නට ඕනෑ. මේ ප්‍රශ්න ඇහුවේ නැත්නම් අප කරන්නේ විපතට පත් ජනතාවට කරන්න පුළුවන් ලොකුම අකටයුත්තයි.

ගොන්ගල කන්දේ Doppler Radar system එක පිළිබඳව 2014දී ආපදා කළමනාකරණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේත්, මේ ගරු සභාවේත් මම යෝජනා ගණනාවක් ඉදිරිපත් කළා. කවුරුවත් ඒවා ගණන් ගත්තේ නැහැ. අදටත් හරියාකාර Doppler Radar system එකක් නැහැ. සුනාමියක් ආවේ මීට වසර 21කට පෙර, 2004දී. Doppler Radar system එක පුත්තලමේ ස්ථාපනය කිරීමේ කටයුත්ත දැන් සති කිහිපයකට පෙර පටන් ගත්තා. පොතුවිල්වලටත් එවැන්නක් අවශ්‍යයි. තවත් Doppler Radar systems ගණනාවක් අවශ්‍යයි. 2014දීත්, ඊට පෙරත් මා කරපු යෝජනා ටිකත් මම මේ අවස්ථාවේ **සභාගත*** කරනවා.

ඒවා ක්‍රියාත්මක නොකිරීම නිසා රටක් හැටියට අද අපි අමාරු තත්ත්වයකට පත් වෙලා සිටිනවා.

ඒ වාගේම මම මේ අවස්ථාව උපයෝගී කර ගන්නවා, රජයට යෝජනා ගණනාවක් ඉදිරිපත් කරන්න. විශේෂයෙන්ම සූදානම් යන්ත්‍රණයේ - preparedness mechanism එකේ - දුබලතා ටික අපි නිවැරදි කර ගන්නට ඕනෑ. ජාතික, පළාත්, දිස්ත්‍රික්, ප්‍රාදේශීය, ග්‍රාමීය, කුඩා ගම්මාන මට්ටමින් සූදානම වර්ධනය කර ගන්නට ඕනෑ. වේලාසන ලැබෙන අනතුරු ඇඟවීම් බිම් මට්ටමට සන්නිවේදනය නොවීම ගැන සොයා බලා ඒ සන්නිවේදන ජාලය ශක්තිමත් කරන්නට ඕනෑ. ඉවත් කිරීමේ සැලසුම් - evacuation planning - වාගේම සෙවණ ලබා දීම - shelter readiness - ශක්තිමත් කර ගන්නට ඕනෑ. ආපදා කළමනාකරණ සම්බන්ධීකරණය තවදුරටත් ශක්තිමත් කරන්නට ඕනෑ. ඒ වාගේම අනිවාර්ය ඉවත් කිරීමේ කලාප නිර්මාණය කරන්නට ඕනෑ. බලශක්ති ක්ෂේත්‍රය තුළ මේ වාගේ

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ආපදාවකදී ඇති විය හැකි ගැටලුවලට තිරසර විසඳුම් ලබා දෙන්නට ඕනෑ. බලශක්තිය පමණක් නොවෙයි, ප්‍රවාහන පහසුකම් යළි සලසන්නට ඕනෑ. ප්‍රවාහන පහසුකම් අවහිර වන ආකාරයෙන් පාලම් කඩා වැටෙන කොට අපේ ආපදා ක්‍රමය තුළ ජංගම - mobile - පාලම් ක්ෂණිකව ලබා දීමේ වැඩ පිළිවෙළක් අප සතුව තිබෙන්නට ඕනෑ.

විශේෂයෙන්ම ආපදා කළමනාකරණ ක්ෂේත්‍රය පිළිබඳව හොඳ සම්බන්ධීකරණයක් තිබෙන්නට ඕනෑ, නායයෑම්, පස් කඳු කඩා වැටීම් වළක්වාලීමට වැඩ පිළිවෙළක් තිබෙන්නට ඕනෑ. ඒ වාගේම, ගංවතුර පාලනයට, drainage systems පාලනයට අපට වැඩ පිළිවෙළක් අවශ්‍යයි. විශේෂයෙන්ම ඒ මොහොතේම ප්‍රතිචාර දැක්වීමේ ක්‍රමය - real-time response - ක්‍රියාත්මක වෙන්නට ඕනෑ. ඒ සම්බන්ධීකරණයේ, ඒ සන්නිවේදනයේ අඩු පාඩුකම් වාගේම logistics පැත්තෙන් එන අභියෝග ජයග්‍රහණය කරන්නට යෝජනා රැසක් තිබෙනවා. විශේෂයෙන්ම සමගි ජන බලවේගයත්, සමගි ජන සන්ධානයත් අපේ බුද්ධි මණ්ඩපයේ සාමාජිකයන් එකතු කරගෙන විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, මහාචාර්යවරුන්, කථිකාචාර්යවරුන් සමඟ අලුත් ආපදා කළමනාකරණ සැලැස්මක් ඉදිරිපත් කරන්නට අපි මේ මොහොතේ වැඩ ආරම්භ කරලාත් හමාරයි. විශේෂයෙන්ම රජයේ වගවීමේ සහ වගකීමේ ක්‍රියාවලිය මීට වඩා සාර්ථකව ක්‍රියාත්මක වෙන්නට ඕනෑ. ශීඝ්‍රගාමීව සහන ලබා දීමේ වැඩ පිළිවෙළට - rapid deployment of relief - අපි යොමු වෙන්නට ඕනෑ. ඒ වාගේම ජලාශ කළමනාකරණය - dam and reservoir management - මීටත් වඩා ශක්තිසම්පන්නව ක්‍රියාත්මක කරන්නට ඕනෑ.

සහන ලබා දීමේදී ඇත්ත වශයෙන්ම අපට සිද්ධ වුණා, ඉන්දියාවේ "Operation Sagar Bandhu" කියන ව්‍යාපෘතිය තුළින් විශාල සේවාවක් ඉටු කරවා ගන්න. අපි ස්තුතිවන්ත වෙනවා ඉන්දියාව ඇතුළු ඒ රටවල් ගණනාවටම, පහසුකම් ලබා දීම පිළිබඳව. නමුත්, රටක් හැටියට ඉන්දියාව "Operation Sagar Bandhu" ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන කල් අපි බලාගෙන ඉන්න හොඳ නැහැ. අපේම ආපදා සහන ක්‍රියාවලියක් ක්‍රියාත්මක වෙන්නට ඕනෑ. විශේෂයෙන්ම විපතට පත් වීමට, ආපදාවට පත් වීමට හේතු වුණු සියලු කරුණු කාරණා පිළිබඳව විනිවිදභාවයෙන් යුක්ත වූ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙන්නට ඕනෑ. කෙටි කාලීන, මධ්‍ය කාලීන, දීර්ඝ කාලීන නැවත ගොඩනැඟීමේ වැඩසටහනක් - reconstruction plan එකක් - ක්‍රියාත්මක වෙන්නට ඕනෑ.

අපේ රටත් එක්ක සංසන්දනය කළොත් ඉන්දියාව ආපදා තත්ත්වය හමුවේ කටයුතු කළේ කොහොමද කියලා මම කෙටියෙන් කියන්න කැමැතියි. Meteorology Department එක "Red" and "Orange" alerts එව්වා. ජනතාව ඉවත් කිරීම, බොහොම සක්‍රියව - proactively - ක්‍රියාත්මක වුණා. සහන ලබා දෙන සම්පත්, relief ලබා දෙන assets, විශේෂයෙන්ම ඒ ගොල්ලෝ National Disaster Response Force එක deploy කළා. විශේෂයෙන්ම ඒ කාර්යය සඳහා අපේ රටේත් එවන් National Disaster Response Force එකක් නිර්මාණය කිරීමේ කටයුත්ත අපි කරන්නට ඕනෑ. අනෙක් අමාත්‍යාංශත් එක්ක සම්බන්ධීකරණ කටයුත්ත කිරීමට පමණක් සීමා නොවී අපේම වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නට ඕනෑ.

ඒ අයගේ හැම sector එකක්ම සූදානමින් සිටියා; digital surveillance technology පාවිච්චි කළා. මම මේ කියන්නේ තමිල්නාඩුවල ස්ටාලින් මහ ඇමතිවරයා ඒ ප්‍රාන්තයේ ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරපු ආකාරයයි. ඒ වාගේම, cross-border coordination එකත් ක්‍රියාත්මක කරලා ඉන්දියාව අපේ රටට විශාල ශක්තියක් ලබා දුන්නා, relief ලබා දුන්නා. ඒ වාගේම, ඒ ගොල්ලන්ගේ Rapid Response Team එක ලබා දුන්නා. ඒ වාගේම, නාවික හමුදාවේත්, ගුවන් හමුදාවේත් සහන ලබා දුන්නා. ඒ වාගේම, ඒ ප්‍රජාවත් ලබා දෙන්න පුළුවන් උපරිම සහයෝගය ලබා දුන්නා.

මම මේ කාරණා කියන්නේ, "දිට්වා" සුළි කුණාටුවේ පාඩම් ටික ඉතා ඉක්මනින් ඉගෙන ගෙන අපි අපේ රටේ ආපදා ක්‍රමය වහා වෙනස් කරන්නට ඕනෑ නිසා. අපි අලුත් පනත් කෙටුම්පතක් ගෙනෙන්නට ඕනෑ. ඒ අලුත් පනත තුළින් මේ පවතින ක්‍රියාදාමයේ වෙනසක් ඇති කරන්නට ඕනෑ. අපි ඇත්ත වශයෙන්ම National Climate Resilience and Disaster Mitigation Act එකක් ගෙන එන්නට කරන්නට ඕනෑ. Disaster එක mitigate කරන්නට ඕනෑ.

මම තවත් පොඩි වෙලාවක් ගන්නවා, ගරු සභාපතිතුමනි.

සිදු වෙන්නට යන ආපදාව අවම කර ගැනීමට, ඒ වාගේම ඒ ආපදාවෙන් ඇති විය හැකි හානිය වළක්වා ගැනීමට ක්‍රමයක් ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒ සඳහා අවශ්‍ය බලතල ටික විශේෂයෙන්ම ලබා දෙන්නට ඕනෑ. ඒ බලතල ටික ක්‍රියාත්මක කරන්නට ඕනෑ. ඒ සඳහා මූල්‍ය නිදහස ලබා දෙන්නට ඕනෑ; ක්‍රියාත්මක වීමේ ස්වාධීනත්වය - operational independence - ලබා දෙන්නට ඕනෑ. ඒ වාගේම අනිවාර්යයෙන්ම සන්නිවේදනය ශක්තිමත් කර ගන්නට ඕනෑ. Emergency response team වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නට ඕනෑ. ඇත්තවශයෙන්ම නවීන තාක්ෂණය උපයෝගී කරගෙන සිදු කරන digital risk mapping ක්‍රමය real time වෙන්නට ඕනෑ. NBRI එක, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ඇතුළු අනෙකුත් දෙපාර්තමේන්තු රට පුරා දිවෙන යන්ත්‍රණයක් ක්‍රියාත්මක කරන්නට ඕනෑ. ඒක දිස්ත්‍රික්ක මට්ටමින්, ප්‍රාදේශීය මට්ටමින් සක්‍රියව ක්‍රියාත්මක කරන්නට ඕනෑ.

මම ජර්මන් තානාපතිතුමා එක්ක සාකච්ඡා කරන කොට එතුමා කිව්වා, මේ වාගේ ආපදාවකදී ඒ රටේ අනුගමනය කරන Krisenstab කියන වැඩ පිළිවෙළ ගැන. ඒ රටේ federal states හයක් තිබෙනවා. ඒ federal states හයේ බලය තිබෙන්නේ බොහෝ විට එක එක දේශපාලන පක්ෂවලට. Chancellor එක්ක සාකච්ඡා කරලා පක්ෂ දේශපාලනය පැත්තක තියලා ඒ සියලුදෙනාම ජාතික වැඩ පිළිවෙළකට මුහුණ දෙනවා. අපේ රටේ එහෙම වෙලා තිබෙනවාද?

කනගාටුවෙන් හෝ කාරණයක් කියන්න ඕනෑ. ආපදා කළමනාකරණ රැස්වීමට මට ආරාධනා කළා. මම ඒ ආරාධනාව භාර ගත්තා. මම මේ කථා කරන්නේ මීට මාස කිහිපයකට පෙර - හත්වැනි මාසයේ- සිදු වුණු දෙයක් ගැන. ඊට පසුව අන්තිම මොහොතේ වෙලාව වෙනස් කළා. එසේ අන්තිම මොහොතේ වෙලාව වෙනස් කරන කොට වළක්වන්නට බැරි හේතුවක් හින්දා මට එයට සම්බන්ධ වෙන්න බැරි නිසා මම යෝජනා කළා, අපේ ගරු රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා යවන්න, ඒ ආපදා කළමනාකරණ කමිටුවට. නමුත් ඒක ප්‍රතික්ෂේප කළා. ඇයි එහෙම පටු විධියට කටයුතු කරන්නේ? ඇයි මේ සභාවේ විවාදයක් නොදෙන්නේ මේවා ගැන සාකච්ඡා කරන්න? මේ කරුණු කථා කරන කොට තමයි අපට හැදෙන්නට පුළුවන්; අපට නිවැරැදි වෙන්නට පුළුවන්. අපි එතැනටයි යන්නට ඕනෑ.

ගරු සභාපතිතුමනි, මම විශේෂයෙන් මේ කාරණයත් කියන්න කැමැතියි. අපි National Disaster Response Force එකක් හදන්නට ඕනෑ වාගේම, කාලගුණික, දේශගුණික තත්ත්වය කේන්ද්‍ර කරගත් budgeting ක්‍රමයකටත් යන්නට ඕනෑ.

නිර්දේශපාලනීකරණයට ලක් වුණු අලුත් යන්ත්‍රණයක්, අලුත් පනතක් හරහා ක්‍රියාත්මක වෙන්නට ඕනෑ. ඒ වාගේම, Climate Hazard and Vulnerability Assessment එකක් වාගේම needs assessment එකක්, අවශ්‍යතා පිළිබඳව විනිවිදභාවයෙන් යුක්ත වූ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා ආපදා වළක්වාලීම සඳහා නිර්මාණය වන අලුත් යන්ත්‍රණය ශක්තිමත්ව ක්‍රියාත්මක කරන්න Key Performance Indicators ලබා දෙන්නට ඕනෑ.

ගරු සභාපතිතුමනි, අවසාන වශයෙන් මම යෝජනාවක් කරන්න කැමැතියි. අදින් පස්සේ හෙට පාර්ලිමේන්තුව රැස් වෙන්නේ නැහැ. සිකුරාදා පාර්ලිමේන්තුව රැස් වෙනවා නේ. සිකුරාදා රැස් වෙලා අය වැය සම්මත කර ගන්නවා නේද? මට පොඩ්ඩක් කියන්නකෝ බලන්න, අද රටේ තත්ත්වයට මේ අය වැය ඔබිනවාද කියලා. මේ රටේ වත්මන් තත්ත්වයට සුදුසු අය වැයක් ද මේ සිකුරාදා සම්මත කර ගන්න හදන්නේ? එහෙම නම් මොකක්ද කළ යුත්තේ? ඇත්තම කථා කරනවා නම්, අද උදේ 10.00 වන කොට වාර්තා වන ආකාරයට ලක්ෂ 15කට වැඩි පිරිසක් විපතට පත් වෙලා සිටින මේ අවස්ථාවේදී අපි සංවේදී වෙන්නට ඕනෑ. තව දින ගණනාවක් අරගෙන අපි අලුත් අය වැයක් කෙටි කාලීනව -දින කිහිපයක් තුළ- ගෙන එන්නට ඕනෑ නේද? විපතට පත් ජනතාවට සහන සලසන අය වැයක්, ආපදාවට ලක් වුණු ප්‍රදේශ ගොඩනඟන අය වැයක්, විනාශ වුණු, යට වුණු ඒ ජන ජීවිත, බලප්‍රදේශ ගොඩනඟන අලුත් අය වැයක් අවශ්‍යයි නේද? නමුත්, මේ සිකුරාදාට අප කරන්න යන විහිළුව මොකක්ද? මහා විපතක් වෙලා, මහා සුළි කුණාටුවක් නිර්මාණය වෙලා තිබියදීත් ඒ සිදු වුණු විපත තඹ සතයකටවත් ගණන් ගන්නේ නැතුව එදා කරපු අය වැය කථාවම අනුමත කරන්නට අපි යෝජනා කරනවා. මොන විහිළුවක්ද මේක? මම යෝජනා කරනවා, තව දින කිහිපයක් අරගෙන මේ ඛේදවාචකයට මුහුණ දුන් ජනතාවට සහන සලසන අලුත් අය වැයක් ලබන සතියේ ඉදිරිපත් කරමු කියලා.

මගේ දෙවැනි යෝජනාව මෙයයි. වහාම ක්‍රියාත්මක වන පරිදි ජාත්‍යන්තර ආධාර සමුළුවක් - international donor conference එකක් - කැඳවන්නට ඕනෑ. විපතට පත් ජනතාව වෙනුවෙන් අපි එය ඉෂ්ට කරන්නට ඕනෑ. මේ රජයට එය කරන්න හැකියාවක් නැත්නම් නිසි බලතලත් එක්ක අපට ඒ කටයුත්ත බාර දෙන්න. විපක්ෂයේ අපි සූදානම් ආණ්ඩුවත් එක්ක එක්කහු වෙලා international donor conference එකක් call කරලා මේ මොහොතේ රටට අවශ්‍ය ප්‍රතිපාදන ටික, ආධාර ටික ලබා ගන්න.

මගේ තුන්වෙනි යෝජනාව මේකයි. වහාම IMF එකට කියන්න, අලුත් IMF agreement එකකට යන්න ඕනෑ කියලා. මේ ආපදාවත් එක්ක අපට පුළුවන්ද, IMF එකේ මේ දරදඬු, බරපතළ, ජනතා පීඩක, ජනතා හිංසන කොන්දේසි සමඟ ඉදිරියට යන්න? මේ මොන විහිළුවක්ද? දැන්මම කථා කරන්න IMF එකට. ඔබට කථා කරන්න බැරි නම් අපත් එකතු කර ගන්න. ඔබතුමන්ලාට කියන්න බැරි නම් IMF එකට කියන්න ඕනෑ දේ අපි කියන්නම්. වහාම ඒ කොන්දේසි ටික ඉවත් කරවා ගන්නට ඕනෑ. අපට මහා ඛේදවාචකයක් නිර්මාණය වෙලායි තිබෙන්නේ, මහා විනාශයක් සිද්ධ වෙලායි තිබෙන්නේ. මිනිස් ජීවිත අහිමි වෙලා, අම්මලා, තාත්තලා, දූ දරුවන්, නෑදෑ හිතවතුන්, ආච්චිලා, සීයලා ඇතුළු බොහෝ දෙනෙක් නැති වෙලා; පස්වලට යට වෙලා. මේ වාගේ තත්ත්වයක් තුළ IMF කොන්දේසි යටතේ වැඩ කරන්නද කියන්නේ? ඒ මොන විහිළුවක්ද? ඒ නිසා දැන්ම IMF එකට කථා කරලා ඒ කොන්දේසි ටික ඉවත් කර ගන්න. ඒකට විපක්ෂයේ අපිත් සහයෝගය ලබා දෙන්නම්. අපි ට්‍රම්ප් ජනාධිපතිතුමාට ලියමු, පුළුවන් නම් ගිහිල්ලා හමු වෙමු, සර්ව පාක්ෂික කණ්ඩායමක් හැටියට ගිහිල්ලා ඉල්ලීමක් කරමු, ප්‍රතිවාරක බදු - reciprocal tariff - ටික ඉවත් කර ගන්න කියලා. මොකද, ඒ තුළින් අපට පුළුවන් පොඩි හෝ හයියක් අපේ කර්මාන්ත ක්ෂේත්‍රයට ලබා දෙන්න.

මම පැහැදිලිවම මේ කාරණයත් කියන්න කැමැතියි. අනේ, අපි මේ අය වැය පැත්තක තියලා අලුත් අය වැයකට යමු. මේ කියන කාරණය අවබෝධ කර ගන්න. IMF එක කියලා තිබෙනවා primary balance එක 2.3ට තියා ගන්න කියලා. නමුත්, අපි ඒක 3.8 දක්වා වැඩි කරගෙන බිලියන 479ක් ඉතිරි කරගෙන තිබෙනවා. ඒ ඉතිරි කර ගත්තු සල්ලි රට ගොඩ නඟන්න යොමු කරන්න. රාජ්‍ය ආදායම සියයට 15 ඉලක්කයක තියලා තිබෙනවා. ඔබතුමන්ලා 15.9 දක්වා ගිහිල්ලා තිබෙනවා. අමතර බිලියන 287ක් තිබෙනවා. කරුණාකර ඒ අමතර මුදල් ටික මිනිසා ජීවත් කරවන්නට, මිනිසා රැක ගන්නට, රට සුරකින්නට, රට සංවර්ධනය කරන්නට, ආපදාවට ලක් වුණු ජනතාවට සහන සලසා දෙන්නට යොමු කරන්න. නැති වුණු ගොවි බිම් ටික, තේ, රබර්, පොල් ටික, වී ගොවිතැන, ගොඩ භෝග වගාව, පලතුරු වගාව, අපනයන භෝග වගාව ආදි ක්ෂේත්‍රවලට වහාම සහන ලබා දෙන වැඩ පිළිවෙළක් හදන්න. තේ වගාව ඇතුළු අනෙකුත් වගා සියල්ලටම සහන ලබා දෙන අරමුදලක් ස්ථාපනය කරලා කෘෂි කර්මාන්තය ගොඩ නඟන්න, ස්වයං රැකියා ටික ගොඩ නඟන්න, කර්මාන්ත ක්ෂේත්‍රය ගොඩ නඟන්න. ඒ අය ගොඩ නඟන තෙක් ඒ මිනිසුන්ට ජීවත් වෙන්න දීමනාවක් ලබා දෙන්නට ඕනෑ. එය අනිවාර්යයෙන්ම කරන්නට ඕනෑ. මේ සිකුරාදා කරන්නට යන විහිළුව වෙනුවට තව දින කිහිපයක් අරගෙන මේ ආපදාවෙන් විපතට පත් ජනතාව වෙනුවෙන් අලුත් අය වැයක්, අලුත් යෝජනා සමඟ, වැඩිපුර මුදල් ප්‍රමාණයක් සමඟ අලුත් අය වැයක් අනුමත කර ගන්න අපට බැරි ඇයි කියන ප්‍රශ්නය මා අහන්න කැමැතියි.

අවසාන වශයෙන්, මම කියන්නේ මෙච්චරයි. නිර්දේශපාලනීකරණයට ලක් වුණු ජාතික සංවර්ධන වැඩ පිළිවෙළකට අපි යොමු වෙන්නට ඕනෑ. ඒ වැඩසටහන ක්‍රියාත්මක කරන්නට අපි අපේ සහයෝගයත් ලබා දෙනවා. විශේෂයෙන්ම රට ගොඩනඟන අපේ ආර්ථික සැලැස්මත්, අපේ සමගි ජන බලවේග සන්ධානයේ ආර්ථික සැලැස්මත් අපි ඉදිරිපත් කරනවා. ජාතික සංවර්ධන සැලැස්මක් අපි ඉදිරිපත් කරනවා.

ගරු සභාපතිතුමනි, හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කරන්න කියලා අප යෝජනා කළේ ජනතාවට සහන සලසා දීමේ වැඩසටහන ශක්තිමත් කරන්නයි. එහෙම නැතිව, ප්‍රජාතන්ත්‍රවාදය හකුළුවන්න නොවෙයි. පසුගිය දවසක ප්‍රකාශයට පත් වෙනවා අපි දැක්කා, හදිසි නීතිය උපයෝගී කරගෙන යම්කිසි මාධ්‍ය මර්දනයකට යොමු වන්නට දැන් යම් යම් කණ්ඩායම් උපදෙස් දෙනවා කියලා. විශේෂයෙන්ම නීතිය හා සාමය ක්ෂේත්‍රය භාරව සිටින වග කිව යුත්තන් ඒ වාගේ ප්‍රකාශ කරනවා අපි දැක්කා. එහෙම කරන්න එපා කියලා මම ඉල්ලීමක් කරනවා. හදිසි නීතිය පනවන්නේ ප්‍රජාතන්ත්‍රවාදය හකුළන්න නොවෙයි, රටේ ජනතාවට සහන සලසන්නයි. ඒ වැඩ පිළිවෙළ තුළ අද වන විට සමාජ මාධ්‍ය ක්‍රියාකාරීන්ට එක එක තර්ජන එල්ල වෙනවා. බ්‍රයන්, සේපාල, අසේල ඇතුළු කණ්ඩායම්වලට තර්ජන එල්ල වෙනවා. හදිසි නීතිය හරහා ක්‍රියාත්මක කරන්නට බලාපොරොත්තු වන මර්දනය වහාම නතර කරන්න.

ඒ වාගේම මේ වැදගත් කරුණු කාරණා පිළිබඳව සාකච්ඡාවට භාජන වෙන මේ මොහොතේ කවුරුත් වැඩි අවධානයක් යොමු නොකරන මාතෘකාවක් තමයි Post-Traumatic Stress Disorder කියන්නේ. සිදුවුණු මේ මහා විනාශය තුළ පශ්චාත් කම්පන ආතති අක්‍රමය, මානසික සෞඛ්‍යය - mental health - ප්‍රශ්නය වැනි ජනතාව මුහුණ දෙන ප්‍රශ්නවලට සෞඛ්‍ය ක්ෂේත්‍රයේ මැදිහත්වීමක් අපි ක්‍රියාත්මක කරන්නට ඕනෑ. සමගි ජන බලවේගයේ අපිත්, අපේ පක්ෂ අරමුදල් හරහා රටේ සියලු ප්‍රදේශ ආවරණය වන දැවැන්ත වැඩසටහනක් ක්‍රියාත්මක කරනවා. අපට හැමදේම කරන්නට බැරි වෙයි. යම් කිසි ක්ෂේත්‍රයක් භාර ගෙන දීප ව්‍යාප්තව සහන ලබා දෙන, ක්‍රමවත්, කාර්යක්ෂම වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නට අපි කටයුතු කරනවා.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

අපේ ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා මේ අවස්ථාවේ සභාවේ ඉන්නවා. අපිට ආරංචියක් ආවා, ඌව පරණගම ප්‍රදේශයේ නිවාස අහිමි වෙලා කඳවුරුවල ඉන්න අයට ආපහු නිවාසවලට යන්න කියනවා කියලා. කරුණාකරලා ඒ ගැන සොයා බලන්න. ඒ ප්‍රදේශයේ කඳවුරු 17ක් තිබෙනවා, ඌව පරණගම ප්‍රදේශයේ මස්පන්න ආයුර්වේද රෝහල, හත්කිඳ, අලගොල්ල, දිඹුලන, ගලනිය, රතඹ, කර්කිල්ස්, මානික්කවත්ත හා ගලහගම ආදී ප්‍රදේශවල අයට යන්න කියනවා ලු. නැති ගෙවල්වලට ඒ මිනිස්සු යන්නේ කොහොමද? ඒ මිනිස්සු ආපදාවලට ලක් වුණු නිවාසවලට යන්නේ කොහොමද? එහෙම දෙයක් සිද්ධ වෙනවා නම්, ඒක වහාම වළක්වන්නට කටයුතු කරන්නය කියලා ඉල්ලනවා.

ඒ වාගේම, අපි නොනැවතී රටක් හැටියට ඉදිරියට යන්නට ඕනෑය කියන එක මේ අවස්ථාවේදී නැවත නැවතත් ප්‍රකාශ කරනවා. අපි එඩිතරව කටයුතු කරන්නට ඕනෑ. අපි බෙදෙන්නේ නැතුව, කැඩෙන්නේ නැතුව, වෙන් වෙන්නේ නැතුව, පක්ෂ-විපක්ෂ, ජාති-ආගම්, කුලමල, ගෝත්‍ර, පන්ති භේදයකින් තොරව මේ රට ගොඩනඟන වැඩසටහනට සක්‍රියව, ප්‍රායෝගිකව, අපක්ෂපාතීව අපේ යුතුකම මේ රට වෙනුවෙන්, ජනතාව වෙනුවෙන් ඉටු කරනවාමයි කියන එක ප්‍රකාශ කර සිටිනවා.

ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Anuradha Jayaratne. You have 12 minutes.

[පූ.භා. 11.17]

**ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව විවාදයට ගන්නා මේ අවස්ථාවේදී මේ වැය ශීර්ෂ පිළිබඳව අවධානය යොමු කරන්නේ නැතුව, අද මේ රටේ ඇති වෙලා තිබෙන ව්‍යසනය, මේ ගැටලුව පිළිබඳව කථා කරන්න මගේ කාලය වෙන් කරනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට අපේ කනගාටුවත් මෙහිදී ප්‍රකාශ කරනවා. මොකද, ආණ්ඩු පක්ෂයෙන් අපි පළමුවැනි දා ඉල්ලීමක් කළා, මේ රටේ ඇති වෙච්ච ව්‍යසනය, මේ බරපතළ තත්ත්වය පිළිබඳව පාර්ලිමේන්තුවේදී කථා කරලා, යම් විසඳුමක් සකස් කිරීම සඳහා කාලය අරගෙන දෙන්න කියලා. හැබැයි, ඒ දේ කරන්න එදා ආණ්ඩුව ඉදිරිපත් වුණේ නැහැ. ගරු සභාපතිතුමනි, ඒකේ ප්‍රතිඵලයක් විධියට අපේ ප්‍රදේශයේ ගම්පොල වැනි ආසනවල අදටත් සමහර ප්‍රශ්න විසඳෙන්නේ නැතුව ඒ විධියටම තිබෙනවා. ඒ නිසා එදා අපි ආපු දවසේ - 01වැනි දා - පාර්ලිමේන්තුවේදී මේ ගැන කථා කළා නම්, අඩුම ගණනේ ආණ්ඩුවට මේ කරුණු පිළිබඳව වැඩ පිළිවෙළක් හදන්න තිබුණා. එසේ නොවීම පිළිබඳව පළමුවෙන්ම අපේ බලවත් කනගාටුව ප්‍රකාශ කරනවා. මෙච්චර ගැටලුවක්, ප්‍රශ්නයක් වෙච්ච වෙලාවේදී ඒකට ප්‍රමුඛතාව දීලා වැඩ කටයුතු කරන්නේ නැතුව, අය වැය සම්මත කරලා ආණ්ඩුවේ කාර්යභාරය විතරක් ඉදිරියට ගෙන යන්න මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ කාලය වෙන් කිරීම පිළිබඳව අපේ කනගාටුව ප්‍රකාශ කරනවා, ගරු සභාපතිතුමනි.

ඒ වාගේම, ඊයේ පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් විශාල පිරිසක් ගිහිල්ලා නුවර දිසාපතිතුමා හමු වුණා. අපි ඒ විධියට දිසාපතිතුමා හමු වුණේ, අවංකවම අපට දිය හැකි යම් කිසි සහයෝගයක් තිබෙනවා නම්, උදවුවක් තිබෙනවා නම් ඒ උදවුව කිරීමට මිස, වෙනත් ආකාරයකින් ආණ්ඩුවට මඩගහන්න, ප්‍රශ්න ඇති කරන්න ආදී කිසිම දෙයකට නොවෙයි කියන එක අපි මුලින්ම සඳහන් කරන්නට ඕනෑ. මොකද, සමහර කණ්ඩායම්, සමහර මාධ්‍ය ඒක පාවිච්චි කළා මේ කණ්ඩායම දිසාපතිතුමා, ආණ්ඩුව, රාජ්‍යය අපහසුතාවට පත් කරන්න ආපු කණ්ඩායමක් කියලා. අපට එහෙම කරන්න ඕනෑකමක් තිබුණේ නැහැ. ඊයේ වන විට මම පෞද්ගලිකව දන්නා කියන උදවියගෙන් අරගෙන ලොරි තුනකට වඩා බඩු පුරවලා මහනුවරට, ගම්පොලට අරගෙන ගියා. ඒවා දෙන්න ඕනෑ කරන, අපි දන්නා කියන තැන්වලට එහා ගිය අත්‍යවශ්‍ය තැන් තිබෙනවා නම්, ඒවා දිසාපතිතුමාගෙන් දැන ගන්න එක තමයි අපේ අවශ්‍යතාව වුණේ. ගරු සභාපතිතුමනි, හැබැයි ඒ ගැන නොයෙකුත් විධියට මඩ ගසමින් විවිධ කාරණා ඉදිරිපත් කළා. එහෙම නම්, මම එක දෙයක් මතක් කරන්න කැමැතියි. ඊයේ - 02වැනි දා - උදේ 10.00 වෙනකොට දිසාපතිතුමාගේ කාර්යාලයේ උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මැරුණු මිනිස්සු ගණන තිබුණු ලේඛනයේ 19යි සඳහන් වුණේ. අපේ සෙත්සිරි එකේ සහ පීපල්ස් ලීසිං ආයතනය පිටුපස තිබුණු bodiesවල එකතුව විතරක් කීයද කියලා ගණන් හදලා බලන්න. ඊයේ උදේ 10.00 වෙනකොට දිසාපතිතුමා ළඟ මුළු උඩපළාතේම මැරුණු ගණන වශයෙන් සඳහන්ව තිබුණේ 19යි. ගරු සභාපතිතුමනි, මම මේවා කියන්න හිටපු දේවල් නොවෙයි. හැබැයි, ආණ්ඩුවේ ක්‍රියාකලාපය මේක නම්, ඒක බරපතළ ප්‍රශ්නයක් කියන එක අපි සිහිපත් කරනවා.

මේ ව්‍යසනයේදී කඳු නාය ගියා, ප්‍රශ්න ඇති වුණා, ගැටලු ඇති වුණා. ඒවා පිළිබඳව අපි ආණ්ඩුවට චෝදනා කරන්නේ නැහැ. ඒකට ආණ්ඩුවට කරන්න පුළුවන් දෙයක් නැහැ. ඒක ස්වාභාවික විපතක්, ස්වාභාවික හානියක්. ඒවා පිළිබඳ අපට තර්කයක් නැහැ. හැබැයි, ඒ තුළ ඇති වෙච්ච ගැටලු, ප්‍රශ්න ගණනාවක් තිබෙනවා, ගරු සභාපතිතුමනි.

රන්ටැඹේ ජලාශයෙන් එළියට යන වතුර ප්‍රමාණය ගත්තාම, සාමාන්‍යයෙන් වැඩිම වර්ෂාපතනයකදී ගිහින් තිබෙන්නේ තත්පරයට ඝන මීටර් 3,500යි. හැබැයි, මහවැලි අධිකාරියෙන් කියනවා, ඒක ඝන මීටර් 5,800ක විතර ප්‍රමාණයකට වැඩිවෙයි කියලා. හැබැයි, ඇත්තටම තත්පරයට ඝන මීටර් 7,800ක් රන්ටැඹේ ජලාශයෙන් එළියට නිකුත් කෙරුණා. මේ කාරණාව දැනගෙන සිටියා නම්, අහිංසක මිනිස්සු කලින් දැනුවත් කරන්න බැරි වුණේ ඇයි?

ගරු සභාපතිතුමනි, අනෙක් පැත්තෙන් UNDP එක සමඟ 27වැනි දා තිබුණු රැස්වීම් සියල්ල 26වැනි දා මහවැලි අධිකාරියෙන් අවලංගු කළා. 27වැනි දා උදේ මෙහෙම ව්‍යසනයක් වෙනවා කියලා, ඒ තිබුණු රැස්වීම් සියල්ල 26වැනි දා අවලංගු කළා. ගම්පොල නගරයට ගිහිල්ලා මෙහෙම flood එකක් එනවා කියලා announce කරන්න බැරි වුණේ ඇයි? මිලිමීටර් 160ක වැස්සක් ආවොත් ගම්පොල යට වෙනවා. එදා නිල්ලඹ මාපාංකයේ සටහන් වෙනවා, තත්පරයට මිලිමීටර් 440ක වැස්සක්. තත්පරයට මිලිමීටර් 440ක වැස්සක් එනවා නම් තත්පරයට මිලිමීටර් 160ක වැස්සකටත් යට වන ගම්මානවලට ගිහිල්ලා ඒ ගැන දැනුවත් කළේ නැත්තේ ඇයි? ඒ විතරක් නොවෙයි. ගරු සභාපතිතුමනි, නාවලපිටියට උඩින් තිබෙනවා Irrigation Department එකේ gauging station එක. ඒ gauging station එකෙන් මහවැලි ගඟේ එන වතුර ප්‍රමාණය මනිනවා. මේ වතුර ප්‍රමාණය මැනලා, ඒක ගම්පොල නගරයට කිව්වා නම් ඔය මැරුණු අයගෙන් සියයට 80ක් එදා බේරෙනවා. හැබැයි, ඒ කිසිම

දෙයක් පිළිබඳව දැනුවත් වෙලා ගම්පොල නගරයේ සිටින මිනිස්සුන්ට ඒවා සන්නිවේදනය කළේ නැහැ. එහෙම නම්, අර නාවලපිටියට උඩින් තිබෙන gauging station එක සම්පූර්ණයෙන් අකර්මණ්‍යයි. මහවැලියෙන් එන වතුර ටික මැනලා නගරයේ ඉන්න මිනිස්සුන්ට ඒ පණිවුඩය සන්නිවේදනය කරන්න බැරි වුණා. ඒ පණිවුඩය සන්නිවේදනය කළා නම් ඒ මැරුණු මිනිස්සුන්ගෙන් සියයට 80ක් අද ජීවත් වෙනවා. ඒක කරගන්න බැරි වුණා. ගරු සභාපතිතුමනි, ඔය ගම්පොල නගරයේ මැරුණු හැම ජීවිතයක් වෙනුවෙන්ම මේ ආණ්ඩුව වග කියන්න ඕනෑ කියා අපි මේ සභාවේදී කියනවා. ඒ වෙන මොකවත් නිසා නොවෙයි. ස්වාභාවිකව කඳු නාය ගිහින්, ප්‍රශ්න ඇති වෙලා, ගැටලු ඇති වුණා නම් ඒ පිළිබඳ තර්කයක් නැහැ. ගම්පොල නගරයේ හිටපු අහිංසක මිනිස්සු ටික මැරුවා. 27වැනි දා ගම්පොලට තත්පරයට මිලිමීටර් 440ක් වහිනවා කියන පණිවුඩය කිව්වේ නැහැ.

ඒ විතරක් නොවෙයි ගරු සභාපතිතුමනි. නැවත වතාවක් 30වැනි දා Kotmale Dam එක අරිනවා කියන ආරංචියකට මිනිස්සු හිස් ලූ ලූ අත දුවන්න පටන්ගත්තා; කඳු දිගේ දිව්වා. ත්‍රීවීලර් එකක loudspeaker එකක් ගැට ගහලා announcement එකක් දෙන්න තිබුණා. සමහර මිනිස්සුන්ට කියලා තිබෙන්නේ Kotmale Dam එකේ ඉරි ගිහින් කියලා. සමහර මිනිස්සු කඳු හොයාගෙන දිව්වා. එවැනි තත්ත්වයක් තමයි තිබුණේ. පහුවැනි දා උදේ තමයි ඔවුන් ගෙවල්වලට ආවේ. ඒ එනකොට කඩ ටික, ගෙවල් ටික හොරු කඩලා. ඒක හරියට සන්නිවේදනය කළේ නැත්තේ ඇයි? අද SMS එකකින්, WhatsApp message එකකින් මුළු රටක් දැනුවත් කරන්න පුළුවන්. "කොත්මලේ ප්‍රශ්නයක් නැහැ, කිසි ගැටලුවක් නැහැ, ආරක්ෂිතව සන මීටර් 80ක් විතරයි එළියට නිකුත් කරන්නේ" කියලා SMS එකක් යවන්න බැරි වුණේ ඇයි? එවැනි තත්ත්වයකට මේ කටයුතු අකර්මණ්‍ය වුණා, ගරු සභාපතිතුමනි. මම මේ ගැන කියන්නේ වෙන මොකවත් නිසා නොවෙයි. ආපදා පිළිබඳව තිබෙන වැඩ පිළිවෙළ මේක නම්, එය බරපතළ ප්‍රශ්නයක්. අහිංසක මිනිස්සුන්ගේ ජීවිත උඩින් මේක ගියේ.

ඒ විතරක් නොවෙයි, ගරු සභාපතිතුමනි. ඊයේ මාවතුරේ ගෙවල් 15ක් සම්පූර්ණයෙන් ගහගෙන ගිහිල්ලා. මිනී හතළිස් ගණනකට වඩා තිබෙනවා, ඒ ඉඩම ඇතුළේ. ඒවා ගන්න JCB machine එකක්වත් අද වෙනකල් ආණ්ඩුවෙන් යවලා නැහැ. මේ මම කථා කරන මොහොත වෙනකොටත් යවලා නැහැ. මිනිස්සු මුදල් එකතු කරලා, JCB machine එකක් rent එකට ගෙනැල්ලා, තෙල් ටික ගහලා තමයි ඒ මිනී ටික ගොඩගන්නේ. ගරු සභාපතිතුමනි, ඉතින් මොකක්ද ආණ්ඩුවේ වැඩ පිළිවෙළ?

ගරු සභාපතිතුමනි, නුවරඑළිය පාර කියන්නේ රටේ තිබෙන ප්‍රධාන පාරක්. අද වෙනකොට පාරදෙක ප්‍රදේශයෙන් නුවරඑළියට යන ප්‍රධාන මාර්ගය විවෘත කරගන්න බැහැ. අටබාගෙන් දුනුකේඋල්ලට යන ප්‍රධාන මාර්ගයේ අද වෙනකල් යන්න බැහැ. Dialysis කරන ලෙඩ්ඩු ඉන්නවා. ඒ ලෙඩ්ඩු ටික පහළට ගෙනෙන්න බැහැ. RDA එකෙන්, PRDA එකෙන් machine එකක් යවලා නැහැ ඒ පාර පිරිසිදු කරගන්න. ඒ නිසා තමයි අපි කිව්වේ 01වැනි දා පාර්ලිමේන්තුවේ කථා කරලා, දත්ත තොරතුරු කියලා වැඩ පිළිවෙළක් හදමු කිව්වේ. අඩුම ගාණේ ඒ වැඩ පිළිවෙළ හැදීමට සම්බන්ධ අපේ අදහස් කියන්නවත් අවස්ථාවක් ලබා දුන්නේ නැහැ. එතකොට රටක් ඉස්සරහට යන්නේ කොහොමද ගරු සභාපතිතුමනි? මේක බරපතළ ප්‍රශ්නයක්. මේක කළමනාකරණයෙන් සම්පූර්ණයෙන්ම ගිලිහිච්ච ප්‍රශ්නයක් කියන එක මේ වෙලාවේදී මම සිහිපත් කරන්න ඕනෑ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, Hon. Gayantha Karunathilleka?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු සභාපතිතුමනි, අද කථිකයන් රාශියක් ඉන්නවා, කථා කරන්න. මේ විපත ගැන නේ අද කථා කරන්නේ. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගෙන් මම ඉල්ලා සිටිනවා, කෑම වෙලාව සඳහා වෙන් කර ඇති කාලය අද දවසට පමණක් මේ විවාදයට ලබා දෙන්න කියලා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
එම යෝජනාවට ආණ්ඩු පාර්ශ්වය එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
එකඟයි.

**ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, ගම්පොල නගරයේ විපතට පත් මිනිස්සුන්ගේ තත්ත්වය 27වැනි දා අපි දැක්කා. ගම්පොල නගරයේ ගෙවල්වල දෙවැනි තට්ටුවල, තුන්වැනි තට්ටුවල ඉන්න මිනිස්සු ටික මුදාගන්න බෝට්ටු ටිකක් දෙන්න කියලා ඉල්ලීමක් කළා, 28වැනි දා උදේ. හැබැයි, බෝට්ටු ටික එනකොට 29වැනි දා උදේ 6.00යි. මෙච්චර flood එකක් ඇති වෙනවා කියලා දන්නවා නම්, මිලිමීටර් 400ක, 500ක වැස්සක් එනවා කියලා දන්නවා නම්, අඩුම ගාණේ ඩිංගි බෝට්ටු ටිකක් තියන්න තිබ්බා ගම්පොල නගරය කිට්ටුව. මෙහෙම යට වෙනවා කියලා දන්නවා නම්, මධ්‍යම පළාතට මෙවැනි වර්ෂාපතනයක් ලැබෙනවා කියලා දන්නවා නම්, බෝට්ටු දෙන වැඩ පිළිවෙළක් හදන්න තිබුණා. 28වැනි දා උදේ ඉල්ලපු බෝට්ටු ටික 29වැනි දා එනකොට වෙන්න ඕනෑ සියල්ල වෙලා ඉවරයි. නිවාසවල පළමුවෙනි තට්ටුවල ඉඳලා කෑ ගහපු මිනිස්සුන්ගෙන්, phonesවල torch දමාගෙන බේරාගන්න කියලා කෑ ගහමින් හිටපු මිනිස්සුන්ගෙන් එක්කෙනෙක්වත් බේරාගන්න බැරි වුණා. ඒක තමයි ඇත්ත තත්ත්වය.

ගරු සභාපතිතුමනි, Disaster Management Centre එකේ meetings ටික කරන්න ඕනෑ. ඒකට disaster management පිළිබඳව යම් වැඩ පිළිවෙළක් තිබෙනවා. මේ ව්‍යසනය පිළිබඳව සියලුදෙනා දැනගෙන හිටියා. සියලුදෙනා දන්නවා, මෙවැනි සුළි කුණාටුවක් එනවා කියලා. ඒක දැනගෙන සිටියදීත්, Disaster Management Centre එක අවසාන වශයෙන් රැස් වුණේ කවදාද? Disaster Management Centre එක දිසාපතිතුමන්ලා, ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කළේ කවදාද? නගර සභාවල, ප්‍රාදේශීය සභාවල කණ්ඩායම් මේ සම්බන්ධව දැනුවත් කළේ කවදාද? ඒ කිසිම කෙනෙක් මේ සම්බන්ධයෙන් දැනුවත් කරලා නැහැ. ඒ නිසා තමයි අහිංසක මිනිස්සු ටිකකට ඒ විධියට මැරෙන්න සිද්ධ වුණේ.

අනෙක් පැත්තෙන්, මෙන්න මේ කාරණයට අපි ප්‍රධාන වශයෙන්ම පාර්ලිමේන්තුවේ අවධානය යොමු කරවනවා. දැන් හරි කමක් නැහැ, මැෂිමක් යවලා අටබාගේ ඉඳලා දුනුකේඋල්ලට යන ප්‍රධාන මාර්ගය විවෘත කරලා දෙන්න. එම ප්‍රදේශවල බොහෝ

[ගරු නිතිඥ අනුරාධ ජයරත්න මහතා]

පිරිසක් ජීවත් වනවා. ඒවා කඩුගන්නාවේ මාර්ගයේ වාගේ හදන්න බැරි තැන් නොවෙයි. ඒ නාය ගිය පස් ටික අයින් කර දැම්මොත් මිනිස්සුන්ට යන්න පුළුවන්. ඒ ප්‍රදේශවල සිටින ලෙඩ්ඩු ටික ගම්පොළ රෝහලට ගේන්න ත්‍රි රෝද රථයකට හෝ යන්න පුළුවන් විධියට පාර හදලා දෙන්න. ඒ වාගේම පාරදෙක ප්‍රදේශයෙන් පුස්සැල්ලාව හරහා නුවරඑළියට යන ප්‍රධාන මාර්ගයත් විවෘත කර දෙන්න. අද අපි මේ කථා කරන්නේ, මේ ප්‍රශ්නය ඇති වෙලා හයවෙනි දවසේ. හයවෙනි දවසේත් අපට ඒ පස් ටික අයින් කරලා ප්‍රධාන පාරවල් විවෘත කරගන්න බැහැ. A1 Road එක ඇතුළු ප්‍රධාන මාර්ග ටික විවෘත කරගන්න බැරි නම්, අර අහිංසක මිනිස්සු ගැන තව මොන කථාද?

මේ අවස්ථාවේ මම විශේෂයෙන් ඉල්ලීමක් කරනවා නිල්ලඹ ජලාශයට යන එලටන් මාර්ගය පිළිබඳවත්. මේ වන විට විනාශ වූ මාර්ග ගණනාවක් තිබෙනවා, ගම්පොල නගරයේ. අඩුම ගාණේ මම මේ කියන නිල්ලඹ දක්වා යන මාර්ගය, පාරදෙක, අටබාගේ හරහා දුනුකේඋල්ලට යන පුස්සැල්ලාව මාර්ගය හරි විවෘත කළේ නැත්නම් ලෙඩ්ඩු ටිකත්, ඒ ප්‍රදේශයේ කඳු ආශ්‍රිතව ඉන්න මිනිස්සු ටිකත් අවසානයේ මැරෙනවා. එම ප්‍රදේශයේ කිලෝමීටර 6ක් යන්න අපට පැය දෙකහමාරකට තුනකට වඩා ගියා. කඳු අස්සෙන්, වතු ඇතුළෙන් ගිහිල්ලා තමයි ඒ ස්ථානවලට ළඟා වෙන්න ඕනෑ. සමහර තැන්වලට අද වෙනකල් ග්‍රාම නිලධාරින් ගිහිල්ලා නැහැ. ඒ ප්‍රදේශවලට අදාළ සංඛ්‍යාලේඛන ටික, දත්ත ටික නිවැරදිව එකතු වෙලා නැහැ. අවදානමට ලක් වෙච්ච කොච්චර පිරිසක් පන්සල්වල, ඉස්කෝලවල ඉන්නවාද කියලා නිවැරදි සංඛ්‍යාලේඛන නැහැ. ඒ නිසා මම විශේෂයෙන් කියනවා, මේ කාරණාව පිළිබඳව මීට වඩා ගැඹුරින් හිතලා සුදුසු වැඩ පිළිවෙළක් හදන්න කියලා. මේ සම්බන්ධයෙන් කියනවා නම් කරුණු කාරණා බොහොමයක් තිබෙනවා කියන්න. නමුත් මට ලැබී තිබෙන කාලය තුළ මම මේ උත්තරීතර සභාවට යෝජනා කිහිපයක් ඉදිරිපත් කරන්න කැමැතියි.

පළමුවෙනි කාරණාව මෙයයි. අද වතුකරයේ ඉන්න ජනතාවගෙන් විශාල පිරිසක් අවතැන් වෙලා පාසල්වල, පන්සල්වල නතර කර තිබෙනවා. වතුර බැහැලා ගියාම වෙන දා වාගේ ඒ කණ්ඩායම් නැවත වතාවක් ඔවුන්ගේ ගෙවල්වලට යවන්න පුළුවන්කමක් නැහැ. ඒකට හේතුව, ඔවුන් පදිංචිව සිටි ගෙවල් එක්කෝ ඉරි තළලා, එහෙම නැත්නම් ඒ ඉඩම් ටික නාය ගිහිල්ලා සම්පූර්ණයෙන් විනාශ වෙලා. එම නිසා ආයෙත් යන්න පුළුවන් මට්ටමේ ගෙයක් ඒ මිනිස්සුන්ට නැහැ. ඒ නිසා මේ පාර්ලිමේන්තුවට යෝජනාවක් ගෙනැල්ලා දහස් ගණනක් වූ ඒ මිනිස්සුන්ට ඉඩම් ටික ලබා දෙන ක්‍රමයක් අනුමත කරන්න. වැවිලි සමාගම්වලින් ඒ අවශ්‍ය ඉඩම් ටික ගන්න ගියොත් ඒක ප්‍රායෝගික නැහැ. ප්‍රාදේශීය ලේකම්ලා ගිහිල්ලා අතැනින් ඉඩමක් දෙන්න, මෙතැනින් ඉඩමක් දෙන්න කිව්වාට එක මනුස්සයෙක් ඉඩමක් දෙන්නේ නැහැ. පෞද්ගලික වැවිලි සමාගම් ටික ඔය කිසි කෙනෙකුට කවදාවත් ඉඩමක් දෙන්නේ නැහැ. ඒ නිසා හැකි ඉක්මනින් මේ මිනිස්සුන්ට විකල්ප හැටියට දෙන ඉඩම් ටික යෝජනා කරලා, මේ පාර්ලිමේන්තුවේ ඊට අදාළ යෝජනා සම්මත කරගන්න. එහෙම කරලා ඒ අහිංසක මිනිස්සුන්ට - වතුකරයේ ඉන්න ජනතාවට - ඉඩම් ටික ලබා දීමේ වැඩ පිළිවෙළ කඩිනමින් හදන්න කියන ගෞරවනීය ඉල්ලීම අපි කරනවා. ඒ වෙන මොනවත් නිසා නොවෙයි. ඒ අය හිටපු තැන්වලටම ගියොත්, ඒ මිනිස්සු තවත් අමාරුවේ වැටෙනවා. අමාරුවේ වැටෙනවා විතරක් නොවෙයි, මේ ප්‍රශ්නය අවසන් වෙන්නේත් නැහැ. මේ නිසා හැමදාම අපට දුක් විඳින්න සිද්ධ වනවා.

ගරු සභාපතිතුමනි, දෙවැනි කාරණාව මෙයයි. ජීවිත කාලයම කැප කරලා ගම්පොල නගරයේ ව්‍යාපාර ටික හදාගත්ත මිනිස්සු ඉන්නවා. මම දන්නා කණ්ඩායම් ඉන්නවා. ඒ සමහරු රට ගිහිල්ලා මැෂින් ගෙනැල්ලා ගම්පොල නගරයේ ඔවුන්ගේ ව්‍යාපාර පටන් ගත්තා. ජීවිත කාලය පුරා හම්බ කරපු දේවල්වලින් ඒ හදපු ගොඩනැඟිල්ල, ඒ හදපු ඒ ව්‍යාපාර අද එහෙමපිටින්ම විනාශ වෙලා ඒ මිනිස්සුන්ගේ සියල්ල නැති වෙලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඔවුන් වෙනුවෙන් සහන ණය ක්‍රමයක් හදන්න. ගම්පොල නගරයේ විතරක් නොවෙයි, මහනුවර දිස්ත්‍රික්කය ඇතුළු ලංකාව පුරා මේ වාගේම අවදානටම ලක් වෙච්ච, ගැටලුවලට මුහුණ දීපු පිරිසට මොනවා හරි සහන ණයක් ලබා දෙන ක්‍රමයක් හදන්න. අවුරුද්දකවත් grace period එකක් දීලා ඒ මුදල් ලබා දෙන ක්‍රමයක් රාජ්‍ය බැංකු සම්බන්ධ කරගෙන කරන්න.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Anuradha Jayaratne, your time is up.

**ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne, Attorney-at-Law)
Hon. Chairman, I will be taking one minute from the Hon. Ravi Karunanayake's time.

ගරු සභාපතිතුමනි, මම ඉල්ලීමක් කරනවා, BOC හෝ වෙනත් රාජ්‍ය බැංකු හෝ යම් ප්‍රමාණයක් ඒකාබද්ධ කරගෙන, ව්‍යාපාර කඩා වැටිච්ච ඒ අහිංසක මිනිස්සුන්ට ණය මුදලක් හෝ ලබා දීලා නැවත වතාවක් ඔවුන්ගේ ජීවත්වීමේ ක්‍රමය, ව්‍යාපාර සාමාන්‍යකරණයට අවශ්‍ය වැඩ පිළිවෙළක් හදන්න කියලා.

ගරු සභාපතිතුමනි, මේ කටයුත්ත එම ප්‍රදේශවල සංවර්ධන කමිටුවලට, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට, ලාල් කාන්ත ඇමතිතුමාට හෝ වෙනත් තනි කෙනෙකුට ගොඩ දාන්න පුළුවන් දෙයක් නොවෙයි. පාලම් ටික හදන්න විතරක් රුපියල් බිලියන ගාණක් යනවා. පැති බැමි ටික ගහන්න විතරක් විශාල මුදලක් යනවා. අපි සාමාන්‍යයෙන් දකිනවාට, හිතනවාට වැඩිය එහා ගිය බරපතළ අර්බුදයක් මේ ප්‍රදේශවල තිබෙනවා. ගරු සභාපතිතුමනි, මුදල් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සාකච්ඡාවට ගැනෙන අද දිනයේදී මේ කටයුතු සඳහා වෙනම මුදලක් වෙන් කරලා දැඩි ලෙස ආපදාවට ලක් වූ මහනුවර දිස්ත්‍රික්කය නැවත ගොඩගැනීමේ, සංවර්ධනය කිරීමේ කඩිනම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියන ගෞරවනීය ඉල්ලීම මම කරනවා. ගරු සභාපතිතුමනි, මේ යෝජනා තුන ක්ෂණිකව මේ පාර්ලිමේන්තුව තුළින් ඉටු කරන්න ක්‍රියාත්මක වෙන්න කියන ගෞරවනීය ඉල්ලීම ආණ්ඩු පක්ෂයේ සියලුදෙනාගෙන් ඉල්ලමින්, විපක්ෂය හැටියට අපට කළ හැකි, කළ යුතු සියලු කාරණාවලදී, ආණ්ඩුව එක්ක හැප්පෙන්න නොවෙයි, ආණ්ඩුවත් එක්ක එකතු වෙලා කටයුතු කරන්න ඉදිරිපත් වෙනවාය කියන එකත් මතක් කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Nishantha Jayaweera. You have 12 minutes.

[පූ.භා.11.32]

**ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)

(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)

ගරු සභාපතිතුමනි, අද මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය සහ වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය පිළිබඳ කාරක සභා විවාදය පැවැත්වෙනවා.

මේ අවස්ථාවේදී ප්‍රථමයෙන්ම මම මේ කාරණය සඳහන් කරන්න ඕනෑ. අපි කවුරුවත් බලාපොරොත්තු නොවූ නොසිතූ වෙලාවක පැමිණි "දිට්වා" සුළි කුණාටුව නිසා ඇති වුණු මේ ස්වාභාවික විපතින් ජීවිත අහිමි වූවන්ගේ ඥාතීන්, මේ නිසා විපතට පත්ව අවතැන් වෙලා ඉන්න පිරිසට, ඒ වාගේම මේ පිරිස්වලට උදවු උපකාර කරන්න ගිහිල්ලා ජීවිත අහිමි වෙච්ච රජයේ නිලධාරින්ගේ ඥාතීන් ඇතුළු සියලුදෙනාට රජයේ බලවත් ශෝකය මේ අවස්ථාවේ පළ කර සිටිනවා. ඒත් එක්කම කියන්න ඕනෑ, මේ නිසා විපතට පත් වෙච්ච ජනතාව මුදාගන්න සම්පූර්ණ රාජ්‍ය යාන්ත්‍රණයම කැප වෙලා තිබෙන බව. පොලීසිය ඇතුළු ආරක්ෂක සේවාවල නියුතු සියලුදෙනා තමන්ගේ කාලය, ශ්‍රමය, ධනය කැප කරලා දිවා රෑ නොතකා ඒ කාර්යයේ නිරත වෙනවා. අපේ රජය වෙනුවෙන් ඔවුන්ට අපේ ස්තුතිය ප්‍රකාශ කරනවා.

විශේෂයෙන්ම මේ අවස්ථාවේ මම මේ කාරණයත් කියන්න ඕනෑ. මේ අර්බුදයේ ගැඹුර, බරපතළකම පැහැදිලිව රජය හැටියට අපි අවබෝධ කරගෙන තිබෙන නිසා තමයි "Rebuilding Sri Lanka" කියන අරමුදල ස්ථාපනය කරන්න කටයුතු කළේ. ඒ අරමුදල සම්බන්ධයෙන් විපක්ෂය විවිධ පටලවා ගැනීම් කරගෙන තිබුණා. විපක්ෂයේ මන්ත්‍රීවරු සඳහන් කළා, මේ අරමුදලේ සාමාජිකයන් හැටියට වෛද්‍යවරුන්, ඉංජිනේරුවන් ඇතුළත් කරලා නැහැ කියලා. ඒක සම්පූර්ණයෙන්ම වැරදි ලෙස වටහා ගැනීමක්. මේ අරමුදල පිහිටුවීමේ පරමාර්ථය සහ ප්‍රධානම අරමුණ මෙයයි. මේ වනකොට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ විවිධ ආයතන විසින් මේ රට ගොඩනැඟීමේ කාර්යයේ නිරත වනවා. ඒ වෙනුවෙන් අවශ්‍ය මුදල් ප්‍රතිපාදන එක්රැස් කිරීම වෙනුවෙන් අරමුදලක් පිහිටුවීම තමයි මෙහි මූලික අරමුණ වුණේ.

මේ අරමුදල සඳහා විශේෂයෙන්ම මුදල්, ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා, මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු සාමාජිකයන් පිරිසක් පත් කරලා තිබෙනවා. ඔවුන්ට විශේෂ කාර්යභාරයක් පවරා තිබෙනවා මේ අරමුදල සඳහා විශාල මුදලක් එක්රැස් කර ගන්නට. විදේශ රාජ්‍යයන් සමඟ, රාජ්‍ය නොවන සංවිධාන සහ දානපතියන් සමඟ සාකච්ඡා කරලා මේ අරමුදල ගොඩනංවා ගැනීම තමයි ඔවුන්ගේ කාර්යභාරය වන්නේ.

ඒ අරමුදල ගොඩනංවා ගැනීම තුළින් මේ කටයුතු ඉතාම විනිවිදභාවයෙන්, වගකීමෙන් සහ මූල්‍ය විනයක් තුළ ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් අපි සහතික වෙනවා. මේ අරමුදලේ කමිටුවට පත් කරලා ඉන්නවා, මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා. මේ අරමුදල ඉතා විනිවිදභාවයෙන් නිසි කාර්යය සඳහාම යෙදෙවෙන බවට පැහැදිලිවම අපට රජය විධියට සහතික වෙන්න පුළුවන්.

මේ අවස්ථාවේදී මේ අය වැය තුළ යෝජනා කරලා තිබෙන බදු යෝජනා පිළිබඳව ප්‍රථමයෙන්ම මම කථා කරන්න කැමැතියි. මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට මූලධන වියදම් වෙනුවෙන් රුපියල් බිලියන 265ක්, පුනරාවර්තන වියදම් වෙනුවෙන් රුපියල් බිලියන 341ක් සහ රාජ්‍ය ණය සේවාකරණය වෙනුවෙන් රුපියල් බිලියන 4,495ක් වෙන් කරලා තිබෙනවා. මේ සභාවේදී විපක්ෂය පැත්තෙන් කියැවුණා, මුදල් අමාත්‍යාංශයට අතිවිශාල මුදලක් වෙන් කරලා තිබෙනවා කියලා. මේ අමාත්‍යාංශයට තමයි එහෙම අතිවිශාල මුදලක් වෙන් කරලා තිබෙන්නේ. මේ අමාත්‍යාංශයට වෙන් කරලා තිබෙන මුළු මුදල වන රුපියල් බිලියන 5,102න්, රුපියල් බිලියන 4,495ක්ම යෙදවෙන්නේ ණය සේවාකරණය වෙනුවෙන්.

විශේෂයෙන්ම පසුගිය කාලයේදී මතු වෙච්ච කාරණාවක් තමයි, මුදල් අමාත්‍යාංශය විශාල මුදලක් එක්රැස් කරගෙන තිබෙනවා, නමුත් වියදම් කරන්නේ නැහැ කියන එක. මුදල් අමාත්‍යාංශයෙන් ඉදිරිපත් කරලා තිබෙන ලිපි ලේඛන සහ පොත් පත් පරිශීලනය කරලා බැලුවොත් ඔබතුමන්ලාට දකින්න පුළුවන් වෙයි, 2026 වසර තුළදී කල් ඉකුත් වන භාණ්ඩාගාර බිල්පත් ගෙවීම වෙනුවෙන්, ඒ ඉතුරු කර ගත් මුදලින් රුපියල් බිලියන 500ක් යෙදෙවෙනවාය කියන එක. ඒකෙන් වෙන්නේ පිටින් භාණ්ඩාගාර බිල්පත් ගන්න බැරි වෙන එකයි. ඒ වාගේම ඒ වෙනුවෙන් ගෙවන්න තිබෙන පොලිය සඳහා රජයෙන් මුදල් වැය වෙන්නේ නැහැ. එතැනින් මුදල් ආරක්ෂා වීමක් සිද්ධ වෙනවා.

ඒ වාගේම ඔබතුමන්ලා සඳහන් කළා, මුදල් නිකම් තිබෙනවා කියලා. එහෙම නැහැ. මුදල් තිබුණු නිසා තමයි මේ වෙලාවේදී විපතට පත් වෙච්ච ජනතාවට සහන සලසන්න පුළුවන් වුණේ. මෙතෙක් කාලයක් ආපදාවට ලක් වෙච්ච ජනතාවට හම්බ වුණු සුළු වියළි ආහාර දීමනාව අපේ රජය විශාල වශයෙන් වැඩි කළා. ඊට අමතරව විපතට පත් වෙච්ච ජනතාවගේ නිවාස යථා තත්ත්වයට පත් කරගෙන, නැවත ඒවායේ පදිංචි වීම සඳහා රුපියල් 25,000ක පමණ දීමනාවක් ලබා දීමට රජය සහ ජනාධිපතිතුමා මේ වනවිට චක්‍රලේඛ නිකුත් කරලා තිබෙනවා. මුදල් ඉතුරු කර ගැනීම නිසා තමයි ජනතාවට ඒ සහන සහ අවශ්‍ය දේවල් ලබා දීමට හැකිවෙලා තිබෙන්නේ.

ඊටත් අමතරව මට තවත් දෙයක් කියන්න තිබෙනවා. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අදාළව අය වැය යෝජනා තුළ ආදායම් යෝජනා 4ක් ඉදිරිපත් කරලා තිබෙනවා. පළමුවැනි යෝජනාව තමයි, පොල් තෙල් සහ palm oil ආනයනය මත VAT එක සහ SSCL එක අය කිරීම. ඒ යෝජනාව ඉදිරිපත් කරන්න හේතුව මෙයයි. මෙතෙක් කාලයක් පොල් තෙල් සහ palm oil දේශීයව නිෂ්පාදන කරනවා නම් ඒ වෙනුවෙන් VAT එක සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද - SSCL එක- අය කළා. නමුත්, ඒවා ආනයනය කිරීමේදී එහෙම බද්දක් අය වුණේ නැහැ. ඒ නිසා සමාන තරගකාරි තත්ත්වයක් ඇති කිරීම වෙනුවෙන් පොල් තෙල් සහ palm oil මත VAT එක සහ SSCL එක පැනවුණා.

ඒ වාගේම දේශීයව නිෂ්පාදනය කරන රෙදි පිළි මත VAT එක අය වෙනවා. හැබැයි, ආනයනික රෙදි පිළිවලට මෙතෙක් කාලයක් එහෙම බද්දක් අය වුණේ නැහැ. අපි අය වැය යෝජනා තුළ ආනයනික රෙදි පිළිවලටත් VAT එක පනවන්න තීරණය කරලා තිබෙනවා.

ඊළඟට, මෙතෙක් වාහන ආනයනය කිරීමේදී සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද පැනවුණේ නැහැ. හැබැයි, වාහන විකුණන අවස්ථාවේදී සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද පැනවුණා. විකුණන වෙලාවේදී පනවන ලද සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද ඉවත් කරලා එය ආනයනය අවස්ථාවේදී එය පනවන්න තීරණය කළා. මේ තීරණය ගන්න විශේෂ හේතුව වුණේ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද එතැනට විතැන් කරලා දෙන්න කියලා මේ ක්ෂේත්‍රයේ නිරත වෙලා හිටපු විශාල පිරිසකගෙන් ඉල්ලීමක් ඉදිරිපත් වුණු නිසායි. අන්න ඒ ඉල්ලීම අනුව තමයි මේක සිද්ධ කරලා තිබෙන්නේ.

[ගරු නිශාන්ත ජයවීර මහතා]

ඊට අමතරව එකතු කළ අගය මත බද්ද සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද අය කරන සීමාව පල්ලෙහාට ගෙනාවා. එම සීමාව පල්ලෙහාට ගෙනෙන්න ප්‍රධානම හේතුව මෙයයි. අපේ රජයේ ප්‍රධාන ප්‍රතිපත්තිය තමයි, බදු පදනම පුළුල් කරන එක. බදු පදනම පුළුල් කර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය පසුබිම සැකසීමක් විධියට තමයි VAT එක සහ SSCL එක යටත් වන සීමාව පහළට ගෙනාවේ. මෙතැනදී රජයේ අරමුණ වන්නේ බදු පදනම පුළුල් කරලා, බදු ගෙවන්නන් වැඩි දෙනෙක් මේ බදු පදනම තුළට ගෙනෙන එකයි.

අපිත් පිළිගන්නවා, ඇත්තටම දැනට පවතින සියයට 18ක VAT අනුපාතය වැඩියි කියන එක. අපේ රජයේ අරමුණ වන්නේ බදු ගෙවන්නන් වැඩි පිරිසක් බදු ගෙවන ජාලයට ඇතුළත් කරගෙන VAT අනුපාතය පහළට ගෙන ඒමයි. ඒ වාගේ ඉදිරි දැක්මක් ඇතුව තමයි මේ බදු පදනම පුළුල් කිරීමේ අරමුණ ගෙනෙන්නේ. ගොඩක් වෙලාවට අපට විපක්ෂයෙන් චෝදනා කළේ මේ තුළින් සියයට 18කින් බඩු මිල වැඩි වෙනවා කියායි. එහෙම වෙන්නේ නැහැ. මොකද, දැනටමත් ගෙවන VAT එක තුළ ඒකට අදාළ input බද්ද තිබෙනවා. එතකොට වැඩි වන අගයට අදාළ VAT එක විතරයි වැය වෙන්නේ. ඒකත් වෙළෙන්දන් මත හෝ නිෂ්පාදකයන් මත නොවෙයි පැනවෙන්නේ. මේක අවසන් පාරිභෝගිකයා මතට තමයි පැනවෙන්නේ. එතකොට වැය බර දරන්න වෙන්නේ පාරිභෝගිකයාට. ඒක ලොකු ප්‍රමාණයක් වෙන්නේත් නැහැ. නමුත්, බදු පදනම පුළුල්වීම ඇතුළත හැමෝටම අවසානයේ සියයට 18 VAT එක බලපානවා. ඒ ප්‍රමාණය වැඩියි. රජයේ අවසාන පරමාර්ථය වන්නේ ඉදිරියේදී ඒක අඩු කරන්නේ කොහොමද කියන එකයි. ඒ සඳහා වන එක උපක්‍රමයක් විධියට තමයි threshold එක පහළට ගෙනෙන්නේ.

අද විපක්ෂයේ සිටින ඔබතුමන්ලාගේ පාලන කාලයේදී ඉතා සංකීර්ණ බදු ක්‍රමයක් තිබුණේ. අපි කලින් පැවැති බදු ක්‍රමය ගත්තොත්, ආදායම් බදු වාර්තාවක් දෙන කෙනෙකුට ඒ බදු වාර්තාව දෙන්න කලින් ඇස්තමේන්තුගත ආදායම් වාර්තාව කියලා තක්සේරු වර්ෂය ආරම්භයේදීම තවත් වාර්තාවක් දෙන්න වුණා. එහෙම වාර්තාවක් දීපු කෙනාට ටික දවසක් යනකොට ඒක වැරදියි කියලා හිතෙනවා නම්, ආයෙත් සංශෝධිත වාර්තාවක් දෙන්න වන විධියට තමයි කලින් නීතිය තිබුණේ. ඒ කියන්නේ, කලින් පැවැති බදු ක්‍රමය ඇතුළත එක ආදායම් බදු වාර්තාවක් ලබා දිය යුතු කෙනා, ඊට කලින් බදු වාර්තා කිහිපයක් දිය යුතු විධියට තමයි බදු නීතිය සකස් වෙලා තිබුණේ. නමුත්, අපි බලයට පත්වීමත් එක්ක මේ බදු ක්‍රමය සරල කිරීමට කටයුතු කළා. ඒක පැහැදිලිවම බදු මූලධර්මවලට අනුකූලයි. බදු මූලධර්මවලට අනුකූලව බදු ක්‍රමය සරල කරලා බදු අනුකූලතාව වැඩි කර ගන්නා එක තමයි අපගේ ප්‍රධාන පරමාර්ථය. ඒකට බලපාන එක අරමුණක් විධියට බදු sets කියන ඇස්තමේන්තුගත ආදායම් බදු වාර්තාව ලබා දීම අවශ්‍යයි කියන එක අපි ඉවත් කර තිබෙනවා. එවැනි ක්‍රම මඟින් අපි බදු ක්‍රමය සරල කරන්න අවශ්‍ය කටයුතු කර තිබෙනවා.

ඒත් එක්කම අපි නවීන තාක්ෂණය යොදා ගෙන බදු පදනම පුළුල් කරන්න අවශ්‍ය පසුබිම සකස් කර තිබෙනවා. ඒකට අදාළ e -invoicing system එකක් ගෙනෙන්න, දැනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පවතින RAMIS පද්ධතිය තවත් ඉහළ මට්ටමකට ගෙනෙන්න, එහි 3වන අදියර කරා ගෙනෙන්න සහ ඒ පද්ධතිය අපේ දේශීය මෘදුකාංග ඉංජිනේරුවන් වෙතට භාර ගන්න දැනට කටයුතු කරනවා. ඔබතුමන්ලා කවදාවත් හිතුවේ නැති කාරණා මේවා. අපි රජයක් විධියට මේ කටයුතු කරන්න මැදිහත් වෙලා තිබෙනවා. නවීන තාක්ෂණය හඳුන්වා දෙමින් ඒ බදු පද්ධති සංවර්ධනය කරන කටයුතු අපි භාර ගෙන තිබෙනවා. එම යෝජනා මේ අය වැය තුළ තිබෙනවා.

ශ්‍රී ලංකා රේගුව ගත්තත්, World Trade Organization එක සමඟ එකඟ වුණු වෙළෙඳ පහසුකම් ඇති කිරීමේ ගිවිසුම අනුව ආයෝජකයන්ගේ සියලු කටයුතු කරගන්න අවශ්‍ය තනි කවුළුවක් - Single Window එකක් - ඇති කිරීමේ සංවර්ධන කටයුතු මේ වනවිට කරගෙන යනවා. ඒ වාගේම දැන් පවතින ක්‍රමය අනුව කවුරු හරි කෙනෙක් භාණ්ඩයක් ආනයනය කරනකොට, එම භාණ්ඩය ලංකාවට ගෙන්වූවාට පසුව තමයි ඊට අදාළ නිෂ්කාසන කටයුතු සිද්ධ කරන්න පුළුවන් වන්නේ. නමුත් අපි ඒ කටයුතු විධිමත් කිරීමට කටයුතු කරනවා. ඒ අනුව භාණ්ඩයක් ලංකාවට ගෙන්වන්න කලින්ම එම පුද්ගලයාට එම නිෂ්කාසන කටයුතු ඉතාම කඩිනමින්, ප්‍රමාදයකින් තොරව සිදු කරගන්න අවශ්‍ය ක්‍රමය අපි සකස් කරගෙන යනවා. මේ සියලු දේවල්වලට අදාළව මේ අය වැයෙන් ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා.

සුරාබදු දෙපාර්තමේන්තුව ගත්තත්, ඒකට නව තොරතුරු තාක්ෂණ පද්ධතියක් ඇති කරන්න අවශ්‍ය සියලු කටයුතු සිදු කර, ඒ සඳහා අවශ්‍ය සංවර්ධකයෙක් - developer කෙනෙක් - හඳුනා ගෙන, ඒ කටයුතුත් මේ වනවිට ආරම්භ කර වේගයෙන් ක්‍රියාත්මක කරමින් පවතිනවා. ඊට අමතරව සුරාබදු දෙපාර්තමේන්තුවේ හිඟ බදු සම්බන්ධ කාරණය ගත්තත්, මින් ඉදිරියට එසේ නොවීමට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන යොදා තිබෙනවා.

ඔබතුමන්ලා කිසිම වෙලාවක හිතුවේ නැතුව ඇති, අපි දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අලුත් බිල්ඩිමක් ලබා දීමට අවශ්‍ය පියවර ගනියි කියලා. ඒ ගැන අවුරුදු 20ක් තිස්සේ කථා කර තිබුණත් සිදු වෙලා තිබුණේ නැහැ. නමුත් අපි දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අලුත් බිල්ඩිමක් හදන්න අවශ්‍ය පියවර ගෙන තිබෙනවා. මෙවැනි කටයුතු හරහා රට ඉතාම හොඳ තැනකට ගෙනියන්න අප රජය විසින් පියවර ගෙන තිබෙනවා.

ඇත්තටම ගත්තොත්, අපේ රටේ පවතින තත්ත්වය තුළ අපි විශාල අන්ධකාරයක ඉන්නේ. නමුත් මේ අන්ධකාරය තුළින් ආලෝකය මතු කර ගැනීමේ විභවයක් මේ රජයට පවතින බව අපට පෙනී යනවා. ඒ විභවය පාවිච්චි කරලා අපේ රට වඩාත් ඉහළ තලයකට ගෙනියන්න මේ රජයට ශක්තිය, ධෛර්යය සහ හැකියාව තිබෙනවා. අපි ඒ ශක්තිය, ධෛර්යය සහ හැකියාව භාවිත කරමින් අපේ රට වඩාත් ඉහළ තලයකට ගෙනියන බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

The Hon. (Dr.) Harsha de Silva, please. You have 10 minutes.

[පූ.භා. 11.45]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි, ගරු සභාපතිතුමනි.

මම ඉස්සෙල්ලාම අපගේ බලවත් ශෝකය ප්‍රකාශ කරනවා, පසුගිය දිනවල ඇති වුණු ආපදාවෙන් විපතට පත් සියලුදෙනාටම. මට ලැබී තිබෙන්නේ විනාඩි 10ක් නිසා මම ඉතාම කෙටියෙන් කාරණා කිහිපයක් පමණක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, 2025 Budget එකෙන් වෙන් කළ මුදල් වියදම් කරගන්න බැරි වුණා. ඒ නිසා මුදල් ඉතුරු වෙලා තිබෙනවා. හදිසි අවස්ථාවකදී ගෙවල් ශුද්ධ කර ගන්න, පාරවල් ශුද්ධ කර ගන්න වාගේ කටයුතුවලට ගන්න රුපියල් බිලියන 30ක විතර මුදලක් ආණ්ඩුවේ Treasury එකේ දැන් තිබෙනවා. තවත් රුපියල් බිලියන 20ක් විතර වෙනත් තැන්වලින් ගන්න පුළුවන්. එතකොට රුපියල් බිලියන 50ක් විතර ඊළඟ සති හතරේදී වියදම් කරන්න හැකියාවක් තිබෙනවා. ඒ අනුව රජයට අවශ්‍ය සියලු මුදල් තිබෙනවා. ඒ නිසා කිසිම excuse එකක් නැහැ, මුදල් නොගෙවා ඉන්න. ඒ circulars හරි ගස්වා ගන්න. ඒ කියන්නේ අවම වශයෙන් රුපියල් 50,000ක්වත් ගෙවන්න පුළුවන්. රුපියල් 25,000ක් ගෙවනවා කිව්වා. මේ තිබෙන inflation එකත් එක්ක ඒකෙන් මොකුත් කර ගන්න පුළුවන්ද කියලා මම නම් දන්නේ නැහැ. ඒ නිසා ඇත්ත මුදල හොයලා ඒක ගෙවන්න.

ඊළඟ කාරණය හැටියට, 2026 වසරට තමයි මූලික ගැටලුව එන්නේ, ගරු සභාපතිතුමනි. මොකද, සියයට 13ක ප්‍රාථමික වියදම් සීමාවක් පළ කරලා තිබෙනවා, Public Financial Management Act එක යටතේ. ඒකත් එක්ක තමයි IMF Agreement එක තිබෙන්නේ. ඒ නිසා ඒ ගැන හිතලා කටයුතු කරන්න. Public Financial Management Act එක හදනකොට මෙතුමන්ලා විරුද්ධ වුණා එදා. Section 14(2) and Section 14(2)(a)වල තිබෙනවා, අවශ්‍ය නම් අපට මේ සීමාව පැනලා ඉස්සරහට යන්න පුළුවන් කියලා. ඒ නිසා IMF Agreement එක තිබුණාට, Public Financial Management Act එක යටතේ අපට පුළුවන්කම තිබෙනවා එන අවුරුද්දේ අවශ්‍ය ප්‍රමාණය වියදම් කරන්න. ඒ නිසා අපට පුළුවන් නම් තවත් රුපියල් බිලියන 300ක් හෝ 500ක් එන අවුරුද්දේ වියදම් කරන්න මේ reconstruction හරහා, ඒකට පාර්ලිමේන්තුවේ අනුමැතිය ගැනීමේ කිසිම ගැටලුවක් නැහැ.

මේ Budget එක පටන් ගන්නකොට මම කළ කථාවක, කළ විවේචනයක කොටසක් උපුටාගෙන සමාජ මාධ්‍යවලත් ඒ ගැන කථා වුණා. ඒ තමයි, භාණ්ඩාගාරය උතුරා ගිහිල්ලා තිබෙනවාය කියන එක. නමුත් එතැනදී ඇත්ත වශයෙන්ම මම අරමුණු කළේ, බදු ගහලා ගහලා මිනිස්සු මිරිකලා සහ වාහන ගෙන්වීම හරහා අනපේක්ෂිත ලෙස ලැබිච්ච මුදලක් භාණ්ඩාගාරයේ තිබෙනවා කියන එකයි. ඒ කථාවේ ඊළඟ කොටස කවුරුවත් කිව්වේ නැහැ. නමුත් මම කිව්වා, ඒ මුදල් අවශ්‍ය විධියට වියදම් කරන්න කියලා. කෙසේ නමුත් දැන් භාණ්ඩාගාරයේ මුදල් තිබෙනවා. කිසිම excuse එකක් නැහැ, ඒ මුදල් වියදම් නොකර ඉන්න. ඒ නිසා එන අවුරුද්දට අවශ්‍ය මුදල් ප්‍රමාණය අපට පාවිච්චි කරන්න පුළුවන්. අපි හරියටම දන්නේ නැහැ මේ සිද්ධියේ loss and damage කීයද කියලා. සමහරු කියනවා, US Dollars 3 billion කියලා. අලවතුවල මන්ත්‍රීතුමා මට කිව්වා, US Dollars 6 billion කියන තොරතුරු එතුමා දැක්කා කියලා. නමුත් තවම හරියට assess කරලා නැහැ. World Bank එකට commission කරලා තිබෙනවා study එකක්. ඒගොල්ලන් සති දෙකකින් the loss and damage හරියටම කියන්නම් කියලා තිබෙනවා. US Dollars 3 billion කිව්වොත්, රුපියල් ට්‍රිලියනයක්. US Dollars 6 billion කිව්වොත් රුපියල් ට්‍රිලියන දෙකක්. ඒ නිසා යම් හදිසි අවස්ථාවකදී - allocation එක එකක්, cash කියන්නේ තවත් එකක් - මුදල් අවශ්‍යම නම්, ශ්‍රී ලංකා මහ බැංකු පනත සම්මත කරනකොට අපි එතැනත් හිඩැසක් තියලා තිබ්බා. ඒ අනුව disaster එකකදී මහ බැංකුවේ උදව් ඉල්ලා ගන්න පුළුවන්. ඒ නිසා cash පිළිබඳව ගැටලුවක් එන්නේත් නැහැ. නමුත් භාණ්ඩාගාරයට ලැබිච්ච රුපියල් ට්‍රිලියනයකට වඩා මුදලක් Bank of Ceylon එකේ සහ People's Bank එකේ තිබෙනවා.

ගරු මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය ඇමතිතුමා දැන් කිව්වා, ඒකෙන් රුපියල් බිලියන 500ක් පාවිච්චි කරන්න බලාපොරොත්තු වෙනවා කියලා, එන අවුරුද්දේ Treasury Bills retire කරන්න. මම එතුමාට කියන්න කැමැතියි, ව්‍යසනයෙන් පීඩා විඳින ජනතාව වෙනුවෙන් ඒ මුදල් වියදම් කරන්න කියලා. Treasury Bills retire කරන එක අපට තවත් අවුරුද්දකට හරි දෙකකට හරි පහු කරන්න පුළුවන්. ගරු විපක්ෂ නායකතුමාත් ඉතාම දීර්ඝව කරුණු පැහැදිලි කළා මේ ප්‍රශ්නය පිළිබඳව. අපි දැක්කා, අනුරාධ ජයරත්න මන්ත්‍රීතුමා ගම්පොළ ප්‍රදේශය පිළිබඳව ඉදිරිපත් කරපු කාරණා. ඒ නිසා සියයට දශම ගණනක interest එකක් save කරලා මේ බිලියන 500 ගෙවනවා වෙනුවට පීඩාවට පත් ජනතාව වෙනුවෙන් ඒ රුපියල් බිලියන 500 වියදම් කරන්න.

ඒ වාගේම අපි දන්නවා, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ - MSMEsවල - ණය බර රුපියල් බිලියන 900ක් බව. රුපියල් ට්‍රිලියනයත් surpass කරයි, හෙට අනිද්දා වෙනකොට. මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා මට කිව්වා, දැන් ඒගොල්ලන් camp එකේ ඉන්නකොටත් *parate* execute කරන්න හදනවා කියලා. විපක්ෂ නායකතුමාත් ඒ ගැන කිව්වා. ඒ නිසා *parate* execution පිළිබඳව කරුණාකරලා නැවතත් හිතන්න කියලා මම කියනවා. මේ වැටිලා ඉන්න මිනිස්සු තවත් වට්ටන්න එපා.

ඒ වාගේම අපි තවත් යෝජනාවක් කරනවා. මේ මුදල්වලින් රුපියල් බිලියන 500ක් යොදාගෙන අලුත් fund එකක් හදන්න. ඒ රුපියල් බිලියන 500ක fund එක අනෙක් අය වෙනුවෙන් නොවෙයි, MSMEsලා වෙනුවෙන් විතරක් පාවිච්චි කරන්න. මොකද, අනෙක් උදවියට මුදල් තිබෙනවා. ඇත්ත වශයෙන්ම අපේ රටේ කොඳු නාරටිය වෙන්නේ MSMEලා. ඒ උදවියට තවදුරටත් වැටෙන්න දෙන්න එපා.

අවසාන වශයෙන් මට කියන්න තිබෙන කාරණය මේකයි. ඔබතුමන්ලාත් කථා කළා අපිත් කථා කළා, මේ "Rebuilding Sri Lanka " fund එක ගැන. පාර්ලිමේන්තුවේ අනුමැතියක් නැතිව එවැනි fund එකක් හදන්න හැකියාවක් නැහැ. මොකද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148වන ව්‍යවස්ථාවේ තිබෙනවා, රටට ලැබෙන සියලු මුදල් සහ රට වියදම් කරන සියලු මුදල්වල සම්පූර්ණ බලය තිබෙන්නේ මේ පාර්ලිමේන්තුවට කියලා. ඒ නිසා funds තුනයි තිබෙන්නේ. එකක්, Consolidated Fund එක. අනෙක් එක, President's Fund එක. අනෙක් ඒවා තමයි ඔය හදන statutory funds. PFM Act එක යටතේ අපි සම්මත කළා, ඕනෑ ඕනෑ විධියට statutory funds හදන්න බැහැ කියලා. Statutory funds නොවන අනෙක් funds තිබෙනවා නම්, PFM Act එකෙන් ඒවා සියල්ලම අහෝසි වෙලා යනවා. මේ news report එකේ මොකක්ද තිබෙන්නේ මේ "Rebuilding Sri Lanka" fund එක ගැන? මේකට පත් කරලා තිබෙන අය පිළිබඳව මම දැන් කථා කරන්න යන්නේ නැහැ. නමුත් මෙහෙම fund එකක් හදලා නැහැ. එහෙම fund එකක් නැහැ. මේ තිබෙන්නේ, DSTගේ - Deputy Secretary to the Treasuryගේ - account number එක සහ මහ බැංකුවේ අධිපතිගේ account number එක. ඒ නිසා කරුණාකරලා මේ කාරණය පැහැදිලි කරන්න. මොකද, එහෙම fund එකක් නැහැ. එහෙම fund එකක් තිබෙනවා නම් කරුණාකරලා කියන්න. හැබැයි, එහෙම fund එකක් හදනවා නම් අවශ්‍ය නීති අපි පාර්ලිමේන්තුවෙන් සම්පාදනය කර ගනිමු. අපි හෙට - පොහොය දවසේ - Public Finance Committee එක රැස් වෙන්නයි හිතාගෙන ඉන්නේ. මොකද, මේ Budget එකේ යම් සංශෝධනයක් කරන්න අද කැබිනට් මණ්ඩලයෙන් යම්කිසි අලුත් මුදලක් pass කරනවා නම්, අපි සූදානම් හෙට ඇවිල්ලා ඒ වැඩේ කරන්න. ඕනෑ නම් අද රෑට වුණත් අපි ඒක කරන්නම්; ඒකේ අවුලක් නැහැ. හැබැයි, fund එකක් හදනවා නම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව විතරයි ඒ fund එක හදන්න පුළුවන් වෙන්න ඕනෑ. මොකද, ඒක audit කරන්න ඕනෑ, account කරන්න ඕනෑ. අර President's Fund එක පිළිබඳවත් ගැටලු ආවා. එහෙම නොකළොත් කට්ටියට FCIDයට, අරකට, මේකට

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

යන්නත් වෙයි. ඒ නිසා කරුණාකරලා ඒක කරනකොට හරි විධියට කරන්න. ඒ fund එක හදන එක පිළිබඳ අපට කිසිම ගැටලුවක් නැහැ. නමුත් ඒක හදනකොට අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව සහ අලුතින් අපි සම්මත කර ගත්ත Public Financial Management Act එක යටතේ හදන්න කියන එක තමයි මම ඔබතුමාට කියන්න බලාපොරොත්තු වුණේ.

අනෙක තමයි, අපට Contingency Fund කියලා එකක් තිබෙනවා. මේ Contingency Fund එකෙන් වියදම් කරන්නත් හැකියාවක් තිබෙනවා. ඒ නිසා අපි අවශ්‍ය විධියට මේ මුදල් එකතු කර ගනිමු; අවශ්‍ය විධියට මුදල් වියදම් කර ගනිමු. ඒක ගැටලුවක් නැහැ. නමුත් අමතක කරන්න එපා, ලැබෙන හැම සතයක් වෙනුවෙන්ම, වියදම් කරන හැම සතයක් වෙනුවෙන්ම වග කියන්න ඕනෑ ඔබතුමන්ලා සහ අපි ඇතුළු මේ පාර්ලිමේන්තුව බව. ඒක එළියේ ඉන්න උදවියට කරන්න බැහැ. අපට ප්‍රශ්නයක් නැහැ, මේ කමිටුවට පත් කරලා තිබෙන්නේ කවුද කියන එක සම්බන්ධයෙන්. ඒ පත් කර තිබෙන්නේ හනීෆ් යූසුෆ් මහත්මයා ද, එහෙමත් නැත්නම් හුලංගමුව මහත්මයා ද කියන එකේ අවුලක් අපට නැහැ. නමුත්, රජයේ මුදල් වියදම් කරන්න ඒ අයට හැකියාවක් නැහැ. මොකද, ඒ හැම සතයටම අපි වග කියන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, ඊළඟට මම මේ කාරණයත් කියන්න කැමැතියි. මේ අපි ඉදිරිපත් කරලා තිබෙන අය වැයට යම් යම් සංශෝධන කරන්න අපට අවශ්‍ය වෙනවා. මොකද, එදා තිබුණු තත්ත්වය නොවෙයි අද තිබෙන්නේ. ඒ නිසා Resolution එකක් නැවත ඉදිරිපත් කරන්න සිද්ධ වෙනවා. ඒ නිසා කරුණාකරලා ඔබතුමන්ලා කැබිනට් මණ්ඩලය හමු වෙලා ඒ Resolution එක ගැන කථා කරන්න. ඔබතුමන්ලා අද හමු වෙනවා නම් emergency එකකින් ඒක සම්මත කර ගන්න. සම්මත කරගෙන roughly ඉදිරිපත් කරන්න, සිකුරාදා pass කරන Budget එක substantially වෙනස් වෙනවා නම් ඒක කරන්නේ කොයි විධියටද, අපි priority දෙන්නේ මොනවාටද කියලා. ඇත්ත වශයෙන්ම මේ ප්‍රශ්නයේ බැරෑරුම්කම තේරුම් ගන්න. ගරු අලවතුවල මන්ත්‍රීතුමා දැන් අපට කියපු විධියට සමහර කුඹුරු අලුතින්ම අස්වද්දන්න සිද්ධ වෙනවා. ඒ කුඹුරු නැහැ. ඒ කුඹුරු ගල්වලින් වැහිලා ගිහිල්ලා, වැලිවලින් වැහිලා ගිහිල්ලා. කවුරු හරි හිතනවා ඇති ගංවතුර ගැලුවා, ගංවතුර බැහැලා ගියාම මේ ප්‍රශ්නය විසඳෙනවා කියලා. නමුත් මෙතැන සිද්ධ වෙලා තිබෙන්නේ එහෙම දෙයක් නොවෙයි. ඊට වඩා අතිශයින් බැරෑරුම් දෙයක් තමයි මෙතැන සිද්ධ වෙලා තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, ඒ නිසා අපි මෙතැනින් එහාට ගිහිල්ලා මේ කාරණා තේරුම් ගන්න ඕනෑ. අපට රජයේ මුදල් සීමිත ප්‍රමාණයයි තිබෙන්නේ. අපි කරපු එක විවේචනයක් තමයි, ජනතාවගේ යහපත සඳහා මේ මුදල් පාවිච්චි කරන්න ඕනෑය කියන එක. සමහර ඒවා තිබෙනවා, පෞද්ගලික අංශයෙන්, එහෙම නැත්නම් investorsලාට කරන්න පුළුවන් දේවල්. ඒවාට මේ සල්ලි වියදම් කරන්න එපා.

උදාහරණයක් හැටියට State-owned enterprises reform පිළිබඳව කරුණාකර කල්පනා කරලා බලන්න. Ceylon Electricity Board Act එක reverse කිරීම හරහා මොකක්ද බලාපොරොත්තු වෙන්නේ? ඒ ඉතිරි වෙලා තිබෙන මුදල් ජනතාව වෙනුවෙන් වියදම් කරනවාද, එහෙමත් නැත්නම් රාජ්‍ය ආයතන වෙනුවෙන් වියදම් කරනවාද? උදාහරණයක් ගනිමු. ගරු සභාපතිතුමනි, අපේ කාරක සභාවෙන් සම්මත කළා රුපියල් බිලියන 100ක් ශ්‍රීලන්කන් ගුවන් සේවයට ලබා දීම සඳහා. තවත් ඇමෙරිකානු ඩොලර් මිලියන 200 ගණනක් ගෙවන්න තිබෙනවා. ඒවා ඔක්කෝම මේ රජයේ මුදල්වලින් ගෙවන්නේ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Hon. (Dr.) Harsha de Silva, your time is up.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

මම මේ කාරණය කියලා අවසන් කරන්නම්, ගරු සභාපතිතුමනි.

ශ්‍රීලන්කන් ගුවන් සේවයේ සම්පූර්ණ loss එක හැටියට තිබෙනවා රුපියල් බිලියන 700ක්. අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කරලා තිබෙන්නේත් රුපියල් බිලියන 700යි. එම නිසා මා රජයෙන් ඉල්ලා සිටින්නේ, ඔබතුමන්ලාගේ policy එක මොකක්ද කියලා කරුණාකර ඔබතුමන්ලා නැවතත් හිතන්න කියලායි. ඔබතුමන්ලා කලින් ආණ්ඩුවේ රනිල් වික්‍රමසිංහගේ වැඩ පිළිවෙළ ඉස්සරහට අරගෙන යනවා නම් ඒ විධියට කරන්න. එහෙමත් නැත්නම්, ඔබතුමන්ලාට අවශ්‍ය වෙලා තිබෙන්නේ නිෂ්පාදන ආර්ථිකයක් හදලා industrial policy එකක් ක්‍රියාත්මක කරන්න නම් ඒක ඒ විධියට කරන්න. මට පෙනෙන විධියට ඔබතුමන්ලා මේ ප්‍රශ්නය යම්කිසි විධියකට ideology එක මත පටලවාගෙන තිබෙනවා. දැන් ඔය අවුල ලිහා ගන්න. ඔය අවුල ලිහා ගත්තේ නැත්නම් අප බලාපොරොත්තු වන රටේ සංවර්ධනය ඇති කර ගන්නත් බැහැ, පීඩාවට පත් වෙලා ඉන්න ජනතාවගේ ප්‍රශ්න විසඳන්නත් බැහැ. මේ ප්‍රශ්නය ඔබතුමන්ලා විසඳා ගත්තේ නැත්නම්, "වඳින්න ගිය දේවාලය ඉහේ කඩා වැටුණා වාගේ" වැඩක් සිද්ධ වනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Hon. (Dr.) Harsha de Silva, could you please wind up?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

I am going to wind up, Sir.

ඒක මට විසඳන්න බැහැ. ඒක ඔබතුමන්ලා internally discuss කරලා විසඳා ගන්න. මේ රට වෙනුවෙන් ඒක කළේ නැත්නම් මේ කටයුතු තවදුරටත් අවුල් වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Next, the Hon. Chaminda Wijesiri. You have 14 minutes.

[පූ.භා. 11.57]

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු සභාපතිතුමනි, මේ මොහොතේ රටම විශාල ආපදාවකට ලක් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම බදුල්ල දිස්ත්‍රික්කයේ ආපදාවට ලක් වුණු ජනතාවට මුලින්ම මගේ ශෝකයත්, කනගාටුවත් ප්‍රකාශ කරනවා.

ගරු සභාපතිතුමනි, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාගේ කථාවේදී විමසූ එක් කාරණයක් මට මතක් වෙනවා. හැබැයි, ඒකට පිළිතුරක් දෙන්න ආණ්ඩු පක්ෂයේ කවුරුවත් ඉදිරිපත් වෙන්නේ නැහැ. ඒකෙන් තහවුරු වෙන්නේ, වංචාව සහ බොරුව මේ මොහොතේ මේ ආණ්ඩුව සිදු කරනවාදෝ කියන කාරණයයි, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි. එතුමන්ලා "Rebuilding Sri Lanka" fund එක රටේ නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පරිබාහිරව යමින් මොකක් උදෙසාද හදන්න හදන්නේ? කවුද මේ ආණ්ඩුවේ ඉන්නේ? එදා "Helping Hambantota" fund එක පිළිබඳව බරපතළ ලෙස විවේචනය කළ කණ්ඩායමක් තමයි අද ආණ්ඩුවේ ඉන්නේ. රටේ ජනතාව විපතට පත් වෙලා ඉන්න වෙලාවක, අසරණ වෙච්ච වෙලාවක ඒ ජනතාවට ලැබිච්ච සහනාධාර හා ආධාර මුදල් ජනතාවට ලබා නොදී ඒවා වංචා කළා කියපු උදවියම මේ සිද්ධ වුණු මේ ව්‍යසනය මතින් මේ රට ගොඩනැඟීම කියන අරමුණ ඉස්මතු කරමින් නැවත වතාවක් ඉතිහාසයේ වුණු ඒ වංචාව, දූෂණය සිදු කරනවාදෝ කියන සැකයෙන් තමයි අපේ ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කරුණු පහදා දුන්නේ. අපි කියන්නේ ඒ අරමුදලේ කටයුතු ඔය විධියට කරන්න එපා, නීත්‍යනුකූලව කරන්න කියලායි. ලැබෙන මුදල් කොහේටද යන්නේ, කාටද යන්නේ, කොහොමද ඒ මුදල් එකතු වෙන්නේ, ඒ අරමුදල අපේ මහා භාණ්ඩාගාරයත් එක්ක කොහොමද බැඳෙන්නේ, ඒක කොහොමද විගණනයට ලක් වෙන්නේ කියන කාරණා පිළිබඳ නීතියෙන් පරිබාහිරව ගිහින් කටයුතු කරන එක සාධාරණද කියන ප්‍රශ්නය අපි අහනවා ගරු සභාපතිතුමනි. එහෙම වෙන්න බැහැ. විශේෂයෙන්ම මේ NPP ආණ්ඩුවට එහෙම කරන්න බැහැ, එදා එතුමන්ලා හැසිරුණු විධියට.

අපේ නායකතුමා කිව්වා, මේ ව්‍යසනය දේශපාලනය කරන්න යොදා ගන්න එපා කියලා. හැබැයි, ඉතිහාසයේ සිදු වූ ව්‍යසන තුළින් දේශපාලනය කළේ කවුද? එදා ගංවතුර උවදුර ආවාම, කඳු නාය යෑම් වුණාම, පාරවල් කැඩුණාම, බෝක්කු කැඩුණාම වැඩි හරියක් කිඹුල් කඳුළු හෙළුවේ, අද මේ ආණ්ඩුවේ ඉන්න තමුන්නාන්සේලායි. ඇමති කෙනෙක් අර අසරණ ජනතාව ඉන්න කඳවුරකට ගිහින් කඳුළු හෙළනවා මම දැක්කා, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමනි. ඒක හොඳයි. හැබැයි, ඒ ඇමතිවරයා එදා උමා ඔය සිදුවීමේදී අපේ ප්‍රදේශයේ ජනතාව හිටපු කඳවුරුවලට ගිහින් ඇඬුවේ නැහැ. එදා එතුමාට ඇඬුණේ නැහැ. හැබැයි, අද අඬනවා. අද තේරෙනවා ඇති, ඇඬෙනවා ඇති, එදා ව්‍යසන දේශපාලනීකරණය කළත්, මේ ව්‍යසනයේදී අසරණ වූ ජනතාවට සැබෑ ලෙසම සලකා ගැනීමට නොහැකි තත්ත්වයක් උදා වන කොට. දැන් කිඹුල් කඳුළු හෝ හෙළලා ඔවුන්ගේ නොහැකියාව වසන් කර ගන්න උත්සාහ කරනවා දෝ කියන සැකය අපට තිබෙනවා, ගරු සභාපතිතුමනි.

අපේ ප්‍රදේශයේ දැවැන්ත ව්‍යසනයක් සිදු වෙලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, පුද්ගලයන් සංඛ්‍යාව ගත්තොත් 47,947ක් අවතැන් වෙලා ඉන්නවා. පවුල් වශයෙන් ගත්තොත් පවුල් 13,494ක් අවතැන් වෙලා ඉන්නවා. ඒ විතරක් නොවෙයි, මරණ සංඛ්‍යාව 86ක් වනවා.

ඒ වාගේම අතුරුදහන් වුවන් 17යි. අතුරුදහන් වුවන් ගැන කියන කොට මම හිතනවා එම සංඛ්‍යාව මීට වඩා වැඩි ඇති කියලා. ඒ ඇයි ගරු සභාපතිතුමනි? අපේ දිස්ත්‍රික්කයේ වියලුව ආසනයේ සමහර ගම්වලට අදටත් කවුරුවත් ගිහිල්ලා නැහැ. මොකද, යන්න බැහැ. ඒ තරමටම මේ ව්‍යසනය බරපතළයි ගරු සභාපතිතුමනි. දැන් සුරක්ෂා මධ්‍යස්ථාන 164ක් තිබෙනවා. ඒවායෙහි පවුල් 6,903ක් ඉන්නවා ගරු සභාපතිතුමනි. පුද්ගලයන් වශයෙන් ගත්තොත්, ඒවායෙහි 21,347දෙනෙක් ඉන්නවා.

ඒ වාගේම, නිවාස හානි ගනිමු. පූර්ණ වශයෙන් හානි වෙලා තිබෙනවා, නිවාස 281ක්. අර්ධ වශයෙන් හානි වෙලා තිබෙනවා 4,915ක්. මේ තොරතුරු -මේ දත්ත- සත්‍යද කියන සැකය අපට තිබෙනවා, මේ ව්‍යසනය ඇස් දෙකෙන් දක්කාම. මීට වඩා බරපතළ ව්‍යසනයක් වෙලා මීට වඩා ජීවිත, දේපොළ හානි වෙලා තිබෙන බව අපට පෙනෙනවා.

ගරු සභාපතිතුමනි, මේ ව්‍යසනය ගැන කල් ඇතිව දැන ගැනීම, ඒක මඟ හැරීම, ඒක කළමනාකරණය නොකිරීම පිළිබඳ වගකීම මේ ආණ්ඩුව භාර ගත යුතුව තිබෙනවා. ජනාධිපතිතුමා කිව්වා, "අපට මියැදුණු උදවියට පණ පමණයි දෙන්න බැරි, අනෙක් සියලු දේම දෙන්න අවශ්‍ය වැඩ පිළිවෙළ අපි හදනවා" කියලා. ඒක හොඳයි. හැබැයි, මියැදුණු හැමෝම, ඒ හැම මරණයක් වෙනුවෙන්ම ජනාධිපතිවරයා ඇතුළු මේ ආණ්ඩුව වග කිව යුතුයි කියන කාරණය අපි බය නැතුව කියනවා, ගරු සභාපතිතුමනි. ඒකට හේතු තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මිලිමීටර 80ක වාගේ වර්ෂාපතනයක් පතිත වනකොට සිදු වන හානිය කන්ද උඩරට මිනිස්සු හැටියට අපට තේරෙනවා නේ. ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, අපේ ප්‍රදේශවලට මිලිමීටර් 80ක විතර වැසි වැටුණාම විශාල හානියක් වෙන බව දැන ගන්න කාලගුණ විද්‍යා පිළිබඳ දැනුම ඕනෑ නැහැ. අපේ ප්‍රදේශයේ ජනතාව දන්නවා මිලිමීටර් 80ක පමණ වැස්සක් වැටුණාම කඳු ටික පහත් වෙලා, නාය ගිහිල්ලා ව්‍යසනයක් සිදු වන බව. ජාත්‍යන්තර මාධ්‍යයෙනුත් අපේ රටේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙනුත් මිලිමීටර් 400ත්, 500ත් අතර වැහි එනවා කියපු නිසා, ඒ පිළිබඳව මේ ආණ්ඩුවේ බලධාරින් දැනුවත් කරපු නිසා කල් ඇතිව අපේ ප්‍රදේශයේ ජනතාව යම් මට්ටමකින් හෝ දැනුවත් කරලා එහි තිබෙන බරපතළකම පැහැදිලි කරන්න තිබුණා. අපේ ප්‍රදේශවලට වහින්නේ උපරිම මිලිමීටර් 80ත්, 100ත් අතර වැසි. අපි කොහොමද ඒවාට මුහුණ දුන්නේ, මොනවාද අපට වෙච්ච ව්‍යසන, වෙච්ච ජීවිත හානි කොපමණද කියලා යම් මට්ටමක දැනුවත් කිරීමේ හැකියාවක් තිබුණා නම් හොඳයි. එපමණක් නොවෙයි, අද මේ කරලා තිබෙන දේ කලින්ම කළා නම් හරි. අද මොකක්ද කරලා තිබෙන්නේ? අද ඒ ජනතාව කඳවුරුවලට දාලා තිබෙනවා. වගකීම් දරන ආයතන විසින් අපේ දිස්ත්‍රික්කවල රතු නිවේදන නිකුත් කරලා තිබෙන -ලේබල් කරලා තිබෙන- ප්‍රදේශවල ජනතාව කල් ඇතිව මේ විධියට කඳවුරුවල රඳවන්න කටයුතු කර තිබුණා නම් අද ඔවුන්ගේ දේපොළ විතරයි අහිමි වෙන්නේ, ගරු සභාපතිතුමනි. එහෙම නම්, ඒ මියගිය උදවියගේ පණ අහිමි වෙන්න නොදී ඒ ජීවිත ආරක්ෂා කර ගන්න වුවමනා වැඩ පිළිවෙළ හදන්න ජනාධිපතිවරයාට පුළුවන්කම තිබුණා. එහෙම වුණේ නැහැ. ගරු සභාපතිතුමනි, මේ සිද්ධිය වුණාට පස්සේ ජනාධිපතිතුමා උදේ 8.30ට විතර පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබුණා. බලන්නකෝ මේ මාධ්‍ය සංදර්ශන! ජනාධිපතිතුමා එදා උදේ 8.30ට පාර්ලිමේන්තුවට ඇවිල්ලා පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් එක්ක කථා කරපු එක හොඳයි. එතුමා අපෙන් අහනවා මොකක්ද කරන්නේ කියලා. රටේ ජනාධිපති තමයි ඒක අහන්නේ. ඒ ඇයි? විපක්ෂයෙන් ඒක අහයි කියලා තමයි එහෙම කරන්නේ.

අද මොකක්ද වුණේ? ආපදාවට පත් වුවන් වෙනුවෙන් කනගාටුව ප්‍රකාශ කරමු කියලා ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා අද උදේ පාර්ලිමේන්තුවේදී ඉල්ලීමක් කරලා විනාඩියක නිහැඬියාවක් පැවැත්වූවා. එදා පාර්ලිමේන්තු රැස්වීම් දවසේ ගරු කථානායකතුමාට ඒ විනාඩියක නිහැඬියාව පවත්වන්න තිබුණේ නැද්ද ගරු සභාපතිතුමනි? මම හිතනවා එදා ඔබතුමා මූලාසනයේ හිටියා නම් ඒක කරයි කියලා. එදා ඒක වුණේ නැහැ.

[ගරු චමින්ද විජේසිරි මහතා]

ගරු සභාපතිතුමනි, අද මේ මුළු පාර්ලිමේන්තුවම ආපදාවට ලක් වෙලා තිබෙන්නේ පාර්ලිමේන්තුවේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මේකයි ඇත්ත කථාව. ඔබතුමාට නියෝග නිකුත් කරනවා; කථානායකතුමාට නියෝග නිකුත් කරනවා. අද මේ මොහොතේ විපක්ෂය සාධනීය යෝජනා ගණනාවක් ගෙනාවා. අපේ ගරු හර්ෂ ද සිල්වා මහත්මයා ගෙනාපු යෝජනාවත් එහෙම එකක්. එහෙම නම්, පාර්ලිමේන්තුව දැනුවත් කරලා පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතියෙන් අද අපට වැඩ පිළිවෙළක් ගැන කථා කරන්න තිබුණා. ඒකයි අපි කිව්වේ ආපදාවට ලක් වෙච්ච ජනතාව වෙනුවෙන් ගන්න තිබෙන ඒ වැදගත් තීරණ ටික ගන්න, හදන්න තිබෙන රෙගුලාසි, නීති ටික හදන්න, මේ ආපදාවට ප්‍රමුඛතාව දීලා ඒ පිළිබඳව පාර්ලිමේන්තුවේදී කථා කරන්න අපට අවස්ථාව හදා දෙන්න කියලා. හැබැයි අපි දැන් මේ මොකක්ද කරන්නේ? වැය ශීර්ෂ පිළිබඳ කථාව පැත්තක තියලා මේ ආණ්ඩුව අපට දෙන්නේ නැති ඒ අවස්ථාව ආපදාවට පත් වෙලා සිටින රටේ ජනතාව වෙනුවෙන් අපි අරගෙන තිබෙනවා, විපක්ෂය හැටියට. ආණ්ඩුවේ අමාත්‍යාංශවල වැය ශීර්ෂ පිළිබඳ විවාදය පැත්තක තියලා අද අපි මේ ආපදා තත්ත්වය ගැන කථා කරන්නේ ඇයි? මේ පාර්ලිමේන්තුවේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ලක් වෙලා තිබෙනවා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

එහෙම වෙලා නැද්ද, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා? ආණ්ඩුවේ යම් කාරණයක් පිළිබඳව අපි ප්‍රශ්න කළාම අගමැතිතුමිය තමයි උත්තර දෙන්න ඕනෑ, ගරු සභාපතිතුමනි. ඇයි ඒ? ආණ්ඩුවේ ප්‍රධානියා වන ජනාධිපතිවරයා නැති වෙලාවට ප්‍රධානියා වන්නේ අගමැතිතුමියයි. හැබැයි, එතුමිය සිටිද්දී මොකක්ද වෙන්නේ? ඔබතුමන්ලාට නියෝග නිකුත් කරන්නේ කවුද? ඒ නිසා මේ ආපදාවෙන් මේ පාර්ලිමේන්තුව ගලවා ගත යුතුව තිබෙනවා, රටේ ජනතාව වෙනුවෙන්. ඒක ඔබතුමා ඔබතුමන්ලාගේ ආණ්ඩුව පැත්තේ අයට කියන්න. ඒක කියන්න ඕනෑ කාරණයක්.

ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, මේ රටේ ජනතාවගේ ප්‍රශ්න ටික කථා කරලා ඒක විසඳන්න පාර්ලිමේන්තුවේ කාලය ඉල්ලුවාම, අද අපට කෝ ඒකට ඉඩක්? අද ඒකට අවස්ථාවක් ලැබිලා නැහැ, ගරු සභාපතිතුමනි. මම ඒක භය නැතිව කියනවා.

ඊළඟට, ඊසාන දිග මෝසම සක්‍රිය වනවා. අපි දන්නවා, දෙසැම්බර් මාසයේ අපට වහිනවා කියලා. කන්ද උඩරටට වැඩිම වර්ෂාව ලැබෙන්නේ දෙසැම්බර් මාසයේ. ලේසි වැසි නොවෙයි ගරු සභාපතිතුමනි කොයි වෙලාවෙත් වහිනවා. දින 7ක් වහිනවා. අපේ අත්තලා, ආච්චිලා අපට කියන්නේ, "දින හතේ වැස්ස එනවා පුතේ" කියලායි. එහෙම නම් දැන් ඒකට තිබෙන සූදානම මොකක්ද? ඒකට වැඩ පිළිවෙළක් සූදානම් කරලා තිබෙනවාද? අපේ සජිත් ප්‍රේමදාස මහත්මයා කිව්වා, කඳුවුරුවල සිටින අය ගෙවල්වලට යවනවා කියලා. ඔවුන්ගේ නිවෙස්වල බිත්ති ඉරි තලලා තිබෙන්නේ. ඒ නිසා ඒවායේ ජීවත් වෙන්න අපහසුයි. පොඩි වැස්සකට වුණත් නැවත ඒවා නාය යන්න පුළුවන්. ඒ උදවිය වෙනුවෙන් අපි වැඩසටහනක් හදන්න ඕනෑ. ආණ්ඩු පක්ෂයේ සිටින බදුල්ල දිස්ත්‍රික්කයේ ඇමතිවරයා ඉන්නවා නම්, එතුමා කිඹුල් කඳුළු හෙළනවා නම් -අද එතුමාට එන්න බැරි නම්- කවුරු හෝ කියන්න, නැවත ඊසාන දිග මෝසම සක්‍රිය වීම නිසා ආපදාවට ලක් වෙන උදවිය රැක ගන්න පුළුවන්, ආරක්ෂා කර ගන්න පුළුවන් වැඩ පිළිවෙළ මොකක්ද කියලා?

ජනතා නියෝජිතයන් හැටියට අපි ඒ ජනතාව බේරා ගන්න නම්, ඔවුන්ට එම කඳවුරු තුළ ඉන්න දෙන්නත්, එම කඳවුරු තුළදී ඔවුන්ගේ අවශ්‍ය සියලු අවශ්‍යතා ඉටු කරන්න පුළුවන් වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා අද ආණ්ඩුවට යෝජනා කරන්න අපට සිද්ධ වෙනවා. නමුත්, අද එහෙම දෙයක් වෙන්නේ නැහැ. බදුල්ලේ විතරක් නොවෙයි, මුළු රටෙන්ම අහලා බැලුවත් එහෙම දෙයක් සිද්ධ වෙන්නේ නැහැ. උතුර, දකුණ, නැඟෙනහිර ඇතුළු සියලු ජනතාව එකට එකතු වෙලා හැම ව්‍යසනයකදීම, හැම ආපදාවකදීම අත්වැල් බැඳ ගත්තා. ඒ අත්වැල් බැඳ ගැනීම අද සමාජය තුළ තිබෙනවා. ඒක අපි දකිනවා. හැබැයි, ඒ එකතු වන බඩු භාණ්ඩ ටික බෙදනකොට විතරක් රතු තරුව කැප් එක දමාගෙන හිටියාට වැඩක් වෙන්නේ නැහැ, ගරු සභාපතිතුමනි. ඒක කරන්න එපා. ඒක වැරදියි. ඉතිහාසයේ ඔයගොල්ලන් දේශපාලන වශයෙන් මේ ආපදා ලඝු කළේ ඒ විධියට. අද මේ ආණ්ඩුවට දිට්ඨධම්ම වේදනීය කර්මය පටිසන් දීලා තිබෙනවා. ඒකෙන් තැවෙන්නේ, අසරණ වෙන්නේ මේ ආපදාවෙන් මිරිකිලා ඉන්න රටේ ජනතාවයි කියන කාරණය මේ වෙලාවේ මතක් කරනවා.

ඒ වාගේම මට ලොකු සැකයක් තිබෙනවා. එක පැත්තකින්, මේ ආණ්ඩුව සැබැවින්ම මේ ව්‍යසනය සම්බන්ධ තොරතුරු රටේ ජනතාවට ලබා දෙන්න අවශ්‍ය වැඩ පිළිවෙළ හැදුවාද නැද්ද කියන සැකය තිබෙනවා. ඒ වාගේම අද මොකක්ද කරන්න හදන්නේ? අද මාධ්‍ය මර්දනය සඳහා රටේ නීතිය අවනීතියක් බවට පරිවර්තනය කරන කටයුතු කරන්න හදනවා. මේ ආපදාවෙන් ජනතාව ගලවා ගන්න අවශ්‍ය වැඩ පිළිවෙළ හදාගන්න හදිසි නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෑ. හැබැයි, මහජන ආරක්ෂක ඇමතිවරයා නිලධාරින්ට කියන්නේ මොකක්ද? යම් තොරතුරක්, යම් විස්තරයක් දෙනවා නම්, ඒක රජයට බලපානවා නම්, හදිසි නීතිය යටතේ ඔවුන් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරන්න කියනවා. ඒක මොන විළිලජ්ජා නැති වැඩක් ද ගරු සභාපතිතුමනි? එහෙම කියන්න පුළුවන් වැඩ පිළිවෙළක් මේ ආණ්ඩුව තුළින් එනවාය කියන කාරණය මේ රටේ පුරවැසියන් දකිනවාද? ඒ, එක් කාරණයක් ගරු සභාපතිතුමනි.

අපේ රටේ ජනතාව අසරණ වෙලා අතරමං වෙලා ඉන්නවා, හිර වෙලා ඉන්නවා. ඒ ජීවිත බේරා ගන්න කියලා ඔවුන්ගේ ජංගම දුරකථනවල පටිගත කරලා, අපේ රටේ තිබෙන වැදගත් මාධ්‍ය ආයතනවලට යොමු කළා. ඒ මාධ්‍ය ආයතන හරහා තමයි රජයේ වැදගත්, උගත් නිලධාරින්, සමහර කණ්ඩායම් දැන ගත්තේ, අහවල් තැන අහවල් සිදුවීම වෙලා තිබෙනවා කියලා. එහෙම නැත්නම් ඒ තොරතුරු දැන ගන්න බැහැ. හැබැයි, මේ ජංගම දුරකථන සියල්ල අක්‍රිය කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ මේ ආණ්ඩුව විසින් හැදුවා දෝ කියන කාරණය ගැනත් මට ලොකු සැකයක් තිබෙනවා. ඒ සැකය එන්නේ මේ නිසායි. මාධ්‍ය තුළින් මම දැක්කා, හෙලිකොප්ටරයක් අනතුරකට ලක් වෙනවා. ඒ අනතුර වෙන්න කලින් ඒක පටිගත කරනවා. ඒ පටිගත කරන වෙලාවේ ඒ යානාව කඩා වැටෙන හැටි ජංගම දුරකථනයේ පටිගත වෙනවා. හැබැයි, එතැනින් පස්සේ අපට දකින්න දෙයක් නැහැ. ඒ යානයේ ආපු අය බේරා ගත්තේ කොහොමද, ඔවුන් කවුද කියන දේවලුත් එතැනින් එහාට පටිගත වෙන්න ඕනෑනේ ගරු

සභාපතිතුමනි. අදටත් මේ මොහොත වන විටත් ඒක මාධ්‍ය තුළ දකින්න නැහැ. අසරණ වෙලා ඉන්න, හිර වෙලා ඉන්න රටේ ජනතාවගේ ජීවිත ගලවා ගන්න කියන කාරණය මාධ්‍ය හරහා, ඔවුන්ගේ ජංගම දුරකථන හරහා කරන ඉල්ලීම් සියල්ල දැනුවත්ව හෝ නොදැනුවත්ව ඔබ නතර කළාය කියන සැකය මට තිබෙනවා. යම් තැනක ආපදාවක් වෙලා තිබෙනවා නම්, ඒ ආවරණ කලාපය තුළ තිබුණු සියලු දේ නැති කරලා අදටත් තමන්ගේ ගමට වෙච්ච දේ, පළාතට වෙච්ච දේ සැබැවින්ම මේ රටේ ජනතාවට දැක ගන්න තිබුණු අවස්ථාව අහුරලා තිබෙනවාය, හිර කරලා තිබෙනවාය කියන කාරණය අපි භය නැතිව තමුන්නාන්සේලාට කියනවා. මේවා තමයි සිදුවීම්. නමුත් එහෙම කරන්න එපා. බොහෝ දෙනාට තමන්ට වෙච්ච සිදුවීම රටට කියන්න පුළුවන් අවස්ථාව හැදුවේ නැහැ. ඔබතුමන්ලාට දින 14ක් තිබුණා, මේ ආපදාවෙන් මිනිස්සු ගලවා ගන්න පුළුවන් ආකාරයට සුදුසු වැඩ පිළිවෙළක් සකස් කරන්න.

අපේ රටට පැමිණි "දිට්වා" සුළි කුණාටුව තවත් රටකට ගියා. ඒකෙන් අද ඒ රටට සිදු වෙලා තිබෙන හානිය අඩු වෙලා තිබෙන්නේ ඇයි? අපේ රටට වෙච්ච සිද්ධිය දැකලා හෝ පෙර සූදානම හරහා ඒ රටේ ජනතාව බේරා ගන්න පුළුවන් වැඩ පිළිවෙළ ඒ රාජ්‍යය හදපු නිසායි ඒක වුණේ. ඒ පෙර සූදානම ඔබෙන් අහිමි වීම, මේ රටේ පුරවැසියන්ට දැවැන්ත විනාශයකට මුහුණ දෙන්න හේතු කාරණාවක් වුණා. ගරු සභාපතිතුමනි, ඒ කෙසේ වෙතත් මම ඔබතුමාට කියනවා, අපේ රටේ මාධ්‍ය ආයතන දැවැන්ත කැප කිරීම් කළ බව. එක පැත්තකින් ඔවුන් මේ ආපදා තත්ත්වයෙන් පීඩාවට පත් වුණු ජනතාව සිටින තැන්වලට ක්ෂණිකව යන්න පුළුවන් වැඩ පිළිවෙළ හැදුවා. එයින් නොනැවතී හැමදාම ක්‍රියාත්මක කළ ආපදා සහන සැපයීමේ වැඩ පිළිවෙළ නැවතත් ක්‍රියාත්මක කරමින් දැවැන්ත කාර්යභාරයක් ඉටු කළා. ඔවුන් නොසිටින්න මේ රටේ ජනතාව මිය ගිය තැන්වලම මිහිදන් වෙන්න ඉඩ තිබුණා. හැබැයි, එවැනි කාරණා අතර මේ රජය අණ පනත් ගෙනෙල්ලා, නීති ගෙනෙල්ලා, හරස් කරලා ඔබතුමන්ලාගේ නොහැකියාව වසන් කරන්න ඒ සියලු මාධ්‍ය ආයතන මර්දනය කරන්න උත්සාහ ගන්න එපාය කියන ඉල්ලීම අපි ආණ්ඩුවෙන් කරනවා. මාධ්‍ය මර්දනය හරහා සත්‍ය තොරතුරු දැන ගැනීම වැළැක්වීමට ක්‍රියා කිරීම තුළින් ඔබේ ආණ්ඩුව දැවැන්ත හානියක් කරන්න කටයුතු කරනවා.

ගරු සභාපතිතුමනි, කෙසේ වෙතත් ආපදාවට මුහුණ දුන් ජනතාවගේ ජීවිත යථා තත්ත්වයට ගෙන ඒම සඳහා වැඩ පිළිවෙළ හදන්න ආණ්ඩුවට ලොකු වගකීමක් තිබෙනවා. රුපියල් 25,000ක් දෙනවා කිව්වත්, ඒ මුදල් තවම දීලා නැහැ. එම නිසා ඒ මුදල දෙන්න ඕනෑ. හැබැයි, රුපියල් 25,000ට වඩා දෙන්න පුළුවන් තරම් මුදල් තිබෙනවා. ඊට එහා මුදලක් දීලා ඒ ජන ජීවිත යථා තත්ත්වයට පත් කරන්න පුළුවන් වැඩ පිළිවෙළක් හදන්න. දැන්වත් බොරු කියන එක නවත්වන්න. බොරු කියලා, බොරු කියලා දිගටම බොරු කිව්වාම ස්වභාවදහමෙනුත් මොකද වෙන්නේ කියලා ඉතිහාසයේ තිබෙනවා නේ. ඔබේ බොරුවට - ඔබේ මුසාවට- අද ස්වභාවධර්මය කෝපවෙලා තිබෙනවා. ඔබේ බොරුව - මුසාව - නිසා මේ රටේ ස්වභාවදහමත් ඔබට විරුද්ධව කටයුතු කරනවා. එම නිසා සැබැවින්ම මේ රටේ ජනතාව ගලවාගන්න පුළුවන් සාධනීය තත්ත්වය ඇති කරන්න. එතැනට අවශ්‍ය සහයෝගය දෙන්න පුළුවන් වැඩ පිළිවෙළ අපි ඉටු කරනවාය කියන කාරණය මතක් කරමින්, මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. (Dr.) Najith Indika. You have ten minutes.

[අ.භා. 12.12]

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)

ගරු සභාපතිතුමනි, පසුගිය දිනවල ඇති වූ දැවැන්ත ව්‍යසනයෙන් ජීවිත අහිමි වුණු, දේපළ අහිමි වුණු, තමන්ගේ හිතවතුන්, යහළුවන්, පවුලේ අය අහිමි වුණු, ලොකුම පීඩාවට මුහුණ දුන් මේ රටේ සියලු ජනතාවට මම මේ වෙලාවේ ආණ්ඩුව වෙනුවෙන් අපේ ශෝකය හා කනගාටුව පළ කරනවා.

ඊළඟට, අතිශයින් භයානක සහ මීට කලින් මුහුණ දීලා නැති තත්ත්වයක් යටතේ වුවත් තමන්ගේ කාර්යභාරයට එහා ගිහිල්ලා, නැත්නම් තමන්ගේ රාජකාරියට එහා ගිහිල්ලා විශාල වැඩ කොටසක් කරපු, කරමින් සිටින, සමහර විට දවස් දෙක, තුන තත්පරයක්වත් නිදාගන්නේ නැතුව තවමත් වැඩ කරන මේ රටේ ත්‍රිවිධ හමුදාවට, පොලීසියට, සහන සේවා කටයුතුවල නිරත වන රාජ්‍ය නිලධාරින්ට, අනෙකුත් සියලු රාජ්‍ය සේවකයන්ට, ඒ වාගේම ජීවිත සහ ගොඩනැඟිලි උපකරණ විතරක් ඉතුරු වුණු තත්ත්වයක් තුළ අවම පහසුකම් යටතේ ඒ විධියටම වැඩ කටයුතු කරගෙන යන සෞඛ්‍ය සේවකයන්ට සහ මේ රටේ අත්‍යවශ්‍ය සේවාවල නිරත වන අපේ නිලධාරින් ඇතුළු පුද්ගලයන්ට, ඒ වාගේම පෞද්ගලික අංශයට, රටේ විවිධ ප්‍රදේශවලින් පැමිණ ස්වේච්ඡාවෙන් ඒ කටයුතුවල නිරත වන සියලුදෙනාට ආණ්ඩුව වෙනුවෙන් ස්තුති කරන්නත් මා මේ අවස්ථාව යොදා ගන්නවා.

වැය ශීර්ෂ සම්බන්ධ කථාව ඒ විධියටම තිබියදී, -මොකද, ඒ සම්බන්ධයෙන් විවේචනයක් ආවේත් නැහැ, ඒ පිළිබඳව පැහැදිලි කිරීම් කරන්න අවශ්‍යතාවක් මතු වුණේත් නැහැ- මම මේ ආපදා තත්ත්වය ගැනම කථා කරන්න කැමැතියි. අපි දන්නවා, "ගලවා ගැනීමේ කණ්ඩායම් අරහෙට ඇවිල්ලා නැහැ, මෙහාට ඇවිල්ලා නැහැ" කියලා නරක චිත්‍රයක්, නැත්නම් negative තත්ත්වයක් හදන්න සමහරු උත්සාහ කළත්, මේ වෙද්දී ජනතාව ගලවා ගැනීමේ මෙහෙයුම වෙනුවෙන් තමන් නොදන්නා ප්‍රදේශවලට ගිහිල්ලා ජීවිත අහිමි කර ගත් නිලධාරින් ගණනාවක් ඉන්නවා. විශේෂයෙන්ම ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ Group Captain Nirmal Siyambalapitiya මහත්මයා, වලෙයිවලදී මෝය කට කපලා ජනතාව ගංවතුරෙන් මුදා ගන්න කටයුතු කරමින් සිටි නාවික හමුදා නිලධාරින් 5දෙනා, ඒ වාගේම නෝර්ටන් බ්‍රිජ්වලදී ශ්‍රී ලංකා යුද හමුදාවේ එක් නිලධාරියෙක් මෙම ගලවා ගැනීමේ කටයුතුවලදී ජීවිත පරිත්‍යාග කර තිබෙනවා. ඒ වාගේම ශ්‍රී ලංකා පොලීසියේ නිලධාරි මහත්මයෙක් අනුරාධපුරයේදී තම ජීවිතය පරිත්‍යාග කරලා තිබෙනවා. මෙවැනි ඉතා අසීරු තත්ත්වයක් තුළ නිලධාරින් සහ රාජ්‍යය වැඩ කරගෙන යනවා. එම නිසා ඒ සියලුදෙනාට උපහාරය සහ ආචාරය පුද කරන මොහොතක් බවට මම මේ වෙලාව පත්කර ගන්නවා.

ගරු සභාපතිතුමනි, මගේ කථාවට කලින් කරපු කථාවකදී මතු වුණා, වැඩිපුර මුදල් වෙන් කිරීම ගැන. එම කරුණු මතු කිරීම ගැන මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ වෙද්දීත් ඒ සඳහා අවශ්‍ය සියලු කටයුතු සූදානම් කර තිබෙනවා. ඒ අයුරින් මේ සියලු කටයුතු කරනවා. ඒ ගැන කිසිම සැකයක්, අවිශ්වාසයක් ඇති කරගත යුතු නැහැ. මේ ආණ්ඩුව වැඩ කරන්නේ කොහොමද, මේ ආණ්ඩුව මුදල් සම්බන්ධයෙන් වැඩ කරන්නේ කොහොමද කියලා අපි පෙන්වලා තිබෙනවා. ඒ අනුව මේ රටේ ජනතාවට අවශ්‍ය සහ දිය හැකි සියලු දේවල් දෙන්න මේ ආණ්ඩුව කටයුතු කරනවා. ජනාධිපතිතුමා කිව්වා වාගේම, අහිමි වුණු ජීවිත හැර දිය හැකි අනෙක් සියලු දේවල් ලබා දීලා ඒ ජන ජීවිත ප්‍රතිෂ්ඨාපනය කරන්න, ඒ ජනතාව නැවත දෙපයින් නඟා සිටුවන්න, පීඩනයට මුහුණ දුන් සියලු ජනතාවට සහන සලසන්න මේ ආණ්ඩුව කටයුතු

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

කරනවා. ඒ සඳහා අවශ්‍ය පරිදි මුදල් වියදම් කරනවා. විශේෂයෙන්ම රුපියල් බිලියන 30ක් ගැන කලින් සඳහන් වුණා. අපි ඒ මුදලත් වෙන් කරනවා. ගරු මන්ත්‍රීතුමනි, ඊට වඩා මුදලක් වෙන් කරන්නත් සාකච්ඡා කර ගෙන යනවා.

රුපියල් 25,000 ගැන ටිකක් වැරදි අදහසක් මෙතැනදී මතු වුණා. ඒක නොදැනුවත්කම වෙන්න ඇති. ඊයේ මුදල් අමාත්‍යාංශයෙන් නිවේදනයක් නිකුත් කළා, ආපදාවට ලක් වුණු සියලු නිවාසවලට රුපියල් 25,000ක් ලබා දෙනවා කියලා. ඒ මුදල ඇත්තටම වන්දියක් නොවෙයි. සියලු කටයුතු රුපියල් 25,000කින් කරන්න පුළුවන්ද කියලා අහන්න එපා. ඒක වන්දියක් නොවෙයි. මෙතෙක් කල් රුපියල් 10,000 විධියට තිබුණු, ඒ කියන්නේ ආපදාවකින් පසුව, ගංවතුරකින් පසුව නිවසක කුස්සියට අවශ්‍ය බඩු ටික අරගෙන, නිවස සුද්ද පවිත්‍ර කර ගෙන, නිවස පදිංචියට සුදුසු ලෙස සකස් කර ගන්න අවශ්‍ය මුදලක් විධියට තමයි ඒ මුදල වෙන් කරන්නේ. රුපියල් 25,000ක මුදල ඒ සඳහා තමයි ලබා දෙන්නේ. වන්දි සම්බන්ධයෙන් ගත්තොත්, ඉදිරියේදී තක්සේරු සහිතව නිසි පරිදි අනිවාර්යයෙන් ඒ කටයුතු කරනවා. එම නිසා රුපියල් 25,000ක් විතරක් දෙනවා කියන එක හිතන්න එපා. ඒක, එහෙම දෙයක් නොවෙයි. ඒක ආරම්භක උපකාර මුදලක් පමණයි.

ඒ වාගේම දවස් දෙකකට කලින් තවත් චක්‍රලේඛ සංශෝධනයක් කළා. ආපදාවකට ලක් වුණාට පසුව යම් කාලයක් යනතුරු වියළි ආහාර සලාකයක් ලබා දීම වෙනුවෙන් මෙතෙක් කල් මුදලක් වෙන් කර තිබුණා. ඒකේ උපරිමය තිබුණේ පස්දෙනෙකුගෙන් යුතු පවුලකට රුපියල් 3,500යි. ඒ මුදල රුපියල් 10,500 දක්වා වැඩි කරන්නත් මේ මොහොතේ අපි කටයුතු කරලා තිබෙනවා. ඉතින්, අපේ ආණ්ඩුව මේ ආකාරයෙන් මේ තත්ත්වයට අදාළ කටයුතු එකින් එක, එකින් එක කර ගෙන යනවා. ගලවා ගැනීමේ මෙහෙයුම්, එහෙම නැත්නම් කොටු වෙලා ඉන්න ජනතාව මුදා ගැනීමේ මෙහෙයුම් තවමත් ක්‍රියාත්මක වෙනවා, ගරු සභාපතිතුමනි. තවමත් ඒ ප්‍රදේශවලට හමුදාව යනවා. විශේෂයෙන් කඳුකරයේ තිබෙන දුෂ්කර තත්ත්වය නිසා ඒ පැත්තට වැඩි අවධානයක් යොමු කරමින් සිටින මොහොතක්, මේ. සුබසාධනය සහ ඉදිරි කටයුතු ගැන අපට ඊළඟ දවසේ කථා කරන්න පුළුවන්. නමුත්, මේ මොහොතේ ලංකාවේ හමුදා, රාජ්‍ය සේවකයන් ඇතුළු සියලුදෙනා එක්ව ගලවා ගැනීමේ කටයුතු සහ මේ රටේ කටයුතු නැවත නිසියාකාරව ආරම්භ කිරීමට අදාළ මූලික වැඩකටයුතු තමයි කරන්නේ. උදාහරණයක් ගත්තොත්, මේ වෙද්දී සිදුව තිබෙන විදුලිය බිඳ වැටීම්, පාරවල් කඩා වැටීම්වලින් සැලකිය යුතු ප්‍රමාණයක් දවස් දෙක, තුනක් ඇතුළත ඉතාම වේගයෙන් යථා තත්ත්වයට පත් කරලා තිබෙනවා. නිලධාරින් එම කටයුතුවල ප්‍රගතිය දිනෙන් දින ප්‍රකාශ කරනවා. විශේෂයෙන් විදුලිබල මණ්ඩලය ගත්තොත්, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ගත්තොත්, RDA එක ගත්තොත්, මූලික මාර්ග, access roads clear කිරීමට පැය 24, පැය 48 නිදි නැතිව නිලධාරින් වැඩ කරමින් ඉන්නවා. ඉතා වේගයෙන් ඒ දේවල් ප්‍රතිෂ්ඨාපනය කරන්න කටයුතු කරනවා.

තවත් කථාවක් මතු වුණා, fund එකක් ගැන. Fund එකක් හදලා නැහැ, එහෙමයි මෙහෙමයි කියලා කථාවක් ගියා. ඒ සම්බන්ධයෙන් එතුමා කියන්න ඇත්තේ වෙන දෙයක්. නමුත්, මට එක දෙයක් පැහැදිලි කරන්න ඕනෑ. විදේශ රටවල සහ ලංකාවේ සිටින අය ලබා දෙන ආධාර වෙනුවෙන් මුදල් අමාත්‍යාංශයේ ගිණුම් අංක කීපයක් රජය විසින් මේ වෙද්දි නිකුත් කරලා තිබෙනවා. ඒක fund එකට අදාළ එකක් නොවෙයි. ඒවා, මේ මොහොතේත් මුදල් අමාත්‍යාංශයේ තිබෙන, මුදල් අමාත්‍යාංශය පිළිගත්, මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කළ ගිණුම් අංක. පිට රට ඉඳලා ලංකාවට මුදල් බැර කරන්න ඉන්න කාට හරි ඒ සම්බන්ධයෙන් පැහැදිලි නැතිකමක් මතු වෙනවාද කියලා මට හිතුණා. ඒක එහෙම එකක් නොවෙයි. කිසිම බයකින්, සැකයකින් තොරව මුදල් අමාත්‍යාංශයට ඒ මුදල් බැර කරන්න පුළුවන්. මොකද, මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා තමයි ඒ ගිණුම් අංක නිකුත් කරලා තිබෙන්නේ. ඒ නිසා මේ සිදු වන කථා තුළින් ඒ මුදල් ගැන කිසිම දෙගිඩියාවක් ඇති කර ගන්න එපා.

ගරු සභාපතිතුමනි, මේක ලංකාවේ නූතන ඉතිහාසයේ සිදු වුණු විශාලම ස්වාභාවික උවදුර බව අපි දන්නවා. මේ වෙනකොට දිස්ත්‍රික්ක 25ම ජනතාව මේ උවදුරට මුහුණ දීලා ඉන්නවා. දිස්ත්‍රික්ක 25න්, දිස්ත්‍රික්ක 21ක සුරක්ෂා මධ්‍යස්ථාන තිබෙනවා. ජනතාව ගෙවල්වලින් ඇවිල්ලා ඒවායේ නැවතිලා ඉන්නවා. මේක ඒ තරම් ලොකු ව්‍යසනයක්. මුළු ලංකාවේම එකවර, එක රාත්‍රියකදී මේ සිදුවීම වෙන්න පටන් ගත්තාට පස්සේ, තිබෙන සම්පත්, ගලවා ගැනීමේ කණ්ඩායම් එක්ක තමයි මුළු රටම වැඩ කරන්නේ. එම නිසා තමයි ඒ මිනිස්සු දිවි පරදුවට තියලා, ජීවිත පරිත්‍යාග කරමින්, නිදි නැතිව තවම වැඩ කරන්නේ. අපි හොඳටම දන්නවා, ඒ කටයුතුවලදී යම් තැනකට අඩුපාඩුවක් වෙන්න පුළුවන් කියන එක. මේ රටේ පැය 24ක් ඇතුළත එකවර නාය යෑමක් සිදු වුණාම, විශාල නාය යෑම් 30ක්, 40ක් වුණාම, ඒ විශාල නගරවලට යන්න මාර්ග - access - නැති වුණාම, හෙලිකොප්ටර් කිහිපයක් විතරක් තිබෙන රටක ඔවුන්ට කරන්න පුළුවන් උපරිමය තමයි ඔවුන් කරන්නේ. හමුදාවේ වැඩි පිරිසක් කඳුකරයට ඇතුළු වුණේ පැය හතක්, අටක් පයින් ගිහිල්ලා කියලා අපි දන්නවා. නුවරඑළියට දෙවැනි දවසේ ඇතුළු වුණේ කඹ දාලා නැඟලා. අපට තිබෙන සම්පත් එක්ක තමයි අපි වැඩ කරන්නේ. විදෙස් ආධාර වේගයෙන් ලැබෙමින් පවතිනවා. ඒකත් එක්ක මේ තත්ත්වය වෙනස් වෙමින් පවතිනවා. නමුත්, ඒ තත්ත්වය ඇතුළේ සිදුවන අඩුපාඩු පිළිබඳව කථා කරන්න ගියොත්, අපට කථා කරන්න පුළුවන් ගරු සභාපතිතුමනි. වේල් දෙකක් කන්න හම්බ වුණේ නැති මිනිස්සු ඉන්න පැති තිබෙනවා කිව්වොත්, ඔව්. ඒ ගැන කථා කරන්න පුළුවන්. එහෙම ඉන්නවා, එහෙම ඉන්න පුළුවන්. මේ ප්‍රශ්නය පාට, පක්ෂ හෝ, දේශපාලන ප්‍රශ්නයක් හෝ නොවෙයි නේ. රාජ්‍ය නිලධාරින්, ස්වේච්ඡා කණ්ඩායම් ඇතුළු මේ සියලුදෙනාටම තිබෙන සම්පත්, ලැබෙන තොරතුරු අනුව තමයි මේ මෙහෙයුම කරන්නේ කියලා අපි හැමෝම දන්නවා. නමුත්, පළමු වැනි මොහොතේ සිට මධ්‍යම මෙහෙයුම් යන්ත්‍රණයක් ඔස්සේ ඉතාම සංවිධානගතව ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඒ කටයුතු මෙහෙය වුණා. එතකොට අඩුපාඩු නොවෙයි, ඒ ඇති වන ප්‍රශ්න ඉදිරිපත් කරන්න පුළුවන්. අපේ පැත්තේ මෙන්න මෙතැන මෙහෙම එකක් වෙලා තිබෙනවා, මෙතැනට බැකෝ එකක් ගිහින් නැහැ වාගේ දේවල් කියන්න පුළුවන්. ඇත්ත! හැබැයි අපි බලන්න ඕනෑ, මේකේ big picture එක දිහා. කොතැන හරි නොසැලකිලිමත්කම හරි, ඒ වාගේ දෙයක් තිබෙනවාද කියලා බලන්න ඕනෑ.

මොකද, මෙතැනදී ඉතාම නරක දෙයක් වුණා. ආණ්ඩු පක්ෂයේ කාර්යභාරය පැහැදිලියි. විපක්ෂයේ කාර්යභාරය ගැන කථා කරද්දී විපක්ෂයෙන් ඉතාම නරක දෙයක් කළා. දවස් දෙකකට කලින් පාර්ලිමේන්තුව කැඳවපු වෙලාව මතක් කරගන්න. එදා කාරණා දෙකයි කිව්වේ. එකක් තමයි, නොවැම්බර් 12 දැනගෙන හිටියා, දැනගෙන හිටියාට ක්‍රියාත්මක වුණේ නැහැ කියලා; දැනගෙන හිටියා, ක්‍රියාත්මක වුණේ නැහැ කියලා විශාල බොරුවක් අතහැරියා. මම ඒක ගැන මේ වෙලාවේ විස්තර කරන්න යන්නේ නැහැ. දවසින් දවස කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මොකක්ද කිව්වේ, දවසින් දවස කියපු පණිවුඩය මොකක්ද කියන එක අද දවස ඇතුළත අපේ ඉදිරි

කථාවලදී හරියට පැහැදිලි කරයි. මේ වාගේ ව්‍යසන මොහොතක රටේ ජනතාව අතර අනවශ්‍ය සැකයක්, බයක් නැත්නම් වෛරයක් හදන්න හැදුවා. බේරාගන්න පුළුවන්කම තිබියදී බේරාගෙන නැහැ වාගේ අදහසක් දෙන්න හැදුවා. මේක නරක දෙයක්. මේක බොරුවක්. අපි ඒක අද දවසේ පැහැදිලි කරලා ඉවර කරන්නම්.

දෙවැනි කාරණය මරණ ගැන කියපු කථාව. එදා කියපු දෙවැනි කාරණාව තමයි 1,000කට වැඩිය මැරිලා තිබෙනවා කියලා මරණ ගැන කිව්වා. අදත් කිව්වා, එතැන මැරිලා ඉන්නවා කියලා. මරණ ගැන ඔබතුමන්ලා දන්නවා නම්, ඒ නිවැරදි ගණන් රාජ්‍ය යන්ත්‍රණයට ඇතුළත් කරන්න. එහෙම නැතිව මරණ ගැන මේ පාර්ලිමේන්තුවේ කියලා, පාර්ලිමේන්තුවෙන් එළියට ගිහින් සද්ද නැතිව සිටින දේශපාලනය කරන්න එපා. මරණ සිදුවෙලා තිබෙනකොට වරින්වර මේ සම්බන්ධයෙන් එහෙම කථා කරන්න එපා. ඊයේ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට හූ කියලා එළවනවා, මම දැක්කා. ඕවා කථා කරන්න ගිහිල්ලා වෙන්න ඇති, ගමේදී හූ කියලා එළවලා තිබුණේ. ඒවා කියන්න එපා. අපි මේ අවස්ථාවේ වගකීම් සහගතව කටයුතු කරන්න ඕනෑ. හැමෝම ගැන නොවෙයි මම කියන්නේ. තමන්ගේ ප්‍රදේශයේ වගකීම් සහගතව වැඩ කරන විපක්ෂයේ මන්ත්‍රීවරු අපි දැක්කා. ඒ ගෞරවය අපි ඒ අයට දෙන්න ඕනෑ. ඒ ගැන නොකිව්වොත් ඒක නරකයි නේ. ඒ වාගේම අනතුරු ඇඟවීම් ගැන මේ කියන කථාව, - ඒ කියන්නේ මීට කලින් ආපදාවලදී මෙහෙම කියලා නැහැ, ගරු සභාපතිතුමනි.

2004දී සුනාමි ආවා කියලා අපි මහින්ද රාජපක්ෂට චෝදනා එල්ල කළේ නැහැ නේ. 2016දී ගංවතුර ආවා කියලා රනිල් වික්‍රමසිංහට චෝදනා එල්ල කළේ නැහැ නේ. මේවා ගත්තාම මේ රටේ සංකීර්ණ ක්‍රියාවලියක් තිබෙනවා. මේ ලෝකයේ සංකීර්ණ ක්‍රියාවලියක් තිබෙනවා. මේ වෙලාවේ මේ කලාපයටම මේ තත්ත්වය බලපා තිබෙනවා. ඉන්දුනීසියාවේ, පිලිපීනයේ සිය ගණන් මැරෙමින් තිබෙනවා. ස්වාභාවික ආපදාවලට පසුබිමක් තිබෙනවා. අවිධිමත් සංවර්ධනය ඇතුළු ගොඩක් දේවල් ඒකට බලපා තිබෙනවා. ඒවා වළක්වන්න මේ ආණ්ඩුව කටයුතු කරමින් ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. (Dr.) Najith Indika, your time is up now.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මට තව විනාඩියක් දෙන්න, ගරු සභාපතිතුමනි.

එහෙම තත්ත්වයක් තුළ මේ සම්බන්ධයෙන් අපි කටයුතු කරමින් ඉන්නවා. එතකොට අර වැවේ සොරොව්ව ඇරියේ නැහැ, මේ වැවේ සොරොව්ව වැහුවේ නැහැ, අතැන දොර ඇරියේ නැහැ කියලා කියන්න එපා. අපි පිරිසක් එක්ක විද්‍යානුකූලව වැඩ කරන්නේ. අර වැවේ සොරොව්ව ඇරියාට පසුව ඊළඟ වැවට වෙන්නේ මොකක්ද කියලා කියන්නේ නැහැ නේ. තමන්ගේ ගමේ මිනිස්සු සතුටු කරන්න නිකම් විද්‍යාත්මක කාරණා ගැන, නොදන්නා දේවල් ගැන කථා කරන්න එපා. ඒවාට සම්බන්ධ technically ප්‍රශ්නයක් තිබෙනවා නම්, ඒවා එකින් එක අරගෙන වෙනම කථා කරමු. එහෙම නැතිව මේක පාච්චිච් කරලා දේශපාලනය කරන්න බැහැ. ලංකාවේ සොරොව් ගැන කථා කරනකොට, එහි යම් system එකක් තිබෙනවා. එක තැනකින් සොරොව්වක් ඇරියාට පස්සේ ඊළඟ තැනට වෙන්නේ මොකක්ද කියලා කවුද කියන්නේ? මේක ගෙදර දොරවල් අරිනවා වාගේ දෙයක් නොවෙයි. මේ ගැන හරියට කථා කරමු. මේ ගැන අනවශ්‍ය සැකයක්, අවිශ්වාසයක් හදන්න එපා.

මේ සම්බන්ධයෙන් කොහොමද වැඩ කළේ කියලා, මේ සම්බන්ධයෙන් මේ මොහොතේ මැදිහත් වෙමින් ඉන්නේ කොහොමද කියලා අපි දන්නවා. ගරු සභාපතිතුමනි, මුලින්ම මේ නිලධාරීන් පිළිබඳව සැකයක් ඇති කළා. ඒ කියන්නේ වැඩ පමා කරන්න පුළුවන් වාගේ කාරණයක් පිළිබඳ සැකයක් ඇති කළා. අපි ඔක්කොම එකතු වෙලා මේ නිලධාරීන්ට යහපත් මානසිකත්වයෙන් වැඩ කරන්න ඉඩ දෙමු. මේ නිලධාරීන් එකතු වෙලා දවස් දෙකක් ඇතුළත විදුලිය ලබා දුන්නාට පස්සේ, පාරවල් clear කළාට පස්සේ ගිහිල්ලා මහනුවර දිස්ත්‍රික් ලේකම්තුමාගේ බෙල්ලෙන් අල්ලා ගන්න හදනවා මම දැක්කා. ඒවා කරන්න එපා. අපි හැමෝම මේ ව්‍යසනයේදී එක විධියට වැඩ කරමු.

ජනාධිපතිතුමාගේ කථාවේදී කිව්වා වාගේ මේ රටේ දේශපාලන නියෝජිතයන් විධියට මේ ආපදා අවස්ථාවේ මේ සති කිහිපය අපි එකට එක්ව වැඩ කරමු. ඒකෙන් පසු අපි දේශපාලනය කරමු. එහෙම කරන අය අපි දැක්කා. ඔබතුමා වැඩ කරනවා, අපි දැක්කා. මාතර මන්ත්‍රීතුමා එහේ ඉඳන් මෙහේට ඇවිත් වැඩ කරනවා. අපි එහෙම ඒවා දැක්කා. ඉතින්, ඒ විධියට වැඩ කරමු. මේ ව්‍යසනයේදී මරණ මතින් දේශපාලනය කරන්න උත්සාහ කරන ගොඩට අපි නොවැටෙමු. මම එහෙම කියන්නේ මේ හැමෝටම නොවෙයි. අපි දැක්කා, කිහිප දෙනෙක් එහෙම ප්‍රකාශ කළා. ඒ වෙනුවට අපි හැමෝම ගෞරවනීයව මේ රටේ වගකිව යුතු දේශපාලන නියෝජිතයන් විධියට වැඩ කරමු කියා මම ඉල්ලා සිටිනවා. එහෙම වැඩ කරන විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මම ස්තුති කරනවා. අපි හැමෝම මේ වෙලාවේ රටක් විධියට ඒ කාර්යභාරය කරමු.

බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. (Mrs.) Chamindranee Kiriella. You have 12 minutes.

Order, please! The Hon. Deputy Chairperson of Committees will now take the Chair.

*අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

[අ.භා. 12.25]

**ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපි මේ කථා කරන මොහොතේ අපේ ආදරණීය මාතෘ භූමිය "දිට්වා" සුළි කුණාටුවට මුහුණ දී විශාල ව්‍යසනයකට ලක් වී තිබෙනවා. අද වෙනකොට ඒ මුළු මරණ සංඛ්‍යාව 474ක්. ඒ වාගේම අතුරුදහන්වීම් 356ක් සිදු වෙලා තිබෙනවා. ලක්ෂ 15කට වැඩි පුද්ගලයන් සංඛ්‍යාවක් බලපෑමට ලක් වෙලා තිබෙනවා. මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීතුමියක් වශයෙන් මම ඉතාම කනගාටුවෙන් ප්‍රකාශ කරනවා, මේ අවස්ථාවේ වැඩිම පීඩනයකට

[ගරු නිතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහතා]

ලක් වෙලා තිබෙන්නේ මහනුවර දිස්ත්‍රික්කය බව. එහි වැඩිම මරණ සංඛ්‍යාවක් වාර්තා වෙලා තිබෙනවා. එම සංඛ්‍යාව 118ක් වෙනවා. අද වනකොට අපේ දිස්ත්‍රික්කයේ අතුරුදහන් වූ සංඛ්‍යාව 171ක්. ඒ වාගේම 10,000කට අධික පවුල් සංඛ්‍යාවකුත්, 40,000කට අධික පුද්ගලයන් සංඛ්‍යාවකුත් මහනුවර දිස්ත්‍රික්කය තුළ විශාල ලෙස බලපෑමකට ලක් වෙලා තිබෙනවා. මම මේ අවස්ථාවේදී ජීවිත අහිමි වූ ඒ සියලුදෙනාට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර ඒ පවුල්වල සියලුදෙනාට මගේ බලවත් ශෝකය පළ කරන්නටත් කැමැතියි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

විශේෂයෙන්ම මහනුවර දිස්ත්‍රික්කය මේ ව්‍යසනයට මුහුණපෑ අවස්ථාවේදී මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්තුමිය, මහනුවර දිසාපතිතුමා ඇතුළු රජයේ සියලු නිලධාරින් දිවා රෑ නොබලා කටයුතු කළා; අදටත් කටයුතු කරමින් පවතිනවා. විපක්ෂයේ මන්ත්‍රීවරියක වශයෙන් මම මේ අවස්ථාවේදී මගේ හද පිරි ස්තුතිය ඒ අය වෙත පුද කරන්න කැමැතියි. ඒ වාගේම ත්‍රිවිධ හමුදාවේ අපේ රණ විරුවන්ටත්, පොලීසියටත්, වෛද්‍යවරුන්ටත්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ටත් මේ වෙලාවේ මම ස්තුතිවන්ත වනවා. මොකද, ගත වුණු මේ දින කිහිපයේදී අධික වර්ෂාව මධ්‍යයේ වුවද ජීවිත බේරා ගැනීම සඳහා මේ සියලුදෙනාම විශාල උත්සාහයක් දැරුවා. ඒ නිසා ඒ සියලුදෙනාම ඉතාම ගෞරවයෙන් මේ අවස්ථාවේදී මා සිහිපත් කරනවා. ඒ වාගේම මල්වතු-අස්ගිරි උභය මහා විහාරවල අති ගෞරවනීය මහානායක ස්වාමීන්ද්‍රයාණන් වහන්සේලාගේ මහ පෙන්වීමෙන් ශ්‍රී දළදා මාළිගාවත්, දියවඩන නිලමේතුමාත් අද වනකොට මහනුවර දිස්ත්‍රික්කය තුළ ලක්ෂයකට ආසන්න පිරිසකට ආහාර වේල් සපයා තිබෙනවා. ඒ වාගේම අදටත් ඒ විශාල සේවාව ඒ අය කරගෙන යනවා. ඒ වෙනුවෙනුත් මගේ ස්තුතිය මේ වෙලාවේ පුද කරනවා.

මහනුවර දිස්ත්‍රික්කයේ අවතැන් වූ ජනතාව රැඳී සිටින ස්ථානවලට මම ගියා. මේ ගත වුණු දින කිහිපයේදී මහනුවර දිස්ත්‍රික්කයේ ජනතාව විතරක් නොවෙයි, රට පුරාම සිටින ජනතාව මහනුවර දිස්ත්‍රික්කයට පැමිණ ඒ අවතැන් ජනතාවට නොයෙකුත් විධියට සහයෝගය ලබා දෙන ආකාරය මම දැක්කා. ඒ සියලුදෙනාටත්, ඒ වාගේම සිවිල් සංවිධානවලටත්, තානාපතිවරුන්ටත් ස්තුතිය පුද කරන්න මා මෙය අවස්ථාවක් කර ගන්නවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

විශේෂයෙන්ම අපේ රටේ ජනතාව මෙවැනි ව්‍යසනයකට මුහුණ පා සිටින අවස්ථාවකදී ක්‍රෝධයෙන් පිරි විපක්ෂයක් විධියට නොවෙයි, මානුෂීය විපක්ෂයක් වන අපි දන්නවා, මේක ලේසි-පහසු කාර්යයක් නොවෙයි කියලා. අපි කාටවත් කාලගුණය වෙනස් කරන්නට බැහැ. නමුත් මේ නිසා සිදු වුණු ජීවිත හානි, ඒ වාගේම දේපළ හානි අවම කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග අපි නිසියාකාරව ගත්තාද, නැද්ද කියන ප්‍රශ්නය අද අපේ රටේ ජනතාව තුළ මතු වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, පසුගිය නොවැම්බර් මාසයේ 12වැනි දා මේ පිළිබඳව දෙස් විදෙස් මාධ්‍ය හරහා අවධාරණය කළා. විශේෂයෙන්ම මා සඳහන් කරන්න කැමැතියි, නොවැම්බර් මාසයේ 25වැනි දා BBC Weather report එකේ පළ වූ කාලගුණ අනාවැකියක් සම්බන්ධව. එහි සඳහන් වුණේ මෙසේයි: "Sri Lanka, where we are going to see exceptionally heavy rain over the coming days, up to 500mm of rainfall. So, there will be some flooding, and we could see a tropical cyclone begin to take shape." ඒ අනුව, ශ්‍රී ලංකාවට නිවර්තන සුළි කුණාටුවක් සමඟ මිලිමීටර් 500ක් දක්වා වැසි සහ ගංවතුර ඇති විය හැකි බව දින තුනකට කලින් BBC නාළිකාව පෙන්වා දුන්නා. ඒ නිසා පෙර සූදානමක් වීමට අපට අවස්ථාව තිබුණා. විශේෂයෙන්ම මේ අවස්ථාවේදී මම රජයට කියන්න කැමැතියි, පෙර සූදානමක් කළා නම් මේ ජීවිත හානි අවම කරගන්න තිබුණාය කියන එක. මොකද ඉන්දියාවේ වූ පෙර සූදානම නිසා මරණ සංඛ්‍යාව 3ක් පමණක් වාර්තා වූ බව අපි දැක්කා. අපටත් එවැනි තත්ත්වයකට යන්න තිබුණා, පෙර සූදානමක් තිබුණා නම්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මහනුවර දිස්ත්‍රික්කය ගැන කථා කළොත්, විශේෂයෙන්ම කොත්මලේ සහ පොල්ගොල්ල ජලාශවල වාන් දොරටු නිසි වේලාවට විවෘත කරලා ඒවායේ තිබෙන ජලය නිසි පරිදි මුදා හැරියා නම් මේ ඇති වුණු අධික ගංවතුර තත්ත්වය වළක්වාගන්න තිබුණා. මහනුවර දිස්ත්‍රික්කයේ ජනතාවගෙන් සියයට 90ක් පමණ ආපදාවට ලක් වුණා, ඇති වුණු ගංවතුර තත්ත්වය නිසා.

ඒ සම්බන්ධයෙන් නිසි වෙලාවේ ක්‍රියාමාර්ගයක් ගත්තා නම් මේ තත්ත්වයෙන් අපට බේරීමට හැකියාවක් තිබුණු බව මම මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමැතියි. මහනුවර දිස්ත්‍රික්කයේ ගම්පොළ නගරයේ විශේෂයෙන් බෝතලපිටිය, සිංහපිටිය කියන ප්‍රදේශවල සියයට 90ක හානියක් අපි දැක්කා. ඒ වාගේම උඩුදුම්බර, හසලක, සරසවිගම, දෙල්තොට, ගලහ, අලවතුගොඩ, පහළ දෙල්තොට යන ප්‍රදේශවලටත් විශාල හානියක් සිදු වුණා. සන්නිවේදන ගැටලු නිසා මේ වන විටත් ඒ සමහර ස්ථානවලින් කිසිම තොරතුරක් ලබා ගැනීමට නොහැකි තත්ත්වයක් තිබෙන්නේ. ඒ වාගේම මාර්ග අවහිරතා නිසා එම ස්ථානවලට යෑමට නොහැකි තත්ත්වයක් තමයි දැනට තිබෙන්නේ. මේ දේවල් සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න කියලා ඉතාම කාරුණිකව ඔබතුමන්ලාගෙන් මා ඉල්ලා සිටිනවා.

මේ ඇති වුණු තත්ත්වය නිසා සරසවිගම, අප්ලන්ඩ් වත්තේ, හදබිම කියන වසමේ පවුල් 32ක් අතුරුදහන් වුණා. ඒ වාගේම අලවතුගොඩ ප්‍රදේශයේත්, හසලක ප්‍රදේශයේ නෙළුම්මල ගම්මානයේත් පවුල් 30කට වඩා මුළුමනින්ම පස්වලට යට වුණා. ඒ පිරිස්වලට අවසන් ගෞරව දැක්වීමටවත් නොහැකි තත්ත්වයක් තිබුණේ. තවමත් සමහර මළ සිරුරු අපට සොයා ගැනීමට නොහැකි තත්ත්වයක් තිබෙන්නේ. සන්නිවේදන ගැටලු නිසා සමහර ස්ථාන ගැන සොයා බලන්න විධියකුත් නැහැ. විශේෂයෙන්ම හසලක, උඩත්ව, ගහේයාය, කිඹුලාඇළ, කපුවත්ත, රබර්වත්ත යන ප්‍රදේශත්, ඒ වාගේම හේවාහැට, ලූල්කඳුර, මාළුස්සාව, දෙල්තොට, ගලහ, මවුලාන වත්ත යන ප්‍රදේශවලට අද වනකොටත් කිසිම දෙයක් ලබා දීමට නොහැකි තත්ත්වයක් තිබෙන්නේ, මාර්ග අවහිරතා නිසා. එම නිසා ඒ සම්බන්ධයෙනුත් අවධානය යොමු කරන්න කියලා ඉතාම කාරුණිකව මා ඉල්ලා සිටිනවා.

මහනුවර දිස්ත්‍රික්කයට තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි පානීය ජල ප්‍රශ්නය, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. ගැටඹේ ජල පවිත්‍රාගාරය යථා තත්ත්වයට පත් කිරීමට ඉංජිනේරුවරුන් දිවා රෑ නොබලා විශාල ප්‍රයත්නයක් දරනවා. මමත් එම ස්ථානයට ගියා. දින හයක් හතක් ගත වුණත්, තවමත් නිසියාකාරව ජලය ලබා ගැනීමට නොහැකි තත්ත්වයක් තිබෙන්නේ. විශේෂයෙන්ම මම ඉල්ලා සිටිනවා, කොළඹින් හරි කණ්ඩායමක් යවලා ඒ ඉංජිනේරුවරුන්ට ඒක යථා තත්ත්වයට පත් කර ගැනීමට උපරිම සහාය ලබා දෙන්න කියලා.

ඒ වාගේම ඉදිරි දිනවල මෝසම් සහිත වැසි ඇතිවන බවට අනාවැකි පළ කරලා තිබෙනවා. ඒ සම්බන්ධයෙනුත් නිසි ක්‍රියාමාර්ග ගන්න කියලා මම මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා.

යුනිසෙෆ් එක -එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල- කියලා තිබෙනවා, ළමයින් ලක්ෂ තුනක් මෙම ආපදාවෙන් පීඩාවට පත් වෙලා තිබෙනවා වාගේම ළමයින් අතර වසංගත රෝග පැතිරීම, මන්දපෝෂණය වැඩිවීම, ජීවත් වීමේ පරිසරය අනාරක්ෂිත වීම ඉහළ යෑමේ අවදානමක් තිබෙනවා කියලා. අපි දන්නවා, මේ

වාගේ ව්‍යසනයක් ඇතිවනකොට වැඩි වශයෙන් පීඩාවට ලක්වන්නේ කාන්තාව සහ කුඩා ළමුන් කියන එක. එම නිසා ඒ අය සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න කියලා මා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම අපි දන්නවා, ලෝක බැංකු වාර්තාවකට අනුව අපේ රටේ ජනතාවගෙන් සියයට 25ක් දුගීභාවයෙන් පෙළෙනවා කියලා. මේ ව්‍යසනයෙන් පස්සේ ඒ සංඛ්‍යාව දෙගුණ තෙගුණ වන බව ලෝක බැංකුව අපට කියලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ විධියට බැලුවාම මෙම ව්‍යසනය නිසා අපේ රටේ ජනතාව විශාල වශයෙන් පීඩාවට ලක් වෙලා තිබෙනවා.

මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමය පවසා තිබෙනවා, දිවයිනට බලපා ඇති ආපදා තත්ත්වය නිසා දරුණු බෝවන රෝග පැතිරීමේ අවදානමක් ඇතිවිය හැකි බවත්, විශේෂයෙන් ඩෙංගු, මී උණ, චිකුන්ගුන්යා පැතිර යෑමේ දැඩි අවදානමක් තිබෙන බවත්. එම නිසා ඒ රෝගවලට අවශ්‍ය ඖෂධ ප්‍රමාණවත්ව ලබා ගැනීමට අවශ්‍ය පෙර සූදානමක් තිබුණොත් හොඳයි කියලා මම මේ අවස්ථාවේ මතක් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 20ක් තිබෙනවා. ආණ්ඩුවෙන් එක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට රුපියල් ලක්ෂ 500ක මුදලක් ලබා දෙනවා කිව්වත්, තිබෙන දත්ත අනුව සමස්තයක් වශයෙන් ගත්තොත්, මම හිතන විධියට, අද වනකොට ඒ මුදලින් සියයට 50ක්වත් ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ලබා දීලා නැහැ. විශේෂයෙන්ම අපි රාජ්‍ය නිලධාරින්ගෙන් ඒ ගැන ඇහුවාට අපට ඔවුන් ඒ තොරතුරු ලබා දෙන්නේ නැහැ. ඒ අනුව අවශ්‍ය පියවර ගැනීමට රාජ්‍ය නිලධාරින්ගේ යම්කිසි පසුබෑමක් තිබෙන බව තමයි අපට වාර්තා වෙන්නේ. ඒ කාරණයටත් මම මේ සභාවේ අවධානය යොමු කරවන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මහනුවර දිස්ත්‍රික්කයේ - කන්ද උඩ රට - ජනතාව ඇතුළුව අපේ රටේ සමස්ත ජනතාවට ඉතිහාසයේ ඉඳලාම නොයෙකුත් කම්කටුලුවලට මුහුණපෑමට සිදු වුණා. නමුත්, ඒ අභියෝග අපේ දළදා වහන්සේගේ ආශීර්වාදයෙන් ජය ගැනීමට අපට හැකියාව ලැබුණා. විපක්ෂය වශයෙන් අපේ පූර්ණ සහයෝගය අපේ ජනතාව වෙනුවෙන් අපි ලබා දෙනවා. අපේ විපක්ෂයේ සිටින සියලුදෙනාම තමන්ගේ දිස්ත්‍රික්කවල ආපදාවට පත්ව සිටින ජනතාව වෙනුවෙන් මේ දිනවල පක්ෂ භේදයෙන් තොරව සහාය දක්වන බව අපි දැක්කා. විපක්ෂයේ මන්ත්‍රීවරියක වශයෙන් මගේත් පූර්ණ දායකත්වය ඒ සඳහා ලබා දෙන බව කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 12.37]

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අද මුදල් අමාත්‍යාංශය ඇතුළු අමාත්‍යාංශ කිහිපයක වැය ශීර්ෂ සම්බන්ධ කාරක සභා අවස්ථාවේ විවාදයට එක්වී අදහස් එකතු කරන්න අවස්ථාව ලැබුණත් මම ඒ පිළිබඳව කථා නොකර, මා නියෝජනය කරන පොළොන්නරුව දිස්ත්‍රික්කයට වාගේම මුළු රටටම බලපා තිබෙන ව්‍යසනය පිළිබඳව කථා කරන්න බලාපොරොත්තු වෙනවා. මේ ව්‍යසනයෙන් අපේම ජනතාවගේ ජීවිත ගණනාවක් අහිමි වෙලා තිබෙනවා. ඒ වාගේම දේපළවලට හානි වෙලා තිබෙනවා. පුද්ගලයන් අතුරුදහන් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ Pilot Captain කෙනෙකුගේ ජීවිතයත් මේ ආපදා තත්ත්වය නිසා අහිමි වුණා. ඒ වාගේම Sri Lanka Navy එකේ නිලධාරින් ගණනාවකගේත් ජීවිත අහිමි වුණා. ඒ සියලුදෙනාටම අපේ ශෝකය මේ අවස්ථාවේදී පළ කරන්නට මම කැමැතියි. මේ ව්‍යසනය නිසා අපේම ජනතාව මොන තරම් පීඩනයකට ලක් වෙලා සිටිනවාද කියන එක මගේ ඇස් දෙකෙන්ම දැක්කා. අපට ඒක දරා ගන්න බැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ වෙනකොට 356දෙනෙකු අතුරුදහන් වෙලා, 474දෙනෙකුගේ ජීවිත නැති වෙලා 1,586,329ක් මේ ව්‍යසනයට ලක් වෙලා සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මීට දින කිහිපයකට පෙර - නොවැම්බර් මාසයේ 12වැනි දා - කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා අපේ රටේ ප්‍රසිද්ධ නාළිකාවකට ඇවිල්ලා මේ ව්‍යසනය පිළිබඳ බොහොම ලස්සන විග්‍රහයක් කරනවා මම දැක්කා. අධික වර්ෂාවක් වාගේම ඉන්දියාවෙන් අපේ රටට අධික සුළං එනවාය කියන එකත් ඒ අධ්‍යක්ෂ ජනරාල්තුමා ඒ ප්‍රසිද්ධ නාළිකාවේදී ප්‍රකාශ කළා. මේ ප්‍රකාශය ගැන රජය දැනුවත් වුණාද නැත්නම් ඒ අධ්‍යක්ෂ ජනරාල්තුමා රජයට ඒ පිළිබඳව කිව්වේ නැද්ද කියන එක තමයි අපට තිබෙන ගැටලුව.

ස්වාභාවික විපත් සිද්ධ වෙන්න පුළුවන්. ඒවා අපට වළක්වන්නට බැහැ. විශේෂයෙන්ම මා නියෝජනය කරන පොළොන්නරුවේ පුද්ගලයන් 16,333ක් මේ ව්‍යසනයට ලක් වෙලා සිටිනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. ඒ වාගේම ගොවියෝ, කිරි ගොවියෝ පීඩාවට පත් වෙලා සිටිනවා. තවම අපට ගණනය කරන්න බැහැ කුඹුරු කොපමණ ප්‍රමාණයකට හානි වෙලා තිබෙනවාද කියලා. පෙරේදා අපි පාර්ලිමේන්තුවේදී ආණ්ඩු පක්ෂයෙන් අවස්ථාවක් ඉල්ලුවා, මේ තිබෙන ගැටලු ටික ගැන කථා කරන්න අපට අද දවසේ අවස්ථාවක් ලබා දෙන්න කියලා. නමුත්, ආණ්ඩු පක්ෂයෙන් ඒක ප්‍රතික්ෂේප කරලා පාර්ලිමේන්තුව කල් තැබුවා. මම ඒක දකින්නේ ඇත්තටම පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයට මරු පහරක් තමයි මේ එල්ල කරලා තිබෙන්නේ කියායි. මේවා ගැන අපි කථා කරන්නේ පාර්ලිමේන්තුවේදී තමයි. අපට මේවා කථා කරන්න වෙන තැනක් නැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. මම මේ ගැන අද කථා කරන්න තීරණය කළේ දැන් රුපියල් මිලියන 50ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට වෙන් කරලා තිබෙන නිසායි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම නියෝජනය කරන පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 7ක් තිබෙනවා. ඒ අනුව පොළොන්නරුව දිස්ත්‍රික්කයට රුපියල් මිලියන 350ක් ලැබෙන්න ඕනෑ. ඒ රුපියල් මිලියන 350 පොළොන්නරුව දිස්ත්‍රික්කයට ලැබුණාද කියලා බලන්න මම ඊයේ අපේ මහ දිසාපතිතුමා හමු වුණා. "දැන් රුපියල් මිලියන 350ක් ඇවිල්ලා තිබෙනවා. ඒක තවම පුද්ගලයන් අතරට ගිහිල්ලා නැත්තේ ඇයි" කියලා මම එතුමාගෙන් ඇහුවා. හැබැයි, ඇත්තටම ඒ රුපියල් මිලියන 350න් ඇවිල්ලා තිබෙන්නේ රුපියල් මිලියන 8යි. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 7ක් තිබෙනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ලැබිලා තිබෙන්නේ රුපියල් ලක්ෂ 8ක් වාගේ පොඩි මුදලක්. 16,000කට වැඩි පිරිසක් දැන් අවතැන් වෙලා ඉන්නවා. ගෙදරකට පළමුවන වටයේදී දෙන රුපියල් 10,000ක මුදල, රජය මැදිහත් වෙලා රුපියල් 25,000 දක්වා වැඩි කළා. ඒක බොහොම හොඳයි. පළමුවෙන් ගෙදරට අවශ්‍ය බඩු ටික ගන්න, ළිඳ සුද්ද කර ගන්න, ඒ අවශ්‍ය දේවල් කර ගන්න රුපියල් 25,000ක් දෙන්න තීරණය

[ගරු කිංස් නෙල්සන් මහතා]

කරලා තිබෙනවා. නමුත්, රුපියල් මිලියන 8යි, පොළොන්නරුව දිස්ත්‍රික්කයටම ලැබිලා තිබෙන්නේ. එම නිසා ඒ මුදල් ඉක්මනින් යවන්න. ඒ මුදල්වල වවුචර් ඕනෑ, estimates බලන්න ඕනෑ, ටෙන්ඩර් කැඳවන්න ඕනෑ කියලා එහෙම කරන්න බැහැ. ප්‍රාදේශීය ලේකම්වරුන්ට ඒ බලය දෙන්න. අද ප්‍රාදේශීය ලේකම්වරු වැඩ කරන්න බොහොම කැමැත්තෙන්, ආශාවෙන් ඉන්නවා. හැබැයි, ඒකට පොඩි භයකුත් තිබෙනවා වාගේ මම එතුමන්ලා තුළින් දකිනවා. මේ වෙලාවේ රජයක් විධියට ඔබතුමන්ලා කථා කරලා, ඒ අය දැනුවත් කරන්න, "භය වෙන්න එපා. මෙච්චර මුදලක් අපි දීලා තිබෙනවා. ඒ මුදල් වියදම් කරන්න." කියලා. ඒ මුදල් වියදම් කරලා රටේ ජනතාවට අවශ්‍ය වෙලාවේ ඒ මුදල් ටික ලබා දෙන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කිරි ගොවියාගේ හරක් ටික මැරිලා, කැලයට ගහගෙන ගිහිල්ලා තිබෙනවා. දැන් ඒ වතුරත් ගහගෙන ඇවිල්ලා, ඒ පැත්තටවත් යන්න බැරි තරමට ගඳයි. එක ගෙදරක ටොන් ගණනක කුණු තිබෙනවා. ඒවා ඉවත් කර ගන්න විධියක් නැහැ. ඒ නිසා මම කියනවා, මේ ආපු මුදල් භය නැතුව වියදම් කරන්න කියන්න කියලා. ඒ මුදල් වියදම් කරන්නේ අවතැන් වෙච්ච අපේම ජනතාව වෙනුවෙන්. ඒ නිසා දිසාපතිතුමන්ලාට, ප්‍රාදේශීය ලේකම්වරුන්ට ඒ බලය දෙන්න කියන කාරණය මම මතක් කරන්න කැමැතියි.

විශේෂයෙන්ම මම කියන්න ඕනෑ, මේ අවතැන් වෙච්ච ජනතාවට වියළි සලාක ලබා දීම සඳහා එක පුද්ගලයෙකුට රුපියල් 2,100ක් තමයි වෙන් කරලා තිබෙන්නේ කියන එක. ඒ රුපියල් 1,200 වෙන් කරලා තිබෙන්නේ දවස් 7කට. රුපියල් 2,100ක් දවස් 7කට වෙන් කළාම, දවසකට වෙන් වෙන්නේ රුපියල් 300යි. ඒ මුදල ප්‍රමාණවත්ද? රුපියල් 300කින් දවසක් කන්න පුළුවන්ද? ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේවා සංශෝධනය වෙන්න ඕනෑ. අපි මෙහෙම කියන්නේ මේවා නිවැරදි වෙන්න ඕනෑ නිසායි. අපි අද දවස ඉල්ලුවේ ඒවා ගැන කථා කරලා ඒවා වෙනස් කර ගන්න. ඒවා ක්ෂණිකව වෙනස් කර ගන්න පුළුවන්. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ කාරණයටත් විශේෂ අවධානයක් යොමු කරන්න කියන එක තමයි මම කියන්නේ.

මම අද උදේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට කථා කරලා ඇහුවා, පරාක්‍රම සමුද්‍රයට තව කොච්චර වතුර පුරවන්න පුළුවන්ද කියලා. මේ වෙනකොට අක්කර අඩි 89,200ක් ජලය තිබෙනවා. අපට තව අක්කර අඩි 116,000ක ජලය පුරවන්න පුළුවන්. අපි තවම වාන් දොරටු ඇරියේ නැහැ. හැබැයි, පොළොන්නරුව දිස්ත්‍රික්කයට මෙච්චර ව්‍යසනයක් ඇති වුණේ ඇයි? මොරගහකන්ද ජලාශයේ ජලය ක්‍රමවත්ව පොළොන්නරුවට එවන්න ඕනෑ වෙලාවේ එව්වේ නැහැ. ඒ නිසා මොරගහකන්දෙන් ආපු ජලය නිසා පොළොන්නරුව දිස්ත්‍රික්කය සම්පූර්ණයෙන්ම විනාශයට පත් වුණා. තවමත් පරාක්‍රම සමුද්‍රය වාන් දමන්නේ නැහැ. අදටත් අක්කර අඩි 116,000ක් වතුර පුරවන්න පුළුවන්. ඔබතුමන්ලා පොළොන්නරුවේ වාරිමාර්ග ඉංජිනේරුවන්ට කථා කරලා බලන්න, කොච්චර වතුර පුරවන්න පුළුවන්ද කියලා. තවත් අක්කර අඩි 116,000ක් වතුර පුරවන්න පුළුවන් පරාක්‍රම සමුද්‍රය වාන් දමන්නේත් නැතුව පොළොන්නරුව යට වුණේ ඇයි? එතැන තිබෙන ප්‍රශ්නය මොකක්ද? කාගේද ඒ වරද? මේවා ඉදිරියේදීත් වෙන්න ඉඩ තියන්න බැහැ. ඒවා වෙනස් වෙන්න ඕනෑ. මේ නිසා ලෝක උරුමයක් විධියට නම් කරපු, බකමූණ ප්‍රදේශයේ තිබෙන ඇළහැර අමුණ සම්පූර්ණයෙන්ම කැඩිලා විනාශ වෙලා ගියා. දැන් මහවැලි අධිකාරියෙන් කියනවා, ඒක යථා තත්ත්වයට ගන්න දින 14ක් ගත වෙනවා කියලා. ඒකත් දින 14කින් කරන්න පුළුවන්ද, බැරිද කියලා දන්නේ නැහැ.

වගා හානි ගත්තොත්, ගංවතුරට යට වෙච්ච කුඹුරු ප්‍රමාණය දැන් විනාශ වෙලා ඉවරයි. හැබැයි, ඇළහැර ගොවි ජනපදයේ, ඇළහැර ව්‍යාපාරයේ මේ ගංවතුරට යට වුණේ නැති කුඹුරුත් තිබෙනවා. ගංවතුරට යට වෙච්ච කුඹුරු දැන් විනාශ වෙලා ඉවරයි. හැබැයි, ඒ ගංවතුරට යන නොවුණු කුඹුරුවලට දින 14ක් වතුර දෙන්නේ නැතිව තිබුණොත්, ඒ කුඹුරු හෙක්ටෙයාර ගණනත් ඉබේම විනාශ වෙලා යනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ ගැන විශේෂ අවධානයක් යොමු කර, ගංවතුරින් බේරිලා ඉන්න ගොවීන්වත් බේරාගන්න වෙනවා. නැත්නම් අනිවාර්යයෙන්ම හාල් හිඟයක් එනවා. දැන් කුඹුරු ටික සම්පූර්ණයෙන් විනාශ වෙලා ඉවරයි. එක් පැත්තකින් කුඹුරු ටික සම්පූර්ණයෙන්ම වැලිවලින් ගොඩවෙලා තිබෙනවා. අනික් පැත්තෙන්, කුඹුරු අඩි 3ක්, 4ක්, ගල් මතුවනකල් හෑරිලා ගිහිල්ලා. කන්න 4ක් යනකල් මේවා ගොඩදාගන්න බැහැ. එහෙම නම්, මේ කුඹුරුවලට පස් ගෙනැල්ලා පුරවලා, මඩ කරලා, ගොවිතැන් කරන්න පුළුවන් විධියට බිම හදාගන්න වෙනවා. එහෙම හදාගන්න විධියක් නැහැ. මේ ගොවීන්ට අද කර කියාගන්න දෙයක් නැතිවෙලා තිබෙන්නේ. ඒ ගැනත් විශේෂ අවධානයක් යොමු කරයි කියලා මම විශ්වාස කරනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

දැන් තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි විදුලිය නැති එක. විදුලිය නැති වෙනවාත් එක්කම පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පානීය ජලය සඳහා තිබෙන RO plantsවල වැඩ නැවතිලා තිබෙනවා. තවම අපට ඒවා යථා තත්ත්වයට පත් කරගන්න විධියක් නැහැ. ඒක කරගන්න බැරි පළමු හේතුව තමයි විදුලි කාර්මිකයන්ගේ හිඟය. අපට බොහොම සීමිත විදුලි කාර්මිකයන් ප්‍රමාණයක් ඉන්නේ. මේක හැම තැනටම බලපාන ප්‍රශ්නයක් වෙන්න ඇති, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. මේ ආයතනවල සේවකයන්ගේ අඩුපාඩුව නිසාම අද වැඩ කරගන්න බැරිවෙලා තිබෙනවා. අද විදුලියත් නැහැ, බොන්න වතුරත් නැහැ. ළිං ටික තවම ශුද්ධ කරගන්න විධියකුත් නැහැ. විශේෂයෙන්ම අපේ රටේ ත්‍රිවිධ හමුදාව, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, රාජ්‍ය සේවයේ සියලු දෙනාම බොහොම කැපවීමෙන් කටයුතු කරනවා. විශේෂයෙන්ම අපේ ග්‍රාම නිලධාරිවරු, කෘෂිසෙලා, සමෘද්ධි නියාමකවරු මේ හැම කෙනෙක්ම දවල් රෑ නොබලා, බඩට බත් වේලක් නැතිව වැඩ කරනවා; ජනතාව එක්ක ඉන්නවා. ඒ නිසා මේ අයටත් ශක්තියක් දෙන්න වෙනවා. විශේෂයෙන්ම ආරක්ෂක අමාත්‍යාංශය ගත්තත්, සෞඛ්‍ය ක්ෂේත්‍රය ගත්තත්, ඒවා අපේ රටේ ආයෝජන. මේවා ලාභ ලබන ආයතන නොවෙයි.

මම දැක්කා, ආරක්ෂක අමාත්‍යාංශයට සල්ලි වෙන් කළාම අපේ සමහර මන්ත්‍රීවරු අහනවා ඇයි මෙච්චර මුදලක් වෙන් කරන්නේ කියලා. එහෙම වෙන් කරන්නේ දෙයියනේ, මෙන්න මේ වාගේ අවස්ථාවල එළියට බැහැලා වැඩ කරන්නයි. ඒ නිසා, ඒ ගැන කවුරුත් මෙතැනදී විවේචනය කරන්න හදන්න එපා. අපේ රටේ අධ්‍යාපන අමාත්‍යාංශයට වාගේම සෞඛ්‍ය ක්ෂේත්‍රයටත්, ආරක්ෂක අමාත්‍යාංශයටත් තමයි වැඩියෙන් මුදල් වෙන් වෙන්න ඕනෑ. දැන් අපට එහි වටිනාකම පෙනෙනවා නේ. මේවා ලාභ ලබන ආයතන නොවෙයි. නාවික හමුදාවෙන් ඇවිල්ලා මේ බෝට්ටු ටික දැම්මේ නැත්නම් මේ අවතැන් වෙච්ච ජනතාව බේරාගන්න පුළුවන්ද? අපේ හෙලිකොප්ටර් පාවිච්චි කරලා ඒ අවතැන් වෙච්ච මිනිස්සු බේරාගත්තා. ඒ නිසා මේවා තව තව ගන්න වෙනවා. අපේ රටේ යුද්ධයක් නැහැ කියලා හමුදාවේ ඉන්න නිලධාරීන් ප්‍රමාණය අඩු කරලා හරියන්නේ නැහැ, හමුදාවට තිබෙන සම්පත් අඩු කරලා හරියන්නේ නැහැ, පොලීසියට, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට තිබෙන සම්පත් අඩු කරලා හරියන්නේ නැහැ. පොළොන්නරුව, මනම්පිටිය රෝහලේ අදටත් විදුලිය නැහැ. මනම්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ජෙනරේටරයක්වත් නැහැ. ඒ නිසා මම යෝජනා කරනවා ලංකාවේම තිබෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට

අවම වශයෙන් ජෙනරේටර් දෙක ගණනේ ලබාදෙන්න ඕනෑ කියලා. ඉස්පිරිතාලයක විදුලිය නැහැ කියන්නේ මොනතරම් ඛේදවාචකයක්ද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

මම හිතුවා ඔබතුමිය මට තව වැඩිපුර කාලය ලබා දෙනවා කියලා. මම බොහොම සතුටු වුණා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේවා විය යුතු දේවල්. මේ ආයතන හඳුනාගෙන මේ අය වැයෙන් අපි ඒවාට මුදල් වෙන් කරන්න ඕනෑ. දැන් අපි දන්නවා අවශ්‍යතාව මොකක්ද කියලා. සමහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ගිහිල්ලා හදිසියකට ලණුවක් ගෙන්වාගන්න විධියක් නැහැ. ඒගොල්ලන් බයයි මුදල් වියදම් කරන්න. ඒගොල්ලන්ට කථා කරලා කියන්න, "ඔයගොල්ලන්ට සම්පූර්ණයෙන් බලය පවරා තිබෙනවා, මේ රටේ ජනතාව වෙනුවෙන් සේවය කරන්නයි මේ මුදල් වෙන් කර තිබෙන්නේ, බය නැතුව වියදම් කරන්න" කියලා.

විශේෂයෙන්ම කියන්න ඕනෑ විදුලිය සම්බන්ධව. අවශ්‍ය කාර්මිකයන් මේවාට යොදවා ඉක්මනින්ම විදුලිය නැති ප්‍රදේශවලට විදුලිය ලබා දෙන්න. මොකද, විදුලිය නැති වුණාම පානීය ජලය දෙන්න විධියකුත් නැහැ. ඒ කාරණයටත් විශේෂ අවධානයක් යොමු කරයි කියලා මම විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මා නියෝජනය කරන පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තමයි සෝමාවතිය රජ මහා විහාරය තිබෙන්නේ. නුවරට දළදා මාළිගාව වාගේ පොළොන්නරුවට සෝමාවතිය රජ මහා විහාරය තිබෙනවා. අපි බෞද්ධයන් විධියට නුවර දළදා වහන්සේ වඳින්න යනවා වාගේ තමයි සෝමාවතී චෛත්‍ය රාජයාණන් වහන්සේ වඳින්න යන්නේත්. මෙවර ගංවතුරත් එක්ක මම හිතන විධියට ඒ ප්‍රදේශය අඩි 19ක්, 20ක් විතර යට වුණා. මේ වෙලාවෙත් එතැන තේවාව ඒ විධියටම සිද්ධ වෙනවා. එතැන ඉන්න ස්වාමීන් වහන්සේලා බෝට්ටුවෙන් ගිහිල්ලා බුද්ධ පූජාව තියනවා. අඩි 19ක් විතර වතුර ආවා කියලා ඒ ස්වාමීන් වහන්සේලා පන්සල දාලා ගියේ නැහැ. ඒ ස්වාමීන් වහන්සේලා පන්සලේ රැඳිලා ඉන්නවා. සෝමාවතිය විහාරාධිපති ස්වාමීන් වහන්සේට රජයේ කිසිම බලධාරියෙක් තවමත් කථා කරලා නැහැ. මේවා කියන්නත් ලජ්ජයි. අඩුම ගාණේ ඇමතිතුමාවත් කථා කළාද දන්නේ නැහැ. කථා කළා නම් හොඳයි. කථා කරලා හිත සතුටු වෙන්න හරි අහන්න, අපේ හාමුදුරුවනේ මොනවද අපෙන් වෙන්න ඕනෑ කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, පොළොන්නරුව දිස්ත්‍රික්කය හැම අවුරුද්දේම වතුරෙන් යට වෙනවා. පොළොන්නරුව-කොළඹ-මඩකලපුව පාරේ දැන් යන්න බැහැ. වෙනදාට යට වෙනකොට අපට යන්න තිබුණු එකම විකල්ප මාර්ගය තමයි කෝව්වි පාර. අපි එහා පැත්තට යන්නේ කෝව්වියෙන්. දැන් ඒ කෝව්වි පාරත් සම්පූර්ණයෙන්ම විනාශ වෙලා. හැම අවුරුද්දකම ඒ පාර යට වෙනවා. යට වුණාම මඩකලපුවේ ඉඳලා කොළඹට යන මිනිස්සුන්ට යන්නත් බැහැ, පොළොන්නරුවේ ඉඳලා මඩකලපුව පැත්තට යන මිනිස්සුන්ට යන්නත් බැහැ. ඒ නිසා මම යෝජනා කරනවා, කදුරුවෙල නගරයේ ඉඳලා මනම්පිටිය දක්වා පාර හදනකොට ඒ පාර ගුවන් පාලමක් විධියට අපි හදමු. කණු මතින් පාර දාලා යටින් වතුර යන්න පුළුවන් විධියට, ගුවන් පාලමක් විධියට හදමු. කදුරුවෙල නගරයේ ඉඳලා මනම්පිටිය නගරයට කිලෝමීටර 7ක්, 8ක් ඇති වැඩිම වුණොත්. දැන් මුදල් වෙන් වෙනවා ඇති මේ කටයුතු කරන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ඔබතුමාට නියමිත කාලය අවසානයි. වැඩිපුරත් විනාඩියක් ලබා දී තිබෙනවා.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

ඒ විධියට මේ පාර හදමු කියලා යෝජනා කරනවා. මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 12.53]

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, වැය ශීර්ෂ කිහිපයක් ගැන කථා කරන අද දවසේ මම කැමැතියි, මේ ඇති වී තිබෙන හදිසි තත්ත්වයත් එක්ක, අයහපත් කාලගුණික තත්ත්වයත් එක්ක ඇති වුණු දේවල් පිළිබඳ පොඩි සමාලෝචනයක් කරන්න. මේ මොහොතේදී අපට දැනගන්න ලැබුණා, විපතට පත් සියලු පාසල් දරුවන්ට රුපියල් 25,000ක් ලබා දෙනවාය කියන කාරණය. පාසල් යන දරුවන් විශාල විධියට විපතට පත් වුණා. ඒ දරුවන්ට පොත් පත් ගන්න, අවශ්‍ය පාසල් උපකරණ ගන්න ඒ රුපියල් 25,000 ලොකු දෙයක් වෙයි. ජනාධිපති අරමුදලින් තමයි ඒ මුදල වෙන් කර තිබෙන්නේ. අපි දන්නවා, දරුවන් කිහිපදෙනෙක් ඉන්න පවුල් තිබෙනවා. ඒ සියලුදෙනා මේ වෙලාවේ ලොකු විපතකට පත් වෙලා ඉන්නේ. ඒ අයට තනියම මේ දේට මුහුණ දෙන්න බැහැ. හැබැයි, ජනාධිපති අරමුදලින් ඒ දරුවන්ට රුපියල් 25,000ක් වෙන් කිරීම ඔවුන්ට විශාල පිටුවහලක් වෙයි කියලා අපි හිතනවා.

ඒ වාගේම ගෙවල් පිරිසිදු කිරීම සඳහාත් රුපියල් 25,000ක් වෙන් කර තිබෙනවා. ඒ සඳහා කලින් තිබුණේ රුපියල් 10,000යි. ඒ ප්‍රමාණය රුපියල් 25,000 දක්වා රජයෙන් වැඩි කළා. කාන්තාවන් විධියට අපි දන්නවා, විශාල ගංවතුරක් ඇවිල්ලා, තමන් පාවිච්චි කරන සියලු බඩු භාණ්ඩ යට වෙලා, ගෙදර තිබෙන සියලු දේවල් විනාශ වුණාට පස්සේ ඒ නිවස පිරිසිදු කිරීමේදී වැඩි බරක් පැටවෙන්නේ ගෘහනියන්ට, කාන්තාවන්ට බව. ඇය මොන තරම් මහන්සි ගත්තත් ඇත්තටම ඒ කටයුත්ත ඇයට තනියම කරගන්න බැහැ. ඒ නිසා ඇයට කාගෙන් හරි පිහිටක්, උදව්වක් අවශ්‍යයි. ඒ නැති වූ සියලු දේවල් දෙන්න නොවෙයි, ගෙදරට ඇතුළු වෙලා ඉන්න පුළුවන් විධියට ගෙදර පිරිසිදු කරගන්න තමයි විපතට පත් සෑම පවුලකටම ඒ රුපියල් 25,000 ලබා දෙන්නේ. ඒකත් මේ වෙලාවේ ලොකු ධෛර්යයක් වෙයි අපේ කාන්තාවන්ට. ඒ වාගේම, පාර්ලිමේන්තුවේ ඉන්න අපේ

[ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය]

කලෙයිවෙල්වි මන්ත්‍රීතුමිය, අනුෂ්කා මන්ත්‍රීතුමිය, සාගරිකා මන්ත්‍රීතුමිය, අම්බිකා මන්ත්‍රීතුමිය ඇතුළු ඒ ඒ දිස්ත්‍රික්කවල ඉන්න මන්ත්‍රීවරියන් එක මිටකට එකතු වෙලා ජනතාවට සහාය දෙන්නත් කටයුතු කරනවා. එතුමියලා කාන්තාවන්ගේ සහ දරුවන්ගේ ප්‍රශ්නවලට - ආරක්ෂාව සහ සනීපාරක්ෂාව කියන දෙකටම අදාළව - කෙළින්ම මැදිහත් වෙනවා. ඒ අයගේ ආරක්ෂාව හා සනීපාරක්ෂාව කියන දෙකටම අදාළ ප්‍රශ්නවලට උත්තර සොයමින් ඉන්නවා. අපේ ඒ මන්ත්‍රීවරියන් පවා මේ ආපදාවට මැදි වෙලා සිටියදී, එතුමියන්ලාගේ ගෙවලුත් විනාශ වෙලා තිබියදී, අසල්වාසීනුත් නැති වෙලා සිටියදී, නෑදැයිනුත් නැති වෙලා තිබියදී එතුමියන්ලාත් එක මිටකට එකතු වෙලා ලොකු වෙහෙසක් ගන්නවා, මේ ආපදාවෙන් පීඩාවට පත් වූ ජනතාවට පිහිට වීම සහ ඒ ජනතාව එයින් මුදා ගැනීම සඳහා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, සොරොව් අරින විදිය ගැන, වෙරළේ මෝය කට කපන විදිය ගැන අපි මෙතැනදී කථා කරනවා. ඔව්, ඒවා ගැන කථා කරන්න ඕනෑ තමයි. ආණ්ඩු පක්ෂයට, විපක්ෂයට ඒ ගැන කථා කරන්න පුළුවන්. හැබැයි, එක වරම මේ රටටම ඇති වුණු අයහපත් කාලගුණික තත්ත්වයක් මේක. මේ තත්ත්වයට මුහුණ දුන්නේ අපේ රට විතරක් නොවෙයි. මේ වෙද්දී අපේ වාගේම තවත් රටවල් කිහිපයක මේ ව්‍යසනය පැතිරිලා ගියා. ඒ රටවල මිනිස්සුත් මේ විධියටම අපහසුතාවට පත් වෙලා තිබෙනවා; මරණයට පත් වෙලා තිබෙනවා. අපේ රටේ වාගේම ඒ රටවලත් සමහර මිනිසුන්ගේ සියලු දේ අහිමි වෙලා තිබෙනවා. අපේ රටේ වාගේම ඒ මිනිස්සුත් ලොකු ධෛර්යයක් ගන්නවා, එක පාරට ඇති වුණු මේ ව්‍යසනයෙන් රටවල් හැටියට මිදෙන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මන්ත්‍රීවරුන් විධියට, එහෙම නැත්නම් මහජන නියෝජිතයන් විධියට අද ඇති වෙලා තිබෙන ආපදා තත්ත්වය කළමනාකරණය කර ගන්න එක, නීති හදන එක අපේ වැඩක් තමයි. හැබැයි, මෝය කට කපන්නේ කොහොමද කියන එක මම දන්නේ නැහැ. එහෙම නැත්නම් සොරොව්ව කොයි වේලාවේද අරින්න ඕනෑ කියන එක, මොන ප්‍රමාණයකින්ද අරින්න ඕනෑ කියන එක අපට මෙතැනදී තීරණය කරන්න බැහැ. ඒ ඇති වන තත්ත්වය අනුව තමයි ඒ කටයුතු කරන්න ඕනෑ. මොකද, අපි ගිහිල්ලා කලින්ම මෝය කට අපට ඕනෑ විධියට කැපුවා නම්, අනෙක් පැත්තට මුහුදේ වතුර ටික එනවා. ඒ නිසා විද්‍යාත්මකව, කාලගුණ වාර්තා අනුව වාරිමාර්ග නිලධාරින් අවශ්‍ය ප්‍රමාණයට තමයි ඒවා කළමනාකරණය කළේ. ඔවුන්ට ඒ විධියට මැදිහත් වෙන්න කියලා අපේ වගකිව යුතු නිලධාරින් ප්‍රකාශ කරලා තිබුණා. ඔවුන් ඒ විධියට වැඩ කටයුතු කරගෙන ගියා. හැබැයි අපි කවුරුත් දන්නා දේ තමයි, මේ ඇති වුණු විනාශය, එහෙම නැත්නම් මේ ඇති වුණු හදිසි තත්ත්වය අප කාටත්, දිස්ත්‍රික්ක 25ටම බලපෑවාය කියන එක. මුළු රටටම හදිසියේම මේ විපතට සූදානම් වෙන්න සිදු වුණා.

ඒ නිසා විපක්ෂය කියපු සමහර කථා පිළිගන්න අපට සිදු වෙනවා වාගේම, සමහර කථාවලට අපට එකඟ වෙන්න බැහැ. එක තැනක් දෙකක්, එහෙම නැත්නම් සමහර තැන් තවම යථා තත්ත්වයට පත් වෙලා නැහැ. ඒක තමයි ඇත්ත. ඇයි ඒ? මේ නිලධාරිනුත් ඒ ජනතාව සමඟ හිටපු අය. ඒ අයත් අනතුරට ලක් වෙලායි ඉන්නේ. බිඳ වැටුණු විදුලි සම්බන්ධතා ලබා දෙන්න හරි, ජල සම්බන්ධතා ලබා දෙන්න හරි, ඒ කටයුතු කළමනාකරණය කරන්න හරි ඉන්න නිලධාරින්ගෙනුත්, එහෙම නැත්නම් ආරක්ෂක අංශයේ ඉන්න නිලධාරින්ගෙනුත් බොහෝ දෙනා අනතුරට ලක් වෙලායි ඉන්නේ. ඒ හින්දා අපට කියන්න පුළුවන්ද උතුරට නැහැ දකුණට විතරයි, දකුණට නැහැ නැගෙනහිරට විතරයි කියලා? එහෙම නොවෙයි, මුළු රටේම ඉන්න ජනතාවත් එක්ක ඒ සියලු නිලධාරිනුත් අනතුරට ලක් වෙලායි ඉන්නේ. හැබැයි අපි දැක්කා, තමන්ගේ අයට මොන අනතුරක් වුණත්, ඒ නිලධාරින් සේවය මේ දක්වා ඉතාම හොඳට ඉටු කළ ආකාරය. ඒ බව අපට කියන්න පුළුවන්. මොකද, අපි ඒ නිලධාරින් එක්ක වැඩ කළා. සමහර අවස්ථාවල සියලු ප්‍රදේශවල විදුලිය නැති වුණා, ගස් කඩාගෙන වැටිලා. නමුත් ජනතාවත් එකතු වෙලා විදුලිබල මණ්ඩලයට අවශ්‍ය සහයෝගය දුන්නා. ඒ නිලධාරින් රැයවල් දෙකතුන නිදා ගත්තේ නැහැ. එහෙම තමයි ඒ අය වැඩ කළේ. විදුලිය විසන්ධි වුණාට පසුව විදුලිය ලබා දෙන්න ඔවුන් විශාල වැඩ කොටසක් කළා. ඒ අය දැනුත් ඒ වැඩ කරමින් ඉන්නවා. ඒ නිසා ඔවුන් දිරිමත් කරන එක, ශක්තිමත් කරන එක ජනතාව විධියට අපි එකට එකතු වෙලා කරන්න ඕනෑ.

මේ වෙලාවේ සියලු අණ පනත් නීති රීති පැත්තකින් තියලා ජනතාවට අවශ්‍ය පහසුකම් සපයන්න කියන එක රජය හැටියට රාජ්‍ය නිලධාරින්ට වගකීමෙන් කියා සිටියා. ඒ නිසා පළමු මොහොතේම ඒ චක්‍රලේඛ මඟින් ක්‍රියාත්මක වෙන්න ඕනෑ විධියට, මුදල් වෙන් කරන්න ඕනෑ විධියට මුදල් වෙන් කළා. මට කලින් කථා කරපු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා කිව්වා, තවමත් ලක්ෂ 50ක් ආවේ නැහැ කියලා. හදිසි නීතිය යටතේ ලක්ෂ 50 නොවෙයි, ඕනෑ නම් ඊට වැඩි පුර වුණත් වියදම් කරන්න කියලාත් කිව්වා. ඕනෑ තරම් මුදල් තිබෙනවා කියලාත් කිව්වා. ළමයින්ගේ පොත් ටික නැති වෙලා නම් පොත් ටික ලබා දෙන්න, වගා භූමිය විනාශ වෙලා නම් වගා හානියට අදාළ සහන ලබා දෙන්න, ඒ වාගේම දේපළ විනාශ වෙලා නම් ඒ සියල්ල ලබා දෙන්න මුදල් වෙන් කර තිබෙනවා. හැබැයි ජනාධිපතිතුමාගේ වචනයෙන් කිව්වොත්, ලබා දෙන්න බැරි නැති වුණු ජීවිත විතරයි.

ඒ හැර අනෙක් සියල්ල ලබා ගන්න අපට පුළුවන්.

ඔබතුමන්ලා දැනගන්න, අපි රජයේ නිලධාරින් -ප්‍රාදේශීය ලේකම්වරු, දිසාපතිවරු- දවසින් දවස, පැයෙන් පැයට දැනුවත් කළා. ඒ අයගෙන් පැයෙන් පැයට තොරතුරු ලබා ගත්තා. තිබෙන නීති රීතිවලින් නිදහස් කරලා මිනිසුන්ට සහන දෙන්න මුදල් වියදම් කරන්න කියලා නිලධාරින්ට කිව්වා. ඒ නිසා කිසිම තැනක, කිසිම කෙනෙකුට මුදල් වියදම් නොකර ඉන්න බැහැ. ඒ ඒ අවශ්‍යතාව අනුව ඒ සියලු මුදල් ජනතාව සඳහා වියදම් කරන්න ඕනෑ. එහෙම කරන නිසා තමයි අපි අද වෙද්දී, පීඩාවට පත් දරුවන්ට රුපියල් 25,000ක් බැගින් ලබා දෙන්නේ.

මේ වෙද්දී අදාළ සියලු දේ තක්සේරු කරමින් තිබෙනවා. ඒ ගැනත් කියන්න ඕනෑ. අප වැටුණු තැනින් නැඟිටින්න ඕනෑ. අපි පාසල් ටික අරින්න ඕනෑ. පාසල් පිරිසිදු කිරීම, මහාමාර්ග යළි පිරිසිදු කරලා, පිළිසකර කරලා ගමනාගමනයට සුදුසු තත්ත්වයට පත් කිරීම, විදුලිය ඇණ හිටි තැන්වලට විදුලිය ලබා දීම තමයි මේ වෙලාවේ අපේ පළමුවෙනි කාර්යය වන්නේ. ඊට පසුව තමයි තක්සේරු කාර්යය කරන නිලධාරින් හරහා නිවැරැදි තක්සේරුවක් ලබා ගැනීම අවශ්‍ය වන්නේ. ඒ නිවැරැදි තක්සේරුවෙන් පසුව, ජනතාවට වුණු පාඩුවට අදාළව -වගා බිම්වලට වෙන්න පුළුවන්, නිවෙස්වලට වෙන්න පුළුවන්, ව්‍යාපාරවලට වෙන්න පුළුවන්- වන්දි ලබා දෙන්න කටයුතු කරන්න කියලා නිලධාරින්ට අවශ්‍ය උපදෙස් දීලායි තිබෙන්නේ. ඒ උපදෙස් අනුව නිලධාරින් සෑම ගෙදරකටම, සෑම ආයතනයකටම ගිහිල්ලා තක්සේරු වටිනාකම් පිළිබඳ තොරතුරු ලබා ගනිමින් ඉන්නවා. අපි ඒ සියල්ලත් මේ වෙද්දී කරනවා. පාසල්වල කටයුතු යථා තත්ත්වයට පත් කරන්න ඕනෑ. විභාග නැවත පවත්වන්න පුළුවන් තත්ත්වය ඇති කරන්න ඕනෑ.

මම හිතන විධියට, අපට තවත් වගකීමක් තිබෙනවා. ඒක තමයි, පීඩාවට පත් ජනතාව හොඳ මානසිකත්වයෙන් තබන එක. අවතැන් වූ ජනතාව ඉන්න කොළොන්නාව ඇතුළු කඳවුරු කිහිපයකටම අපි ගියා. ඒ තැන්වලදී අපි දැක්කා, දරුවන්, කාන්තාවන්, පවුල් ජීවත් වෙන්නේ කොහොමද කියලා. අපි ඔවුන්ගේ මූලික සනීපාරක්ෂක කාරණා පිළිබඳව විමසා සිටියා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මනෝ උපදේශකවරු දෙදෙනෙක් ඉන්නවා. ආර්ථික සංවර්ධන නිලධාරි සහ ග්‍රාම නිලධාරි එක්ක එකතු වෙලා විවිධ වැඩසටහන් පවත්වලා, එම ජනතාවට ඇහුම්කන් දීලා, එම ජනතාවගේ මානසික සෞඛ්‍යය යහපත් තත්ත්වයට පත් කරන්න පුළුවන්. ඒ සඳහා අවශ්‍ය කරන දේවල් පවා අපි සකස් කරලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමියනි, කාලය අවසන්.

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)
මට තවත් විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

අපි විපක්ෂයටත් ආරාධනා කරනවා, අපේ පුංචි දරුවන්ගෙනුත් යමක් ඉගෙන ගන්න කියලා. එක තැනකදී මම දැක්කා, පුංචි දරුවන් සල්ලි එකතු කරපු කැට ගෙනැල්ලා අනතුරට පත්, විපතට පත් ජනතාවට ඒ මුදල් ලබා දෙනවා. ඒ විධියට රුපියලකින් වෙන්න පුළුවන්, තමන්ගේ වචනයකින් වෙන්න පුළුවන්, ශ්‍රමයෙන් වෙන්න පුළුවන් උපකාර කළ හැකි සියලු ජනතාව ආපදාවට පත් ජනතාව වෙත ගිහින් උපකාර කරනවා. දරුවන් ලබා දෙන ඒ පාඩම සියලු දෙනා ඉගෙන ගත්තා නම් හොඳයි කියන කාරණයත් මම මතක් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.04]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඇත්තටම මේ වෙලාව රට ඉතාම අවාසනාවන්ත තත්ත්වයකට මුහුණ දීලා තිබෙන වෙලාවක්. මේ ව්‍යසනයෙන් විපතට පත් වෙලා ඉන්නේ අපේම සහෝදර සහෝදරියන්. මේ ව්‍යසනයෙන් හානි විශාල ප්‍රමාණයක් සිදු වෙලා තිබෙනවා. අතුරුදහන් වීම් ද සිදු වෙලා තිබෙන බවක් කියනවා. මේ ව්‍යසනයෙන් ජීවිතක්ෂයට පත් වුණු ජනතාවගේ පවුල්වලට, දුකට පත් වුණු සියලු දෙනාට මුලින්ම අපේ කනගාටුව ප්‍රකාශ කර සිටිනවා. ඒ වාගේම, මෙහිදී විශාල කාර්යභාරයක් ඉෂ්ට කළා, අපේ ත්‍රිවිධ හමුදාවේ රණවිරුවන්, පොලීසිය, විශේෂ කාර්ය බලකාය, දිස්ත්‍රික් ලේකම්වරු, ප්‍රාදේශීය ලේකම්වරු, ග්‍රාම නිලධාරිවරු, සංවර්ධන නිලධාරින්, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර ඇතුළු නිලධාරින් සියලු දෙනා; ඒ වාගේම, පක්ෂ, පාට භේදයකින් තොරව ප්‍රාදේශීය සභාවල සභාපතිවරු, මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමන්ලා ඇතුළු බොහෝ දෙනා. ඒ වාගේම සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සිටින වෛද්‍යවරුන්, හෙද හෙදියන් ඇතුළුව සියලු ක්ෂේත්‍රවල නිලධාරින් දිවා රෑ නොබලා විපතට පත් අයට සහන සැලසීම සඳහා විශාල කාර්යභාරයක් ඉෂ්ට කළා. අපට ඒක අමතක කරන්න බැහැ. මහජන නියෝජිතයන් හැටියට අපි ඒ සියලු දෙනාට අපගේ ගෞරවය සහ ස්තුතිය පිරිනමන්න ඕනෑ.

ඒ වාගේම තමයි, මේ සිදුවීමෙන් එක පැත්තකින් නාය යෑම් නිසාත්, අනෙක් පැත්තෙන් ජල ගැලීම් නිසාත් බොහෝ පිරිසක් ව්‍යසනයට පත් වුණා. අපේ ප්‍රදේශය ගත්තාම දැදුරු ඔය ආශ්‍රිතව ජල ගැලීමක් සිදු වුණා කිව්වාට, දැදුරු ඔයේ ජලය පිරී ඉතිරී යාමක් නොවෙයි සිදු වුණේ. හැම දෙයක්ම වතුරට ගහගෙන ගියා. නිවාස, ගස් කොළන්, සතුන්, මිනිසුන් කියන ඔක්කෝම ගහගෙන යන තත්ත්වයක ඉතා විශාල ජල ගැල්මක් ඇති වුණේ. ඒ තත්ත්වය තුළ වෙනදාට වඩා විශාල හානිකර තත්ත්වයක් තමයි අද ඇති වෙලා තිබෙන්නේ.

මේ ව්‍යසනකාරී තත්ත්වය තුළ ඇතැම් අයට හානි වුණත්, එම ප්‍රදේශවලින් ටිකක් එහාට වෙන්න හිටපු අයට හානි වුණේ නැහැ. මෙහිදී අපි පැහැදිලිව කියන්න ඕනෑ, ඒ අය තමයි අර ව්‍යසනයට මුහුණ දුන් ගොඩක් අයගේ ජීවිත බේරා ගන්න මුලින්ම ඇවිල්ලා උදවු කර තිබුණේ කියන එක. ඒ වාගේම අපේ රටේම ජනතාව ආපදාවට පත් ජනතාවට උදවු කරමින්, විශාල සහයෝගයක් ලබා දුන්නා. අපි දකිනවා, එය අපේ රටේ ජනතාව තුළ තිබෙන ඉතාම හොඳ ගුණයක් බව. අන්න ඒ තත්ත්වය තුළ තමයි අපට යම් ප්‍රමාණයකින් හෝ ආපදාවට පත් ජනතාවගේ ජීවිත හානි අඩු කරගන්න පුළුවන් වුණේ. ඒක ඉතාම වැදගත්. ඒ නිසා එසේ උදවු කළ අයටත් අපේ ගෞරවය හිමි වෙන්න ඕනෑ.

අපි දකිනවා, මෙම ආපදා තත්ත්වය නිසා තවම දුරකථන වැඩ කරන්නේ නැති ගම්මාන ගණනාවක් තිබෙන බව. ඒ වාගේම එම ප්‍රදේශවලට යෑමට නොහැකි වෙලා තිබෙනවා, මාර්ග අවහිරතා නිසා. කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දොඩන්ගස්ලන්ද වාගේ ගම්මාන ගණනාවක් තිබෙනවා, ඒවාට තවම ළඟා වෙන්නවත් බැහැ. ඒ වාගේම මිරිස්සල, දුනුමාව, අඹතැන්න වාගේ ප්‍රදේශත් නාය ගිහිල්ලා. ඒ ප්‍රදේශවල ජනතාව හිර වෙලා ඉන්නවා. ඒ වාගේ තැන්වලට තවම කාටවත් යන්න බැරි තත්ත්වයක් තිබෙන්නේ. මේ වෙනකම් ඒ ප්‍රදේශවල දුරකථන වැඩ කරන්නේත් නැහැ. කුරුණෑගල නගරයෙන් ටිකක් එහාට වෙන්න තිබෙන සමහර පැතිවල ඊයේ වාගේ තමයි දුරකථන වැඩ කරන්න පටන් ගත්තේ. ඒක ඉතාම අවාසනාවන්ත තත්ත්වයක්. ඒ ප්‍රදේශවලට යන්න බයයි. මොකද, තවම ඒ ප්‍රදේශ නාය යනවා. ඒ නිසා ජනතාව පයින්වත් ඒ ප්‍රදේශවලට යන්න බය තත්ත්වයක් තිබෙන්නේ. සන්නිවේදන පහසුකම් අක්‍රිය වීම නිසා විශාල ගැටලු ගණනාවක් එවැනි ප්‍රදේශවල ඇති වුණා.

ඒ වාගේම මම කියන්න ඕනෑ, දැන් ඔය ඉදිරිපත් කරන සංඛ්‍යාලේඛන ගැන මට නම් කිසි විශ්වාසයක් නැති බව. මොකද, ඔය සංඛ්‍යාලේඛනවලින් ඉදිරිපත් කරන මරණ සංඛ්‍යාවට, අතුරුදහන් වූවන්ගේ සංඛ්‍යාවට සහ හානි වුණු සංඛ්‍යාවට වඩා විශාල ප්‍රමාණයක් මේ ව්‍යසනයට මුහුණ පා තිබෙනවා කියන එක මම පැහැදිලිවම කියන්න ඕනෑ. ඒ ප්‍රදේශවලට ගිහිල්ලා ඒ ගැන දැකපු පුද්ගලයෙකු හැටියටයි මම ඒ ගැන කියන්නේ. ඔය ඉදිරිපත් කරන සංඛ්‍යාලේඛනවල දැක්වෙන්නේ ඉතා සුළු සංඛ්‍යාවක්. තව තොරතුරු විශාල ප්‍රමාණයක් ලැබිලා නැහැ. මම හිතන විධියට, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ලැබෙන සංඛ්‍යාලේඛන තමයි ඔය ඉදිරිපත් කරන්නේ. නමුත් ඊට වඩා විශාල පිරිසක් මේ ව්‍යසනයෙන් මරණයට පත් වෙලා තිබෙනවා, ඒ වාගේම විශාල හානියක් සිදු වෙලා තිබෙනවා. තව සතියකින් විතර තමයි අපට ඒ සියලු තොරතුරු දැනගන්න ලැබෙන්නේ.

[ගරු ජේ.සී. අලවතුවල මහතා]

මේ වෙච්ච හානිය සම්බන්ධයෙන් කථා කිරීමේදී, අපට පැහැදිලි වුණු කාරණා කිහිපයක් මේ වෙලාවේ මම සඳහන් කරන්නම ඕනෑ. මේ ව්‍යසනයෙන් පසුව ඉතිරි වෙලා සිටින අයගේ ජීවිතවලට ඉදිරියේදී වග කියන්නේ කවුද? මේක ස්වාභාවික විපතක් තමයි. නමුත් මේ ව්‍යසනයට මුහුණ දුන් අයගේ ජීවිත මීට වඩා ප්‍රමාණයකින් රැකගන්න අපට අවස්ථාව තිබුණා. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 12වැනි දා තමයි මේ තත්ත්වය ගැන අපේ රටට මාධ්‍ය හරහා පැහැදිලි කර තිබෙන්නේ. ඒ වාගේම 20වැනි දා වාගේ වෙනකොට BBC, CNN වාර්තාවලත් සඳහන් වුණා, මිලිමීටර් 500ක පමණ වර්ෂාපතනයක් ඒ දිනවල ඇති වෙන්න පුළුවන් කියලා. මේ සිද්ධිය වුණේ නොවැම්බර් 27, 28 කියන දිනවල. එතකොට හොඳටම කාලය තිබුණා, මේ සිදුවුණු හානිය අවම කරගෙන, මීට වඩා ජීවිත බේරා ගන්නට.

අපි ආණ්ඩුවට චෝදනා කරනවා නොවෙයි. නමුත් මේ තත්ත්වය ගැන මුළු රටම පැහැදිලිවම දැනගන්න ඕනෑ. අපි අහන්න කැමැතියි, මේ සිද්ධිය ඇති වෙන්න පෙර, ආණ්ඩුව විසින් මේ සම්බන්ධව ගත් පියවර මොකක්ද කියලා. මේ ආපදා තත්ත්වය පිළිබඳව විශේෂයෙන්ම කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 12වැනි දා කළ ප්‍රකාශය සම්බන්ධයෙන් හෝ එම සිදුවීම ගැන ජාත්‍යන්තර මාධ්‍ය තුළ පළ වුණු අදහස් සම්බන්ධයෙන් අඩු ගණනේ කැබිනට් මණ්ඩලය තුළ සාකච්ඡාවක් ගන්න හෝ ඔබතුමන්ලාට පුළුවන් වුණාද? කැබිනට් මණ්ඩලය ඒ ගැන සාකච්ඡා කළාද? අපි පැහැදිලිව කියනවා, මේ සිද්ධිය වෙනකම් ගත් යම් ක්‍රියාමාර්ගයක් තිබෙනවා නම්, ඒ සම්බන්ධව අද දිනයේ හෝ මේ පාර්ලිමේන්තුවට ඇමතිවරයෙකු විසින් දැනුම් දෙන්න කියලා. දැන් ඇමතිවරුන් කථා කළා. නමුත් කවුරුවත් ඒ ගැන සඳහන් කළේ නැහැ. ඒකෙන් පැහැදිලි වන්නේ මේ ව්‍යසනය සම්බන්ධව නොසලකා හැරීම නිසා විශාල හානියක් සිද්ධ වුණා කියන කාරණයයි.

මෙතරම් ආපදාවක් සිදුවන්න බලපෑ එක හේතුවක් තමයි, ජලාශවල වතුර වැඩිවීම. උදාහරණයකට අපේ ප්‍රදේශය ගත්තොත්, දැදුරු ඔය කියන්නේ අපේ ප්‍රදේශයේ තිබෙන විශාල ජලාශයක්. සති දෙක තුනක් තිස්සේ වැහැලා මේ තත්ත්වය ඇති වනකොටත් දැදුරු ඔය ජලාශය පිරිලා තිබුණේ. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පසුගිය 12වැනි දා කළ ප්‍රකාශයත් එක්ක අපට සති දෙකක් තිස්සේ ඒ වතුර ප්‍රමාණය අඩු කර ගන්න ඕනෑ තරම් කාලය තිබුණා. නමුත් ඒ වතුර ප්‍රමාණය අඩු කර නොගත්තේ ඇයි? එහෙම අඩු කර නොගැනීම නිසා මොකක්ද සිද්ධ වුණේ? ජලාශයේ වාන් දොරටු සියල්ල එකවර විවෘත කිරීම නිසා දැදුරු ඔය ජලාශයට පහළින් පිහිටා තිබෙන නිකවැරටිය, හලාවත දක්වා ප්‍රදේශවලට ඉතිහාසයේ කවදාවත් නොවූ ආකාරයේ විශාල හානියක් වෙලා තිබෙනවා. ඒක සාමාන්‍ය ජල ගැලීමක් නොවෙයි. සතුන්, මිනිසුන් මෙන්ම දේපළ සියල්ලත් ගසාගෙන ගිහිල්ලා විශාල විනාශයක් සිදු වෙලා තිබෙනවා. අපි මුහුණ දුන් මේ අවාසනාවන්ත තත්ත්වය ස්වාභාවික විපතක් වුණාට පෙර සූදානමක් තිබුණා නම්, මේ සිදු වූ ජීවිත සහ දේපළ හානි ප්‍රමාණය විශාල වශයෙන් අවම කර ගන්න තිබුණා. ඒ තත්ත්වයම තමයි මම හිතන විධියට මහනුවර දිස්ත්‍රික්කයේ කොත්මලේ ජලාශය සම්බන්ධයෙන් ගත්තත් තිබෙන්නේ. ගම්පොළ නගරය සම්පූර්ණයෙන්ම යට වෙලා විනාශ වෙන්න හේතු වුණේ, මේ disaster එක වෙන්න කලින්, එහෙම නැත්නම් මේ කුණාටුව එන්න කලින් ඒ තත්ත්වය තේරුම් අරගෙන, ජලය කළමනාකරණය කරන්න කටයුතු නොකළ නිසා බව මම පැහැදිලිව කියන්න ඕනෑ.

ඒ වාගේම මේ සිද්ධීන් ඇති වුණු වෙලාවේත් ආපදා කළමනාකරණය සඳහා හදිසි නීතිය ප්‍රකාශයට පත් කරන්න කියලා අපි පාර්ලිමේන්තුවේදී කිව්වා. නමුත් ඒක කරන්නත් දින ගණනාවක් ගියා. ඊට පසුව හදිසි නීතිය ප්‍රකාශයට පත් කළා. මමත් පාර්ලිමේන්තුවේදී කිව්වා, හදිසි නීතිය ප්‍රකාශයට පත් කරලා, නිලධාරින්ට ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරන්න අවශ්‍ය නීතිමය තත්ත්වය සකස් කරලා දෙන්න කියලා. නමුත් අපි දැක්කා, ඊයේත් මහජන ආරක්ෂක නියෝජ්‍ය ඇමතිවරයා වන වටගල මහත්මයා කිව්වා, මේ හදිසි නීතිය අපි social mediaවලට, එහෙම නැත්නම් ආණ්ඩුවට විරුද්ධව යම් යම් කාරණා ඉදිරිපත් කරන මාධ්‍යවේදීන් සම්බන්ධව පාවිච්චි කරන්න යනවා කියලා. අපි ඒකට සම්පූර්ණයෙන් විරුද්ධයි. මොකද, අකරතැබ්බයට ලක් වුණු පුද්ගලයන් යථා තත්ත්වයට පත් කරන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ආධාර උපකාර කරන්න තමයි හදිසි නීතිය අවශ්‍යයි කියලා අපි ප්‍රකාශ කළේ. ඒ නිසා ආණ්ඩුව ඒක වැරදි විධියට පාවිච්චි කරන්න යනවා නම්, අපි ඒකට දැඩි ලෙස විරෝධය පළ කරනවාය කියන එකත් මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම අපි දන්නවා, මේ වනකොට මරණ ගණනාවක් සිද්ධ වෙලා තිබෙන බව. ආණ්ඩුව ප්‍රකාශ කරලා තිබෙනවා, ජීවිතක්ෂයට පත් අයෙක් වෙනුවෙන් රුපියල් ලක්ෂ 10ක් ගෙවනවා කියලා. මුදල්වලින් ජීවිතයක වටිනාකම මනින්න බැහැ. නමුත් ඒ මුදල තවත් වැඩි කරනවා නම් හොඳයි. මොකද, පවුලක ගෘහ මූලිකයා පස්වලට යටවෙලා මිය ගිහිල්ලා නම් ඒ දරුවන්ගේ ජීවිතය එතැනින් එහාට ගෙන යන්න ඊට වඩා වැඩි මුදලක් අත්‍යවශ්‍ය බව අපි පැහැදිලි කරන්න ඕනෑ. ඒ වාගේම අනෙක් කාරණය තමයි සමහර පුද්ගලයන් අතුරුදහන් වුණාය කියනවා. යුද්ධයකදී නම් අපි දන්නවා, අතුරුදහන් කිව්වාට missing person කෙනෙක් ආපහු එන්න පුළුවන් බව. නමුත් ගම තුළ ඉන්න හැම කෙනාම දන්නවා, මේ නාය යෑම නිසා මේ පුද්ගලයා පස්වලට යටවෙලා කියලා. ඉතින් ඒ පුද්ගලයා අතුරුදහන් කිව්වාම ඒ පුද්ගලයාගේ පවුලේ අයට ඒකෙන් ලොකු අසාධාරණයක් සිද්ධ වනවා. මොකද, මරණ සහතිකයක් ඉදිරිපත් කරන්න බැරි වනවා. ඒ සඳහා ලොකු කාලයක් යනවා. එතකොට ඒ පවුලට ලැබෙන්න තිබෙන දේවල්, අයිතිවාසිකම් ගණනාවක් නැති වනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
වන්දිවත් ගන්න හම්බ වෙන්නේ නැහැ.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ඒ වාගේ ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. ඉතින් ඒ සම්බන්ධව තිබෙන නීති වෙනස් කරන්න ඕනෑ නම්, අපි ලැහැස්තියි පාර්ලිමේන්තුවේදී ඒ සඳහා අපේ සහයෝගය ලබා දෙන්න. හෙට නොවෙයි අනිද්දා නැවත පාර්ලිමේන්තුව රැස් වෙනවා. ඒ නිසා ඒ කටයුතු කල් දමන්නේ නැතුව, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා ඒ නීති වෙනස් කරලා හරි අවශ්‍ය කටයුතු කරන්න. මොකද මේ යන විධිය බැලුවාම ඉස්සරහට ඔය අතුරුදහන් කියන ගණන ගොඩක් වැඩි වෙන්න පුළුවන්. ඒ නිසා ඒ පවුල්වල අයටත් අසාධාරණයක් සිදු නොවන්න, අතුරුදහන් වූ පුද්ගලයන්ගේ මරණ සහතිකත් ඉක්මනින් ලබා ගන්න පුළුවන් විධියේ වැඩ පිළිවෙළක් සකස් කරලා දෙනවා නම්, ඒක ඉතාම වැදගත් වනවා. ඒක කළ යුතු දෙයක් හැටියට අපි දකිනවා.

ඒ වාගේම නිවාස අහිමි වූ පිරිස බැලුවාම, සම්පූර්ණයෙන්ම නිවාස අහිමි වූ ගණන දැන් තිබෙන සංඛ්‍යාලේඛන අනුව 1,000ට අඩුයි. ඒක සම්පූර්ණයෙන්ම වැරදි සංඛ්‍යාලේඛනයක්. එම

සංඛ්‍යාව ඉස්සරහට තවත් වැඩි වෙයි. මොකද, මම දන්නා විධියට මාවතගම ආසනය ගත්තාම මේ වනකොට කඳු ගණනාවක් නාය ගිහිල්ලා තිබෙනවා. දොඩන්ගස්ලන්ද ගත්තත්, හිරියාල ගත්තත් ඒ වාගේ තමයි. මෙහිදී හානිය වෙන්නේ නාය ගිය නිවාසවලට විතරක් නොවෙයි. කන්දක් නාය ගිහිල්ලා ගෙවල් 10ක්, 15ක් පමණක් යට වුණාට ඒ මුළු කන්දම සෙලවීමට ලක් වෙලා, ඉරි තැළිලා, යටින් වතුර එන්න ගන්නවා. එතකොට ඒ කන්දේ තිබෙන අනෙක් ගෙවල්වලත් ජීවත් වෙන්න බැහැ. ඒ නිසා හානියට පත්වුණු නිවාස ගණන ඔය කියනවාට වඩා විශාල ගණනක් වෙන්න පුළුවන්.

අපේ ප්‍රදේශය ගත්තොත්, මම දකින විධියට එක ආසනයක නිවාස 150ක් විතර අලුතින් හදන්න සිදු වෙලා තිබෙනවා. මොකද, ඉරි ගිහිල්ලා තිබෙන ගෙවල්වලට ගිහිල්ලා ඒ අයට පදිංචි වෙන්න කියලා අපට කියන්න බැහැ. කාටවත් එහෙම කියන්න බැහැ. සමහර නිලධාරීන් කියනවා මම දැක්කා, මේවායේ දැන් ගිහිල්ලා ඉන්න පුළුවන් කියලා. එහෙම ඉන්න පුළුවන් තත්ත්වයක් නැහැ. මොකද, තව පොඩි වැස්සක් වැස්සොත්, එහෙම නැත්නම් පොඩි කාලයක් තුළ ඒවා ආපහු කඩාගෙන එන්න පුළුවන්. ඒ නිසා ජීවිත හානි වළක්වා ගන්න තමයි අපි බලන්න ඕනෑ. ඒ නිසා එවැනි නාය ගිය කඳුවල ඉන්න විශාල පිරිසකට නැවත ඒ කඳුවල ජීවත් වෙන්න පුළුවන් තත්ත්වයක් නැහැ. ඒ නිසා නිවාස හානි ගත්තාම කැඩිලා ගිය නිවාස විතරක් නොවෙයි, ජීවත් වෙන්න සුදුසු නැති තත්ත්වයේ තිබෙන නිවාස වෙනුවටත් අපි අලුත් නිවාස හදලා ඒ අයට පදිංචි වීම සඳහා ලබා දෙන්න අවශ්‍ය වෙනවා. ඒ වාගේම, ජල ගැල්මට හසු වුණු නිවාසත් සම්පූර්ණයෙන්ම ගසාගෙන ගිහිල්ලා තිබෙනවා. එම නිසා නැවත වතාවක් එතැන ගෙයක් හදන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා ඉඩම් සොයාගෙන ඒ ප්‍රදේශවල විශේෂයෙන්ම නිවාස අලුතින් සකස් කිරීමේදී ඔය කියන සංඛ්‍යාලේඛනවලට වඩා විශාල ගුණයකින් නිවාස ප්‍රමාණය වැඩි වෙනවා. ඒ සඳහා රජය ඇත්තටම සූදානම් වෙන්න ඕනෑ. කඩිනමින් ඒ සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න අවශ්‍යයි. ඒ වාගේම, අර්ධ හානි වුණු නිවාසත් විශාල වශයෙන් තිබෙනවා. ඒවාට ලබා දෙන වන්දිය සම්බන්ධයෙන් නිශ්චිත මුදලක් නැහැ. අපි ඒ මුදල් අනිවාර්යයෙන්ම ලබා දෙන්න ඕනෑ.

ඒ වාගේම තමයි, මේ ජල ගැල්මට හසුවීම නිසා නිවාසවල තිබුණු ඇඳුම් පැලඳුම්වල ඉඳලා තිබුණු හැම දෙයක්ම නැතිවෙලා තිබෙනවා. ඒවාට ගෙවන ක්‍රමයක් ගැන තවම සඳහනක් නැහැ. ළමයින්ගේ පොත් පත් ඇතුළු සියල්ලමත් විනාශ වෙලා තිබෙනවා. නැවත පදිංචිය සඳහා පවුලකට රුපියල් 10,000ක් දෙනවා කියලා කියනවා. ඒක ඇත්තටම තේරුමක් නැති දෙයක්. මේ වෙනකොටත් විපතට පත් වුණු මේ ජනතාව ජීවත් වෙන්නේ අසල්වැසි මිනිසුන්ගේ සහයෝගයෙන්. අපි ඒ බවත් ඇත්තටම මතක් කරන්න ඕනෑ. ඔවුන් මේ විපතට පත් ජනතාව වෙනුවෙන් විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් අලුතින් නීති-රීති සකස් කරලා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන්න. අපේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කිව්වා, අර පරිපූරකය යටතේ රුපියල් බිලියන 500ක් අරගෙන වියදම් කරන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවා කියලා. ඒ නිසා මේ දේවල් තියාගෙන ඉන්න එක නොවෙයි කරන්න ඕනෑ. මේ අසරණ වෙච්ච ජනතාව ජීවත් කරවන්න මේ මුදල් ලබා දෙන්න. ඒ සඳහා විපක්ෂයක් හැටියට අපේ සහාය දෙන්න පුළුවන් නම්, ඕනෑම එකකට අනුමැතිය දෙන්න අපි ලෑස්තියි. මොකද, ඒ දේවල් අපි අනිවාර්යයෙන්ම කළ යුතු දේවල් හැටියට මම දකිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට තව පොඩි කාලයක් දෙන්න. මේ කාරණයත් මම කියන්න ඕනෑ. විශේෂයෙන්ම කුඹුරු ගොවිතැන් කරපු ජනතාව නැවත ඒ වගාවන්ට යොමු කරවන්නත් අවශ්‍යයි. නමුත්, මේ වෙනකොට බොහොමයක් කුඹුරු සම්පූර්ණයෙන්ම සෝදාගෙන ගිහිල්ලා පස් ටික එළියට ගිහිල්ලා තිබෙන්නේ. ඒ අයට නැවත ඒ කුඹුර සකස් කර ගන්න නම් අඩුම වශයෙන් අක්කරයකට රුපියල් ලක්ෂ දෙකක්වත් දෙන්න ඕනෑ. සමහර කුඹුරු නැවත තිබූ තත්ත්වයට සකස් කර ගන්න ඊටත් වඩා වැඩි මුදලක් යනවා. කුඹුර අස්වද්දන්න නම් අඩුම ගණනේ රුපියල් ලක්ෂ දෙකක්වත් දෙන්න ඕනෑ. ඒ නිසා මේ තිබෙන තත්ත්වයන් වෙනස් කරලා, චක්‍රලේඛ වෙනස් කරලා මේ ජනතාව නැවත ජීවත් කරවන විධියේ වැඩ පිළිවෙළකට ආණ්ඩුව යන්න ඕනෑ. ජනතාව වෙනුවෙන් කරන මේ කාර්යයට විපක්ෂයක් හැටියට අපේ සම්පූර්ණ සහයෝගය ලබා දෙන්න අපි සූදානම් බව මේ වෙලාවේ මම මතක් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[பி.ப. 1.19]

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, இன்று எமது நாடு பாரிய அனர்த்தத்துக்கு முகங்கொடுத்திருக்கின்ற இந்தத் தறுவாயில், நூற்றுக்கணக்கான மக்கள் மாண்டிருக்கிறார்கள்; இன்னும் நூற்றுக்கணக்கானவர்கள் காணாமல் போயுள்ளார்கள்; பல இலட்சம் பேர் இடம்பெயர்ந்தும் பாதிப்புகளுக்குள்ளாகியும் இருக்கிறார்கள். இந்த அனர்த்தத்தில் உயிரிழந்த அனைவருக்கும் இந்த இடத்தில் எனது அஞ்சலியைச் செலுத்திக்கொள்ளுகின்றேன்.

இந்த நாடு இக்கட்டான நிலையில் இருக்கும்போது, நாட்டு மக்கள் என்ற ரீதியில் நாங்கள் ஒன்றாகச் சேர்ந்து பயணிக்கவேண்டும். அனர்த்தம் ஏற்பட்டிருக்கின்ற இந்தக் காலகட்டத்தில், பாகுபாடு காட்டுவதை நிறுத்தி, ஆட்சியைப் பிடிப்பதற்கு அல்லது வேறு சதித்திட்டங்களைச் செய்வதற்கு உடந்தையாக இருக்காமல், இந்த நாட்டு மக்களைப் பாதுகாக்க வேண்டிய கடமையும் பொறுப்பும் இந்த உயரிய சபையில் இருக்கின்ற அனைத்துப் பாராளுமன்ற உறுப்பினர்களுக்கும் இருக்கின்றது. இந்த இடத்தில் நாம் ஒருவரையொருவர் குற்றஞ்சாட்டாமல், எமது மக்களையும் பொருளாதாரத்தையும் நாட்டையும் பாதுகாத்துக்கொள்ள வேண்டும். இந்த இக்கட்டான நேரத்தில் அரச அதிகாரிகள் மிகவும் கடினமாக உழைத்துக்கொண்டு இருக்கிறார்கள்; அவர்கள் இரவு பகலாகத் தங்களால் இயன்ற வேலைத்திட்டங்களைச் செய்து வருகின்றார்கள். அவர்களுக்கான ஒத்துழைப்பையும் ஒத்தாசையையும் வழங்கவேண்டிய கடமையும் பொறுப்பும் எமக்கு இருக்கின்றது.

இந்த அனர்த்தத்தினால் எமது அம்பாறை மாவட்டத்தில் மட்டுமல்லாமல் அனைத்து இடங்களிலும் விவசாயிகள் மிகவும் பாதிக்கப்பட்டு இருக்கிறார்கள். விவசாயக் காணிகள், கால்நடைகள், ஏற்றுமதிப் பொருளாதாரம், இறக்குமதிப் பொருளாதாரம் எனப் பல்வேறு விடயங்களும் பாதிக்கப்பட்டிருக்கின்றது. பல்லாயிரம் பேர் வீடுகளை இழந்திருக்கிறார்கள். அம்பாறை மாவட்டத்தில் இருக்கின்ற

[ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා]

பல்லாயிரக்கணக்கான ஏக்கர் நெற்காணிகள் வெள்ள அனர்த்தத்தால் மிகவும் பாதிக்கப்பட்டு, விவசாயிகள் மிகவும் நஷ்டமடைந்த நிலையில் இருக்கிறார்கள். இந்த அடைமழையால் நெல் வயல்கள் வெள்ள நீரில் மூழ்கியது மட்டுமல்லாமல், வயல்களில் கூடுதலான களைகளும் வளர்ந்திருக்கின்றன. பண்ணையாளர்களின் மாடுகள்கூட இந்த வெள்ளத்தால் காவுகொள்ளப்பட்டு இருக்கின்றன. இப்படியான இக்கட்டான காலகட்டத்தில் இந்த மக்களின் வாழ்வாதாரத்தையும் வாழ்க்கையையும் பாதுகாக்கவேண்டிய கடமையும் பொறுப்பும் அரசுக்கு இருக்கின்றது. எனவே, அவர்களுக்கான நிவாரண உதவி என்பது மிகவும் அத்தியாவசியமான ஒன்றாக இருக்கின்றது. எனவே, இவர்கள் கொஞ்சம் பாதிக்கப்பட்டு இருக்கிறார்கள், அவர்கள் கூடுதலாகப் பாதிக்கப்பட்டு இருக்கிறார்கள் என்றில்லாமல், அனைவருக்கும் உரிய நிவாரண உதவிகளை அரசாங்கம் வழங்கவேண்டும்.

மலையகத்தில் மண்சரிவால் கூடுதலான உயிர்கள் இழக்கப்பட்டிருக்கின்றது. மலையகப் பகுதியில் உள்ளவர்கள்தான் இந்த அனர்த்தத்தால் கூடுதலாகப் பாதிக்கப்பட்டு இருக்கிறார்கள். அந்த மக்களுக்கு நாங்கள் எங்களால் இயன்ற அனைத்து நிவாரண உதவிகளையும் செய்யவேண்டும். ஏனெனில், இது வேண்டுமென்றே உருவாக்கப்பட்ட ஓர் அனர்த்தம் அல்ல, இயற்கையாக ஏற்பட்ட அனர்த்தம்! கடந்த காலங்களில் சுனாமி, சூறாவளி, 'கொவிட்' தொற்று எனப் பல அனர்த்தங்கள் ஏற்பட்டிருக்கின்றன. இப்படியான இயற்கை அனர்த்தங்களிலிருந்து எமது மக்களைப் பாதுகாத்துக்கொள்ள வேண்டும்; அதற்கான ஒத்துழைப்பையும் ஒத்தாசையையும் வழங்க வேண்டும்.

அதுமட்டுமன்றி, இந்த அனர்த்த காலத்திலும்கூட நாங்கள் சில திணைக்களங்கள் பற்றிய விடயங்களைக் கூறவேண்டி இருக்கின்றது. கடந்த 2025.07.19ஆம் திகதி நடத்தப்பட்ட Open Competitive Examination for Recruitment to Grade III of the Sri Lanka Inland Revenue Service - 2024/2025இன் பெறுபேறுகளின் அடிப்படையில், 104 பேர் அச்சேவைக்காகத் தெரிவுசெய்யப்பட்டிருக்கிறார்கள். இவர்கள் அனைவரும் சிங்களவர்கள்! அதில் எந்தவொரு சிறுபான்மை இனத்தவரும் - குறிப்பாக, தமிழர்களோ, முஸ்லிம்களோ - உள்வாங்கப்படவில்லை. இதனை நாங்கள் பாகுபாடான ஒரு விடயமாகவே பார்க்கின்றோம்.

இதில் தமிழர்களையும் தமிழ் பேசுபவர்களையும் உள்வாங்கவேண்டும். ஏனெனில், Tax Officers எங்களுடைய மக்களோடு தமிழ் மொழியில் communicationஐ மேற்கொள்ளக்கூடியவர்களாக இருக்கவேண்டும். இதனைக் கருத்திற்கொண்டு, நீங்கள் சிறுபான்மை இனத்தவர்களையும் இதில் உள்வாங்க வேண்டுமென இந்த உயரிய சபையில் கேட்டுக்கொள்ளுகின்றேன்.

அதுபோல், இயற்கை அனர்த்தம் ஏற்பட்டுத் தலைக்குமேல் வெள்ளநீர் செல்கின்ற இந்த இக்கட்டான நிலையில்கூட, நுண்கடன் நிறுவனத்தினர் இடுப்பளவு வெள்ளநீரில் நின்றவாறு கடனை அறவிட்டுக்கொண்டிருக்கிறார்கள். மக்கள் இக்கட்டான நிலையில், வறுமையோடும் கஷ்டமான நிலையிலும் இருக்கின்றபொழுது, இந்த நுண்கடன் நிறுவனத்தினர் அங்கு சென்று மனிதாபிமானமற்ற ரீதியில் தங்களது கடனை அறவிட்டுக்கொண்டு இருக்கிறார்கள். இது எவ்வளவு துர்ப்பாக்கியமான நிலை! இந்தச் செயற்பாடு நிறுத்தப்படவேண்டும். எனவே, கடன் மற்றும் ஏனைய கட்டணங்களை அறவிடுதல் தற்காலிகமாக நிறுத்திவைக்கப்பட வேண்டுமென நான் இந்தச் சபையில் கேட்டுக்கொள்ளுகின்றேன். இன்று இந்த நாடு ஏற்றுமதிமூலம் கூடுதலான அந்நியச் செலாவணியை ஈட்டவேண்டிய காலகட்டத்திலே இருக்கின்றது. குறிப்பாக, இந்த நாட்டின் பொருளாதாரத்தை உயர்த்த வேண்டும். அதற்குத் தேவையான அனைத்து விடயங்களையும் நாங்கள் செய்ய வேண்டியவர்களாக இருக்கின்றோம்.

அம்பாறை மாவட்டத்திலுள்ள அக்கரைப்பற்றின் ஆலையடிவேம்பில் 'சதொச' நிறுவனம் ஒன்று இருந்தது; ஒரு வருடத்துக்கு முன்னர் அது அங்குள்ள பெரிய முதலாளிமாரால் இல்லாமல் செய்யப்பட்டது. அனர்த்தம் ஏற்பட்டிருக்கின்ற இந்த நிலையில் அந்த 'சதொச' நிறுவனம் அங்கு இல்லாததன் அருமை விளங்குகிறது. தயவுசெய்து கௌரவ அமைச்சர் அவர்கள் அந்தப் பிரதேசத்தில் மீளவும் 'சதொச' நிறுவனத்தை அமைக்கவேண்டும். ஏனெனில், அதன்மூலம் பல்லாயிரக் கணக்கான மக்கள் நன்மை அடைந்தார்கள். நான் இந்த விடயத்தைப் பல தடவை அமைச்சரிடமும் கூறியிருக்கிறேன். அதனை அமைத்துத் தருவதாக அவர் கூறினாலும், இற்றைவரை அதற்குரிய எந்த விடயமும் நடைபெறவில்லை என்பதை நான் இந்த இடத்தில் கூற விரும்புகின்றேன்.

மேலும், விவசாயிகளைப் பாதுகாக்கின்ற அதேநேரம் நீர்ப்பாசனத் திட்டங்களையும் சரியான முறையில் மேற்கொள்ள வேண்டும். இந்த முறைகூட மேலதிக நீரால் ஆலையடிவேம்பு பிரதேசம் உட்படப் பல பிரதேசங்கள் பாதிக்கப்பட்டன. ஒருங்கிணைக்கப்பட்ட விவசாயத் திட்டத்தினூடாக கஞ்சிகுடிச்சாறு குளம், ரூபஸ் குளம், சாகாமம் குளம் போன்றவற்றின் ஊடாக மேலதிக நீரை divert பண்ணக்கூடிய வகையில் வாய்க்கால் ஒன்றை அமைப்பதன்மூலம் பல்லாயிரக்கணக்கான ஏக்கர் வயல் நிலங்களில் - கிட்டத்தட்ட 5,000 ஏக்கரில் இரண்டு போகமும் பயிர்ச்செய்கையை மேற்கொள்ளக்கூடிய வாய்ப்பு ஏற்படும். இது இந்த நாட்டின் பொருளாதாரத்துக்கு, குறிப்பாக நெல் ஏற்றுமதிக்கு உறுதுணையாக இருக்கும். எனவே, இதற்கு நீங்கள் national planning ஊடாக approval பெற்றுத் தரவேண்டும். National planning ஊடாக இந்தத் திட்டங்களை வலுப்படுத்தும்பொழுது, ஏற்றுமதிப் பொருளாதாரத்தை மேற்கொள்ள முடிவதோடு, மேலதிக நீரால் ஏற்படுகின்ற அனர்த்தத்திலிருந்தும் பாதுகாத்துக்கொள்ள முடியும். எனவே, நான் இங்கு குறிப்பிட்ட விடயங்களைத் தயவுசெய்து நீங்கள் முன்னெடுக்க வேண்டுமெனக் கேட்டு, எனது உரையை முடித்துக்கொள்ளுகின்றேன்.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**

(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)

(The Hon. Deputy Chairperson)

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.29]

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)

(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අද අමාත්‍යාංශ හතරක වැය ශීර්ෂ පිළිබඳව විවාද කරනවා. පසුගිය දිනවල ඇති වුණු හදිසි ආපදා තත්ත්වය පිළිබඳව මම මුලින්ම කථා කරන්න ඕනෑ. පසුගිය

26, 27, 28, 29 හා 30 යන දිනවල ඇති වූ ආපදා තත්ත්වය නිසා විපතට පත් වුණු ජනතාව බොහෝයි. එම ව්‍යසනයෙන් මිය ගිය අය වෙනුවෙන් ගරු ජනාධිපතිතුමා වෙනුවෙන් මා මේ අවස්ථාවේදී ශෝකය පළ කර සිටිනවා. මේ ආපදා තත්ත්වය දිස්ත්‍රික්ක 22කට බලපෑවා.

පසුගිය 26වැනි දා උදේ ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජාතික ආපදා කළමනාකරණ සභාව පාර්ලිමේන්තුවේ කාරක සභා කාමරයකදී රැස් වුණා. මේ හදිසි ආපදා තත්ත්වය සැලකිල්ලට ගෙන සියලු සේවා නියෝජනය කරන නිලධාරින් එම රැස්වීමට කැඳවා අවශ්‍ය උපදෙස් ඔවුන්ට ලබා දුන්නා. විශේෂයෙන්ම මම කියන්න ඕනෑ, ආපදා කළමනාකරණ පනතට අනුව හදිසි අවස්ථා තත්ත්වයකදී කළ යුතු සියලු දේවල් මෙහිදී ක්‍රියාත්මක වුණු බව. අවශ්‍ය දේවල් අපි ක්‍රියාත්මක කළේ නැහැ කිව්වාට, එය සම්පූර්ණයෙන් අසත්‍යයක්. කල්පනාවෙන්, අවබෝධයක් ඇතිව ගරු ජනාධිපතිතුමා විසින් අවශ්‍ය උපදෙස් ලබා දුන්නා. ඒ වාගේම ආරක්ෂක අමාත්‍යාංශය විසින් ත්‍රිවිධ හමුදාවන්ට සහ අදාළ සියලු ආයතනවලට අවශ්‍ය උපදෙස් ලබා දුන්නා.

මට මතක විධියට පසුගිය ජූලි 17වැනි දා -දිනය පොඩ්ඩක් එහාට මෙහාට වෙන්නත් පුළුවන්- විපක්ෂයේ මන්ත්‍රීවරුන් සහ නියෝජිතයින් සමඟ ජාතික ආපදා කළමනාකරණ සභාව ජනාධිපති ලේකම් කාර්යාලයේදී රැස්වුණා. ඒ සභාව කැඳෙව්වේ අවුරුදු 7කට පස්සේ. 2018දී කැඳෙව්වාට පස්සේ ජාතික ආපදා කළමනාකරණ සභාව කැඳවා තිබුණේ නැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. ඒකෙන්ම හිතාගන්න පුළුවන්, ඔය කථා කරන අයවලුන්ගේ තත්ත්වය කොහොමද කියලා.

අපි 26වැනි දා උදේ යුද හමුදාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් විශේෂ ආපදා මෙහෙයුම් මැදිරියක් යුද හමුදා මූලස්ථානයේ ස්ථාපිත කළා. අපේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ හදිසි මෙහෙයුම් මැදිරියක් - Emergency Operations Centre එකක් - ක්‍රියාත්මක වන ගමන්, NDRSC - National Disaster Relief Services Centre - එකේ ඉන්න අය සමඟ, ඒ වාගේම විශේෂයෙන්ම ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සහ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු සියලුදෙනා සමඟ ඒ ක්‍රියාන්විත මැදිරිය පිහිටෙව්වේ 26වැනි දා. ඒ අවස්ථාවේ ත්‍රිවිධ හමුදාව, පොලීසිය, විශේෂ කාර්ය බලකාය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, සිවිල් ආරක්ෂක බලකාය වෙත ආරක්ෂක අමාත්‍යාංශය විසින් විශේෂ උපදෙස් ලබා දුන්නා, විශේෂ වැඩසටහන් සඳහා ස්ථානගත වෙන්න. ඒ වාගේම ආණ්ඩුකාරවරුන්, දිස්ත්‍රික් ලේකම්වරුන්, ඒ ඒ දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ විශේෂයෙන්ම ඒ ඒ දිස්ත්‍රික්කවල දේශපාලන අධිකාරියත් එයට සම්බන්ධ වෙලා මේ කටයුතු සිද්ධ කරගෙන ආවා.

විශේෂයෙන්ම ත්‍රිවිධ හමුදාවේ නිලධාරින් තම ජීවිත නොතකා විශේෂ මෙහෙයුම් රාශියක් මෙහිදී කළා. ඒ වාගේම ජීවිත ගලවා ගැනීම් සහ අනෙකුත් ආපදා කළමනාකරණ කටයුතු සඳහා ත්‍රිවිධ හමුදා සාමාජිකයින් සම්බන්ධ වනකොට ඒ ත්‍රිවිධ හමුදා සාමාජිකයින්ගේ පවුල්වල සාමාජිකයින්ද ආපදාවලට ලක් වෙලා, අනතුරුවලට ලක් වෙලා, ඔවුන්ගේත් නිවාස ඇතුළු දේපළවලට හානි වෙලා තිබුණා. එසේ තිබියදී නිවාඩුවක්වත් ඉල්ලන්නේ නැතුව, ඒ ගැන කිසිම කථාවක්වත් නොකර, ආපදාවට පත් වූ ජනතාවගේ අවශ්‍යතා ගැන සිතා, රටේ අවශ්‍යතාව හදිසි අවස්ථා තත්ත්වයක් නිසා ඔවුන් ඒ වෙනුවෙන් කටයුතු කළා.

මම මේ අවස්ථාවේ සිහිපත් කරන්න ඕනෑ, හෙලිකොප්ටරයක් අනතුරකට ලක් වෙලා අවාසනාවන්ත ලෙස මිය ගිය ගුවන් හමුදා නියමුවා සහ වලෙයි ප්‍රදේශයේ කළපුවේ මෝය කට පුළුල් කිරීමට ගොස් දැනට සොයා ගන්න බැරිව ඉන්න නාවික හමුදාවේ නිලධාරින් පස්දෙනාව. ඒ වාගේම යුද හමුදාවට සහ පොලීසියට ඔවුන් ඉටු කළ සහ ඉටු කරන වැඩකටයුතු සම්බන්ධයෙනුත් අපේ කෘතඥතාව පුද කරනවා. හෙලිකොප්ටර් අනතුරෙන් මිය ගිය ඒ ගුවන් හමුදා නියමුවා වෙනුවෙනුත් අපේ ශෝකය මේ අවස්ථාවේ පළ කර සිටිනවා. අපට තිබෙන්නේත් සීමිත හෙලිකොප්ටර් ප්‍රමාණයක්. Bell 212 වර්ගයේ හෙලිකොප්ටර් දෙකක් සහ MI-17 වර්ගයේ හෙලිකොප්ටර් දෙකක් පමණයි අපට තිබෙන්නේ.

ගරු ජනාධිපතිතුමා, එහෙම නැත්නම් වැදගත් පුද්ගලයින් වෙනුවෙන් හෙලිකොප්ටර් වෙන් කරලා තිබෙනවා. ඒ දවස්වල ආපදාවක් වුණාම ඒ ජනාධිපතිවරු පාවිච්චි කළේ ඒ හෙලිකොප්ටර්. මේ සැරේ ඒවා ජනාධිපතිතුමා පාවිච්චි කළේ නැහැ. ඒ නිසා ඒවාත් මේ රටේ ආපදාවට ලක් වෙච්ච ජනතාව වෙනුවෙන් වෙන් කරලා, ඒ අවශ්‍ය වැඩකටයුතු කළා. විශේෂයෙන්ම 27වැනි දා උදේ ජනාධිපතිතුමා වාගේම ආරක්ෂක ලේකම්තුමාත් මැදිහත් වෙලා ඉන්දියානු මහ කොමසාරිස්තුමාට සහ පාකිස්තානයේ මහ කොමසාරිස්තුමාට කථා කරලා, ඒ දවස්වල ලංකාවට පැමිණිලා තිබුණු "INS Vikrant" කියන මහා නෞකාවේ තිබුණු හෙලිකොප්ටර් පවා මේ මෙහෙයුම්වලට පාවිච්චි කරලා, ආපදාවට පත් වෙලා හිටපු ජනතාවගේ දිවි ගලවා ගන්න අවශ්‍ය කටයුතු කළා. ඒ සම්බන්ධයෙන් අපි ඉන්දියාවේ සහ පාකිස්තානයේ මහ කොමසාරිස්වරුන්ට ස්තූතිවන්ත වෙනවා. විශේෂයෙන් නිකවැරටිය බස් අනතුර සිද්ධ වෙච්ච වෙලාවේදී වාගේම දිවයිනේ කඳුකර ප්‍රදේශයේ ඇති වෙච්ච තත්ත්වයන් මත ආපදාවට ලක් වෙච්ච ජනතාවගේ ජීවිත ගලවා ගැනීම සඳහා ඒ හෙලිකොප්ටර් යොදාගෙන අවශ්‍ය කටයුතු කළා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, 26වැනි දා උදේ මේ ආපදා තත්ත්වය මතු වුණාට පස්සේ ගරු ජනාධිපතිතුමා එක්ක අපි දුරකථනයෙන් ඒ පිළිබඳව සාකච්ඡා කළා. 26වැනි දා පාර්ලිමේන්තුවේ රැස්වීමට සහභාගි වෙලා දවල්ම දිවයිනේ ඇති වෙච්ච ආපදා තත්ත්වය ගැන සොයා බලන්න මහජන ආරක්ෂක අමාත්‍යතුමා මහනුවරට ගියා. මම බදුල්ල දිස්ත්‍රික්කයට ගියා. බදුල්ල, මහියංගනය, පස්සර, නුවරඑළිය, වලපනේ, ගම්පොළ වාගේ ප්‍රදේශවල ආපදාවට ලක් වෙලා තිබුණු ස්ථානවලට විකල්ප මාර්ග සොයා ගෙන යන්න යුද, ගුවන්, නාවික, පොලීසිය, සිවිල් ආරක්ෂක බලඇණිය මහත් වෙහෙසක් දැරුවා. රාත්‍රී කාලයේ ඇති වුණු වැස්ස නිසා කඳු කඩා වැටිලා පාරවල්වල යන්න බැරි තත්ත්වයක් තිබුණා. නමුත්, 28වැනි දා ශ්‍රී ලංකා යුද්ධ හමුදා විශේෂ බලකායේ කමාන්ඩෝ හට පිරිස් කොහොම හරි ගුවනින් වලපනේට, රම්බොඩට සහ ඊට පස්සේ ගම්පොලට ගොඩබැස්සුවා. ඒ ස්ථාන තුනටම 28වැනි දා වෙනකොට කමාන්ඩෝ හට පිරිස් ගොඩබස්සලා යන්න බැරි ස්ථානවලට ගියා. ඒ අනුව විශේෂයෙන්ම නුවරඑළිය, ගම්පොල, වලපනේ යන ප්‍රදේශවලට ගියා. මහියංගනය ඉස්පිරිතාලයත් ජලයෙන් යට වුණා. පස්සර පාරේ යන්න බැරි ස්ථානවලට පවා යුද හමුදාවේ අය ගියා. ඒ වාගේම මහියංගනය ඉස්පිරිතාලයටත් ගිහිල්ලා අධ්‍යක්ෂතුමා හමුවෙලා ඒ සඳහා අවශ්‍ය සියලු කටයුතු කළා. ඒ අවස්ථාව වනකොට තිබුණු බෝට්ටු, ධීවර ජනතාවගේ බෝට්ටු, ආම්පන්න, මහ ජනතාවගේ තිබුණු අනෙකුත් උපකරණ ඔක්කොම එකතු කරගෙන තමයි මේ ජීවිත බේරා ගන්න අවශ්‍ය වැඩ කටයුතු කළේ. අපේ ප්‍රමුඛත්වය වෙලා තිබුණේ ආපදාවට පත් වෙලා හිටපු ජනතාවගේ ජීවිත බේරා ගැනීමයි. අපි මේ වනකොට ආපදාවට පත් හැම තැනකටම වාගේ ගිහිල්ලා තිබෙනවා. නොගිය තැනක් නැහැ. ඉතා අසීරුවෙන් ඒ සෑම ස්ථානයකටම අපි ගිහිල්ලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, සුනාමි ව්‍යසනය සහ කොවිඩ් වසංගතය ආවාට පස්සේ, කොහොමද ආපදා තත්ත්වය කළමනාකරණය කර ගත්තේ කියලා අපි දන්නවා. කෙසෙල් ගෙඩිවල නම ගහලා තිබෙනවා මමත් දැක්කා. ඒ ගැන මටත් ලජ්ජයි, හිටපු හමුදා නිලධාරියෙක් හැටියට. මෙන්න මෙහෙමයි

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා]

අපේ රටේ දේශපාලනඥයෝ වැඩ කළේ. ඒ කියන්නේ, සුනාමි ව්‍යසනයෙන් පස්සේ ඒ වෙනුවෙන් ලැබුණු මුදල් තාත්තලා, පුතාලා, බාප්පලා, අම්මලා ඔක්කෝම එකතු වෙලා නැති කළා. එහෙම කට්ටිය තමයි අද ඇවිල්ලා කියන්නේ, රටේ මෙවැනි ව්‍යසනයක් වෙලා තිබෙනවා, මෙන්න මේ විධියේ දේවල් කරන්න කියලා. යම්කිසි අවස්ථාවක ආගම අනතුරේ වැටුණා නම් මේ ඔක්කෝම පාරට එන්න ඉන්නවා. නමුත්, මේ රට විනාශ වෙලා, ජනතාව අනතුරට පත්ව අසරණ වෙලා ඉන්න වෙලාවේ ඒ ගැන සොයන්න කවුරුවත් නැහැ. බදුල්ල දිස්ත්‍රික්කයේ, ඌව පළාතේ හැම තැනකටම වාගේ අපි ගියා. නමුත්, මේ විපක්ෂයේ කවුරුවත් හිටියේ නැහැ.

ගරු විපක්ෂ නායකතුමා ඩොප්ලර් රේඩාර් යන්ත්‍රය ගැන කථා කළා. මේ උපකරණයෙන් බොහෝ ප්‍රයෝජන තිබෙනවා. එම උපකරණයෙන් වායුගෝලය සම්බන්ධ බොහෝ සාධක ලබා ගැනීමට පුළුවන්. මෙම උපකරණය කාලගුණික අනාවැකි කියන්න ඉතා වැදගත් වෙනවා. නමුත්, මෙම උපකරණය 2006දී තමයි ගෙනැල්ලා තිබුණේ. ඒ, මීට අවුරුදු 19කට කලින්. නමුත්, 2011 වනතුරුත් ඒ කටයුත්ත කර ගන්න බැරි වුණා. නැවත මේ උපකරණ දෙකක් ජපන් රජයෙන් ගෙන්වා ගන්න හැදුවා. විපක්ෂ නායකතුමා කිව්වා වාගේ ගොන්ගල කන්දේ ඩොප්ලර් රේඩාර් යන්ත්‍ර ස්ථාපනය කරන්න තීරණය කළා. ඒ වෙනුවෙන් ඩොලර් මිලියන 513ක් වෙන් වුණා. ඒ, 2017 වර්ෂයේදී. 2021දී තමයි ඒ කටයුතු අවසන් කරන්න තිබුණේ. නමුත්, ඒ කටයුත්ත කරලා නැහැ. වියදම් කරලා තිබෙන්නේ රුපියල් 370,000යි. ඒකෙන්ම තේරෙනවා, කොච්චර අකර්මණ්‍ය වෙලා ද කියන එක. මේ ව්‍යසනය ඇති වූ වෙලාවේදී මුළුමහත් ජනතාවම ජාති, ආගම් භේද පැත්තක තියලා මේ රට ගොඩගන්න ඉදිරියට ඇවිල්ලා තිබෙනවා; ලෝකයත් ඉදිරියට ඇවිල්ලා තිබෙනවා.

ඔබතුමන්ලා බලාගෙන ඉන්න, අපි නම් ඉන්නේ මේ ජනතාවත් එක්ක. මිනිස්සුන්ට තිබෙන ප්‍රශ්න, පීඩන, අවශ්‍යතා ගැන හොඳ අවබෝධයක් තිබෙනවා, විශේෂයෙන්ම ගරු ජනාධිපතිතුමා ඇතුළු කැබිනට් මණ්ඩලයට, මන්ත්‍රීවරුන්ට, - අපේ ආණ්ඩුවට - ප්‍රාදේශීය මට්ටමේ ඉන්න හැම දෙනාටම. ඒ කටයුතු ඉටු කර දෙන්න අපි බැඳිලා ඉන්නවා. අපි ඒ වෙනුවෙන් වග වෙනවා, වග කියනවා. ඒ වාගේම ලැබෙන ආධාර, මුදල් වියදම් කරන විධිය විනිවිදභාවයකින් අපි පෙන්වනවා. අපේ ජනතාව හරිම ශ්‍රේෂ්ඨයි. විශේෂයෙන්ම ජාති භේදයක් නැතුව ඔවුන් විපතක් වුණාම එකමුතු වෙනවා. භය වෙන්න එපා, අපි සියලු කටයුතු කරලා, ජනතාවට සාධාරණයක් කරලා ඔවුන් ඉන්න තත්ත්වයෙන් ගොඩ ගන්නවා.

26වැනි දා උදේ අපි මෙහෙයුම් මධ්‍යස්ථානය ස්ථාපිත කළාට පස්සේ, Hon. Deputy Chairperson, the Tri Forces Commanders were called in by the Executive and were given the necessary strategic directions after analysing the changing situations and getting updates. Strategic decision-making was also wisely done and exercised. National emergency requirements had been very well coordinated and evaluation from strategic level to the tactical level has been done and will be done in the weeks to come, and we are there to protect you all. Thank you very much.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු කිංස් නෙල්සන් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கிங்ஸ் நெல்சன் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. KINS NELSON took the Chair.*

[අ.භා. 1.40]

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)

මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

රටක්, ජාතියක් විධියට දැවැන්ත ව්‍යසනයකට මුහුණ දීලා තිබෙන වෙලාවක්, මේ. ඒ හේතුවෙන් ජීවිත ගණනාවක් අහිමි වෙලා තිබෙනවා. ඒ පවුල්වල අයට අපේ ශෝකය ප්‍රකාශ කරන්නත් මා මෙය අවස්ථාවක් කර ගන්නවා. ඒ වාගේම තමයි, මේ ආපදා තත්ත්වය හේතුවෙන් විශාල පිරිසක් අවතැන් වෙලා ඉන්නවා. මම හිතන විධියට, පවුල් වශයෙන් ලක්ෂ 4කට වැඩි ප්‍රමාණයක් මේ ස්වභාවික ව්‍යසනයට මුහුණ දුන්නා. පුද්ගලයින් විධියට ගත්තොත්, ලක්ෂ 15කට වැඩි ප්‍රමාණයක් මේ ව්‍යසනයට මුහුණ දුන්නා. ඒ වාගේම තමයි දේපළ, ව්‍යාපාර, පාසල්, රෝහල්, කර්මාන්තශාලා, ගොවි ගම්මාන, ධීවර කර්මාන්තය, ව්‍යවසායකයින් විශාල ප්‍රමාණයක් හානියට පත් වුණා. මේ ව්‍යසනයට මුහුණ දෙන්න පෙර ඒ සම්බන්ධයෙන් සූදානමක් තිබුණාද, නැද්ද කියන කාරණය පිළිබඳව අපි පසුව සාකච්ඡා කරමු. මම හිතන විධියට, අද ඒකට වෙලාව නොවෙයි. මොකද, ආපදාවට මුහුණ දීලා ඉන්න ජනතාව තමන්ගේ ජීවිතය ආරක්ෂා කර ගන්න, තමන්ගේ දේපළ ආරක්ෂා කර ගන්න මේ වෙනකොට විශාල සටනක නියැළිලා ඉන්නවා.

අද මත දෙකක් තිබෙනවා. යම් පාර්ශ්වයකින් ආණ්ඩුවට චෝදනාවක් එල්ල වෙනවා, ආණ්ඩුව මීට පෙර මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වුණා නම් හොඳයි කියලා. ආණ්ඩුවෙන් චෝදනාවක් එල්ල වෙනවා, නිලධාරින් මේ වෙනුවෙන් ක්‍රියාත්මක වුණේ නැහැ කියලා. අපි දැක්කා, ආණ්ඩුවේ නියෝජ්‍ය අමාත්‍යවරයෙකු නිලධාරින් පිට මේ වැරැද්ද පටවන්න උත්සාහ කරනවා. හැබැයි, ආණ්ඩුව පැත්තටත් චෝදනාව එල්ල වෙනවා. ඒ නිසා මම හිතනවා, ගරු කථානායකතුමා මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාවක් පත් කළ යුතුය කියලා. ඒක අර හොරාගේ අම්මාගෙන් පේන අහනවා වාගේම කන්ටේනර් පන්නපු කාරණය පිළිබඳව සොයා බැලීම සඳහා පත් කළ විශේෂ කාරක සභාවක් වාගේ එකක් නොවිය යුතුයි. විනිවිදභාවයකින් යුතුව, අවංකව කොතැනද වැරදුණේ කියන කාරණය පිළිබඳව හොයන්න පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාවක් පත් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි මේ ඉන්නේ අය වැය විවාදයක. තවදුරටත් ඔබ ඉදිරිපත් කරපු අය වැය ලේඛනය වලංගුද, නැද්ද කියන කාරණය අපට තිබෙනවා. පසුගිය වසරේ ඉදිරිපත් කළ අය වැය ලේඛනයෙනුත් සියයට 20ක්, 30ක් තමයි ඔබ යථාර්ථයක් බවට පත් කළේ. හැබැයි, සියයට 50ක්වත් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කර ගන්න බැරි වෙච්ච ආණ්ඩුවකට මෙවැනි දැවැන්ත ව්‍යසනයක් හමුවේ මේ අය වැයත් එක්ක ඉස්සරහට යන්න පුළුවන්ද, බැරිද කියන ප්‍රශ්නය තිබෙනවා. ආණ්ඩු පාර්ශ්වයෙන්ම කියනවා, ඩොලර් බිලියන 6ක, 7ක වාගේ

ප්‍රමාණයක හානියක් සිද්ධ වෙලා තිබෙනවා කියලා. ඒ වාගේම තමයි සමස්ත ආර්ථිකයට සියයට 3ක, සියයට 5ක බලපෑමක් සිද්ධ වනවා. තවත් පැත්තකින් මේ ගම් බිම් නැවත වතාවක් ගොඩ නඟන්න, මේ මිනිස්සුන්ගේ ජීවිත නැවත වතාවක් සාමාන්‍ය තත්ත්වයට ගෙනෙන්න, දරුවන් ටික පාසලට යවන්න අමතර වියදම් දරන්න වෙනවා. අපි දකිනවා, අදටත් ආණ්ඩුව පැත්තෙන් ජනාධිපති අරමුදලෙන් යම් මුදලක් දෙන්න කථා කරනවා. තවත් පැත්තකින් ගෙවල් ශුද්ධ පවිත්‍ර කරන්න යම් මුදලක් දෙන්න කථා කරනවා. ඒවා හොඳ දේවල්. හැබැයි, මේ ආපදාවන් සඳහා මුහුණ දෙන්න පුළුවන් ජාතික වැඩ පිළිවෙළක් එක්ක මේ අය වැය ලේඛනය නැවත සකස් කළ යුතුයි, නැත්නම් revise කළ යුතුයි කියලා අපි විශ්වාස කරනවා.

ඒ වාගේම අපි ඔබෙන් ඉල්ලනවා, IMF එකත් එක්ක සාකච්ඡා කරන්න කියලා. අද තිබෙන තත්ත්වය IMF එකට දැනුම් දෙන්න. මේ තිබෙන බදු ක්‍රමය ඇතුළේ කටයුතු කරන මේ ව්‍යවසායකයෝ, ව්‍යාපාරිකයෝ; මහජනතාව ගංවතුර සහ නායයෑම්වලටත් මුහුණ දීලා තිබෙන මොහොතේ නැවත වතාවක් IMF එකේ condition එක්ක අසීමිත බදු බරකට යට වෙනවා නම්, ඔවුන්ට ඔවුන්ගේ ජීවිත නැවත ගොඩනඟා ගැනීමේදී දැවැන්ත අපහසුතාවලට මුහුණ දෙන්න සිදු වෙනවා. එම නිසා ඒ පිළිබඳවත් ඔබේ අවධානය යොමු කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් පැත්තකින් මේ රාජ්‍ය යන්ත්‍රණය පිළිබඳව විශ්වාසයක් ඇති විය යුතුයි. අපි දකිනවා, අද පණිවුඩය හරියට යන්නේ නැහැ කියලා. රාජ්‍ය ආයතන, අමාත්‍යාංශ අතරින් එන පණිවුඩ එකිනෙකට පරස්පර විරෝධියි. ඍජුවම, එක සැලැස්මකට යන්නේ නැහැ. ඔබ ක්‍රියාත්මක වීමට පරක්කු වුණු කාරණය, ආපදා තත්ත්වයක් විධියට නම් කරන්න පරක්කු වුණු කාරණා, ජලාශවල වතුර ටික බස්සවන්න තිබුණාද, නැද්ද කියන කාරණාව, නායයන ප්‍රදේශවල ජනතාව කල් වේලා ඇතිව ඉවත් කරන්න තිබුණාද, නැද්ද කියන කාරණාව - ඒවා - ගැන අපි පසුව කථා කරමු. හැබැයි, අඩු ගාණේ ආපදාවට ලක් වුණාට පස්සේ ඒ පණිවුඩය මිනිසුන්ට යවන්න, සහන සේවාවලට උදව් කරන්න, ඒ අයට හරි තැන පෙන්වන්න, කොහොමද කරන්න ඕනෑ කියලා කියන්න, මොකක්ද වෙන්න ඕනෑ කියලා කියන්න, ජාත්‍යන්තර සංවිධාන, රටවල් අපට උදව් කරන්න මැදිහත් වෙනකොට ඒ අයව guide කරන්න ආණ්ඩුවේ යන්ත්‍රණය ලැහැස්තිද, නැද්ද කියන ප්‍රශ්නය අපට තිබෙනවා. අදටත් ආණ්ඩුවේ යන්ත්‍රණය ඒකට පූර්ණ කාලීනව ලැහැස්ති නැහැ. ලැහැස්ති නැති වෙන්න වෙන හේතු ඇති, ඔබේ පරිපාලන ක්‍රමවේදය ඇතුළේ. ඔබේ පරිපාලන ක්‍රමවේදය ගැන, ඔබ හිතන දේ ගැන ඔබට විශ්වාසයක් ඇති. හැබැයි, ඒක අපේ රටේ රාජ්‍ය යන්ත්‍රණය සක්‍රිය කරන්න ගැළපෙනවාද, නැද්ද කියන ප්‍රශ්නය තිබෙනවා. ඔබට දේශපාලනික වශයෙන් පසුගිය ආණ්ඩු පිළිබඳව විවේචන ඇති. හැබැයි, 2020දී මෙවැනිම කුණාටුවක් ලංකාවට එනවා කියලා දැනුම් දුන්නාම ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාගේ ආණ්ඩුව ඒකට මුහුණ දෙන්න සූදානම් වුණු ආකාරය පිළිබඳව පොඩ්ඩක් අධ්‍යයනය කරන්න. ඔහු ඒකට ලැහැස්ති වුණේ කොහොමද, ආණ්ඩුව ඒකට මුහුණ දෙන්න ලැහැස්ති වුණේ කොහොමද කියන කාරණය පිළිබඳව ඔබ අධ්‍යයනය කරන්න. එහෙම අධ්‍යයනය කරලා ඒවායින් හොඳ දේවල් ගන්නවා කියන එක වැරැද්දක් නොවෙයි. අද සමහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රාදේශීය ලේකම්වරු නැහැ. වලපනේ කියන්නේ වැඩියෙන්ම ආපදාවට ලක් වුණු ප්‍රදේශයක්. වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ප්‍රාදේශීය ලේකම්වරයෙක් නැහැ. ඉතින් කොහොමද, ඒ මිනිසුන්ට සහන ටික දෙන්නේ?

අද කෘෂි කර්මාන්තය ගැන කථා කරනවා. හැම දේටම ලේසිම දේ වාගේ, ආණ්ඩුව කියනවා "අපි පිටින් එළවලු ගෙනෙමු" කියලා. ඔබේ න්‍යාය ඒක නම් පිටින් ගෙන්වා ගන්න. දැන් ආණ්ඩුව කියනවා, අස්වැන්නෙන් සියයට 70ක් විනාශ වෙලා කියලා. ගොවි සංවිධාන කියනවා, සියයට 30යි කියලා. හැබැයි, ජනාධිපතිවරයා කියනවා, දත්ත නැහැ, ඒ නිසා කවුද ඇත්ත කියන්නේ කියලා සොයන්න කියලා. නමුත් අඩුම ගණනේ මේ වෙනකොට නුවරඑළිය, බදුල්ල, බණ්ඩාරවෙල වාගේ ප්‍රදේශවල තිබෙන එළවලු ටික හෝ තිබෙන පලතුරු ටික හෝ අනෙක් ප්‍රදේශවලට ගෙනයන්න වැඩ පිළිවෙළක් ඔබතුමන්නාන්සේලා හදලා තිබෙනවාද? හදලා නැත්නම් හදන්න. අද මේ ක්‍රියාවලිය මැද මාෆියාවක් හැදිලා තිබෙනවා. මැද ඉන්න කට්ටිය අසීමිත ලාභ ලබන -සියයට 200ක ලාභ ලබන- තැනකට පත් වෙලා තිබෙනවා. හැබැයි, ගොවියාට ඒකේ ලාභය යන්නේ නැහැ. ගොවියා තමයි ආපදාවට මුහුණ දෙන්නේ. ලාභය ගන්නේ වෙන කෙනෙක්. අද ආණ්ඩුව මේ වෙනුවෙන් මැදිහත් වෙන්න ඕනෑ. ආණ්ඩුව විකල්පය විධියට, "අපි දැන් මාෆියාව පැන් පහරින් අයින් කරනවා" වාගේ කථාවක් මේ කියන්න හදන්නේ. පිටින් එළවලු ගේමු කියලා කියනවා. හැබැයි, අපේ ගොවි මහත්වරුන්ගේ කොරටුවලින් කඩපු එළවලු තිබෙනවා, උගුලපු ඒවා තිබෙනවා. ඒ ටිකවත් නගරවලට ගේන්න ඔබතුමන්නාන්සේලාගේ වැඩ පිළිවෙළ මොකක්ද, ඔබ තමුන්නාන්සේලා ඒ සඳහා ක්‍රියාත්මක වෙන්නේ නැත්තේ ඇයි කියන කාරණය අපට අහන්න වෙනවා.

ඒ වාගේම අපි ඔබතමුන්නාන්සේලාගෙන් තවත් ඉල්ලීමක් කරනවා. අපි දන්නවා, ගම්වල ජනතාව අසීමිත පීඩනයකින් ඉන්නේ. ජීවිත අහිමි වෙලා තිබෙනවා; තමන්ගේ දරුවෝ පස්වලට යට වෙලා තිබෙනවා; දෙමව්පියෝ නැතිවෙලා තිබෙනවා; දේපළ අහිමි වෙලා තිබෙනවා. වෛද්‍ය කාර්ය මණ්ඩල අද අසීමිත සේවාවක් කරනවා. එදා ඔබ රණ විරුවා, රණ විරුවෙක් විධියට නොදැක්කත්, අදවත් ඔබ රණ විරුවා, රණ විරුවෙක් විධියට දකීවි කියලා මම හිතනවා. හලාවත රෝහලේ, වලපනේ, නුවරඑළියේ රෝහල්වල වෛද්‍යවරු තමන්ගේ ජීවිත ගැන නොතකා තමයි ඒ මිනිස්සුන්ගේ ජීවිත බේරා ගන්න කටයුතු කරන්නේ. ඉතින්, මේ අය ගැනත් ඔබේ අවධානය යොමු කරන්න කියන ඉල්ලීම අපි කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ ජනතාවගේ පීඩනය ඔවුන් පිට කරනවා. ඒ පීඩනය පිට කරන්නේ ජනාධිපතිතුමාට බැණලාද, ආණ්ඩුවට බැණලාද, මැති ඇමතිවරුන්ට බැණලාද, විපක්ෂයට බැණලාද, නිලධාරින්ට බැණලාද කියන එක නොවෙයි බලන්න ඕනෑ. ඒ මිනිස්සු අවංකව, දැවැන්ත පීඩනයක ඉන්නේ. හැබැයි, ඔබතුමන්ලාගේ විසඳුම මොකක්ද? ඔබතුමන්ලා දන්නේ එක දෙයයි. ඒ තමයි යම්කිසි කෙනෙක් තමන්ගේ පීඩනය පිට කළොත් ඔහුව අල්ලලා හිරේ දමන එක. ආණ්ඩුවේම ඇමතිවරු කියනවා, හදිසි නීතිය ඇතුළේ ක්‍රියාත්මක වෙන්න ඕනෑ ආකාරය. ඉතින්, ඔය හදිසි නීතිය තිබෙනකොට සමාජ මාධ්‍යයෙන් ජනාධිපතිතුමාගේ හිත රිදෙන්න වචනයක් කියපු කෙනෙක්ව කුදලාගෙන ගිහිල්ලා හිරේ දමන්න පුළුවන් නම්, ආපදා තත්ත්වය යටතේ අර පස් කන්දක් නාය ගිහිල්ලා, අසීමිත ජල කඳක් ඇවිල්ලා, නැති වෙන ජීවිත බේරා ගන්න ඒ ආකාරයට ඔබට ක්‍රියාත්මක වෙන්න බැරි වුණේ ඇයි කියලා පොඩ්ඩක් හිතන්න. ඇයි බැරි වුණේ, ඒ ජීවිත ටික බේරා ගන්න? ජනාධිපතිවරයාගේ හිත රිදෙන්න මොනවා හරි කියපු කෙනෙක්ව අල්ලා ගෙන ගිහිල්ලා හිරේ දමන්න පුළුවන්; ඒකට ආණ්ඩුව ලැහැස්තියි. ඒ සඳහා ඇමතිවරු උපදෙසුත් දෙනවා, කරන විධිය ගැන. හැබැයි, අහිංසක මිනිස්සුන්ගේ ජීවිත බේරා ගන්න ඔබට බැරි වුණේ ඇයි? ඒ ගැන ඔබතමුන්නාන්සේලා කල්පනා කරන්න කියන ඉල්ලීම අපි කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
මට තව තත්පර 30ක් දෙන්න.

දේශපාලනය අපට අදාළ නැහැ. මේකෙදි හරි කවුද, වැරදි කවුද, කවුද වගකීම් පැහැර හැරියේ කියන ඒවා ගැන අපි පස්සේ කථා කරමු. අදත් අපි ඔබෙන් ඉල්ලන්නේ, කරුණාකරලා මේ අහිංසක මිනිස්සුන්ගේ ජීවිත ආරක්ෂා කරන්න, දේපළ ආරක්ෂා කරන්න, ඔවුන්ට තුන්වේල කන්න දෙන්න කටයුතු කරන්න කියලා. බත් පැකට් එකක් දීලා අත්සනක් ගහගන්න සංස්කෘතියෙන් දැන්වත් පොඩ්ඩක් අයින් වෙන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බත් පැකට් එකක් දීලා අත්සනක් ගහගෙන එනවා. ඒ තත්ත්වයෙන් අයින් වෙන්න. ලූනු ටිකටයි, අල ගෙඩියටයි නිලධාරින්ගේ පස්සේ එළවන එක නවත්වන්න. ඒ ආපදාවට පත් වුණු මිනිස්සුන්ට තුන් වේල කන්න දෙන්න, ව්‍යවසායකයින්ට නැවත වතාවක් වැඩ ටික පටන් ගන්න කටයුතු සලස්වා දෙන්න. ගම් බිම්වලට යන්න. ඉස්පිරිතාවලට බෙහෙත් ටික දීලා ඒ ජනතාව යථා තත්ත්වයට ගෙනෙන්න කටයුතු කරන්න කියන ඉල්ලීම අපි කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුජිත් සංජය පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.51]

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම වැදගත් අමාත්‍යාංශ කීපයක වැය ශීර්ෂ විවාදයට ගන්නා අවස්ථාවේ ඒ සම්බන්ධව අදහස් දක්වන්න පෙර මම කාරණයක් කිව යුතුයි.

අපි දන්නවා, මේ රටේ පසුගිය දවස්වල ඇති වුණු දැඩි ව්‍යවසනකාරී තත්ත්වය තුළ අපේ රටේ ජනතාවගෙන් 1,000කට, 1,500කට ආසන්න සංඛ්‍යාවක් මිය ගිහින් තිබෙන බව. ඒ වාගේම පුද්ගලයින් ලක්ෂ 15ක විතර ප්‍රමාණයක් අවතැන් වෙලා තිබෙනවා. ඒ මිය ගිය අය වෙනුවෙනුත්, අවතැන් වුණු අය වෙනුවෙනුත් අපේ කනගාටුව මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආපදාව සම්බන්ධයෙන් ඇති රජයේ දත්ත කෙසේ වෙතත්, අපට දැන ගන්න ලැබුණු විදියට 1,500ක් විතර මිය ගොස් තිබෙනවා, ඒ වාගේම ලක්ෂ 10ක, 15ක විතර ප්‍රමාණයක් අවතැන් වෙලා තිබෙනවා. අපි දන්නවා, හුඟක් වෙලාවට මේ අවස්ථාවේදී අපේ රටේ ජනතාවගේ, විවිධ දේශපාලන නායකයින්ගේ, නොයෙක් දෙනාගේ අදහස වෙලා තිබෙන්නේ මේ සම්බන්ධව පෙර සිටම කඩිනම් අවධානයක් යොමු කළ යුතුව තිබුණා කියන එකයි. මොකද, සති දෙකකට විතර ඉස්සෙල්ලා විශේෂයෙන්ම කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවත්, විදේශ රටවල මේ සම්බන්ධයෙන් තිබෙන ආයතනත් ලංකාවට මේ වාගේ ව්‍යසන තත්ත්වයක් ඇති වෙනවා කියලා අනතුරු ඇඟවීම් කළා. ඒ අවස්ථානුකූලව රජය මූලික වශයෙන් වැඩකටයුතු ආරම්භ කළා නම්, අවශ්‍ය ආයතන ටික දැනුවත් කරලා මේ තත්ත්වයට මුහුණ දීමට පූර්ව සූදානමක් ඇති කළා නම් මේ ව්‍යසන තත්ත්වය යම්තාක් දුරට අඩු කර ගන්න පුළුවන්කම තිබුණා කියන එක තමයි අද හුඟ දෙනෙකුගේ මතය වෙලා තිබෙන්නේ. නමුත්, ඒ අඩුපාඩුකම් දැන් සිද්ධ වෙලා අවසානයි. ජීවිත හානි විශාල ප්‍රමාණයක්, විශාල පිරිසක් අවතැන් වීමත් අද සිද්ධ වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අයගේ ජීවිත යථා තත්ත්වයට පත් කරන්න, රට පෙර තිබුණු තත්ත්වයට ගෙන එන්නට මේ ආණ්ඩුවට විශාල වැඩ කොටසක් කරන්න තිබෙනවා. මම දන්නේ නැහැ, ආණ්ඩුව තවදුරටත් මේ සම්බන්ධව වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කටයුතු කරනවාද කියලා. ඒ වාගේම සියලුදෙනා ඒක රාශි කරලා, අනෙකුත් පක්ෂත් ඒක රාශි කර ගෙන මේ වැඩ පිළිවෙළ කරන්නේ කොහොමද, මේ සඳහා අවශ්‍ය කරන මුදල් ප්‍රතිපාදන හොයා ගෙන මේ රටේ ජන ජීවිත යථා තත්ත්වයට පත් කරන්නේ කොහොමද කියන එක ගැන යම්කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවාද කියන එක ගැන අපට ප්‍රශ්නයක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වනකොට අවතැන් කඳවුරුවල දහස් ගණනක් ඉන්න බව අපි දන්නවා. ඒ අවතැන් කඳවුරුවල සිටින, ගංවතුරෙන් තම නිවාසවලට හානියක් සිදු වී නොමැති අයට නම් යම්කිසි අවස්ථාවක යම්කිසි සහනයක් තිබෙනවා. මොකද, ආධාර මුදලක් ලබා දුන්නොත්, ඒ අයගේ නිවාස කඩිනමින් පිළිසකර කර ගන්න පුළුවන්කම ලැබුණොත්, ඒ අයට නැවත වරක් ගෙවල්වලට යන්න පුළුවන්. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අවතැන් කඳවුරුවල ජීවත් වන, අනාථ වී ඉන්න අයගෙන් සියයට 50ක් විතර අවදානම් කලාපවල පදිංචිව හිටපු නිසා, ඒ ස්ථානවල තවදුරටත් නාය යෑමේ අවදානම පවතින නිසා තමයි මේ වන කොටත් එම අවතැන් කඳවුරුවල ඉන්නේ. ඒ අයට ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ඒ අයට ගෙවල් පිළිසකර කරගෙන යන්න පුළුවන්කමක් නැහැ. මොකද, ඒ අයගේ ගෙවල්වලට අලාභ හානි සිද්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම රජය පැත්තෙන් ඒ අයට අවසර ලබා දීලාත් නැහැ, නැවත වරක් ඒ හිටපු තැන්වලම පදිංචියට ගිහිල්ලා අවදානම් තත්ත්වයට පත් වෙන්න. ඒ අය සම්බන්ධව ආණ්ඩුව අනුගමනය කරන ක්‍රියා මාර්ගය මොකක්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධව පරීක්ෂණයක්, නිරීක්ෂණයක්, විමර්ශනයක් කරන්න අවශ්‍ය වෙනවා. ගරු ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමාත් සභාවේ සිටින මේ අවස්ථාවේ මා කියන්නේ මේ ක්‍රියාමාර්ග කඩිනමින් ගන්න කියලායි.

නිලධාරින්ගේ හිඟයක් තිබෙන බවකුත් කියනවා. විශේෂයෙන් ආපදා තත්ත්වයන් සම්බන්ධව සොයා බලන්න, භූ විද්‍යා දැනුම තිබෙන, ඒ පිළිබඳ නිරීක්ෂණය කරන්න හැකියාව තිබෙන නිලධාරින් ඉන්නේ සීමිත සංඛ්‍යාවක් නිසා ඉහත කී කටයුතු සඳහා දීර්ඝ කාලයක් ගතවන තත්ත්වයක් ඇති වනවා. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඒකයි අප ඉල්ලා සිටින්නේ, නාය යාමේ අවදානමට ලක් වුණු, අධිඅවදානම් කලාප ලෙස හඳුනා ගත්තු තැන් තිබෙනවා නම්, ඒවා සම්බන්ධව විශේෂයෙන් අවධානය යොමු කරලා එකී අවදානම් තත්ත්වයන් කඩිනමින් හඳුනා ගන්න කටයුතු කරන්න කියලා. එසේ කටයුතු කළොත්, අපේ ජනතාව නැවත පදිංචි කරවීම සම්බන්ධව යම්කිසි ක්‍රියා මාර්ගයක් ගන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මා දන්නා තරමින් නම්, අවදානම් තත්ත්වය හරියාකාරව හඳුනා ගත්තොත් දැනට අවතැන් කඳවුරුවල සිටින සියයට 50ක් විතර වාගේ නැවත වරක් පදිංචි කරවන්න පුළුවන්කම ලැබේවි. අනෙක් අයට තමයි ඉදිරි

කාලයේදී ඉඩ කඩම් ටික සොයා දීලා, ගෙවල් හදන්න ආධාර මුදලක් ලබා දීලා ඒ අය නැවත ස්ථානගත කරන්න අවශ්‍ය කටයුතු කරන්න වෙන්නේ. රජය පැත්තෙන් ඔබතුමන්ලා කඩිනමින් මේ පරීක්ෂණ, සමීක්ෂණ සිදු කරලා අවදානම් තත්ත්වය හරියට හඳුනා ගත්තොත් මේ ප්‍රශ්නයෙන් සියයට 50ක් විතර විසඳාගන්න ඔබතුමන්ලාට අවස්ථාව තිබෙනවා කියන එකත් මම මේ අවස්ථාවේ සඳහන් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා සඳහන් කර තිබෙනවා, වියළි සලාකයට අමතරව ගංවතුර නිසා සහ නාය යාම් හෝ වෙනත් හේතුවක් නිසා අවතැන් කඳවුරුවල සිට ගෙවල්වලට යන අයට තමන්ගේ ගෙවල් ටික පිළිසකර කර ගන්න රුපියල් 10,000 සිට රුපියල් 25,000 දක්වා මුදලක් ලබා දෙනවා කියලා. ඊට අමතරව තවත් ලිපියක් ඇවිල්ලා තිබෙනවා මම දැක්කා. ඒක නීත්‍යනුකූලව නිකුත් කළ චක්‍රලේඛයක්ද, ලිපියක්ද කියන එක ගැන අපේ ජනතාව සමහර වෙලාවට විමසීම් කරනවා. එතැනදී ඒ අය අහන්නේ ඒ මුදල් ලබා දෙන ක්‍රමවේදය ගැනයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දැනට නිලධාරින්ට තිබෙන කාර්ය බහුලත්වය සහ පාරවල් කැඩිලා තිබීම හේතුවෙන් යන්න එන්න තිබෙන අපහසුතා නිසා ජනතාවට සිදු වෙලා තිබෙන අලාභ හානිය හඳුනා ගන්න පුළුවන්කමක් ලැබිලා නැහැ; සිදු වෙලා තිබෙන හානිය ගැන තක්සේරු කර ගන්න පුළුවන්කමක් ලැබිලා නැහැ; ගෙවල් කැඩිලා තිබෙන එක ගැන සොයන්න පුළුවන් වෙලා නැහැ. ඒ වාගේම, ඒ අයගේ පෞද්ගලික බඩු බාහිරාදියට ද විශාල වශයෙන් අලාභ හානි වෙලා තිබෙනවා. ඉතින්, ඒවා සම්බන්ධව කොයි ආකාරයටද තක්සේරු කරන්නේ? අපට පුද්ගලයෙකු කියන දේ ඒ ආකාරයෙන්ම පිළිගන්න පුළුවන්කමක් නැහැ නේ. නිලධාරින් නරකක් කරන්නේ නැති වෙයි. ඉතින්, මම නම් උපදෙස් දුන්නේ මේ තිබෙන තත්ත්වය අනිවාර්යයෙන් තමන්ගේ දුරකථනයෙන් හෝ ඡායාරූපගත කර ගන්න කියලායි. ඒවා සම්බන්ධව ඔබතුමන්ලාත් යම්කිසි විමසීමක් කරන්න. ගංවතුරට යට වෙච්ච කට්ටිය තමන්ගේ ගෙවල් පිළිසකර කරගෙන ගියත්, ඒ අයගේ බඩු බාහිරාදියට විශාල වශයෙන් හානි වෙලා තිබෙනවා කියලා අපි දන්නවා. ඒගොල්ලන්ට වන්දි ලබා දෙන්නේ කොහොමද කියන එක සම්බන්ධවත් යම්කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න. "ඔහොම තමයි කියන්නේ. අපට මේවාට වන්දි මුදලක් ලබා දෙයිද, ඒක කොයි විධියට වෙයිද, අපේ කැඩුණු බිත්ති හදලා දෙයිද, වහලය හදලා දෙයිද කියලා අපි දන්නේ නැහැ. අපේ washing machine එකට හානි වෙලා තිබෙනවා, ශීතකරණයට -fridge එකට- අලාභ හානි වෙලා තිබෙනවා, රූපවාහිනියට අලාභ හානි වෙලා තිබෙනවා, මේවා සම්බන්ධව යම්කිසි මුදලක් ලබා ගන්න පුළුවන් වෙයිද දන්නේ නැහැ" කියලායි ඒ හැමෝම වාගේ කියන්නේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මා ඉල්ලා සිටින්නේ මේවා වචනයට පමණක් සීමා කරන්නේ නැතිව කටයුතු කරන්න කියලායි. මොකද, ඒ ජනතාව බොහොම අසරණ තත්ත්වයට පත් වෙලායි ඉන්නේ. බත් පැකට් එක, කෑම වේල ලබා දුන්නාට, වියළි සලාකය ලබා දුන්නාට ඒගොල්ලන්ගේ ජන ජීවිතය ආපහු ගොඩ නඟන්නේ කොහොමද කියන එක ගැන ලොකු ගැටලු සහගත තත්ත්වයක් තිබෙනවා. ඒ බව මම මේ අවස්ථාවේදී විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වතුකරයේ ජනතාවත් බෙහෙවින් අසරණ වෙලා ඉන්නවා. විශේෂයෙන්ම අපේ ගම්මානවල ඉන්න ජනතාව ගැන තමයි අපි හුඟක් වෙලාවට කථා කරන්නේ. ආපදාවලට ලක් වෙච්ච අයට සහන සලසන කොට ආධාර, මුදල්, සලාක ආදිය වැඩි හරියක්ම යන්නේ ගම්මානවල තිබෙන කඳවුරුවලටයි. නමුත් ආපදාවට ලක් නොවුණත් විවිධ දුෂ්කරතා සහිත වතු ආශ්‍රිත ගම්මාන තිබෙනවා. උදාහරණයක් හැටියට යටියන්තොට ප්‍රදේශයේ කන්දල්ඕය සහ නාගස්තැන්න කියන වතු දෙක ගැන අපි දන්නවා. ඒ වාගේම නුවරඑළිය ප්‍රදේශයේත්, වලපනේ, රිළගහ රාගල පැත්තේත් තවත් වතු ආශ්‍රිත ගම්මාන රාශියක් තිබෙනවා. ඒ වාගේම තවත් වතු රාශියක් තිබෙනවා. ඒගොල්ලන්ට හානියක් වෙලා නැහැ. ඒගොල්ලන්ගේ ලැයිම් කාමර, නිවාස හොඳ තත්ත්වයක තිබෙනවා. නමුත් ඒගොල්ලන්ට ජීවිකාව කරගෙන යන්න පුළුවන්කමක් නැහැ; යන්න එන්න විධියක් නැහැ; බඩුවක් මුට්ටුවක් ගන්න පුළුවන්කමක් නැහැ. යටියන්තොට ප්‍රදේශයේ තිබෙන වතු දෙක ගැන මම පෞද්ගලිකවම දන්නවා. මම අද උදේත් ඒ ප්‍රාදේශීය ලේකම්තුමියට කථා කළා. කථා කරලා කිව්වේ, "ඒ අයට ආපදාවක් වෙලා නැති වුණත්, ඒ කියන්නේ වහලවල් ගිහිල්ලා, ගෙවල් කඩාගෙන ගිහිල්ලා නැති වුණත් ජීවිකාව කරගෙන යන්න බැරි වීම ආදියත් ආපදාවක්" කියලායි. ඒ කියන්නේ තමන්ට අවශ්‍ය දේ ගන්න පුළුවන්කමක් නැත්නම්, යන්න එන්න පුළුවන්කමක් නැත්නම්, මාර්ග පහසුකමක් නැත්නම්, කොහොමද ඒගොල්ලන් ජීවත් වෙන්නේ, කොහොමද, බඩුවක් මුට්ටුවක් ගන්නේ? ඒ නිසා ගරු ඇමතිතුමනි, බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙන්න මේ ප්‍රදේශය කෙරෙහි අවධානය යොමු කරලා කටයුතු කරන්න. විශේෂයෙන්ම ඒ ප්‍රදේශය බොහොම දුෂ්කර ප්‍රදේශයක්. නාවලපිටියටත්, යටියන්තොටටත් මායිම්වයි තිබෙන්නේ, නාගස්තැන්න වත්තත්, කන්දල්ඕය වත්තත්. ඒ වතුවල ජනතාවට යම්කිසි ආහාර ද්‍රව්‍ය ටිකක්; වියළි සලාක ටිකක් ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලාත් අපි මේ අවස්ථාවේදී යෝජනා කරනවා. මම මේ සම්බන්ධව දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය ගැනත් කථා කරන්න තිබෙන නිසා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වතුවල ජනතාවට හානි සිද්ධ වුණා වාගේම තේ කර්මාන්තශාලාවල ව්‍යාපාරිකයන්ටත් නොයෙකුත් ආකාරයේ අපහසුතා ඇති වී තිබෙනවා. මොකද අපි දන්නවා, අපේ පැතිවල ඉන්න අයට දැන් මාර්ග පහසුකම් නැති නිසා, ඒ වාගේම අලාභ හානි සිද්ධ වෙලා තිබෙන නිසා තමන්ගේ ජීවිකාව කරගෙන යන්න; දලු ටික ප්‍රවාහනය කර ගන්න හැකියාවක් නැහැ කියලා. ඒ දලු ටික ප්‍රවාහනය කර ගන්න බැරි වනකොට තේ කර්මාන්තශාලා ටික පවත්වාගෙන යන්න බැහැ. සමහර තේ කර්මාන්තශාලා තිබෙන පැතිවල බිඳ වැටුණු විදුලිය සම්බන්ධතාව තවම හදා ගන්න හැකි වෙලා නැහැ. විදුලිය නැතිව ඒ තේ කර්මාන්තශාලා ටික පවත්වාගෙන යන්න හැකියාවක් නැති තත්ත්වයක් තිබෙන්නේ. ඒ නිසා මේවා ගැනත් කඩිනමින් සොයා බලා ඒ පැත්තෙන් ඒ අයටත් යම්කිසි සහනයක් ලබා දෙන්න කටයුතු කරන්න කියා මම මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කථාව කරන්න ඉස්සෙල්ලා මා දන්නා, හිතවත් තේ අපනයනකරුවෙක් මට කථා කළා. එතුමන්ලාගේ තේ ගබඩා සංකීර්ණ පිහිටා තිබෙන්නේ වැල්ලම්පිටිය, කොළොන්නාව වාගේ පහත් බිම්වල. මේ තත්ත්වය බලපා තිබෙන්නේ තේ කර්මාන්තයට අදාළ අපනයනකරුවන්ට විතරක් නොවෙයි. අනෙක් අපනයනකරුවන්ටත් මෙය බලපානවා ඇති; යම්කිසි අලාභ හානි සිද්ධ වෙලා ඇති. සමහර හානිවලට රක්ෂණයෙන් වන්දි ගන්න පුළුවන් වෙයිද, බැරි වෙයිද කියන්න පුළුවන්කමක් නැහැ. දැනට ඒගොල්ලන්ට ලොකු අලාභ හානියක් සිදු වෙලා තිබෙනවා. ඔබතුමන්ලාගේ වන්දි ලබා දීමේ ක්‍රියාදාමය තුළ යම්කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා ඒ අය වෙනුවෙනුත් යම්කිසි වන්දියක් ලබා දීමේ කටයුත්තක් ක්‍රියාත්මක කරන්න කියා මම ඉල්ලා සිටිනවා. මොකද, ඒගොල්ලෝ මෙතෙක් කල් රටට ලොකු විදේශ විනිමයක් ලබා දෙන්න කැපවීමක් කරපු අය.

[ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා]

ඒ අපනයනකරුවන් නිරන්තරයෙන් මතක් කළ කරුණක් තිබෙනවා. ඒ, SVAT එක ගැනයි. මොකද, පසුගිය කාල සීමාව තුළ SVAT එක අය කරන්න කටයුතු කළා. මා හිතන හැටියට, අපනයනකරුවෝ හැමදෙනාම ඒකට විරුද්ධත්වය පළ කළා. මොකද, ඒගොල්ලන්ගේ මුදල් මාස ගණන් රඳවා තියාගන්න පුළුවන්කමක් නැහැ. එහෙම වුණොත් අපේ අපනයන ක්‍රියාදාමයට යම්කිසි බාධා පැමිණෙනවා කියන එක ගැන නොයෙකුත් ආකාරයේ ප්‍රශ්න තිබුණා. අපි මේ සම්බන්ධව කථා කළා. අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවලදී අප මේ ගැන කථා කළාම මුදල් අමාත්‍යාංශයේ නිලධාරින් කිව්වේ "අපි මාසයක්, එහෙම නැත්නම් දවස් 45ක් විතර යනකොට නැවත වරක් මේක ප්‍රතිපූරණය කරන්න අනිවාර්යයෙන්ම කටයුතු කරනවා, මෙය ලබා දෙන්න කටයුතු කරනවා" කියලායි. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක තවමත් එහෙම සිද්ධ වෙලා නැහැ. ඒක පටන් ගත්තේ ඔක්තෝබර් මාසයේ. මා හිතන විධියට, SVAT එක සම්බන්ධයෙන් මුදල් අය කර ගත්තු ඒවා නැවත අය කර ගැනීමේ හැකියාවක් ඒගොල්ලන්ට අදටත් ලැබිලා නැහැ. මේ වෙලාවේ මේ අපනයනකරුවන්ට සිද්ධ වෙලා තිබෙන හානිය සම්බන්ධයෙන් බලන කොට, අඩුම තරමින් තාවකාලිකව හරි කමක් නැහැ, SVAT සහනය ලබා දෙන්න කටයුතු කරන්න කියලාත් ඒගොල්ලන් වෙනුවෙන් මම මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා. ඒගොල්ලන්ගේ පැත්තෙන් ඒගොල්ලෝ ඒ ඉල්ලීම කරනවා. විශේෂයෙන් ගරු අග්‍රාමාත්‍යතුමියත් මේ වෙලාවේ ගරු සභාවේ සිටින නිසා මේ කථා කළ කරුණු කාරණා කෙරෙහි විශේෂ අවධානය යොමු කරවන්න මා කැමැතියි.

ඊළඟට, මා කලිනුත් කිව්වා වාගේ අපට දැන් විශේෂයෙන් කරන්න තිබෙන්නේ මේකයි. අවතැන් කඳවුරුවල ඉන්න අයට ඒවායේ මාස ගණන් -මාස දෙකතුන- ඉන්න පුළුවන්කමක් නැහැ. අපි දන්නවා, ඔවුන්ට නොයෙකුත් ආකාරයේ ප්‍රශ්න එන බව; යම්කිසි අවස්ථාවක වසංගත රෝග එන්න පුළුවන්කම තිබෙන බව. ඒවායේ දිගින් දිගටම පවුල් පිටින් ඉන්න කොට මානසික ප්‍රශ්න ඇති වෙනවා. ගරු අග්‍රාමාත්‍යතුමියනි, මා කලින් කිව්වා වාගේ ගංවතුරෙන් ආපදාවට ලක් වුණු, නමුත් තම ගෙවල්වලට ලොකු හානියක් වෙච්ච නැති අයට ගෙවල් ටික යම්තාක් දුරකට හෝ පිළිසකර කරලා ඒවාට කොහොම හරි යාගන්න පුළුවන්. නමුත් අධිඅවදානම් කියලා නම් කරලා තිබෙන තැන්වල අයට යන්න එන්න තැනක් නැහැ. මොකද, ඒගොල්ලන්ට පෞද්ගලිකව ගිහිල්ලා වෙනත් තැන්වල ඉන්න පුළුවන්කමක් නැහැ. එහෙම නම්, ඒගොල්ලන්ට ස්ථිරව ඉන්න පුළුවන් විධියේ රැඳවුම් මධ්‍යස්ථානයක් වාගේ දෙයක් හදන්න වෙනවා. විශේෂයෙන්ම කෑගල්ල දිස්ත්‍රික්කය ගත්තොත්, එවැනි තැන්වල බරපතළ තත්ත්වයක් තිබෙනවා. නුවර දිස්ත්‍රික්කයේත්, බදුල්ල දිස්ත්‍රික්කයේත් එහෙමයි. එවැනි තැන්වලට අදාළව මා ඉහතින් කිව්වා වාගේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න අවශ්‍ය වෙනවා.

බොහෝ දෙනෙක් මටත් කථා කරලා කිව්වා, "ගොඩක් දෙනෙක් මේ කඳවුරුවලින් ඉවත් වෙලා යනවා. අපට ඉවත් වෙලා යන්න විධියක් නැහැ. අපට යන්න අවසරයක් නැහැ. මේ තැන් අධිඅවදානම් කියලා සඳහන් කරලා තිබෙනවා. ගෙවල් කැඩිලා බිඳිලා තිබෙනවා. ඒ වාගේ තැන්වලට අපි ගිහිල්ලා කොහොමද අපේ ජීවිතය අනතුරේ හෙළා ගන්නේ කියන ප්‍රශ්නය තිබෙනවා" කියලා. ඒ වාගේ විශාල පිරිසක් ඉන්නවා. ඒ නිසා ඒගොල්ලන් වෙනුවෙන් මොකක් හරි ක්‍රමයක් හදන්න. ඔබතුමන්ලා සමීක්ෂණය කරලා මේ වාර්තා අරගෙන ඉඩකඩම් ටික ලබා දීලා, ගෙවල් දොරවල් හදලා දෙන්න තව මාස කීයක් ගත වෙයිද කියලා කියන්න පුළුවන්කමක් නැහැ. සුළුපටු කාල සීමාවකින් ඒවා කරන්න බැහැ. ගරු අගමැතිතුමියනි, ඒ අය වෙනුවෙන් මොකක් හරි වැඩ පිළිවෙළක් යොදන්න කියලා ඔබතුමියගෙන් ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා.2.04]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වැය ශීර්ෂ කිහිපයක් ගැන විවාද කරන්න තිබුණත් විශේෂයෙන්ම රටේ සිදු වෙලා තිබෙන ආපදා තත්ත්වය මූලික කරගෙන තමයි මේ සාකච්ඡාව පාර්ලිමේන්තුවේ පැවැත්වෙන්නේ. කියමනක් තිබෙනවා, "සිදුවීම් සිදු වෙන්නේ කොක් හඬලා සිනාසෙන්නවත් එහෙම නැත්නම් හඬා වැලපී බෙරිහන් දෙන්නවත් නොවෙයි" කියලා. අපි වගකිව යුතු ආණ්ඩුවක් හැටියට මේ ව්‍යසනය හොඳින් තේරුම් අරගෙන තිබෙනවා. එම නිසා ඒ තත්ත්වය සම්බන්ධව ඉදිරි කටයුතු වඩාත් හොඳින් කරගෙන යෑමේ වගකීමක් විශේෂයෙන්ම ආණ්ඩුවක් හැටියට අපට තිබෙනවා.

අපි සූදානම් වෙලා තිබුණේ අය වැය ගැන සාකච්ඡා කරන්නයි. 2026 අවුරුද්දේ මේ රටේ මිනිසුන්ගේ ජීවිතය ලස්සන ජීවිතයක් බවට පත් කිරීම සඳහා විශාල බලාපොරොත්තු සහිතව අය වැය විවාදයට සම්බන්ධ වෙමින් ඉන්නකොට තමයි මේ ස්වාභාවික ඛේදවාචකය වුණේ.

අපේ රටේ බොහොමයක් ජනතාව මුහුණ දුන්නේ ස්වාභාවික ඛේදවාචකවලට වඩා පාලකයන්ගේ වැරදි කටයුතු නිසා ඇති වෙච්ච ඛේදවාචකවලට. ඒ අතරේ ස්වාභාවික උවදුරුවලටත් අපේ ජනතාව මුහුණ දෙන අවස්ථා අපි දැකලා තිබෙනවා. ඒ බොහෝ අවස්ථාවල අපි මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ හිටියේ. හැබැයි, අද අපි ඉන්නේ ආණ්ඩුවේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි එදා විපක්ෂයේ සිටියදී මෙවැනි තත්ත්වයකට රටක් ගොදුරු වුණාට පස්සේ විපක්ෂයක් හැටියට කටයුතු කරපු ආකාරයයි, මේ ඛේදවාචකය එක්ක අද විපක්ෂයේ අය පාර්ලිමේන්තුවේ කටයුතු කරන ආකාරයයි අතර ලොකු වෙනසක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඒක නොකියාම බැහැ. විපක්ෂයේ ඉන්න ඕනෑම පක්ෂයකට ආණ්ඩුවක් සම්බන්ධව විවේචන තිබෙනවා. බොහෝ වෙලාවට ප්‍රතිපත්තිමය විවේචන තමයි තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් රටේ ජනතාව ස්වාභාවික උවදුරකට පත් වුණාට පසුව ආණ්ඩුවක් සම්බන්ධව තිබෙන සියලු ආකාරයේ ප්‍රතිපත්ති විවේචන අපි අයින් කර ගන්නවා. ඇත්තටම අපි තත්ත්වය අනුව වෙනස් වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි විපක්ෂයේ සිටියදී කළේ තවදුරටත් ආණ්ඩුව විවේචනය කර කර ඉන්නවාට වඩා ක්‍රියාකාරී දායකත්වයකට බහින එකයි. ව්‍යසනයක් සිදු වෙලා තිබෙන නිසා ආණ්ඩුවට උදවු කරනවා වාගේම, ඒ තුළින් රටේ ජනතාවටත් උදවු කරනවා. විපක්ෂයක් හැටියට අපට වගකීමක් තිබෙනවාය කියන තැන ඉඳලා අපේ ක්‍රියාකාරිත්වයත් අපි වෙනස් කරගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි ඒ ක්‍රියාකාරිත්වය වෙනස් වෙච්ච එක අවස්ථාවක් තමයි මේ රටේ හැමෝම දන්නා "රතු තරුව" ව්‍යාපෘතිය. මෙවැනි ව්‍යසන තත්ත්වයක් යටතේ "රතු තරුව" කරන්නේ ක්‍රියාකාරී වැඩක්. අපේ සමහර අය මගෙනුත් අහලා තිබෙනවා, "කෝ දැන් රතු තරුව" කියලා. දැන් රතු තරුව වැඩ. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි රතු තරුව පෙනෙන්නේ නැහැ. මොකද, අපි දැන් ආණ්ඩු පක්ෂයේ ඉන්නේ. ආණ්ඩුව ඇතුළේ රතු තරුවක් තිබෙනවා. එහෙම නම් දැන් මොකක්ද වෙන්නේ? දැන් රතු තරුව රට ව්‍යසනයෙන් ගලවා ගැනීම සඳහා මහජනතාව එක්ක, මේ ආණ්ඩුවත් එක්ක, මේ රජයත් එක්ක හරි හරියට වැඩ. ඇත්තටම දැන් ක්‍රියාකාරිත්වය

දකින්න ඕනෑ කොළ තරුව, දම් තරුව, නිල් තරුව වාගේ ඒවායේ. නමුත් ඇත්තටම එහෙම තරු නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි; එහෙම ක්‍රියාකාරිත්වයක් නැහැ. විවේචනාත්මක කටයුත්තක් විපක්ෂය හැටියට ඒගොල්ලන් කරනවා. මම ඒක නරකයි, ඒක නතර කරන්න කියනවා නොවෙයි. ඇත්ත, සාධාරණ විවේචන තිබෙනවා නම් කරන්න ඕනෑ. හැබැයි, දැන් තිබෙන්නේ විවේචන විතරයි, ක්‍රියාකාරිත්වයක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේ තත්ත්වය ඇතුළේ අපේ රටේ සමාජයීය ක්‍රියාකාරිත්වය ලෝකයට ආදර්ශයක්. මේ රටේ මිනිස්සුන්ගේ ආධ්‍යාත්මය ඇතුළේ තිබෙන ඇත්ත මනුෂ්‍යත්වය, ඒ මානව ගුණධර්මය අපි අගය කරන්න ඕනෑ. ඒක අගය කරන්න අපි පැකිළෙන්න ඕනෑ නැහැ. පුදුම විධියේ වටිනා මිනිස්සු අපේ රටේ ඉන්නවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සමහර වෙලාවට අපට යම් යම් පාර්ශ්වයන්ගේ කටයුතුවලදී එතැන මනුෂ්‍යත්වයක් නැද්ද කියලා හිතෙන අවස්ථාත් ඇති වෙනවා. හැබැයි, එහෙම මිනිස්සු පවා අද වනකොට අපිත් එක්ක එකතු වෙලා තිබෙනවා. අපේ රටේ තිබෙන සංස්කෘතිය, සදාචාරය ඇතුළේ මෙවැනි ව්‍යසනයකදී ඒ සෑම මනුෂ්‍යයෙකුම එක තැනකට එනවා. මේ රටේ ඉන්නේ කොයි තරම් හොඳ මිනිස්සුද, කොයි තරම් හොඳ මනුෂ්‍යත්වයක් තිබෙන මිනිස්සුද කියලා හිතෙන තරමට අපේ මිනිස්සු බොහොම දියුණුයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ මොහොත වෙනකොට අපි කිහිපදෙනෙකුට මේ පාර්ලිමේන්තුවට කොටු වෙන්න සිද්ධ වුණාට අපි ඉන්න ඕනෑත් ඒ මිනිස්සුත් එක්ක ඒ සමාජ ක්‍රියාකාරිත්වය තුළ. මේ සියල්ල අනිත්‍යයි, ඔක්කෝම නතර වෙන්න ඕනෑ කියන එක නොවෙයි මම මේ කියන්නේ. ඇත්තටම ඒ මිනිස්සුන්ට ධෛර්යය දෙන්න අපි ඔවුන් සමඟ තමයි ඉන්න ඕනෑ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා මම මේ වෙලාවේදී විශේෂයෙන්ම මේ රටේ ජනතාව අගය කිරීමක් කරනවා. ඒ මිනිස්සුන්ටත් දේශපාලනයක් ඇති. හැබැයි, කිසිම වෙලාවක අපට එහෙම මිනිස්සු මේ ක්‍රියාකාරිත්වය ඇතුළේ හමු වුණේ නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එහෙම මිනිස්සු හොයා ගන්න අපි එන්න ඕනෑ පාර්ලිමේන්තුවට. පාර්ලිමේන්තුවට ආවාම ඒ ජාතියේ මිනිස්සු ඉන්නවා. මේ ව්‍යසනය ඇතුළේ සමහර අය පිට කරන වචනවලින් අපට ඒ දේවල් පෙනෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පොඩි ළමයි නොවෙයි නේ මේ පාර්ලිමේන්තුවේ ඉන්නේ.

අපි මේ මොහොතේදී විදේශීය සහයෝගය පිළිබඳව ලොකු අගය කිරීමක් කරන්න ඕනෑ. මම සමාජ මාධ්‍යවල පළ වනවා දැක්කා පාකිස්තානයේ ජෙට් එකයි, ඉන්දියාවේ ජෙට් එකයි එකට යන රූප රාමු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන්නේ ඒවා ලෝකයට ආදර්ශයක්. ජාත්‍යන්තරවත් අපි ඒවා අගය කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ රාජ්‍ය නිලධාරින් සම්බන්ධව යම් යම් කාල වකවානුවල තිබුණේ ඇත්තටම අගය කිරීමක් නොවෙයි. මම නියෝජනය කරන්නේ කොළඹ දිස්ත්‍රික්කය. අපේ අගමැතිතුමියටත් හොඳ අවබෝධයක් තිබෙනවා කොළඹ ගැන. දිස්ත්‍රික් ලේකම්තුමාගේ ඉඳන් ප්‍රාදේශීය ලේකම්වරු, පළාත් පාලන ආයතනවල නාගරික කොමසාරිස්වරු, ලේකම්වරු, කාර්යාල කාර්ය සහායකයා දක්වා සෑම රාජ්‍ය නිලධාරියෙක්ම අද ලොකු ක්‍රියාන්විතයක ඉන්නවා. ඒක අගය කළ යුතු දෙයක් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඊළඟ කාරණය මේකයි. ඉතිහාසයේ සිදු වුණු ව්‍යසනවලදී අපි ඒ ක්‍රියාකාරිත්වයේ සිටි නිසා දන්නවා, එක් එක් ආයතන අතර විශේෂයෙන්ම රාජ්‍ය ආයතන අතර අන්තර් සම්බන්ධීකරණයක් තිබුණේ නැතිකම අපේ රටේ තිබුණු ලොකු දුර්වලතාවක් කියන එක. ව්‍යසනයක් ආවාම එක එක්කෙනා එක එක තැන්වලට දුවනවා. ප්‍රාදේශීය ලේකම් එක දිහාවකට දුවනවා, දිස්ත්‍රික් ලේකම් තව දිහාවක දුවනවා, පළාත් පාලන ආයතනවල නිලධාරින් තව දිහාවක දුවනවා, අමාත්‍යාංශ නිලධාරින් තවත් දිහාවක දුවනවා. හැබැයි, මේ ව්‍යසනය ඇතුළේ මේ සියලු ආයතන එක තැනකට සම්බන්ධ කර ගන්න අපි සමත් වුණා, ජාතික මට්ටමේ සම්බන්ධීකරණය එක තැනකින්, පළාත් මට්ටමේ සම්බන්ධීකරණය තව තැනකින්, දිස්ත්‍රික් මට්ටමේ සම්බන්ධීකරණය තව තැනකින් ආදී වශයෙන්. මේ ව්‍යසනයෙන් ජනතාව බේරා ගැනීම සඳහා ඉහළ සිට පහළ දක්වාම නිලධාරින් - ග්‍රාම නිලධාරිවරයා දක්වා - එකම වැඩකට, එකම ඉලක්කයකට අරගෙන යන්න පුළුවන් සම්බන්ධීකරණයක් මේ පාලනය තුළ හදා ගන්න අපි සමත් වුණා. මේ ව්‍යසනය සිදු වෙලා මේ වනකොට දවස් ගණනාවක් ගත වුණත් මේක සුළුපටු ව්‍යසනයක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සමහරු හිතාගෙන ඉන්නවා, ආණ්ඩුවක් වුණාම මේවා ගැන ජේන දකින්න ඕනෑ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම තත්ත්වයකට වඩා වෙනස් නේ මේ ඇති වෙලා තිබෙන ව්‍යසනය. කලිනුත් කිව්වා වාගේ මේක දිස්ත්‍රික්ක 22කටම ඇති වෙච්ච ව්‍යසනයක්. මම දන්නා ඉතිහාසය තුළ ඇති වූ සුනාමි ව්‍යසනය වැනි ව්‍යසනයත් එකම වේලාවක දිස්ත්‍රික්ක 22කට බලපා නැහැ. ඒ නිසා මේක ඊට වඩා වෙනස් තත්ත්වයක්. ඒ නිසා මේ ආපදා අවස්ථාවේදී කළ කටයුතු අපි මේ වෙලාවේ අගය කරන්න ඕනෑ. කෙනෙකුට කියන්න පුළුවන්, "මෙහෙම වුණා නම් අරහෙම කරන්න තිබුණා නේ. අරහෙම වුණා නම් මෙහෙම කරන්න තිබුණා නේ. ඇයි මෙහෙම කළේ නැත්තේ, ඇයි අර විධියට කළේ නැත්තේ" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඕනෑම කෙනෙකුට ඒවා කියන්න පුළුවන්. ඒවා ගොඩ ඉඳගෙන පීනන්න උගන්වනවා වාගේ වැඩ. නමුත්, ඇත්ත ක්‍රියාකාරිත්වය ඇතුළේ අපි දන්නවා මොන වාගේ තත්ත්වයක්ද තිබෙන්නේ කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දුන් කාලය අවසන්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)
මම මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ අනුව අපි විශ්වාස කරනවා, මේ රට මෙතැනින් එහාට ගොඩ ගැනීම සඳහා තවදුරටත් මේ සියලුදෙනා එක්ව කටයුතු කළ යුතුයි කියා. අපි මේ කරන කටයුත්ත ඇතුළේ මේ රට ගොඩ දමා ගන්න පුළුවන් කියන විශ්වාසය අපට තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[පි.ප. 2.14]

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே!

இயற்கை அனர்த்தத்தால் காவுகொள்ளப்பட்ட மற்றும் காணாமல் ஆக்கப்பட்ட எங்களுடைய உறவுகளுக்குத் தமிழீழ விடுதலை இயக்கத்தின் சார்பாகவும், ஜனநாயகத் தமிழ்த் தேசியக் கூட்டமைப்பின் சார்பாகவும் முதலில் எனது

[ගරු අමීර්තනාදන් අඩෛක්කලනාදන් මහතා]

அஞ்சலியைச் செலுத்திக்கொள்ளுகின்றேன். "இந்த அனர்த்தத்தை எதிர்கொள்வதற்கான ஆயத்தங்களை முன்பே செய்யவில்லை; அதைச் செய்திருந்தால், இந்தப் பிரச்சினையைத் தவிர்த்திருக்கலாம்" என்றெல்லாம் குறை கூறுவதை நிறுத்துங்கள்! இயற்கை அனர்த்தப் பாதிப்புக்குள்ளான மக்களுக்கு என்ன செய்யவேண்டும் என்பதற்கான ஆலோசனைகளைச் சொல்லுங்கள்! என்று நான் இங்கு கூற விரும்புகிறேன். அரசாங்கம் அதைச் செய்யவில்லை, இதைச் செய்யவில்லை என்று நாங்கள் அரசாங்கத்தைக் குறைகூறுவது இந்த நேரத்திலே பொருத்தமற்றது என்பதை நான் இங்கே குறிப்பிட விரும்புகின்றேன். எங்களுடைய இந்த நாட்டை மீளவும் கட்டியெழுப்புவதற்கான செயற்பாட்டில் அனைவரும் ஒன்றாக இணைந்து செயற்பட வேண்டும் என்பது என்னுடைய கருத்து. அந்தவகையிலே, முதலிலே நான் அரசாங்கத்திடம் சொல்வது என்னவென்றால், எங்களுடைய அயல் நாடான இந்தியாவைப் பற்றிப் பிடிப்போம்! எமது நாட்டில் பொருளாதார வீழ்ச்சி ஏற்பட்டபோதும், இப்பொழுது இந்த இயற்கை அனர்த்தம் ஏற்பட்டபோதும் முதலிலே காலூன்றி எங்களுக்கு உதவி செய்த நாடு இந்தியாதான்! அந்தவகையிலே, இந்த நாடு இந்திய நாட்டைக் கரம் பற்றிப் பிடிப்பது சாலச் சிறந்தது என்பதை நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். அந்தவகையிலே, இந்திய நாட்டினுடைய அதிமேதகு பிரதமர் அவர்கள், அந்த நாட்டு மக்கள், தமிழ் நாட்டு முதலமைச்சர் எல்லோருக்கும் நான் எமது இலங்கை நாட்டு மக்கள் சார்பாக நன்றியைச் சொல்லிக்கொள்ளுகிறேன்.

அதுபோல், மாண்புமிகு சனாதிபதி அவர்களுக்கும் இந்த அரசாங்கத்திற்கும் உண்மையிலே நான் நன்றி சொல்லக் கடமைப்பட்டிருக்கின்றேன். இந்த நாடு அனர்த்தத்தைச் சந்தித்திருக்கின்றபோது, தூங்காமல் இரவு பகலாக நாட்டு மக்களைப் பற்றிச் சிந்தித்து, அவர்களுடைய பிரச்சினைகளை நிவர்த்தி செய்கின்ற வகையிலே முழுமூச்சுடன் செயற்படுகின்ற ஒரு சனாதிபதியாக அவர் இருக்கின்றார். மேலும், எங்களுடைய வன்னிப் பிராந்தியத்திலே குறிப்பாக வவுனியா, மன்னார், முல்லைத்தீவு போன்ற பிரதேசங்களிலே உள்ள அரசாங்க அதிபர்கள், பிரதேச செயலாளர்கள், கிராம சேவையாளர்கள், பிரதேச சபை மற்றும் நகர சபை உறுப்பினர்கள், தொண்டர்கள் மற்றும் முப்படையினருக்கும் நான் நன்றி தெரிவித்துக்கொள்ளுகிறேன்.

இந்த அனர்த்த சூழ்நிலையால் இன்றைக்கு எங்களுடைய மன்னார் மாவட்டம் மிக மோசமான பின்னடைவைச் சந்தித்திருக்கிறது. அந்தவகையிலே, எங்களுடைய நகர சபைத் தவிசாளரான டானியல் வசந்தன் அவர்கள், மாந்தை மேற்குப் பிரதேச சபையின் தவிசாளரான ஞானப்பிரகாசம் பிரேம்குமார் அவர்கள் மற்றும் அந்தச் சபையை அலங்கரிக்கின்ற உறுப்பினர்கள் அனைவரும் இந்த அனர்த்தத்தின்போது முன்னின்று மிக முழுமூச்சாக செயற்படுகின்ற சந்தர்ப்பத்தைப் பார்க்கின்றபோது, இவர்களுக்கு உண்மையிலே நான் என்னுடைய பாராட்டைத் தெரிவித்து, நன்றி செலுத்துவது சாலச் சிறந்ததென்று நினைக்கின்றேன். இவ்வாறான ஓர் அனர்த்தச் சூழ்நிலையில் 100 வீதம் ஒரு விடயத்தை, ஒரு வேலையைச் செய்ய முடியாது; திருப்திப்படுத்த முடியாது என்பதைச் சில நபர்களிடம் நான் சொல்லிக்கொள்ள விரும்புகின்றேன். அந்த வகையிலே இந்த நிவாரண நடவடிக்கையின்போது சில பிழைகள், தவறுகள் ஏற்படுவதுண்டு. அதை வைத்துக்கொண்டு நாங்கள் விமர்சனம் செய்ய முடியாது. அந்தச் செயற்பாடுகளை எப்படி நாங்கள் முன்கொண்டுபோக வேண்டுமென்பதுதான் பிரதான நோக்கமாக இருக்கவேண்டும். ஆகவே, இந்த அரசும் அரச இயந்திரமும் சரியாக வேலை செய்யவில்லையென்று குறை சொல்லாதீர்கள்! இந்த இயற்கை அனர்த்தம் தொடர்பான எந்த வேலையையும் 100 வீதம் சரியாகச் செய்வது என்றைக்குமே இயலாத காரியம் என்பதை நான் இங்கே மீண்டும் குறிப்பிட விரும்புகிறேன். ஆகவே, அரசாங்கத்தின் செயற்பாடுகளைக் குறை சொல்லாது, என்ன செய்ய வேண்டுமென்பதைச் சொல்லுங்கள்!

நான் முதலில் குறிப்பிட்டதுபோல, வன்னியிலே கூடுதலாக மன்னார் மாவட்டம் மிக மோசமாகப் பாதிக்கப்பட்ட நிலையில் இருக்கின்றது. இருந்தாலும் நான் எவரையும் நான் குறை சொல்ல வரவில்லை. ஏனென்றால், எல்லோரும் அர்ப்பணிப்போடு, கண் விழித்து நிவாரணம் மற்றும் மீளமைப்புச் செயற்பாடுகளில் ஈடுபட்டிருக்கின்ற வேளையிலே, அது பிழை, இது பிழை என்று சொல்வதில் எந்த அர்த்தமுமில்லை என்பதை நான் இங்கே சொல்லிக்கொள்ள விரும்புகின்றேன். ஆனால், நீங்கள் மன்னார் மாவட்டத்தையும் முக்கியமாகக் கவனத்தில் எடுக்கவேண்டும் என்பதுதான் என்னுடைய நோக்கம். வன்னியிலே கூடுதலான கால்நடைகள் இறந்திருக்கின்றன; விவசாயிகள் பாதிக்கப்பட்டிருக்கிறார்கள்; கடற்றொழிலாளர்களின் வலைகள் வெள்ளத்தில் அடித்துச் செல்லப்பட்டிருக்கின்றது. இந்த நிலையில் ஒரு புதிய நாட்டைக் கட்டியெழுப்ப வேண்டி நாங்களும் அரசாங்கத்தோடு இணைந்து செயற்படத் தயாராக இருக்கிறோம் என்பதை இங்கு குறிப்பிட விரும்புகிறேன். ஆகவே, மக்களை பாகுபடுத்திப் பார்க்க வேண்டாம்! முகாம்களில் இருக்கின்றவர்களுக்கு மாத்திரமே உதவி செய்யவேண்டு மென்ற பாகுபாடு வேண்டாம்! இந்த இலங்கை நாட்டில் எல்லோரும் இயற்கை அழிவால் பாதிக்கப்பட்ட மக்கள் என்ற ரீதியிலே இந்த அரசாங்கத்தோடு இணைந்து செயற்படுகின்ற வாய்ப்பை நாங்கள் ஏற்படுத்துவோம்! எங்களுடைய மக்களைத் தூக்கி நிறுத்துவோம்!

உண்மையிலே, 'வெள்ளத்தினால் பாதிப்படைந்த ஒரு வீட்டைச் சுத்தம் செய்ய 25,000 ரூபாய் என்ற கொடுப்பனவு' என்ற செய்தியை நான் பார்த்தபோது மிகவும் சந்தோமடைந்தேன்; நான் இதை வரவேற்கிறேன். அந்தத் தொகை போதாதென்றாலும் அது எல்லாக் குடும்பங்களுக்கும் கொடுக்கப்படவேண்டும். அந்த வகையிலே, மன்னார் மாவட்டத்தில் பாதிக்கப்பட்ட குடும்பங்களின் எண்ணிக்கை 40,605 ஆகும். பாதிக்கப்பட்ட தனிநபர்களின் எண்ணிக்கை 136,483 ஆகும். இறந்தவர்களின் எண்ணிக்கை 2. முழுமையாகச் சேதமடைந்த வீடுகள் 10. அதுபோல், முல்லைத்தீவு மாவட்டத்தை எடுத்துக்கொண்டால், 12,691 குடும்பங்கள் பாதிக்கப்பட்டிருக்கின்றன; பாதிக்கப்பட்ட தனிநபர்களின் எண்ணிக்கை 39,193 ஆகும். ஏனைய விடயங்களும் இதிலே உள்ளடங்கியிருக்கின்றன. வவுனியாவில் பாதிக்கப்பட்ட குடும்பங்களின் எண்ணிக்கை 6,320; தனிநபர்கள் என்ற வகையில் 20,785 பேர் பாதிக்கப்பட்டிருக்கிறார்கள். இந்த விபரம் ஓர் அறிக்கையாக இருக்கின்றது. நேரம் போதாமையால் அந்த அறிக்கையைச் சபாபீடத்துக்குச் *சமர்ப்பிக்கின்றேன்.

இந்த வகையிலே இன்று கஷ்டப்பட்ட சூழ்நிலையிலே இருக்கின்ற எங்களுடைய மக்களுக்கு நாங்கள் எல்லோரும் சேர்ந்து கைகொடுக்க வேண்டும். உலக நாடுகள் எங்களுக்கு உதவி செய்திருக்கின்றது. குறிப்பாக, இந்தியா தன்னுடைய கடமையை உடனடியாகச் செய்திருக்கின்றது. நாங்கள் இந்த

---

* පුස්තකාලයේ තබා ඇත.

* நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.

* *Placed in the Library.*

நாட்டு மக்களை மீண்டும் தூக்கி நிறுத்தவேண்டும். அதைவிடுத்து, இந்த நேரத்திலே அரசாங்கத்தைக் குறைசொல்வதில் அர்த்தமில்லை என்பதை நான் இங்கு குறிப்பிட விரும்புகிறேன். இம்மாதம் 1ஆம் திகதி எங்களுக்குப் பேச நேரம் கொடுக்காமையால்தான் நாங்கள் வெளிநடப்புச் செய்தோம்; அரசாங்கத்துடன் கோபித்துக்கொண்டு செல்லவில்லை. உண்மையிலே நான் ஏற்கனவே சொன்னதுபோல, இந்த அரசாங்கத்தோடு இணைந்து ஒரு நாட்டை, ஒரு generationஐ புதிதாகக் கட்டியெழுப்புவது போன்றுதான் நாங்கள் செயற்படவேண்டும். நாங்கள் இன்னும் பொருளாதார ரீதியாக மேம்படவில்லை. மலையகத்தை எடுத்துக் கொண்டால், அந்தப் பிரதேசத்தைச் செப்பனிடுவதற்கு இன்னும் 2 வருடங்களாகுமென நான் நினைக்கின்றேன். ஏன், ஏனைய மாவட்டங்களை எடுத்துக்கொண்டாலும், அங்கு வீதிகள் உட்பட விவசாயிகளுக்கு ஏற்பட்டுள்ள அழிவுகள், கால்நடை வளர்ப்பாளர்களுக்கு ஏற்பட்டுள்ள அழிவுகள், கடற்றொழிலாளர்களுக்கு ஏற்பட்டுள்ள அழிவுகள், சாமானிய மக்களுக்கு ஏற்பட்ட பாதிப்புகள் எல்லாவற்றையும் கணக்குப் பார்த்தால் நாடு தாங்காது. இப்படியானதொரு சூழலில் நாங்கள் அரசாங்கத்தோடு சேர்ந்து செயற்படவேண்டும்; உலக நாடுகளிடமிருந்து அன்பளிப்புகளை அல்லது உதவிகளைப் பெறுவதற்கான முயற்சிகளை மேற்கொள்ளவேண்டும். வெறுமனே எதிர்க்கட்சியிலிருந்துகொண்டு, இந்த நேரத்தில் அரசாங்கத்தைக் குறைகூறுவதில் அர்த்தமில்லை.

உண்மையிலே நான் ஜனாதிபதி அவர்களை மதிக்கின்றேன். தூக்கமில்லாமல் செயற்படுகின்றதொரு தலைவர் இன்றைக்கு மாண்புமிகு சனாதிபதியாக இருக்கின்றார்; நான் அதைப் பெருமையாகப் பார்க்கின்றேன். மக்களைக் காப்பாற்ற வேண்டும் என்ற எண்ணத்தோடு செயற்படுவதற்காக இந்த அரசாங்கத்தையும் மாண்புமிகு சனாதிபதியையும் வாழ்த்துகின்றேன். அதற்காக எல்லா விடயத்திற்கும் என்னுடைய முழுமையான ஆதரவை அரசாங்கத்துக்குத் தருகின்றேன் என்று சொல்லவில்லை. இந்த அனர்த்தத்திலிருந்து மக்களை மீட்டெடுக்க, என்னுடைய பங்களிப்பை முழுமையாக வழங்கும் வகையில் ஜனநாயகத் தமிழ் தேசிய கூட்டணியும் தமிழீழ விடுதலை இயக்கமும் அரசாங்கத்தோடு கைகோர்ப்பதற்குத் தயாராக இருக்கின்றது என்பதைச் சொல்லி விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අග්‍රාමාත්‍යතුමිය. ඔබතුමියට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා.2.26]

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපේ රටේ ඉතිහාසයේ ඇති වූ විශාලතම මෙන්ම දරුණුම විපත්වලින් එකකට පසුගිය දින කිහිපය තුළ අපට මුහුණ දීමට සිදු වුණා. මේ විපතින් ජීවිත අහිමි වුණු, අවතැන් වුණු, දේපළ හානි සිදු වුණු සහ විවිධ අයුරින් විපතට පත් වුණු සියලු සහෝදර ජනතාව වෙත පළමුවෙන්ම මගේ සාතිශය සංවේගය පළ කරනවා. මේ ආපදාවෙන් නිවාස, ව්‍යාපාර, දේපළ අහිමි වී අවතැන් වූ සියලුදෙනාගේ ජීවිත යළි නඟාසිටුවීම උදෙසා රජයක් ලෙස කළ හැකි සියලු දේ, ලබා දිය යුතු සහයෝගය අප ලබා දෙන බවත් මම මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය දින කිහිපය පුරා විශේෂයෙන් අපේ රටේ රාජ්‍ය නිලධාරින් සහ මහජන නියෝජිතයන් දැඩි වෙහෙසක් ගනිමින් විපතට පත් වූ අපේම සහෝදර ජනතාව මුදාගැනීම සහ ඔවුන්ට සහන සැලසීම වෙනුවෙන් උපරිම සහයෝගය ලබා දී තිබෙනවා. අදටත් උපරිම දායකත්වය ලබා දෙමින් ඉන්නවා. රාජ්‍ය නිලධාරින් සමඟ එකමුතු වී එකට වැඩ කරපු ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ මහජන නියෝජිතයන් සියලුදෙනාටත් මේ අවස්ථාවේදී මගේ විශේෂ ස්තුතිය පිරිනමන්න කැමැතියි. ඒ වාගේම වචනයකින් හෝ අපට ශක්තිය දුන් සියලුදෙනාටත් මේ අවස්ථාවේදී මගේ ස්තුතිය පළ කරනවා. මේ අභියෝගයට මුහුණ දීමේදී අපේ ජනතාව අතර පවත්වාගෙන යන ඒ එකමුතුකම, ධෛර්යය, කරුණාව, සහකම්පනය, එකිනෙකාට උදවු කිරීමට තිබෙන වුවමනාව වැනි ගුණාංග අපට දකින්නට ලැබුණා. මේ ඉතාම අමාරු අවස්ථාව තුළ අතිශයින්ම දුෂ්කර මෙම මෙහෙයුම ඉදිරියට ගෙන යෑමට එය අපට විශාල ශක්තියක් වුණා.

මෙම ආපදාවෙන් අනතුරට පත් සහෝදර ජනතාව මුදාගැනීමටත්, ඔවුන් ආරක්ෂිත ස්ථාන වෙත ගෙන යෑමටත් දැඩි ලෙස වෙහෙස වී කටයුතු කළ, තවමත් ඒ මෙහෙයුමේ රැඳී සිටින ශ්‍රී ලංකා යුද හමුදාව, නාවික හමුදාව, ගුවන් හමුදාව, පොලීසිය ඇතුළු රාජ්‍ය නිලධාරින් හා සියලු හදිසි සහන කණ්ඩායම් වෙත මේ අවස්ථාවේදී මාගේ ආචාරය පුද කරන්න කැමැතියි. ඒ වාගේම තවත් අයෙකුගේ ජීවිතයක් බේරා ගැනීමට තමන්ගේ ජීවිතය බිලි දුන් අවස්ථාත් මේ අතරතුර අපට දකින්න ලැබුණා. එය පහසුවෙන් දකින්නට නොලැබෙන වීරත්වයක්. ඒ සියලුදෙනාටම නැවත නැවතත් මගේ ගෞරවය පුද කරන්න කැමැතියි. ඒ වාගේම මුදාගැනීමේ මෙහෙයුම අතරතුර වෙන්නප්පුව, ලුණුවිල, ගිං ඔයේදී අනතුරකට ලක් වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අයත් Bell 212 හෙලිකොප්ටර් යානයේ සිටි ගුවන් නියමු Group Captain Nirmal Siyambalapitiya, ඒ වාගේම ගංවතුර පාලනය කිරීම සඳහා චුන්ඩිකුලම් ප්‍රදේශයේ කළපුවේ මෝය කට පුළුල් කිරීමේ කටයුතුවල යෙදී සිටියදී අතුරුදහන් වූ නාවික හමුදා නිලධාරින් පස්දෙනාටත් මේ අවස්ථාවේ මගේ ආචාරය පුද කරනවා. දහස් ගණන් මිනිසුන්ගේ ජීවිත බේරාගැනීම වෙනුවෙන් තම ජීවිතය පරදුවට තැබූ ඒ වීරත්වය අපට කවදාවත් අමතක වන්නේ නැහැ.

ඒ වාගේම අපේ ආණ්ඩුකාරවරුන්, අපේ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම්වරුන්, අපේ ග්‍රාම නිලධාරින්, අපේ ප්‍රාදේශීය පාලන අධිකාරින් සහ ඒ සියලු ආයතනවල සිටින අපේ නිලධාරින්, අත්‍යවශ්‍ය සේවා සපයන්නන් මේ දුෂ්කර මොහොතේ සෘජුවම ක්ෂේත්‍රයේ සිට ක්‍රියාත්මක වනවා. ඔවුන්ගේ සේවය විශේෂයෙන් අපි අගය කර සිටිනවා.

ඒ වාගේම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, රජයේ මිනින්දෝරු දෙපාර්තමේන්තුව, දුරකථන සේවා සමාගම්වල කාර්ය මණ්ඩලය, ලංකා විදුලිබල මණ්ඩලය, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, Road Development Authority එක වැනි ආයතනවල ප්‍රධානීන් සහ සේවක මහත්ම මහත්මීන් සියලුදෙනාටත් මේ අවස්ථාවේදී මගේ විශේෂ ස්තුතිය පිරිනමනවා.

අතිශයින්ම දුෂ්කර තත්ත්ව තුළ ජනතාවගේ සාමාන්‍ය ජීවිතය නැවත පවත්වා ගෙන යෑම වෙනුවෙන්, ඔවුන් කරන මැදිහත්වීම අතිශයින්ම විශිෂ්ටයි කියලා මම මේ අවස්ථාවේදී කියනවා. ඒ අත්‍යවශ්‍ය සේවා නැවත ස්ථාපිත කිරීම සඳහා ඔවුන් දැඩි

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

කැපවීමෙන් වැඩ කරමින් සිටිනවා. අපේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වෛද්‍යවරුන්, හෙද නිලධාරින්, රෝහල් කාර්ය මණ්ඩලය, මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරින්, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරින් සහ ප්‍රජා සෞඛ්‍ය සේවකයන්ට ඔවුන්ගේ දැඩි කැපවීම වෙනුවෙන් මගේ ගෞරවය පිරිනමන්නත් කැමැතියි.

ඒ වාගේම විශේෂයෙන්ම සිහිපත් කළ යුතුයි, මේ මොහොතේ විපතට පත්වූවන් වෙනුවෙන් නොයෙක් ආකාරයෙන් උපකාර කිරීමට ඉදිරිපත් වන ආගමික සිද්ධස්ථානවල අපේ ගෞරවනීය ස්වාමීන් වහන්සේලා, අපේ පූජකවරුන් සහ ස්වේච්ඡා කණ්ඩායම්, තරුණ කණ්ඩායම්, ශිෂ්‍ය කණ්ඩායම්, කාන්තා කණ්ඩායම්, නොයෙක් තරුණ සාමූහිකයන් හා සංවිධාන. මේ සියලුදෙනා කිසිම ලාභ ප්‍රයෝජනයක් නොතකා, විපතට පත්වූවන්ට සහන සැලසීම වෙනුවෙන් දායකත්වය ලබා දෙනවා. දින ගණනාවක් තිස්සේ -මේ මොහොතේදීත්- ඔවුන් මේ ක්‍රියාන්විතය වෙනුවෙන් කැපවී සිටිනවා. රටක් විධියට, ශ්‍රී ලාංකික ජාතිය විධියට අපට තිබෙන වටිනාම ශක්තිය තමයි, මිනිස්කම හඳුනාගෙන අනෙකා කෙරෙහි සහකම්පනයෙන් යුතු ඒ මිනිස් හදවත්. ඒ සියලුදෙනා වෙතත් මේ මොහොතේ මගේ ආචාරය පුද කර සිටිනවා. ඒ වාගේම මේ අභියෝගාත්මක අවස්ථාවේ අප සමඟ එක් වූ අපට ශක්තියක් වූ අපේ මිත්‍ර විදෙස් රටවල් ගැනත් මම කියන්න ඕනෑ.

All foreign nations, countries, international organizations, multi-lateral organizations who stepped forward, who have expressed their support for us, who have expressed their solidarity with us at this moment and who have already taken action to provide services, to provide personnel, to provide equipment, who have called us, talked to us and asked in whatever ways they can help us, we deeply appreciate and value the generosity that they have shown and most importantly, the solidarity that they have shown and the assurance that they have given us that they will stand with us during this difficult period.

At the same time, I also want to thank the Sri Lankan diaspora who have stepped up like they always do at times of crisis where they have forgotten every other division, every other issue, but have come together and come forward to help us. The massive campaigns that are underway in most of these countries among the Sri Lankan diaspora to collect funds, to collect equipment, to collect material, it is not only helping us directly but it gives us courage to go forward at this moment in time and I thank all of them.

පවතින තත්ත්වය පිළිබඳව නිතරම නිවැරදි තොරතුරු යාවත්කාලීන කරන මාධ්‍යවේදීන්, සත්‍ය තොරතුරු හරහා ජනතාව දැනුවත් කරන මාධ්‍ය ආයතන, සමාජ මාධ්‍ය ක්‍රියාකාරින් සහ නිවැරදි, විශ්වසනීය, වගකීම් සහගත තොරතුරු බෙදාහරින පුරවැසියන්ටත් මේ මොහොතේ මම ස්තුතිවන්ත වනවා. විපතට පත්වූවන් මුදාගැනීමේ මෙහෙයුම සඳහා මඟ පෙන්වීමට, නිවැරදි කළමනාකරණය සිදු කිරීමට වාගේම ජනතාව වෙත ආරක්ෂාකාරී මඟපෙන්වන්නන් ලෙස ඔවුන් කරන සේවය අතිශයින්ම වැදගත් වනවා.

ඒ සමඟින් මම සිහිපත් කළ යුතු තවත් විශේෂ දෙයක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇතැම් පුද්ගලයන් නොයෙක් වාසි වෙනුවෙන් මේ මොහොතේ වැරදි තොරතුරු ප්‍රචාරය කරමින් සිටින බවත් අපට දකින්න ලැබෙනවා. ඒ සියල්ල කළමනාකරණය කිරීමත්, වගකීම් සහගතව, නිවැරදි තොරතුරු බෙදා ගැනීමත් අතිශයින්ම වැදගත්. ඒ නිසා මම සියලුදෙනාගෙන්ම මේ මොහොතේ ඉල්ලා සිටිනවා, ඔබ යමක් සන්නිවේදනය කරනකොට වගකීම් සහගතව එය කරන්න, මේ මොහොතේ බැරෑරුම්කම තේරුම් අරගෙන එය සන්නිවේදනය කරන්න කියලා.

ඒ වාගේම මේ හදිසි අවස්ථාව තුළ සෑම අංශයක්ම සම්බන්ධීකරණය කළ යුතුව තිබෙනවා. අපේ අධ්‍යාපන ක්ෂේත්‍රය දැවැන්ත අභියෝග රාශියකට අපි මුහුණ දෙමින් සිටිනවා. අධ්‍යාපන ඇමතිතුමිය හැටියට මම ඒ ගැන විශේෂයෙන්ම කථා කිරීම අවශ්‍යයි. පළමුවෙන්ම මම අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා, නිලධාරි මණ්ඩලය ඇතුළු සියලු සේවකයන්ට මගේ හෘදයාංගම ස්තුතිය පළ කර සිටිනවා. මේ ව්‍යසනය දැනගත් මොහොතේ සිටම හා ඊට පෙර සිටම මේ ගැන අනාවැකි පළ කරපු මොහොතේ සිටම ඔවුන් දැවැන්ත කාර්යභාරයක් කරමින් සිටිනවා. විභාග කොමසාරිස් ජනරාල්තුමිය, නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරුන් හා විභාග දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලයට ඒ වෙනුවෙන් මගේ කෘතඥතාව පළ කර සිටිනවා.

ඔබ සියලුදෙනා දන්නවා මේ දවස්වල උසස් පෙළ විභාගය පවත්වන්න නියමිතව තිබුණු බව. අපට ඒ පිළිබඳව දැඩි තීන්දු - තීරණ ඉතාම ඉක්මනින් ගන්න සිද්ධ වුණා. ඒ හැම අවස්ථාවකදීම රෑ දවල් නොබලා මේ තත්ත්වය monitor කරමින් ඔවුන් වගකීම් සහගතව මැදිහත්ව ඒ වෙනුවෙන් කටයුතු කළා. විභාග පත්‍රිකා ආරක්ෂා කිරීමට, සම්පූර්ණ කරන ලද පිළිතුරු පත්‍ර ආරක්ෂා කිරීමට, විභාග මධ්‍යස්ථාන සුරක්ෂිත කිරීමට සහ විභාග ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වා ගෙන යෑමට ඉතාම දුෂ්කර තත්ත්ව යටතේ වුවද ඔවුන් දරන ලද නොපසුබට උත්සාහය, ඔවුන්ගේ වෘත්තීයභාවය සහ කැපවීම වෙනුවෙන් මේ අගය කිරීම මා කළ යුතුව තිබෙනවා.

මේ අවස්ථාවේදී මම සිහිපත් කළ යුතුයි, තලවකැලේ සුමන මහා විද්‍යාලයේ පවත්වා ගෙන යන ප්‍රාදේශීය එක් රැස්කිරීමේ මධ්‍යස්ථානයේ සහකාර සම්බන්ධීකරණ නිලධාරිතුමා. එතුමා රාජකාරියේ නිරතව සිටියදී එතුමාගේ බිරිඳ, දරුවන් ඇතුළු සියලුදෙනා ඒ ප්‍රදේශයේ සිදු වූ නාය යෑම හේතුවෙන් ජීවිතක්ෂයට පත් වුණා. එය ඉතා සංවේගජනක සිදුවීමක්. රාජකාරිය වෙනුවෙන් කැපවී සිටි මොහොතක තමයි එතුමාට මේ තත්ත්වයට මුහුණ දෙන්න සිද්ධ වුණේ. ඒ අවස්ථාවේදී වුණත් ඔහුත්, ඔහුගේ සහෝදර නිලධාරිනුත් විභාග ප්‍රශ්න පත්‍රවල ආරක්ෂාව සහතික කරන්න කිසිසේත්ම පසුබට වුණේ නැහැ. ඒ හා සමානව අපගේ පාසල් ආරක්ෂා කිරීමට, බලපෑමට ලක් වූ පවුල්වලට සහාය වීමට සහ විභාග කටයුතු බාධාවකින් තොරව සිදු කරන බව සහතික කිරීමට දිවා රෑ නොබලා වැඩ කළ ගුරු විදුහල්පතිවරු සහ කාර්ය මණ්ඩලවලට, පළාත් අධ්‍යාපන ලේකම්වරුන්ට, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ට සහ සියලු පළාත් සහ දිස්ත්‍රික් අධ්‍යාපන බලධාරින්ට මගේ අවංක කෘතඥතාව පළ කරනවා. ආපදා මධ්‍යයේ වුවද ඔබතුමන්ලාගේ කැපවීම ආදර්ශවත්. සහන කටයුතු සම්බන්ධීකරණය කළ, වේගවත්ව සන්නිවේදන කටයුතු කරමින් තොරතුරු කළමනාකරණය කළ, සෑම අභියෝගයකටම ක්ෂණික ප්‍රතිචාර දැක්වූ විභාග දෙපාර්තමේන්තුවේ සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයට මගේ ගෞරවය පළ කරනවා. උසස් අධ්‍යාපන අංශය, වෘත්තීය අධ්‍යාපන අංශය සහ සියලු අනුබද්ධ ආයතනවල ආයතන ප්‍රධානීන් සහ කාර්ය මණ්ඩලය දැක්වූ දායකත්වය වෙනුවෙන් මම ස්තුතිවන්ත වෙනවා. මෙම අර්බුදය තුළ සම්පත්, පහසුකම් සහ පුහුණු කාර්ය මණ්ඩලය සැපයීමට ඔබ දැක්වූ සහයෝගය, නම්‍යශීලීභාවය සහ සූදානම සැබෑ ජාතික සහයෝගිතාව පිළිබිඹු කරනවා. මෙම කාල පරිච්ඡේදය තුළ අප දැරූ වැදගත්ම වගකීමක් වූයේ අපේ සිසුන්ට අඛණ්ඩ

අධ්‍යාපනයක් සහතික කිරීම සහ මානසිකව ඔවුන් යථාවත් කිරීමයි. ඒ සඳහා ඔබ සියලුදෙනාගේම සහයෝගය ඉදිරියටත් අපි බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා රජයක් ලෙස අප වගකීම් සහගතව පෙනී සිටිනවා. ජනාධිපති අරමුදලින් විපතට පත් වූ සියලු පාසල් දරුවන්ට රුපියල් 25,000ක් දෙන බව අද ප්‍රකාශයට පත් වුණා. එවැනි ක්‍රියාමාර්ග තුළින් අපි ඔවුන්ගේ අධ්‍යාපනය අඛණ්ඩව පවත්වා ගෙන යැමට රජයක් ලෙස කැප වෙන බව නැවතත් අවධාරණය කරනවා.

අමාත්‍යාංශ, දිස්ත්‍රික් පාසල්, පළාත් පාසල් සහ විශ්වවිද්‍යාල හරහා සිදු කරන මේ සාමූහික උත්සාහය විසින් අපේ අධ්‍යාපන පද්ධතිය හුදෙක් පද්ධතියක් පමණක් නොව එකම පවුලක් බව අපි ඔප්පු කරනවා. මේ දැවැන්ත ජාතික කර්තව්‍යයට දායක වූ සෑම පුද්ගලයෙකුටම අධ්‍යාපන අමාත්‍යවරිය වශයෙන් මම ගෞරව කරනවා. සෑම විටම අප පවසන පරිදි අපේ ශක්තිය අපේ රටේ පුරවැසියන්. ඔවුන්ගේ සුවිශේෂී කාරුණික හදවත් අනෙකා වෙනුවෙන් සහකම්පනය වෙනවා. ඒ වාගේම ඕනෑම අභියෝගයකට මුහුණ දෙන උදාර මිනිස්කම් සහිත ඒ පුරවැසියන්ගේ හදවත් ගැන අපි නැවත නැවතත් ආඩම්බර වෙනවා. මහා විපතක් ඉදිරියේ ප්‍රාණවත්ව, සක්‍රියව, මිනිස්කමින් යුතුව ඒ සියල්ලන් රටක් වශයෙන් අපේ ශක්තිය කුමක්දැයි මුළු ලෝකයටම කියා සිටිනවා. සියලු අසීරුතා අතුරින් මට කරන්න පුළුවන් දෙයක් තිබෙනවාය කියමින් පැමිණ පැනඩෝල් පැකට් එකක් පරිත්‍යාග කළ ඒ අම්මා, සහකම්පනය, කරුණාව, උදාරකම සහ එකමුතුකම මනාව පෙන්වන උදාහරණයක්. මේක අසීරු මොහොතක්. අසීරුවෙන් ජය ගත යුතු අභියෝගාත්මක ගමනක් අප ඉදිරියේ තිබෙනවා. එකිනෙකා කෙරෙහි කරුණාවෙන්, ආදරයෙන් සහ අවබෝධයෙන් කටයුතු කිරීම මේ මොහොතේදී අත්‍යවශ්‍යයි. ජීවිත අහිමි වූ සියල්ලන් වෙනුවෙන් අපේ හදවත්වල නැඟෙන වේදනාව සහ කම්පනය කිසිදා අපේ හදවතින් ඈත් නොවෙනවා. නමුත්, අපි ඉදිරියට යා යුතුමයි. මේ දැවැන්ත ව්‍යසනයෙන් හිස ඔසවා අපි නැඟී සිටිය යුතුමයි. එකමුතුකමින්, ධෛර්යයෙන්, අලුත් ආකල්පවලින් යුතුව, අලුත් පණක් සහිතව අපි නැඟී සිටිය යුතුමයි. මේ මොහොතේ රජය විසින් ඉටු කරන භාරදූර කාර්යය කෙරෙහි විශ්වාසය තබා ඒ සමඟ එකතු වන සියලුදෙනාට මම නැවත වරක් ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම මේ මොහොතේදී සියලු පක්ෂ, පාට පසෙක දමා මේ රට යළි ගොඩනැඟීම වෙනුවෙන් එකතු වී වැඩ කරමු කියන ඉල්ලීමත් අපේ සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට මම ඉදිරිපත් කරන්න කැමැතියි. විදුලිය බිඳ වැටීම, ජලය සහ ආහාර ලබා ගැනීමේ අපහසුතා ඇතුළු අප්‍රමාණ බාධා හමුවේත් ඔබ පෙන්වූ ඉවසීම, අපේ ජනතාව පෙන්වූ ඉවසීම, අභියෝගවලට මුහුණ දීමේ ශක්තිය අපේ සමස්ත ජාතියේම ශක්තිය බව මම තරයේ විශ්වාස කරනවා. මෙම අසීරු කාලය පුරා නොයෙක් ආකාරයෙන් ඔබ දැක්වූ දායකත්වයට, ඔබ පෙන්වූ ධෛර්යයට සහ එකමුතුකමට මගේ ගෞරවය සහ ස්තුතිය පළ කරනවා. අපි එකතු වී එකමුතුව මේ අභියෝගය ජය ගනිමු කියන යෝජනාව කරමින් මා නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු එම්.ඒ.එම්. තාහිර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කිංස් නෙල්සන් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு கிங்ஸ் நெல்சன் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி அவர்கள் தலைமை வகித்தார்கள்*

*Whereupon THE HON. KINS NELSON left the Chair and THE HON. LAKSHMAN NIPUNA ARACHCHI took the Chair.*

[பி.ப. 2.43]

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு சம்பந்தமான விவாதம் நடைபெறுகின்றபோதிலும், அதை விடுத்து, இந்த நாட்டில் ஏற்பட்டிருக்கின்ற இக்கட்டான சூழ்நிலையில் மக்களுடைய துயரத்தில் பங்குகொள்ளும் வகையில் அவர்கள் எதிர்கொள்ளும் பிரச்சினைகள் தொடர்பாக எனது கருத்துக்களை முன்வைக்க இந்தச் சந்தர்ப்பத்தைப் பயன்படுத்திக்கொள்ள விரும்புகின்றேன்.

இந்த நாட்டில் ஏற்பட்டிருக்கின்ற அனர்த்தமானது யாராலும் நம்பவோ, ஏற்றுக்கொள்ளவோ முடியாதளவுக்குப் பாரிய பாதிப்புக்களை ஏற்படுத்தியிருக்கிறது. இதனால் 15 இலட்சத்துக்கும் மேற்பட்ட மக்கள் பாதிக்கப்பட்டு இருப்பதுடன், அதிகமான உயிர்ச் சேதங்களும் ஏற்பட்டிருக் கின்றது; இன்னும் இறந்தவர்களின் உடல்களைத் தேடிக்கொண்டு இருக்கின்றோம். மேலும், பல கோடி ரூபாய் பெறுமதியான சொத்துக்கள் இழக்கப்பட்டிருக்கின்றது. இவ்வாறானதொரு சந்தர்ப்பத்தில், இந்த நாட்டைக் கட்டியெழுப்புவதற்கு ஒன்றுபட வேண்டுமென கௌரவ பிரதம அமைச்சர் அவர்கள் இந்தப் பாராளுமன்றத்தைக் கேட்டுக்கொண்டார். அவர் ஒரு பெண் என்ற அடிப்படையில், ஒரு தாய்மை உணர்வோடு பேசியிருக்கிறாரென நான் நம்புகின்றேன்.

கௌரவ பிரதம அமைச்சர் அவர்களே, நீங்கள் கருணை உள்ளத்தோடு விடுத்திருக்கின்ற இவ்வாறான அழைப்பை இந்த அனர்த்த நிலைமைக்கு மாத்திரம் மட்டுப்படுத்தாமல், தொடர்ச்சியாக இந்தப் பாராளுமன்றக் காலம் முழுவதும் எதிர்க்கட்சியினரின் ஒத்துழைப்பைப் பெறும்வகையில் பயன்படுத்த வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக்கொள்ளுகின்றேன். இந்த நாடு கடந்த கால ஆட்சியாளர்களின் கைகளிலிருந்து விடுவிக்கப்பட்டு உங்களுடைய கைகளுக்குக் கிடைக்கப் பெற்றுள்ளதையிட்டு மக்கள் உண்மையிலேயே மிகவும் சந்தோஷம் அடைந்திருக் கின்றார்கள். மக்கள் 159 பாராளுமன்ற உறுப்பினர்களை உங்களுடைய கட்சிக்கு வழங்கியிருப்பது இந்த நாட்டைச் சிறப்பான முறையில் வழிநடாத்த வேண்டும் என்ற நோக்கத்திற்காகத்தான். எனவே, எதிர்க்கட்சியினரையும் இணைத்துக்கொண்டு உங்களுடைய பயணத்தை தொடர வேண்டிய தார்மீகப் பொறுப்பு உங்களுக்கு இருக்கின்றது. இப்போது நாங்கள் இந்தப் பாராளுமன்றக் காலத்தின் ஒரு வருடத்தைக் கழித்திருக்கின்றோம். இந்தக் காலகட்டத்தில், முன்பு ஆட்சியில் இருந்தவர்கள் எவ்வாறு எதிர்க்கட்சியை வழிநடத்தினார்களோ அதேபோன்றுதான் நீங்களும் வழிநடத்துவதை நாங்கள் உணர்கிறோம்.

[ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා]

இது என்னுடைய முதலாவது பாராளுமன்றக் காலம். இதற்கு முன்னர் நான் ஒரு பிரதேச சபையில் மூன்று தடவை - 14 வருடங்கள் - ஓர் உள்ளூராட்சி மன்றத் தலைவராகத் தெரிவாகியிருந்து அந்தப் பிரதேசத்தில் ஏற்பட்ட வெள்ளப் பெருக்கு உட்பட பல்வேறு இன்னல்களுக்கும் முகங்கொடுத்து, அங்குள்ள மக்களோடு சேர்ந்து பயணித்த ஒருவன். 2011ஆம் ஆண்டு கிழக்கு மாகாணத்தில் 1978இல் ஏற்பட்டதைவிடப் பாரிய வெள்ள அனர்த்தம் ஏற்பட்டபோது, மூன்று நாட்கள் தொடர்ச்சியாக நித்திரையின்றி, உணவின்றி அங்குள்ள மக்களோடு சேர்ந்து செயற்பட்ட அனுபவம் எனக்கு இருக்கின்றது. அப்போது அந்தப் பிரதேச சபையில் எதிர்க்கட்சி என்ற ஒன்று இல்லை என்ற நிலையில் எல்லோரும் அந்த மக்களுக்குப் பணி செய்ய வந்தவர்கள் என்ற அடிப்படையில் இணைந்து செயற்பட்டதன் பிரதிபலனாகத்தான் இன்று நான் இந்த அவையில் அந்த மக்களின் அங்கீகாரத்துடன் பேசிக்கொண்டு இருக்கின்றேன். *அல்ஹம்துலில்லாஹ்!*

நாங்கள் இந்தப் பாராளுமன்றத்தை 159 பேர் மாத்திரம் தனித்து இயங்குகின்ற ஓர் அவையாகப் பார்க்க முடியாது. நீங்கள் இங்கிருக்கின்ற மற்றவர்களின் கருத்துக்களையும் அனுபவங்களையும் பெற்றுக்கொள்ளும் வகையில் அத்தனை பேரையும் இணைத்துச் செயற்படவேண்டிய அவசியம் இருக்கின்றது. இந்தப் பாராளுமன்றத்துக்கு வெளியில் இருக்கின்ற துறைசார்ந்த வல்லுநர்களின் கருத்துக்களையும் அனுபவங்களையும் பெற்று நாங்கள் இந்த நாட்டைக் கட்டியெழுப்ப வேண்டும். அதற்கு எந்த வகையில் உங்களுக்கு உதவி செய்ய வேண்டுமோ, கைகோர்க்க வேண்டுமோ அதற்கு நாங்கள் என்றும் தயாராக இருக்கின்றோம் என்ற செய்தியை இந்த இடத்தில் கூறிக்கொள்ளுகின்றேன்.

இந்த அனர்த்தத்தால் உயிரிழந்தவர்களின் குடும்பத்தினருக்கு எங்களுடைய ஆழ்ந்த அனுதாபங்களை இச்சந்தர்ப்பத்தில் தெரிவித்துக்கொள்வதுடன், சொத்துக்களையும் உடைமைகளையும் இழந்த மக்களுக்கு எங்களுடைய கவலையையும் தெரிவித்துக்கொள்ளுகின்றோம். இந்த இடரின்பொழுது தன்னார்வம் மிக்க தொண்டு நிறுவனங்கள், பள்ளிவாசல்கள், விகாரைகள், கோவில்கள், ஏனைய மதத் தலங்கள் ஆகியவற்றின் தலைவர்களும் பணியாளர்களும் ஒன்றிணைந்து செயற்பட்டு இருக்கிறார்கள். மீட்பு நடவடிக்கையின்போது இந்த நாட்டின் முப்படையினர் தங்களுடைய உயிரைக்கூட இழந்திருக்கிறார்கள். அவர்கள் இன்றுவரை மக்களின் இறந்த உடல்களை மீட்பதிலும், அவர்களின் உடைமைகளைப் பாதுகாப்பதிலும் கூடுதலான கவனம் செலுத்தி வருகிறார்கள். மேலும், வைத்தியர்கள் உட்பட சுகாதாரத் துறையினர், சிவில் சமூக அமைப்பினர், ஊடகத் துறையினர் எனப் பலரும் தம்மாலான பணிகளைச் செய்து வருகின்றனர். ஒருசில ஊடகங்கள் இந்த அரசுக்கு எதிரான கருத்துக்களை முன்வைத்தாலும்கூட, பெரும்பாலான ஊடகங்கள் குறிப்பாக அனர்த்தம் குறைவாக ஏற்பட்ட நாட்டின் ஏனைய பகுதிகளிலுள்ள மக்களின் அனுசரணையுடன் பாதிக்கப்பட்ட மக்களுக்குச் சேவை செய்வதற்கு முன்வந்திருக்கின்றன. இவர்கள் அனைவருக்கும் நாங்கள் கௌரவமிக்க பாராட்டுதல்களைத் தெரிவித்து, மேலும் ஊக்கப்படுத்த வேண்டிய தேவைப்பாடு இருக்கின்றது.

நாட்டை மீளக் கட்டியெழுப்புவதற்கென மாண்புமிகு சனாதிபதி அவர்கள் குழுவொன்றை அமைத்திருக்கிறார். இந்தக் குழுவில் துறை சார்ந்தவர்களை அதிகமாக உள்ளீர்ப்புச் செய்ய வேண்டுமென அதிகமானவர்கள் கருத்துக் கூறியிருந்தார்கள். அதற்கு, குறித்த நிதியைப் பெறுவதற்காக மாத்திரமே அவர்கள் நியமிக்கப்பட்டிருப்பதாக ஆளும் தரப்பினர் கூறினார்கள். இதில் என்னுடைய கருத்தாக இருப்பது, கிரிக்கெட் என்பது இந்த உலகத்திலுள்ள அனைவரையும் ஈர்க்கக்கூடிய ஒரு விளையாட்டாகக் காணப்படுவதால், ஓய்வுநிலையில் இருக்கின்ற எமது கிரிக்கெட் வீரர்களை இதில் உள்வாங்குவதன்மூலமாக மிகக் கூடுதலான நிதியை நாட்டுக்குக் கொண்டுவருவதற்குச் சந்தர்ப்பம் இருக்கின்றது என்பதாகும். அதன்மூலம் இந்த நாட்டு மக்கள் அதிகளவான பயனைப் பெறுவதற்கு வாய்ப்பு இருக்கின்றது என்பதை இச்சந்தர்ப்பத்தில் நான் கூறிக்கொள்ளுகின்றேன்.

இந்த அனர்த்தத்தால் மலையகம் மிகுந்த பாதிப்புக்கு உள்ளாகியிருக்கின்றது. குறிப்பாக, கம்பளை நகரம் முழுமையாகப் பாதிக்கப்பட்டு பல வியாபாரத் தலங்கள் அழிவடைந்திருக்கின்றது. அதுபோல, கண்டி, பதுளை, நுவரெலியா போன்ற இடங்கள் உயிராபத்து நிறைந்த பிரதேசங்களாக இருந்தாலும், அங்கிருந்து வழிந்தோடும் நீரால் பொலன்னறுவை, அநுராதபுரம் மற்றும் வட, கிழக்குப் பிரதேசங்களிலுள்ள விவசாயக் காணிகள், வீடுகள், கால்நடைகள் என்பன கூடுதலான சேதத்துக்கு உள்ளாகியிருக்கின்றது. ஆகவே, மலையகத்தில் இருக்கின்ற மக்களின் வாழ்வாதாரத்தைக் கட்டியெழுப்புகின்ற அதேநேரம், முழு நாட்டையும் கட்டியெழுப்ப வேண்டுமாக இருந்தால், இந்தப் பிரதேசங்களில் பரந்து வாழுகின்ற உற்பத்தியாளர்களையும் விவசாயம் சார்ந்தவர்களையும் ஊக்கப்படுத்த வேண்டிய கட்டாயத் தேவை இருக்கின்றது. அதற்கான ஒரு வேலைத்திட்டத்தை உருவாக்கி, இந்த மக்களுக்கான பணிகளைச் செய்கின்ற விடயத்தில் கவனம் செலுத்தவேண்டும்.

இந்த இடர் நிலைமைகளைச் சீர்செய்வதில் தியாகங்களுக்கு மத்தியில் தங்களை அர்ப்பணித்துச் சேவை செய்கின்ற மின்சாரம், நீர் வழங்கல், சுகாதாரத் துறைகளைச் சார்ந்த உத்தியோகத்தர்களுக்கு இச்சந்தர்ப்பத்தில் எனது நன்றியைத் தெரிவித்துக்கொள்ளுகின்றேன். எங்களுடைய அம்பாறை பிரதேசத்தில் நூற்றுக்கும் அதிகமான அரிசி ஆலைகள் இருக்கின்றது. அங்கிருந்துதான் ஏனைய பிரதேசங்களுக்கு அரிசியை அனுப்பவேண்டிய தேவைப்பாடு இருக்கின்றது. இந்த அனர்த்தத்தில் பாதிக்கப்பட்ட மக்களுக்கு வழங்குவதற்காக, பாதிப்பு குறைந்த பிரதேசங்களில் இருக்கின்ற தனவந்தர்கள் கூடுதலாக அரிசியைப் பெறுவதற்கு முயற்சி செய்கின்றபோதும் அந்த அரிசி ஆலைகளை இயக்க முடியாமல் அங்குள்ள தொழில் முனைவோர் கஷ்டப்படுகின்றார்கள். அங்கு மின்சாரம் தடைப்பட்டிருக்கின்ற நிலையில் அந்தத் தொழிற்சாலைகளை இயங்கவைக்க முடியாதிருக்கின்றது.

மின்சாரத்தை வழங்குவதில் அங்கிருக்கின்ற பொறியியலாளர்களும் ஏனையவர்களும் கனத்த முயற்சிகளையெடுத்து வருகின்ற இந்தச் சந்தர்ப்பத்தில், கூடுதலான வாய்ப்பை அம்பாறையில் இருக்கின்ற அந்தத் தொழில்முனைவோருக்குப் பெற்றுக்கொடுக்க வேண்டும். அதேபோன்று, உணவகங்கள், வைத்தியசாலைகள் என்பனவும் மின்சாரம் இன்மையால் பாதிக்கப்பட்டு இருக்கின்றன. எனவே, இதில் கூடுதலான கவனத்தைச் செலுத்தவேண்டுமென இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக்கொள்ளுகின்றேன்.

அதுபோல், எங்களுடைய அகில இலங்கை மக்கள் காங்கிரஸ் தலைவரின் சொந்தப் பிரதேசமான மன்னாரும் மிகக் கூடுதலான பாதிப்புக்கு உட்பட்டிருக்கின்றது. அதனால் இன்றைய தினம் அவரால் இங்கு வர முடியவில்லை. அவர் நேற்றும் இன்றும் அந்தப் பிரதேசத்திலும் திருகோணமலை போன்ற பிரதேசங்களுக்கும் பயணத்தை மேற்கொண்டு, தன்னால் முடிந்த உதவிகளை அந்தப் பிரதேச மக்களுக்கு

வழங்கிக்கொண்டு இருக்கின்றார். இன்று மொத்தப் பாராளுமன்ற உறுப்பினர்களில் 1/3 பங்கினர்தான் இங்கு வருகை தந்திருக்கிறார்கள்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, අවසන් කරන්න.

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
මට තව විනාඩියක් දෙන්න.

இந்தச் சந்தர்ப்பத்தில், பாதிக்கப்பட்ட மக்களுக்கான பணிகளைச் செய்வதற்கு குழுக்களை நியமித்து, அவற்றுக்குத் தலைமைதாங்கி வழிநடாத்திக்கொண்டு இருக்கின்ற பாராளுமன்ற உறுப்பினர்களுக்கு நான் நன்றி கூறிக்கொள்ளுகின்றேன். இந்த அரசாங்கம் எல்லோரையும் இணைத்துச் செயற்படுகின்ற இந்தச் சந்தர்ப்பத்தில், நாட்டின் சனாதிபதி அவர்கள் ஏழை எளிய மக்களின் கஷ்டங்களை உணர்ந்தவர் என்ற அடிப்படையில், இரவு, பகல் பாராமல் பாதிக்கப்பட்ட மக்களுடைய பிரச்சினைகளைத் தீர்ப்பதற்காகச் செயற்பட்டுக்கொண்டு இருக்கிறார். அதற்காக அவருக்கும் அமைச்சர்களுக்கும் ஏனைய பாராளுமன்ற உறுப்பினர் களுக்கும் நன்றி தெரிவித்து, விடைபெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අනුර කරුණාතිලක අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.52]

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ඇතුළු වැදගත් අමාත්‍යාංශ ගණනාවක වැය ශීර්ෂ සාකච්ඡා කරන අද දවසේ අපි ඉන්නේ මැත ඉතිහාසයේ සිදු වූ අතිශයින්ම වේදනාකාරී, ඒ වාගේම බිහිසුණු ව්‍යසනයකට මුහුණ දුන් වටපිටාවක. සිය ගණනක් ජීවිත අහිමි වෙලා තිබෙනවා. තවත් සිය ගණනකට කුමක් වුණාද කියන එක තවමත් සොයා ගන්න නැහැ. ඒ විතරක් නොවෙයි, කෘෂිකර්මාන්තයේ වාගේම ප්‍රවාහනය වාගේ යටිතල පහසුකම්වලට විශාල විනාශයක් සිදු වෙච්ච මොහොතකයි අද දවසේ අපි මේ සාකච්ඡා කරන්නේ.

ලෝක ඉතිහාසයේ අළු මතින් නැඟී සිටි ජාතීන් පිළිබඳව අපි අහලා තිබෙනවා. ජර්මනිය, ජපානය වාගේ රටවල් දෙවන ලෝක යුද්ධයෙන් පසු, ඒ ව්‍යසනයම පෙරළා ඔවුන්ගේ රටේ සංවර්ධනය සඳහා, සමාජීය වශයෙන්, ආර්ථික වශයෙන් සංවර්ධනය සඳහා උපයෝගි කර ගත්තා. විශේෂයෙන් කොරියාව ගත්තොත්, කොරියානු යුද්ධයෙන් පසුව අධ්‍යාපනය සහ කර්මාන්තය මුල් කරගෙන, ඒක අරමුණ කර ගනිමින් අද වෙනකොට දැවැන්ත සංවර්ධනයක් අත්පත් කරගෙන තිබෙනවා. ඉන්දුනීසියාව ගත්තොත්, 2004දී අපිත් අත් දැකපු ඒ සුනාමි ව්‍යසනයෙන් පසු, ඒ ව්‍යසනය මතින් අලුත් ආරම්භයක් අරගෙන ඒ රට සංවර්ධනය කරන්න කටයුතු කරලා තිබෙනවා. මේ අය දිහා බැලුවාම අපට පෙනෙන විශේෂ කාරණය මෙකයි. දීර්ඝ කාලීන සැලසුම්, ප්‍රජා සාමූහිකත්වය, නව පද්ධති සහ නව තාක්ෂණය පිළිබඳ දරන විශ්වාසය, අතීතයෙන් ලද පාඩම්, කාර්යක්ෂම සහ දූරදර්ශී නායකත්වය, ජාත්‍යන්තර ප්‍රජාවගේ සහයෝගය කියන මෙන්න මේ විවිධ ක්ෂේත්‍ර ඔස්සේ කරපු කටයුතු නිසා තමයි ඔවුන්ට ඒ ජයග්‍රහණය අත්පත් කර ගන්න පුළුවන්කම ලැබිලා තිබෙන්නේ.

අතීතයේදීත්, මෑත ඉතිහාසයේදීත්, කොවිඩ් වසංගතයෙන් පසුවත්, සුනාමි ව්‍යසනයෙන් පසුවත් ජාතියක් හැටියට - ශ්‍රී ලාංකීය ජාතිය හැටියට - එකතු වෙලා නව ශ්‍රී ලංකාවක් බිහි කිරීම සඳහා අපට අවස්ථාවක් ලැබුණු බව අපි දන්නවා. නමුත්, අවාසනාවකට විවිධ හේතු නිසා ඒ අවස්ථාව මඟ හැරී ගියා. ඒ නිසා අද දවසේ අප මුහුණ දීලා තිබෙන ව්‍යසනය ගැන කල්පනා කරලා අප උත්සාහ කරන්න ඕනෑ, මේ ව්‍යවසනය හමුවේ නව ශ්‍රී ලංකාවක් ගොඩනැඟීම සඳහා අප මේ අවස්ථාව උපයෝගී කර ගන්නේ කොහොමද කියලා. විශේෂයෙන්ම ජාතින් හැටියට බෙදිලා කල්පනා කරන්නේ නැතුව, මොන දේශපාලන මතවාද තිබුණත් ඒ දේශපාලන මතවාද පැත්තකින් තියලා ශ්‍රී ලාංකීය ජාතිය හැටියට කල්පනා කරලා පොදු සාමූහික වැඩ පිළිවෙළක් තුළ කටයුතු කළොත්, අපට මෙය අවස්ථාවක් කර ගන්න පුළුවන්, ලෝකය තුළ ශ්‍රී ලංකාව ඉහළ තැනකට ඔසවා තබන්න; නව ශ්‍රී ලංකාවක් ගොඩනඟන්න.

"Rebuilding Sri Lanka" වැඩසටහන තුළින් ඇත්තටම අප බලාපොරොත්තු වන්නේ මෙන්න මේ උත්තුංග කාර්යය කිරීමටයි. අපි මෙහිදී බලාපොරොත්තු වන්නේ හුදෙක් අරමුදලක් ඇති කරලා මේ වෙච්ච විනාශයට පිළියම් යෙදීම පමණක් නොවෙයි. විවිධ වෘත්තිකයන්ගේ සහ විද්වතුන්ගේ දායකත්වය, ඒ වාගේම ජාත්‍යන්තර ප්‍රජාවගේ සහයෝගය ඇතුව, විවිධ ක්ෂේත්‍ර ඔස්සේ කල්පනා කරමින්, නිශ්චිත සැලසුමක් අනුව නව ශ්‍රී ලංකාවක් ගොඩනැඟීම තමයි මේ "Rebuilding Sri Lanka" වැඩසටහන තුළින් අපි බලාපොරොත්තු වන්නේ. ඒ නිසා අප අතර මොන වෙනස්කම් තිබුණත්, මතවාදීව මොන වෙනස්කම් තිබුණත්, රට ගොඩනඟන ආර්ථික සංවර්ධන සැලැස්ම, ආර්ථික උපාය මාර්ග පිළිබඳව අප තුළ මතවාදීව කුමන වෙනස්කම් තිබුණත්, මොහොතකට ඒ වෙනස්කම් පැත්තකට දමලා මේ මොහොතේ රටට බලපා තිබෙන ව්‍යසනයේ තරම සහ බිහිසුණුකම තේරුම් අරගෙන නව ශ්‍රී ලාංකීය ජාතියක් හැටියට කල්පනා කරලා කටයුතු කළ හැකියි කියා අපි විශ්වාස කරනවා. ඒ කර්තව්‍යය සම්පූර්ණ කර ගැනීම සඳහා එකට එකතු වෙලා වැඩ කරමු කියා රජය හැටියට අපි මේ අවස්ථාවේදී සියලුදෙනාටම ආරාධනා කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වාගේ ව්‍යසනයකට මුහුණ දුන්නු හැම වෙලාවකම විශේෂයෙන්ම ජාත්‍යන්තර ප්‍රජාව අපත් සමඟ සිටි බව, අපට ආධාර දෙන්න, අපට උදව් කරන්න ඉදිරිපත් වුණු බව අපි දන්නවා. අප මේ බිහිසුණු අනතුරට, මේ බිහිසුණු ව්‍යසනයට මුහුණ දුන් පළමු පැය කිහිපයේ පටන් අපේ ජාත්‍යන්තර මිතුරන් අපට සහයෝගය ලබා දෙන්න ඉදිරිපත් වුණා. විශේෂයෙන්ම ඉන්දියාවේ "වික්‍රාන්ට්" කියන නැව ඒ වනකොටත් කොළඹ වරායේයි තිබුණේ. ඒ නැව තුළ තිබිච්ච Mi-17V-5, Cheetah helicopter වාගේ හෙලිකොප්ටර් යානා කිහිපයක් යොදාගෙන හදිසි මුදා ගැනීම් සඳහා ඒ අය ඉතාම ඉක්මනින්, සැලසුම් සහගතව කටයුතු කළා. ඒ වාගේම 80කට, 100කට ආසන්න පිරිසක් මුදා ගැනීමේ මෙහෙයුම් සඳහා ඉදිරිපත් වුණා. ඒ අය තවමත් ඒ මෙහෙයුම්වල නිරත වෙමින් ඉන්නවා. ඒ වාගේම රටවල් 70කට ආසන්න ප්‍රමාණයක් මේ වන කොටත් අපට

[ගරු අනුර කරුණාතිලක මහතා]

ජාත්‍යන්තර මානුෂීය ආධාර ලබා දෙන්න ඉදිරිපත් වෙලා තිබෙනවා. චීනය, ජර්මනිය, ජපානය, මාලදිවයින, නේපාලය, ඇමෙරිකා එක්සත් ජනපදය ඇතුළු රටවල් 70කට ආසන්න ප්‍රමාණයක් මානුෂීය අධාර ලබා දීම සඳහා ඉදිරිපත් වෙලා තිබෙනවා. ටොන් 200කට ආසන්න මානුෂීය ආධාර රැගත් පාකිස්තාන නැවක් මේ වනකොටත් පිටත් වෙලා තිබෙනවා. එය ඉතාම ඉක්මනින් කොළඹ වරායට ළඟා වෙයි.

එමඟින් අපට පෙනෙන්නේ, රටක් හැටියට මුහුණ දුන් මේ අනතුරෙන්, ව්‍යසනයෙන් මිදෙන්න ශ්‍රී ලාංකීය ප්‍රජාව හැටියට අප අත්වැල් බැඳගෙන වැඩ කරනවා වාගේම ජාත්‍යන්තර ප්‍රජාවත් ඒ සඳහා අපට සහයෝගය ලබා දෙමින්, ආධාර ලබා දෙමින් සිටින බවයි. ඉදිරියේදීත් අපේ රට ගොඩනැඟීම සඳහා අවශ්‍ය වන අරමුදල් සම්පාදනය කරන්න, අවශ්‍ය උපකරණ ලබා දෙන්න ඔවුන් ඉදිරිපත් වෙනවා කියන පණිවුඩය දැනටමත් අපට ලබා දී තිබෙනවා. ඇත්තටම මේ අමාරුම මොහොතේ ශ්‍රී ලංකාව හැටියට අප ලෝකය තුළ තනි වෙලා නැහැ කියන පණිවුඩය අපි අපේ රටේ ජනතාවට මේ මොහොතේ ලබා දෙන්න කැමැතියි. ඒ වාගේම විවිධ විදේශීය සංවිධාන, විදෙස්ගත ශ්‍රී ලාංකිකයන් ඉදිරිපත් වෙලා සිටිනවා, මේ මොහොතේ අපට උදවු කරන්න. අපි ඒ අයට කියන්න කැමැතියි, විශේෂයෙන්ම ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත යොමු කරන ආධාර රේගු සහ අනෙකුත් බදු අය කිරීමකින් තොරව නිදහස් කරන්න අවශ්‍ය ප්‍රතිපත්තිමය තීන්දුව අප මේ වන කොටත් ගෙන තිබෙන බව. ඒ වාගේම, රේගු සහ අනෙකුත් බදු, මුදල් රෙගුලාසි සහ බලපත්‍රවලින් නිදහස්ව ඒ මානුෂීය ආධාර ඉතා ඉක්මනින් නිදහස් කිරීම සඳහා අවශ්‍ය පියවර අපි අරගෙන තිබෙනවා. ඒ වාගේම ගුවන් තොටුපොළටත්, වරාය තුළටත් විදේශීය රටවලින්, විදේශීය ආයතනවලින්, පෞද්ගලික ආයතනවලින් සහ පෞද්ගලිකව එවන සියලු මානුෂීය ආධාර ඉතා ඉක්මනින් නිදහස් කර ගැනීම සඳහා වරාය තුළත්, ගුවන් තොටුපොළ තුළත් විශේෂ ඒකක, විශේෂ කවුළු අපි මේ වන කොටත් ආරම්භ කර තිබෙනවා. ඒ, එම කටයුතු ඉක්මනින් කරගැනීම සඳහායි. ඒ කවුළු තුළින්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා රේගුව, ගුවන් තොටුපොළ තුළ ශ්‍රී ලංකා ගුවන් තොටුපොළ අධිකාරිය, SriLankan Airlines, වරාය ආදී සියලු ආයතනවල නිලධාරින් එකට එකතු වෙලා විශේෂ මෙහෙයුම් කමිටු මඟින් මේ මානුෂීය ආධාර නිදහස් කිරීම සඳහා කටයුතු කරනවා. ඉහත කී බදු නිදහස් කිරීම් පිළිබඳ වැඩිදුර තොරතුරු www.customs.gov.lk කියන වෙබ් අඩවියේ පළ කර තිබෙනවා. මොන විධියේ බදුවලින්ද නිදහස් වෙන්නේ, කොහොමද වරාය ගාස්තු නිදහස් කරන්නේ, කොහොමද ගුවන් තොටුපොළ ගාස්තු නිදහස් කරන්නේ කියලා එහි සඳහන්ව තිබෙනවා.

ඒ වාගේම අපි එතැනදී පියවර ගෙන තිබෙනවා, ආරක්ෂක ලේකම්වරයා වෙත, එහෙම නැත්නම් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත යොමු වන ආධාර මුදල් එකී ආකාරයට නිදහස් කරන්න. ඒ වාගේම අපි දන්නවා, මේ වාගේ වෙලාවක ලෝකය තුළ ඉන්න විදේශගත ශ්‍රී ලාංකිකයන්, විවිධ ආයතන මේ රටට උදවු කරන්න විවිධ පුද්ගලයන්ගේ නමින්, විවිධ ආයතන නමින් ආධාර එවනවා කියලා. ඒ අය කැමැති නම් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට හෝ ආරක්ෂක ලේකම්වරයා වෙත ඒ ආධාර යොමු කරන්න, ඒ ආධාර එවන ආයතනය කුමක් වුණත්, ආධාර එවන පුද්ගලයන් කවුරු වුණත් ඒ අදාළ බදු මුදල්වලින් සහ රේගු නිෂ්කාසන බදු මුදල්වලින් නිදහස් කරලා ඉතා ඉක්මනින් ඒ ආධාර මුදල්, ඒ මානුෂීය ආධාර රට තුළට ගලා ඒමට සැලැස්වීම සඳහා වන වැඩ පිළිවෙළක් අපි සකස් කර තිබෙනවා. ඒ වාගේම, අපි විදේශගත ශ්‍රී ලාංකිකයන්ට දන්වා සිටිනවා, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හැටියට අපට මේ මොහොතේ අවශ්‍ය මොන වාගේ මානුෂීය ආධාරද -අවශ්‍ය බෙහෙත් ද්‍රව්‍යද, වෙනත් ද්‍රව්‍යද- යන්න සම්බන්ධයෙන් වන ලැයිස්තුවක් මේ වන කොටත් ප්‍රකාශයට පත් කර තිබෙන බව. ඒ සඳහා අවශ්‍ය වන වැඩිදුර තොරතුරු www.donate.gov.lk කියන වෙබ් අඩවියේ සඳහන් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මෙහිදී තවත් කාරණයක් සඳහන් කරන්න කැමැතියි. මේ ව්‍යසනය ආරම්භ වෙච්ච මුල් පැය 24 තුළ ගුවන් තොටුපොළේ 12,000කට අධික ගුවන් මගීන් පිරිසක් සිර වෙලා සිටියා. හැබැයි, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියත්, ගුවන් තොටුපොළ අධිකාරියත්, SriLankan Airlines එකත් එකට එකතු වෙලා අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ මූලිකත්වයෙන් විශේෂ මෙහෙයුම් කමිටුවක් හරහා ඒ ගුවන් මගීන් ඉතා ඉක්මනින් තමන්ගේ ගමනාන්ත වෙත යැවීම සඳහා පියවර ගත්තා. ඒ ගැන අපට ඇත්තටම සන්තෝෂයි. මොකද, ඒ අදාළ ආයතනවල ඉහළම නිලධාරියාගේ ඉඳලා පහළම නිලධාරියා දක්වා එකට එකතු වෙලා තනි කණ්ඩායමක්, තනි පවුලක් හැටියට ගත්තු ඒ ක්‍රියා මාර්ගය නිසා ඉතා කෙටි කාලයක් තුළ අපේ ගුවන් තොටුපොළේ කටයුතු සාමාන්‍ය තත්ත්වයට පත් කර ගන්න අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා. ඒ සඳහා අපට ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් සහ ශ්‍රී ලංකා නාවික හමුදාවෙන් ලැබුණු සහයෝගය මම මේ අවස්ථාවේ විශේෂයෙන් මතක් කරන්න කැමැතියි. ඒ වාගේම, මේ රට තුළ මේ කියන සහන කටයුතු මෙහෙයවමින් පුද්ගලයන් ගලවා ගන්න කටයුතු කරපු විවිධ කණ්ඩායම්වලටත් අපි මේ අවස්ථාවේදී විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා.

මම වැඩ කටයුතු කරපු බියගම ආසනය තුළ 20,000කට ආසන්න පුද්ගලයන් පිරිසක්, 6,000කට ආසන්න පවුල් සංඛ්‍යාවක් මේ ව්‍යසනයේ ගොදුරු බවට පත් වෙලා සිටියා. එහි සුරක්ෂිත කඳවුරු 19ක් තිබුණා. ඒ අයට සහන සලස්වන්න අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරු, ප්‍රාදේශීය ලේකම්වරු, ග්‍රාම නිලධාරින්, ක්ෂේත්‍ර නිලධාරින් ඇතුළු සියලු රාජ්‍ය නිලධාරින් දිවා රෑ නොබලා, කන්නේ බොන්නේ නැතිව, තමුන්ගේ පවුල ගැන හිතන්නේ නැතිව ඉතා වෙහෙස මහන්සියෙන්, කැපවීමෙන් කටයුතු කළා. ඔවුන් තමන්ගේ වෘත්තීය සීමාවෙන් ඔබ්බට ගිහිල්ලා වැඩ කළා. ඒ අය වෙනුවෙන් විශේෂ ස්තුතියක් මම මේ අවස්ථාවේදී පුද කරන්න කැමැතියි.

ඒ වාගේම නාවික හමුදාව, යුද්ධ හමුදාව, පොලීසිය ඇතුළු ආරක්ෂක අංශත්, ලංකා විදුලිබල මණ්ඩලය, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, මාර්ග සංවර්ධන අධිකාරිය ඇතුළු යටිතල පහසුකම් සපයන ආයතනත් මේ මොහොතේ ඉතා කැපවීමෙන් වැඩ කළාය කියන එකත් සඳහන් කරන්න කැමැතියි.

ඒ වාගේම තමයි, අපේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්, ඇමතිවරුන් ගැන මම විශේෂයෙන් කථා කරන්නේ නැහැ. නමුත්, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු -ආණ්ඩු පක්ෂයේ වාගේම විපක්ෂයේ මන්ත්‍රීවරු- ගමට බැහැලා තමුන්ගේ හිතවතා, නෑදෑයා කවුද කියලා බලන්නේ නැතිව, කිසිවෙකුටත් වෙනසක් නැතිව ආගමික නායකයන්ගේ මඟ පෙන්වීම යටතේ මහ ජනතාව වෙනුවෙන් පොදුවේ විශාල වැඩ කොටසක් කළා.

මම අවසාන වශයෙන් මේ කාරණයත් මතක් කරන්න කැමැතියි. මම මුලින් සඳහන් කළා වාගේ අපට ඉතිහාසයේ විවිධ අවස්ථා තිබුණා, එකට එකතු වෙලා වැඩ කරන්න. සමහර අවස්ථා සතුටුදායක අවස්ථා; සමහර අවස්ථා ඛේදනීය අවස්ථා. මේකත් ඛේදනීය අවස්ථාවක්. මෙන්න මේ ඛේදනීය අවස්ථාවේදී අප හොඳින් හිතලා, කඳුළු මතින් නැඟිටලා, සැලසුම්සහගත ලෙස හැමෝම අත්වැල් බැඳගෙන කටයුතු කළොත් අපට නව ශ්‍රී

ලංකාවක් පිළිබඳ බලාපොරොත්තු ඇති කර ගන්න පුළුවන්. අන්න ඒ බලාපොරොත්තුව වෙනුවෙන් සියලුදෙනාම එකට එකතු වෙලා වැඩ කරමු කියා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා.

බෙහෙවින්ම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා.3.06]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන්ම මේ ආපදා තත්ත්වය නිසා අප සියලුදෙනා ඉන්නේ විශාල කනගාටුවකින් සහ විශාල වේදනාවකින්. මේක මේ රටේ සියලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස එකවර විශාල හානියකට පත් වූ ව්‍යසනයක්. මේක සුනාමි ව්‍යසනයෙන් පසුව ඇතිවූ විශාලම ආපදාවයි. 2016දී ආපු ගංවතුරෙන් ලංකාවේ ප්‍රදේශ පොඩි ප්‍රමාණයක් පමණයි ආපදාවට ලක් වුණේ.

නමුත්, මේ අවස්ථාවේ මුළු රටටම වාගේ මේ ව්‍යසනයට මුහුණ දෙන්න සිදු වුණා. ඒ ගැන අප කනගාටු විය යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2004දී සුනාමි ව්‍යසනයෙන් පසු 2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනත මේ රටේ සම්මත කළා. නමුත් වත්මන් ආණ්ඩුවට ඒ පිළිබඳව කිසිම අවබෝධයක් තිබුණාය කියලා මම විශ්වාස කරන්නේ නැහැ. මොකද, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ තිබුණු තත්ත්වය පිළිබඳව හරියට කල්පනා කරලා බැලුවා නම්, අපි සියලු කරුණු පිළිබඳව අධ්‍යයනය කරලා ඒ සඳහා දැවැන්ත වැඩ පිළිවෙළක් ස්ථාපිත කරලා තිබුණා. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වැඩ කළ පිට රටට ගිහිල්ලා training වූ, බොහෝ අත්දැකීම් තිබෙන අය ඉවත් කරලා මේ ආණ්ඩුව ආපු ගමන් කළේ වෙනත් එක එක අය පත් කරන්න කටයුතු කිරීමයි. මම දැක්කා උවිඳු කුරුකුලසූරිය මැතිතුමා ලියලා තිබුණු ඉතාම වැදගත් සටහනක්. ඒ සටහනේ තිබුණා, එතුමාගේ ඉල්ලීම නිසා තමයි ජනාධිපතිතුමා වෙන කෙනෙක් පත් කරන්න හදපු එක නතර කර ගත්තේ කියලා. මම හිතන විධියට, එතුමා නිසා ඒක යාන්තම් බේරුණා. වෙන එක්කෙනෙක් හිටියා නම් එහෙම වෙන්නේ නැහැ. ඒක තමයි ඒ කාරණයේදී අපට හිතන්න තිබෙන දේ.

සහන, පුනරුත්ථාපන කටයුතු සහ ප්‍රතිසංස්කරණ කටයුතු සැලසුම්කොට ක්‍රියාත්මක කරනු පිණිස තමයි ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය පිහිටෙව්වේ කියලා බොහොම පැහැදිලිව තිබෙනවා. මට හොඳට මතකයි, 2016 කාලයේ ගරු රවි කරුණානායක මැතිතුමා මුදල් ඇමතිවරයා විධියට ඒ සඳහා අපට විශාල ශක්තියක් ලබා දුන් බව. ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා තමයි ඒ කාලයේ ආපදා කළමනාකරණ ඇමතිවරයා විධියට කටයුතු කළේ. සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකටම අපි බෝට්ටු ලබා දුන්නා. ඊළඟට, මොනවා හෝ ඇදගෙන යෑමේ ප්‍රශ්න තිබෙනවා නම් ඒ සඳහා tractors ඇතුළු අවශ්‍ය සියල්ලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ලබා දුන්නා. කියන්න කනගාටුයි, මේ අවස්ථාවේ අපි කුරුණෑගල දිස්ත්‍රික්කයේ තිබුණු බෝට්ටු ගැන හොයලා බලනකොට ඒ සමහර ඒවායේ එන්ජින් වැඩ කරන්නේ නැහැ. සමහර ඒවා වැඩ කරන්නේම නැති තැනකට පත් වෙලා. ඒ කියන්නේ, මේ ආණ්ඩුවෙන් පසුගිය අවුරුදු එකහමාර, දෙක ඇතුළත ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හරහා කිසිදු ආකාරයේ වැඩ පිළිවෙළක් කරලා නැහැ. ඕනෑම අභියෝගයට මුහුණ දෙන්න පුළුවන් ආකාරයට, සැලසුම්සහගත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වන තත්ත්වයකට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පත් කරලා තිබුණේ නැහැ කියලා මේ කරුණු අනුව මම කියනවා. ඒ නිසා සහන සේවා ක්‍රියාදාමය ඉදිරියට ගෙන යෑම සඳහා අපට සිදු වුණා විශේෂයෙන්ම දකුණේ ඉන්න ධීවර සහෝදරයන්ට කථා කරලා ඔවුන්ගේ බෝට්ටු ගෙන්වා ගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ව්‍යසනය සම්බන්ධව තොරතුරු විශාල ප්‍රමාණයක් කලින් ලැබී තිබුණා. හැබැයි, ඒ ලැබී තිබුණු තොරතුරු මත අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ක්‍රියාත්මක වීමේ වැඩ පිළිවෙළක් ආණ්ඩුවට නොතිබීම ගැන අපි කනගාටු වනවා. එදා උදේ අපි ජනාධිපතිතුමා සමඟ සාකච්ඡා කරනකොටත් මම එතුමාට කිව්වා, අක්කර අඩි 55,000 පැනලා නම් අපේ දැදුරු ඔය ජලාශය අනිවාර්යයෙන් පිරිලා තිබෙන්නේ, එතකොට අනෙක් පැත්තට ගිල්ම ගහනවා කියලා. එහිදී එතුමා කිව්වා, පුළුවන් තරම් ඉක්මනින් ඒකට වැඩකටයුතු කරමු කියලා. නමුත්, ඒක ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ නිසා මොකද වුණේ? සෑහෙන වෙලාවක් පරක්කු වෙලා තමයි වාන් දොරටු විවෘත කර ගන්න අපට හැකියාව ලැබුණේ. ඇත්තටම එහා පැත්තෙන් එන වතුර පාරත්, ජලාශයෙන් පිට කරන වතුර පාරත් ගත්තාම විශාල ප්‍රමාණයක්. කාටවත් හිතා ගන්න බැරි ජල කඳක් එකවර මුදා හරින තැනකට පත් වුණා. ඒකේ ප්‍රතිඵලය තමයි මේ. එදා ජනාධිපතිතුමා හිටපු රැස්වීමේත් මම පැහැදිලිව කිව්වා, වාරියපොළ, නිකවැරටිය, පඬුවස්නුවර, බිංගිරිය සහ එතැනින් එහාට ගියාම පුත්තලම දිස්ත්‍රික්කයටත් මෙය බලපානවා, මේ ගැන ඉක්මනින් අපි ක්‍රියා කළොත් හොඳයි, ජනාධිපතිතුමනි කියලා. මට වැඩි වෙලා එතැන ඉන්න හම්බ වුණේ නැහැ. මම එළියට ආවා. නමුත්, එම කටයුත්ත ටිකක් ප්‍රමාද වුණා. කෙසේ වෙතත්, අපි ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වනවා මේ ක්‍රියාවලියට යම්කිසි විධියකට විපක්ෂයත් සම්බන්ධ කර ගැනීමට කටයුතු කිරීම ගැන. මම පෞද්ගලිකව කාටවත් චෝදනා කරන්න යන්නේ නැහැ. මේ අවස්ථාවේ අපේ සහායත් අපට පුළුවන් විධියට ආණ්ඩුවට ලබා දුන්නා. අපි කිසි විටෙක විවේචනය කරන්න ගියේ නැහැ. අපි මේ ගැන කථා කරන්නේ වෙන කාරණයක් නිසා නොවෙයි. මීට වඩා ශක්තිමත් විධියට කටයුතු කළා නම් අපට මෙම ව්‍යසනය මීට වඩා අඩු තත්ත්වයකින් බේර ගන්න තිබුණාය කියන කාරණය මම මෙතැනදී කියන්න වුවමනා නිසායි. වැඩේ වුණාට පස්සේ තමයි ආණ්ඩුව විධියට අවශ්‍ය ක්‍රියාමාර්ග ලඟි ලඟියේ ක්‍රියාත්මක කරන්න තමුන්නාන්සේලාට සිදු වුණේ.

12වෙනි දා වෙනකොටත් මේ රටේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මේ සඳහා කළ යුතු වැඩකටයුතු ගැන ප්‍රකාශ කරලා තිබුණා. එතැනින් පස්සේ ඇත්තටම මේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය කටයුතු කළා නම්, හරියට ක්‍රියාත්මක වුණා නම් ඒ අවශ්‍ය කටයුතු කරන්න තිබුණා. මෙහිදී ගන්න තිබෙන පියවර මේකේ බොහොම පැහැදිලිව තිබෙනවා. ඔවුන් කළ යුතු කාර්යභාරය එකින් එක ගත්තාම විශාල වැඩ කොටස් ගණනාවක් තිබෙනවා. ඒ නිසා ඒ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සිද්ධ කළාද, නැද්ද කියන කාරණය ගැන අපට නැවත සොයා බලන්න සිද්ධ වෙයි.

ව්‍යසන කළමනාකරණය සඳහා වන ජාතික සභාව අවසාන වශයෙන් අගෝස්තු මාසයේ 6වැනි දා කැඳවා තිබෙනවා. අගෝස්තු 06වැනි දා තීන්දු තීරණ ගණනාවක් ගන්නවා. මම අහන්න කැමැතියි එදා ගත්ත තීන්දු තීරණ ක්‍රියාත්මක කරන්න

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

වැඩකටයුතු සිද්ධ වුණාද, නැද්ද කියලා. එදා තීන්දු ගණනාවක් ගෙන තිබෙනවා. එකක්, ව්‍යසන කළමනාකරණ අරමුදල ස්ථාපිත කරන්න කටයුතු කිරීම. ඒ ව්‍යසන කළමනාකරණ අරමුදල ස්ථාපිත කරලා තිබුණා නම් තමුන්නාන්සේලාට හදිසියේ මේ ක්‍රියාමාර්ගවලට යන්න වුවමනාවක් වෙන්නේ නැහැ. අද මේ ආණ්ඩුව මේ සඳහා අරමුදල් එකතු කරන්න පිරිසක් දාලා වැඩ පිළිවෙළක් සකස් කරනවා. නමුත් මේ රට ඇතුළේ, නීතිමය ක්‍රියාදාමය තුළ තිබෙන අරමුදල් විශාල ප්‍රමාණයක් තිබෙනවා මේ ක්‍රියාදාමය ඉස්සරහට ගෙනියන්න. නමුත් ඒකට අවශ්‍ය කටයුතු ටික කළේ නැහැ කියලා තමයි මෙතැනදී අපට කියන්න තිබෙන්නේ. 2005 අංක 13 දරන පනතේ 17වෙනි වගන්තිය යටතේ ව්‍යසන කළමනාකරණ අරමුදල වහාම ස්ථාපිත කරන්න පුළුවන් කියලා බොහොම පැහැදිලිව සඳහන් වෙලා තිබෙනවා.

ඊට අමතරව තවත් තීරණ ගණනාවක් එදා ගත්තා. ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම, ඒ වාගේම පළාත් සභා සමඟ ඒකාබද්ධ වෙලා කටයුතු කරන ක්‍රියාදාමය, ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාවේ උපකරණ මිලට ගැනීම්, ඒකට අවශ්‍ය නිලධාරින් බඳවා ගැනීම් සම්බන්ධ තීන්දු තීරණ ගණනාවක් 2025 අගෝස්තු මාසයේ 6වැනි දා පැවැති 14වෙනි සභා වාරයේ දී අරගෙන තිබෙනවා. මා ළඟ ඒ සියලු තොරතුරු තිබෙනවා. නමුත්, ඒ සියලු දේවල් සිද්ධ වුණේ නැහැ කියන එක තමයි අපට කියන්න තිබෙන්නේ. ඒ නිසා කුරුණෑගල දිස්ත්‍රික්කයේ හානි ගණනාවක් සිද්ධ වුණා. විශේෂයෙන්ම මම කියන්න කැමැතියි, මෙම ආපදාවෙන් විපතට පත් පවුල් සංඛ්‍යාව 17,803ක්, පුද්ගලයන් විධියට 61,354 දෙනෙක්. 53දෙනෙක් මිය ගියා, කුරුණෑගල දිස්ත්‍රික්කයේ පමණක්. ඒ වාගේම පූර්ණ නිවාස හානි 92ක්, අර්ධ නිවාස හානි 902ක් තිබෙනවා. තුවාල වූ පුද්ගලයන් 27දෙනෙක් ඉන්නවා. දිස්ත්‍රික් ලේකම්තුමා ඇතුළු ප්‍රාදේශීය ලේකම්තුමන්ලා, සහකාර ප්‍රාදේශීය ලේකම්තුමන්ලා, ග්‍රාම නිලධාරිතුමන්ලා, සමෘද්ධි සංවර්ධන නිලධාරිතුමන්ලා, කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරින්, සංවර්ධන නිලධාරින්, ආපදා කළමනාකරණය සම්බන්ධ අනෙකුත් සියලු නිලධාරින් අතිවිශාල ප්‍රමාණයක් විශාල කැප කිරීමක් කරලා සුරක්ෂිත මධ්‍යස්ථාන 56ක වැඩ කළා. අපි ඒ අයට අපේ ගෞරවය හා ස්තුතිය මේ අවස්ථාවේ දී නැවතත් පුද කරනවා. සමහර දිසාපතිතුමන්ලාට අපි කථා කළාට පස්සේ දැන ගන්න ලැබුණා, හවස් වරුව වෙනකල්ම ඒ අය අග්ගලයක් විතරයි කාලා තිබුණේ. මම රාත්‍රියේ කථා කළාමත් කිව්වා, "මොනවත් තවම කැවේ නැහැ සර්. අපට කන්න මොනවත් ලැබුණේ නැහැ" කියලා. ඒ තරමට ඔවුන් පුදුම විධියට මහන්සි වෙලා, කැප වෙලා වැඩ කළා. ඒ නිසා අපට ඔවුන් කෙරෙහි විශාල ගෞරවයක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැනින් පස්සේ කරන්න ප්‍රධාන කාරණා ගණනක් තිබෙනවා. මේ ක්‍රියාදාමය තුළ ඇති වෙලා තිබෙන තත්ත්වය එක්ක ආණ්ඩුව විධියට පොදුවේ ක්‍රියාමාර්ග ගණනාවක් ගත යුතුයි කියලා මා විශ්වාස කරනවා. විශේෂයෙන්ම කුඩා ගෙවල් හදන්න ණය ගත්ත විශාල පිරිසක් ලංකාව පුරාම ඉන්නවා. මම ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා, කරුණාකරලා අඩුම තරමින් මේ අයට සහනයක් සලසන්න කටයුතු කරන්න කියලා. අඩුම තරමින් අර්ධ ණය කපා හැරීමක්වත් කරන්න. මොකද, මේ අයට දැන් ඒ ණය ගෙවා ගන්න විධියක් නැහැ, ආදායමක් නැති තත්ත්වයට පත් වෙලා තිබෙන නිසා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි. ගොවි ජනයාගේ කන්න සම්පූර්ණයෙන් දැන් විනාශ වෙලා තිබෙන්නේ. අද කොළඹ ගත්තොත්, එක එළවලුවක්වත් හොයා ගන්න බැරි තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ සියලු ගොවීන්ට අවශ්‍ය සහන ලබා දෙන්න කටයුතු කරන්න කියලාත්, ගොවීන් ගත්ත ණය ප්‍රමාණය කපා හරින්න කියලාත් මේ ආණ්ඩුවෙන් ඉල්ලන්න කැමැතියි; ගරු ජනාධිපතිතුමාගෙන් ඉල්ලන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඇති වෙලා තිබෙන තත්ත්වයත් එක්ක කුඩා ව්‍යාපාරිකයාට නැඟිටින්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. නැවතත් ඔවුන් හිර වෙලා තිබෙනවා. ඔවුන් පසුගිය කාලයේ ණය අරගෙන විශාල අර්බුදයකට ලක් වුණා. ඔවුන්ට පරාටේ නීතිය යටතේ ක්‍රියාමාර්ග ගෙන තිබෙනවා. රුපියල් 1,000ටත් ඔවුන්ගේ ඉඩම් සියල්ල බැංකු ලියා ගත්තා. ඒ නිසා අපි ගෞරවයෙන් ආණ්ඩුවෙන් ඉල්ලනවා, ඒ සඳහා අවශ්‍ය මූලික තීන්දු ටික අරගෙන කුඩා ව්‍යාපාරිකයන් ආරක්ෂා කරන්න කටයුතු කරන්න කියලා. සංචාරක ව්‍යාපාරයේ නිරත වෙලා ඉන්න අයත් මේ දවස්වල විශාල විනාශයකට ලක් වෙලා සිටිනවා. ඒ අය ගැනත් සොයන්න කියලා මේ වෙලාවේ අපි කියන්න කැමැතියි.

ඉන්දියාව, ඇමෙරිකාව, ජපානය, රුසියාව, පාකිස්තානය වාගේ රටවල් අපට විශාල සහයෝගයක්, ශක්තියක් ලබා දුන්නා. ඒ රටවල්වලට මේ අවස්ථාවේ අපේ ගෞරවය පුද කරන්න කැමැතියි.

අපි දින ගණනාවක් තුළ කුරුණෑගල දිස්ත්‍රික්කයේ අපට යන්න පුළුවන් හැම තැනකටම ගියා. ආධාර එකතු කරලා, මිනිස්සුන්ට තිබෙන ප්‍රශ්න සොයා බලමින්, අපට කරන්න පුළුවන් දේවල් කරගෙන යනවා.

මෙහිදී මේ කාරණයත් මම කියන්න කැමැතියි. ජවිපෙ, මිස්ටර් වීරප්පන්ගේ මඩ බලකාය ඊයේ මොකක්ද කළේ? අපි ගමකට ගියා. ඒ ගමේ කිසිම ප්‍රශ්නයක් තිබුණේ නැහැ. දෙදෙනෙක් තුන්දෙනෙක් කරපු දෙයක් ගැන වීඩියෝ දමමින් පුළුවන් තරම් අපට මඩ ගහන වැඩේ තමයි කරන්නේ. ඔය දේශපාලනය තමයි තමුන්නාන්සේලා කළේ. අවුරුදු 76ක ශාපය, ශාපය කිය කියා ඉඳලා, ඒක කීමේ ප්‍රතිඵලයක් විධියට තමයි අවසානයේ 77වෙනි අවුරුද්දේ ශාපය ලංකාවට ආවේ. ඒ නිසා ඒ කියන ඒවා දැන්වත් නවත්වන්න කියලා අපි ආදරයෙන් ඉල්ලනවා. ග්‍රාමීය මට්ටමේ අහිංසක මිනිස්සු වෙනුවෙන් ශක්තිය ලබා දෙන්න තවදුරටත් අපි කටයුතු කරමු කියා යෝජනා කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.18]

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සොබාදහමේ අකාරුණිකත්වය හමුවේ ජීවිත අහිමි වූ, තමන් මුළු ජීවිතය කාලයම ගත කරපු, තමන්ගේ ජීවිතය හා සමාන දේපළ අහිමි වූ හදවතින් වැලපෙන දහස් ගණන් ජනතාව අතරේ සිට අද මම මේ ගරු පාර්ලිමේන්තුවට පැමිණියේ, ඒ වැලපෙන ජනතාවගේ හදවතේ තිබෙන කථාව මේ වැදගත් සංවාදයේදී මෙම සභාව හමුවේ තබන්නයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ජීවත් වෙන්නේ කොළඹ දිස්ත්‍රික්කය තුළ. මේ වනවිට කොළඹ දිස්ත්‍රික්කය තුළ පවුල් 76,839ක්, පුද්ගලයන් 294,674ක් අවතැන් වෙලා, මරණ 5ක් සිදුවූ අවස්ථාවක තමයි මේ කටයුතුවලට අපි මැදිහත් වෙමින් තිබෙන්නේ. මා ජීවත් වන කඩුවෙල ආසනය තුළ පවුල් 12,101ක්, පුද්ගලයන් 40,080ක් අවතැන් වෙලා, මරණ දෙකක් සිදු වුණා. එවැනි තැනක ඉඳලා ඇවිත් තමයි මම මේ සභාව ආමන්ත්‍රණය කරන්නේ. ගෙවුණු නොවැම්බර් මාසයේ 24වැනි දා ඉඳලා මේ ගතවුණු සතිය තුළ මුළු මහත් රටවැසියන් වාගේම කොළඹ දිස්ත්‍රික්කයේ ජනතාවත්, විශේෂයෙන් මා ජීවත් වන කඩුවෙල ආසනයේ ජනතාවත්, රැය දෙක තුනක් තිස්සේ තවමත් නොනිදා ගත කරනවා. මේ වන විට සමස්ත රටේම ජීවිත 400කට වැඩි ප්‍රමාණයක් අහිමි වෙලා තිබෙනවා. ඒ වාගේම අතුරුදහන් වූ සංඛ්‍යාව 366 ඉක්මවනවා. දේපළවල සමස්ත විනාශය රුපියල් බිලියන 40ට වැඩි වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රට කියන්නේ මෙවැනි ස්වාභාවික ව්‍යසනයකට ඔරොත්තු දීමට සමත්, ශක්තිමත් ව්‍යුහයක් සහිත, ශක්තිමත් ආර්ථිකයක් සහිත, ශක්තිමත් ක්‍රමයක් සහිත රාජ්‍යයක් නොවෙයි කියන එක නැවත නැවතත් අපට ඔප්පු වෙලා තිබෙනවා. දශක ගණනාවක් තිස්සේ මේ රටේ ආර්ථිකය බෙලහීන කරපු, දුර්වල කරපු, ජනතාවගේ අවිධිමත් පදිංචිවීම්වලට, නායකත්වය දුන් දේශපාලන බලවේග අද කිඹුල් කඳුළු හෙළනවා. කැමරා අටවාගෙන බත් පැකට් එකක් බෙදන්න ගිහිල්ලා මිනිස්සුන්ගේ විරෝධය එල්ල වුණාට පස්සේ, ඒ විරෝධයත් නැවත ආණ්ඩුවට හරවන්න උත්සාහ කරනවා. දශක ගණනාවක් පුරාම මේ අවිධිමත් රාජ්‍යයන් පවත්වාගෙන ආපු දේශපාලනය විසින් මේ ආපදා තත්ත්වයට අවශ්‍ය පසුබිම සකස් කර තිබෙනවා.

මා ජීවත් වන කඩුවෙල ආසනයේ ග්‍රාම නිලධාරි වසම් 35ක් මේ ආපදාවේ ගොදුරු බවට පත් වෙලා තිබෙනවා. අපේ ආසනය පසුගිය කාලය පුරාම ගංවතුර ආපදාවෙන් පීඩනයට පත් වූ ආසනයක්. සාමාන්‍යයෙන් ග්‍රාම නිලධාරි වසම් 21කට ආසන්න ප්‍රමාණයක් තමයි වෙන දා පීඩාවට පත් වෙන්නේ. නමුත්, මෙවර ග්‍රාම නිලධාරි වසම් 35කට වැඩි ප්‍රමාණයක් පීඩාවට පත් වුණා. ඒ සඳහා සුරක්ෂිත මධ්‍යස්ථාන 41ක් පිහිටුවන්න සිදු වුණා. ඉතිහාසයේ කවදාවත් ස්වාභාවික විපතකදී එවැනි සුරක්ෂිත මධ්‍යස්ථාන ප්‍රමාණයක් අපේ ආසනය තුළ පිහිටුවා නැහැ. ඒ සුරක්ෂිත මධ්‍යස්ථානවල පවුල් 4,000කට ආසන්න ප්‍රමාණයක් මේ වන තෙක් රැකවරණය ලබමින් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආපදාවෙන් පසු ගතවුණු සතිය තුළ මහජන නියෝජිතයන් විදියට අපට කළ හැකි සියල්ල අපි කළා. ඇති විය හැකි ආපදා තත්ත්වය පිළිබඳව ඊට අදාළ ආයතන ආසන්න කාල පරිච්ඡේදයේදී අනතුරු අඟවද්දී, මහජන නියෝජිතයන් විදියට අපිත්, ඒ වාගේම ඊට අදාළ සියලු රාජ්‍ය ආයතනත් වේගවත්ව කටයුතු කරමින් මහජනතාවගේ ආරක්ෂාව සැලසීම සඳහා නොගත් උත්සාහයක් නැහැ. එවැනි වේගවත් මැදිහත් වීමක් කරපු නිසා කොළඹ දිස්ත්‍රික්කයේ මරණ ප්‍රමාණය 5කට සීමා කරන්න අපට හැකියාව ලැබුණා. මේ කටයුතු රාජ්‍ය නිලධාරින්ගේ සහ මහජන නියෝජිතයන්ගේ ඒකාබද්ධ මැදිහත් වීමෙන් තොරව අයාලේ සිද්ධ වුණා නම්, බොහෝ විට මේ මරණ ප්‍රමාණය වැඩි වෙන්න ඉඩ තිබුණා. ඒ ලැබුණු ඉඩ කඩ ඇතුළේ කරපු වේගවත් මැදිහත් වීම වෙනුවෙන්, එසේ මැදිහත් වුණු සියලු මහජන නියෝජිතයන්ට, ඒ වාගේම සියලු රාජ්‍ය නිලධාරින්ට, කොළඹ දිස්ත්‍රික් ලේකම්තුමා ඇතුළු සියලු කාර්ය මණ්ඩලයට, කඩුවෙල ප්‍රාදේශීය ලේකම්තුමා ඇතුළු සියලු කාර්ය මණ්ඩලයට, ග්‍රාම නිලධාරි මහත්වරුන්ට, සංවර්ධන නිලධාරින් ඇතුළු අනෙකුත් සියලු නිලධාරින්ට, කඩුවෙල මහ නගර සභාවේ නගරාධිපතිතුමා, නාගරික කොමසාරිස් ඇතුළු කාර්ය මණ්ඩලයට, ලංකා විදුලිබල මණ්ඩලයට ස්තුති කරන්න මම මෙය අවස්ථාවක් කර ගන්නවා. කඩුවෙල ආසනයේ බෝට්ටුවකින් ගිය එක් පුද්ගලයෙකුට විදුලි සැර වැදී ජීවිතය අහිමි වෙද්දී ලංකා විදුලිබල මණ්ඩලයේ නිලධාරින් ඉතා වේගවත්ව මැදිහත් වෙලා සියලු ස්ථාන ආරක්ෂිත ස්ථාන බවට පත් කරන්න කටයුතු කළා. ත්‍රිවිධ හමුදාවත් ඒකට මැදිහත් වුණා. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මේ සියල්ල සම්බන්ධීකරණය කරමින්, කළමනාකරණය කරමින් කටයුතු කළා.

ඒ වාගේම මේ කටයුතුවලට ස්වේච්ඡාවෙන් මැදිහත් වූ අතිවිශාල සමාජ ක්‍රියාකාරින් ප්‍රමාණයක් ඉන්නවා. සමාජ ජාල තුළ කටයුතු කළ පිරිස් community kitchens සකස් කරමින්, ආහාර පැකට් දහස් ගණන් සකස් කරමින්, ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන් වේගවත් මැදිහත් වීමක් සිදු කළා. ඒ කරපු මැදිහත් වීම පිළිබඳව සමාජ ජාල තුළ කටයුතු කරන සියලු සහෝදරයන්ට මම මේ අවස්ථාවේ හිස නමා ආචාර කරනවා.

ඒ වාගේම ගාල්ල, මාතර, මීගමුව ප්‍රදේශයේ ධීවර ප්‍රජාව ස්වේච්ඡාවෙන් මේ කටයුතුවලට මැදිහත් වුණා. ඔවුන් ස්වේච්ඡාවෙන් බෝට්ටු අරගෙන ඇවිල්ලා ඔවුන් නොදන්නා බිම්වල ගමන් කරමින් අවතැන් ජනතාව, පීඩාවට පත්වෙලා සිටි ජනතාව ගලවා ගැනීමට කටයුතු කළා. එහිදී බලපිටිය ප්‍රදේශයෙන් පැමිණි තරුණයෙකුට වූ යම් සිදුවීමක් පිළිබඳව මේ අවස්ථාවේ මගේ කනගාටුව ප්‍රකාශ කරනවා. සමාජ ජාල තුළ ඒ කාරණයට සම්බන්ධ වීඩියෝ සංසරණය වුණා. බලපිටියේ සිට ස්වේච්ඡාවෙන් පැමිණි ඒ තරුණයාට බීමතින් සිටි යම් පිරිසක් විසින් අතුරුගිරිය ප්‍රදේශයේදී පහර දී ඔහුගේ බෝට්ටුව පැහැරගෙන යැමට උත්සාහ දරා තිබුණා. ඒ ගැන බොහෝදෙනා කම්පාවට පත්වෙලා තිබුණා. එම නිසා කඩුවෙල ජීවත් වන මහජන නියෝජිතයකු විදියට මම ඒ සිදුවීම පිළිබඳව ඒ සහෝදරයාට මේ අවස්ථාවේ මාගේ කම්පාව හදවතින්ම පළ කරනවා. ඉදිරියේදී ඒ බිම තුළ එවැනි සිදු වීමක් ඇති නොවන්න කටයුතු කරනවාය කියන එකත් මම ඔබට පොරොන්දු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ ජනාධිපතිවරයා තමයි අපට දිවා රෑ වෙහෙසෙමින්, නිදි වරමින් ජනතාවගේ කටයුතු වෙනුවෙන් මැදිහත් වෙන්න ධෛර්යය දුන්නේ. එතුමා නොනිදා රෑ පහන් කරමින්, අපට පෞද්ගලිකව දුරකථන ඇමතුම් ලබා දෙමින්, තත්ත්වය විමසමින්, බිම් මට්ටමේ සිදු වන හැම දෙයක් පිළිබඳව දැඩි අවධානයකින් අපට දේශපාලන නායකත්වය ලබා දුන්නා. අපේ ජීවිතය පැත්තකින් තියලා මහජනතාව වෙනුවෙන් කැප වෙන්න, මැදිහත් වෙන්න, දිවා රාත්‍රියේ පවා බෝට්ටුවලින් ගමන් කරමින් ජනතාව ගලවා ගැනීමට යන්න අවශ්‍ය ධෛර්යය අපට ලැබුණේ ඒ ධෛර්ය සම්පන්න දේශපාලන මැදිහත්වීම නිසාය කියන එක මම මේ අවස්ථාවේ කියන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මේ කාරණයත් මම කියන්න ඕනෑ. බිඳ වැටුණු මේ රාජ්‍යය නැවත ගොඩනැඟීම වෙනුවෙන් අපි මේ රාජ්‍යය ප්‍රතිසංවිධානය කළ යුතුයි. ජනතාවට ජීවත් වෙන්න පුළුවන් ස්ථානවල ඔවුන්ගේ ජීවිත නැවත ආරම්භ කළ යුතුයි. ඒ සඳහා විධිමත් නිවාස සංකීර්ණ පද්ධති මේ රට තුළ ගොඩනැඟිය යුතුයි. අවදානම් ස්ථාන සියල්ලෙන්ම ජනතාව ඉවත් කරලා විවෘත අවකාශ සහිත ඉඩම් තුළ වාසස්ථාන නිර්මාණය කළ යුතුයි. ඒක මධ්‍යම කඳුකරය වෙන්න පුළුවන්, ඒක මහනුවර වෙන්න පුළුවන්, ඒක කඩුවෙල වෙන්න පුළුවන්, ඒක කොළඹ මෝදර ප්‍රදේශය වෙන්න පුළුවන්. මේ කියන තැන්වල ඉන්න මිනිස්සු ඔවුන්ට හැකි පමණින් ඉන්න සකස් කරගත් නිවෙස්වල ඉන්න දෙනවා වෙනුවට, රාජ්‍යයක්

[ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා]

මැදිහත් වී විධිමත් නිවාස පද්ධති සකස් කිරීමේ වැඩසටහනකට අපි අවතීර්ණ විය යුතුයි. ඒ සඳහා ඉතාම හොඳ ඉඩම් කළමනාකරණ සැලැස්මකට අපි අවතීර්ණ විය යුතුයි. එම නිසා ඒ වෙනුවෙන් අපි ඉතාම බුද්ධිමත් සහ විධිමත් තීන්දු-තීරණ ගත යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කැලණි ගඟ පිටාර ගැලීමෙන් සිදුවන ස්වාභාවික විපත පිළිබඳව අපි පසුගිය මාස කීපය පුරාම ගරු අග්‍රාමාත්‍යතුමියගේ නායකත්වය යටතේ සාකච්ඡා කළා. ඒ සඳහා විශේෂඥ කමිටු කීපයක් පත් කරමින් ඒ සඳහා ඉදිරිපත්ව ඇති යෝජනා පිළිබඳව සාකච්ඡා කරමින් ඉන්නකොට තමයි මේ ආපදාවට අපි ගොදුරු වුණේ. මේ ආපදාව පදනම් කරගෙන රටක් ලෙස නැවත නැඟිටින්න ලැබුණු මේ අවස්ථාවේ ජනතාව තුළ තිබෙන ධෛර්යයත්, මහජන නියෝජිතයන් සහ ආණ්ඩුව කෙරෙහි තිබෙන විශ්වාසය සහ කැපවීම කියන මේ සියල්ලත් එකතු කරගෙන ඉතා ඉක්මනින් අපි සාමාන්‍ය තත්ත්වයට පත් වෙන්න ඕනෑ. එසේ සාමාන්‍ය තත්ත්වයට පත්වූ පළමු මොහොතේම මෙම ප්‍රශ්නයට අවශ්‍ය දීර්ඝ කාලීන, ස්ථිරසාර විසඳුමක් කරා මේ ගරු පාර්ලිමේන්තුවේ අවධානය යොමු කරවන්න ඕනෑ. ඉක්මන් මැදිහත් වීමකින් විද්‍යාත්මක විසඳුමකට යෑම සඳහා සියලු ගංගා ද්‍රෝණි පිළිබඳව අවධානය යොමු කරමින් කටයුතු කළ යුතුයි. ඒ සඳහා ආධාර උපකාර ගත යුතු සියලු තැන්වල නිලධාරින් එක්ක සාකච්ඡා කරලා විධිමත් වැඩසටහනකට ඉක්මනින් ගමන් කළ යුතුයි කියන කාරණය අවධාරණය කරමින්, මට මේ කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 25ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.28]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම ප්‍රථමයෙන්ම අපේ රටේ සමස්ත රණවිරුවන්ට, පොලීසියට සහ හදිසි කටයුතු සම්බන්ධයෙන් වැඩ කරන සියලුදෙනාටම ස්තුතිය පුද කරන්න කැමැතියි. අපේ රණවිරුවන් කියන්නේ, හැම අවස්ථාවකදීම මේ රටේ ස්වෛරීභාවය සහ ඒකීයභාවය රැකගෙන ඉන්න කොටසක්. විශේෂයෙන් මෙවැනි ආපදා අවස්ථාවලදීත් ඔවුන්ගේ සේවය වටිනා එකක් බව ඔවුන් ඔප්පු කර පෙන්වා තිබෙනවා. ඒ වාගේම මේ ආපදාවට පත් ජනතාවට සහන සැලසීම වෙනුවෙන් කැප වෙලා වැඩ කරන සියලුදෙනාටම අපේ ස්තුතිය සහ ප්‍රණාමය පුද කරනවා. ඒ වාගේම 2003, 2015, 2016 වර්ෂවල මෙවැනි ප්‍රශ්න ඇති වූ අවස්ථාවලදී අපි මේ සියලුදෙනාටම විශේෂ දීමනාවක් දුන්නා, ඒගොල්ලන්ගේ කැප වීම සහ වැඩ කිරීම වෙනුවෙන්. ඉතින් මම මේ අවස්ථාව උපයෝගී කර ගන්නවා, ඒකත් මතක් කරලා ඒගොල්ලන්ගේ සේවය අගය කිරීමට. ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ගේ පවුල්වලට දීලා තිබෙන වරප්‍රසාද කපා හරින්න එපා කියන කාරුණික ඉල්ලීම මම මේ ආණ්ඩුවෙන් කරනවා. මොකද, නොවැම්බර් 11වැනි දා "The Island" පත්තරයේ සඳහන් වෙනවා, "NPP govt. urged to reconsider decision to abolish concession granted to military families" කියලා. ඒක නිවැරදි කරන්න අවශ්‍යයි. මොකද, ඒ වරප්‍රසාද දීම අත්‍යවශ්‍යයි ඒ අයගේ මහන්සිය, ඒ අය කරන සේවය අගය කිරීමට.

අපි අය වැය ගැන කථා කරන්න පටන් ගත්තොත්, රටේ සම්පූර්ණ වියදම රුපියල් බිලියන 8,980ක් සහ ආදායම රුපියල් බිලියන 5,355ක් වුණාම gross financing need එක රුපියල් බිලියන 3,740ක් පමණ වනවා. ඒ තුළින් අපි ණය මවනවා එන අවුරුද්දට රුපියල් බිලියන 1,740ක්. මම දැන් මේ ගැන කථා කරලා, අද ඇති වෙලා තිබෙන ව්‍යසන තත්ත්වය ගැන අන්තිමට කථා කරන්න බලාපොරොත්තු වනවා. මොකද, මට වැඩිය අත්දැකීමක් ලබා තිබෙන මන්ත්‍රීවරු මේ ව්‍යසනය ගැන බොහෝ දේ කථා කරලා තිබෙනවා. ඒ නිසා මම හිතන විධියට, අය වැය ගැනත් කථා කරන්න අපට අවශ්‍යතාවක් තිබෙනවා. කෙසේ වෙතත්, ඒ කාරණා දෙකම මිශ්‍ර කරලා කථා කරන්න මම මේ අවස්ථාව යොදා ගන්නවා.

මුදල් අමාත්‍යාංශය යටතේ ඇති මහ බැංකුව රාජ්‍ය ණය කළමනාකරණ පනතට - Public Debt Management Act එකට - අනුවයි දැන් ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ. ප්‍රශ්නයක් තිබෙන අවස්ථාවේදී වුවත්, විපක්ෂයක් විධියට අපි නම්‍යශීලීව විවාදයකින් තොරව මේ කටයුතු කරන්න අවස්ථාව දීලා තිබෙනවා. අපි මුදල් අමාත්‍යාංශයේ සියලුදෙනාටම සුබ පතනවා, මේ කටයුතු හරියාකාරව ඉෂ්ට කරගෙන ඉදිරියට යන්න කියලා.

අපි මතක තබා ගන්න අවශ්‍යයි, අද ණය ගන්නකොට සියයට 9.8ක පොලී අනුපාතයක් තමයි රට දරන්නේ කියන එක. විදේශ ණය හැටියට US Dollars 37 billion තිබෙන අවස්ථාවක අපි ඒ සඳහා පොලිය ලෙස සියයට 7ක් ගෙවනවා. දේශීය වශයෙන් - ලංකාවෙන්- ගන්න ණයවල පොලිය ලෙස සියයට 12ක්, 13ක් විතර ගෙවනවා. සමස්තයක් වශයෙන් අපි සියයට 9.8ක පොලියක් ගෙවනවා. පොලිය වැඩි වන සෑම සියයට 1ක් සඳහාම අපේ වියදම රුපියල් බිලියන 170කින් වැඩි වනවා කියන එක මතක තබාගෙන තමයි අපි ගමන් කරන්න අවශ්‍ය වන්නේ. එම නිසා මුදල් අමාත්‍යාංශයට, ඒ අයගේ අලුත් කර්තව්‍යයට මහ බැංකුවේ සම්පූර්ණ සහයෝගය ලබා ගන්න අවශ්‍යයි. නමුත්, ඒක ලිඛිතව මහ බැංකුවෙන් ගතයුතුයි. එහෙම නැත්නම් ඒගොල්ලන්ගේ ප්‍රශ්නත් මෙහාට ගේන්න පුළුවන්. ඉතින් නිලධාරින්ට කියන්න අවශ්‍යයි, ඒකේ standard operating procedures ඔක්කෝම අරගෙන කටයුතු කරන්න කියලා.

මම එතැනට යන්නේ ඇයි? ඒ, මේ රටේ ණය වෙනුවෙන් කටයුතු කරන මහ බැංකුව අද අත සෝදාගෙන ඉන්න නිසායි. මම මේ පාර්ලිමේන්තුවේ හිටපු හැම දවසකම වාගේ කථා කරලා තිබෙනවා, මහ බැංකුව කටයුතු කරන ආකාරය රටට අහිතකර වන අවස්ථා පිළිබඳව. යම් යම් දේවල් හොඳයි. නමුත් මහ බැංකුවට මේක කරන්න බැහැ කියනකොට, මෙතැන ඉන්න බොහොම අය බයෙන් කථා කරන්නේ මහ බැංකුව ගැන. වැඩිකල් යන්න ඉස්සෙල්ලා තේරෙයි, මම මේ සටන මෙතෙක් දුර තනිව ගෙනැත් තිබෙන්නේ ඇයි කියන එක.

අපේ රටේ තිබුණු සියයට 14ක විතර ණය මැවීම 2025 අප්‍රේල් සිට වැඩි වෙලා තිබෙනවා. දැන් සියයට 22කට ණය මවා තිබෙනවා. මේ මැවීම තුළ කෘත්‍රිම වශයෙන් ණය ඇති කරන ලීසිංවලට රුපියල් ට්‍රිලියන 1.3ක් වැඩි කරලා තිබෙනවා කියලා අපට පෙනෙනවා. එය අපේ උගස් ණයවලට රුපියල් බිලියන 354ක් සහ credit cardsවලට රුපියල් බිලියන 310ක් වනවා. මේ තුළින් අපට පෙනෙන්නේ අපි ණය ගන්න හදන්නේ අවශ්‍ය තැන්වලට නොවෙයි කියන එකයි. මේක කරන්නේ ප්‍රාග්ධන

වියදම්වලට නම්, ඒක වෙනම දෙයක්. හැබැයි, අපි ණය ගෙවීමට තමයි ණය ගන්නේ. මහ බැංකුව කියනවා, "ඔව්, අපි දැන් ණය මවලා තිබෙනවා" කියලා. ණය මවන්නේ ණය ඇති කරන්න නම්, ඒකෙන් රටට වෙන හානිය මොකක්ද, ප්‍රතිලාභය මොකක්ද? ඉතින් මම මේ අවස්ථාවේ පෙන්වන්න උත්සාහ කරන්නේ මෙයයි. අපි ණය මවන්න ඕනෑ කරන්නේ රටේ අභිවෘද්ධියටයි. නැත්නම් අහිංසක මිනිස්සුන්ගේ ණය බර වැඩි වන එක විතරයි වෙන්නේ.

මම මේ අවස්ථාවේ මේ කාරණය නැවත මතක් කරන්නයි කියන්නේ. 2015 වර්ෂයේදී මමත්, අපේ රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමාත් ඇමතිවරු වශයෙන් කටයුතු කළ අවස්ථාවේ මේ රටේ සිදු වන ව්‍යසන පිළිබඳව සොයා බැලුවා. අපේ රටේ අවුරුදු හතරෙන් හතරට ව්‍යසන සිදු වෙලා තිබෙනවා. 2003දී ඉතාම දරුණු ගංවතුර තත්ත්වයක් ඇති වුණා. 2004දී සුනාමි තත්ත්වයක් ඇති වුණා. 2010දී නැවත ගංවතුරක් ආවා. 2017දී නාය යෑමක් එක්ක ලොකු ගංවතුරක් ඇති වුණා. 2020දී කොවිඩ් වසංගතය ඇති වුණා. 2021දී එක්ස්ප්‍රස් පර්ල් නෞකාවේ ප්‍රශ්නය ඇති වුණා. මේ නිසා 2015දී මුදල් ඇමති වශයෙන් මමත්, අපේ රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා තවත් ඇමතිවරයෙකු ලෙසත් ලංකාවේ ප්‍රථම වතාවට National Natural Disaster Insurance Scheme එකක් ඇති කළා. ලෝක බැංකුවේ නිලධාරින් ඇවිත් අපෙන් ඇහුවා, කොයි ආකාරයෙන්ද මේ ගැන සොයා බලා තිබෙන්නේ කියලා. මොකද, ලෝකයේ රටවල් 222කින් අපි තමයි ප්‍රථම වතාවට මේ රක්ෂණ ක්‍රමය ඇති කළේ. අපි ඒක 2016දී පටන් ගත්තා. අපි insurance premium එක වශයෙන් රුපියල් මිලියන 330ක් ගෙව්වා. ඒ නිසා කොළොන්නාවට ඇති වුණු ගංවතුර තත්ත්වයේදීත්, කොස්ගම ඇති වුණු ප්‍රශ්නයේදීත් අපට රුපියල් මිලියන 5,500ක් ලබා ගන්න පුළුවන් වුණා, රක්ෂණය තුළින්. 2017 වර්ෂයේත් එවැනි ව්‍යසනයක් ඇති වුණු නිසා රුපියල් මිලියන 800කට ඒ ගෙවන ප්‍රමාණය වැඩි වුණා. නමුත් අපට පුළුවන් වුණා, රුපියල් මිලියන 6,800ක් රක්ෂණය තුළින් ලබා ගන්න. නමුත් ඊට පසුව ඒක නවතා තිබෙනවා.

මේ වාගේ අපරාද වැඩ නිසා, ඊර්ෂ්‍යාව නිසා ඇති කරන දේවල් නිසා අන්තිමට රටට ඇති වන හෙණය තමයි මෙතැනින් ඇති වෙලා තිබෙන්නේ. මම මේ කාරණය මතක් කළේ එක හේතුවක් නිසායි. මම ඇමතිවරයා වශයෙන් සිටියදී මගේ අමාත්‍යාංශයේ වැඩ කරපු ආනන්ද සිල්වා මැතිතුමා දැන් ඉන්නේ ඕස්ට්‍රේලියාවේ. එතුමා මීට අදාළව තිබුණු සම්පූර්ණ ලියකියවිලි ටික මට එව්වා. මෙහේ දේශීය කොම්පැනියක් තිබෙනවා, Strategic Insurance Brokers කියලා. එහි සභාපති තමයි, ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු. මම මේ නම් කියන්නේ, එදා අපි නොදැනුවත් දෙයක් ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහත්මයා අපට ගෙනැල්ලා දුන්නු නිසායි. ඒක අපේ කැබිනට් මණ්ඩලය එදා අනුමත කළා. ඒකෙන් රටට ලොකු මුදල් ප්‍රමාණයක් ඉතුරු කරන්න පුළුවන් වුණා. ඒ වාගේම මංජුල ද සිල්වා, ජාතික රක්ෂණ භාර අරමුදලේ හිටපු සභාපතිවරයෙක්. මා සතුව ඇති ලේඛන තුළින් මේ අය එදා ලබා ගත් දේ පිළිබඳව මම කරුණු කියනවා. මේ අවස්ථාවේදී මීට අදාළ එම ලේඛන මම **table*** කරනවා.

මේ ආණ්ඩුවටවත් ඒක ඉදිරියට ගෙන යන්න පුළුවන් අවස්ථාවක් මේ තුළින් මම ඇති කරනවා. මේ තුළින් අනාගතයේ ඇති වන අනිසි දේශගුණ තත්ත්ව නිසා සිදුවන හානිය පියවා ගන්න අපට අවස්ථාව ලැබෙනවා. ඒ නිසා මම කාරුණිකව ආණ්ඩුවෙන් ඉල්ලනවා, නිර්දේශපාලනීකරණය වන්න කියලා. කථාවට වැඩිය ක්‍රියාවෙන් ඔප්පු කරලා පෙන්වන්න, කොහොමද වැඩ කරන්නේ කියලා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මම දැක්කා, අද හැමදෙනාම මේ කාරණය පිළිබඳව කථා කරනවා. අපේ විපක්ෂ නායකතුමාත් කථා කළා. මම එදා ඉඳන් කථා කළා, පරාටේ නීතිය පිළිබඳව. අද වන විට ඇති වෙලා තිබෙන තත්ත්වය සලකා බලා කරුණාකරලා මේ අවස්ථාවේ පරාටේ නීතිය ක්‍රියාත්මක කිරීම නවත්වන්න කියා මම මතක් කරන්න කැමතියි.

ඒ වාගේම, මේ වාගේ අවස්ථාවක ඒ වෙනුවෙන් දීලා තිබෙන පොලී අනුපාතය ඉතාම අධිකයි. Commissioner-General of Essential Services, ප්‍රභාත් චන්ද්‍රකීර්ති මැතිතුමා කියලා තිබෙනවා, ලංකාවේ දිස්ත්‍රික්ක 22කට මේ ආපදා තත්ත්වය බලපා තිබෙනවා කියලා. මේ වාගේ දේවල් මේ අවස්ථාවේදී මම මතක් කරනවා. ඒ නිසා තුළින් පරාටේ නීතිය අත්හිටුවන්න කියාත්, වැඩ නොකරන කර්මාන්ත සහ සේවා අංශවලටත් බැංකු පොලී ගෙවීම සඳහා යම් කාල පරිච්ඡේදයක් ලබා දෙන්න කියාත් මම ඉල්ලා සිටිනවා. මම අද උදේ කථානායකතුමා මූලාසනයේ ඉන්නකොට පෙන්වන්න උත්සාහ කළා, නොවැම්බර් මාසයේ 29වැනි දා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව බදු ගෙවන්න තව සුමානයක් කාලය දීර්ඝ කරලා තිබෙනවා කියලා. අපට වාර්තා වෙලා තිබෙන ආකාරයට මේ ආපදා තත්ත්වය නිසා පවුල් ලක්ෂ හතරහමාරකට වැඩිය අනාථ වෙලා තිබෙනවා. ලක්ෂ 18ක විතර පිරිසකට මේ ප්‍රශ්නය විඳ දරා ගන්න වෙලා තිබෙනවා. ඒ නිසා මේක සුමානයකින් දීර්ඝ කරලා හරියන්නේ නැහැ.

ආපදාවට පත් යම් තැන්වලට තවම යන්න බැරි වෙලා තිබෙනවා. අපේ විපක්ෂයේ මන්ත්‍රීවරු යන හැම තැනකදීම පුදුම වෙනවා, කවුරුවත් ඒ පැතිවලට ගිහිල්ලා නැහැ කියලා. මේ අවස්ථාවේදී දේශපාලනය කරන එක නොවෙයි අවශ්‍ය වන්නේ. නමුත්, ඒ අයට නිකරුණේ ප්‍රශ්නයක් ඇති නොවන විධියට කටයුතු කළ යුතුයි. මම කාරුණිකව ඉල්ලන්නේ මේකයි. උදේ මම කථානායකතුමාට මතක් කරන්න හැදුවේ කරුණාකරලා මේ බදු ගෙවන්න මේ අවුරුද්ද අග වෙනකම්වත් තව කාලයක් දෙන්න කියන එකයි. අගමැතිනිය වාගේම අනිල් ජයන්ත ඇමතිතුමාත් ඒ අවස්ථාවේ හිටියා. මොකද බදු ගෙවන්න online තිබුණාට වැඩක් නැහැ. Computers ගන්න තියා කෑම වේලක් කන්න බැරි අවස්ථාවක ඒ අයට මතක් වෙන්නේ බදු ගෙවන එක නොවෙයි, ජීවත් වෙන්නේ කොහොමද කියන එකයි. මේ අවුරුද්ද අග වෙනකල්, ඒ කියන්නේ මේ මාසයේ අග වෙනකල් මේ සඳහා අවස්ථාව ලබා දෙන්න කියලා මම ඉතාම කාරුණිකව ඒ සියලුදෙනා වෙනුවෙන් ඉල්ලා සිටිනවා.

අද වනකොට අපේ රාජ්‍ය සේවයේ ලක්ෂ 16ක පිරිසක් ඉන්නවා. නමුත් මේ තුළ ඵලදායි ලෙස වැඩ කරන ලක්ෂ හයක්, හතක්, අටක් වාගේ පිරිසක් ඉන්නවා. මේ අයට ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා Public Administration විෂයභාර ඇමති විධියට හිටපු අවස්ථාවේ ඒ අයට දීපු දිරිගැන්වීම් අද සම්පූර්ණයෙන් නැති වෙලා තිබෙනවා. අද රජයේ සේවකයන් භයෙන් වැඩ කරන්නේ.

ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමනි, ඔබතුමාත්, අපිත් ඊයේ කොළඹ දිස්ත්‍රික්කයේ Divisional Secretariat එකේ තිබුණු රැස්වීමකට ගියා. එතැනට ඇවිල්ලා හිටපු කට්ටිය කවුද කියලා බලන්න. එතැනට අගමැතිනිය එනවා. ඔබතුමන්ලාගේ ඇමතිවරු එනවා. එතැනට එන්නේ දෙවැනි, තුන්වැනි පෙළේ අය. ඒ, ඒගොල්ලන් තීන්දු ගන්න භය නිසා. මොකද, රජයේ සේවකයෝ මැද ඉන්නකොට ඒගොල්ලන්ට AR/ FR ගැන කථා කරන්න තිබෙනවා, Auditor-Generalට උත්තර දෙන්න තිබෙනවා, CID එකට උත්තර දෙන්න තිබෙනවා, CIABOC එකට උත්තර දෙන්න තිබෙනවා, media සහ social mediaවලට උත්තර දෙන්න තිබෙනවා. COPE and COPAවලට ආවාම ඒගොල්ලන් හෙම්බත්

[ගරු රවී කරුණානායක මහතා]

වෙලා ඉන්නේ. ඒගොල්ලන් හිතනවා, අපි වැඩත් කරලා ප්‍රශ්න ඇති කරගන්නේ ඇයි, වැඩ කළේ නැත්නම් ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ කියලා. ඒක නිසා වැඩ කරන්නේ නැතුව ඉන්න එක තමයි අද වනකොට ඒ අයගේ සාමාන්‍ය සිරිත බවට පරිවර්තනය වෙලා තිබෙන්නේ. අපට යම් විධියකින් අය වැයක් සාර්ථක කර ගන්න ඕනෑ නම් මේක තමයි අනුගමනය කළ යුතු මූලික සිද්ධාන්තය. මේ රජයේ නිලධාරින් තමයි, Chief Accounting Officersලා. ඒගොල්ලන් දිරිගැන්වූයේ නැති වුණොත් අනිවාර්යයෙන්ම ප්‍රශ්නයක් ඇති වෙනවා. ඒක නිසා මම කාරුණිකව ඉල්ලන්නේ මේකයි. අපට නැවත ඒගොල්ලන් දිරිගන්වන්න පුළුවන් වන්නේ කොහොමද, මේ අය වැය ඉලක්කය සපුරන්න පුළුවන් වන්නේ කොහොමද? මේ අවුරුද්දේ සියයට 32යි, ඔවුන් වෙනුවෙන් වියදම් කරලා තිබෙන්නේ. ඒ නිසා ඔවුන් වෙනුවෙන් කටයුතු කරන්න පුළුවන් කොහොමද කියන එක මම ඉතා ඕනෑකමින් අහනවා.

ඒ වාගේම මම මේ පාර්ලිමේන්තුවේදී මහ බැංකුවේ ස්වාධීනත්වය ගැන අහලා තිබෙනවා. අපි ප්‍රශ්න හයක් අහලා තිබෙනවා, මහ බැංකුව සම්බන්ධයෙන්. අපේ අනිල් ජයන්ත ඇමතිතුමාට සහ අගමැතිනියට ඒවාට උත්තර දෙන්න බැරි වෙලා තිබෙනවා. මොකද, මහ බැංකුවෙන් තොරතුරු එන්නේ නැහැ. මම ප්‍රශ්නයක් අහලා තිබෙනවා, මේ රටේ බංකොලොත්භාවය ප්‍රකාශ කිරීම හෝ යම් විධියකින් ණය ගෙවීම තාවකාලික අත්හිටුවීම - debt standstill එක - සම්බන්ධයෙන්. මේ පාර්ලිමේන්තුවට හැර වෙන කාටවත් ඒකට උත්තරයක් දෙන්න බැහැ. මේ පාර්ලිමේන්තුවේ අවසරය දීලා නැත්නම් ඒ අවසර නොදීම කොයි ආකාරයෙන්ද සිදු වුණේ? කවුද ඒ බලය ලබා ගෙන කටයුතු කරලා තිබෙන්නේ? අද ලංකාවේ ණයක් ගන්න බැරි වෙලා තිබෙන්නේ එදා ණය බර ප්‍රකාශ කරපු නිසායි. කවුද ඒ ණය බර ප්‍රකාශ කරන්න අවසර දුන්නේ කියන එකට තවම උත්තර දීලා නැහැ. පාර්ලිමේන්තුවේදී මාස දෙකක් තිස්සේ අහලා තිබෙන ප්‍රශ්නයකට උත්තර ලැබෙන්නේ නැත්නම් මොකක්ද මේ පාර්ලිමේන්තුවේ තිබෙන වටිනාකම? අපි මේවා අහන්නේ නිකම් නොවෙයි. අපි මේවා අහන්නේ යම් විධියක ඉදිරි දැක්මක් සහිතවයි. අපි දැකලා තිබෙනවා, අවුරුදු 30ක් තිස්සේ මේ පාර්ලිමේන්තුව තුළ හැසිරෙන ආකාරය. මෙතැන දේශපාලනයට බණින එක තමයි ඒගොල්ලන් කරන්න හදන්නේ. නමුත්, විපක්ෂයේ ඉඳලා දැන් ආණ්ඩු පක්ෂයට ගිහිල්ලා සිටින අයට යම් විධියකින් මේකේ වගකීම දරන්න වෙලා තිබෙනවා. පොලී අනුපාතය අඩු කරන්න ජනතාව පත් කළ ජනාධිපතිට අවශ්‍ය වුණොත් මහ බැංකුව කියාවි, "නැහැ, ඒක කරන්න බැහැ" කියලා. පත් වෙන්න ජනතාව දෙන වරමට වැඩිය පත් කරලා තිබෙන කෙනෙකුට පුළුවන්, මේ රටේ මූල්‍ය අංශය ඉදිරියට ගෙන යන්න. මේ තුළින් එක පොලී අනුපාතයක් වැඩි වුණොත් ජනතාව පත් කරලා තිබෙන ආණ්ඩුවකට වියදම් කරන්න පුළුවන් හැකියාව රුපියල් බිලියන 170කින් අඩු වෙනවා. මෙන්න මේක තමයි මම පෙන්වන්න හදන්නේ. මේ රට බංකොලොත් කළේ කවුද කියලා අඩු ගණනේ හෙටවත් මේ පාර්ලිමේන්තුව දැනුවත් කළොත් අපට පුළුවන් වේවි, අපේ credit ratings improve කරන්න.

ඊළඟට, සේවක අර්ථසාධක අරමුදල ගනිමු. ආණ්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කියන දේවල් කරනවා නම්, ඒකේත් ස්වාධීනත්වය රකින්න ඕනෑ කියලා ඒගොල්ලන් කියලා තිබෙනවා. නමුත්, මහ බැංකුව තවම ඒක රැකගෙන තිබෙනවා. එහෙනම් ඇයි මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ?

අනෙක් කාරණය තමයි, මේ රටේ විශ්‍රාම වැටුප් ප්‍රශ්නය. අපි විශ්‍රාම වැටුප් සඳහා මේ අවුරුද්දේ රුපියල් බිලියන 510ක් ගෙවලා තිබෙනවා. ඒ කියන්නේ, පඩිනඩිවලට වෙන් කරපු රුපියල් බිලියන 1,300කින් විශ්‍රාම වැටුප් සඳහා රුපියල් බිලියන 510ක් ගෙවලා තිබෙනවා. ඒ ප්‍රමාණය තව අවුරුදු 10කින් රුපියල් බිලියන 1,100ට වැඩි වෙනවා. ඒක දරා ගන්න පුළුවන්ද? මොකද, ඒ මුදල අය වැයකින් වෙන් කරන්නේ නැහැ. ඒ මුදල කෙළින්ම ඒ අවුරුද්දේ වෙන් කරන්න හැකියාව තිබෙනවා. ඒ නිසා pension අරමුදලක් ඇති කරලා, ඒක කළමනාකරණය කරන්න. නැත්නම් ඒකෙන් ඉදිරියේදී ලොකු බලපෑමක් ඇති වෙනවා. ණය ගෙවන ප්‍රමාණයෙන් සියයට 70ක් තිබෙන්නේ ණය පොලී ගෙවන්නයි. ඒ වාගේම ප්‍රාග්ධන වියදම් සඳහා ගෙවන්න තිබෙනවා. ඊට පස්සේ පඩිනඩිවලට සියයට 35ක්, 40ක් වැය වෙනවා. Pension එකට තව රුපියල් බිලියනයක් වෙන් කරන්න වුණොත් අපේ සෞඛ්‍යයට, අධ්‍යාපනයට, සංවර්ධන කටයුතුවලට කොහොමද මුදල් වෙන් කරන්න පුළුවන් වෙන්නේ කියන ප්‍රශ්නය තමයි මම හිතන්නේ මෙතැන මූලිකව තිබෙන්නේ. අගමැතිනිය කියනවා, අධ්‍යාපනයට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6.5ක් වෙන් කරන්න ඕනෑ කියලා. අපි, Committee on Public Finance, අහපු කාරණයකටත් උත්තර දෙන්න සුමාන පහක් ඉල්ලලා තිබෙනවා. අපි මහ බැංකුවේ ක්‍රියාදාමය ගැන නැවත බලන්න අවශ්‍යයි, කොහොමද ඒ කටයුතු කරන්නේ කියලා.

හැම අවස්ථාවකදීම ප්‍රශ්නයක්, බිල්ලෙක් මවන්න ඕනෑ වුණාම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල උදාහරණයට ගන්නවා. නොදන්නා කට්ටියට එහෙම කියන්න පුළුවන්. නමුත්, අපි වාගේ අය agreement එකක් ගැන ඒ අයත් එක්ක සාකච්ඡා කරනකොට ඒගොල්ලන් කරන ආකාරය කොහොමද, අපි කරන ආකාරය කොහොමද කියලා විශ්වාසයක් ඇති වෙන්න කටයුතු කරන්න පුළුවන් වුණොත් ඒගොල්ලන් අපි කියන දෙයට හිස නමනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කටයුතු 2026 දෙසැම්බර් 31වැනි දා අවසන් වෙනවා. ඒ නිසා මේ ආණ්ඩුවටත් රනිල් වික්‍රමසිංහ ජනාධිපති වශයෙන් හිටපු ආණ්ඩුව ක්‍රියාත්මක කළ ආකාරයටම ඒ කටයුත්ත ඉදිරියට කරගෙන යන්න සිදු වෙනවා. ඒකේ මූල්‍ය විනයක් තිබෙනවාය කියන එක මම පිළිගන්නවා. ඒකේ වටිනාකමක් තිබෙනවා.

2026 වසරෙන් පසුව 2027 වර්ෂය පටන් ගන්න තව දවස් 370ක් විතර තිබෙන්නේ. ඒ අවස්ථාව වනවිට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තිබෙන skeleton එක, ඒ කියන්නේ ඒගොල්ලන් හදපු රාමුවෙන් පිටතට ගමන් කරන්න රජය සූදානමින් සිටිනවාද, නැද්ද කියන ප්‍රශ්නය ඇති වෙනවා. මේක තමයි මම හිතන විධියට තිබෙන ලොකුම ප්‍රශ්නය. අද හැම දෙයක්ම "ජාත්‍යන්තර මූල්‍ය අරමුදල" කියලා නතර කළාම කොහොමද ඉදිරි අනාගතයට ආදායම් හොයා ගන්න පුළුවන් වෙන්නේ? පඩි වැඩි කරන්නේ නැත්තේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල නිසාය කියනවා. පෞද්ගලික අංශයට දෙන්න කිව්වාම ඒක කරන්න බැරි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල නිසාය කියනවා. විශ්වවිද්‍යාලයේ යම් දේවල් සංවර්ධනය කරන්න ඕනෑ වුණත් ඒක ජාත්‍යන්තර මූල්‍ය අරමුදල නිසා කරන්න බැහැ කියනවා. එහෙනම් තව දවස් 370කින් විතර පස්සේ අපේ රටට ලස්සන අනාගතයක් ඇති කරන්නේ කොහොමද කියලා තමුන්නාන්සේලාට සැලසුමක් තිබෙනවාද? ඒක තමයි තිබෙන ලොකුම ප්‍රශ්නය. මට පෙනෙන විධියට තමුන්නාන්සේලාට අදහසක් තිබුණාට, සිහිනයක් තිබුණාට ඒක ක්‍රියාත්මක කරන්න මාර්ගයක් නැති එක තමයි තිබෙන ප්‍රශ්නය. එහෙම නම් අපි කොහොමද ඒක ඇති කරන්න අවශ්‍ය වෙන්නේ?

මේ අවස්ථාව වනවිට අපි හිතුවේ නැති ව්‍යසන තත්ත්වයක් රට තුළ ඇති වෙලා තිබෙනවා. මේ වාගේ තත්ත්ව හැම ආණ්ඩුවකටම ඇති වෙලා තිබෙනවා. 76 වසරක ශාපය කියලා කිව්වාට මේ වාගේ ව්‍යසන තත්ත්ව හැම කාලයේදීම වාගේ ඇති වෙලා තිබෙනවා. අපි ලබපු එවැනි අත්දැකීම් තුළ අපට ව්‍යසන අවස්ථාවකදී කිසිම තෘප්තියක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා තමයි අපි මෙතැන බෝඩ් ලෑලි අල්ලන්නේ නැත්තේ; ප්‍රශ්න කරන්නේ

නැත්තේ. ඒ නිසා තමයි තිබෙන හැම රුස්වීමකටම ගිහිල්ලා අපි උදවු කරන්නේ. නමුත්, ඒ තත්ත්වය පාර්ලිමේන්තුවෙන් ගිලිහුණු බව අපට පෙනුණා. ඒක බේදවාචකයක්. ප්‍රසම්පාදන කමිටුවේදී මුදල් අමාත්‍යාංශයේ ලේකම් කරුණු ඉදිරිපත් කරමින් කියනවා අපි දැක්කා, මෙහෙම තමයි කටයුතු කරන්න ඕනෑ කියලා. ඒ, ඉදිරිපත් කළේ රනිල් වික්‍රමසිංහ 2024දී ඉදිරිපත් කරපු චක්‍රලේඛ. ඒ චක්‍රලේඛ මේ වාගේ ව්‍යසනයක් තිබෙන තත්ත්වයක් තුළ කොහොමද ක්‍රියාත්මක කරන්නේ? බත් පැකට් එකක් හම්බ වෙලා නැති කොළඹ දිස්ත්‍රික්කයේ හෝ මොනරාගල හෝ බදුල්ලේ හෝ මහනුවර මිනිස්සුන්ට මේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළින් ඒ කටයුතු කරන්නේ කොහොමද? ඒ නිසා තමයි අපි කිව්වේ හදිසි නීතිය පනවන්න ඕනෑ කියලා. විපක්ෂයේ අපි කිව්වේ, හදිසි නීතියක් ඇති කරන එක පිළිබඳව නොවෙයි. ඒ ක්‍රමය කරලා පෙන්වන්න ඕනෑ. අත්දැකීම තුළින් අපි දැන ගත්ත දේ තමයි ඉදිරිපත් කරලා තිබෙන්නේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කර්තව්‍යය වන්නේ ආදායම් වැඩි කරන්න උපදෙස් දෙන එක; fiscal consolidation ඇති වෙන්න උපදෙස් දෙන එක. මහ බැංකුව ඒගොල්ලන්ගේ ස්වාධීනත්වය කියලා රකින්න බලන්නේ විදේශ විනිමය අනුපාතය - exchange rate එක - සහ පොලී අනුපාතය සලකා. රටේ වර්ධනයක් අවශ්‍යයි. මේ වාගේ බංකොලොත්භාවයෙන් එළියට එන්න හදන රටක අඩු ගණනේ සියයට හතක, අටක, නවයක වර්ධන වේගයක් තිබෙන්න ඕනෑ. ඒ වර්ධන වේගය සියයට 8ක්, 9ක් ලබා ගන්න නම් ආයෝජන තිබෙන්න අවශ්‍යයි සියයට 45කට. ඒ සියයට 45 වෙනුවට අද තිබෙන්නේ සියයට 15යි, 16, 17, 18යි නම්, කොහොමද ඒක වැඩි කර ගන්නේ? කොන්දේසි එක්ක තමයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කියන්නේ අපි 2028 ඉඳන් බිලියන 6.5ක ණයක් ගෙවන්න අවශ්‍යයි කියලා. ඒකෙන් සියයට 35ක් විදේශීය ණය, අනෙක් ටික දේශීය ණය. මේවා ගෙවන්න නම් අපි ආයෝජනය තුළින් අපනයන වර්ධනයක් ඇති කර ගත යුතුයි. අපි බොහොම සතුටු වෙනවා මේ රට දේශීය ලෙස ආදායමක් ලබා ගන්න එක ගැන. එතැනත් ගෙවන කෙනාටම බදු ගහනවා මිසක් බදු දැල ප්‍රසාරණය කිරීමේ වැඩ පිළිවෙළක් නොවෙයි තිබෙන්නේ. ගෙවන එක්කෙනාගෙන් හම්බ වුණාම, එයාට තවත් සියයට 1ක් එකතු කරලා දරා ගන්න බැරි තත්ත්වයකට පත් කරනවා. ඉංග්‍රීසියෙන් කියනවා, "willing to pay, but not affordable to pay" කියලා. එහෙම කළාම මොකක්ද වෙන්නේ? ව්‍යාපාර, profit-driven; ආර්ථිකය, policy-driven. ඒ කියන්නේ තිබෙන ප්‍රතිපත්තියයි, ප්‍රායෝගික ගමනයි අතර ලොකු පරස්පරයක් තිබෙනවා. අපි ඒ පරස්පරය නැති කරන්නේ කොහොමද කියලා බලන්න ඕනෑ.

ඒ වාගේම තමයි උද්ධමනය පාලනය කරන්න ගිහින් රටේ ආර්ථිකය සංකෝචනය කිරීම නිසා අද ඇති වෙලා තිබෙන ප්‍රතිවිපාකයෙන් ට්‍රිලියන 33ක තිබුණු දළ දේශීය නිෂ්පාදනය අද ට්‍රිලියන 32ට පහළ ගිහින් තිබෙනවා. එන අවුරුද්දේත් වර්ධනය අඩු වෙනවා. ඒ වාගේම අපි ප්‍රාග්ධන වියදම්, වියදම් නොකිරීමේ බලපෑමකුත් තිබෙනවා. මම මේ අවස්ථාව උපයෝගි කර ගන්නවා, මේ වැටිලා සිටින අවස්ථාවේ අපි එකමුතුව නැඟිටින්නට අවශ්‍යයි, පාට පැත්තකට දාලා රට ඉලක්ක කරගෙන වැඩ කරන්න ඕනෑ කාලය ඇවිල්ලා තිබෙනවාය කියන එක මතක් කර දෙන්නට.

ආදායම base කරලා tax base එක වැඩි වෙලා නැහැ. මම කිව්වා වාගේ ආදායම වැඩි වුණාට tax base එක වැඩි වෙලා නැහැ. Tax ගෙවන ප්‍රමාණය වැඩි වෙලා නැහැ. 2015-2016දී අපට ලක්ෂ 12ක් tax files තිබුණා. අද තවම තිබෙන්නේ මම හිතන විධියට tax files ලක්ෂ 11යි, 2021දී යම් ප්‍රමාණයකින් ඒවා අඩු වුණු ඒකේ ප්‍රතිඵලයක් විධියට. ඒක වැඩි කරන්නේ කොහොමද? අපි බලන්න ඕනෑ cryptocurrency පිළිබඳව. දැන් cryptocurrency සංවර්ධනය වෙලා තිබෙනවා. නමුත් මේ අය වැයෙන් සත පහක ආදායමක් සොයන්න මාර්ගයක් ඇති කරලා නැහැ. මොකද ඒ? යම් අයට ඒකෙන් ආදායම් උපයන්න පුළුවන් කටයුත්තක්ද ඒ කරලා තිබෙන්නේ? ඒ නිසා තමයි මම කිව්වේ ආදායම වැඩි කරන්න හැදුවාට tax base එක වැඩි කරන්න කටයුතු කරලා නැහැ කියලා.

මම හිතන විධියට ආනයනයේදී අපට පුළුවන් මේ රටේ විදේශ විනිමය ආරක්ෂා කරන්න. අද පොල් තෙල් මේ රටට ගේනවා. මේ රටට palm oil ගේන්න හැකියාව තිබෙනවා. හැබැයි බදු ප්‍රතිපත්තිය නිසා හා palm oil import කරන එක නීතියෙන් අවලංගු කර තිබෙන නිසා මේ රටට බිලියන 19ක, 20ක ආදායමක් අවුරුද්දකට අහිමි වෙනවා. විදේශ විනිමය වශයෙන් ඩොලර් මිලියන 300-350 අතර ප්‍රමාණයක් මේ රටට අහිමි වෙනවා. මේ රටට විදේශ විනිමය තමයි අවශ්‍යම, අත්‍යවශ්‍යම දේ. මේ වාගේ දේවල් ආනයනය කිරීම තහනම් කරනවාට වඩා, රටට ඔබින palm oil ආනයනය කිරීමයි කළ යුත්තේ. 2021ට ඉස්සෙල්ලා මේ රටට ආනයනය කළ palm oilවලින් කිසිම අහිතකර තත්ත්වයක් ජනතාවට ඇති වුණේ නැහැ. මම මේ අවස්ථාවේදී කියනවා මේ ගැන ප්‍රායෝගිකව හිතලා ඒවා විවෘත කරන්න. ඒ විවෘත කිරීම තුළින් විදේශ විනිමය ආරක්ෂා කර ගන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට මිනිත්තු 25ක් තිබුණා. මම තව මිනිත්තු 3ක් ගන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

දැන් ආදායම් උත්පාදන ක්‍රම ඇති කරන්නේ කොහොමද? මේ අය වැයේ තිබෙනවා ලබන අවුරුද්දේ 75,000කට රැකීරක්ෂා දෙනවා කියලා. ඒ රැකීරක්ෂා දුන්නාම අන්තිමට බිලියන 117ක්, ඒ කියන්නේ කෝටි 11,700ක් යනවා ඒකට වියදම.

ඒ වාගේම තමයි ශ්‍රී ලන්කන් එයාර්ලයින්ස් ආයතනය. දැනට බිලියන 684ක් accumulated loss එකක් තිබෙනවා. පාඩු ලබන ආයතන සාමාන්‍යයෙන් bonus ගෙවන්නේ නැහැ. නමුත් මේ අවස්ථාවේ ශ්‍රී ලන්කන් එයාර්ලයින්ස් ය මිලියන 600ක් bonus ගෙවන්න සූදානම් වෙනවා. මම 13.11.2025 දිනැති එයට අදාළ ලේඛනය **සභාගත*** කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. කථාව අවසන් කරන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පාඩු ලබන ආයතනයක් මිලියන 600ක් bonus ගෙවනවා!

අපි දුප්පත් රටක් කියනවා. ඒත් කැබ් රථ ගොඩක් ගේනවා. ලස්සන රටක් හදන්න හදනවා කියනවා. කරුණාකරලා ඒ කැබ් රථ 1,775ක් ගෙන්වන්න දරන වියදම නතර කළොත්, මේ

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු රවී කරුණානායක මහතා]

ව්‍යසනයට ලක් වෙච්ච අය වෙනුවෙන් රුපියල් බිලියන 42ක් - කෝටි 420- පාවිච්චි කරන්න පුළුවන්. මේ රට මල් පවා අපනයනය කරපු රටක්. Huejay International වාගේ ආයතන ජපානය වාගේ රටවලට මල් යැව්වා. දැන් අපි චීනයෙන් හා ඉන්දියාවෙන් මල් ආනයනය කරනවා. ඒ විධියට ආනයනය කරන නිසා අපට විදේශ විනිමය ආරක්ෂා කර ගන්න බැරි වෙලා තිබෙනවා. ඒ නිසා මම හිතන්නේ අපි රැඩිකල් ගමනක් ආරම්භ කරන්න අවශ්‍යයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් අවසන් කරන්න. ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම තව මිනිත්තුවයි ගන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

1947දී අපේ රටේ ඒක පුද්ගල ආදායම ජපානය එක්ක සංසන්දනය කළොත් ඩොලර් 48යි, ජපානයේ ඩොලර් 49යි. අද ඒගොල්ලන්ගේ ආර්ථිකය ඩොලර් ට්‍රිලියන 4.1යි. අපේ ඩොලර් බිලියන 98යි. ඊට පස්සේ අපි චීනය සමඟ සංසන්දනය කරලා බලමු. 1977දී ඒගොල්ලෝ පටන් ගන්න කොට අපි සමඟ සම මට්ටමේ තිබුණේ. අද ඒගොල්ලන්ගේ ආර්ථිකය ට්‍රිලියන 18.7යි. අපේ තවම ඩොලර් බිලියන 98යි. ඒ වාගේම, වියට්නාමයේ අද ඇමෙරිකානු ඩොලර් බිලියන 476යි, අපේ බිලියන 98යි. සිංගප්පූරුව පොඩි රටක්. නමුත්, ඒ ගොල්ලන්ගේ 575යි. අපේ 98යි. ඒ නිසා අපට අවශ්‍ය මේ රටේ රැඩිකල් ආර්ථික වර්ධනයක් ඇති කරන්නයි. කරුණාකරලා රුපියල ආරක්ෂා කරන්න. අපි එදා කිව්වා වාහන ගෙන්වන්න අවස්ථාව දෙනකොට ප්‍රශ්නය තිබෙන්නේ, රුපියල ආරක්ෂා කිරීම කියලා. රුපියල අවප්‍රමාණ වෙන එකෙන් අන්තිමට අපේ Budget එකට බිලියන 40ක් අලාභ වෙනවා.

කාලය හරස් වෙලා තිබෙන නිසා, මම කථාව අවසන් කරනවා. මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කුමාර ජයකොඩි ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.53]

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සුළි කුණාටුව නිසා ලංකාව පුරා ඇති වෙච්ච අභාග්‍යසම්පන්න තත්ත්වයට අදාළව යමක් කථා කරන්න ඕනෑ කියලා මම හිතුවා. විශේෂයෙන්ම මගේ අමාත්‍යාංශයට සම්බන්ධ ක්ෂේත්‍ර දෙකක් වන, ඛනිජ තෙල් සැපයුම සහ විදුලි සැපයුම පිළිබඳව යම් තත්ත්වයක් ප්‍රකාශ කිරීමට මා මේ අවස්ථාව ප්‍රයෝජනයට ගන්නවා.

ඇත්තටම ඉතිහාසයේ නොවූ විරූ ප්‍රමාණයෙන් ලැබුණු වර්ෂාපතනයත් එක්ක, ඒ වාගේම දැඩි සුළං තත්ත්වයත් එක්ක, අපේ විදුලිබල පද්ධතියට මේ මොහොත වන විට ලොකු අලාභ හානියක් වෙලා තිබෙනවා. අද වන විට වාර්තා වෙලා තිබෙන බිඳ වැටීම් සංඛ්‍යාව 132,000කට ආසන්න වෙනවා. එයින් සබඳතා 62,447ක් මේ වන විට යථා තත්ත්වයට පත් කරලා තිබෙනවා. ඉතිරි සබඳතා සහ අදාළ බිඳවැටීම් සම්පූර්ණ කර යථා තත්ත්වයට පත් කරන්න ඉදිරි දින කිහිපය තුළ අපි ඉතාම උනන්දුවෙන් කටයුතු කරනවා වාගේම, ලංකා විදුලිබල මණ්ඩලයේ සහ ලංකා විදුලි පුද්ගලික සමාගමේ සේවකයන් මහන්සි නොබලා, නිදි නොලබා කරන සේවය එක්ක ඉදිරියට කටයුතු කර ගෙන යනවා.

විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ ප්‍රධාන බිඳ වැටීම් කිහිපයක් අපට අත් දකින්න වුණ බව. රන්ටැඹේ - මහියංගනය කිලෝවොට් 132 සම්ප්‍රේෂණ මාර්ගයේ, transmission towers බිඳවැටීමට ලක් වුණා. ඒක ඇත්තටම ලොකු ගැටලුවක් විධියට අපට ආවා. මොකද, ඒකෙන් මහියංගනය, අම්පාර සහ වව්නතිව් කියන ප්‍රදේශවලට සහ ඒ ආශ්‍රිත සැපයුම්වලට දැඩි බලපෑමක් එල්ල වුණා. අපි ඒකට තාවකාලික පිළියමක් වශයෙන් දැනට මොනරාගල - බදුල්ල දක්වා සම්ප්‍රේෂණ රැහැන් මාර්ගය හරහා යම් සම්බන්ධතාවක් අරගෙන ප්‍රධාන මර්මස්ථානවලට, අම්පාර දිස්ත්‍රික්කයට විදුලිය සැපයීමට සමත් වෙලා තිබෙනවා. නමුත්, සියලු පාරිභෝගිකයන්ට විදුලිය ලබා දීම සඳහා ඒ සබඳතාව ප්‍රමාණවත් නැහැ. ඒකට අදාළව තවත් සම්ප්‍රේෂණ කුලුනක් ඉදි කිරීම මේ වන විටත් ආරම්භ කරලා තිබෙනවා. මොකද, බොහෝ තැන්වලට දවසකට පැය දෙකක් හෝ පැය කිහිපයක් විතරයි විදුලිය දෙන්න වෙන්නේ. ඒක rotational විධියට තමයි අපි දැනට පවත්වා ගෙන යන්නේ. මොකද, අඩු ධාරිතාවක් සහිතව තාවකාලිකවයි අපි ඒ සම්බන්ධතාව ලබා ගත්තේ. ඒකට අදාළව අලුතින් තාවකාලික කුලුනක් ඉදි කිරීම දැනටමත් ආරම්භ කර තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, දෙසැම්බර් මාසයේ 10වැනි දා වනකොට ඒක සම්පූර්ණ කරලා රැහැන් මාර්ගය යථා තත්ත්වයට පත් කරලා ඒ ප්‍රදේශයේ සියලු පාරිභෝගිකයන්ගේ විදුලිය සැපයුම යථාවත් කර දීමට. ඒ සඳහා ස්ථිරසාර විසඳුම ලබා දෙන්න ටික කාලයක් යයි. හැබැයි, ඒ සියලු පාරිභෝගිකයන්ට අවශ්‍ය විදුලිය 10වැනි දා වනකොට ලබා දීමට අවශ්‍ය කටයුතු අපි යොදා තිබෙනවා. ඒ වෙනුවෙන් ගොඩක් සේවකයන්, අදාළ නිලධාරීන් බොහොම යුහුසුළුව වැඩ කරගෙන යනවා. ඒ ප්‍රදේශයට යන්න හෝ ඒ තැන හඳුනා ගන්න හෝ බැරි තත්ත්වයටම ජලයෙන් යට වෙලා, මාර්ග අවහිර වෙලා තිබුණේ. දැන් එහි අවශ්‍ය කටයුතු ආරම්භ කරලා තිබෙනවා.

ඒ වාගේම, තවත් ලොකු damage එකක් වුණා උකුවෙල-බෝවතැන්න රැහැන් මාර්ගයට. එහිත් සම්ප්‍රේෂණ කුලුනකට - transmission tower එකකට- damage වෙලා තිබෙනවා. අපි ඒ සඳහාත් අවශ්‍ය මූලික කටයුතු කරගෙන යනවා. ඒකටත් අර වාගේම temporary tower එකක් හදලා දෙසැම්බර් 10 වැනි දා වන කොට අවශ්‍ය ඔක්කොටම විදුලිය ලබා දෙන්න කටයුතු කරනවා.

කොළොන්නාවේ grid substation එකට වතුර ඇවිල්ලා තිබුණා. එහි අවශ්‍ය යථාවත් කිරීම් දැන් කරගෙන යනවා. උකුවෙල-හබරණ කිලෝවොට් 132 ලයින් එකටත් damage එකක් වුණා. අපි දැන් ඒකත් හදාගෙන යනවා. ඒ වාගේම, major distribution breakdowns ගොඩක් තිබෙනවා. ගැටඹේ primary grid substation එකටත් damage වෙලා තිබෙනවා. කොටුගොඩ grid substation එක අපට off කරන්න සිදු වුණා. ඒ හැම දෙයක්ම දැන් යථා තත්ත්වයට පත් කරන්න අවශ්‍ය කටයුතු කරගෙන යනවා. නමුත් සමහර තැන් අපට යථාවත් කරන්න අමාරු වෙලා තිබෙනවා තවම ජලය බැස යෑම ප්‍රමාද වීම නිසා. ඒ වාගේම, අවශ්‍ය තැන්වලට විදුලිය සැපයීම සඳහා අවශ්‍ය විදුලි ජනක යන්ත්‍රත් අපි ලෑහැස්ති කර තිබෙනවා. අවශ්‍යතාව අනුව, ඉල්ලුම අනුව තාවකාලිකව විදුලිය සැපයීම සඳහා කටයුතු කරන්න අපට පුළුවන්.

විශේෂයෙන් ජලය සම්බන්ධ ගැටලුවකුත් තිබෙනවා. මොකද, ජල පවිත්‍රාගාර ගංවතුරින් යට වීම නිසා ඒවායේ pump stations damage වෙලා තිබෙනවා. ඒ වාගේම, ඒ තැන්වල විදුලියත් විසන්ධි වෙලා තිබෙනවා. මුලින්ම ඒ pump stations යථා තත්ත්වයට පත් කරන්න ඕනෑ. ඊට පසුව තමයි විදුලිය සැපයීම ගැන උනන්දු වෙලා ඒ වැඩේ කරන්න අපට පුළුවන් වන්නේ. මහනුවර දිස්ත්‍රික්කයේ විශේෂයෙන් මහනුවර නගරයට ඊයේ උදේ වනකල්ම පානීය ජලය නොමැතිව තිබුණා. මොකද, ගැටඹේ ජල පවිත්‍රාගාරය සම්පූර්ණයෙන්ම ජලයෙන් යට වුණා. ඒ වාගේම මහනුවර, පේරාදෙණිය, කටුගස්තොට වැනි ප්‍රදේශවල භූගත විදුලි රැහැන් ගොඩක් damage වෙච්ච විධියට අපට faulty පෙන්වනවා. අපි පිටින් ගෙනැල්ලා සම්බන්ධතාව ඇති කළත්, භූගත පද්ධති හරහා, circuits හරහා අපට damages වාර්තා වුණා. දැන් ඒ ගොඩක් ඒවාට අපි තාවකාලික විසඳුම් ලබා දෙමින් යනවා. මේවා නියමිත පරිදි ප්‍රතිස්ථාපනය කරන්න කාලයක් යයි.

හැබැයි ලංකා විදුලිබල මණ්ඩලයේ, LECO එකේ වාගේම ආණ්ඩුවේ අරමුණ වී තිබෙන්නේ ජනතාවට, කර්මාන්තවලට ඉක්මනින්ම මේ විදුලි සැපයුම ලබා දීමයි. ඒ සඳහා සේවක භවතුන්, නිලධාරින් හැමෝම කැප වෙලා යුහුසුළුව වැඩ කරගෙන යනවා. දැන් ගෙවල්වලත් විදුලිය විසන්ධි වෙලා තිබෙනවා. ගෙවල්වල internal circuitsවල damages තිබෙනවා; ප්‍රශ්න තිබෙනවා. අපට සමහර වෙලාවට ඒවා පවා සොයන්න වෙනවා. ඉතින්, අපි ජනතාවගෙන් ඉල්ලා සිටිනවා, පුළුවන් තරම් තමන්ගේ ප්‍රදේශයේ තාක්ෂණික නිලධාරියෙකු හෝ සම්බන්ධ කරගෙන ඒවා යථා තත්ත්වයට පත් කර ගන්න කියලා. ඒක අපට ලේසියි. මොකද, අපි සැපයුම දුන්නත් ගෙදර විදුලි සම්බන්ධතාව යථාවත් කරන්න බැරි තත්ත්වයක් තිබෙනවා, සමහර ගෙවල් ජලයෙන් යට වීම නිසා.

ඛනිජ තෙල් සැපයුම සම්බන්ධයෙන් ගත්තොත්, ජලයෙන් යට වීම නිසා පිරවුම්හල් 38කට හානි සිදු වුණා. අද වන කොට එම ප්‍රමාණය 24ක් දක්වා අඩු වෙලා තිබෙනවා. මම හිතනවා, ලබන සඳුදා වන කොට අපට ඒ පිරවුම්හල් 24ත් උපරිම ක්‍රියාත්මක මට්ටමට ගන්න පුළුවන් වෙයි කියලා.

මොකද, ඒවායේ වතුර තිබෙනවා. Pumpsවලට වතුර ගිහිල්ලා තිබෙන නිසා ඒවා සුද්ද කරන්න තිබෙනවා. අපි ඒ ටික කරගෙන යනවා. ඒ වාගේම සියලු පිරවුම්හල් සඳහා අවශ්‍ය ඉන්ධන සැපයීම නොකඩවා කිරීමට අවශ්‍ය මාර්ග පහසුකම්ද සලසාගෙන තිබෙනවා. නුවරඑළිය දිස්ත්‍රික්කයට පවා කුඩා බවුසර් හරහා තෙල් ලබා දීමට අවශ්‍ය කටයුතු කරනවා; හිඟයකින් තොරව ඉන්ධන සපයන්න අවශ්‍ය කටයුතු කරලා තිබෙනවා.

සමහර ප්‍රදේශවල කට කථාවක් යවා තිබෙනවා ඛනිජ තෙල් හිඟයක් තිබෙනවා කියලා. එහෙම කිසිම දෙයක් නැහැ. අපේ සේවකයන්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සේවකයන් ඇතුළු හැමෝගේම උත්සාහයෙන් විදුලි බලාගාරවලට අදාළ ජලාශ රැක ගන්න අපට පුළුවන් වුණා. එක අවස්ථාවක වික්ටෝරියා විදුලි බලාගාරය ජලයෙන් යට වන මට්ටමට මීටරයකට, මීටර් එකහමාරකට පමණ ජලය ආවා. ඊට පසුව අපි හැමෝම එකතු වෙලා ඒක පාලනය කර ගත්තා. අපි ඉදිරියටත් අවශ්‍ය කටයුතු කරමින් ඉන්නවා. ජනතාවට විදුලි බලය සහ ඛනිජ තෙල් සැපයුම යථා පරිදි ලබා දීමට අවශ්‍ය කටයුතු අපි යුහුසුලුව කරනවා. ආණ්ඩුවේ වගකීමක් ලෙස සලකා අපි එය ඉදිරියට කරගෙන යනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු බිමල් රත්නායක අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් තිබෙනවා.

[අ.භා.4.03]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද අය වැය විවාදයේදී ගොඩක්ම කථා කරන්න සිදු වෙලා තිබෙන්නේ, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ගැන නිසා අපේ රටේ ආර්ථිකය ගැන කථා කරන්න තිබෙනවා. ආර්ථිකයට සහ සමාජයට විශාල බලපෑමක් ඇති වෙච්ච සිද්ධියක් තමයි මේ සුවිශාල ස්වාභාවික ව්‍යසනය. ඒ නිසා අනෙක් සෑම මන්ත්‍රීවරයෙකු වාගේම මමත් කල්පනා කළා ඒ පිළිබඳව කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම ප්‍රශ්නයට මුහුණ දීමේදී අපි ඒ ඕනෑම ක්ෂේත්‍රයක් සම්බන්ධව මූලික උපාය මාර්ගික සැලැස්මක ඉන්නවා, ඉතාම හදිසි, ප්‍රමුඛ කටයුතු, තාවකාලිකව ගෙන ආ යුතු විසඳුම් සහ ස්ථිරසාර විසඳුම්- urgent, temporary and permanent solutions - ආදි වශයෙන්. අධ්‍යාපනය ගත්තත්, පාරවල් ගත්තත්, ජන ජීවිතය ගොඩ නැඟීම ගත්තත් හැම ප්‍රශ්නයක් දිහාම අප මේ වෙලාවේ බලන්නේ ඒ දෘෂ්ටි කෝණයෙන්. ඒ අනුව අපේ අවධානය ප්‍රධාන වශයෙන්ම යොමු වෙලා තිබෙන්නේ, මෙන්න මේ හදිසි සහ තාවකාලික ප්‍රතිකර්ම කියන එකට. ඒ අතරේ අපි අපේ මට්ටමෙනුත් ඒ වාගේම ජනාධිපතිතුමාගේ මට්ටමෙනුත් කටයුතු කරගෙන යනවා. Rebuild the nation කියන එක එන්නේ permanent solution එකක් හැටියට. ඊට අදාළව, ලංකාව තව අවුරුදු දෙකකින් කොතැනටද ගෙනිහින් තබන්නේ කියන කාරණය ගැනත් සංකල්පමය වශයෙන් නිලධාරි මට්ටමෙනුත්, අපේ මට්ටමෙනුත් අපි යම්කිසි ආකාරයක මූලික සූදානම්වීම්වල ඉන්නවා.

මේ ස්වාභාවික ව්‍යසනයෙන් විනාශයට පත් වෙච්ච පැති ගොඩක් තිබුණා. ඒවා අතරින් උතුරු පළාත ගැනත් සඳහන් කළ යුතුමයි. උතුරු පළාතට අයත් දිස්ත්‍රික්ක පහෙන් වාවුනියා සහ ආදී කවුරු වාගේ ප්‍රදේශ කිහිපයක් හැරුණාම යාපනය දිස්ත්‍රික්කයට වෙච්ච බලපෑම ඉතා අඩුයි. ඒ වාගේම කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ ඇතැම් ප්‍රදේශවලට බලපෑමක් සිද්ධ වුණා, ඉරණමඩු ජලාශයේ ඇළකින් යම් ආකාරයකට ආපු ජලයත් එක්ක. වවුනියාව දිස්ත්‍රික්කයේ නෙරියකුලම්, සෙට්ටිකුලම් ප්‍රදේශවලට යම් ප්‍රමාණයකට හානි සිද්ධ වුණා. ජනතාව එළියට ගන්න බැරිවත් හිටියා, ඒ ප්‍රදේශයේ ගංවතුර නිසා. වැඩිම හානි වෙලා තිබෙන, වැඩිම බලපෑම්වලට ලක් වෙලා තිබෙන ප්‍රදේශ වන්නේ, මන්නාරම සහ මුලතිව්. වැඩිපුරම මන්නාරමට හානි වෙලා තිබෙනවා. මම ඊයේ කථා කර බලද්දී මන්නාරමේ camps 83ක් තිබුණා. මන්නාරමේ ග්‍රාම නිලධාරි වසම් 162ක් විතර තිබෙනවා. ඒකෙන් 150ක් විතර වර්ෂාවට යට වෙනවා. මේ වෙලාවේ සිලාවතුර, නානාට්ටාන් ආදි ප්‍රදේශ යට වෙලා තිබෙනවා. ස්වේච්ඡාවෙන් කටයුතු කරන කණ්ඩායම්, මන්ත්‍රීවරුන්, දිසාපතිතුමා ඇතුළු හැමකෙනාම එකතු

[ගරු බිමල් රත්නායක මහතා]

වෙලා ඒ ජනතාව දුෂ්කරතාවලින් බේරා ගන්න කටයුතු කරමින් ඉන්නවා. ඒ වාගේම ඩෙල්ෆ්ට්වල, නයනතිව්වල බෝට්ටු ගමනාගමනය පිළිබඳව අනතුරුදායක තත්ත්වයක් තිබෙනවා කියා ඊයේ වාර්තා වෙලා තිබුණා. අපි උපදෙස් දුන්නා, නාවික හමුදාවෙනුත්, DGMS එකෙනුත් කණ්ඩායම් ගෙනැල්ලා ඒ තිබෙන බෝට්ටු පරීක්ෂා කරන්න කියලා. නොවැම්බර් අග සහ දෙසැම්බර් වනකොට උතුර පළාතට, නැඟෙනහිර පළාතට මෝසම් වර්ෂාව කොහොමටත් එනවා. ඒ නිසා ඒ කාලයේදී කොහොමත් ferry services නතර කරන්න වෙනවා; slow කරන්න වෙනවා. කෙසේ වෙතත්, ඒ බෝට්ටු පරීක්ෂා කරන්න කියලා තිබෙනවා.

විශේෂයෙන්ම ගරු ජනාධිපතිතුමා සමඟ ආණ්ඩු පක්ෂයේ කණ්ඩායම දින දෙකකට කලින් Zoom සාකච්ඡාවක් පවත්වද්දී ගරු ජෙගදීස්වරන් මන්ත්‍රීතුමා කියා සිටියා, මන්නාරමේ කුඹුරු අක්කර 35,000ක් පමණ හානි වෙලා තිබෙන බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට මේ කාරණය ඇතුළේ යම්කිසි රිදී රේඛාවක් පෙනෙන්න තිබෙනවා. මොකද, අපි තවම මාස් කන්නය ආරම්භයේ ඉන්නේ. ඒ නිසා අපි වන්දි දෙන්න පටන් ගන්නවා, ඉතාම ඉක්මනින්. අපි හිතනවා, සති දෙකක් පහුවෙලා හරි අපට මාස් කන්නය පටන් ගන්න පුළුවන් වෙයි කියලා. ජනාධිපතිතුමාගේ පැත්තෙන් කෘෂිකර්ම අමාත්‍යාංශයට උපදෙස් දුන්නා, ජෙගදීස්වරන් මන්ත්‍රීතුමාගේ ඉල්ලීම මතම ඒ කෘෂිකාර්මික කටයුතු නැවත ආරම්භ කරන්න අවශ්‍ය පහසුකම් ලබා දෙන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම උතුරු පළාතේ දිසාපතිවරුන්ට අපි අපේ පැත්තෙන් ලබා දෙන්න තිබෙන උපරිම සහාය ලබා දීලා තිබෙනවා. ඒ වාගේම තමයි උතුරු පළාතේ ජනතාවට, විවිධ පුද්ගලයන්, ඉංජිනේරුවන්, ස්වේච්ඡා කණ්ඩායම් උදවු කරනවා. ඒ වාගේම අපි කෙළින්ම කියන්න ඕනෑ, ජාතික ජන බලවේගයේ කණ්ඩායම අද මන්නාරමට, මුලතිව්වලට ගිහිල්ලා ජනතාවට උදවු කරන බව. මුලතිව්වල තිබෙන ප්‍රධාන ප්‍රශ්නය ගරු මන්ත්‍රීවරු වාර්තා කළා. විශේෂයෙන්ම මුලතිව්-කෝකිලායි පාරේ තිබෙන Nayaru Bridge එක කැඩිලා තිබෙනවා. මම දැන් කථා කරලා නැවත check කළා. මේ වන කොට එය යථාවත් කිරීමේ වැඩ පටන් අරගෙන තිබෙනවා. අද Nayaru Bridge එක ළඟට bailey bridges ගිහින් තිබෙනවා. අපේ target එක දෙසැම්බර් 15. නමුත් ඊට කලින් අපි ඒ කටයුතු අවසන් කරනවා. කෝකිලායි ගම්මානයේ ජනතාව අතරමං වී සිටියා. අද ඔවුන් එහි පන්සලේ ඉන්නවා. අපි ඔවුන්ට අවශ්‍ය ආධාර ලබා දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කවුරුත් පිළිගන්නවා, සාමාන්‍ය තත්ත්වයෙන් තිබුණු හැම දෙයක්ම සපයන්න බැහැ කියන එක. නමුත් අත්‍යවශ්‍ය සේවා සැපයීම වෙනුවෙන් දිසාපතිවරුන්, දේශපාලන නායකත්වය, ස්වේච්ඡා කණ්ඩායම් ඇතුළු සියලුදෙනා මැදිහත් වෙලා උතුරු පළාත වෙනුවෙන් කටයුතු කරගෙන යනවා. අපි උතුරු පළාත කිසිසේත් අමතක කරලා නැහැ. ඒ වාගේම බලාපොරොත්තු වෙනවා, හෙට දිනයෙන් පසුව ශුද්ධ පවිත්‍ර කිරීම සඳහා අනුරාධපුර දිස්ත්‍රික්කයෙනුත් ස්වේච්ඡා කණ්ඩායම් විශේෂයෙන්ම මන්නාරමට යවන්න. අපි ස්තුතිවන්ත වෙනවා, ගරු අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා එතුමාගේ සමහර නියෝජිතයන් වාගේ වෙන්නේ නැතුව සත්‍ය තත්ත්වය කථා කරපු එක ගැන. මොකද, මම හිතනවා, මඩකලපුව, යාපනය කෙසේ වෙතත්, ඒ ගොඩක් මන්ත්‍රීතුමන්ලාට යන්න තිබුණේ මන්නාරමට සහ මුලතිව්වලටයි කියලා. මා හිතන විධියට, යාපනයේ ඉඳලා A32 මාර්ගය ඇරලා තිබෙන්නේ. ඒකෙන් එන්න පුළුවන් මන්නාරමට. ඒකේ එන්නේ නැතුව, කොහොමද නුවරට ආවේ කියලා මට හිතා ගන්න බැහැ. ගරු අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා ඇතුළු සාධාරණව කටයුතු කරන ඕනෑම මහජන නියෝජිතයෙකුට අපේ පැත්තෙන් දෙන්න තිබෙන උපරිම සහයෝගය දෙන්න අපි කැමැතියි. මොකද, මේක ආණ්ඩුවකට හෝ පක්ෂයකට තනියම කරන්න පුළුවන් දෙයක් නොවෙයි. මේක ජාතියක් වශයෙන් fight කරන්න තිබෙන දෙයක්. ගරු මන්ත්‍රීතුමනි, ඒක තේරුම් ගන්න තරම් පරිණතකමක් තිබීම ගැන අපි ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා, මේ "urgent" කියන issue එකේදී ග්‍රාම නිලධාරින්ට හැමදාම සිදු වෙලා තිබුණේ, අනාථ කඳවුරක, සරණාගත කඳවුරක holder එකක්, bulb එකක් දාන්නත් බිලක් ලිවිය යුතු, දිසාපතිතුමාට කථා කළ යුතු තත්ත්වයක් බව. මම කොළොන්නාවේ camp එක visit කළා, ගරු එරංග ගුණසේකර නියෝජ්‍ය ඇමතිතුමා එක්ක. එතැන ග්‍රාම නිලධාරිතුමිය struggle කරනවා අපි දැක්කා. අපි ඒ වෙලාවේම කථා කළා, ජනාධිපති ලේකම්තුමාට සහ Public Administration Ministry එකේ Secretaryට. එතුමන්ලා සාකච්ඡා කරලා ඊයේ නිකුත් කළා අවශ්‍ය උපදෙස්. ඒ අනුව දැන් ඕනෑම ග්‍රාම නිලධාරි මහත්මයෙකුට මහත්මියකට මුදලින් රුපියල් 50,000ක් අතට දෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් මේ ගැන දන්නවා. මොකද, ඔබතුමාත් District Coordinating Committee එකක සභාපතිවරයෙක්. දැන් අපි ඒ අවස්ථාව සලසා දී තිබෙනවා. ඒ මුදලින් එතුමන්ලාට ඕනෑ දේවල් ගන්න පුළුවන්. ඊට පසුව ඒවාට බිල් කොහොමටත් දෙන්න ඕනෑ. ප්‍රාදේශීය ලේකම්වරයෙකුට ලංකා ඉතිහාසයේ පළමු වතාවට රුපියල් ලක්ෂ 500ක් cash payment කරන්න අපි ඉඩ දීලා තිබෙනවා. ඊට වඩා වියදම් කරන්නත් පුළුවන්. බදුල්ල හා Central Province ගත්තොත්, රුපියල් ලක්ෂ 500 මදි. නමුත් රුපියල් ලක්ෂ 500 දීලා තිබෙන්නේ cashවලින් කරන්න පුළුවන් වන විධියට. අපි මෙය පුළුවන් තරම් ප්‍රායෝගිකව කරනවා. මොකද, අපි මේවා ගැන දන්නවා. අපි බිම් මට්ටමේ දේශපාලන ව්‍යාපාරයක්. අපි මේවා අවුරුදු ගණනක් කරලා තිබෙනවා. එම නිසා තමයි අපට එහි ගිය ගමන්ම ඒ ප්‍රශ්නය තේරුණේ. අපි නිකම්ම උඩින් බහින්නේ නැහැ. අපි ඒ කියපු දේවල් කරලා තිබෙනවා.

ඒ වාගේම අපි දන්නවා, මිනිසුන්ට කොච්චර අමාරුද කියලා. ඒ නිසා තමයි ගරු අගමැතිතුමිය කිව්වා වාගේ පාසල් දරුවකුට රුපියල් 25,000ක් දීලා තිබෙන්නේ. ඒ වාගේම ගෙවල් ශුද්ධ පවිත්‍ර කර ගැනීම සඳහා රුපියල් 25,000ක් දීලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ඒ ගෙවීම් කටයුතු පටන් අරගෙන තිබෙනවා. මට ඔබතුමා අවසර දුන්නොත්, දැනට මේ රුපියල් 25,000 ගෙවන්න පටන් අරගෙන තිබෙන දිස්ත්‍රික්ක සඳහන් කරන්න පුළුවන්. ඒ වාගේම අනික් සෑම දිස්ත්‍රික්කයකටම වාගේ මුදල් යවා තිබෙනවා. දිසාපතිවරුන්ට පුළුවන් ඒ තොරතුරු තිබෙන තත්ත්වය මත ඒවා බෙදා හැරීම පටන් ගන්න. නමුත් ඔබතුමා දන්නවා, විශේෂයෙන්ම මධ්‍යම කඳුකරය, බදුල්ල, මොනරගල දිස්ත්‍රික්කයේ සමහර කොටසක්, කුරුණෑගල, පුත්තලමේ හලාවත මුන්දලම කොටස ගත්තොත්, ඒවායේ වැඩ පටන් ගන්න පොඩි කාලයක් යයි. ඒ හැර අනෙක් තැන්වල අවශ්‍ය කටයුතු කරමින් තිබෙනවා.

උදාහරණයක් විධියට, රුපියල් 25,000 ගෙවීම ඊයේ කොළඹින් ආරම්භ කළා. මේ වන විට රුපියල් 25,000 ගෙවීම ආරම්භ කරලා තිබෙනවා, කොළඹ, ගම්පහ, අනුරාධපුරය, බදුල්ල, මොනරාගල, රත්නපුර සහ කෑගල්ල දිස්ත්‍රික්කවල. අම්පාර දිස්ත්‍රික්කයට අද ඉඳලා ගෙවන්න පුළුවන් බව GA දන්වා තිබෙනවා, උදේ 11.00 වනකොට. යාපනයට, මන්නාරමට, මුලතිව්වලට, කිළිනොච්චියට, මඩකලපුවට සහ ත්‍රිකුණාමලයට මුදල් ලැබී ඇති බවට දිසාපතිවරු සහතික කර තිබෙනවා. අපි මේ

කට්න් බතල කොළ හිටවනවා නොවෙයි. අපි ඒ මුදල් deliver කරලා තිබෙනවා. දැන් තිබෙන්නේ, සොයා බලා අවශ්‍ය කටයුතු කරන්නයි. අපි කියා තිබෙනවා, මේ මුදල් දෙනකොට මාරාන්තික විධියට, නීති රීති 500ක් බලන්නේ නැතුව මිනිසුන්ට දෙන්න කියලා. විපක්ෂයේ සමහරු ඇවිල්ලා ඒ ගැන බොරුත් කියනවා මම දැක්කා. එහෙම දෙයක් නැහැ. නිලධාරින් කියන්නේ අමුතු කට්ටියක් නොවෙයි. ඒ අයත් ලංකාවේ මිනිස්සු. ඒගොල්ලන්ට තේරෙනවා ආණ්ඩුව වැඩ කරන විධිය. ආණ්ඩුව ඒගොල්ලන්ගේ පස්සෙන් එළවනවාද, ආණ්ඩුව ඒගොල්ලන්ට උදවු කරනවා ද කියලා ඒගොල්ලන්ට තේරෙනවා. අපි ඒ අයට respect කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට මහනුවර දිසාපතිතුමා ගැන දුක හිතෙනවා. එතුමා දින 7ක් තිස්සේ මහන්සි වුණා ජනතාව වෙනුවෙන්. එතුමා ම දීපු බවුසර්වලින් තෙල් ගහගෙන, එතුමා ම දීපු ඩෝසර්වලින් කපපු පාරෙන්ම ගිහිල්ලා තමයි එතුමාට තර්ජනය කරලා තිබුණේ. අපි දවස් දෙකෙන් ගලගෙදර ඉඳලා නුවරට යන මාර්ගය විවෘත කළා, RDA එකේ නිලධාරින්, ත්‍රිවිධ හමුදාව සහ නුවර දිසාපතිතුමාගේ සහයෝගය ඇතිව. නායක ස්වාමීන් වහන්සේ නමක් පවා දවසක්ම හිර වෙලා හිටියා, කොහොමවත්ම - දෙපැත්තෙන්ම - යන්න බැරිව. අපි ඒ දෙපැත්තෙන්ම පාර කපලා ගලගෙදර මාර්ගය open කළා. කඩුගන්නාව මාර්ගයත් open කළා. ඒ මන්ත්‍රීවරු පිරිස ඒ පාරෙන්ම ගිහිල්ලා මහනුවර දිසාපතිට අතිශය නරක විධියට තර්ජනය කරලා තිබුණා. අපි කියන්නේ මේකයි. රාජ්‍ය නිලධාරින් ගැන විවිධ චෝදනා තිබෙන්න පුළුවන්. නමුත් අප අද අත් දකින දෙය තමයි, රාජ්‍ය නිලධාරින් සියලුදෙනාම අද ඉතා අවංකව සහ ඉතා වුවමනාවෙන් කටයුතු කරනවා කියන එක. ඇත්තටම මට තේරුම් ගන්න අමාරුයි, මොකක්ද ඒ හෘදය සාක්ෂිය කියලා.

ඒ වාගේම ගොඩක් අයට ප්‍රශ්නයක් තිබෙනවා, ව්‍යාපාර සහ කර්මාන්ත සම්බන්ධව. කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයෙන් ආපදාවට ලක් වෙච්ච කර්මාන්ත register කරන්න පටන්ගෙන තිබෙනවා. ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමාට මම දැනුම් දුන්නා, ජනාධිපතිතුමා එක්ක කථා කරලා, register වුණු කුඩා ව්‍යාපාර පිළිබඳව බලන්න කියලා. ඒගොල්ලන්ටත් ආරම්භක කටයුතු සඳහා, එනම් ණය කපා හැරීම වාගේ දේවල් නොව ව්‍යාපාරය ආරම්භ කිරීමට අවශ්‍ය මූලිකම දේවල් සඳහා -කුණු ටික සුද්ද කර ගන්න වෙන්න පුළුවන්, මඩ ටික සුද්ද කර ගන්න වෙන්න පුළුවන්- යම්කිසි සහනයක් සලසන්න කියලා. අපට දැඩි විශ්වාසයක් තිබෙනවා, ඒවා සිද්ධ වෙනවා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තමයි නැවත පදිංචි කිරීම් ගත්තත්. මිනිස්සු හැමදාම කඳවුරුවල ඉන්න කැමති නැහැ. කඳවුරුවලට ආපු අය වර්ග තුනක් ඉන්නවා. එක පිරිසක් තමයි, නාය ගිය නිසාම ආපු අය. තවත් කණ්ඩායමක්, නාය යන්න ඉඩ තිබෙන නිසා ආපු අය. තවත් සැලකිය යුතු පිරිසක් ආවා භය නිසා. පළමුවැනි සහ දෙවැනි කණ්ඩායම් ඒ ගෙවල්වලට යවන්න අපට බැහැ. තුන්වැනි කණ්ඩායමේ අයගෙන් කොටසක් මේ වනකොට ගෙවල්වලට ගිහිල්ලාත් තිබෙනවා; තවමත් යමින් ඉන්නවා. නමුත් දැන් විශාල ප්‍රශ්නයක් තිබෙනවා. ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානයේ නිලධාරින් සහතික කරන්න ඕනෑ - ensure කරන්න ඕනෑ- ඒ ගම්මාන, ඒ කඳු ආශ්‍රිත ප්‍රදේශ ආරක්ෂිතයි කියලා. නමුත් NBRI එකට ගොඩක් scientistsලා බඳවාගෙන තිබුණේ නැහැ. ඒ නිසා අද අපි අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්තුමා එක්ක, NBRI එකේ Director General සහ භූ විද්‍යාඥයෙකු වන පරිසර නියෝජ්‍ය ඇමතිතුමා එක්ක ජනාධිපති ලේකම් කාර්යාලයේදී සාකච්ඡා කරලා අවශ්‍ය කටයුතු යොදනවා. GSMB එකේ, National Water Supply and Drainage Board එකේ සහ Peradeniya University එකේ Geological Department එකේ senior studentsලා ආදි සියලුදෙනා NBRI එකට සම්බන්ධ කරගෙන, NBRI එකේ scientistsලාගේත් සම්බන්ධය ඇතිව Central Province, ඌව සහ සබරගමුව පළාත්වලට ගිහිල්ලා පරීක්ෂා කර බලා "ඒවායෙහි අනාරක්ෂිත තත්ත්වයක් නැහැ, එහෙම නැත්නම්, අනාරක්ෂිත තත්ත්වය ඉතාම අඩුයි" කියලා ඉතාම ඉක්මනින් ජනතාවට සහතිකය ලබා දෙන්න. ඒ අනුව තමයි අප බලාපොරොත්තු වෙන්නේ, ජනතාව ගෙවල්වලට යවන්න. ගෙවල්වල ඉන්න ජනතාවට ආහාර ද්‍රව්‍ය ලබා දීමේ ගැටලුවක් නැහැ. නමුත් ප්‍රවාහනයේදී ඇති වන ප්‍රායෝගික දුෂ්කරතා නිසා ගැටලු තිබෙන්න පුළුවන්.

Circuit එක දුවන එක තමයි දැන් සිදු විය යුතුව තිබෙන ලොකුම දෙය. Circuit එක දුවන්න නම්, ප්‍රවාහනය, telecommunication සහ electricity අවශ්‍යමයි. අපේ ගරු බලශක්ති අමාත්‍යතුමා ඒ ගැන කථා කළා. අපේ ගරු එරංග වීරරත්න නියෝජ්‍ය අමාත්‍යතුමා telecommunication ගැන කථා කරන්න නියමිතව ඉන්නවා. මම ප්‍රවාහනය ගැන කියන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "අධික වර්ෂාපතනය හේතුවෙන් 2025.11.27 වන විට ගමනාගමනය කළ නොහැකිව තිබූ නමුත්, 2025.12.03 දින, එනම් අද දහවල් 1.00 වන විට ගමනාගමනය සඳහා විවෘතව ඇති මාර්ග කොටස්" යනුවෙන් සඳහන් ලේඛනය මම **සභාගත*** කරනවා.

මේවා RDA එකට අයිති ප්‍රධාන මාර්ග. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාර්ග 246ක් RDA එකේ නිලධාරින්ගේ මහන්සියෙන් සකස් කරලා තිබෙනවා. ඒ සඳහා ජනතාව සහ ත්‍රිවිධ හමුදාව උදවු කරලා තිබෙනවා. අපි ඔවුන්ට ස්තුතිවන්ත වෙනවා. RDA එකේ එක් නිලධාරියෙකු ජීවිතක්ෂයට පත් වුණා. අපේ උදව්වට RDA එකෙන් hire කරපු වාහනයක ආපු පුද්ගලයෙක් හඟුරන්කෙත ප්‍රදේශයේදී නැති වුණා. ඔවුන් දරන මේ විශාල මහන්සියට අපි ස්තුතිවන්ත වෙනවා. රටේ RDA එකේ මාර්ගවලින් සියයට 98ක කටයුතු ලබන දෙසැම්බර් 10වැනි දා වෙනකොට අවසන් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒක එහෙමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවැනි දවසේ SLTB එකේ බස් 1,000ක් ගෙනාවා. ඊට පස්සේ ඒක 2,000ට ගෙනාවා; 3,000ට ගෙනාවා; දැන් 4,000ට ගෙනැල්ලා තිබෙනවා. ඒ වාගේම අපි වැඩිපුරම හානියට ලක් වෙච්ච ප්‍රදේශවල SLTB එකට උදව් කරන්න විශේෂ මෙහෙයුමක් හදලා තිබෙනවා.

දුම්රිය මාර්ග ගත්තොත්, සුවිශාල හානියක් සිද්ධ වෙලා තිබෙනවා. දුම්රිය engines විශාල ප්‍රමාණයක් - 20ක් විතර - රඹුක්කනින් එහා පැත්තේ තිබෙනවා. ඒක ටිකක් serious වැඩක්. නමුත් අපි ඊයේ සහ අද ත්‍රිවිධ හමුදාව, RDA එක සහ දුම්රිය දෙපාර්තමේන්තුව ඔක්කෝම එකතු කරලා විශේෂ සාකච්ඡා කිහිපයක් පැවැත්වුවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රධාන දුම්රිය මාර්ග තුනක්, පුත්තලම northern line එක, මඩකලපුව සහ බදුල්ල line එක හදන්න අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

---

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
I have no time, Hon. Member. මම කෝච්චිය වාගේ යන්නේ. *[බාධා කිරීමක්]* சொல்லுங்கள்!

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ அமைச்சர் அவர்களே, 'டித்வா' புயலால் பாதிக்கப்பட்டிருக்கின்ற மக்களுக்கு அரசாங்கத்தினால் எடுக்கப்படுகின்ற நடவடிக்கைகளுக்கு எங்களுடைய பூரணமான ஆதரவு உங்களுக்கு இருக்கும். தமிழ் மக்கள் அறம் சார்ந்தவர்கள்; அவர்கள் எக்காலத்திலும் இதுபோன்ற விடயங்களுக்கு எதிரானவர்கள் அல்லர். உங்களுக்குத் தெரியும், சுனாமி வந்த காலப்பகுதியில்கூட, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
ஒரு நிமிடம்!

நான் குறிப்பிட வருகின்ற முக்கியமான விஷயம் என்னவென்றால், எழுவைதீவு, அனலைதீவு, நயினாதீவு மற்றும் நெடுந்தீவுக்கான போக்குவரத்துச் சேவைகள் பற்றி நீங்கள் சொன்னீர்கள். எழுவைதீவுக்கான 'எழுதாரகை' படகுச் சேவை இயங்காது இருக்கின்றது. அதேபோல, நெடுந்தீவுக்கான 'குமுதினி' மற்றும் 'நெடுந்தாரகை' படகுச் சேவைகள் மிக முக்கியத்துவம் வாய்ந்ததாக இருக்கின்றன. கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் இந்த விடயத்துக்குப் பொறுப்பானவர் என்ற வகையில், தயவுசெய்து மேற்குறிப்பிட்ட படகுச் சேவைகள் தொடர்பாகக் கூடுதலான கவனம் செலுத்துமாறு நான் கேட்கிறேன்.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු මන්ත්‍රීතුමනි, මම ඒ ගැන මගේ කථාවේ මුලින්ම කිව්වා. මම අද උදේත්, ඊයේත් ඇත්තටම ඩෙල්ෆ්ට්වල, නයිනතිව්වල මේ ප්‍රශ්නය සඳහා මැදිහත් වුණා. ඒ නිසා මම ඒකට වග කියනවා. ආරක්ෂිතව ගමනාගමනය සහතික කරනවා. මම උදේ GAට කථා කළා; චන්ද්‍රසේකර් ඇමතිතුමාට කථා කළා; DGMSට කථා කළා. දැන් ඒ අය මැදිහත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම SLTB බස් 4,200ක් හෙට දිනයේදී ධාවනය කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

දුම්රිය ප්‍රශ්නය ගැනයි මම කිය කියා හිටියේ. දුම්රියටම ආවේණික ගැටලුත් තිබෙනවා. ඒ තිබියදීත් ඔවුන් මහන්සි වෙනවා. ඒත් අපි නොවැම්බර් 26වැනි දා දුම්රිය 275කුත්, නොවැම්බර් 27වැනි දා දුම්රිය 245කුත් operate කළා. ඊට පස්සේ NBRI උපදෙස් මත සහ සමහර ප්‍රායෝගික ප්‍රශ්න මත අපි 28වැනි දා ධාවනය කළේ දුම්රිය 10යි. 29වැනි දා 12යි. 30වැනි දා 25යි. දෙසැම්බර් 1වැනි දා 80යි. 2වැනි දා 139යි. අද, දෙසැම්බර් 3වැනි දා 150ක් ධාවනය කරලා තිබෙනවා. නමුත් තවමත් අපට සමහර තැන්වලින් එහාට යන්න බැරි වෙලා තිබෙනවා. මේ දෙන service එක වෙලාවට, පිළිවෙළට දෙන්න උපරිම උත්සාහ කරන්න කියලා අපි දුම්රිය නිලධාරින්ගෙන් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම පෞද්ගලික සහ රාජ්‍ය කියන අංශ දෙකේම bus operations පටන් අරගෙන තිබෙනවා. අපට සැලකිය යුතු කාලයක් ගත වෙන්න ඉඩ තිබෙනවා, පේරාදෙණියේ දුම්රිය පාලම, රඹුක්කනින් එහා කඩුගන්නාව පැත්තේ පාලම් දුර්වල වෙලා තිබෙන නිසා. ඒ නිසා දුම්රිය මාර්ග ප්‍රතිසංස්කරණය කරන්න යන කාලය අපට හරියටම කියන්න අමාරුයි. ඒක සති තුනක්, හතරක් හෝ මාසයක්, දෙකක් වෙන්න පුළුවන්. ඒ නිසා අඹේපුස්ස දක්වා trains වැඩ කරනවා. අඹේපුස්ස ඉඳලා පොල්ගහවෙලට දුම්රිය, SLTB එක සහ private buses ඔක්කෝම එකතු කරගත්ත මෙහෙයුමක් දියත් කරනවා. අපි දැන් සාකච්ඡා කරලා ඒ plan එක finalize කරලා තිබෙනවා. ඒක fine-tune කරලා එක්කෝ හෙට උදේ, එහෙම නැත්නම් අනිද්දා අපි අනිවාර්යයෙන්ම ඒක පටන් ගන්නවා. එතකොට මගීන්ට පුළුවන් වෙනවා, යම් කාලයක් යනකල් දුම්රිය ටිකට් එකෙන්ම SLTB බස් එකේ එන්න. මොකද, දුම්රිය ටිකට් එකේ ගණන අඩුයි, SLTB ටිකට් එකට වඩා.

ඒ වාගේම airline passengersලා, SriLankan Airlines පාවිච්චි කරන අය වරාය සහ සිවිල් ගුවන් සේවා ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරලා තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අනුව ශ්‍රී ලන්කන් ගුවන් සේවය තීන්දුවක් අරගෙන තිබෙනවා, there is a full waiver of charges on flight cancellations and date changes for passengers who need to reschedule their flights due to these weather-related disruptions. Basically ගත්තොත්, flights cancel වෙලා ticket change කරන්න වුණාම සාමාන්‍යයෙන් cancellation charges අය කරනවා. ඒ charges ඔක්කෝම අයින් කරලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ අනුව, urgent ලෙස සලකන දේවල් අතරින් අපට කරන්න පුළුවන් ගොඩක් දේවල් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, SLLDC එකට, ඒ වාගේම ත්‍රිවිධ හමුදාවට විශේෂයෙන්ම අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඔබතුමා දන්නවා, කොළඹ දිස්ත්‍රික්කයේ කොළොන්නාව, කඩුවෙල ජලයෙන් යට වුණා. ඊයේ විශේෂයෙන්ම SF එකෙන් සහ Sri Lanka Navy එකෙන් diversලා ඇවිල්ලා කරපු විශේෂ මැදිහත්වීමෙන් තමයි අපි අඹතලේ ගේට්ටු ඇරලා වතුර release කරන එක ඉක්මන් කර ගත්තේ. ඒ diversලාට අපි ස්තුතිවන්ත වෙනවා. ඒගොල්ලන් ඇත්තටම විශාල කාර්යභාරයක් කළා. අවුරුදු 100කින් විතර ලංකාවට ආපු ලොකුම ගංවතුරක් මේක. මේ ගංවතුරේදී කැලණි ගඟත් විශාල ලෙස පිටාර ගැලුවා. මීට කලින් ආපු ඕනෑම ගංවතුරකට වඩා කලින් අපි කොලොන්නාවේ ගංවතුර බස්සලා, හෙට දිනයේ ඉඳලා විශාල පිරිසිදු කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරන්න බලාපොරොත්තු වෙනවා. ගරු අගමැතිතුමිය ඒ සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ සැලසුම් සකස් කරයි කියලා මම හිතනවා.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වලපනේ, නිල්දණ්ඩාහින්න, කොත්මලේ, මතුරට වාගේ ඉතාම දුෂ්කර ප්‍රදේශවල, - *[බාධා කිරීමක්]*

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පොඩි පැහැදිලි කිරීමක් කරන්න අවස්ථාව දෙන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව කරන්න මට අවස්ථාව දෙන්න. මට ලොකු වෙලාවක් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමනි, ඊළඟට ඔබතුමාගේ කථාව තිබෙන්නේ. *[බාධා කිරීමක්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමනි, ඔබතුමා රටට උදව් කරන්න. මට උදව් කරන්න ඕනෑ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම දුෂ්කර ප්‍රදේශ සහමුලින්ම කනපිට හැරිලා තිබෙනවා. කොත්මලේ කියන්නේත් ඒ වාගේ ප්‍රදේශයක්. මම ඒ හැම තැනකටම මගේ මට්ටමින් මැදිහත් වුණා; කථා කළා. හැම සාමාන්‍ය මනුස්සයෙකුගේම callsවලට answer කරලා උත්තර හොයලා තිබෙනවා. Tri-forces officersලා තවලම්තැන්නට පයින් ගිහිල්ලා කොත්මලේ කැම්ප් එකක් ස්ථාපිත කරලා තිබෙනවා. ගාමිණී දිසානායක විද්‍යාලයේ සිටින මිනිසුන්ට කෑම අරගෙන 20 වතාවක් විතර අපි flights යවලා තිබෙනවා. ප්‍රාදේශීය ලේකම්වරු උදේ සිට රාත්‍රී වනතුරුම වෙහෙස නොබලා මහන්සි වෙනවා. ගරු අගමැතිතුමියනි, ඔබතුමියට වෙලාවක් ලැබුණාම මෙන්න මේ පොලිස් නිලධාරි මහත්මයාටත් ස්තුති කරන්න. මේ එකම එක පොලිස් නිලධාරි මහත්මයෙක් පාසලක ප්‍රශ්න පත්‍ර ආරක්ෂා කරමින් ඉන්නවා. ඒ වාගේ විශිෂ්ට මිනිස්සු ඉන්නවා. ඒ වාගේම, මේ හැම තැනටම අපි අවශ්‍ය දේවල් ඉක්මනින්ම යවනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැනට මම දන්නා තරමින් බඩගින්නේ කිසිවෙක් නැහැ. නමුත්, මේ පාරවල් හැදීමට යම් කාලයක් ගත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. අපේ රටේ ජනතාව වෙනුවෙන් ස්වේච්ඡා සංවිධාන සිදු කරන ක්‍රියාවලිය වෙනුවෙන් අපි ඔවුන්ට ස්තුතිවන්ත වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අනතුරේ ඉතාම වැදගත් දෙයක් තිබෙනවා. ඕනෑම අර්බුදයක් ඇතුළේ අවස්ථා තිබෙනවා. ඒ අවස්ථාව තමයි අපේ මච්බිම, අපේ ජාතිය නැවත එකතු කර තිබෙන එක. ජනතාව නැවත එකතු කර තිබෙනවා. මච්බිමේ සිටින සතුරන් ප්‍රමාණය අඩු කරලා, ඒක 50ක, 100ක ප්‍රමාණයකට කුඩා කර තිබෙනවා. ඒ නිසා අද ආණ්ඩුවක් වශයෙනුත්, ජනතාවක් වශයෙනුත් අපි එකතු වෙලා තිබෙනවා. අපට වැදුණු මේ shot එක නිසා ලංකාවේ අපි එකතු වෙලා තිබෙනවා. ඒ නිසා අපි පොදුවේ විපක්ෂයටත්, ආණ්ඩු පක්ෂයේ සියලුදෙනාටත් ස්තුති කරනවා. අපි බලාපොරොත්තු නොවන ආකාරයට, අපේ හෘදය සාක්ෂියට දරාගන්න බැරි ආකාරයට ඉතාම නපුරු ප්‍රවේශ තිබෙන බව අපි දකිනවා. ඉතාම නපුරු. මම මේ කාරණය කියන්නේ මෙන්න මේ නිසායි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මෙවැනි ස්වාභාවික අනතුරුවලදී අපි පක්ෂයක් ලෙස wholeheartedly වැඩ කරලා තිබෙනවා. මේ වාගේ ආපදාවකදී වැඩ කරන්න ගිහිල්ලා 2004දී අපේ සහෝදරියක් මැරුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2004දී ඇති වුණු සුනාමි ව්‍යසනයේදී මමත් එක්ක අපේ සහෝදරවරු හම්බන්තොටදී මිනී ඇදලා තිබෙනවා. මිනී දහස් ගණනක් අපි ඇදලා තිබෙනවා. ඒ නිසා අපි සත පහක් හම්බ කරන්නේ නැතිව, හොරකම් කරන්නේ නැතිව වැඩ කරන්න දන්නවා. අපි ඒ විධියට වැඩ කරලා තිබෙනවා. අපේ ජීවිතවලින් අපි ඒක ඔප්පු කර තිබෙනවා. අපි වැඩ කරලා ලෙඩ හදාගෙන තිබෙනවා. ඒ නිසා අදත් මාතරින්, ගාල්ලෙන්, එහෙන් මෙහෙන් ගිය මිනිස්සු 800, 1000, 2000 මේ වෙනුවෙන් කැප වෙනවා. ඒ විධියට ඔවුන් වැඩ කරන්නේ ඒ අයගේ නම් දා ගන්න නොවෙයි. ඒ අය නම් නැති මිනිස්සු. ඒගොල්ලන් නමක්වත් කියැවෙන එක බලාපොරොත්තු වෙන්නේ නැහැ. මම මේ කියන්නේ අපේ පක්ෂයේ දේවල් ගැන නොවෙයි. අද වන විට සත්තු බේරා ගන්න ස්වේච්ඡා සංවිධාන වැඩ කරනවා. රටක් වශයෙන් අපට දේශපාලනය කරන්නත් මේ මච්බිම තිබෙන්න එපායැ. ජනතාව ඉන්න එපායැ. නමුත් සමහරු හැසිරෙන විධිය දැක්කාම අපි ඒ ගැන ඉතාම කනගාටු වෙනවා. විශේෂයෙන්ම නුවර සිද්ධිය දැක්කාම මට හිතුණා මොකක්ද මේ කියලා. හෘදය සාක්ෂිය වුට්ටක්වත් ඉතිරි වෙලා නැද්ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කාරණයත් කියලා කථාව අවසන් කරන්නම්. අද සිද්ධ වෙලා තිබෙන්නේ මේකයි. අපි ආණ්ඩුව ගත්තේ මීට වඩා දරුණු ආර්ථික, දේශපාලන සහ සමාජ අර්බුදයක් මැද. අපි ආණ්ඩුව ගත්ත මොහොතේ ඉඳලාම ආණ්ඩුව අද වැටෙයි, හෙට වැටෙයි කියලා විපක්ෂයේ අය ප්‍රාර්ථනා කළා. ඒ නිසා කිව්වා, මාස 3න් ජනාධිපති කෙනෙක් එනවා, මාස 6න් ජනාධිපති කෙනෙක් එනවා, අද වැටෙනවා, හෙට වැටෙනවා කියලා. ජනාධිපතිතුමාත්, අගමැතිනියත්, අපේ පක්ෂයත්, ආණ්ඩුවත් -අපි- එකම එක වැරදි දේශපාලන හෝ ආර්ථික තීන්දුවක් ගත්තේ නැති නිසා තමයි අද අපේ රට ආර්ථික, දේශපාලන, සමාජයීය වශයෙන් ස්ථාවර වෙලා තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. වැරදි තීන්දුවක්වත් අපි internally ගත්තේ නැහැ. හැබැයි, බාහිර ප්‍රශ්න ආවා. ඉන්දියාවයි, පාකිස්තානයයි ගහගන්න කොට ප්‍රාර්ථනා කළා ලංකාව වැටෙයි කියලා. ඊශ්‍රායලයයි, ඉරානයයි ගහගන්නකොට හිතුවා තෙල් මිල වැඩිවෙලා අනුර කුමාර දිසානායකගේ ආණ්ඩුව වැටෙයි කියලා. ඊට පස්සේ ඩොනල්ඩ් ට්‍රම්ප් ජනාධිපතිතුමා tariff දැම්මාට පස්සේ හිතුවා දැන් අපේ රට වැටෙයි කියලා. විපක්ෂයේ සමහරු ජනාධිපතිවරුන්ගේ නම් පවා යෝජනා කළා. ඒ මෙතැන ඉන්න සියලුදෙනාම නොවෙයි. විපක්ෂයේ සමහරු මාස 3න් 3ට ඒ සඳහා සමහර නම් යෝජනා කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි අපි resilient සහ අපි ඔප්පු කර තිබෙනවා, අපි මේ අවුරුද්ද හරියට කරලා තිබෙනවා කියලා. ඒ නිසා අපි වට්ටන්න කිසිම ආකාරයකට බැරිවෙලා තිබෙනවා. දැන් ප්‍රාර්ථනා කරන්නේ මොකක්ද? මේ ඔක්කෝම external issues. අපි ආණ්ඩුවක් වශයෙන් කරපු කිසිම දේකින් මෙන්න මේකයි වැරද්ද කියලා කියන්න බැහැ. ඒ නිසා අපේ කෙනෙක් සපත්තු දාගෙන අතුගෑවා, අපේ කෙනෙකුගේ වචනයක් වැරදුණා කියන ඒවා තමයි අල්ලා ගන්නේ. එහෙම නැතිව ප්‍රධාන වශයෙන් අපි ගත්ත substantial උපාය මාර්ගවල එක වරදක්වත් කියන්න විපක්ෂය තවම සමත් වෙලා නැහැ. අපි වරදක් කරලාත් නැහැ. අපි එහෙම වැරදි කරන්නේත් නැහැ. එම නිසා බාහිර සාධකවලින් දැන් අපි වැටෙයි කියලා ප්‍රාර්ථනා කරනවා. ඒකට ප්‍රශ්නයක් නැහැ. නමුත් අපි කියන්නේ මේකයි. අපි අවුරුදු 60ක් ඉවසිලිවන්තව සෑම දෙයක්ම දරාගෙන ආපු දේශපාලන ව්‍යාපාරයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමන්ලා ඔක්කෝටම වඩා අපට ඒ ශක්තිය තිබෙනවා. අපි මිනී කඳු උඩින්, මර්දන තුළින්, අපහාස කිරීම් තුළින්, කොන් කිරීම් තුළින්, අත්අඩංගුවට ගැනීම් තුළින් හා අසාධාරණකම් තුළින් පන්නරය ලැබූ දේශපාලන පක්ෂයක්. අපි පොඩ්ඩක්වත් කලබල වෙන්නේ නැහැ. අපට මේ හැම බාධකයක් ඇතුළේම පීනාගෙන යන්න ඕනෑ තැන පෙනෙනවා. අපට හැම වෙලාවේම ක්ෂිතිජය පෙනෙනවා. එම නිසා ඔබතුමන්ලා මතක තබාගන්න, ඔබතුමන්ලාගේ කලින් පුරෝකථන ඔක්කෝම වැරදුණා වාගේ තව සතියක් යනකොට ඔය ඉතාම දුෂ්ට බලවේග අපි පරද්දනවා කියලා. ඇත්තටම වැඩ කරන ගරු මන්ත්‍රීතුමන්ලා විපක්ෂයේ ඉන්නවා. අපි සතුටු වනවා, උතුරත්, නැගෙනහිරත් නියෝජනය කරන සමහර මන්ත්‍රීතුමන්ලා ගැන. ඒ, මහ පොළොවෙන් ආපු ඇත්ත මන්ත්‍රීවරු. ඒ බොරු හොර කුමාරයෝ

[ගරු බිමල් රත්නායක මහතා]

නොවෙයි. නමුත්, මේ සමහර මන්ත්‍රීවරුන් ගැන අපි කනගාටු වනවා. මොකද, සමහර අයගෙන් මෙතරම් නපුරු ප්‍රවේශයක් අපි බලාපොරොත්තු වුණේ නැහැ. හැබැයි, ඒ ගැන අපට කිසි ප්‍රශ්නයක් නැහැ. නමුත්, අපි මනුෂ්‍යයෝ වශයෙන් අවසාන වශයෙන් ඉල්ලා සිටින දේ තමයි, ඔබතුමන්ලාගේ මුහුණ දිහා බලලා කථා කරන්න තිබෙන ඉඩකඩ ඉතුරු කර ගන්න කියන එක. මනුෂ්‍යත්වය ගැන තිබෙන අවසාන අදහස නැති කරන්න දෙන්න එපා. සමහරු හැසිරුණු ආකාරය ඉතාම දුෂ්ටයි. ඒකට අපට කමක් නැහැ. ගිහිල්ලා අර නිලධාරින්ට දමපු තර්ජනය දැක්කාද? මොකක්ද ඒ? හත්දෙනෙක්, අටදෙනෙක් ගිහිල්ලා -

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
Sir, I rise to a point of Order.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
There is no point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මගේ අවස්ථාව; මගේ කථාව. *[බාධා කිරීමක්]* එහෙම එකක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මොකක්ද? මේ, තොප්පිය දාගෙන. දැන් නයා තොප්පිය දාගෙන. *[බාධා කිරීමක්]* නයා තොප්පිය දාගෙන.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
ඔබතුමා චෝදනා කරන්න එපා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා, ඇමතිතුමාගේ කථාවට බාධා කරන්න එපා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කිසිම කෙනෙක් අපි ඉස්සරහ නිවැරදි වෙන්න ඕනෑ නැහැ. ජනතාව ඉස්සරහ නිවැරදි වෙන්න ඕනෑ. ඒක තමයි මෙතුමන්ලාට දෙන අභියෝගය. ඔබතුමන්ලා ජනතාව ඉස්සරහ නිවැරදි වෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කියන්න ඕනෑ විපක්ෂයේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් අපිත් එක්ක ඉතා හොඳින් වැඩ කරන බව. සමහර ප්‍රාදේශීය සභා සභාපතිවරුන් කථා කර කර අපෙන් උදවු ඉල්ලනවා. අපි ඒගොල්ලන්ට උදවු කරනවා. උතුරු පළාතේ ප්‍රාදේශීය සභාවල සභාපතිවරු හැටියට වැඩියෙන්ම ඉන්නේ ඉලංගෙයි තමිල් අරසු කච්චි පක්ෂයේ අය. අපි ඒ අයට උදවු කරනවා. බලන්න, ගරු අඩෙක්කලනාදන් මන්ත්‍රීතුමා කථා කරපු විදිය. අපි එතුමන්ලාට උදවු කරනවා. අපි විරුද්ධ අයටත් උදවු කරනවා. හැබැයි, අවම වශයෙන් හෝ ගරුත්වය රැක ගන්න පුළුවන් අයට.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ අභියෝගය ජයග්‍රහණය කරනවා. අපට ඒ සඳහා අත්දැකීමත්, දරා ගැනීමත්, සූදානමත් තිබෙනවා. ධෛර්යය පමණක් නොවෙයි, හදවත පමණක් නොවෙයි අපට මොළයත් තිබෙනවා. ඒ වාගේම සහෝදරත්වය සහ එකමුතුකම තිබෙනවා. අද දකුණු පළාතේ මාතර, ගාල්ල වාගේම බස්නාහිර පළාතේ කළුතර, කොළඹ මිනිස්සු දස දහස් ගණනක් ගිහිල්ලා තමන් නොදන්නා මිනිස්සු වෙනුවෙන් වැඩ කරනවා. මොන දේශපාලන ව්‍යාපාරයක්ද එහෙම කරලා තිබෙන්නේ? අද යාපනයේ මිනිස්සු ගිහිල්ලා මන්නාරමේ ශ්‍රමදාන කරනවා. අපි හෙට අනුරාධපුරයෙන් කණ්ඩායමක් යවනවා, මන්නාරමට. මම විපක්ෂයට කියන්නේ මේකයි. මේ අය ලංකාවේ මිනිස්සු. ඔබතුමන්ලා ඒ අය දිනාගන්න. ආණ්ඩුවක් හදන්න ඕනෑ නම් ඒ අය දිනාගන්න. හැබැයි, ඔය විදියට නම් ඒ අය දිනාගන්න බැහැ. මාතෘ භූමියට උදවු කරන්න; මිනිස්සුන්ට උදවු කරන්න. ඔබතුමන්ලා කිව්වා, ඊශ්‍රායල-ඉරාන ගැටුමේදී ආණ්ඩුව වැටෙනවා කියලා. ඉන්දියානු-පාකිස්තානු අර්බුදයේදී ආණ්ඩුව වැටෙනවා කිව්වා. ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ බදුවලින් ආණ්ඩුව වැටෙනවා කිව්වා. 2028දී ණය ගෙවද්දි ආණ්ඩුව වැටෙනවා කිව්වා. අපි කියනවා, ඒ එකකින්වත් ලංකාව වැටෙන්න දෙන්නේ නැහැ කියලා. ජනාධිපතිතුමා කිව්වා වාගේ අපි මේ රට නැවත ගොඩනඟනවා. නැවත ගොඩනඟලා දරුවන්ට මීට වඩා හොඳ රටක් අවුරුදු දෙකක් යනකොට අපි දායාද කරනවා. ඒ වෙනුවෙන් වැඩ කරන පක්ෂ, විපක්ෂ සැම කෙනාටම අපි ඉමහත් ලෙස ගරු කරනවා. අපි මිනිසුන්ට ගරු කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම ඉල්ලා සිටියේ මනුෂ්‍යයන්ගේ ගරුත්වයට අපහාස වන විදියට කටයුතු නොකර සිටින ලෙසයි. මම හිතනවා, මේ වාගේ අමාරු වෙලාවක අපි කාටත් තිබෙන ලොකුම වගකීම ඒකයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි මට වැඩිපුරත් අවස්ථාව ලබා දීම ගැන.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.31]

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මටත් පොඩ්ඩක් වැඩිපුර කාලයක් ලබා දෙයි කියලා මම හිතනවා. ඒ මොකද, මේ රජයට සාධනීය යෝජනා ඉදිරිපත් කරමින් අපට පුළුවන් හැම විදියකින්ම උදවු කිරීමේ බලාපොරොත්තුවෙන් තමයි මම අද ආවේ.

ගරු සභානායකතුමනි, ඔබතුමා ගරු සභාවෙන් පිටව යනවා මට පෙනෙනවා. එහෙම කරන්න එපා. මට නිවැරදි කිරීමක් කරන්න ඕනෑ. මෙය කියන්නේ ඔබතුමාගේ දැනගැනීම පිණිසයි. ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් පොඩ්ඩක් ඉඳලා යන්න. ඔබතුමා මේක අහලා යන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාගේ කථාවේදී කිව්වා, දුෂ්ට බලවේගයක් ඊයේ නුවරට ගිහින් තිබෙනවා කියලා. ඒ බලවේගය දුෂ්ට නම්, ඒකේ මමත් හිටියා. පෙරේදා එතුමාත් එක්ක තිබුණු සංවාදයේදී අපි ඉල්ලා සිටියා ප්‍රතිපත්තිමය තීන්දු ගැනීම සඳහා පාර්ලිමේන්තුව කැඳවන්න කියලා.

එතුමා කිව්වා, පාරට ගිහිල්ලා බිම වැඩ කරන්න කියලා. අපි කිසිම පක්ෂ භේදයකින් තොරව, කිසිම ජාති හා ආගම් භේදයකින් තොරව උතුරේ මන්ත්‍රීවරු, දකුණේ මන්ත්‍රීවරු, මුස්ලිම් මන්ත්‍රීවරු, දෙමළ මන්ත්‍රීවරු, සිංහල මන්ත්‍රීවරු, හිටපු මන්ත්‍රීවරු, නුවර මන්ත්‍රීවරු, නුවර නොවන මන්ත්‍රීවරු ඔක්කෝම එකතු වෙලා මහනුවරට යන්න තීරණය කළේ, මහනුවරට වැඩිම විනාශයක්

සිද්ධ වෙලා තිබෙනවා කියලා නිරීක්ෂණය කළ නිසායි. ඉතින් අපි ඒ ගමන අපේ යුතුකමක් හැටියට ගියා. අපට යන්නට තිබුණා වෙන වෙන තැන්වලට. නමුත්, යුතුකමක් හැටියට සහ නිවැරදි දත්ත ගවේෂණයක් සඳහා අපි දිසාපති කාර්යාලයට ගියා. සභානායකතුමා මේ ගරු සභාවෙන් ගිය හේතුව මම දන්නවා. මොකද එතුමා දන්නවා, එතුමා කිව්වේ ව්‍යාජයක්, බොරුවක්, අතිශයෝක්තියක්, නිර්මාණයක් කියන එක. ඇයි? දිසාපති කාර්යාලයේදී කළ සාකච්ඡාවලට සම්පූර්ණයෙන් ඇහුම්කන් දුන්නොත් එහිදී අපි කෙතරම් ආදරයෙන්, ගෞරවයෙන් කටයුතු කළා ද කියලා බලන්නට පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි එතැන යම් සිදුවීමක් වුණා. අපි යනකොට ලංකාවේ තිබෙන ලොකුම දිස්ත්‍රික්කයක මහ දිසාපතිවරයාගේ පුටුවේ වාඩි වෙලා හිටියේ මෙතුමන්ලාගේ මන්ත්‍රීවරයෙක්. ඇත්තටම අවංකව කියන්නට ඕනෑ මම ඔහු හඳුනා ගත්තේ නැති බව. අපේ අනික් මන්ත්‍රීවරුත් ඔහුව හඳුනා ගත්තේ නැහැ. ඒ සංවාදය වෙන වෙලාවේ තමයි හඳුනා ගත්තේ ඔහු මන්ත්‍රීවරයෙක් කියලා. ඇත්තටම අපි ගරු බිමල් රත්නායක මහත්තයාට ආදරයෙන් කියන්නට ඕනෑ, අවංකව කියන්නට ඕනෑ, ඔන්න ඕක තමයි කරන්න නරක කියන එක. එතුමන්ලාම කියනවා, "අපි රාජ්‍ය සේවයට ගෞරව කරනවා. රාජ්‍ය සේවයත් එක්ක ගෞරවාන්විතව ගනුදෙනු කරනවා" කියලා. මහ දිසාපතිතුමා පැත්තකින් වාඩි කරවලා හිටියා. ඒ, අහිංසක මනුස්සයෙක් නේ. මම හිතන විධියට, ඒ මනුස්සයා තෙල්දෙණියේ හිටපු ප්‍රාදේශීය ලේකම්තුමා. මෙතුමන්ලාගේ හිතවත්කම් මත ගෙනැල්ලා දිසාපති වශයෙන් පත් කරලා තිබෙනවා. එතුමා බොහොම අහිංසක විධියට පැත්තකින් වාඩි කරවලා මෙතුමන්ලාගේ මන්ත්‍රීවරයෙක් ඒ පුටුවේ වාඩි වුණා. ඉතින් ඒක කොතරම් නරක වැඩක්ද? ඒක කොච්චර නරකද? අනික් එක, අපි මේ දත්ත ගැන අහනකොට එතුමා අසරණව කටයුතු කළා. එතුමා පාවිච්චි කළ වචනම මම කියන්නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. "මට පුළුවන් විධියට, අපේ ධාරිතාවට, හැකියාවට අනුව අපි පුළුවන් විධියට කරනවා" කියලා එතුමා කිව්වා. අපි කිව්වා, ඔබතුමා පුළුවන් විධියට කළාට නුවරට වතුර නැහැ, ඒක නිසා අපට ඕනෑ උදව් කරන්නයි, කියන්නකෝ, මොකද්ද අපට කරන්න පුළුවන්, අපි ජනතාව එකතු කරන්නද, ජනතාව දැනුවත් කරන්නද කියලා. අපි කොතරම් සෙනෙහසින්ද මේ ගමන ගියේ? අපි කොතරම් ආදරයෙන් ද මේ ගමන ගියේ? අපි කිසිම ආරාවුලක් ඇති කර ගන්නවත්, රාජ්‍ය සේවකයන් කිසිසේත්ම පහත් කරන්නවත් නොවෙයි කටයුතු කළේ. ඇත්තටම අපි එතුමා එක්ක කරපු සම්පූර්ණ සංවාදය ගත්තොත්, අපි ගෙනාවේ සාධනීය යෝජනා. ඒවා බොහොම සෙනෙහසින් කරපු යෝජනා.

මේක දුෂ්ට බලවේගයක් හැටියට දකින්නට පුළුවන් පාපිෂ්ටයන්ට පමණයි, දුෂ්ටයන්ට පමණයි. මාධ්‍ය ආයතන දෙකක්, තුනක් අරගෙන පොඩි කෑලි කපලා මහා දුෂ්ට විධියට කටයුතු කරනවා. මේක කොතරම් නරකද? අපි මේ ජනතාව එකතු කරන්න හදනවා, ජනතාව අභිප්‍රේරණය කරන්න හදනවා, ආණ්ඩුවට ගෞරවයක් ලබා දෙන්නට හදනවා. අපි ආණ්ඩුව විවේචනය කරන්න ඕනෑ තැන්වලවත් විවේචනය කරලා නැහැ. මම මේ ගැන එකින් එක කරුණු දක්වන්න උත්සාහ කරන්නේ නැහැ. කෙතරම් ප්‍රශස්ත විපක්ෂයක් ද මේ ඉන්නේ? මේ විපක්ෂය හැම තිස්සේම කටයුතු කරලා තිබෙන්නේ මේ ව්‍යසනය හමුවේ කෙතරම් ප්‍රශස්ත විධියට ද? ඔබතුමන්ලා දන්නවා, ඔබතුමන්ලාගේ හෘදය සාක්ෂියට එකඟව ඔබතුමන්ලා විපක්ෂයේ හිටියා නම් අද කටයුතු කරන ආකාරය සහ මේ රටේ අර්බුද ඇති වූ අවස්ථාවලදී කෙතරම් පහළ තත්ත්වයකට ගියා ද කියලා. මම ඒ ගැන කථා කරන්නේ නැහැ. නමුත්, මම අද කථා කරන්නට ආපු වැදගත් කරුණු කියන්න තිබුණු අවස්ථාව නැති කළා. මොකද, කෙතරම් පටු විධියකට ද ඒ සිද්ධිය විග්‍රහ කළේ කියන එක මට පැහැදිලි කරන්න සිද්ධ වූ නිසා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහනුවර දිසාපතිතුමාට මම අනුකම්පා කරනවා. ඇත්තටම මෙතුමන්ලායි එතුමාගෙන් සමාව ගන්නට ඕනෑ, මේ රටේ ඉන්න වැදගත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පිරිසක් ආපු වෙලාවක එතුමාගේ පුටුවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වාඩි වෙලා එතුමාගේ අදහස් දක්වන්නට නිදහස ලබා නොදීම ගැන. මේ අය සමාව ගත යුතුයි, මේ රටේ අපි හැම දාම විශ්වාසය තියපු, අපි ආදරය කරන රාජ්‍ය නිලධාරීන්ගෙන්, රාජ්‍ය නිලධාරි තන්ත්‍රයෙන්. ඒකයි අපට කියන්නට තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කනගාටු වෙනවා, මට මේ කථාව සම්පූර්ණයෙන් කරන්නට ලැබෙන්නේ නැති නිසා. එහෙත් මම නැවතත් කියන්නට ඕනෑ, ඔබ කොහොම හිතුවත් අපි මේ රටට ආදරෙයි, මේ මව්බිමට ආදරෙයි කියලා. අපි මේ රටේ මිනිස්සුන්ට ආදරෙයි. අපි බොහොම සෙනෙහසින් මහ රෑ මේ සිදුවීම වුණු වෙලාවේ ඉඳලා අදටත් මහ රෑ වුණත් බිමේ ඉඳගෙන වැඩ කරනවා. අපි කවදාවත් මේ දේවල්වලට ගෞරවයක් ඉල්ලුවේ නැහැ. අපි මේකෙන් දේශපාලනයක් කළේ නැහැ. අපි දේශපාලනය වෙනුවෙන් මොකුත්ම කළේ නැහැ.

මම පෞද්ගලිකව මගේ අතේ තිබෙන සියලු මුදල් වියදම් කරගෙන තමයි බොහොම අවංකව මහ පොළොවේ වැඩ කරමින් යන්නේ. මම මේවා පාර්ලිමේන්තුවේ කියන්න හිටපු දේවල් නොවෙයි. නමුත්, අපි උනන්දුවෙන්, ආදරයෙන් වැඩ කරන අවස්ථාවක විපක්ෂයේ සාධනීය කරුණු පිළිබඳව සාකච්ඡා කරන්නට අපට අවස්ථාවක් ලබා නොදෙමින් පාර්ලිමේන්තු අවකාශය පවා සීමා කරමින් කටයුතු කරන්නේ ඇයි? ඒක තමයි පාපිෂ්ඨ, දුෂ්ට ක්‍රියාවලිය. එහෙම නොවෙයි කටයුතු කළ යුත්තේ. අද අපි ජාතියක් හැටියට අමාරුවේ වැටිලා තිබෙනවා. අපි ඔක්කොටම යම් යම් හැකියාවන් තිබෙනවා. ඒවා සද්භාවයෙන් ගන්න. අවංකව ගන්න. අපි මේ ආදරයෙන් කරන්න හදන දේ ඔය විධියට පහත් කරලා සලකන්න එපා. අපේ අදහස් මේ විධියට පාගලා දමන්න එපා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. සිදු වී ඇති ආපදාව මා හිතන හැටියට අපට දරාගත නොහැකි විශාල ඛේදවාචකයක්. මේ ඛේදවාචකයේදී ඔබ මොනයම් විධියකින් හෝ ඒක මේ තත්ත්වයට මේක ලඝු කරන්න හදනවා නම් ඒ කරන්නේ මහා විනාශයක්. අපේ ජනතාවට කරන්නේ ඉතාම පහත් ක්‍රියාවක්. ඒ නිසා අපි ඔක්කොම එකතු වෙලා මේ සඳහා ජාතික උපාය මාර්ගයක් - national strategy එකක් - හදන්න ඕනෑ. National strategy එකක් හදන්නට නම් ඒ සඳහා උපාය මාර්ගික හැකියාවන්, උපාය මාර්ගික චින්තනයක්, උපාය මාර්ගික දර්ශනයක් තිබෙන පුද්ගලයන් කොහේ හිටියත් - විපක්ෂයේ හිටියත්, පක්ෂයේ හිටියත්, එළියේ හිටියත්,කොට වුණත්, උස වුණත්, මුස්ලිම් වුණත්, සිංහල වුණත් - ඒ හැමෝම අපි එකතු කරගන්නට ඕනෑ. ඒ උපාය මාර්ගය සකස් කර ගැනීම අපට අවශ්‍යයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මම හිතනවා, මට ඊට අමතරව තව විනාඩි දෙකක් ලබා දෙයි කියලා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
එතුමාට තව විනාඩි දෙකක් ලබා දෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට අමතර විනාඩි දෙකක කාලයක් ලබා දෙනවා.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ආදරයෙන් ඉල්ලා සිටිනවා, මේක පටු තැනකට ගෙනියන්න එපා කියලා. මේ සිදුවීම සිදු වුණු ආකාරය, ඒ පිටුපස ඔබෙන් සිදු වුණු අඩුපාඩු ගැන නොවෙයි නේ අපි කථා කළේ. අපි කථා කළේ මේ මිනිස්සුන්ට එදිනෙදා කන්න දෙන්නේ කොහොමද, වතුර ටික යවන්නේ කොහොමද, ඇඳුම් ටික යවන්නේ කොහොමද කියායි. මම අද වනකල් කොහේ හෝ කියලා තිබෙනවාද, ඊයේ නිරීක්ෂණ ටික ගැන. අපේ විපක්ෂය ඒ ගැන විවේචනය කළාද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගංවතුරෙන් විශාල ඛේදවාචකයක් සිද්ධ වුණා. මිනිස්සු 40ක් මහ පොළොවට මිහිදන් වෙලා තිබෙනවා. ඒක මාධ්‍යයෙන්වත් පෙන්නුවේ නැහැ. මම දැනුවත්ව මහනුවර දිස්ත්‍රික්කයේ එවැනි ස්ථාන 8කට වඩා තිබෙනවා. ඒ තැන්වල මිනිස්සු වාඩි වෙලා ඉන්නවා, හැඬු කඳුළින් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මෙතැන ඉන්නේ මගේ අම්මා, මගේ අම්මා අරන් දෙන්න කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි මේක සංවේදී කාරණාවක්. මගේ අම්මා මෙතැන ඉන්නේ, මගේ දරුවායි, මගේ බිරිඳයි මෙතැන ඉන්නේ කියලා ඔවුන් අපට කියනවා. ඒ වාගේම ඔවුන් කියනවා ඒ ස්ථානයට බැකෝ එකක්වත් එවලා නැහැ කියලා. ගමේ ඉන්න මිනිස්සු සල්ලි එකතු කරලා ඩීසල් ගැහුවා කියනවා නම්, ඒ ප්‍රශ්නය අපි විසඳා ගන්නට ඕනෑ. මම මේවා කියන්න හිතාගෙන ආපු දේවල් නොවෙයි. නමුත් මේ අවස්ථාවේ මම කියන්නම් වැරදුණු තැන, අපි නිවැරදි කරගත යුතු තැන. ඇත්තටම මේවා සාධනීයව ගන්න. ඔබගේ අතීත දේශපාලනයෙන් අපි ගැන මනින්න එපා. ඔබේ අතීත දේශපාලනයේ තිබුණු පටු අර්ථයෙන් අපි ගැන මනින්න එපා. අපි හොඳ හදවතක් තිබෙන මිනිස්සු. මගේ පෞද්ගලික දේශපාලනය තුළ කවදාකවත් එවැනි පටු අරමුණකින් කටයුතු කරලා නැහැ, අනාගතයේ කටයුතු කරන්නේත් නැහැ. ඒ නිසා මම කියන්නේ අපිත් මේවාට එකතු කර ගන්න කියායි. අපි හදවතින්ම ඔබත් එක්ක එකතු වෙනවා.

මේ රටේ මිනිස්සුන්ට මේ මහා ඛේදවාචකය හේතුවෙන් ඇති වූ සියලු ආනුෂංගික ප්‍රතිඵලවලට මුහුණ දෙන්න වෙන්නේ ජාතියක් හැටියට. මේ සිදු වුණු ආර්ථික විනාශයට අපට මුහුණ දෙන්නට වෙන්නේත් ජාතියක් හැටියට. ජාතියක් හැටියට අපි සියලුදෙනා එයට මුහුණ දෙනකොට අප ඔක්කොම එහි පංගුකාරයන්. ඒ පංගුකාරයන් හැටියට අපට අවශ්‍යයි මේවා නිවැරදි වෙනවා දකින්නට. මේ නිවැරදි වීම කර ගැනීමට නම් ඔබගේ තිබෙන උද්ධච්ච මානසිකත්වයෙන් ඔබ මිදෙන්නට ඕනෑ. ඔබ අපට සහෝදරත්වයේ දෑත දිගු කරන්න. මොකද, අපි දෑත් දිගු කරගෙන ඉන්නේ සහෝදරත්වය වෙනුවෙන්. මම දන්නේ නැහැ අපේ බිමල් රත්නායක ඇමතිතුමා කියන දූෂ්ට බලවේග, ආණ්ඩුව පෙරළෙනකල් බලාගෙන ඉන්න අය කවුද කියලා. අපි උත්සාහ කරන්නේ මේ ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළ අප සියලුදෙනා සහභාගිත්ව දේශපාලනයක ප්‍රතිඵල හැටියට මිනිස්සුන්ට සේවයක් වන තැනට ගෙනියන්නට මිසක් පටු අරමුණු ඉෂ්ට කර ගැනීමට නොවෙයි. ඒ නිසා ජාතික උපාය මාර්ගික වැඩ පිළිවෙළක් දැන් වහාම සකස් කළ යුතුයි. ඒ උපාය මාර්ගය තුළින් කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන වශයෙන් අපි මේ අර්බුදයෙන් එළියට එන්නේ කොහොමද කියලා සාකච්ඡා වන පරිසරයක් නිර්මාණය කර ගත යුතුයි. එවැනි පරිසරයක් නිර්මාණය වෙයි කියලා අපි බලාපොරොත්තුවෙන් ඉන්නවා. ඔබ, ඔබගේ මනස මීට වැඩිය ධනාත්මක විධියට සකස් කර ගන්න. ඔය හිඟන සෘණාත්මක මනසින් එළියට එන්න. අපි අද ලෝකයට මුහුණ දෙන්නට ඕනෑ, එක එක්කෙනාගෙන් ණය ඉල්ලාගෙන නොවෙයි. මේ මව් බිමේ සිටින මිනිස්සු මේ මව් බිම වැටෙන්න දෙන්නේ නැහැ. මේ මව් බිමේ මිනිස්සු මේ මව් බිමට ආදරෙයි. ඉතින්, මේ මිනිස්සුත් එක්ක එකතුවෙලා අපි ඔක්කෝටම නැඟිටින්න පුළුවන්. අපි යාචකයන් හැටියට කවුරු ළඟටවත් හිඟමනේ යන්නට අවශ්‍ය නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
විපක්ෂය පැත්තෙන් එතුමාට තව මිනිත්තුවක කාලයක් ලබා දෙනවා.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා මට තව මිනිත්තුවක කාලයක් දුන්නා.

අපි කවුරු ළඟටවත් හිඟමනේ යන්නට ඕනෑ නැහැ. මේ රටේ සම්පත් අනූනයි. මේ රටේ මිනිසුන්ගේ ආත්ම ශක්තිය වෙනම මට්ටමක තිබෙන බව මේ අවස්ථාවේදී ඔබට බලා ගන්නට පුළුවන් වෙලා තිබෙනවා. මේ රටේ මිනිසුන්ගේ අන්‍යෝන්‍ය ආදරය කොහොමද කියලා දැන් බලා ගන්නට පුළුවන්. මේ රටේ මිනිස්සු කටයුතු කරන්නේ අන්න ඒ විභවයෙන්, ඒ ශක්තියෙන්. එම නිසා අපි ඔක්කෝම එකතුවෙලා එක දෙයයි කරන්නට ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි ඔක්කෝම එකතුවෙලා කරන්නට ඕනෑ වෙන මොකුත් නොවෙයි, මේ රටේ මිනිසුන්ගේ මානසිකත්වය ධනාත්මක තත්ත්වයට ගෙනෙන එකයි. මිනිසුන්ගේ මානසික මට්ටම ඒ තත්ත්වයට ගෙනෙන්න පුළුවන් ආකාරයේ දේශපාලනයක් ආණ්ඩු පක්ෂයෙන් ඉස්සෙල්ලාම එළියට එන්නට ඕනෑ. හැමදාම සෘණාත්මක දේවල් ගැන කථා කරලා මේ මිනිස්සු මානසිකව වට්ටලා, මිනිසුන්ට තිබෙන ප්‍රබෝධය සහ විශ්වාසය නැති කරලා, මව් බිම ගැන තිබෙන ආදරය නැති කරලා ඒක කරන්නට බැහැ. විශේෂයෙන්ම අපට බලා ගන්නට පුළුවන්, මෙවැනි ව්‍යසන අවස්ථාවකදී ධනාත්මක ජාතියක් ගොඩනැඟීමට අපොහොසත් වීම නිසා සිදු වන දේවල්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න. ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
එම නිසා මම අවසාන වශයෙන් නැවතත් කියනවා, අපි ඉන්නේ ඕනෑම වෙලාවක කොන්දේසි විරහිතව එකතුවෙලා වැඩ කරන්නයි කියන එක. ඔබ කියන්න, අපි මොකක්ද කරන්න ඕනෑ කියලා. අපි ඒ ඕනෑම දෙයක් කරන්නම්. හැබැයි, ඒ සඳහා අවශ්‍ය පාලම තනන්න. එපමණයි මට කියන්න තිබෙන්නේ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.44]

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, உண்மையிலேயே நாட்டில் ஏற்பட்டுள்ள மிக மோசமான சூழ்நிலை காரணமாக, மிகுந்த மனவேதனையுடனும் கனத்த இதயத்துடனும் இன்று இந்தப் பாராளுமன்றத்தில் நாம் உரையாற்றிக்கொண்டு இருக்கின்றோம். நாட்டில் எதிர்பாராமல் ஏற்பட்ட மிக மோசமான, கடுமையான வெள்ளப்பெருக்கு மற்றும் கோரமான மண்சரிவுகளின் காரணமாக இதுவரையில் நூற்றுக்கணக்கானவர்கள் மரணத்தைத் தழுவியுள்ள, மேலும் நூற்றுக்கணக்கானோர் காணாமற்போயுள்ள சோகமான நிகழ்வுகள் நடைபெற்ற நிலையில் நாம் இங்கு கூடியிருக்கின்றோம். கிட்டத்தட்ட 16 இலட்சம் மக்கள் தங்களுடைய வீடுகளையும் உடமைகளையும் வாழ்க்கையின் அனைத்து ஆதாரங்களையும் இழந்து மிகவும் மோசமான நிர்க்கதி நிலைக்குத் தள்ளப்பட்டுள்ளனர். நமது நாட்டினுடைய மிக முக்கியமான பொருளாதார மூலங்களான மீன்பிடி, விவசாயம், கைத்தொழில், வியாபாரம் போன்ற எல்லாத் துறைகளிலும் ஏற்பட்டுள்ள பாரிய பாதிப்புகளை நாம் தாங்கிக் கொண்டிருக்கின்றோம். இந்நிலைமை எமக்குத் தாங்கமுடியாத துயரத்தை அளிக்கின்றது. துயரில் ஆழ்ந்துள்ள எமது நாடு, இந்தச் சோதனையிலிருந்து விரைவாகவும் வலிமையாகவும் மீண்டுவர, எல்லாம் வல்ல இறைவனை நாங்கள் எல்லோரும் பிரார்த்திப்போமாக!

இன, மத, மொழி, அரசியல் கட்சி என்ற வேறுபாடுகளுக்கு அப்பால், நாம் அனைவரும் மனிதர்கள் என்ற உணர்வுடன், பாதிக்கப்பட்ட மக்களுடன் மக்களுக்காக என்றும் துயர்துடைக்கும் களத்தில் உறுதியாக நாங்கள் நிற்போம்! இந்தத் துயரச் சம்பவத்திலே பாதிக்கப்பட்ட குடும்பங்களுக்கும் மரணித்தவர்களுக்கும் ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸ் சார்பில் எங்களுடைய ஆழ்ந்த அனுதாபத்தையும் இரங்கலையும் தெரிவித்துக் கொள்கின்றோம். அதேபோன்று, இந்தச் சூழ்நிலையிலிருந்து நாட்டைக் கட்டியெழுப்புவதற்காக இரவு பகலாக அர்ப்பணிப்புடன் செயற்பட்டுக் கொண்டிருக்கின்ற மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்களுக்கும் அமைச்சர்களுக்கும் பொலிஸ் உட்பட இராணுவம், Air force, Navy ஆகிய முப்படையினருக்கும் அதேபோன்று உத்தியோகத்தர்களுக்கும் எங்களுடைய நன்றியையும் பாராட்டையும் தெரிவித்துக் கொள்கின்றோம். இந்த அனர்த்தத்திலிருந்து மக்களை மீட்டெடுப்பதற்காகத் தம்முடைய உயிரையே அர்ப்பணித்த பல சகோதரர்களுக்காகவும் helicopter விபத்தில் உயிர்நீர்த்த விமானப்படை வீரருக்காகவும் நாங்கள் பிரார்த்திக்கின்றோம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் கௌரவ பிமல் ரத்நாயக்க அவருடைய பேச்சையும் கௌரவ பிரதம அமைச்சர் அவர்களுடைய பேச்சையும் கேட்டுக் கொண்டிருந்தேன். உண்மையிலேயே கடந்த காலங்களைவிடவும் இன்று மிக வேகமாக மீட்புப் பணிகள் இடம்பெற்றுக் கொண்டிருக்கின்றன என்பதை நாங்கள் ஏற்றுக் கொள்கின்றோம். இன்று என்னுடன் பேசிய மட்டக்களப்பு அரசாங்க அதிபர் Mr. Arulraj அவர்கள் "DMCஇற்குத் தேவையான முழு நிதியும் வந்திருக்கின்றது; அளவுக்கு அதிகமான நிதியை அரசாங்கம் எங்களுக்கு அனுப்பியிருக்கின்றது; ஆனால் இன்னும் செலவு செய்யவில்லை" என்று என்னிடத்திலே சொன்னார். உண்மையிலேயே மீட்புப் பணிகள் வேகமாக நடைபெற்று வருகின்றன. இது முழு நாட்டிலும் ஏற்பட்ட ஓர் அனர்த்தம்! இவ்வாறான ஓர் அனர்த்தத்தை என்னுடைய 40 ஆண்டுகால அரசியல் காலகட்டத்தில் நான் சந்திக்கவில்லை. ஆகவே, இந்த அனர்த்தத்திலிருந்து நாட்டை மீட்டெடுப்பதற்குச் சில நாட்கள் தேவை. இந்த நிலைமையிலே நாங்கள் குறிப்பாகச் சிலவற்றை யோசிக்க வேண்டும்.

இந்த நாட்டில் ஒவ்வொரு மாவட்டத்திலும் உள்ள DDMCU - District Disaster Management Coordinating Unitsஇல் ஆகக்கூடியது 4-5 staffதான் இருக்கிறார்கள்; அது போதாது. 2005ஆம் ஆண்டின் 13ஆம் இலக்க அனர்த்த முகாமைத்துவச் சட்டத்தின் பிரகாரம் ஒவ்வொரு மாகாணத்திலும் provincial disaster management centre உருவாக்கப்பட வேண்டுமென்று தீர்மானிக்கப்பட்டிருக்கின்றது. ஆனால், இன்னும் அது உருவாக்கப்படவில்லை. குறித்த Actஇன்படி அதனை உருவாக்கியிருந்தால், இன்று இந்த disasterஐக் குறைத்திருக்க முடியும். கடந்த 20 வருடமாக ஆட்சிக்கு வந்த எந்த ஓர் அரசும் இந்த provincial disaster management centreஐ உருவாக்கவில்லை. ஆகவே, கௌரவ அமைச்சர் அவர்களே, இந்த அரசாங்கம் முடியுமான விரைவிலே according to the Disaster Management Act, No.13 of 2005இன் கீழ் அந்த provincial disaster management centreஐ உருவாக்க வேண்டும். சம்மாந்துறை, மாவடிப்பள்ளி மத்ரஸா மாணவர்களுடைய துயரச் சம்பவம் இடம்பெற்றபோது நீதிபதிகூட அதைப்பற்றி கூறியிருந்தார். ஒரு DSஇல்கூட coordinate பண்ண ஒரு Disaster Relief Services Officer இல்லை. ஆகவே, ஒவ்வொரு பிரதேச செயலகத்திலும் இதற்கான உத்தியோகத்தர்களை நியமிக்க வேண்டும். இன்றிருக்கின்ற உள்ளூராட்சிச் சபைகளெல்லாம் மாகாண சபைக்கு உட்பட்டவை. இந்த District Disaster Management Coordinating Unitsஆனது Central Governmentஇன்கீழ் இருக்கின்றது. ஆகவே, இந்த provincial setupஇலே provincial disaster management centreஐ உருவாக்க முடியுமென்றால், முழு மாகாணத்தின் கீழ் இருக்கின்ற government structureஐயும் - mechanismஐயும் disasterக்குப் பயன்படுத்த முடியும். ஆகவே, இதற்கான வழிகளை நீங்கள் மேற்கொள்ள வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

இந்த அனர்த்தத்தின்போது அங்குள்ள District Secretaryஆல் Divisional Secretaryஐத் தொடர்புகொள்ள முடியவில்லை. ஏனென்றால், கிழக்கு மாகாணத்திலே communication system, networking system, தொலைபேசி, mobile phone போன்றவை செயலிழந்துபோனது. ஏன், என்னால்கூட 2-3 நாட்கள் mobile phoneஇல் பேச முடியவில்லை, நானும்கூட மிகவும் கஷ்டப்பட்டேன். அதுபோல, After tsunami இந்த நாட்டிலே அமைக்கப் பட்டிருக்கின்ற 77 early warning towersஇல் ஒரு towerகூட இந்த இடரின்போது வேலை செய்யவில்லை; அனைத்தும் செயலிழந்திருந்தன. ஆகவே, அரசாங்கம் இந்த விடயத்தில் உடனடியாகக் கவனம் செலுத்த வேண்டும். எதிர்காலத்தில் இவ்வாறான பிரச்சினைகள் ஏற்படுகின்ற போது உடனடியாகச் செயற்படக்கூடிய வகையிலே District Secretaryக்கும் Divisional Secretaryக்கும் இடையில் radio communication system ஒன்றை உருவாக்க வேண்டும்.

[ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා]

மட்டக்களப்பு மாவட்டத்தைப் பொறுத்தவரையிலே 35,000 பேர் இந்த அனர்த்தம் காரணமாகப் பாதிக்கப் பட்டிருக் கிறார்கள். அவர்களை இயல்பு வாழ்க்கைக்குக் கொண்டு வருவதற்கு அரசாங்கம் எடுக்கும் முயற்சிகளுக்கு என்னுடைய மாவட்ட மக்களின் சார்பிலே இந்த அரசாங்கத்துக்கு நான் நன்றி தெரிவிக்கின்றேன். அங்கு அவசர அவசரமாக boats அனுப்பப்பட்டது. எதிர்காலத்திலே அரசாங்கம் இன்னும் சில விடயங்களைச் செய்யுமாகவிருந்தால் - ஒவ்வொரு மாவட்டத்துக்கும் தேவையான boats, engine, life jackets போன்றவற்றை வழங்க முடியுமாகவிருந்தால் - இந்த இழப்புக்களை மேலும் எங்களால் குறைக்க முடியும். குறிப்பாக மட்டக்களப்பு மாவட்டத்திலே முந்தெனி ஆற்றுக் கருத்திட்ட வேலை ஆரம்பிக்கப்பட்டிருக்க வேண்டும்; ஆனால் அந்த வேலை தொடர்ச்சியாக இழுபறிப்பட்டு வந்தது. இப்போது இந்த அரசாங்கம் அதற்கான ஆரம்ப நிதியை ஒதுக்கியிருக் கின்றது. அந்த முந்தெனி ஆறு கருத்திட்டத்தை அவசரமாகச் செய்தால், மட்டக்களப்பு மாவட்டத்தில் ஏற்படும் வெள்ளப் பெருக்கைத் தவிர்க்க முடியும்.

அதுபோன்று, மட்டக்களப்பு மாவட்டத்திலே flood safety centres என்ற வகையில் three-storey buildingஐ அமைக்க நான்கு இடங்கள் அடையாளம் காணப்பட்டிருக்கின்றது. அந்த மாவட்டத்திலுள்ள நான்கு பாடசாலைகளுக்கு three-storey buildingஐ அமைத்துக்கொடுக்க முடியுமாகவிருந்தால், அங்கிருக்கின்ற மக்களை உடனடியாக அப்பாடசாலைகளில் தங்கவைக்க முடியும்.

கௌரவ பிரதி அமைச்சர் முனீர் முலாபர் அவர்கள் இங்கே இருக்கின்றார். நேற்று முன்தினம் தற்செயலாக நான் அவருடைய தேர்தல் தொகுதியான மல்வானைக்குப் போயிருந்தேன்; அவர் அந்த மண்ணிலே அதிகமான பணிகளைச் செய்துகொண்டிருப்பதைப் பார்த்தேன். உண்மையிலே இந்த அனர்த்தம் அங்கு பாரிய இழப்பை ஏற்படுத்தியிருக்கிறது. ஒவ்வொரு வருடமும் மழை வெள்ளம் வருகின்றபோதும் மல்வானை நகரம் மூழ்குகிறது. அந்த நகரத்திலே மாத்திரம் கிட்டத்தட்ட 1,500 கோடி ரூபாய் பெறுமதியான சொத்துக்கள் இழக்கப்பட்டிருக்கின்றது. முன்னைய காலங்களில் வெள்ளத்தைத் தடுப்பதற்காக பேலியகொடையிலிருந்து களனி ரஜமகா விகாரை வரையிலான பகுதிக்கு அணைக்கட்டு - bund - கட்டப்பட்டு இருக்கின்றது. அதனால்தான் களனி வரையிலான பிரதேசம் பாதுகாக்கப்படுகின்றது. இந்த bundஐ களனி ரஜமகா விகாரை பகுதியிலிருந்து இரண்டு பக்கமும் நீட்டிக்க முடியுமாக விருந்தால் Biyagama zone, கடவத்தை, சபுகஸ்கந்த, மல்வானை, பூகொடை வரையிலான பிரதேசங்களையும், மறுபக்கத்தில் வெல்லம்பிட்டிய, கொலன்னாவ, அம்பத்தல, அங்கொடை, கடுவலை ஆகிய பிரதேசங்களையும் பாதுகாக்க முடியும். ரணில் விக்கிரமசிங்க அவர்கள் ஜனாதிபதியாக இருந்தபோது இந்த bundஐ நீட்டிப்பதற்கான ஆரம்ப முயற்சிகள் எடுக்கப்பட்டு, உலக வங்கியோடு ஒரு பேச்சுவார்த்தையும் நடத்தப்பட்டதாக நான் அறிந்தேன். ஆகவே, கௌரவ பிரதி அமைச்சர் அவர்களே, நீங்கள் அரசாங்கத்துடன் பேசி இந்த வேலைத்திட்டத்தைச் செய்யமுடியுமாக இருந்தால், அப்பிரதேசங்களைப் பாரிய அழிவிலிருந்து காப்பாற்ற முடியும்.

அதுபோல், இந்தச் சந்தர்ப்பத்தைப் பயன்படுத்தி நாங்கள் ஐக்கிய அமெரிக்காவின் ஜனாதிபதி டொனால்ட் ட்ரம்ப் அவர்களின் அரசாங்கத்துடன் பேச்சுவார்த்தை நடத்தி, எமது நாட்டுக்கு விதிக்கப்பட்டிருக்கின்ற வரியை உடனடியாகக் குறைக்க முடியும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
அரசாங்கமும் எதிர்க்கட்சியும் இணைந்து 'டித்வா' புயல் பாதிப்புத் தொடர்பான தகவல்களை வழங்கி அந்த வரியைக் குறைக்க நடவடிக்கை எடுக்க வேண்டும். ஏனென்றால், நாங்கள் அதனால் மிக மோசமாகப் பாதிக்கப்பட்டு இருக்கின்றோம். அதேபோன்று, IMF உடனும் பேச்சு வார்த்தை நடாத்தி, எமது கடன் செலுத்தும் காலத்தை அதிகரிக்க அல்லது அவசரமாகக் கடனைப் பெறுவதற்கான சூழ்நிலையை உருவாக்குவதற்கான முயற்சிகளை எடுக்க வேண்டும். நான் அதற்கான முழு ஒத்துழைப்பையும் தருவதற்கு ஆயத்தமாக இருக்கிறேன் என்று கூறி, விடைபெறுகிறேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.55]

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

මගේ කථාව ආරම්භ කරමින්, පළමුවෙන්ම මේ වෙනකොට ලංකාව පුරාම ආපදාවට ලක්වෙලා සිටින ජනතාව ගලවා ගැනීම සඳහා සහභාගි වෙලා සිටින රාජ්‍ය සේවකයන්ට අපගේ උපහාරය පුද කරන්නට ඕනෑ. ඒ වාගේම ඒ ගලවා ගැනීමේ මෙහෙයුම තුළදී තමන්ගේ ජීවිතය පූජා කරමින් ජනතාව වෙනුවෙන් කටයුතු කළ වින්ග් කමාන්ඩර් නිර්මාල් සියඹලාපිටිය මැතිතුමා, ඒ වාගේම අතුරුදහන් වූ නාවික හමුදාවේ නිලධාරිතුමන්ලා පස්දෙනා අපි බොහොම ගෞරවයෙන් සහ බොහොම ආදරයෙන් මතක් කරනවා. එවැනි නිලධාරින් නිසා තමයි මේ වෙනකොට ලංකාවේ බහුතරයක් ජනතාව ආරක්ෂිතව ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ කථා කරන්නේ දිස්ත්‍රික්ක 25ටම බලපෑ ආපදාවක් ගැනයි. ආපදාවට ලක්වන ලද, නැත්නම් ව්‍යසනයට පාත්‍ර වී ඇති දිස්ත්‍රික්ක හැටියට මේ වෙනකොට දිස්ත්‍රික්ක 22ක් ගැසට් කරලා තිබෙනවා. ආපදාවට ලක් වූ ජනතාව දිස්ත්‍රික්ක 21ක පිහිටුවා ඇති ආපදා කඳවුරුවල රැඳී සිටිනවා. මේක රට පුරාම පැතිරී ගිය ව්‍යසනයක්. අපි අපේ ජීවිත කාලය තුළ නොදුටු ආකාරයේ රට පුරා පැතිරී ගිය ව්‍යසනයක්. මේ වෙනකොට වාර්තා වන තොරතුරුවලට අනුව මරණ 465ක් වාර්තාවෙලා තිබෙනවා. 366දෙනෙක් අතුරුදහන් වෙලා තිබෙනවා. මේ ව්‍යසනයේ -මේ ඛේදවාචකයේ- බරපතළකමට සුදුසු හැටියට තමයි අපි හැමෝම ප්‍රතිචාර දක්වන්නට අවශ්‍ය, අපි හැමෝම මෙතැනදී කථා කරන්නට අවශ්‍ය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය දවස් කිහිපය තුළදී විපක්ෂයේ සමහර කණ්ඩායම් කථා කරපු දේවල් ගැන ඇත්තටම මම කනගාටු වෙනවා. ඒ වාගේම, විපක්ෂයේ සමහර දේශපාලන

පක්ෂ, සමහර මන්ත්‍රීවරු ඉතාම සහයෝගයෙන් කටයුතු කළාය කියන කාරණයත් මම මතක් කරන්නට ඕනෑ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු විතරක් නොවෙයි, නාගරික මන්ත්‍රීවරු, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු, ප්‍රාදේශීය සභා සභාපතිවරු ඉතාම යහපත් ලෙස, රජයත් සමඟ ඉතාම සහයෝගයෙන් කටයුතු කරමින්, ජනතාව පත්වෙලා තිබෙන ආපදාවෙන් මුදා ගැනීමට කටයුතු කරමින් ඉන්නවා සහ කටයුතු කළා. අපි ඔවුන්ට අපේ ප්‍රශංසාව පුද කරන්නට අවශ්‍යයි; ඔවුන් ඇගයීමට ලක් කරන්නට අවශ්‍යයි. එතුමන්ලා එහෙම කටයුතු කරන අතරතුර, විපක්ෂය අපකීර්තියට පත් කරන කණ්ඩායමකුත් ඉන්නවා. අප ඒකත් මතක් කරන්න අවශ්‍යයි. දැන් ටිකකට ඉස්සෙල්ලාත් දිලිත් ජයවීර මන්ත්‍රීතුමා කථා කළා. මා හිතන්නේ, එතුමා ගැන අද විශේෂයෙන් කථා කරන්නට අවශ්‍යයි. කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා අපට බොහොම මිත්‍ර මන්ත්‍රීතුමෙක්. එතුමා කිව්වා, නොවැම්බර් 12වැනි දා warning එකක් නිකුත් කර තිබුණා කියලා. දිලිත් ජයවීර මන්ත්‍රීතුමා ඇතුළු මන්ත්‍රීවරු කිහිප දෙනෙක්ම අද ඒ අදහස පළ කළා.

ඒ වාගේම, නොවැම්බර් 12වැනි දා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙන් warning එකක් ඇවිත් තිබුණා, අනතුරු ඇඟවීමක් කරලා තිබුණා, නිවේදනයක් කරලා තිබුණා. ඒකට අනුව රජය ක්‍රියාත්මක වුණේ නැහැ කියන අදහස ජනගත කරන්නට, සමාජගත කරන්නට විපක්ෂය දින කිහිපයකට පෙර පාර්ලිමේන්තුවේදී විශාල ගාලගෝට්ටියක් ඇති කළා ඔබතුමන්ලාට මතකද? නම් කරලාම මම කියනවා දිලිත් ජයවීර මන්ත්‍රීතුමාගේ "දෙරණ" නාළිකාව විසින් තමයි ඒ කාරණය කළේ කියලා.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මට අවස්ථාව දෙනවාද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
Take your time, please; take your time and explain.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මෙවැනි අවස්ථාවකදීවත් ඔබතුමා,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
( மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මෙහෙමයි. වැරැදි අර්ථ නිරූපණයක් කළා නම් ඒ ගැන තත්පර 15කින් කියන්න. එහෙම නැත්නම් නම කියූ පමණින් ඔබතුමාට අවස්ථාවක් දෙන්න බැහැ.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
නම කියූ පමණින් නොවෙයි. මේ කරන්නේ මහා බරපතළ චෝදනාවක් නේ. මේ කරන්නේ විශාල චෝදනාවක් නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා තත්පර 15ක් අරගෙන කියන්නකෝ. ඔබතුමාට මයික් එක දීලා තිබෙන්නේ.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මන්ත්‍රීතුමිය දැන් ගත්තු ප්‍රවේශයම දුෂ්ටයි නේ. ඔන්න, ඕක තමයි දුෂ්ට දේශපාලනය කියන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එතුමිය කියපු දේ වැරැදි නම් වැරැදියි කියන්න, හරි නම් හරි කියන්න. එච්චරයි.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මම "දෙරණේ" news කියන කෙනෙක්ද? *[බාධා කිරීමක්]* මම "දෙරණේ" news කියන කෙනාද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා ඒක ප්‍රතික්ෂේප කරනවා නේ.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක පොඩ්ඩක් අහන්න.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මම හිතන විධියට, එතුමා වැදගත් දෙයක් කියන්නේ නැහැ.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
පොඩ්ඩක් අහන්න.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,- *[බාධා කිරීමක්]* මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, *[බාධා කිරීමක්]* දිලිත් ජයවීර මන්ත්‍රීතුමාට -මේ කෑ ගහන මන්ත්‍රීතුමාට- කිසිම විනයක් නැහැ. ආපදාවකට පසුව පාර්ලිමේන්තුවේ හැසිරෙන්නේ කොහොමද කියලා එතුමාට තේරුමක් නැහැ. *[බාධා කිරීමක්]* මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දිලිත් ජයවීර මන්ත්‍රීතුමාගේ "දෙරණ" නාළිකාවේ තමයි මේ මතය,

[ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මහතා]

මේ අදහස ප්‍රකාශ කළේ. *[බාධා කිරීමක්]* එතුමා වගකීම භාර ගන්න අවශ්‍යයි. මොකද, මේක ජාතික ව්‍යසනයක්. අදටත් පුද්ගලයන් 366ක් missing. 465ක් මිය ගිහිල්ලා තිබෙනවා. *[බාධා කිරීමක්]* ජාතික ව්‍යසනයකදී වගකීම භාර ගන්න. *[බාධා කිරීමක්]* මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මගේ කාලය ලබා දෙන්න.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මට ඔය විධියට අපහාස කරන්න ඔබතුමියට බැහැ.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නොවැම්බර් 12වැනි දා - *[බාධා කිරීමක්]* නොවැම්බර් 12වැනි දා warning එකක් දුන්නා කියලා මේ මන්ත්‍රීතුමාට අදාළ ආයතනය විසින් සහ මේ මන්ත්‍රීතුමා විසින් පළ කරන ලද අදහස්වලට රැවටිලා තමයි මේ සමහර මන්ත්‍රීවරු මෙතැන අදහස් ප්‍රකාශ කරන්නේ කියලා මම හිතනවා. එම නිසා මම අභියෝග කරනවා, නොවැම්බර් 12වැනි දා මොකක්ද ආපු warning එක, ඒක කවුද කිව්වේ, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙන් ආපු warning එක මොකක්ද කියලා මේ සභාවට කියන ලෙස. මම **සභාගත*** කරනවා, නොවැම්බර් 12වැනි දා "දෙරණ" නාළිකාවේ සිදු වුණු එම සාකච්ඡාව; මේ කියන මාධ්‍ය සාකච්ඡාව; මාධ්‍යවේදියෙකු අහන ප්‍රශ්නයකට දෙන උත්තරය.

මේ කියපු කාරණය ගැන, මේකේ කොහේද ඒ warning එක තිබෙන්නේ කියලා විශේෂයෙන් දිලිත් ජයවීර මන්ත්‍රීතුමා අපට ප්‍රකාශ කරන්න, පැහැදිලි කරලා කියන්න. එච්චරයි, මම ඒ ගැන කථා කරන්නේ. *[බාධා කිරීමක්]* මේක ඉතාම කැත දේශපාලනයක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. *[බාධා කිරීමක්]* ඉතාම කැත දේශපාලනයක් විපක්ෂය විසින් කරනු ලබනවා, ජනතාව ව්‍යසනයට පත් වෙලා ඉන්න කොට. මිනී මතින් දේශපාලනය කරනවා.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මිනී මතින් දේශපාලනය කරනවා. *[බාධා කිරීමක්]* මිනී මතින් දේශපාලනය කරනවා. මේක ඉතාම නරකයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට අවස්ථාව දෙන්නම්, මෙතුමියගේ කථාවෙන් පසුව තත්පරයක්.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
ඉතාම නරකයි.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
බැහැ, බැහැ. එතුමිය කිව්වා මට පැහැදිලි කරන්න කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පැහැදිලි කරන්න මම ඔබතුමාට අවස්ථාව දෙන්නම්, මේ කථාවෙන් පසුව. කාලය සම්බන්ධව ප්‍රශ්නයක් තිබෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මේ මන්ත්‍රීතුමාගේ කථාවේදී කිව්වා, සභානායකතුමා ව්‍යාජයක්, බොරුවක්, අතිශයෝක්තියක් කිව්වා කියලා. ගරු මන්ත්‍රීතුමනි, අපි අභියෝග කරනවා, ඔබතුමා ඇත්ත නම් කියන්නේ -විපක්ෂය ඇත්ත නම් කියන්නේ- නොවැම්බර් 12වැනි දා මේ කියපු warning එක මොකක්ද කියලා කියන ලෙස. *[බාධා කිරීමක්]* ඒ ආකාරයට නොවැම්බර් 12වැනි දා කිසිදු warning එකක් ඇවිල්ලා නැහැ. *[බාධා කිරීමක්]* මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටටම බලපෑ මේ ව්‍යසනය නිසා මැරිච්ච මිනිස්සු ඉන්නවා. ඔවුන්ගේ පවුල්වල සාමාජිකයෝ ඉන්නවා. ඔවුන් අදටත් දුකෙන් ඉන්නේ. සංවේගයෙන් ඉන්නේ. තමන්ගේ මිය ගිය ඥාතීන්ට වෙච්ච දේ ගැන දුකෙන් ඉන්නේ. ඒ මිනිසුන්ටයි පතුරවන්නේ මේ විෂ බීජ. මේවා විසකුරු විෂ බීජ. ලංකාවේ ජනතාවටයි පතුරවන්නේ මේ විෂ බීජ. කවුද මේවාට වග කියන්නේ? මෙය, ජාතික ව්‍යසන අවස්ථාවකදී මාධ්‍ය හැසිරිය යුතු ආකාරයද? මෙය, ජාතික ව්‍යසන අවස්ථාවකදී විපක්ෂය හැසිරිය යුතු ආකාරයද? රජයට සහයෝගය ලබා දෙන්නේ නැතිව, රජයත් එක්ක කටයුතු කරන්නේ නැතිව මේ දේවල් කරන එක හරිද? ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා හැම පක්ෂයකම මන්ත්‍රීතුමන්ලා එක්ක කථා කළා.

එතුමා සියලු පක්ෂවල මන්ත්‍රීතුමන්ලා කැඳවලා කථා කළා; සහයෝගය ලබා ගත්තා; එතුමන්ලාගේ අදහස්වලට ඇහුම්කන් දුන්නා. එවැනි න්‍යායශීලි, එවැනි ප්‍රජාතන්ත්‍රවාදී පිළිවෙතක් රජය විසින් පෙන්වා තිබෙනවා. ආධාර ලබා දීමේදී පක්ෂ භේද බලන්නේ නැතිව හැමෝටම ආධාර ලබා දීලා තිබෙනවා. ප්‍රාදේශීය ලේකම්වරුන්ට, දිස්ත්‍රික් ලේකම්වරුන්ට කිසිදු දේශපාලන බලපෑමකින් තොරව ජනතාව මූලික කරගෙන වැඩ කිරීමට ඉඩ කඩ ලබා දීලා තිබෙනවා. අපි අපේ උපරිම සහයෝගය ලබා දීලා තිබෙනවා. ඒ නිලධාරිතුමන්ලා ඒක දන්නවා. එහෙම තිබියදී තමයි මේ විපක්ෂයේ මන්ත්‍රීවරු ගිහින් නුවර දිසාපතිතුමාට ඒ හිරිහැරය කළේ. මේ වෙලාවේ රාජ්‍ය නිලධාරීන් ආතතියකින්, පීඩාවකින් ඉන්නේ. ඔවුන්ගේ දරුවන් ඇතුළු පවුල්වල උදවියත් ඉන්නවා, මේ ව්‍යසනයට ලක් වෙලා. ඒක ගැන හිතන්නේවත් නැතිව තමයි විපක්ෂය මේ ආකාරයට කටයුතු කරන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඇත්තටම මම හිතනවා විපක්ෂයේ වගකීමක් තිබෙන මන්ත්‍රීවරු මේ උත්සාහය පරාජය කරයි කියලා. අපි හිතනවා ඔබතුමන්ලා ඒ වගකීම ගනියි කියලා. අපි හිතනවා මහත්මා දේශපාලනයක් තවමත් ලංකාවේ ඉතිරි වෙලා තිබෙනවා කියලා.

මට කාලය ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

---
** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා තත්පර 30ක් අරගෙන ඔබතුමාගේ නම කියලා සඳහන් කළ කාරණය ගැන විතරක් කථා කරන්න.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තත්පර 30කින් උත්තර දෙන්න බැහැ. එතුමිය මගෙන් පැහැදිලි කිරීමක් ඉල්ලා සිටියා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඊට වඩා දෙන්න බැහැ. ඔබතුමා තත්පර 30ක කාලයක් ගන්නවා නම් අරගෙන පැහැදිලි කිරීම කරන්න.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
එතුමිය ඉල්ලා සිටියා, පැහැදිලි කිරීමක්. මට ඒ පැහැදිලි කිරීම කරන්න දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
තත්පර 30න් පැහැදිලි කිරීම කරන්න.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ පැහැදිලි කිරීම කරන්න දෙන්න, ප්‍රජාතන්ත්‍රවාදයේ නාමයෙන්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඉතින්, ඔබතුමා මේ වෙලාවේ ඒ පැහැදිලි කිරීම කරන්න.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
පැහැදිලි කිරීම කරන්න ඉඩ දෙන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "දෙරණ" නාළිකාව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිලධාරින් එක්ක කරපු සංවාදයක් අළලායි ඒ මන්ත්‍රීතුමිය ඒ ප්‍රකාශය කරන්නේ. එතුමිය ඒ ප්‍රකාශය කරනවා නම් ඒකට මා පටලවා ගන්න අවශ්‍ය නැහැ. එතුමියට පුළුවන් ඒ ප්‍රකාශය කරපු අයට විරුද්ධව කටයුතු කරන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි, කාරණය පැහැදිලියි.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
පොඩ්ඩක් ඉන්න. පොඩ්ඩක් ඉන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බලන්න මේ ගත්තු උත්සාහය දිහා. මේ ගත්තු උත්සාහය මොකක්ද? මේ ගත්තු උත්සාහය තමයි, අන්න අර කියන දුෂ්ට දේශපාලනය.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හරි, හරි, ඔබතුමා දැන් අවසන් කරන්න.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
දෙවැනි කරුණ මේකයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහනුවර දිස්ත්‍රික් මන්ත්‍රීවරයා වාඩි වෙලා හිටියේ මහ දිසාපතිතුමාගේ පුටුවේද, නැද්ද කියලා මට පැහැදිලි කරන්න කියන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියට ආණ්ඩු පක්ෂයෙන් විනාඩි දෙකක් දෙන්නම් ලු.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප හැමෝටම ලේසියි වගකීම් විරහිත ලෙස හැසිරිලා, වගකීම් විරහිත ලෙස කටයුතු කරලා මෙතැනට ඇවිල්ලා,- *[බාධා කිරීම්]* මගේ වෙලාව මට දීලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පැහැදිලි කිරීමක් විතරයි. ඔබතුමිය ඉක්මනට අවසන් කරන්න, ඒ කාරණයට අදාළව කරන මොකක් හෝ පැහැදිලි කිරීමකට විතරයි අවස්ථාව තිබෙන්නේ.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා වගකීම් විරහිත ලෙස කටයුතු කරලා තිබෙනවා. මාධ්‍ය සහ මාධ්‍ය හිමිකරුවන්ටත් ජනාධිපතිතුමා විශේෂයෙන් කථා කරලා තිබෙනවා, මේ ව්‍යසන අවස්ථාව ගැන

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි, පැහැදිලියි, ඔබතුමිය කියන කාරණය.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ වෙලාව මට ලබා දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමියට අලුතින් වෙලාවක් දෙන්න බැහැ, මූලසුනට. අවස්ථාව දෙන්න පුළුවන් පැහැදිලි කිරීමට පමණයි. ඔබතුමිය දැන් ඔය පැහැදිලි කිරීම අවසන් කරන්න.

ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.05]

**ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා**
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W.H.M. Dharmasena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ දිස්ත්‍රික්ක 25 තුළම ආපදාවට ලක් වී, විපතට පත් වී මිය ගිය අය වෙනුවෙන් කනගාටුව සහ ශෝකය මම ප්‍රථමයෙන්ම ප්‍රකාශ කර සිටිනවා. මා ජීවත් වන මොනරාගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 11යි. ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 11 තුළම යම්කිසි ආකාරයෙන් හෝ - පුංචි පුංචි ආකාරයට හෝ - ආපදාවලට ලක් වුණු ජනතාව සිටිනවා. ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 11න් විශේෂයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 5ක් පමණ ආපදාවට ලක්ව තිබෙනවා. බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉහළ කඳුකර කොට්ඨාසය, බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දෙහිගල වතුයාය, කතරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නාගහවීදියේ ග්‍රාම නිලධාරි කොට්ඨාසය, සියඹලාණ්ඩුවේ කෝන්ගහපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය සහ බුත්තල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසය යනාදියෙහි ආපදා තත්ත්වයක් ඇති වී තිබෙනවා. ඒ වාගේම, බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කෝන්කැටිය ප්‍රදේශයේ වෙහෙරයාය ගමේ පන්සලක සිර වී ගම්වාසින් විශාල පිරිසකට දින තුනහතරක් ගත කරන්න සිද්ධ වුණා. ඒ තුළ පුංචි පුංචි ආපදා රාශියකට මුහුණ දුන් විශාල පිරිසක් හිටියා. ඒ අය ගලවා ගැනීම සඳහා දිසාපතිතුමා, ප්‍රාදේශීය ලේකම්තුමන්ලා, ආපදා කළමනාකරණ නිලධාරින්, වෛද්‍යවරුන් ඇතුළු සෞඛ්‍ය සේවයේ සියලු නිලධාරින්, ග්‍රාම නිලධාරින්, සංවර්ධන නිලධාරින්, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරින්, සමෘද්ධි නිලධාරින්, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්, පොලීසිය, විශේෂ කාර්ය බලකාය, හමුදාව, ප්‍රාදේශීය සභා සභාපතිවරු, විපක්ෂ නායකවරු, මන්ත්‍රීවරු ආදි සියලුදෙනා බෙහෙවින් කැප වෙලා කටයුතු කළා.

අන්න ඒ කැපවීම වෙනුවෙන් මොනරාගල දිස්ත්‍රික්කයේ මේ කටයුතු කරපු සියලු නිලධාරින්ට මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා. ඒ වාගේම තමයි මේ අතරතුර යම් යම් නිලධාරින්ගේ අඩුපාඩුකම් නිසා, විශේෂයෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ අඩුපාඩුකම් නිසා කුඹුක්කන් ඔය ඔක්කම්පිටිය ව්‍යාපාරයේ අමුණේ දොරවල් විවෘත කළේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එහි දොරවල් රාශියක් තිබුණා. මේ දොරවල් විවෘත නොකර තිබුණු නිසා, කොළඹ-මොනරාගල මාර්ගයේ කුඹුක්කන ආසන්නයේ ප්‍රදේශය සම්පූර්ණයෙන්ම යට වෙලා බස් රථ දෙකක් සහ විවිධ වර්ගයේ මෝටර් රථ ජල කඳට හසුවෙලා, යටවෙලා තිබුණු මොහොතේ ගම්වාසීන්ගේ ඉල්ලීම මත තමයි ඒ අය මේ දොරවල් ටික විවෘත කළේ.

ගංවතුර එන එක ගැන වාරිමාර්ග දෙපාර්තමේන්තුව මීට ප්‍රථම දැනගෙන සිටියා. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මේ ගැන දැනුවත් කළා. ඒ වාගේම තමයි, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව දිගින් දිගටම දැනුවත් කර තිබියදී වාරිමාර්ග දෙපාර්තමේන්තුව මේ දොරවල් ටික විවෘත කර තිබුණා නම් මේ ජල කඳ එකවර ඔක්කම්පිටිය දෙසට ගලාගෙන යන්නේ නැහැ. මේ ජලාශයේ දොරවල් ටික එකවර ඇරපු නිසා ඔක්කම්පිටියේ රුපියල් කෝටි 10ක්, 15ක් වටිනා පාලම් දෙකක් විනාශ වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා කරුණාකර මේ ගැන සොයා බලන්න. මේ නිලධාරින්ගේ රාජකාරිය මේ ආපදාව වෙන අවස්ථාවේ හරියාකාරව ඉටු කළාද කියන කාරණය ගැන හිතලා බලන්න. මේ වෙනකොට ඒ පාලම් දෙක කැඩිලා ගිය නිසා ගොවිතැන් කරපු ජනතාවට තමන්ගේ ගොවිබිම්වලට යන්න බැරිව ඉන්නවා. බඩ ඉරිඟු වගා කළ අයට ඒ බඩ ඉරිඟුවලට පොහොර ටික යොදන්න, වෙනත් භෝග වගා කරපු ගොවි මහත්වරුන්ට ඒ වගාවලට අවශ්‍ය පොහොර ටික යොදන්න ඒ ස්ථානවලට ළඟාවෙන්න බැරිවෙලා තිබෙනවා. මේ ආපදාව නිසා හානි සිදු වුණේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නොසැලකිලිමත්කම නිසා කියලා මම ප්‍රකාශ කරනවා. අන්න ඒ නිසා මේ ගැන පරීක්ෂණයක් කරන්න කියන ඉල්ලීම කරන ගමන්, කරුණාකරලා මේ පාලම් දෙක අලුත්වැඩියා කරන්න කඩිනමින් කටයුතු කරන්න කියලාත් ඉල්ලා සිටිනවා. ඒවා අලුත්වැඩියා කරන්න නම් පුළුවන්කමක් නැතිව ඇති. ඒ නිසා මේ පාලම් දෙක අලුතින් හදලා දෙන්න කියන ඉල්ලීම කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආපදාවකට ලක් වුණු එක් පුද්ගලයෙක් සඳහා දින 7කට රජය විසින් රුපියල් 2,100ක මුදලක් වෙන් කර තිබෙනවා. මේ රුපියල් 2,100න් දිනකට වෙන් වන මුදල ගත්තොත්, දිනකට තුන් වේලටම රුපියල් 300යි වෙන් කර තිබෙන්නේ. මේ රුපියල් 300 දිනක තුන් වේල කන්න කොහොමත් මදි. ඒ නිසා මෙම දින 7ට වෙන් කරපු රුපියල් 2,100ක මුදල වෙනුවට අඩු තරමින් රුපියල් 5,000ක්වත් වෙන් කරලා දෙන්න කියන ඉල්ලීම කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ දිස්ත්‍රික්කය ගත්තොත්, ඉතාම දුගී දුප්පත් ජනතාව විශාල ප්‍රමාණයක් සිටින දිස්ත්‍රික්කයක්. මේ දිස්ත්‍රික්කය තුළ මැටි ගෙවල්වල ජීවත් වන විශාල පිරිසක් ඉන්නවා. මේ ආපදාව නිසා බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මැටි ගෙවල් කිහිපයක් මේ වන විට කඩා වැටිලා තිබෙනවා. මේ ගෙවල්වලට විදුලිය ලබා ගැනීමේදී විදුලි මීටර් සවි කර තිබිලා තිබෙන්නේ මේ බිත්තිවල. මේ බිත්ති පෙරළීම නිසා විදුලි මීටර් සම්පූර්ණයෙන්ම විනාශ වෙලා තිබෙනවා. ඒ විනාශ වූ විදුලි මීටර් වෙනුවට මේ නිවෙස් හිමියන් ගිහිල්ලා විදුලිබල මණ්ඩලයෙන් විදුලි මීටර් ඉලුවාම, විදුලි මීටර් ගන්න නම් රුපියල් 38,000ක තක්සේරුවක් ලබා දී තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදුලි මීටරයකට රුපියල් 38,000ක් ගෙවන්න මේ අසරණ පුද්ගලයන්ට මේ අවස්ථාවේ පුළුවන්කමක් නැහැ. අන්න, ඒ නිසා ඔබතුමන්ලා මැදිහත් වෙලා මේ ආපදාවට ලක් වුණු නිවාසවලට සහනදායී මිලකට විදුලි මීටර් ලබා දෙන්න කියලා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආපදාව නිසා අපේ ඉහළ කඳුකරයේ ජීවත්වන ද්‍රවිඩ ජනතාව ඉතාම අසීරුවෙන් ජීවත් වෙන්නේ. සමහර ප්‍රදේශවලට එක් එක් ආකාරයෙන් ආධාර උපකාර ලැබෙනවා. ප්‍රාදේශීය ලේකම්තුමන්ලා මැදිහත් වෙලා ඒ කටයුත්ත සිදු කරමින් පැවතියත්, ආපදාවලට ලක්වුණු සමහර තැන්වලට ඒ ආධාර නොලැබෙන තත්ත්වයක් තිබෙනවා. ඒක නිසා කරුණාකරලා කඩිනමින් මේ ආධාර ලබා දෙන්න කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා. මීට පෙර කථා කළ ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රී කෙනෙක් ප්‍රකාශ කළා, "රතු තරුව" කියන වැඩසටහන තුළින් වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "රතු තරුව" තුළින් අපේ ප්‍රදේශයේ නම් වැඩක් කෙරෙනවා මම දැකලා නැහැ. අපේ ගම්වල ඉන්න තරුණ තරුණියෝ එකතු කරන ආධාර මුදල් බෙදා දීමේදී, "රතු තරුව" ලේබල් එක ගහන්න ගිහිල්ලා ආරාවුල් ඇතිවුණු තැන් මම දැකලා තිබෙනවා. ඒක නිසා මේ ආරාවුල් ඇතිවෙන විදියට ගම්වල තරුණ තරුණියෝ එකතු කරන ආධාරවලට "රතු තරුව" ගහලා ඒ ආධාර මුදල් බෙදන්න ඉඩ දෙන්න එපා. හැබැයි, අපේ පක්ෂයේ ඇරෙන්න වෙනත් පක්ෂවල කොළ පාට, කහ පාට තරු තිබෙනවාද කියලා එතුමා ඇහුවා. අපේ පක්ෂවල එහෙම තරු ගහගෙන වැඩ කරන සිරිතක් නැහැ. හැබැයි, ඔබතුමන්ලාට වැඩි කාලයක් යන්න කලින් තරු පෙනෙන දවසක් උදාවෙනවා කියන විශ්වාසය මට තිබෙනවා. ඒක නිසා අනාථ වෙච්ච මිනිසුන්ට ආධාර උපකාර කරන්න කියන ඉල්ලීම කරමින්, මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මුනීර් මුලාෆර් නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.14]

**ගරු මුනීර් මුලාෆර් මහතා (ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு முனீர் முலாபர் - சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of Religious and Cultural Affairs)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எமது நாட்டிலே ஏற்பட்டிருக்கின்ற பேரிடர் காரணமாக உயிரிழந்த அனைவருக்கும் முதலிலே எமது அரசாங்கத்தின் சார்பில் அஞ்சலியைத் தெரிவித்துக் கொள்கின்றேன். குறிப்பாக, இந்த இடரின்போது மீட்புப் பணியாற்றிக்கொண்டிருந்த எமது இராணுவத்தினர், பொலிஸார் மற்றும் ஏனைய துறையினர் பாரிய சிக்கல்களுக்கு உட்பட்டார்கள். உண்மையிலேயே இந்தப் பாரிய அனர்த்தத்தை நாம் எடுத்துக் கொள்ளுகின்ற போது, இதனுடன் தொடர்பானவர்களாக 3 தரப்பினர் இருக்கிறார்கள் என்று கூற முடியும். இந்தப் பாரிய அனர்த்தம் காரணமாக உயிர்களை இழந்து, உடைமைகளை இழந்து, வியாபாரங்களை இழந்து பாதிக்கப்பட்டு அவதிப் படுகின்றவர்கள் ஒரு தரப்பினர்; பாதிக்கப் பட்டவர்களுக்காகத் தமது உயிரையும் துச்சமாக மதித்துச் செயற்படக்கூடிய முப்படையினர், பொலிஸார், அரச உத்தியோகத்தர்கள், மதத் தலைவர்கள், சிவில் அமைப்பினர் எனப் பலரும் மற்றைய தரப்பினர்; இந்த இரண்டு தரப்பினரையும் தவிர்த்து, இந்த இடரினால் பாதிக்கப்பட்டவர்களைப் பாதுகாக்கின்ற, மீட்புப் பணியில் ஈடுபடுகின்றவர்களுக்கு ஒத்தாசை புரிகின்ற செயற்பாடுகளுக்கு இடையூறாக இருந்துகொண்டு, வதந்திகளைப் பரப்பி, இந்த இடர்மிகுந்த சந்தர்ப்பத்திலும்கூட தமது அரசியல் கனவுகளை நனவாக்கிக் கொள்வதற்காகத் துடித்துக் கொண்டிருக்கின்ற பலர் அடுத்த தரப்பினர்.

ஆரம்பத்தில் இந்த அனர்த்தம் ஏற்பட்டவுடன், நாட்டைத் தன்னிடம் பொறுப்புத்தருமாறு கேட்டுக்கொள்ளும் அளவுக்கு அரசியலைப் பயன்படுத்தியவர்கள் இந்த நாட்டில் இருக்கிறார்கள் என்பது எங்களுக்குத் தெரியும். கடந்த காலங்களில் இந்த நாடு பொருளாதார ரீதியாக மீண்டும் மீண்டும் வீழ்ந்தபோது, நாட்டைப் பொறுப்பேற்ற எமது அரசாங்கம், நாட்டின் பொருளாதாரத்தைக் கட்டியெழுப்பி, இந்த நாட்டை ஒரு நல்ல திசைக்குக் கொண்டுசெல்வதற்கான முயற்சியை மேற்கொண்டிருந்தும், எப்போது இந்த நாடு வீழுமென்ற ஓர் எதிர்பார்ப்போடு செயற்படுகின்ற எதிர்க் கட்சியைக் கொண்ட துர்ப்பாக்கிய நாடாக இந்த நாடு மாறியிருக்கின்றது.

අපි හැම කෙනාම දන්නවා, මේ මොහොතේ රටේ විශාල ව්‍යසනයක් ඇති වී තිබෙන බව. රටේ බහුතර ප්‍රදේශ හානියට පත් වෙලා -විනාශ වෙලා- සමීපතයන්ගේ ජීවිත අහිමි වෙලා, දේපළ අහිමි වෙලා, ව්‍යාපාර නැති වෙලා තිබෙන මොහොතක සමහර පිරිස් මොකක්ද කරන්නේ? ඔවුන් ඒ සිදුවීම තවමත් කොත්මලේ ජලාශයේ වාන් දොරටුවල එල්ලන්න හදනවා. ඒගොල්ලන් ඒ මත්තෙන් තමන්ගේ දේශපාලන ගමන ගෙන යන්න උත්සාහ කරන අවාසනාවන්ත තත්ත්වයක් තිබෙනවා. මේ ගංවතුර තත්ත්වය තුළ රටක් ලෙස අපි කරන්න අවශ්‍ය වෙන්නේ මොකක්ද? 2004 සුනාමියෙන් පසුව පාර්ලිමේන්තුවේ කාරක සභාවක් පත් කරලා, ඒ පිළිබඳ අධ්‍යයනය කරලා, අපේ රටේ මෙවැනි ආපදා තත්ත්වයක් ඇතිවන විට ක්‍රියා කළ යුත්තේ කෙසේද කියන අධ්‍යයනය කරන්න රටවල් කිහිපයකට ගිහින් හදපු වාර්තා අපේ රට තුළ තිබුණත් පසුගිය කාලය පුරාවටම ඒ වාර්තා අනුව අපේ රටේ ක්‍රියාත්මක වෙලා තිබුණේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව පත් වුණාට පසුව තමයි ආපදා කළමනාකරණ කමිටුව රැස් වෙන්නේ. අපේ ආණ්ඩුව පත් වුණාට පස්සේ දිස්ත්‍රික් සංවර්ධන කමිටුව තුළත් ආපදා කළමනාකරණ කමිටු පිළිබඳව සාකච්ඡා කරපු ආකාරය අපට හොඳට මතකයි. විශේෂයෙන් ගම්පහ දිස්ත්‍රික්කය තුළ මෙවැනි ආපදා ඇතිවීම වැළැක්වීම සඳහා, ඒවා කළමනාකරණය කිරීම සඳහා විවිධ වැඩ පිළිවෙළ පසු ගිය කාලය තිස්සේම අපි සාකච්ඡා කළා. එය කළමනාකරණය කිරීම සඳහා අපේ රජය විසින් විවිධ කටයුතු කරමින් සිටියා. හැබැයි, මේ ඇති වෙච්ච ගංවතුර තත්ත්වය කොතරම් විශාල බලපෑමක් කළාද කියලා අපි දන්නවා. අපේ ජීවිත කාලය තුළ මෙතරම් විශාල ව්‍යසනයක් අපි දැක්කාමයි.

එය රටේ සියලු ප්‍රදේශවල පැතිර ගොස් තිබෙනවා. මේ තත්ත්වය තේරුම් නොගෙන මේ මොහොතේ විපක්ෂය එල්ල කරන චෝදනා දෙස බලන්න. විශේෂයෙන්ම "රතු තරුව" පිළිබඳව සාකච්ඡා කරනවා. ඒ වාගේම ඉතාම පොඩි දේවල්, සුළු දේවල් පිළිබඳ කරුණු මතු කරමින් ජනතාව වැරදි දිශාවකට යොමු කරමින්, ජනතාව තුළ වැරදි දේවල් නිදන්ගත කරමින් ඒගොල්ලන් නැවත දේශපාලනය කරන්න උත්සාහ කරනවා.

හැබැයි, මෙවැනි තත්ත්වයක් තුළ අපේ රටේ ජනතාව ජාති, කුලමල භේදයකින් තොරව සියලුදෙනා එක්ව කටයුතු කිරීම පිළිබඳව අපි රජයක් ලෙස මේ මොහොතේ ඒ ජනතාවට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ශ්‍රී ලාංකිකත්වය මතු කරමින්, ශ්‍රී ලාංකිකයන් ලෙස එකට වැඩ කරන්න අපට හොඳ අවස්ථාවක් ලැබී තිබෙනවා. එවැනි අද්විතීය අවස්ථාවක් අපට උදා වෙලා තිබෙනවා. අපට විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ සහයෝගයත් නොමසුරුව ලැබෙමින් පවතිනවා. ඔවුන් රටින් පිට හිටියත් ඔවුන්ගේ හදවත්, ඔවුන්ගේ අවධානය හැමවිටම රට තුළම තමයි තිබෙන්නේ. ඔවුන් අපට විශාල ශක්තියක් වෙමින් තිබෙනවා.

අපි පාඩම් ඉගෙන ගන්න ඕනෑ. විශේෂයෙන්ම රටට මෙවැනි අනතුරුදායක තත්ත්වයක් උදා වෙච්ච ගමන්ම අසල්වැසි රට ඉන්දියාව, පාකිස්තානය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, රුසියාව, ඇමෙරිකාව, චීනය වාගේ ලෝකයේ බොහෝ රටවල් රාශියක් අපට උදවු කිරීම සඳහා ඉදිරිපත් වී තිබෙනවා. ඒ තත්ත්වය තුළ ශ්‍රී ලාංකිකයන් ලෙස අපි කළ යුත්තේ මොකක්ද? මේ ව්‍යසනය තුළ දේශපාලනය නොකර, - දේශපාලන බලය ලබා ගන්න වෙනත් ක්‍රම සොයාගෙන- මේ තත්ත්වය සමනය කරගෙන රට ඉදිරියට ගෙන යන්න, ජනතාවගේ ජීවිත නැවත නඟා සිටුවන්නට, ඔවුන් යළිත් ස්වාභාවික ජීවිතය සඳහා යොමු කරන්න අපි හැමකෙනාම අත්වැල් බැඳගත යුතුයි. ඒ සඳහා අපට ඉතා හොඳ අවස්ථාවක් ලැබී තිබෙනවා කියලා මම හිතනවා. අපි හැමකෙනාම ශ්‍රී ලාංකිකයන් ලෙස එකතු වෙලා මේ ව්‍යසනයෙන්, මේ අනතුරෙන් රට මුදාගෙන ඉදිරියට යමු කියා මම ආරාධනා කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 5.22]

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, முதலில் நமது தாய் நாட்டில் ஏற்பட்ட சூறாவளி, வெள்ளம் என்பவற்றால் மரணித்தவர்களுக்காக இறைவனிடம் பிரார்த்தித்தவனாக, அவர்களின் குடும்பத்தினருக்கு எங்களுடைய ஸ்ரீலங்கா முஸ்லிம் காங்கிரஸ் சார்பில் ஆழ்ந்த அனுதாபங்களைத் தெரிவித்துக்கொள்ளுகின்றேன். எமக்குக் கிடைத்திருக்கின்ற அறிக்கையின்படி, அண்மையில் ஏற்பட்ட சூறாவளி மற்றும் பெரும் வெள்ளத்தால் இன்றுவரை 474 பேர் இறந்துள்ளதுடன், 356 பேர் காணாமற்போயும் உள்ளனர். மேலும், 448,817 குடும்பங்களும் 1,586,329 பொதுமக்களும் பாதிக்கப்பட்டுள்ளனர். இந்த அனர்த்தமானது நமது நாட்டிலுள்ள 25 மாவட்டங்களிலும் பாரிய பாதிப்பை ஏற்படுத்தியுள்ளது.

நாங்கள் எல்லோரும் ஒன்றை உணர்ந்துகொள்ள வேண்டும். நாங்கள் எல்லோரும் அவரவரது சமயத்தின்மீது நம்பிக்கை வைத்திருக்கிறோம். அந்த வகையில் இயற்கை அனர்த்தங்கள் இறைவனால்தான் ஏற்படுத்தப்படுகின்றது என்ற அசைக்க முடியாத நம்பிக்கையுடன் நாங்கள் இருக்கவேண்டும். இப்போதிருக்கின்ற அரசாங்கம் ஆட்சிக்கு வந்ததனாலோ அல்லது வேறோர் அரசாங்கம் ஆட்சிக்கு வருவதனாலோ இந்த அனர்த்தங்கள் ஏற்படுவதில்லை. எங்களுடைய புனித இஸ்லாம் மார்க்கத்தின்படி, மனிதர்களைப் படைப்பதற்கு முன்பே இறைவன் அவர்களுடைய இறப்பைத் தீர்மானித்துவிடுவான். எனவே, இயற்கை அனர்த்தங்கள் இறைவனாலே ஏற்படுத்தப்படுகின்றது.

1978ஆம் ஆண்டு இலங்கையில் பெரும் சூறாவளி ஒன்று ஏற்பட்டது. அதனால் வட, கிழக்கு மாகாணங்களிலுள்ள மக்கள் மோசமாகப் பாதிக்கப்பட்டார்கள். அதேபோல், 2004ஆம் ஆண்டு சுனாமிப் பேரலை ஏற்பட்டது. அதற்கு முதல் நாம் யாருமே - இந்த நாடே - சுனாமி பற்றி அறிந்திருக்கவில்லை. "கடல் மேட்டுக்கு வருகின்றது" என்று சொன்னபோது எல்லோருமே சிரித்தார்கள். அது மாத்திரமன்றி, கடல் வற்றிக்கொண்டு போனபோது, சில பொதுமக்கள் மீன்களைப் பிடிப்பதற்கு கடலுக்குள் போனார்கள். காரணம், அப்பொழுது அவர்கள் சுனாமி பற்றி தெரியாதவர்களாக இருந்தார்கள். அந்த சுனாமி பேரலையானது, நாட்டுக்குப் பெரும் அழிவைத் தந்தது. அதன்பிறகு நாங்கள் அது தொடர்பான அறிவைப் பெற்று, ஒவ்வொரு வருடமும் ஒத்திகை பார்க்கின்றோம்; சுனாமி வந்தால் எப்படி ஓட வேண்டும், எப்படிப் பாதுகாப்பாக இருக்க வேண்டும் என்பது தொடர்பில் விழிப்புணர்வைப் பெற்றவர்களாக மாறியிருக்கிறோம்.

நமது நாட்டில் சூறாவளி, வெள்ளப்பெருக்கு ஏற்படும்போது, அவற்றை முகாமைத்துவம் செய்யும் கட்டமைப்பில் பலவீனம் இருக்கிறது. அதைச் சிறந்த முறையில் நிருவகிக்கவேண்டிய பொறுப்பு அரசாங்கத்துக்கு இருக்கிறது. இறைவன் நமக்கு குளங்கள், நதிகள் - ஆறுகள் - மற்றும் சமுத்திரங்களைத் தந்திருக்கிறான். அதேபோல், இயற்கை அனர்த்தங்கள் ஏற்படும்போது, நீர் வழிந்தோடுவதற்காக இவற்றுக்கான இயற்கையான வடிச்சல் வழிகளையும் படைத்திருக்கிறான். நம்முடைய மனித சமூகம் என்ன செய்கிறது? இறைவனால் படைக்கப்பட்டுள்ள அந்த வடிச்சல் வழிகளையும் குளங்களையும் மறித்து, அந்தப் பகுதியில் குடியேறுகின்றது. இதனால் இயற்கையாக வழிந்தோடக்கூடிய நீர், வழிந்தோட முடியாமல் தேங்கி, மக்களுக்குப் பெரும் பாதிப்பை ஏற்படுத்துகின்றது. பின்னர் ஒவ்வொரு வருடமும் வெள்ளம் வரும்போது நாங்கள் கூடிப் பேசுவதும் திட்டமிடுவதும் பின்னர் அதை மறந்துபோவதும், மீண்டும் வெள்ளம், சூறாவளி வந்தால் அதுபற்றி கூடிப் பேசுவதும் என இந்த நிலை தொடர்வது இந்த நாட்டில் வழமையாகிப் போயிருக்கின்றது. இந்த வெள்ள அனர்த்தத்தினால் எமது நாட்டுக்குப் பேரழிவு ஏற்பட்டு, முழு நாடுமே சோகமயமாக இருந்துகொண்டு இருக்கிறது. இது நமது தாய் நாடு. இந்த வெள்ள அனர்த்தத்தால் நமது தாய் நாட்டில் பெரும் அழிவு ஏற்பட்டிருக்கிறது. இந்த நேரத்தில் நாங்கள் அரசியல் பேச முடியாது. எனவே, இதனை ஒரு படிப்பினையாகக் கொண்டு, எதிர்கால சமூகத்தின் நலன்கருதி, நாங்கள் இதற்கான திட்டமொன்றை உருவாக்க வேண்டும்.

எதிர்க்கட்சி உறுப்பினர் ஒருவர் பேசியதை நான் கேட்டேன்; அவர் கூறிய அந்த விடயத்தை நானும் பார்த்தேன். "எங்களுடைய தாயின் சடலம் இவ்விடத்தில்தான் இருக்கிறது. அதனை மீட்டுத் தாருங்கள்" என்று பிள்ளைகள் கத்துகின்ற காட்சிகளைப் பார்க்கும்போது எங்களுடைய மனம் பதறுகின்றது. இது எமது நாட்டுக்குப் பெரியளவில் சேதத்தை ஏற்படுத்தியிருப்பதால், ஆளுங்கட்சியினர், எதிர்க்கட்சியினர், அரச உத்தியோகத்தர்கள் என எல்லோரும் சேர்ந்துதான் இந்த நாட்டை மீளக் கட்டியெழுப்ப வேண்டும்.

இந்த அனர்த்தம் ஏற்பட்டபோது, எங்களுடைய மாண்புமிகு சனாதிபதி அவர்கள் கடந்த மாதம் 27ஆம் திகதி 9.00 மணிக்கு பாராளுமன்ற உறுப்பினர்கள் எல்லோரையும் அழைத்து விசேட கூட்டமொன்றை நடாத்தினார். தேசிய அனர்த்த முகாமைச் சபையில் நான்கு பேர் இருக்கிறார்கள்; அதில் நானும் எதிர்க்கட்சித் தலைவரும் இருக்கிறோம். நாங்கள் இருவரும்தான் அன்று 7.00 மணியளவில் நடந்த கூட்டத்தில் கலந்துகொண்டோம். அக்கூட்டத்தில் அமைச்சர்கள், துறைசார்ந்தவர்கள், முப்படைகளின் தலைவர்களுடன் இந்த அனர்த்தம் சம்பந்தமாகக் கலந்துரையாடி நாங்கள் சில நடவடிக்கைகளை எடுத்தோம். ஒரு பேரழிவு வந்தால், அதிலிருந்து நாட்டை மீட்டுக் கட்டியெழுப்ப வேண்டிய பணி நமக்கு இருக்கிறது. இந்த அனர்த்தத்தால் பாதிக்கப்பட்டவர்கள் எத்தனை பேர் என்ற கணக்கெடுப்பை இன்னும் சரியாக எடுக்க முடியாமல் இருக்கிறது. நாளாந்தம் பாதிக்கப்பட்டவர்களின் எண்ணிக்கை 50-60 என்று அதிகரித்துக்கொண்டு செல்கின்ற காரணத்தால், இப்போது இந்த நாடு ஒரு 'ஜனாஸா இல்லம்' போன்று காணப்படுகிறது. இத்தகைய கவலையான, சோகமான சூழலில், அரசியல் தலைவர்கள் உட்பட நாங்கள் எல்லோரும் ஒற்றுமைப்பட்டு இணைந்து பயணிக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

என்னுடைய தனிப்பட்ட கருத்தொன்றை இங்கு குறிப்பிட விரும்புகின்றேன். மூன்று தினங்களுக்கு முன்னர் நடைபெற்ற கட்சித் தலைவர்களின் கூட்டத்தில், நாட்டில் ஏற்பட்டிருக்கின்ற அனர்த்தம் சம்பந்தமாகப் பேசுவதற்கு நேரத்தை ஒதுக்கித் தருமாறு எதிர்க்கட்சியினர் கேட்டபோது, அதற்கு ஆளுங்கட்சியினர் இணங்கவில்லை. அதனால் எதிர்க்கட்சியினர் அன்றைய தினம் சபையிலிருந்து வெளியேறவேண்டிய நிலை ஏற்பட்டது. ஆனால், இன்று ஆளும் கட்சியினர், எதிர்க்கட்சியினர் என எல்லோரும் இங்கு வந்து, ஏற்பட்டிருக்கின்ற அனர்த்தம் பற்றி பேசுகின்ற சூழல் ஏற்பட்டிருக்கின்றது. நாங்கள் அன்றே இதைப் பற்றி விவாதித்திருந்தால், எங்கள் மத்தியில் இன்னும் சிநேகபூர்வமான உணர்வு ஏற்பட்டிருக்கும். இது

எல்லோருக்கும் பொதுவான ஒரு விடயம் என்பதால், தேசிய உணர்வோடும் நாட்டுப் பற்றோடும் இந்த விடயத்தை அணுக வேண்டுமென நான் எல்லோரையும் கேட்டுக்கொள்ள விரும்புகின்றேன். நமது தாய் நாட்டைக் கட்டியெழுப்புகின்ற விடயத்தில் எமது நாட்டுக்கு வெளிநாடுகளிலிருந்து நிறைய உதவிகள் கிடைக்கப்பெறுகின்றன. எனவே, நீங்கள் எல்லோரும் இந்த விடயத்துக்கு ஒத்துழைப்பு வழங்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, எமது அம்பாறை மாவட்டம் சம்பந்தமாகச் சில விடயங்களைச் சொல்ல வேண்டும். அங்கு ஏராளமான ஆறுகளும் வயல் நிலங்களும் இருக்கின்றன. ஒவ்வொரு வருடமும் வெள்ளப்பெருக்கு ஏற்படும்போது, எங்களுடைய விவசாயிகளினதும் மீனவர்களினதும் வாழ்வாதாரம் பாதிக்கப்படுகின்றது. இந்த வருடமும் பெரும் பாதிப்பு ஏற்பட்டு இருக்கின்றது. அம்பாறை மாவட்டத்தில் 1957, 1964, 2004, 2011, 2014, 2018, 2024, 2025இல் தலா இரண்டு பெரும் வெள்ள நிலைமைகள் ஏற்பட்டு, எங்களுடைய மக்களின் வாழ்வு சீரழிந்ததுடன், அவர்களின் பொருளாதாரமும் பாதிக்கப்பட்டது. எங்களுடைய பிரதேசத்தில் இங்கினியாகல - சேனாநாயக்க சமுத்திரத்துடன் தொடர்புடைய இரண்டு வடிச்சல் திட்டங்கள் செயற்படுத்தப்பட வேண்டியிருக்கின்றது. ஒன்று, பெரியகளப்பு - சம்புக்களப்பு வடிச்சல் திட்டம்; அடுத்தது, கரைவாகுவட்டை வடிச்சல் திட்டம். இந்த இரண்டு வடிச்சல் திட்டங்கள் தொடர்பாக நாங்கள் ஏற்கெனவே நீர்ப்பாசன அமைச்சுக்குச் சொல்லியிருக்கிறோம். இவற்றின்மூலம் சீராகக் கடலுக்கு நீர் செல்லக்கூடிய வாய்ப்பை ஏற்படுத்தினால், அரசாங்கத்தின் கோடிக் கணக்கான நிதியை மீதப்படுத்த முடியும் என்பதுடன், அங்குள்ள மக்கள் தொடர்ச்சியாக பொருளாதாரத்தில் நஷ்டமடையும் நிலைமையை நீக்கலாமென்றும் நான் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
මට තව විනාඩියක් දෙන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මගේ දිස්ත්‍රික්කය සම්බන්ධවත් මම කථා කරන්න ඕනෑ.

அம்பாறை மாவட்டத்திலுள்ள விவசாயிகளும் மீனவர்களும் பொருளாதார ரீதியாக மிகவும் கஷ்டப்பட்டுக்கொண்டு இருக்கிறார்கள். இந்த வருடம் 81,800 ஹெக்டயர் நிலத்தில் பயிர்ச்செய்கை மேற்கொள்ளப்பட்டுள்ளது. அதில் 9,200 ஹெக்டெயார் முழுமையாக வெள்ளத்தால் பாதிக்கப்பட்டுள்ளதுடன், 15,200 ஹெக்டயர் பகுதியளவில் பாதிக்கப்பட்டுள்ளது. அதுமாத்திரமன்றி, 1,400 ஹெக்டயர் சோளப் பயிர்ச்செய்கைக்கும் பெரும் அழிவு ஏற்பட்டு இருக்கின்றது. இதற்கான நட்டஈடுகளை வழங்குவதற்குரிய ஏற்பாடுகளை விவசாய அமைச்சு மேற்கொள்ள வேண்டும். அம்பாறை மாவட்டத்தில் இருக்கின்ற -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා දැන් කථාව අවසන් කරන්න.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපේ ප්‍රදේශවලට විදුලිය නැහැ. බලශක්ති ඇමතිතුමා මෙතැන ඉඳලා ගියා. මේ වෙලාවේ අපි ඒ ගැන ඉල්ලීමක් කරන්නේ නැහැ. ඒ මොකද දන්නවාද? මේ දිනවල රටේ තිබෙන තත්ත්වය නිසා අපේ මිනිස්සු පොඩ්ඩක් ඉවසීමෙන් ඉන්නවා. දවසකට පැයක් තමයි අපේ ප්‍රදේශවලට විදුලිය පහසුකම් දෙන්නේ ගරු ඇමතිතුමනි. මම හිතන විධියට, මඩකලපුව දිස්ත්‍රික්කයට තවම විදුලිය පහසුකම් ලබා දුන්නේ නැහැ. ඒගොල්ලන් ටික ටික තමයි හදලා දෙන්නේ. ඒ වෙනකම් ඉන්න කියලා අපි මිනිස්සුන්ට කථා කරලා තිබෙන්නේ. ඒ නිසා පොඩ්ඩක් ඉක්මනින් විදුලිය පහසුකම් ලබා දෙන්න කියලා බලශක්ති ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එරංග වීරරත්න නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.30]

**ගරු එරංග වීරරත්න මහතා (ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எரங்க வீரரத்ன - டிஜிட்டல் பொருளாதார பிரதி அமைச்சர்)
(The Hon. Eranga Weeraratne - Deputy Minister of Digital Economy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නොවැම්බර් 28වෙනි දා සිට 30වෙනි දා දක්වා පැවති "දිට්වා" සුළි කුණාටුව අපේ රටට විශාල හානියක් කරලා තිබෙනවා. ගංවතුර, නාය යෑම්, දේපළ හානි නිසා ඉන්න හිටින්න තැන් නැතිව විශාල පිරිසක් මේ වන විට අවතැන් වෙලා තිබෙනවා. කෘෂි කාර්මික බිම් සෝදා ගොස් වගාවලට දැඩි හානියක් සිදු වී තිබෙනවා. ඒ වාගේම මහාමාර්ග, දුම්රිය මාර්ග, වාරිමාර්ග, ගොඩනැඟිලි වැනි අතිවිශාල පොදු දේපළ ප්‍රමාණයකට ද හානිවෙලා තිබෙනවා. නමුත්, අවතැන් වූ ජනතාවගේ ආරක්ෂාව සහ මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා රජයත්, රාජ්‍ය ආයතනත්, නිලධාරීනුත්, ත්‍රිවිධ හමුදාවත්, පෞද්ගලික ආයතනත්, සිවිල් සංවිධාන හා මහජනතාවත් එකතු වී යුහුසුලුව හා දිවා රෑ නොබලා වැඩ කිරීම නිසා මේ වන විට මේ ව්‍යසන තත්ත්වය සාර්ථකව සමනය කර ගැනීමට අප රජයට හැකි වී තිබෙනවා.

මේ ව්‍යසනය අපේ විදුලි සංදේශ ජාලයටත් සෑහෙන්න බලපෑවා. මොකද, නාය යෑම් සහ ජල ගැලීම් නිසා සන්නිවේදන ජාල කිහිපයක්ම අඩපණ වී තිබුණා. නමුත්, ඒ සන්නිවේදන ජාල යථා තත්ත්වයට පත් කරන්න ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයත්, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවත්, විදුලි සන්නිවේදන සමාගම් සමඟ එකතු වෙලා යුහුසුලුව වැඩ කිරීම නිසා, අද වන විට සමස්ත දුරකථන ක්‍රියාවලිය සියයට 90කට වැඩි ප්‍රමාණයක් යථා තත්ත්වයට පත් කර ගන්න අපට හැකියාව ලැබිලා තිබෙනවා. අපේ දුරකථන ක්‍රියාවලියේදී පළාත් අතර දුරකථන ජාලය සම්බන්ධ වන්නේ ෆයිබර් රැහැන් ජාලයක් සමඟයි. මේ ව්‍යසනයේදී වෙච්ච නාය යෑම් හා ජල ගැලීම් නිසා නොවැම්බර් 28වැනි දා වන විට එම ජාලයේ ප්‍රධාන රැහැන් 11ක් තැන් තැන්වලින් කැඩිලා තිබුණා. ඒ නිසා පළාත් ගණනාවක්ම

[ගරු එරංග වීරරත්න මහතා]

එකිනෙකට සම්බන්ධ කර ගන්න බැරිව, ඒ ජාලයේ පළාත් ගොඩකට අපේ සම්බන්ධතාව නැති වෙලා ගිහින් ඒ ප්‍රදේශවල තිබෙන දුරකථන වැඩ කරන්නේ නැති වුණා. මොකද, අපේ රටේ සෑම පළාතකම වාගේ locally දුරකථන ජාලය තිබුණත්, ඒ දුරකථන switch on කරන්න හැම දුරකථන සමාගමකම ප්‍රධාන මධ්‍යස්ථානය තිබෙන්නේ කොළඹ. එතකොට කොළඹත් එක්ක සම්බන්ධතාව නැති වුණාම, ඒ ජාල වැඩ කරන්නේ නැතිව යනවා. නමුත් කියන්න සතුටුයි, එම ආයතන, ත්‍රිවිධ හමුදාවේත් සහාය ඇතිව දිවා රෑ නොබලා, අවදානම නොතකා වැඩ කිරීම නිසා, එම ෆයිබර් රැහැන්වලින් වැඩි ප්‍රමාණයක් පැය 24ක් යෑමට ප්‍රථම සම්බන්ධ කරන්න 28වැනි දා සිට 29වැනි දා වන විට සමත් වුණු බව. මේ වන විට ප්‍රධාන ෆයිබර් රැහැන් සියල්ලක්ම යථා තත්ත්වයට පත් කරලා තිබෙනවා. නමුත්, තවමත් අනුරැහැන් 5ක් පමණ යථා තත්ත්වයට පත් කරමින් තිබෙනවා. ඒ නිසා අපට මේ පද්ධතියේ තවත් සියයට 10ක වාගේ ප්‍රමාණයක් ගොඩ ගන්න තිබෙනවා.

මුළු ලංකාවම ගත්තොත් විදුලි සන්නිවේදන කුලුනු 9,332ක් තිබෙනවා. ඒ කුලුනු හරහා සන්නිවේදන කලාප, ඒ කියන්නේ telecom sites 16,926ක් ලංකාවේම තිබෙනවා. 28වැනි දා වන විට ඒ සන්නිවේදන කලාප 16,926න්, 4,000කට වැඩි ප්‍රමාණයක් අක්‍රිය වෙලා තිබුණේ. නමුත්, අක්‍රියව තිබුණු 4,000කට වඩා වැඩි ඒ සන්නිවේදන කලාප ප්‍රමාණය ඊයේ වන විට 1,248කට අඩු කරන්න අපට පුළුවන් වුණා. අද වන විට ඒ ප්‍රමාණය 1,066කට අඩු කරලා තිබෙනවා. ඒ කියන්නේ, අපි කලාප 3,000කට වැඩි ප්‍රමාණයක් යථා තත්ත්වයට පත් කරලා තිබෙනවා. ඒ සන්නිවේදන කලාප 1,066න්, 809ක් විදුලිය විසන්ධිවීම් නිසා තවමත් අක්‍රිය තත්ත්වයේ තිබෙනවා. අපි බලාපොරොත්තු වනවා, අපේ බලශක්ති අමාත්‍යතුමා කියපු විධියට ඒ 809ත් පුළුවන් තරම් ඉක්මනින් යථා තත්ත්වයට ගන්න. මොකද, විදුලිය ලබා දීම යුහුසුලුව කරන්න අවශ්‍ය සෑම උත්සාහයක්ම මේ අවස්ථාවේදී ලංකා විදුලිබල මණ්ඩලයෙන් ගනිමින් තිබෙනවා.

තවත් 236ක් තිබෙනවා ෆයිබර් සබඳතා විසන්ධි වීම මත අපට තවමත් සක්‍රිය කර ගන්න බැරි වෙලා තිබෙන. ඒ වාගේම තවත් 21ක් වෙනත් හේතු නිසා තවමත් සක්‍රිය නොවී තිබෙනවා. අපට ප්‍රධානම බාධාව වෙලා තිබෙන්නේ මේ ස්ථානවලට ළඟා වීම අවදානම් තත්ත්වයක තිබීමයි. මොකද, සමහර ස්ථාන තවමත් ජලයෙන් යට වෙලා තිබෙනවා. ඒ වාගේම තවමත් සක්‍රිය නාය යෑම් තිබෙන ප්‍රදේශ තිබෙනවා. නමුත් අපි බලාපොරොත්තු වනවා, හෙට වන විට මේ ස්ථාන වැඩි ප්‍රමාණයක් stable වෙයි කියලා. ඒ හරහා අපට පුළුවන් වෙයි, ඒ ස්ථානවලට ගිහිල්ලා ඒ තිබෙන telecom sites යථා තත්ත්වයට ගන්න.

කියන්න සතුටුයි, මේ වනකොට නුවරඑළිය හැරුණාම අනෙක් සියලු නගරවල සියයට 70කට, 75කට වැඩි ප්‍රමාණයක් අපි දුරකථන සබඳතා සක්‍රිය කරලා තිබෙනවා. නුවරඑළියේ පමණක් තවමත් සියයට 68ක් පමණ තමයි සක්‍රිය කරලා තිබෙන්නේ. නමුත් අපි බලාපොරොත්තු වනවා, හෙට වාගේ වනකොට සියයට 75කට වැඩි ප්‍රමාණයකට නවීකරණය කරලා සක්‍රිය කර ගන්න පුළුවන් වෙයි කියලා.

අම්පාර, නුවර, මුලතිව් සහ පුත්තලම යන ප්‍රදේශවල දුරකථන සබඳතා සියයට 70ක්, 75ක් පමණ ප්‍රමාණයක් මේ වනකොට සක්‍රියයි. ඒ වාගේම ආපදාවට ලක් වූ සෙසු පළාත්වලින් සියයට 80කට වැඩි ප්‍රමාණයක් සක්‍රිය කරලා තිබෙනවා. ආපදාවට ලක් නොවූ ප්‍රදේශත් එක්ක ගත්තාම සියල්ලක්ම සියයට 90කට වැඩි ප්‍රමාණයකට අපේ දුරකථන සබඳතා දැන් සක්‍රිය කරලා තිබෙනවා; යථා තත්ත්වයට පත් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි සතුටින් කියනවා, දුරකථන ගිණුම්වල ශේෂය අඩු වීම නිසා දුරකථන සබඳතාව අහිමිවීමෙන් ග්‍රාහකයන්ට වන කරදරය, අපහසුතාව නැති කරන්න, රජයේ ඉල්ලීමක් අනුව මේ ව්‍යසනය ඇතිවූ දා පටන්ම නොමිලයේ සේවාව දෙන්න, top-up packages හඳුන්වා දෙන්න අපේ විදුලි සන්නිවේදන සමාගම් තුනම එකතු වුණ බව.

ඒ අනුව, කථා කරන කාලය විනාඩි 250ක්, 300ක්, SMS 200ක්, 250ක්, 300ක් සහ data සම්බන්ධතාව - අන්තර්ජාල සම්බන්ධතාව - GB එකක් පමණ ප්‍රමාණයක් ලැබෙන telecom package එකක් නොමිලේ ලබා දෙන්න මේ සමාගම් තුනම කැමැති වුණා. ඒ හරහා අපේ ජනතාවට තමන්ගේ telecom සේවාවට top-up එකක් දමා ගන්න බැරි වුණත්, ඔවුන්ගේ connections disconnect නොවී තබා ගන්න හැකි වුණා. ඒ වාගේම, ස්ටාර්ලින්ක් සේවාව දෙසැම්බර් මාසයේ අග දක්වාම මේ ආපදාවට ලක් වූ ප්‍රදේශවල සේවා ග්‍රාහකයන්ට නොමිලේ සේවා ලබා දෙන්න එකඟ වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දැන් ඉන්නේ ව්‍යසන තත්ත්වය ගොඩක් දුරට සමනය කරගෙන, සංවර්ධන සැලැස්මකට යන අවධියක. අපි බලාපොරොත්තු වෙනවා, "Rebuilding Sri Lanka" කියන වැඩසටහන ඔස්සේ කඩිනම් සහ කාර්යක්ෂම ක්‍රියා පටිපාටියකට ගිහින් මේ රට සංවර්ධනය කරන මාවතට පිවිස අපේ රට මේ ව්‍යසනයට මුහුණපාන්න ඉස්සෙල්ලා තිබුණු තත්ත්වයටත් වඩා හොඳ මට්ටමකට ඉතාම ඉක්මනින් ළඟා වෙන්න. ඒ සඳහා ලංකාවේ සිටින සියලු පුරවැසියන්ගේ සහ පිට රටවල සිටින ජනතාවගේ උදවු ඇතුව අපි මේ "Rebuilding Sri Lanka" කියන වැඩසටහන ඉතාම විනිවිදභාවයෙන් සහ කාර්යක්ෂමව කරන්න ඒ සඳහා කමිටුවක් පත් කරගෙන කටයුතු කරමින් යනවා. ඒ කමිටුව තුළින් අපට මේ කටයුත්ත කරන්න පුළුවන්. ඒ වාගේම අපේ රජයේ මැති ඇමතිවරු සියලුදෙනාත්, රාජ්‍ය සේවයත් එකතු වෙලා මේ කාර්යය ඉතාම යුහුසුලුව කරනවා කියා ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.39]

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ் அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கடந்த வாரம் நாட்டில் ஏற்பட்ட அசாதாரண சூழ்நிலை காரணமாக, நாட்டிலுள்ள பெரும்பாலான பிரதேசங்கள் நீரில் மூழ்கியிருக்கின்றது; பல உயிர்கள் காவுகொள்ளப்பட்டிருக்கின்றன. அவ்வாறு மரணமானவர்களை இறைவன் பொருந்திக்கொள்ள வேண்டும் என்று பிரார்த்திப்பதுடன், அவர்களை இழந்து தவிக்கும் குடும்பத்தவருக்கு எமது கட்சியின் சார்பாக ஆழ்ந்த சோகத்தைத் தெரிவித்துக் கொள்கின்றேன்.

குறிப்பாக, கண்டி ரம்புக்-எல என்ற கிராமம் அக்குரணை பிரதேச செயலாளர் பிரிவின் கீழ் 590ஆம் இலக்க கிராம உத்தியோகத்தர் பிரிவில் அமைந்திருந்தது. அங்குள்ள சுமார் 50 குடும்பங்களைச் சேர்ந்தவர்களும் மொத்தமாக நீரில் மூழ்கி

மரணித்துப் போயுள்ளார்கள். இதேபோன்று, நாடளாவிய ரீதியில் நேற்று வரைக்கும் சுமார் 474 பேர் இறந்திருக் கிறார்கள்; 368 பேர் காணாமல் போயிருக்கிறார்கள். பல வீதிகளும் பாலங்களும் சேதமடைந்துள்ளன. பல்லாயிரம் வீடுகள் பாதிக்கப்பட்டுள்ளன. மின்சார தூண்கள், மின் இணைப்புகள் என்பனவும் பெரும் பாதிப்புக்குள்ளாகி இருக்கின்றது. இந்த அனர்த்தம் காரணமாக இன்று வரைக்கும் முழுமையாக மின்சார வசதியைப் பெற முடியாதுள்ளது. சில பிரதேசங்கள் குடிநீரையும் இழந்து நிற்கின்றன. இலட்சக் கணக்கானோர் பாதிக்கப்பட்டுள்ளனர். பல குடும்பங்கள் அநாதரவாகியுள்ளன.

இந்தச் சூழ்நிலையால் பாதிக்கப்பட்ட மக்களுக்கான அத்தியாவசிய உதவிகளை வழங்கிக்கொண்டிருக்கின்ற India, Pakistan, UAE, China, Bangladesh உள்ளிட்ட ஏனைய நாட்டின் தலைவர்களுக்கும், எமது நாட்டின் நிலைமையை கட்டுப்பாட்டுக்குள் கொண்டுவர உதவிக்கொண்டிருக்கின்ற மாண்புமிகு ஜனாதிபதி, கௌரவ பிரதமர் உள்ளிட்ட அமைச்சர்கள், அனைத்துப் பாராளுமன்ற உறுப்பினர்கள், Army, Navy, STF, GA, Police, Chairmen of DSs, MPs, CEB ஊழியர்கள், MOH, Air Force, NGO, INGO போன்றவற்றின் ஊழியர்கள், நிவாரண நடவடிக்கைகளை முன்னெடுத்திருக் கின்ற அகில இலங்கை ஜம்மியதுல் உலமா உட்பட ஒவ்வொரு பிரதேத்தினுடைய தனவந்தர்கள், இளைஞர்கள் மற்றும் சமூக மட்ட அமைப்புகளுக்கும் இந்த வேளையிலே எனது மனமார்ந்த நன்றியைத் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

எனது பிரதேசத்தைப் பொறுத்தவரைக்கும் ஹெட ஓயா, நாவலாறுப் பாலம், கிரிந்து ஓயா, வில்லோயா போன்ற வற்றினூடாக வடிச்சல் நீரானது கடலுக்கு செல்கின்றது. இவ்வாறு செல்லும் நீர் ஆற்றினுள் காணப்படும் மரம், பற்றைகள், பழைய மரங்கள் என்பன காரணமாக விரைவாக வடிய முடியாதுள்ளது. இதனுள் உள்ள வழிப்பாதைக் காடுளைத் துப்புரவு செய்ய முடியாதுள்ளது. Department of Forest, CCD என்று பலரும் தடைவிதிப்பதால் பாதிப்புகள் அதிகமாக உள்ளது. எனவே, விரைவாக மேற்குறித்த ஆற்று வழிகளைத் துப்புரவு செய்து, ஆற்றையும் அணைக் கட்டுகளையும் அகலப்படுத்துவதன்மூலம் இனிவரும் காலங் களில் ஆபத்துக்களைத் தடுக்க முடியும். இவ்வாறு துப்புரவு செய்வதன்மூலம் மயிலனோடை, பூவரசடி காணிகளையும் சிரமமின்றிச் செய்கை பண்ணவும் முடியும்.

அதுபோல, Raddela Tank கட்டாயம் புனரமைப்புச் செய்யப்பட வேண்டும். இவ்வாறு செய்வது எதிர்காலத்துக்குச் சிறந்த ஒரு வேலைத்திட்டமாக மாறும். அதன் அணைக் கட்டுகளையும் திருத்த வேண்டியிருக்கின்றது; வாய்க்கால் களையும் புனரமைக்க வேண்டும். அவ்வாறு புனரமைத்தால் மூங்கில்சேனைக் காணிகளையும் சிறப்பாகச் செய்ய முடியும்.

ஹெட ஓயா ஆற்றுப் படுக்கைகள் உடைப்பெடுத்ததன் காரணமாக நெல் வயல்கள் பாதிக்கப்பட்டுள்ளன. விவசாயிகள் பல்வேறு துன்பங்களை எதிர்கொண்டுள்ளார்கள். இதற்கான நிவாரண நடவடிக்கைகளைத் துரிதப்படுத்த வேண்டும். அணைக்கட்டுகளை ஆற்று மண்கொண்டு அமைப்பதை விடுத்து, பொருத்தமான மண்ணைத் தெரிவுசெய்து அமைப்பதன்மூலம் உடைப்பு ஏற்படுவதைத் தடுக்க முடியும் என்று நான் நம்புகின்றேன்.

பொத்துவில் உட்பட மாவட்டத்தின் பல பிரதேச செயலாளர் பிரிவுகளில் கால்நடை வளர்ப்பாளர்கள் தொழிலின்றிப் பாதிக்கப்பட்டுள்ளார்கள். இவர்களுக்கான நிவாரண நடவடிக்கைகளையும் அரசு மேற்கொள்ள வேண்டுமெனக் கேட்டுக்கொள்ள விரும்புகிறேன்.

குறிப்பாக, நாடளாவிய ரீதியில் இந்த அனர்த்தம் பெரும் பாதிப்பை ஏற்படுத்தியிருந்தாலும், நான் சார்ந்த அம்பாறை மாவட்டம் சற்று இறைவனால் காப்பாற்றப்பட்டதென்றுதான் கூறவேண்டி இருக்கின்றது. அங்கு பாரிய சேதங்கள், இழப்புகள் வீடழிவுகள் இல்லாமல் இருந்தாலும், விவசாயம், கால்நடை, மீன்பிடி என்பனவும் விவசாய அணைக்கட்டுகள் பலவும் பாதிக்கப்பட்டுள்ளதை இந்த வேளையில் குறிப்பிட்டுக்கொள்ள விரும்புகிறேன்.

மேலும், வெள்ளம் காரணமாகப் பாதிக்கப்பட்ட வீடுகளைத் துப்புரவு செய்ய அரசு வழங்கும் 10,000 ரூபாய் தொகையை 25,000 ரூபாய் வரை உயர்த்தியிருப்பதும், உலருணவு, சமைத்த உணவு வழங்கல் கொடுப்பனவு அதிகரிக்கப்பட்டமைக்காகவும் பாதிக்கப்பட்ட மக்கள் சார்பாக அரசுக்கு எனது மனமார்ந்த நன்றியைத் தெரிவித்துக் கொள்கிறேன். அவ்வாறு பாதிக்கப் பட்ட மக்களுக்கு வழங்கும் உலர் உணவுகள் அனைவருக்கும் கிடைக்க அரசாங்கம் நடவடிக்கை எடுக்க வேண்டுமென்று கேட்டுக் கொள்கிறேன்.

இந்த இடர் மீட்பு நடவடிக்கையில் ஈடுபட்ட Captain Pilot, Wing Commander Nirmal உட்பட 5 Navy உறுப்பினர்கள் காணாமற்போயும் மரணித்தும் இருக்கிறார்கள். இவர்களது ஆத்மா சாந்தியடையப் பிரார்த்திப்பதுடன், அவர்களது குடும்பத்தவர்களுக்கும் எனது கட்சி சார்பாகவும் எனது சார்பாகவும் ஆழ்ந்த அனுதாபங்களைத் தெரிவித்துக் கொள்கிறேன்.

மேலும், கடந்த ஆண்டு ஏற்பட்ட வெள்ளம் காரணமாகப் பாதிக்கப்பட்ட மக்களுக்கு அம்பாறை அரச அதிபரின் அனுமதியில் நிவாரணப் பொருள்களை வழங்கிய பொத்துவில், லகுகல, அக்கரைப்பற்று, அட்டாளைச்சேனை ஆகிய பிரதேச செயலாளர் பிரிவுகளில் உள்ள கடைகளின் உரிமையாளர் களுக்கு இன்னமும் கொடுப்பனவு வழங்கப்படவில்லை. பொத்துவில் Rouff Traders, Mayidas, Budget Food City போன்றவற்றுக்கு இக்கொடுப்பனவுகளை வழங்குவதற்கு அரசு விரைவாக நடவடிக்கை எடுக்க வேண்டும். கடந்த வாரம் மாண்புமிகு ஜனாதிபதி அவர்களிடம் நேரிலும் இந்த விடயம் சம்பந்தமாகப் பேசியிருந்தேன்.

கடந்த காலங்களில் வெள்ளம் காரணமாகப் பாதிக்கப்பட்ட P5 சர்வோதயபுரம் பாலமானது நிதி ஒதுக்கப்பட்டும் இன்று வரை நிர்மாணிக்கப்படவில்லை. இதனையும் விரைவாகப் புனரமைக்க அரசாங்கம் நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கிறேன். 2023-2025 வரைக்கும் வெள்ளம் காரணமாகவும் அனர்த்தம் காரணமாகவும் பாதிக்கப்பட்ட கரையோரப் பிரதேசங்களில் எந்தவிதத் திருத்த வேலைகளோ, மீளக் கட்டியெழுப்பும் வேலைகளோ செய்யப்படவில்லை என அறிய முடிகின்றது. இவற்றை அடையாளப்படுத்திச் சரியாக இனங்கண்டு மீளமைக்க அரசாங்கம் நடவடிக்கை எடுக்க வேண்டும்.

பொத்துவிலில் Jamanthurai Bund, Palliyadiyan Road Bund, Sinna Iluckkuchenai Bund போன்றன உடைப்பெடுத்துள்ளன. Ten Gatesஇல் ஒரு பகுதி உடைப்பெடுத்துள்ளது. Amavedduvan Bundஉம் உடைப்பெடுத்துள்ளது. Duwwaya Bridge உடையும் அபாயம் தடுக்கப்பட்டுள்ளபோதும் அதன் ஒரு பகுதி உடைப்பெடுத்துக் காணப்படுகின்றது. கனரக வாகனங்கள் போக முடியவில்லை. உடைப்பைத் தடுக்க நீர்ப்பாசனப் பொறியியலாளர், RDA பொறியியலாளர், பிரதேச செயலாளர், பிரதேச சபையின் தவிசாளர், பொதுமக்கள் போன்றோர் Armyஉடன் இணைந்து உதவி செய்திருக்கின்றார்கள். விரைவான திருத்த வேலைகளைச்

[ගරු එම්.එස්. අබ්දුල් වාසිද් මහතා]

செய்வதற்கு RDA அவசர ஆய்வுகளை மேற்கொண்டு வருவதையும் இந்தச் சந்தர்ப்பத்தில் குறிப்பிட விரும்புகின்றேன்.

நாட்டின் ஏனைய பாகங்களிலுள்ள பாதிக்கப்பட்ட மக்களுக்கு நிவாரண உதவிகளை வழங்குவதற்கு எமது பிரதேச உலமா சபையினர், அனைத்துப் பள்ளிவாசல் சம்மேளத்தினர், பிரதேச சபை, Lanka FM, Semmozhi FM, துயர் துடைப்போம் அமைப்பு, Power Boys' Club, Arugam Bay Half Marathon அமைப்பினர் போன்றவர்கள் பொருட்களைச் சேகரித்து வருகின்றார்கள். அவர்கள் அனைவருக்கும் இந்த உயரிய சபையில் நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன். மாவட்டத்தின் பிரதேச செயலாளர்கள், கௌரவ தவிசாளர்கள், உறுப்பினர்கள் போன்றவர்களும் பொத்துவில் பிரதேச செயலகப் பிரிவில் கிராம உத்தியோகத்தர்களாக இருக்கின்ற ஐ.எல்.சுபைர், நஸ்ருடீன், அன்வர், காமில், ஹாரூன், ரஷாத், ஷானாஸ், முஸ்தாக், ராஜேந்திரன், ரமேஸ், காமிலா, நஜீர், அமீன், ஹாதி, ரவூப், ராபி, றிபான், ரிஸ்வி, ஏ.நுஸ்ரத், தஸ்லீம், றஹீம், முவாஸ், கவீந்திரன் போன்றவர்களுக்கும் இந்த வேளையில் என்னுடைய மனமார்ந்த நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன்.

நாட்டின் 25 மாவட்டங்களும் வெள்ளத்தால் பாதிக்கப் பட்டுள்ளன. குறிப்பாக, கொழும்பு, கண்டி, பதுளை, நுவரெலியா, மாத்தறை, பொலனறுவை, திருகோணமலையில் மூதூர், தோப்பூர் போன்ற பிரதேசங்களும் பாதிக்கப் பட்டுள்ளன என்பதையும் குறிப்பிட விரும்புகின்றேன். நாட்டின் தாழ்வான பிரதேசங்கள் அதிகமாகப் பாதிக்கப் பட்டுள்ளன. ஆயிரக்கணக்கான வீடுகள் நீரில் முழ்கியிருக் கின்றன; உயிரிழப்புகளும் பாரியளவில் ஏற்பட்டிருக்கின்றது. பல கிராமங்களும் முற்றாக நீரில் முழ்கியிருப்பதால், வெளியுலகத் தொடர்புகள் இல்லாமல் இருக்கின்றன. இவ்வேளையில், நாம் உடனடியாகச் செய்யவேண்டியவை தெளிவாக இருக்கின்றது: (1) சிக்கியுள்ள மக்களை மண்ணில் இருந்து மீட்டல்; (2) உணவு, குடிநீர், மருந்து, தற்காலிக தங்குமிடங்களை வழங்குதல்; (3) சேதமான பாதைகள், பாலம், மின்சாரம் போன்ற அடிப்படை வசதிகளை ஏற்படுத்துதல்; (4) நீண்ட கால மறுசீரமைப்பு, புதுப்பித்தல் திட்டங்களை உருவாக்கிச் செயற்படுத்துதல். இந்தப் பேரழிவு என்பது ஓர் அரசியல் பிரச்சினையல்ல, ஒரு மனிதாபிமானப் பிரச்சினை மட்டுமே!

இந்த வேளையில், நாம் அனைவரும் அரசியலை ஒதுக்கிவிட்டு ஒன்றுபட்டுச் செயல்பட முன்வர வேண்டும். அவசர நிதி ஒதுக்கீட்டை உடன் பெற முயற்சிக்க வேண்டும். நிவாரணம் மற்றும் மதிப்பீட்டு, மீட்பு நடவடிக்கைகளில் அனைத்து அமைச்சுகளையும் இணைத்துச் செயற்பட உத்தரவிட வேண்டும். மறுகட்டமைப்புப் பணிகளைக் கண்காணிக்கப் பாராளுமன்றக் குழுவை அமைக்க வேண்டும். சர்வதேச மனிதாபிமான அமைப்புகளுடன் இணைந்து கூடுதல் உதவிகளைப் பெற வேண்டும். நாட்டை மீட்டெடுக்க 3 பில்லியன் அமெரிக்க டொலர் தேவையாக உள்ளது. இதனைப் பெறுவதற்கு எடுக்கும் முயற்சியில் உங்களோடு நாமும் இணைந்து செயற்படுவோம்.

கிழக்கு மாகாணத்தில் உள்ள ஒரேயொரு வானிலை அவதான நிலையம் பொத்துவிலில் மட்டுமே இருக்கின்றது. நவீன தொழில்நுட்ப வசதிகளைப் பயன்படுத்தி பூரணமான சேவையை வழங்கும் பொருட்டு இதற்கு Doppler Radar வசதிகளைச் செய்து கொடுக்க வேண்டுமென இந்தச் சபையைக் கேட்டுக் கொள்கின்றேன். அதேபோன்று, புத்தளத்திலும் இவ்வாறான வசதிகளை ஏற்படுத்துவதன்மூலம், வானிலை அவதான நிலையத்திலிருந்து சரியான தகவலைப் பெற்றுக்கொள்ள முடியுமென நாங்கள் நம்புகின்றோம்.

கிழக்கு மாகாணம் உட்பட நாட்டின் கரையோரப் பிரதேசங்களில் உள்ள மீனவர்களின் நிலைமை மிகவும் மோசமாக இருக்கின்றது. அரசு இவர்களுக்கான நஷ்ட ஈட்டு விடயத்தில் கவனம் செலுத்த வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். எனது மாவட்டத்தில் மருதமுனை தொடக்கம் பொத்துவில், பாணமை வரையுள்ள மீனவர்களின் தொழிலும் மிகவும் மோசமாகப் பாதிக்கப்பட்டுள்ளது. ஆதலால், அரசானது மீனவர்கள் விடயத்தில் கவனம் செலுத்தி, அவர்களின் வாழ்வாதாரத்துக்கு உதவ வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். மேலும், கடந்த காலங்களில் பொத்துவில் பிரதேசத்தில் சூறாவளியினால் பாதிக்கப்பட்டு தங்களது boatகளை இழந்துள்ள 14 மீனவர்களுக்கும் இன்றுவரை நஷ்ட ஈடு வழங்கப்படவில்லை என்பதை மிகவும் சோகமான செய்தியாக இந்த வேளையில் நான் கூறிக்கொள்ள விரும்புகின்றேன். ஆகவே, இந்தச் சபையானது அவர்களுக் குரிய நஷ்ட ஈட்டை வழங்குவதற்கான ஏற்பாட்டையும் செய்ய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். இறுதியாக, நாம் அனைவரும் ஒன்றிணைந்து எமது நாட்டை இந்தப் பேரழிவில் இருந்து மீட்டெடுத்து, ஒரு பாதுகாப்பான எதிர்காலத்தை ஏற்படுத்துவோம் என்று கூறி, முடிக்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.47]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய நிலையில் நாங்கள் இந்த நாளுக்குரிய விவாதப்பொருளுக்கு அப்பால் கடந்த வாரத்தில் ஏற்பட்ட பேரிடர் அல்லது பேரனர்த்ததைப் பற்றி சிந்திக்கின்றோம். உண்மையில் இந்த அனர்த்தம் காரணமாக எங்களது மக்களின் 465 உயிர்கள் காவுகொள்ளப்பட்டிருக்கின்றன; 368 பேரைக் காணவில்லையெனத் தேடிக்கொண்டிருக்கின்றார்கள். அதை விடவும், 20 இலட்சத்துக்கும் அதிகமான மக்கள் வீடுகளை இழந்திருக்கின்றார்கள். சிறார்களைப் பொறுத்தமட்டில் 175,000 பேர் பாதிக்கப்பட்டிருக்கின்றார்கள்.

மட்டக்களப்பைப் பொறுத்தமட்டில் 12,446 குடும்பங்கள் வெள்ளத்தால் பாதிக்கப்பட்டிருக்கின்றன; கிழக்கு மாகாணத்தைப் பொறுத்தமட்டிலும் 41,000க்கும் மேற்பட்ட குடும்பங்கள் பாதிக்கப்பட்டிருக்கின்றன. அதேவேளை, மட்டக்களப்பில் 547 வீதிகள் பாதிக்கப்பட்டுள்ளன; 24 பாலங்கள் உடைப்பெடுத்திருக்கின்றன. இந்த விடயங்களை நாங்கள் கவனத்தில் கொள்ளவேண்டிய அதேவேளை, இந்தப் பேரிடர் காரணமாக மரணமடைந்த எமது உறவுகளின் ஆத்மா இறையடி சேரவேண்டுமென்று இந்த இடத்தில் வேண்டுவதோடு, அவர்களுக்கு எனது அஞ்சலியையும் செலுத்திக் கொள்கின்றேன். அதுபோல, காணாமற்போன மக்கள் இன்னும் மீண்டு வராத நிலை இருக்கின்றது.

அவர்களுக்கும் இறையாசி கிடைக்க வேண்டுமென்றும், முடிந்தவரை அவர்கள் தப்பி வீடு வந்து சேரவேண்டுமென்றும் நாங்கள் பிரார்த்தித்துக் கொள்கின்றோம்.

இந்தப் பேரிடர் மீட்புப் பணியில் தம்மை அர்ப்பணித்துச் செயற்படுகின்ற அனைவருக்கும் இந்த நேரத்தில் நாங்கள் நன்றியுள்ளவர்களாக இருக்க வேண்டும். அது அரச தரப்பினராக இருக்கலாம், மாண்புமிகு சனாதிபதியாக இருக்கலாம், கௌரவ அமைச்சர்களாக இருக்கலாம், கௌரவ பாராளுமன்ற உறுப்பினர்களாக இருக்கலாம் அல்லது எங்களுக்கு உதவிகளைத் தருகின்ற வெளிநாடுகளாக இருக்கலாம்! இந்தியா உட்படப் பல நாடுகள் உதவிகளைச் செய்துகொண்டிருக்கின்றன. உள்நாட்டிலும்கூட தனிப்பட்ட முறையில் பரோபகாரிகள் பலரும் உதவிகளை வழங்கிக் கொண்டு இருக்கின்றார்கள். இவர்களுக்கெல்லாம் நாங்கள் நன்றியுள்ளவர்களாக இருக்க வேண்டும்.

உண்மையில், இந்த அனர்த்தம் காரணமாகப் பலர் மடிந்திருக்கின்றார்கள். நாங்கள் சூறாவளியைக் கண்டிருக் கின்றோம், சுனாமியைக் கண்டிருக்கின்றோம், மண் சரிவைக் கண்டிருக்கின்றோம், வெள்ளப் பெருக்கைக் கண்டிருக் கின்றோம். இவ்வாறு பல வழிகளில் எமது நாடு அனர்த் தத்தைச் சந்தித்திருக்கின்றது. இதுபோன்ற அனர்த்தங்களின் போது நாங்கள் முன்திட்டமிடலோடு செயற்பட வேண்டிய அவசியம் இருக்கின்றது. உண்மையில் மலையகத்தைப் பொறுத்தமட்டில், அங்கு வாழுகின்ற மக்கள் மரண பூமியில் இருப்பது போன்று வாழ்ந்து கொண்டிருக்கின்றார்கள். இது முதற்தடவை அல்ல, பல தடவை அங்கு மண் சரிவுகள் ஏற்பட்டிருக்கின்றன. மக்கள் பலர் காணாமல் போயிருக் கின்றார்கள் அல்லது இறந்திருக்கின்றார்கள். அந்த மக்களைப் பொறுத்தமட்டில், அவர்களுக்கு உண்மையில் நிரந்தரமான ஒரு பாதுகாப்பு வேண்டும். மண் சரிவு என்பது இந்த அரசாங்கத்தின் காலத்தில் மட்டும் ஏற்படவில்லை, கடந்த காலத்திலும் ஏற்பட்டிருக்கின்றது. ஆகவே, மண்சரிவு அபாயமுள்ள இடங்களில் வாழும் மக்கள் நிரந்தரமாகப் பாதுகாப்புடன் வாழக்கூடிய இடங்களில் குடியேற்றப்பட வேண்டும். அவர்கள் பயந்துகொண்டு வாழ்வதென்பது ஒவ்வொரு நாளும் செத்துமடிவது போன்ற ஒரு நிலைமையாக இருக்கும். அதனையும் கவனத்தில் கொள்ளவேண்டும்.

உண்மையில் மாண்புமிகு சனாதிபதி அவர்கள் இந்தச் சந்தர்ப்பத்தில் கடுமையாக உழைத்துக் கொண்டிருக்கின்றார். அவருடைய கண்களைப் பார்க்கின்றபோது, அவர் உறக்கமில்லாமல் உழைத்துக் கொண்டிருக்கின்றார் என்பது தெரிகின்றது. அதுபோல், நாங்களும் இதனை ஓர் அரசியல் சார்ந்த விடயமாகப் பார்க்காமல், எங்களுடைய நாட்டு மக்கள் பாதிக்கப்பட்டிருக்கின்றார்கள், அவர்களுக்கு இயன்றவரை உதவி செய்ய வேண்டும் என்ற எண்ணத்துடன் செயற்படும் சந்தர்ப்பத்தை உருவாக்கிக்கொள்ள வேண்டும். அதுமட்டு மல்லாமல், இதற்காக உழைத்துக் கொண்டிருக்கின்றவர்களைப் படுமோசமாக விமர்சனம் செய்வதென்பது மனிதாபிமானத் துக்கு அப்பாற்பட்ட ஒரு செயலாக இருக்கும் என்பதையும் உணர்ந்துகொள்ள வேண்டும்.

அடுத்து, மட்டக்களப்பைப் பற்றி சில விடயங்களைச் சொல்ல வேண்டும். மட்டக்களப்புப் படுவான்கரைப் பிரதேசத்தில் இப்போது யானைகளின் நடமாட்டம் அதிகமாகக் காணப்படுகின்றது. அதேவேளை, அங்கே மின்சாரம் தடைப்பட்டிருக்கின்றது. மின்சாரம் தடைப்பட்டிருக்கின்ற படியால் அந்த இருள் வேளையில் யானைகளின் தாக்கம் மேலும் அதிகரிக்கக்கூடிய வாய்ப்பு இருக்கின்றது. அந்த வகையில், இப்போது பாவற்கொடிச்சேனை, பன்சேனை, கொத்தியாபுலை, கன்னங்குடா, புல்லுமலை, தாந்தாமலை, பட்டிப்பளை Division, வாகரை Division, போரதீவுப்பற்று, ஏறாவூர்ப்பற்று போன்ற பகுதிகளில் யானைகளின் நடமாட்டம் அதிகரித்திருப்பதாகச் சொல்லுகின்றார்கள். ஆகவே, அந்தப் பகுதிகளுக்கு மின்சாரத்தை மிக விரைவாகக் கொடுக்க வேண்டும். ஏனென்றால், வெள்ளத்தால் பாதிக்கப்பட்ட அவர்கள், யானையாலும் தாக்கப்படக்கூடிய நிலைமை இருக்கின்றபடியால், அதனை உடனடியாகச் செய்ய வேண்டுமென்று இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

அத்துடன், தற்போது மீனவர்கள் பாதிக்கப்பட்டிருக் கின்றார்கள்; விவசாயிகள் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். அதேபோல, முச்சக்கரவண்டிச் சாரதிகளும்கூட இந்த வெள்ளத்தால் அதிகமாகப் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். எனவே, பாதிக்கப்பட்ட இந்த மக்களுக்குரிய நிவாரணம் உரிய காலத்தில் கிடைக்க வேண்டும். நான் மட்டக்களப்பு மாவட்ட அரசாங்க அதிபர் ஜே.எஸ். அருள்ராஜ் அவர்களைத் தொடர்புகொண்டு இதுபற்றி பேசியபோது, "அநேகமாக நிவாரணத்துக்குரிய நிதி வந்துவிட்டது, நீங்கள் பாதிக்கப் பட்டவர்களுடைய விபரங்களை வழங்கினால் மிக விரைவாக நிவாரணத்தைக் கொடுப்பதற்கு நாங்கள் தயாராக இருக்கின்றோம்" என்று அவர் சொன்னார். அதேபோன்றுதான் பிரதேச செயலாளர்களும் தங்களுக்குரிய நிதியும் கிடைத்துவிட்டது என்ற செய்தியைச் சொன்னார்கள். ஆகவே, அனர்த்தத்தால் பாதிக்கப்பட்ட மக்களுக்குரிய நிவாரணங்களை வழங்குவதற்காக நீங்கள் துரிதமாகச் செயற்படுவதையிட்டு நாங்கள் உண்மையில் பாராட்டுகின்றோம். மண் சரிவினால் ஏற்பட்ட மரணங்களை நாங்கள் உண்மையில் இயற்கையின் சீற்றத்தால் ஏற்பட்ட மரணங்களாகவே கருதுகின்றோம் என்ற விடயத்தையும் நான் சொல்லிக் கொள்கின்றேன்.

வேற்றுச்சேனை, பிரம்படித்தீவு போன்ற இடங்களில் வெள்ளம் ஏற்படுகின்றபோது, அந்தக் கிராமங்கள் முழுமையாக நீரில் அமிழ்ந்து கிடக்கின்றது. எனவே, அந்த இடங்களில் இருக்கின்றவர்கள் வெள்ளத்தினால் பாதிக்கப்படாமல் பாதுகாப்பாக இருப்பதற்காக அங்கு மாடிக் கட்டிடங்களை அமைத்துக் கொடுக்கவேண்டிய தேவை இருக்கின்றது. நாங்கள் அபிவிருத்திக் குழுக் கூட்டத்திலும்கூட இந்த விடயத்தைச் சிபாரிசு செய்திருந்தோம். வேற்றுச்சேனை என்பது முழுக்க முழுக்க ஒரு தாழ்நிலப் பகுதி. ஏழை விவசாயிகள் வாழுகின்ற அந்த இடத்தில் ஓர் இரண்டு மாடிக் கட்டிடம் இல்லாமல் இருக்கிறது. எனவே, அங்கு ஓர் இரண்டு மாடிக் கட்டிடம் அமைக்கப்பட வேண்டும். அதேபோன்று, பிரம்படித் தீவு - அதுவும் அக்கரையில் இருக்கின்ற ஒரு பகுதி - என்ற கிராம மக்கள் அவ்வளவு பேரும் வெள்ளம் ஏற்படுகின்றபோது அக்கரைப்பற்றுப் பிரதேசத்திற்கு வந்து வேறோர் இடத்தில் குடியேற வேண்டிய நிலைமை இருக்கின்றபடியால், அந்த இடத்திலும் ஓர் இரண்டு மாடிக் கட்டிடம் அமைக்க வேண்டிய தேவை இருக்கின்றது.

அதேபோன்றுதான், பாதிக்கப்பட்டிருக்கின்ற எங்களுடைய விவசாயிகள், மீனவர்கள் மற்றும் அன்றாடக் கூலித் தொழிலாளர்கள் முதலானவர்கள் தங்களுடைய தொழிலை இழந்து தவிக்கின்றார்கள். அவர்களுக்குரிய நிவாரணங்களை மிக விரைவாக வழங்க வேண்டும். இந்த விடயத்தில் ஊழல், மோசடிகள் இல்லாமல் நேர்த்தியாக நீங்கள் செய்வீர்கள் என்று நாங்கள் நினைக்கின்றோம். உண்மையில் கடந்தகால யுத்தத்தினால் கரடியனாறு பண்ணை, அதேபோன்று சத்துருக் கொண்டான் பண்ணை என்பன பாதிக்கப்பட்டன. இவற்றை

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

மீளக் கட்டியெழுப்புகின்றபோது அநேகமானவர்களுக்குத் தொழில் வாய்ப்புகளைக் கொடுக்கக்கூடிதாக இருக்கும். உண்மையில் வடக்கு, கிழக்கு மாகாணங்களில் தொழிற்சாலைகள் மிகக் குறைவாகக் காணப்படுகின்றன; கிட்டத்தட்ட 96% தொழிற்சாலைகள் வடக்கு, கிழக்குக்கு அப்பால் காணப்படுகின்றன. ஆகவே, இந்த இடங்களுக்குத் தொழிற்சாலைகள் மிக அவசியமானது. வடக்கு, கிழக்குத் தவிர்ந்த ஏனைய இடங்களில் 96% தொழிற்சாலைகள் இருக்கின்றன. அதிலும், அம்பாறை மாவட்டத்தில் ஓரளவுக்குத் தொழிற்சாலைகள் இருந்தாலும் ஏனைய மாவட்டங்களில் தொழிற்சாலைகள் மிகக்குறைவாகக் காணப்படுகின்றன. எனவே, அங்கு தொழிற்சாலைகள் கட்டியெழுப்பப்பட வேண்டும்.

அதேபோன்று மட்டக்களப்பைப் பொறுத்தமட்டில், படுவான்கரை, எழுவான்கரை என்ற வேறுபாட்டுடன் காணப் படுகின்ற நிலத்திற்கிடையே பாலம் இல்லாத காரணத்தினால், தோணிகளில், படகுகளில் பயணிக்கின்ற மக்கள் அநேகமாக உயிர் ஆபத்தைச் சந்திக்கின்ற பெரியதொரு பிரச்சினை இருக்கின்றது. இந்த வெள்ளப் பெருக்கின்போதும் அந்த நிலைமை காணப்பட்டது. எனவே, அங்கு பாலம் அமைக்க வேண்டிய தேவையிருக்கின்றது.

இதைவிட, நான் சொல்லக்கூடிய முக்கியமான விடயம் என்னவென்றால், மட்டக்களப்பில் ஏற்படுகின்ற வெள்ளப் பெருக்கிலிருந்து தப்பிப்பதாக இருந்தால், முந்தனையாற்று அபிவிருத்தித் திட்டத்தைச் செயற்படுத்தி உறுகாமம், கித்துள் குளங்களை இணைக்கின்றபோது, வெள்ள நீரைத் தடுப்பதற்கும் பயிர்ச் செய்கையை விருத்தி செய்வதற்கும் வாய்ப்பு இருக்கின்றது. இதைவிட, கண்டியனாறு குளம் மற்றும் அடைச்சகல் குளம் போன்ற குளங்களைப் பெருப்பித்து, அணைக்கட்டுகளை உயர்த்துவதன்மூலமாக வெள்ளப் பெருக்கிலிருந்து மக்களைப் பாதுகாத்துக் கொள்ளக்கூடிய வழி ஏற்படும். எனவே, அந்தச் செயற்பாடுகளையும் முன்னெடுக்க வேண்டும் என்ற விடயத்தை உங்களுக்குச் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

குறிப்பாக மீண்டும் சொல்கின்றேன், மலையக மக்கள் மரண பூமியில் வாழ்ந்து கொண்டிருக்கின்றார்கள். ஒவ்வொரு வருடமும் மழை வெள்ளம் ஏற்படுகின்றபோது, மண்சரிவு ஏற்பட்டு அவர்களுடைய உயிர்கள் காவுகொள்ளப்படுகின்றன. உண்மையில் அந்த மக்களைப் பொறுத்தமட்டில், அவர்கள் குனிந்து குனிந்து கொழுந்தெடுத்து நாடு நிமிர்ந்து நிற்பதற்காகப் பாடுபடுகின்றார்கள். ஆனால், ஊழல்வாதிகள் அவர்களுக்கான உரிமைகளைத் தடுத்து வருகின்றார்கள். அந்த மக்களுக்கு நிரந்தரமான, பாதுகாப்பான இடத்தை வழங்கக்கூடிய விதத்தில் இந்த அரசாங்கம் தக்க முடிவுகளை எடுக்க வேண்டும்.

இறுதியாக ஒரு விடயத்தைக் கூற விரும்புகின்றேன். வாய்க்குள் இருக்கும்வரைதான் வார்த்தைகள் எங்களுக்குச் சொந்தமானது, வார்த்தைகளை வெளியில் கொட்டிவிட்டால், வார்த்தைகளின் சொந்தக்காரர்களாக நாங்கள் மாறுகின்றோம். ஆகவே, இந்த உயரிய சபையில் தேவையற்ற கருத்துகள் அல்லது அநாகரிகமான சொற்களைப் பேசுவதைத் தவிர்த்து, இந்த உயரிய சபையை, உயரிய சபையாகக் கொண்டு செல்வதற்கு உதவ வேண்டுமென்றும், சகலரும் பொறுப்புடன் செயற்பட வேண்டுமென்றும் கேட்டுக் கொள்கின்றேன். இன்று நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சுத் தொடர்பாக விவாதிக்கின்றோம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)

தயவுசெய்து யுத்தத்தால் பாதிக்கப்பட்ட வடக்கு, கிழக்கு மாகாணங்களில் ஊழல் மோசடிகள் அற்ற நிலையான அபிவிருத்திகளைச் செய்வதற்கு இந்த அமைச்சு உதவ வேண்டுமென்று கேட்டு, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. LAKSHMAN NIPUNA ARACHCHI left the Chair, and THE HON. DEPUTY SPEAKER took the Chair.*

[අ.භා. 5.57]

**ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஹால் அபேசிங்ஹ)
(The Hon. (Dr.) Nihal Abeysinghe)

ගරු සභාපතිතුමනි, මෑත ඉතිහාසයේ සිද්ධ වූ බරපතළම ඛේදවාචකයට අපේ රට මුහුණ දී තිබෙනවා. මට මතකයි, 2004 සුනාමියට අපේ රට මුහුණ දුන් අවස්ථාව. ඒ අවස්ථාවේත් මේ වාගේම බරපතළ අභියෝගයකට මුහුණ දෙන්න අපට සිදු වුණා. නමුත්, ඒ අවස්ථාවේ ඒ ඛේදවාචකය සීමා වුණේ, මේ රටේ මුහුදුකරයට පමණයි. ඒ නිසා රජයට, රටේ අනිකුත් ප්‍රදේශවල රාජ්‍ය නිලධාරින්ට, මහ ජනතාවට හැකි වුණා, ඒ ආපදාවට ක්ෂණිකව මුහුණ දීලා ඒ ආපදාවෙන් මේ රටට වෙන්න තිබ්බ බරපතළ විපත් වළක්වා ගන්න. මේ ඛේදවාචකයේදීත් අපේ රජය, ඒ වාගේම රාජ්‍ය නිලධාරින්, මහ ජනතාව ඉතාම යුහුසුලුව, ආපදාවට ලක් වූ ජනතාවට අවශ්‍ය ආරක්ෂාව සපයන්න මැදිහත් වුණා. මේ ඛේදවාචකයෙන් ජීවිත විශාල ප්‍රමාණයක් අපට අහිමි වුණා; බරපතළ ආකාරයට දේපළ විනාශ වුණා. මා පෞද්ගලිකවම මේ වෙලාව පාවිච්චි කරනවා, අපට අහිමි වෙච්ච ජීවිත පිළිබඳව අපේ කනගාටුව ප්‍රකාශ කරන්න; ඒ පවුල්වල අයට අපේ කනගාටුව ප්‍රකාශ කරන්න.

මේ ආපදාවට ගොදුරු වූ අය අතර මේ වනකොට අතුරුදහන් වෙච්ච සැහෙන්න පිරිසක් ඉන්නවා. මේ මරණ සංඛ්‍යාව මීටත් වඩා ඉහළ යාවි කියලා අපි දන්නවා. නමුත්, මේක තමයි අපට මුහුණ දෙන්න තිබෙන තත්ත්වය. අපේ රටේ රාජ්‍ය නිලධාරින්, ආපදා කළමනාකරණ සේවාවලට සම්බන්ධ රාජ්‍ය නිලධාරින් ඉතාම යුහුසුලුව මේ ඛේදවාචකයට මුහුණ දෙමින් කටයුතු කළා. අපේ ගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුව දැනුවත් කරලා පක්ෂ,

විපක්ෂ සියලුදෙනා එක්කම මේ පිළිබඳව සාකච්ඡා කළා. එදිනම - 27වැනි දා- සවස අපි දිස්ත්‍රික්කවල ආපදා කළමනාකරණ කණ්ඩායම් රැස් කරලා දිසාපතිතුමන්ලා එක්ක, ආපදා කළමනාකරණයට සම්බන්ධ නිලධාරීන් එක්ක සාකච්ඡා කළා. ඊට පහුවැනි දා -28වැනි දා- අපි සියලු ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ආපදා කළමනාකරණ නිලධාරීන් සම්බන්ධ කරගෙන ඒ අයත් එක්ක සාකච්ඡා කරලා ආපදාවට ලක් වූ අයගේ ජීවිත ආරක්ෂා කර ගන්නත්, ඔවුන් තවදුරටත් ආපදාවට ලක් වීම වළක්වා ගන්නත් කටයුතු කළා. ඒ වාගේම අපි NBRO එකේ නිලධාරීන් කැඳවා බොහෝ අනාරක්ෂිත ස්ථාන, විශාල වශයෙන් නාය යෑමට ගොදුරු විය හැකි ස්ථාන හඳුනා ගෙන ඒවායේ සිටින අය සුරක්ෂිත ස්ථානවලට කැඳෙව්වා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාර්ය මණ්ඩල, ප්‍රාදේශීය ලේකම්වරු, ග්‍රාම නිලධාරිවරු සහ ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වෙච්ච අපේ ජනතාව මැදිහත් වෙලා විශාල කාර්යභාරයක් මේ වන විටත් කරමින් ඉන්නවා.

මේ වන කොටත් ආපදාවට ලක් වූ ජනතාව සුරක්ෂිත මධ්‍යස්ථානවල රැඳිලා ඉන්නවා; සෞඛ්‍ය සේවයේ නිලධාරීන් ඉතාම යුහුසුලුව ඒ අයට අවශ්‍ය කරන සෞඛ්‍ය සේවා සපයමින් ඉන්නවා. ඒ නිසා අපට විශ්වාසයි, මෙවර මේ අභියෝගයට මුහුණ දීලා අපට මේ අභියෝගය ජය ගන්න පුළුවන් බව. මේ වනකොට මේ රටේ ජනතාව ආපදාවට ලක් වෙලා විශාල පිරිසක් සුරක්ෂිත මධ්‍යස්ථානවල රැඳිලා ඉන්නවා. ඒ ජනතාව සෞඛ්‍ය ප්‍රශ්නයක් නොමැතිව බේරා ගන්න අපට පුළුවන් වෙයි කියලා අපි හිතනවා. මේ වනකොට අපි කළුතර දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරුන් අමතලා, ඒගොල්ලන්ට උපදෙස් දීලා තිබෙනවා, කොහොමද මේ වෙලාවේ තොරතුරු එකතු කරන්නේ කියලා. ඒ වාගේම රෝහල්වලට කථා කරලා අපි ඒ රෝහල්වලට දැනුම් දීලා තිබෙනවා, රෝගීන් පිළිබඳව විමසිලිමත් වන්නේ කොහොමද, ඒ අයට අවශ්‍ය කරන පහසුකම් සපයන්නේ කොහොමද කියලා.

මේ නාය යාම්වලට බරපතළ ලෙස ගොදුරු වෙච්ච ප්‍රදේශවල, ගංවතුරට බරපතළ ලෙස ගොදුරු වෙච්ච ප්‍රදේශවල මීළඟට අපට මුහුණ දෙන්න සිදු වන අභියෝගය තමයි බෝ වන රෝග පැතිරීම. ඒ වාගේම මේ සුරක්ෂිත කඳවුරුවල ඉන්න අපේ සහෝදර ජනතාවගෙන් බොහෝ දෙනෙක් බෝ නොවන රෝගවලින් පෙළෙනවා. ඒ නිසා ඒ ප්‍රදේශවල ජීවත් වන අයට අවශ්‍ය කරන පහසුකම් සැපයීම සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරුන්ට සහ ඒ කාර්ය මණ්ඩලවලට, ඒ වාගේම ඒ ප්‍රාදේශීය රෝහල්වලට විශාල කාර්යභාරයක් පැවරී තිබෙනවා. මොකද, මේ සුරක්ෂිත මධ්‍යස්ථානවලට නිතර ගිහිල්ලා, ඒ අයගේ බෝ නොවන රෝග තත්ත්වයන් පිළිබඳ සොයා බලලා ඒ අයට අවශ්‍ය ප්‍රතිකාර ලබා දීමට කටයුතු කිරීම අවශ්‍යයි. ඒ වාගේම වසංගත රෝග විද්‍යා අංශය ප්‍රමුඛ මේ රටේ මහජන සෞඛ්‍ය සේවාවටත් විශාල කාර්යභාරයක් පැවරී තිබෙනවා, මේ වෙලාවේ මේ රටේ වසංගත රෝග පැතිරීම වළක්වා ගන්නට. මේ වනකොට සෞඛ්‍ය අමාත්‍යාංශයේ අපගේ සියලු නිලධාරීන් ඒ සඳහා මැදිහත් වෙමින් ඉන්නවා.

අපේ රට මේ වාගේ බරපතළ ව්‍යසනයකට ගොදුරු වෙලා තිබෙන අවස්ථාවක ඊට මුහුණ දීම ඇත්තටම අපට ලොකු අභියෝගයක්. නමුත් අපි හිතනවා, මේ අභියෝගය ජය ගන්න තරම් හැකියාවක් අපේ ආණ්ඩුවට, අපේ රජයට තිබෙනවා කියලා. මොකද, රාජ්‍ය නිලධාරීන්ගේ එකමුතුව සහ ඒ අයත් එක්ක සහයෝගයෙන් කටයුතු කරමින් අපට මේ අභියෝගයට මුහුණ දෙන්න අපට පුළුවන්.

ඒ වාගේම අපි දන්නවා, අපේ රට වාගේම ආසන්නයේ තිබෙන අනෙකුත් රටවලටත් මේ සුළි සුළං සහ ගංවතුර තත්ත්වය බලපා තිබෙන බව; වැසි සහිත තත්ත්වය බලපා තිබෙන බව. ඒ රටවලුත් මේ වනකොට යම් යම් ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා.

ගරු සභාපතිතුමනි, අපේ කළුතර දිස්ත්‍රික්කය මෙවර ගංවතුරට, එහෙම නැත්නම් නාය යෑම්වලට ඉතාම සුළු වශයෙන් තමයි මුහුණ දුන්නේ. ඒ නිසාම අපි තීරණය කළා, අපේ දිස්ත්‍රික්කයේ ජනතාව සමඟ මැදිහත් වෙලා සුරක්ෂිත මධ්‍යස්ථානවල ජීවත් වන ජනතාවට අවශ්‍ය කරන පහසුකම් සපයන්නට; අනෙකුත් දිස්ත්‍රික්කවල මේ ආපදාව නිසා ඇති වෙච්ච ගැටලු විසඳන්නට අපේ සහයෝගය ලබා දෙන්නට. ඒ අනුව අපි මීට දවස් දෙකතුනකට පෙර කළුතර දිස්ත්‍රික්කයෙන් කණ්ඩායම් 7ක් නුවරඑළිය දිස්ත්‍රික්කයට පිටත් කළා. ඒ හැම කණ්ඩායමකටම ආසන්න වශයෙන් 30ක පිරිසක් අයත් වුණා. මේ වනකොටත් ඒ කණ්ඩායම් නුවරඑළිය දිස්ත්‍රික්කයේ සුරක්ෂිත ස්ථානවල ජීවත් වන ඒ ජනතාවට අවශ්‍ය කරන වියළි ආහාර ද්‍රව්‍ය සහ ඖෂධ සපයමින්, ඒ වාගේම ඒ ප්‍රදේශවල පාරවල් එළිපෙහෙළි කරමින්, ඒ වාගේම ආපදාවට පත් වෙලා හිර වෙලා ඉන්න අය මුදා ගනිමින් ඉන්නවා. අපි ඊළඟ කණ්ඩායමත් දැන් සූදානම් කරමින් ඉන්නවා, ඉදිරි දිනක ඒ ඉතිරි කටයුතු කිරීම සඳහා ඒ ප්‍රදේශවලට යවන්න. ඉතින් රජයත්, මේ රටේ සියලු දෙනාත් දැන් විශාල අභියෝගයකට මුහුණ දෙමින් සිටිනවා. මේ වාගේ වෙලාවක අප හැමදෙනාගේම යුතුකම තමයි මෙයට සාමූහිකව මුහුණ දෙන එක. නමුත් සමහර විට අපි සමාජ මාධ්‍ය ඔස්සේ, ඒ වාගේම සමහර රූපවාහිනී නාළිකා ඔස්සේ දකිනවා, වෙනත් අදහස් පතුරවමින්, විවිධ බොරු තොරතුරු ප්‍රචාරය කරමින්, මේ ආපදාවට මුහුණ දීලා ඉන්න ජනතාව කලඹන ස්වභාවයට පත් කරන ආකාරයක්. ඉතින් ඇත්තටම කනගාටුදායකයි, ඒ තත්ත්වය.

මට මතකයි, සුනාමි ඛේදවාචකයේදී මේ රටේ සියලුදෙනා එකට එකතුවෙලා සුනාමියට ගොදුරු වෙච්ච ඒ ජනතාව වෙනුවෙන් මහන්සි වුණු ආකාරය. නමුත් මේ අවස්ථාවේදී විවිධ අය, විවිධ මත පතුරමින් වෙනස් ක්‍රමයකට හැසිරෙන්න උත්සාහ කරනවා. නමුත් අපි විශ්වාස කරනවා, මේ රටේ ජනතාව ඒක තේරුම් අරගෙනයි ඉන්නේ කියලා. සාමාන්‍ය ජනතාවට ඒ අය කියන දේවල් පිළිබඳව කිසිම උනන්දුවක් නැහැ. ඒ නිසා අපට ඒ ජනතාවගේ සහයෝගය විශාල වශයෙන් ලැබෙනවා. මේ වනකොට සැහෙන පිරිසක් ඉදිරිපත් වෙමින් ඉන්නවා, දුෂ්කරතාවට පත්ව තිබෙන දිස්ත්‍රික්කවල සිටින ජනතාවට අවශ්‍ය සේවා සපයන්න. මේ වෙලාවේ අපට විශාල වශයෙන් අවශ්‍ය වන්නේ ජනතාව ඉතාම සාමකාමීව, සාමූහිකව මේ අභියෝගයට මුහුණ දෙන එකයි. ඒ නිසාම තමයි අපි විශ්වාස කරන්නේ, අපට තිබෙන මේ අභියෝගය වඩා සාර්ථකව කළමනාකරණය කරගෙන මේ රට ගොඩනඟන්න අපට පුළුවන් කියලා. ඇත්තටම මේ අභියෝගය ප්‍රයෝජනයට ගනිමින් මේ රට නැවත ගොඩනඟන්නට ලැබී තිබෙන මේ අවස්ථාව අපි කළමනාකරණය කරගත යුතුයි. අපේ ආණ්ඩුව බලයට පත්වෙලා අවුරුද්දකට පස්සේ 2026 වර්ෂය සඳහා අය වැය ඉදිරිපත් කර, ඒ අය වැය තුළ මේ රටේ නොයෙකුත් ප්‍රශ්නවලට මුහුණ දෙන ආකාරය සාකච්ඡා කරමින් ඉන්න වෙලාවක තමයි අපට මේ අභියෝගයට මුහුණ දෙන්න සිද්ධ වුණේ. ඒ නිසාම තමයි අපට මේ අභියෝගය සාමූහිකව ජය ගැනීම වඩාත් වැදගත් වන්නේ. මොකද, මේ ලැබුණු අවස්ථාවෙන් අපි ප්‍රයෝජන ගන්න ඕනෑ. මේ වනකොට ජාත්‍යන්තරයේ නොයෙකුත් රටවල් අපට ආධාර කරන්න පෙලඹෙමින් ඉන්නවා. අපි විශ්වාස කරනවා, මෙවර මේ කලාපය තුළ තිබෙන සියලුම රටවල ආධාර උපකාර අරගෙන, ජාත්‍යන්තරයෙන් අපට ලැබෙන ඒ සියලු සහයෝගයන් හරියට කළමනාකරණය කර ගත්තොත්, මේ රට ජයග්‍රහණය කරා මෙහෙයවන්න මේ අභියෝගයම අපට ප්‍රයෝජනයට ගන්න පුළුවන් කියලා. ඒ නිසා මේ අවස්ථාව අපට ඉතාම වැදගත් කියා මා හිතනවා. අප සියලුදෙනා මේ අවස්ථාවට මුහුණ දී, මේ රටේ ජනතාව එකට එකතු කරමින් කටයුතු කරන්න ඕනෑ.

සෑම දිස්ත්‍රික්කයකම වාගේ ඒ අහිමි වෙච්ච ජීවිත නැවත ලබා දෙන්න අපට නොහැකි වුණත්, ඒ පවුල්වල ඉතිරි වෙලා ඉන්න දූවා දරුවන්ට ඔවුන්ගේ පාසල් අධ්‍යාපනය සම්පූර්ණ කරගෙන,

[ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා]

විශේෂයෙන්ම විභාගවලට මුහුණ දෙන දරුවන්ට ඔවුන්ගේ අවශ්‍යතා ඉෂ්ට කරගන්න, ඒ පවුල්වලට අවශ්‍ය මූලික අවශ්‍යතා සපුරා දී මේ කටයුත්ත ඉදිරියට කරගෙන යන්න අපට හැකියාව තිබෙනවා.

ඒ වාගේම, අද අපේ පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරුන්, ගරු ඇමතිවරුන් ප්‍රකාශ කරපු ආකාරයට මේ වනකොට රජය විශාල මුදලක් වෙන් කර තිබෙනවා මේ ආපදාව වෙනුවෙන්.

Sir, I think this is really an opportunity that we have at this moment to face this challenge and take our country forward as a peaceful country in a couple of months.

Thank you very much.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. M. Nizam Kariapper. You have 10 minutes.

[6.09 p.m.]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

Sir, I rise to speak at a time of a huge calamity in this country. ගරු සභාපතිතුමනි, 1978දී ආ පළමුවැනි සුළි සුළඟ ගැන සමහර විට ඔබතුමාටත් අත්දැකීම් තිබෙන්න පුළුවන්. අපි ඒක දැනගෙන හිටියේ නැහැ. මොකද, ඒ, මම අපොස (සාමාන්‍ය පෙළ) විභාගය ගත් අවුරුද්ද. ඒකත් නැඟෙනහිර පළාතට, අපේ ගමට තමයි ආවේ. ඊට පස්සේ අපි දැකපු ලොකුම ව්‍යසනය තමයි, 2004දී ආ සුනාමිය. දැන් 2025දී ආ "දිට්වා" සුළි සුළඟ.

අද දවසේ මාතෘකාවට එන්න ඉස්සෙල්ලා මම තව කාරණා කිහිපයක් කියන්න කැමැතියි. මම එනකොට මේ සභාව පොඩ්ඩක් උණුසුම්ව තිබුණේ. ජනතා විමුක්ති පෙරමුණේ, එහෙම නැත්නම් අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාගේ දේශපාලන නායකත්වයට සහ එතුමාගේ කථාවට, මන්ත්‍රීවරයෙක් වෙන්න ඉස්සෙල්ලා අපි සෑහෙන්න කැමැතියි. විපක්ෂයේ ඉඳගෙන රජයට ප්‍රශස්ති ගී ගායනා කරලා වැඩ කර ගැනීමේ දේශපාලන සංස්කෘතියකට යන්න මම නම් බලාපොරොත්තු වන්නේ නැහැ. මොකද මෙතැනදී පොඩි අදහසක් මතු වුණා, ඔබතුමන්ලාගේ ඇමතිතුමෙකු එක එක්කෙනාගේ නම් කියලා මේ කෙනා හොඳට අපි ගැන කථා කළා යනුවෙන් කියපු බවට. විශේෂයෙන්ම උතුර, නැඟෙනහිර පළාත්වල ඉන්න මුස්ලිම් සහ දෙමළ කථා කරන මන්ත්‍රීවරුන් ගැන මෙතැන මතු කරන්න හදනවා, "අපි පොඩ්ඩක් ෂේප් එකේ ආණ්ඩුවට support එකක් දීලා අපේ වැඩේ කර ගනිමු" වාගේ කථාවක්. මම නම් පෞද්ගලිකවම හිතන්නේ නැහැ, එවැනි ප්‍රජාතන්ත්‍ර විරෝධී තත්ත්වයක්, ආණ්ඩුවට ආවඩලා, ප්‍රශස්ති ගී ගයලා වැඩ කර ගැනීමේ දේශපාලන සංස්කෘතියක් ආපහු ඇති වෙයි කියලා. මම ඒක බලාපොරොත්තු වන්නේත් නැහැ. විවේචනයක් සාධාරණව, විද්‍යානුකූලව, තර්කානුකූලව - constructive criticism - ඉදිරිපත් කළොත්, ඒ විවේචනවලට ඇහුම්කන් දීලා, ඒ අනුව කටයුතු කිරීමේ ගුණාංගය ඔබ රජයට තිබෙනවා කියන පදනම මතයි තවමත් මම සිටින්නේ. හැබැයි මට සිද්ධ වනවා, with the little bit of my understanding, අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා දේශය අමතා කරපු කථාව පිළිබඳව to express my disappointment. එතුමා දත්ත සහ කරුණු හෙළිදරව් නොකළා පමණක් නොවෙයි, අනාගත වැඩ පිළිවෙළ පිළිබඳව පොදුවේ සඳහන් කළා මිසක්, විශේෂිතව සඳහන් කළේ නැහැ. සමහර විට ඒ වකවානුව වනකොට ඒ සම්බන්ධයෙන් තොරතුරු එතුමා ළඟ නොතිබුණු නිසා වෙන්න පුළුවන්. නමුත්, අනාගතයේදී - හෙට, අනිද්දා - ඒ සම්බන්ධව පාර්ලිමේන්තුවට ඇවිල්ලා එතුමා කියන්න පුළුවන්.

හැබැයි සමගි ජන සන්ධානයේ මන්ත්‍රීවරයෙකු හැටියට මම අනිවාර්යයෙන්ම කියන්න ඕනෑ, මට විපක්ෂ නායකතුමා ගැන ආඩම්බරයි කියලා. මොකද එතුමාගේ කථාවේ බහුතරයක්ම තිබුණේ, දත්ත සහ ඉතාම පැහැදිලි සාධනීය විවේචන. අපට ඒක පිළිගන්න වනවා. නමුත් හවස් වනකොට රූපවාහිනියේ තිබුණු කථාවක් අල්ලාගෙන මෙතැන පැටළුණා. ඒක නොවුණා නම් හොඳයි කියලා මට හිතුණා, ගරු සභාපතිතුමනි.

මම විද්‍යානුකූලවත් යම්කිසි දෙයක් කියන්න කැමැතියි, timelines එක්ක. පුරෝකථනය කියන ප්‍රශ්නය පසුගිය දිනවල මතු වුණා. සාමාන්‍යයෙන් සුළි සුළඟක් ඇති වීමට ඉස්සෙල්ලා අඩු පීඩන අවපාතයක් - depression එකක් - ඇති වනවා; tropical depressions ඇති වනවා. ඊට පස්සේ ඒක deep depressions හැටියට මතු වනවා. Deep depressions ඇතිවෙලා සුළං එකතු වුණාම, සුළි සුළඟක් හැටියට මුහුදු ජලයේ තිබෙන ජල වාෂ්ප ටික ඔක්කෝම දිවයින ඇතුළට එනවා. I was able to get the timelines. 2025.11.26වැනි දා - එදා පාර්ලිමේන්තුව රැස්වුණු දවසක් - තමයි ඉස්සෙල්ලාම අවපීඩනයක් හට ගන්නේ. ඊට පස්සේ 27වැනි දා වනකොට ඒකට නමක් දුන්නා, "දිට්වා"කියලා.

ගරු සභාපතිතුමනි, සාමාන්‍යයෙන් සුළි සුළඟට නමක් දෙන්නේ යම් කිසි විශේෂ හේතුවක් මත. යකෙකුට වුණත් නමක් දෙන්නේ වෙන මොකවත් නිසා නොවෙයි, because it would turn out to be a big problem. ඒ කියන්නේ, එසේ නමක් දෙන්නේම මේක ටිකක් බරපතළයි, මේ ප්‍රශ්නය දෙස අවධානයෙන් බලන්න කියන අරමුණින්. මේ සිදුවීම වුණේ සිකුරාදා. ඒ නිසා නොවැම්බර් 12වැනි දා පළ කර තිබුණු විස්තරයක් අදාළ කරගෙන, මහත්මියක් ඇවිල්ලා ඒක සුළි සුළඟක් විය හැකියි කියපු සාමාන්‍ය කථාව සම්බන්ධව නොවෙයි මම අදහස් දක්වන්නේ. තර්කානුකූලවයි මම අදහස් දක්වන්නේ. අපිට පැය 24ක කාලයක් තිබුණා. විශේෂයෙන්ම දිවයිනේ අග්නිදිග පැත්තෙන් දිවයිනට ඇතුළු වන මෙම සුළි කුණාටුව වෙරළාසන්නයෙන් දිවයින අභ්‍යන්තරයට යෑම නිසා විශාල ව්‍යසනයක් සිදු වන බවට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙන් ඇත්තටම දැනුම් දී තිබුණා.

ඒක නොවෙයි ප්‍රශ්නය. කොහොමත් අපේ ජනතාවගේ ලොකු දුර්වලකමක් තිබෙනවා. මගේ අම්මා වුණත් එහෙමයි, ගෙදර අය වුණත් එහෙමයි. සුනාමියක් කිව්වොත් නම්, අපේ අම්මලා දුවලා යනවා. මොකද, එක සැරයක් සුනාමියක් ඇවිල්ලා තිබෙනවා නේ. මගේ අම්මා එහේ ඉන්නවා. අම්මා කියනවා, "එහෙම එන්නේ නැහැ, මොකුත් වෙන්නේ නැහැ පුතා" කියලා. හැබැයි, සුනාමි කිව්වොත් බයයි. හැබැයි, සුනාමිය එන්න කලින් එහෙම කිව්වාමත් ගණන් ගත්තේ නැහැ. Cyclones කියපු ගමන් මතක් වෙන්නේ, 1978දී පොල්ගස් කරකවා ගෙන ආපු සුළි සුළඟ විතරයි. හැබැයි, සුළි කුණාටුවක් හරහා මිලිමීටර් 300ක්, මිලිමීටර් 500ක් වැනි විශාල ජල කන්දරාවක් මේ දිවයින ඇතුළට වැටීම හේතු කොටගෙන සිදු වන විපර්යාසය පිළිබඳව සාමාන්‍ය ජනතාවට තේරුම් යන්නේ නැහැ. ඒක තමයි ඇත්ත. එවැනි දැඩි වර්ෂාපතනයකින් සිදු වන්නේ පස බුරුල් වෙලා නාය යාම් සිදු

වෙන එකයි. අපි ඔක්කෝම එකතු වෙලා වැරදි වැඩ කළා. ගං ඉවුරු අල්ලා ගෙන ඒ තැන් block කළා. ඒකෙන් වෙන්නේ ගංගා පිටාර ගලන එකයි. මිලිමීටර් ගණනාවක වර්ෂාපතනයක් ලැබෙනවා කිව්වාට, මිනිස්සුන්ට තේරෙන්නේ නැහැ. අධික වර්ෂාවක් නිසා දිවයිනට වැටෙන වතුර මුහුදට යන අතර පිටාර ගලනවා කියන එකත්, ඒක විශාල ව්‍යසනයක් කරගෙන යනවා කියන එකත්, ජනතාවට අවබෝධ කළ යුතුයි. මොකද, මීට පසුව වුණත් මෙවැනි දේවල් සිදු විය හැකි නිසා.

මම දැක්කා, "සියත" නාළිකාව පුවත් පත් විස්තරවලට කියා තිබුණු කාරණයක්. ලස්සන කථා වගයක් කියලා තිබුණා. ගරු සභාපතිතුමනි, ඒකේ කියා තිබුණා, "යට වුණු පළාත් 5කට හෙට සිට යළි වැසි" කියලා. ඊළඟට, නාය ගිය තැන් සුළු වැස්සකටත් සක්‍රිය විය හැකියි කියා තිබෙනවා. මම මේක කිව්වා කියලා මිනිස්සු මේ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරනවාද? නැහැ. දැනටමත් යට වී තිබෙන පළාත් 5කට හෙට අනිද්දා සිට යළි වැසි ඇති වෙනවා කිව්වාට, ඒගොල්ලන් ගණන් ගන්නේ නැහැ. හැබැයි, එහෙම කියලා සතියකට පමණ පසුව එහෙම එකක් වුණාම අපි ඔක්කෝටම බණිනවා, ඔයගොල්ලන් ඇයි කිව්වේ නැත්තේ කියලා. සුළු වැස්සකටත් නැවත නාය යෑම් සක්‍රිය විය හැකියි කියලාත් තිබෙනවා. නාය යෑම්වලට හසු වුණු ජනතාව දැන් පායනවා කියලා ආපසු ගෙවල්වලට යනකොට, යන්න එපා කිව්වත් නොගිහින් ඉන්නේ නැහැ. මේක හරි ප්‍රශ්නයක්.

මම කල්පනා කළා, විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට වැදගත් යෝජනාවක් ඔබතුමන්ලාට ඉදිරිපත් කරන්න. ඒ කියන්නේ, පුරෝකථනය කිරීම සඳහා මීට වඩා වූ වෙනයම් වැඩ පිළිවෙළක් අපට සකස් කරන්න වෙනවා. මම නම් කල්පනා කරන්නේ කාලගුණ විද්‍යාව පිළිබඳව හදාරන විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, NBRI එක, Disaster Management Centre එක, social media යනාදී සියල්ලක්ම එකතු කරගෙන ජනතාවගේ විශ්වාසය දිනා ගත හැකි, ජනතාවට micromanage කර ගත හැකි, ජනතාවට පිළිගත හැකි පරිදි මේ පිළිබඳව පුරෝකථනය කිරීම සඳහා වූ යම් කිසි මධ්‍යස්ථානයක් ඇති කළ යුතු බවයි. උදාහරණයක් විධියට ගත්තොත්, අරණායක කන්දේ නාය යෑමක් වෙලා වතුර සමඟ පස් කන්දක් දිය වෙලා එනවා කියා ඒ ප්‍රදේශය හඳුනා ගෙන, ඒ ප්‍රදේශයේ සිටින ගම්වාසීන් එතැනින් ඉවත් කිරීමට අපට ක්‍රමවේදයක් තිබෙනවා නම්, හොඳයි. මොකද, ඒවා අපි දන්නේ නැහැ. විදේශ රටවල නම් ගිනි කඳු තිබෙන ප්‍රදේශවල එහෙම ක්‍රමයක් තිබෙනවා. ඒ දැනුම් දීම ආපු ගමන් කට්ටිය එතැනින් ඉවත් වෙනවා. නමුත් අපේ කට්ටිය එහෙම කරන්නේ නැහැ.

දැන් කියනවා, මීට පසුව ගංගා ද්‍රෝණිවල මොකුත් සංවර්ධන කටයුත්තක් කරන්නේ නැහැ කියලා. ලොකුවට එහෙම කියනවා. නමුත් මාස 2ක් පමණ ගියාට පසුව නැවත ඒ කටයුතු පටන් ගන්නවා. ඒක නිසා ඒ සම්බන්ධයෙන් අනිවාර්යයෙන්ම අපට ඉතාම දැඩි තීන්දු ගන්න වෙනවා. ඒ ගන්නා තීන්දු සම්බන්ධව ජනතාවගේ ප්‍රසාදය නැති වුණත් කමක් නැහැ.

මම දන්නවා, මුස්ලිම් ප්‍රජාව තුළත් ටිකක් ඔය දුර්වලකම තිබෙන බව. Townsවල එහෙම සංවර්ධන සැලසුම් සත පහකට ගණන් ගන්නේ නැහැ. මම නගරාධිපති වෙලා හිටියා. මට ලැබුණේ සියයට 90ක්ම - ඒගොල්ලන් එකක්වත් approve කරන්නේ නැහැ. බැංකුවේ ණයක් තිබෙනවා කියන එකට විතරයි approval එකක් ඕනෑ. ඉන් එහාට මොකුත් කරන්නේ නැහැ, ඒගොල්ලන්. ඒක හැම තැනම තිබෙනවා; සමාජයේ හැම තැනම තිබෙනවා. ඒකට ප්‍රධාන හේතුව ආර්ථික ප්‍රශ්නය.

දැන් මේ ව්‍යසනය මහා ලොකුවට බලපෑ මහනුවර ප්‍රදේශය අරගෙන බලන්න. අපේ නායක රවුෆ් හකීම් මන්ත්‍රීතුමා විශේෂ කාරණා දෙකක් කියන්න කියලා මට කිව්වා. එතුමා එතැන ඉන්නේ. ඇමතිතුමාට මම මේ කියන්නේ. එකක් තමයි රඹුක් ඇළ -

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Hon. M. Nizam Kariapper, you have only one more minute.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

Sir, I wish you would have warned me two minutes before my time ends. However, I will quickly finish, Sir.

අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රඹුක් ඇළ නාය යෑමෙන් 29දෙනෙක් මැරිලා තිබෙනවා. Bodies 11යි තවමත් recover කරගෙන තිබෙන්නේ. අනෙක් bodies ටික recover කර ගන්න කිසිම සහායක් ලැබිලා නැහැ. ඊළඟට, මාවතුරත් ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. අපට කියන්න බැහැ, ඒ ප්‍රදේශයට කට්ටිය ආවේ නැහැ කියලා. මම දන්නවා, විශාල ව්‍යසනයක් සිදුවෙලා තිබෙන බව. හැම තැනටම යන්න තිබෙනවා. ඒ ගැනත් සභාවට දන්වන්න කියලා රවුෆ් හකීම් නායකතුමා මට කිව්වා. අනෙක් එක, upland එක. විශේෂයෙන්ම රඹුක් ඇළ සම්බන්ධයෙන් කෝන්ගල විහාරස්ථානයේ විහාරාධිපති ස්වාමීන්වහන්සේට මේ සභාවේදී විශේෂ ස්තුතියක් පිරිනමන්න කිව්වා. මොකද, ඒ විහාරාධිපති ස්වාමීන්වහන්සේ ඉතාම සාධාරණව ජනතාවට විශාල සේවයක් කරලා තිබෙනවා. මේ ආගම්, භාෂා ප්‍රශ්න එකක්වත් උන්වහන්සේට අදාළ නැහැ. ඔබතුමන්ලා ඒ පළාත ගැන විශේෂ අවධානයක් යොමු කරන්න.

ඊළඟ ලොකුම ප්‍රශ්නය තමයි අපේ නලින්ද ජයතිස්ස ඇමතිතුමාට භාර විෂයයට අදාළ, ජනතාවගේ සෞඛ්‍යය පිළිබඳ ප්‍රශ්නය. මම හිතන විධියට, ඔබතුමන්ලා දැනටමත් ඒ සම්බන්ධයෙන් කටයුතු කරනවා ඇති. මට වඩා මෙතැන ඉන්න අනෙක් මන්ත්‍රීවරුන් ඒ සම්බන්ධයෙන් විශේෂ සැලකිල්ලක් දක්වයි. මොකද, අපේ පළාතේත් pipe-borne water නැහැ. All wells have become adulterated and got polluted. ඒ නිසා පිරිසිදු වතුර පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. අපේ ජනතාවගේ කුඹුරු පිළිබඳවත් ප්‍රශ්නයක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් සියලුම මන්ත්‍රීවරු කථා කරලා තිබෙනවා. ඒ පිළිබඳව ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

අවසාන වශයෙන්, ඕනෑම අවස්ථාවක විවේචනය කිරීමේ අපේ අයිතිය රඳවා ගෙන විපක්ෂය හැටියට අපේ මන්ත්‍රීවරුන් අදහස් ප්‍රකාශ කරන බව සඳහන් කරනවා. ප්‍රශස්ත ගී ගායනා කරමින් වැඩ කර ගන්නා දේශපාලන සංස්කෘතිය නැවත කවදාවත් ඇති නොකරන්න කියලාත් ඔබතුමන්ලාට කියමින්, මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Next, the Hon. (Dr.) Nalinda Jayatissa. You have 20 minutes.

[අ.භා. 6.22]

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු සභාපතිතුමනි, අපේ රටට බලපෑ ගංවතුර තත්ත්වය, සුළි කුණාටු සහ නාය යෑම් යන දරුණු ස්වාභාවික ආපදා තත්ත්වය හේතුවෙන් අද හවස 6.00 වන විට දිස්ත්‍රික්ක විසිපහේම පවුල් 455,405ක් පීඩාවට පත්වෙලා තිබෙනවා. පුද්ගලයන් වශයෙන් ගත්තොත් 1,614,790ක් පීඩාවට පත්වෙලා තිබෙනවා. ඒ වාගේම අද හවස 6.00 වන විට මේ ආපදා තත්ත්වය හේතුවෙන් පුද්ගල මරණ 479ක් වාර්තා වෙලා තිබෙනවා, මහනුවර දිස්ත්‍රික්කයෙන් 118ක්, නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් 89ක්, බදුල්ල දිස්ත්‍රික්කයෙන් 83ක්, කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් 56ක්, කෑගල්ල දිස්ත්‍රික්කයෙන් 30ක්, පුත්තලම දිස්ත්‍රික්කයෙන් 29ක්, මාතලේ දිස්ත්‍රික්කයෙන් 28ක් වශයෙන්. තවත් දිස්ත්‍රික්කවලිනුත් අඩු වැඩි වශයෙන් මරණ සංඛ්‍යාවක් වාර්තා වෙලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, පීඩාවට පත් ජනතාව මුදා ගැනීමේ සහන මෙහෙයුම් ක්‍රියාත්මකයේදී අපේ ගුවන් හමුදා නිලධාරියෙක්, ඒ වාගේම -

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Order, please! The Hon. Speaker will now take the Chair.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. SPEAKER took the Chair.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු සභාපතිතුමනි, මේ ව්‍යසනයෙන් මියගිය සියලුදෙනා වෙනුවෙන් ආණ්ඩුව හැටියට මේ අවස්ථාවේදී අපේ සාතිශය සංවේගය පළ කරන්න කැමැතියි. ඒ වාගේම විපතට පත් ජනතාව මුදාගැනීමේ ක්‍රියාත්මකයේදී අපේ ශ්‍රී ලංකා ගුවන් හමුදා නිලධාරියෙක්, ශ්‍රී ලංකා නාවික හමුදා නිලධාරින් 5දෙනෙක් සහ පොලිස් නිලධාරියෙක් ජීවිත පරිත්‍යාග කළා. අපි රටක් හැටියට, ජාතියක් හැටියට එතුමන්ලා සියලුදෙනාටම අපේ ගෞරවය, ප්‍රණාමය පුද කරනවා. විපතට පත් තවත් මිනිස් ජීවිත බේරා ගැනීම වෙනුවෙන් ජීවිත පරදුවට තබා ඉතාම විශිෂ්ට සමාජ මෙහෙවරක් කරලා තමයි එතුමන්ලා ජීවිතයෙන් නික්ම යන්නේ.

ගරු සභාපතිතුමනි, අද හවස 6.00 වන විට පුද්ගල අතුරුදන්වීම් 350ක් වාර්තා වනවා, පූර්ණ නිවාස හානි 1,289ක් වාර්තා වනවා, අර්ධ නිවාස හානි 44,556ක් වාර්තා වනවා. ඒ වාගේම ආරක්ෂිත ස්ථාන 1,347ක පුද්ගලයන් 188,974ක් දැනට ඉන්නවා. ගරු සභාපතිතුමනි, මේක මෑත කාලයේ අපේ රටට බලපෑ ඉතාම දරුණු ගණයේ ව්‍යසනයක්. 2004දී ඇති වුණු සුනාමි ව්‍යසනය වෙරළබඩ දිස්ත්‍රික්ක ගණනාවකට බලපෑවා. නමුත්, මේක අපේ රටේ දිස්ත්‍රික්ක 25ටම වාගේ බලපෑ ව්‍යසනයක්. වෙන දා ඇති වන ආපදාවලදී සමහර දිස්ත්‍රික්ක තිබෙනවා, විපතට පත් දිස්ත්‍රික්කවලට ගොඩක් උදව් කරන්න පුළුවන් හැකියාව තිබෙන. මේ වතාවේ අපේ රටේ එවැනි දිස්ත්‍රික්ක ඉතිරි වුණේ ඉතාම අඩු සංඛ්‍යාවක්. අනෙක් පැත්තෙන්, මුල් අවස්ථාවේදී අපේ රාජ්‍ය යන්ත්‍රණය පවා, නිලධාරින් ඇතුළු ඒ වැඩ කරන අය පවා මේ ව්‍යසනයේ ගොදුරු බවට පත් වුණා. කෙසේ නමුත්, මෙම දින කිහිපය ඇතුළත ඉතාම දැඩි පරිශ්‍රමයක් දරමින් අපි රට යථාවත් කරමින් ඉන්නවා. ඒ සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ශ්‍රී ලංකාවේ කාර්යාලය වාර්තාවක් නිකුත් කර තිබෙනවා. ඒ වාර්තාව අනුව ඔවුන් බොහොම පැහැදිලිව වාර්තා කර තිබෙනවා, රටක් හැටියට අපි දැන් මොකක්ද කරමින් ඉන්නේ කියන එක. මම හිතනවා, ආණ්ඩුව හැටියට රාජ්‍ය යන්ත්‍රණය මෙහෙයවමින් මේ කරන දේවල් නොදකින විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන්ට ඒ වාර්තාව කියවා යම් අදහසක් ගන්න පුළුවන් කියලා.

ගරු සභාපතිතුමනි, මම මේ වෙලාවේදී ප්‍රධාන වශයෙන් එක කරුණකට මේ සභාවේ අවධානය යොමු කරවන්න කැමැතියි. මේ ව්‍යසනයට ගොදුරු වෙලා ජනතාව මිය යනකොට, අතුරුදන් වනකොට, විශාල හානියක් සිදු වනකොට තැන් තැන්වලින් කියැවෙන්න පටන් ගත්තා, මේ අනතුර පිළිබඳව මීට කලින් තොරතුරු වාර්තා වුණා, ඒවා නොසලකා හිටියා කියලා. නොවැම්බර් 12 කියලා දිනයකුත් කිව්වා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Order, please! පාර්ලිමේන්තුව යළි රැස්වේ.

***ඊට අනුකූලව පාර්ලිමේන්තුව එක්රැස් විය.***
*அதன்படி பாராளுமன்றம் மீண்டும் கூடியது.*
*Accordingly, Parliament resumed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද දින විවාදයේ වැඩකටයුතු අවසන් වන තෙක් කාලය දීර්ඝ කර ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***කාරක සභාවෙහිදී තවදුරටත් සලකා බලන ලදී. -***
***[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் மேலும் ஆராயப்பட்டது. -*
*[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered further in Committee. -*
*[THE HON. SPEAKER in the Chair.]*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු සභාපතිතුමනි, මගේ කථාවට විනාඩි 20ක් විතර වෙන් කර තිබෙන නිසා මේ කාරණයත් පැහැදිලි කරන්නම්. ඒ විධියට කරුණු ඉදිරිපත් කරපු විපක්ෂයේ ඕනෑම කෙනෙකුට මම කියන්න කැමැතියි, මේ කාලය ඇතුළතදී නොවැම්බර් 12වැනි දා කවර හෝ ආයතනයක් නිල නිවේදනයක් හැටියට එවැනි දෙයක් කියලා තිබෙනවා නම්, කරුණාකර එය සභාගත කරන්න කියලා. ගරු විපක්ෂ නායකතුමා, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා, ගරු

දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා, ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා, ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා, එහෙම නැත්නම් වෙනත් කවුරුන් හෝ මන්ත්‍රීවරයෙක් එතුමන්ලාගේ අතේ, ඒ කියන්නේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව තුළවත් නැති, රජය සතුවවත් නැති, නොවැම්බර් 12වැනි දා කවුරු හරි පුරෝකථනය කළාය කියන එවැනි නිල නිවේදනයක් රජයට ඉදිරිපත් වෙලා තිබෙනවා නම් කරුණාකර එය ඉදිරිපත් කරන්න. ඒක මේ රටේ ජනතාව දැනගත යුතු වැදගත් කරුණක් වේවි. දැන් මෙතැන මේ කියන්න හදන බොරුව මොකක්ද?

ගරු සභාපතිතුමනි, එතුමන්ලා නොවැම්බර් 12වැනි දා ගැන කියන නිසා මම අරගෙන බැලුවා, නොවැම්බර් මාසයේ පළමුවැනි දා ඉඳලා නොවැම්බර් මාසයේ 12වැනි දා උදේ වෙනකම් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරපු තොරතුරු. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සාමාන්‍යයෙන් උදේ 5.30ට, හවස 2.00ට සහ හවස 4.00ට කාලගුණ වාර්තා ඉදිරිපත් කරනවා. විශේෂයක් තිබුණොත් ඒ අතරතුරත් වාර්තා ඉදිරිපත් කරනවා.

නොවැම්බර් 01වැනි දා ඉඳලා නොවැම්බර් 04වැනි දා උදේ 5.30 වනකල් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව වාර්තා 10ක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ හැම වාර්තාවකම තිබෙන්නේ, "සබරගමුව, මධ්‍යම, දකුණ හා ඌව පළාත්වල පස් වරු 2.00න් පසු ස්ථාන කිහිපයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැකි ය" කියලා. හැබැයි, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවවත් ඒ ප්‍රමාණය මිලිමීටර් 75 හෝ, 100 හෝ 150 හෝ කියලාවත් වාර්තා කරන්නේ නැහැ. මොකද, සාමාන්‍යයෙන් මේ පවතින්නේ අන්තර් මෝසම් කාලය. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මේ දවස් කිහිපයේම තොරතුරු වාර්තා කරන්නේ ඒ විධියට. 04වැනි දා හවස 2.00ට නිකුත් කළ නිවේදනයේ ඉඳලා, 05වැනි දා හවස 4.00 දක්වා නිකුත් කළ නිවේදනවල එහෙම දෙයක්වත් කියන්නේ නැහැ. කියන්නේ, "දිවයිනේ තැනින් තැන වැසිවාර කිහිපයක් වාර්තා වනවා" කියලා පමණයි.

ඊළඟට 06වැනි දා උදේ 5.30ට කියනවා, "ගිගුරුම් සහිත වැසි සඳහා හිතකර තත්ත්වයක් තිබෙනවා" කියලා. ගරු සභාපතිතුමනි, නොවැම්බර් මාසය පටන් ගත්තාට පස්සේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් මෙන්න මෙතරම් ප්‍රමාණයකට වර්ෂාපතනයක් පතිත වේවි කියලා ඉලක්කමක් කියන්නේ 06වැනි දා හවස 2.00ට. ඒත්, මිලිමීටර් 75ක විතර තරමක තද වැසි ඇති වෙයි කියන එක විතරයි. ගරු සභාපතිතුමනි, ඇත්තටම මේක තමයි 12වැනි දා උදේ වනකල් ඒ අය ඉදිරිපත් කරන වාර්තාව. මගේ ළඟ තිබෙනවා මුළු නොවැම්බර් මාසයටම අදාළව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ඉදිරිපත් කළ වාර්තා. මේ කිසිම වාර්තාවක කිසිම තැනක කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව නිල වශයෙන් එහෙම නිවේදනයක් නිකුත් කරලා නැහැ. 12වැනි දා උදැසන කිව්වාය කියන වාර්තාවක් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව නිකුත් කරලා නැහැ. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළොත් තමයි ඒක ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට, ඊළඟට අනෙක් අදාළ ආයතනවලට යොමු වන්නේ. නමුත් එහෙම එකක් කියලා නැහැ. හැබැයි, එහෙම කරුණක් නොකියා තිබියදී එක්තරා නාළිකාවක එහෙම කිව්වාය කියලා මන්ත්‍රීවරු ගණනාවක් සාවද්‍ය ලෙස ඒ තොරතුරු විකෘති කරලා කියනවා. අපේ ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමියත් ඒක පැහැදිලි කළා. එහෙම එකක් හරියට කියලා නැහැ කියලා එතුමියත් කිව්වා. හැබැයි, ඒකත් උලුප්පා දක්වමින් දැන් පාර්ලිමේන්තුවේ නොයෙක් දේවල් කියනවා. එදා කබීර් හෂීම් මන්ත්‍රීතුමා ඒක කියලා එතුමන්ලාගේ කණ්ඩායමත් අරගෙන නැඟිටලා ගියා, සභාවෙන් එළියට. ඒකට අදාළව ඊට පසුව එළියේ voice-cuts දෙනවා. මතයක් හදන්න හැදුවා, 12වැනි දා තමයි මේ පිළිබඳව දැනගත්තේ කියලා. හැබැයි ඔබතුමන්ලාට පෙනෙනවා ඇති, 12වැනි දාට කලින් එහෙම කිසිම වාර්තාවක් නිකුත් වෙලා නැහැ කියලා. ඒ කණ්ඩායම තවත් මේ කරුණ විකෘති කරන්න පුළුවන් නිසා මම මේකත් කියන්නම්.

ඒ අතර කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව අවවාදාත්මක නිවේදන - advisory notices - කිහිපයක් නිකුත් කරනවා. නොවැම්බර් 02වැනි දා හවස 3.30ට නිවේදනයක් නිකුත් කරනවා. ඒ නිකුත් කරන්නේ, "නැඟෙනහිර පළාත, පොළොන්නරුව, මොනරාගල ඇතැම් ප්‍රදේශවල මිනිස් සිරුරට දැනෙන උෂ්ණත්වයක් වාර්තා වනවා" කියලා. ඒකෙනුත් කියන්නේ, සුළි කුණාටුවක් පිළිබඳව නොවෙයි. "අවවාදාත්මක" කිව්වාට පස්සේ ඕනෑ නම් ඒගොල්ලන්ට කියන්න පුළුවන්, "නැහැ. ඒ අතරේ අවවාදාත්මක නිවේදන කිහිපයක් නිකුත් කළා" කියලා. ඒ අවවාදාත්මක නිවේදනයක තිබෙන්නේ උෂ්ණත්වයක් ගැන.

නොවැම්බර් 06වැනි දා හවස 3.30ට, නොවැම්බර් 07වැනි දා හවස 3.00ට, නොවැම්බර් 08වැනි දා දවල් 1.40ට, නොවැම්බර් 10වැනි දා දවල් 1.00ට, නොවැම්බර් 12වැනි දා හවස 3.00ට, නොවැම්බර් 13වැනි දා දවල් 12.00ට නිකුත් කරන්නේ ප්‍රබල අකුණු පිළිබඳ නිවේදන විතරයි. ඒවා වැසි නිවේදන නොවෙයි. ප්‍රබල අකුණු ඇති වෙන්න පුළුවන් කියන එක විතරයි නිවේදනය කරන්නේ. ගරු සභාපතිතුමනි, ඒ නිසා නොවැම්බර් 12 කියන එකේ කිසි පදනමක් නැහැ. 12වැනි දාට කලින්වත් එවැනි කිසිම දෙයක් කියලා නැහැ. ඒ කියලා තිබෙන්නේත් මිලිමීටර් 75ක වැසි ඇති වනවාය කියන එක මිසක් සුළි කුණාටුවක් ගැන, පීඩන අවපාතයක් ගැන, ගැඹුරු අවපාතයක් ගැන නොවෙයි. එවැනි කිසිවක් වාර්තා කරලා නැහැ. එහෙම තිබියදී 12වැනි දා ගැන කථා කරන එකේ කිසිම තේරුමක් නැහැ.

ඊළඟ කරුණ මෙයයි. එතැනින් පස්සේ නොවැම්බර් 13වැනි දා හවස 2.00ට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව වාර්තා කරනවා, "දිවයිනට නැඟෙනහිර දෙසින් පහළ වායුගෝලයේ කැළඹිලි ස්වභාවයක් වර්ධනය වෙමින් පවතිනවා. ඒ අනුව දැනටමත් පවතින මේ අන්තර් මෝසම් වැසි තත්ත්වයේ වර්ධනයක් උතුරු සහ නැඟෙනහිර පළාත්වල අපේක්ෂා කරනවා. මිලිමීටර් 75ක පමණ වැසි බස්නාහිර, සබරගමුව, මධ්‍යම, දකුණු හා ඌව පළාත්වලත්, අම්පාර, මඩකලපුව දිස්ත්‍රික්කවලත් තැනින් තැන අපේක්ෂා කරනවා" කියලා. එතකොට එතැනදීත් කියන්නේ, වායුගෝලයේ කැළඹිලි ස්වභාවයක් වර්ධනය වෙමින් පවතිනවාය කියන එක. දැන් මේ තත්ත්වය කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව 14වැනි දා වාර්තා දෙකකදී කියනවා. 14වැනි දා හවස 4.00ට නිකුත් කළ වාර්තාවෙන් කියනවා, අර මිලිමීටර් 75, මිලිමීටර් 100 විතර දක්වා වැඩි වෙන්න පුළුවන් කියලා, උතුරු පළාතේ සහ ත්‍රිකුණාමලයේ. ඒත් බස්නාහිර, සබරගමුව, මධ්‍යම, ඌව සහ දකුණු පළාත්වල තැනින් තැන මිලිමීටර් 75ක වර්ෂාපතනයක් අපේක්ෂා කරන බව තමයි ඒ නිවේදනයේත් තිබෙන්නේ.

14වැනි දා හවස නිකුත් කළ වාර්තාවත් ඒකයි. 15වැනි දා හවස 4.00ට නිකුත් කළ වාර්තාවේ කියනවා, "කැළඹිලි තත්ත්වය අඩු පීඩන කලාපයක් දක්වා වර්ධනය වී ඇත" කියලා. මෙහෙම කියන්නේ, 15වැනි දා හවස 4.00ට. උතුර, උතුරු මැද සහ නැඟෙනහිරට මිලිමීටර් 100ක පමණ වර්ෂාපතනයකුත්, මධ්‍යම, සබරගමුව, දකුණ සහ ඌව පළාත්වලට මිලිමීටර් 75ක පමණ වර්ෂාපතනයකුත් ඇති වෙයි කියලා තමයි පුරෝකථනය කර තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, නොවැම්බර් 16 සහ 17වැනි දා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව නිකුත් කරන ලද වාර්තාවල 15වැනි දා හවස 4.00ට කියපු අඩු පීඩන කලාපය පිළිබඳව තමයි වාර්තා කරන්නේ. එතකොට මොකද වෙන්නේ? 12වැනි දා නොවෙයි, 13වැනි දා නිකුත් කළ වාර්තාව ගැන තමයි කියනවා ඇත්තේ.

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

එතකොට 12වැනි දා සහ 13වැනි දා පොඩ්ඩක් ඒක එහෙ මෙහෙ වෙන්නත් ඇති කියලා දැන් ඕනෑ කෙනෙකුට කියන්නත් පුළුවන් නේ. හැබැයි, නොවැම්බර් 18වැනි දා හවස 2.00ට නිකුත් කරපු වාර්තාව අනුව කියැවෙන්නේ, "දිවයින ආශ්‍රිතව පැවති අඩුපීඩන කලාපය ක්‍රමයෙන් දිවයිනෙන් ඉවතට ගමන් කරමින් පවතී. ඒ හේතුවෙන් හෙට - නොවැම්බර් 19වැනි දා - සහ අනිද්දා දිනවල දිවයිනේ වැසි තත්ත්වයේ තාවකාලික අඩුවීමක් බලාපොරොත්තු වේ. සබරගමුව, දකුණ, ඌව පළාත්වල ඇතැම් ස්ථානවල මිලිමීටර් 50ක පමණ තරමක තද වැසි ඇති විය හැකිය" කියායි. ඒක තමයි කියන්නේ. ඒ කියන්නේ, 12වැනි දාට කලින් කිසිම දෙයක් වාර්තා වෙන්නේ නැහැ. 12වැනි දා සිට 18වැනි දා දක්වා කාලය ගත්තාට පස්සේ, 13වැනි දා ඇති වන කැලඹිලි ස්වභාවය, අඩුපීඩන කලාපයක් ලෙස වර්ධනය වෙලා 18වැනි දා දිවයිනෙන් ඉවත් වෙලා යන බව තමයි කියන්නේ. නමුත් මෙන්න මේ සියලු කරුණු පටලවලා දැන්, "නැහැ. නැහැ. මේ ගැන තමයි කියන්නේ" කියනවා. නමුත් මේක වෙන එකක්. මේ කැලඹිලි ස්වභාවය 18වැනි දා දිවයිනෙන් බැහැරව ගියා. ඒකෙන් ප්‍රශ්නයක් වුණේ නැහැ.

ගරු සභාපතිතුමනි, නොවැම්බර් 18වැනි දා රාත්‍රී 8.00ට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව වාර්තා කරනවා, "ගිනිකොන දිග බෙංගාල බොක්ක ආශ්‍රිතව නව අඩු පීඩන කලාපයක් නිර්මාණය වීමේ හැකියාව පවතී. උතුරු වෙරළට ආසන්නයෙන් මෙය ගමන් කරනු ඇතැයි බලාපොරොත්තු වෙනවා" කියලා. මේක අලුත් prediction එකක්. 13වැනි දා පටන් ගත්ත කථාව, 18වැනි දා උදේ අවසන් වනවා. 18වැනි දා රෑ තවත් වාර්තාවක් එනවා, "තවත් නව අඩුපීඩන කලාපයක් නිර්මාණය වීමේ හැකියාව තිබෙනවා" කියලා. ඒක තමයි 19වැනි දා වාර්තා තුනකින්, 20වැනි දා වාර්තා තුනකින් සහ 21වැනි දා වාර්තාවලිනුත් ප්‍රකාශ කරන්නේ, "අඩු පීඩන කලාපයක් වර්ධනය වෙමින් තිබෙනවා" කියන එකයි. ඒ නිසා ඒගොල්ලන් කියනවා, වැසි තත්ත්වයේ වැඩිවීමක් අපේක්ෂා කරන්න පුළුවන් කියලා. ඒ කියන්නේ, අන්තර් මෝසම් වැසි තත්ත්වය වැඩි වෙනවා කියන එකයි. 21වැනි දා හවස 2.00ට කියනවා, "බස්නාහිර, සබරගමුව සහ උතුරු පළාතටයි, නුවරඑළිය දිස්ත්‍රික්කයටයි මිලිමීටර් 100ක විතර වර්ෂාපතනයක් වාර්තා වේවි" කියලා. 22වැනි දා හවස 2.00ට කියනවා, "උතුර, උතුර මැද, ත්‍රිකුණාමලය, මඩකලපුවට මිලිමීටර් 75ක පමණ වර්ෂාපතනයක් වාර්තා වෙයි" කියලා. කලින් කියපු මිලිමීටර් 100ත් අඩු වෙලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, දැන් මේ කියන අඩුපීඩන කලාපය ඇත්තටම වෙන එකක්. බෙංගාල බොක්ක ගැඹුරු මුහුදු ප්‍රදේශයේ යාත්‍රා කරන බහුදින ධීවර යාත්‍රාවලට බලපාන අඩුපීඩන කලාපයක් තමයි මේක. මේ ගැන කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව හරහා ඒ ධීවරයන්ට වාර්තා 10කට වැඩි ප්‍රමාණයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ අනුව බහුදින ධීවර යාත්‍රාවලට අවවාදාත්මක නිවේදන නිකුත් කරලා තිබෙනවා, තද සුළං, තද වැසි සහ මුහුද රළු වන ප්‍රදේශ පිළිබඳව.

ඇත්තටම කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මේ අඩු පීඩන තත්ත්වය උතුරු දෙසට යනවාය කිව්වාට පසු, ඒක සුමාත්‍රා දෙසට ගිහිල්ලා මේ තත්ත්වය අවසන් වුණා. ඒ නිසා 18වැනි දා රාත්‍රී 8.00ට වාර්තා කරපු අඩු පීඩන තත්ත්වය උතුරු දෙසට නොවෙයි, සුමාත්‍රා දෙසට ගිහිල්ලා තමයි අවසන් වුණේ. ඒකට ගොඩබිමත් එක්ක සම්බන්ධයක් තිබුණේ නැහැ. ඒ නිසා තමයි මුහුදේ සිටින ධීවර යාත්‍රාවල ධීවරයන්ට මේ පණිවුඩය දෙන්නට වැඩි අවධානයක් යොමු වුණේ. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ධීවර යාත්‍රාවලට මෙම පණිවුඩය කොතරම් ප්‍රබලව සන්නිවේදනය කළාද කියනවා නම්, මේ අඩුපීඩන කලාපය නිසා කිසිදු ධීවර යාත්‍රාවකට වාගේම කිසිදු ජීවිතයකට හානියක් සිදු වුණේ නැහැ. ඒ අඩුපීඩන තත්ත්වයත් මේ රටින් එළියට ගියා. එතකොට 12වැනි දා ඉඳන් 18වැනි දා දක්වා ආපු කථාව ඉවරයි. 18වැනි දා රෑ පටන් ගත්ත කථාවත්, 22වැනි දා, 23වැනි දා වෙනකොට ඉවරයි. ඒකෙනුත් මුහුදට තමයි බලපෑමක් තිබුණේ. නමුත්, මුහුදේ තිබුණු යාත්‍රා කිසිවකට හානියක් කරන්නේ නැතුව ඒ අඩු පීඩන තත්ත්වය අපේ රටින් එළියට ගියා.

ගරු සභාපතිතුමනි, ඊළඟට තුන්වෙනි කථාව මේකයි. නොවැම්බර් 23වැනි දා උදේ 5.30ට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව වාර්තා කරනවා, දිවයින පුරා පවතින වැසි තත්ත්වය පිළිබඳව. බස්නාහිර, සබරගමුව, වයඹ, උතුර, දකුණ කියන පළාත්වලත්, මහනුවර, නුවරඑළිය දිස්ත්‍රික්කවලත් තැනින් තැන මිලිමීටර් 100ක් සහ අනෙක් තැන්වලට මිලිමීටර් 75ක විතර වර්ෂාපතනයක් ලැබෙනවාය කියා අන්තර් මෝසම පිළිබඳව තමයි මේ වාර්තා කරන්නේ. ඒ කියන්නේ, 23වැනි දා උදේ 5.30ටත්, හවස 2.00ටත්, හවස 4.00ටත් වාර්තා කරන්නේ ඒ තත්ත්වයම තමයි. ඒ අතරේ බෙංගාල බොක්ක ආශ්‍රිතව යම් අඩු පීඩන කලාපයක් වර්ධනය වීමේ හැකියාවක් පවතින බවට නිරීක්ෂණයක් විතරක් තිබෙනවා. නමුත්, ඒක තහවුරු කරන්නේ නැහැ. ඇත්තටම මේ කැලඹිලි තත්ත්වය අඩු පීඩන තත්ත්වයක් දක්වා වර්ධනය වුණාය කියන එක වාර්තා වෙන්නේ නොවැම්බර් 25වැනි දා උදේ 10.00ට. කැලඹිලි තත්ත්වයක් ඕනෑ වෙලාවක තිබෙන්න පුළුවන්. ඒ කැලඹිලි තත්ත්වය පිළිබඳව උදේ 5.30ට කිව්වාට, එය අවපීඩන තත්ත්වයක් දක්වා වර්ධනය වෙලා නැඟෙනහිර, මධ්‍යම, සබරගමුව, ඌව, දකුණ කියන පළාත්වල මිලිමීටර් 100ක පමණ වර්ෂාපතනයකුත්, සෙසු පළාත්වල මිලිමීටර් 75ක පමණ වර්ෂාපතනයකුත් ගැන වාර්තා කරන්නේ 25වැනි දා උදේ 10.00ට.

මෙන්න මේ අඩු පීඩන තත්ත්වය තමයි 25වැනි දා රෑ 10.30 වනකොට පීඩන අවපාතයක් දක්වා වර්ධනය වෙන්න පුළුවන් කියලා රතු නිවේදනයක් නිකුත් කරන්නේ. එය පීඩන අවපාතයක් දක්වා වර්ධනය වෙන්න පුළුවන් කියලා නිවේදනයක් නිකුත් කරනවා. නොවැම්බර් 26වැනි දා මේ අඩු පීඩන කලාපය වර්ධනය වෙන්න පටන් ගන්නවා, මිලිමීටර් 150ක වර්ෂාපතනයක් දක්වා. හවස 2.00 වනකොට අඩු පීඩන කලාපය උතුරට බරව වයඹ දෙසට ගමන් කිරීමේ හැකියාවක් පවතිනවාය කියනවා. 26වැනි දා හවස 4.00ට පීඩන අවපාතයක් දක්වා මේ තත්ත්වය වර්ධනය වෙමින් පවතිනවාය කියනවා. 27වැනි දා උදේ 5.30ට කියනවා, පීඩන අවපාතයක් ඇති වෙලා තිබෙනවා, ඒ අනුව උතුරු මැද, වයඹ සහ ත්‍රිකුණාමලයට මිලිමීටර් 200ක පමණ වර්ෂාපතනයකුත්, මධ්‍යම, සබරගමුව, ඌව, බස්නාහිරට මිලිමීටර් 150ක පමණ වර්ෂාපතනයක් සහ සෙසු ප්‍රදේශවලට මිලිමීටර් 100ක පමණ වර්ෂාපතනයක් ඇති විය හැකි බව වාර්තා කරනවාය කියලා. හරියටම ගත්තොත්, නොවැම්බර් 25වැනි දා උදේ 10.00ට තිබෙන කැලඹිලි සහිත අඩු පීඩන තත්ත්වය වර්ධනය වනවා කියන එකේ ඉඳලා, 27වැනි දා උදේ 5.30ට තමයි පීඩන අවපාතයක් පිළිබඳ නිල වශයෙන් වාර්තා වෙන්නේ. ඊළඟට, සවස 1.00ට සහ 4.00ට ඔවුන් වාර්තා කරනවා, මේ පීඩන අවපාතය ගැඹුරු පීඩන අවපාතයක් දක්වා වර්ධනය වෙලා කියලා. රාත්‍රී 8.00ට කියනවා, මෙය සුළි කුණාටුවක් දක්වා වර්ධනය වෙලා කියලා. එතැනදී තමයි, "දිට්වා" කියන නම එන්නේ.

නිසාම් කාරියප්පර් මැතිතුමාත් කිව්වා, පහළ වායුගෝලයේ කැලඹෙන ස්වභාවයක් ආවාම ඒක අඩු පීඩන කලාපයක් බවට පත් වෙනවා කියලා. සමහර විට ඒක අඩු පීඩන කලාපයෙන්ම ඉවත් වෙන්නත් පුළුවන් නැත්නම් ඒක පීඩන අවපාතයක් දක්වා වර්ධනය වෙන්නත් පුළුවන්. එක්කෝ පීඩන අවපාතයෙන් නතර වෙන්නත් පුළුවන්. නැත්නම් ඒක ගැඹුරු පීඩන අවපාතයක් වෙන්නත් පුළුවන්. ඒ ගැඹුරු පීඩන අවපාතය සමහර වෙලාවට සුළි කුණාටුවක් දක්වා වර්ධනය වෙන්නත් පුළුවන්. එහෙම නැත්නම්, ඒක නතර වෙන්නත් පුළුවන්. සුළි කුණාටුවක් බවට පත් වුණාට පස්සේ තමයි ඒකට නමක් වැටෙන්නේ. එය සුළි කුණාටුවක් හෝ චණ්ඩ සුළි කුණාටුවක් බවට පත් වෙන්න පුළුවන්කමක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, මම කිව්වේ සිදුවීම් තුනක් නේ. නොවැම්බර් 12වැනි දාට කලින් කිසිම සිදුවීමක් වාර්තා වුණේ

නැහැ. ඒ අනුව නොවැම්බර් 12වැනි දා සඳහන් කරමින් කියපු කථාවත් පට්ටපල් බොරුවක්. ඒක ගොතපු කථාවක්. මම ඒ ගැන කියන්නම්.

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා - Committee on Parliamentary Business - රැස්වීමේදී අපි එකඟතාවකට ආවා නේ, පෙරේදා දවල් 12.30 වනකල් ඕනෑ නම් මේ ස්වාභාවික ආපදාව ගැන විවාද කරමු කියලා. විපක්ෂ නායකතුමා, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඇතුළු කට්ටිය ඒකට එකඟ වෙලා නේ ආවේ. ඒකට එකඟ වුණාට, මෙතැනට ආවාට පස්සේ ලොකු ඝෝෂාවක් කරලා, නොවැම්බර් 12වැනි දා කථාව බොරුවක් කියලා කට්ටියත් අරගෙන සභාවෙන් එළියට ගියා. ඊට පසුව හොයා බලනකොට තමයි ආරංචි වුණේ නොවැම්බර් 12වැනි දා ප්‍රවෘත්තිය නිර්මාණය කරපු කණ්ඩායම සහ ඒ මාධ්‍ය අයිතිකරුවා, "අපි දැන් ආණ්ඩුව හේත්තු වන වැඩක් කරලා තිබෙන්නේ, ඒ නිසා මේක අත්හරින්න එපා, අපි ඒකේම යමු" කියලා එළියේදී කිව්වා කියලා. ඒක නේ Parliamentary Business Committee එකේදී ගත්ත තීරණය මෙතැනට එනකොට වෙනස් වෙන්නේ, මේ සභාවෙන් එළියට යන්න ඕනෑ කියලා. එහෙම තමයි මේ කතන්දර ගොතන්නේ. එතකොට 12වැනි දා කථාවේ පදනමක් නැහැ. 13වැනි දා උදේ පටන් ගත්ත කැලඹිලිසහගත තත්ත්වයත් 18වැනි දා අවසන් වනවා.

18වැනි දා හවස පටන් ගත්ත මුහුදේ කැලඹිලි තත්ත්වයත් 22වැනි දා, 23වැනි දා වෙනකොට අවසන් වනවා. ජීවිත හානියක් නැතුව ඒ කැලඹිලිසහගත අවස්ථා දෙකම කෙළවර වෙනවා. නොවැම්බර් 25වැනි දා උදේ 10.00ට අවපීඩන තත්ත්වයක් ඇති වෙනවාය කියලා රජයට නිල වශයෙන් කරපු නිවේදනය තමයි මේ පිළිබඳව පුරෝකථනය කරපු පළමු අවස්ථාව. ආණ්ඩුවක් හැටියට, නැත්නම් රජයක් හැටියට අපි එතැනින් පස්සේ මොකද කළේ? 25වැනි දා උදේ 10.00ට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මේ පිළිබඳව කියනකොට ඇත්තටම ඊට පැය කිහිපයට කලින් ඒ අය අතර සාකච්ඡාවක් තිබෙන්නට ඇති නේ. මේ කාරණය අදාළ ආයතනවලට දැනුම් දෙනවා. ඒ අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය 25වැනි දා ඉඳලාම පටන් අරගෙන ආරක්ෂක අමාත්‍යාංශයේ හමුදා සම්බන්ධතා නිලධාරිට, ත්‍රිවිධ හමුදාපතිවරුන්ට, පොලිස්පතිට, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට සහ ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ට මේ බව දැනුම් දෙනවා.

ඒ වාගේම, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට සම්බන්ධ දිස්ත්‍රික්කවල සිටින සියලු නියෝජ්‍ය සහ සහකාර අධ්‍යක්ෂවරුන්ට කියනවා, දිස්ත්‍රික්කයේ රැඳී ඉන්න, වෙන කොහේවත් යන්න එපා, ආපදා තත්ත්වයක් වර්ධනය වෙනවා කියලා. ඇයි එහෙම කියන්නේ? එහෙම කියන්නේ ඒ හැම කෙනාම සෙවීමේ සහ මුදාගැනීමේ මෙහෙයුම්වලට සූදානම් වෙන්න අවශ්‍ය නිසා. 24වැනි දා සවස කැලඹිලි තත්ත්වයක් ඇවිල්ලා, 25වැනි දා රජය විසින් නිල නිවේදනයක් නිකුත් කළාම, ඒ අනුව රජයේ ආයතන සූදානම් වූ හැටි තමයි, ඒ. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිවේදනය අනුව ඒ හැම ආයතනයක්ම ඒ තත්ත්වයට මුහුණ දෙන්න සූදානම් වුණා. ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයත් ඒ අතරේ තිබෙනවා. මේ තත්ත්වයත් එක්ක නාය යෑමේ අවදානමක් එන්න පුළුවන් නිසා ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය නොවැම්බර් 26වැනි දා ඒ සියලු නිලධාරින්ට සහ දිස්ත්‍රික් ලේකම්වරුන්ට ලියුමක් යවලා පැහැදිලිව උපදෙස් දෙනවා, "නාය යෑමේ ආපදා සම්බන්ධයෙන් එම ආයතනය විසින් නිකුත් කරන ලද අනතුරු ඇඟවීමේ නිවේදනය ඔවුන් වෙත ලබා දීම අත්‍යවශ්‍ය කරුණක්. ඒ අනුව ග්‍රාමීය ආපදා කළමනාකරණ කමිටු සක්‍රිය කරමින් කඩිනමින් ජනතාවගේ ජීවිත සුරක්ෂිත කිරීමට මැදිහත් වෙන්න. එක්කෝ, ඒ නායයෑමේ අවදානමට ලක්විය හැකි තැන්වල සිටින අය හඳුනාගෙන සුරක්ෂිත මධ්‍යස්ථානවලට යොමු කරන්න නැත්නම් ඥාති නිවාස වෙත යොමු කරන්න" කියලා. ආරක්ෂක අමාත්‍යාංශය යටතේ වැඩ කරන ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය තමයි ඒ විධියට උපදෙස් දෙන්නේ. මේ නිවේදනය ආවාට පස්සේ තමයි ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වැඩ කරන්න පටන් අරගෙන තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, එතකොට ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය මොකද කරන්නේ? ඒ අය නොවැම්බර් 25වැනි දා නිවේදනයක් නිකුත් කරමින් තමන්ගේ නිලධාරින්ට මේ පිළිබඳව දැනුම් දෙනවා. ඒ අනුව මා ළඟ තිබෙනවා, දිස්ත්‍රික්ක කිහිපයක් පිළිබඳ විස්තර. රටේ දිස්ත්‍රික්ක 12ක නම්, වර්ණ කේතය කහ පැහැයෙන් සඳහන් කරමින් කියනවා විමසිලිමත් වෙන්න කියලා. ඒකෙන් කියැවෙනවා, "පසුගිය පැය 24 තුළ වර්ෂාපතනය මිලිමීටර් 75 ඉක්මවා ඇති බැවින්, වර්ෂාව තවදුරටත් පවතී නම් නාය යෑම්, බෑවුම් කඩා වැටීම්, ගස් පෙරළීම්, පස් කණ්ඩි කඩා වැටීම්, පොළොව ගිලා බැසීමේ අවදානම් පිළිබඳව විමසිලිමත් වන්න" කියලා. දිස්ත්‍රික්ක 12කට ඒ විධියට කියනවා. දිස්ත්‍රික්ක 7කට කියනවා, "පසුගිය පැය 24 තුළ වර්ෂාපතනය මිලිමීටර් 100 ඉක්මවා ඇති බැවින්, වර්ෂාව තවදුරටත් පවතී නම්, නාය යෑම්, බෑවුම් සහ කඳු කඩා වැටීම්, ගල් පෙරළීම්, පොළොව ගිලා බැසීම්, පස් කණ්ඩි කඩා වැටීම් වැනි අවදානම් පිළිබඳව අවධානයෙන් සිට අවශ්‍ය වුවහොත් ආරක්ෂාකාරී තැනකට යෑමට සූදානම් වන්න" කියලා. ඒ වෙනකොට රතු නිවේදනයක් නිකුත් කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. රතු නිවේදනයක් එන්නේ නොවැම්බර් 26වැනි දා. නුවරඑළිය දිස්ත්‍රික්කයට තමයි රතු නිවේදනයක් නිකුත් කරන්නේ. එතකොට, NBRI එකත් වැඩ කරන්න පටන් අරගෙන තිබෙන්නේ. නිවේදනය ආවාට පස්සේ රජයේ ආයතන යුහුසුලුව තමන්ගේ කාර්යය කරමින් ඉන්නවා.

ඊළඟට, Irrigation Department එක ගැන කියනවා නේ. දැන් කියන්න පටන් ගත්තා, "වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ජලාශ හිස් කරන්න තිබුණා නේ" කියලා. වාරිමාර්ග දෙපාර්තමේන්තුව මොකක්ද කළේ?

නොවැම්බර් 25වැනි දා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙන් මේ නිල නිවේදනය නිකුත් කළාට පසු, එදාම ගංවතුර සඳහා සූදානම් වීමේ පූර්ව දැනුම් දීමක් විධියට වාරිමාර්ග අධ්‍යක්ෂවරයා සියලු නිලධාරින්ට උපදෙස් ලබා දෙනවා. ඒ අනුව, ඒ අය කරන කටයුතු ප්‍රමාණයක් තිබෙනවා, ගරු සභාපතිතුමනි. ඒ වෙනකොට ජලාශවල තත්ත්වය මොකක්ද? මම ඒකත් කියන්නම්. නොවැම්බර් 15වැනි දා රාජාංගනය ජලාශය සියයට 87.08ක් පිරිලා තිබුණා; නොවැම්බර් 24වැනි දා ජලය තිබුණේ සියයට 84.6යි. නොවැම්බර් 25 වෙනකොට තිබුණේ සියයට 84.6යි. ඒ කියන්නේ මේ කාල පරිච්ඡේදය තුළ -නොවැම්බර් 24, 25, 26 වෙනකොට- රාජාංගනය ජලාශයේ අඩුම ජල ප්‍රතිශතයක් තිබුණේ. දැදුරු ඔයේ නොවැම්බර් 15වැනි දා සියයට 91.79ක ප්‍රමාණයක් තිබුණා. නොවැම්බර් 25වැනි දා වෙනකොට සියයට 81.07 තිබුණේ. මට ඉදිරිපත් කරන්න පුළුවන් ඒ තොරතුරු මෙතැන තිබෙනවා. නොවැම්බර් 25වැනි දා වෙනකොට කොත්මලේ ජල ප්‍රමාණය තිබුණේ සියයට 41යි, පොල්ගොල්ල සියයට 83යි, රන්දෙනිගල සියයට 87යි, රන්ටැඹේ සියයට 70යි. මේ විධියට ඒ දවස් කීපයේ සාමාන්‍යයෙන් ගත්තොත් අඩු ජල ප්‍රමාණයක් තමයි තිබුණේ. එතකොට ඒ නිලධාරින් ඒකට අවශ්‍ය ක්‍රියා මාර්ග ගත්තා. මේ ජලය නිදහස් කරන්නේ කොහොමද කියන තීන්දු අරගෙන ඒ අනුව කටයුතු කරමින් හිටියා.

ගරු සභාපතිතුමනි, එදා කබීර් හෂීම් මන්ත්‍රීතුමා කියපු විධියට ඉංජිනේරුමය අත්දැකීම් පැත්තක තියලා දේශපාලන අවශ්‍යතා මත ජලාශවල වාන් දොරටු අරින්නයි, වහන්නයි තීන්දු කළොත් රටකට මොකක් වෙයිද? නේද? මේ රටේ දේශපාලනයේ එහෙම කාලයක් තිබුණා නේ. ඒ විධියට ගුරු පත්වීම් දෙනවා, ළමයි ඉස්කෝලවලට ගන්නවා. රෝගීන්ට ඇඳන් අරගෙන දෙන්න දේශපාලනය මැදිහත් වෙනවා. එහෙම තිබුණු රටක් නේ, මේ වෙනස් කරමින් යන්නේ. එතකොට මේ කියන හැටියට

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

ඇමතිවරයා හරි, දේශපාලන අධිකාරිය හරි මැදිහත් වෙලා වාන් දොරටු අරින්න කිව්වොත් මොනවා වෙයිද? ඉංජිනේරුවන්ගේ අත්දැකීම්, දැනුම සියල්ල පාවිච්චි කරමින් ඒවා කළමනාකරණය කරනවා. ජලාශයෙන් ජලාශයට ඒවා කළමනාකරණය කර ගැනීම සඳහා ව්‍යුහයක් පවතිනවා.

ඇත්තටම අපේ ඉංජිනේරුවන්ගේ කාර්යභාරය ගැන කොහේවත් සාකච්ඡා වෙන්නේ නැහැ, මේ වාගේ දැවැන්ත වර්ෂාපතනයක් ඇවිල්ලාත් මේ ආකාරයට කළමනාකරණය කර ගැනීම පිළිබඳ. ඒ කියන්නේ, අවුරුද්දක් තුළ වහින වැස්සෙන් කාලක් විතර දවස් කීපයක් තුළ ආවාම. අපේ සුසිල් රණසිංහ ඇමතිතුමා මට කිව්වා, කලා ඔය ද්‍රෝණියට වැටිච්ච ජල ප්‍රමාණය කලා වැවේ තිබුණු ජල ප්‍රමාණය වාගේ දහ ගුණයක් කියලා. ඒ කලා ඔයේ ද්‍රෝණියට වැටිච්ච ප්‍රමාණය. ඒ තරම් ප්‍රමාණයක් වැටුණා. එතකොට එහෙම අවස්ථාවක, මේ වාගේ දැඩි වර්ෂාපතනයක් තිබුණු අවස්ථාව එක වේල්ලක්වත් කඩා ගන්නේ නැතිව, එක විශාල වේල්ලක් බිඳ ගන්නේ නැතිව මේ තත්ත්වය කළමනාකරණය කර ගැනීම දක්ෂතාවක් නොවෙයිද? මෙතුමන්ලා කියන විධියට වාන් දොරටු ඇරලා දැම්මා නම් මොනවා වෙයිද? කබීර් හෂීම් මන්ත්‍රීතුමා කියන හැටියට ඒවා අරින්න ඕනෑ, 13වැනි දා විතර. ඇයි? නොවැම්බර් 12වැනි දා එතුමා කොහෙන් හරි දැන ගෙන හිතා ගන්නවා, මහ සුළි කුණාටුවක් එනවා කියලා. එතුමා කියනවා, 13වැනි දාම ජලාශ ටික අරින්න කියලා. හැබැයි, 18වැනි දා ඒ කියන තත්ත්වය පහ වෙලාත් යනවා. කබීර් හෂීම් මන්ත්‍රීතුමා කියපු විධියට ජලාශ ටික ඇරියා නම් කොහොමද? නොවැම්බර් 12වැනි දා අහපු මොකක් හරි බොරුවක් මත මේගොල්ලෝ අපට කියන්නේ ජලාශවල වාන් දොරටු අරින්න ඕනෑ, වතුර නිදහස් කරන්න ඕනෑ කියලා නේ. එහෙම නේ ඔය කියන්න හදන්නේ. හැබැයි, 18වැනි දා ඒ කියපු තත්ත්වය පහ වෙලාත් යනවා. ඒ නිසා එහෙම කරන්න බැහැ ඒවා. ඒක ඉංජිනේරුමය කාර්යභාරයක්. ඒක තමයි ඉංජිනේරුවෝ කළේ. ඔබතුමන්ලා තේරුම් ගන්න ඕනෑ, මෙවැනි දැවැන්ත ආපදාවකදී ජලාශයක වේල්ලක් කඩා ගෙන ගියොත් ඇති වෙන තත්ත්වය මොකක්ද කියලා. නමුත් ඒගොල්ලෝ ඒ තත්ත්වය විද්‍යානුකූලව, හරියට කළමනාකරණය කළා.

ඊළඟට, අපේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවත් - Irrigation Department එකත් - මේ සඳහා අවශ්‍ය කටයුතු කළා. වාන් දොරටු විවෘත කිරීමේ ප්‍රමාණය වැඩි කරන්නට, ජලාශ උපරිම ජල මට්ටමට පැමිණීමට පෙර ඒකට අදාළ සියලු ආයතන දැනුවත් කරන්නට අවශ්‍ය උපදෙස් ගණනාවක් වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළා පමණක් නොවෙයි, ඒ උපදෙස් ක්‍රියාත්මක වුණා. අනපේක්ෂිත ජල ප්‍රමාණයක් ලැබීමේ ප්‍රවණතාව අනුව අධික වාන් දැමීමට ලක් වේ යැයි සහ ජල පාලනය කිරීම අපහසු වේ යැයි උපකල්පිත ජලාශවල, ජලාශයේ මුදුන් මට්ටමට අඩු කිරීමට අවශ්‍ය වන ජලාශවල යන්ත්‍ර සූත්‍ර ස්ථානගත කිරීම, වාන් දොරටු යාන්ත්‍රික ඉංජිනේරුවන් ලවා පරීක්ෂා කර ඒවායේ ක්‍රියාකාරිත්වය තහවුරු කර ගැනීම සඳහා කටයුතු කිරීම, හදිසි ආපදා අවස්ථාවලදී භාවිතයට ගන්නා වැලි කොට්ට ආදි දේවල් සූදානම් කිරීමට ඉංජිනේරුවන්ට උපදෙස් ලබා දීම ඇතුළු මේ සියලු කටයුතු කරලා තිබෙන්නේ. ඒගොල්ලන් ඒවා කළා. ඒවා තමයි වාරිමාර්ග දෙපාර්තමේන්තුව මේ නිවේදනය ආවාට පසුව කළ වැඩ කටයුතු ටික.

ඊට පසුව අපේ ත්‍රිවිධ හමුදාවේ සූදානම ගැන බලමු. මම කියන්නම්, නාවික හමුදාව මේකට සූදානම් වුණේ කොහොමද කියලා. 25වැනි දා උදේ 10.00ට මේ පණිවුඩය ලැබුණාට පස්සේ නාවික හමුදාව නාවික විධාන හතක්, නාවික කණ්ඩායම් 141ක්, නාවික භට පිරිස් 539ක් මේ වෙනුවෙන් සූදානම් කළා. කුඩා නාවික යාත්‍රා 130ක් ලෑස්ති කළා. Outboard motor boats 123ක් ලෑස්ති කළා. රථ වාහන 91ක් ලෑස්ති කළා. ජීවිතාරක්ෂක කබා 1,239ක් ලෑස්ති කළා. මේ, 25වැනි දා ඒගොල්ලන්ගේ සූදානම. 27වැනි දා විතර වෙනකොට මේ කණ්ඩායම තව වැඩි කළා. නාවික කණ්ඩායම් 224ක් ස්ථාන 159ක ස්ථානගත කළා. ඒ අය ඒ කටයුතු සිද්ධ කළා. පළමුවෙන්ම නාවික කණ්ඩායම් 141ක් ස්ථානගත කරන්න හිටියාට, ඒක 224 දක්වා වර්ධනය කළා. නාවික භට පිරිස් 539ක් ස්ථානගත කරන්න මුලින් කටයුතු කළාට, ඒක 688 දක්වා වර්ධනය කළා. මම කලින් කිව්වා වාගේ යාත්‍රා 130ක් ඒ වෙනුවෙන් වෙන් කළා. Outboard motor boats 123ක් වෙන් කළා. මේ විධියට නාවික හමුදාව තමන්ගේ කටයුතු කරමින් හිටියා. නාවික හමුදාව මේ මෙහෙයුම තුළ කොතරම් දැඩි කැපවීමකින්, පරිශ්‍රමයකින් කටයුතු කළාද කියන්න ඕනෑ තරම් උදාහරණ තිබෙනවා.

ඔබතුමන්ලා නිකම් සොයලා බලන්න, පුත්තලම-අනුරාධපුර මාර්ගයේ කලාඔය ආශ්‍රිතව හිරවෙච්ච බස් එක බේරාගන්න දරපු මහන්සිය. එතැන තිබුණු තත්ත්වයට, ඒ ජල පහරට අපට තිබුණු හොඳම නාවික යාත්‍රා දෙකක් ඔරොත්තු දුන්නෙත් නැහැ. පළමු උත්සාහයේදී බෝට්ටුවේ එන්ජිනුත් ගැලවිලා ගියා. දෙවැනි බෝට්ටුවේ ගිය නාවික භටයන් තුන්දෙනා අර වහලයට ගොඩ කරගෙන තමයි අපි ඒ පැය 24 හිටියේ. අපි ඒ 69 දෙනා බේරාගත්තා. ගුවන් හමුදාව, නාවික හමුදාව, යුද හමුදාව එකතු වෙලා කරපු ඒකාබද්ධ මෙහෙයුමක් ඒක. අවසාන කොටස පටන් ගත්තේ රාත්‍රි 12න් පස්සේ. ඒ හමුදාවල ඉන්න විශේෂම භටයන් අරගෙන ඇවිත් තමයි මධ්‍යම රාත්‍රියේ ඒ මෙහෙයුම ආරම්භ කරලා උදෑසන 5.00 විතර වෙනකොට පළමුවැනි කණ්ඩායම මුදා ගත්තේ, ගරු සභාපතිතුමනි. නාවික හමුදා භටයන් පස් දෙනෙකුගේ දිවි අහිමි වුණා, මේ මෙහෙයුම් ඇතුළතදී. නමුත් අදත් ඒ අය වැඩ. ඒ අය මුලින් සූදානම් වුණා.

ඊළඟට, ගුවන් හමුදාවේ සූදානම ගැන බලමු. ඒ අයට තිබුණු ගුවන් යානා 13ක් මේ වෙනුවෙන් වෙන් කළා. භට පිරිස් 104ක්, ඒ කියන්නේ Regimental Special Force එක හැටියට භට පිරිස් 104ක්, Disaster Assistance Response Team එක හැටියට භට පිරිස් 406ක් යෙදෙව්වා. තව 735ක් standby තිබ්බා. මෙහෙම තමයි ගුවන් හමුදාව සූදානම් වුණේ. ඒ සූදානම් වීමේ ප්‍රතිඵලයක් හැටියට තමයි 26 වැනි දා රාත්‍රියේ සිට 27 දින වැස්ස වැඩි වෙනකොට, ගංවතුර ගලනකොට, නාය යන්න පටන් ගත්තාට පස්සේ ඒ භට පිරිස් යොමු කරන්න පුළුවන්කම ලැබුණේ.

යුද හමුදාවේ 20,000කට වැඩි භටයන් ප්‍රමාණයක් ස්ථානගත කරලා තිබුණා. ඒ අය තමයි ඔය දිස්ත්‍රික්කවල ආපදා මෙහෙයුම්වල නිරතවෙලා හිටියේ. 25වැනි දා උදේ 10ට මේ අඩු පීඩන තත්ත්වය පිළිබඳ නිල වශයෙන් වාර්තා වුණාම, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, NBRI එක, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ත්‍රිවිධ හමුදාව, පොලීසිය සූදානම් වුණා. අද උදේ ඉඳන් සමහර අය කිව්වා, "මේ ගැන පණිවුඩයක් දුන්නේ නැහැ, තාක්ෂණය දියුණුයි, වට්ස්ඇප් පණිවුඩයක් එවන්න තිබුණා" කියලා. මේ පණිවුඩය ආවාට පස්සේ 25වැනි දා පැය 17.00ට කළුතර සියලු දිස්ත්‍රික් භාර නිලධාරීන් හා මූලස්ථාන පොලිස් පරීක්ෂකවරු, ස්ථානාධිපතිවරු, කොට්ඨාස භාර නිලධාරි කාර්යාලයට කැඳවා සාකච්ඡාවක් පවත්වා අනතුර සම්බන්ධයෙන් දැනුවත් කර අවස්ථානුකූලව කටයුතු කරන ලෙස පොලීසියට උපදෙස් දීලා තිබෙනවා.

පොලිස් වසම්වල මහජන ආරක්ෂක කමිටු මඟින් මහජනතාව දැනුවත් කර ඇති බව සඳහන් කර තිබෙනවා. පානදුරේ, පානදුර උතුර, අළුබෝමුල්ල, වාද්දුව, පිංවත්ත, මොරොන්තුඩුව, අඟුරුවාතොට, මිල්ලනිය, බණ්ඩාරගම, හොරණ, ඉංගිරිය පොලිස් වසම් තුළ පදිංචි මහජනතාව දැනුවත් කිරීමට කටයුතු කරලා තිබෙනවා. හෝමාගම පොලිස් කොට්ඨාසයේ පොලිස් වසම්වල පදිංචි මහජනතාව ශබ්ද විකාශ යන්ත්‍ර මඟින් දැනුවත් කරලා තිබෙනවා. දැනුවත් කරපු වේලාවත් සඳහන් කරලා තිබෙනවා. කොළඹ උතුරත් එහෙමයි. කොළඹ මධ්‍යමත් එහෙමයි. ගල්කිස්සත් එහෙමයි. රත්නපුර, කෑගල්ල, තංගල්ල, ගාල්ල,

අම්පාර, මඩකලපුව, ඒත් එහෙමයි. 25වැනි දා පොලිස් ස්ථාන දැනුවත් කරලා තිබෙනවා. මඩකලපුව පොලිස් ස්ථානය විසින් යතුරුපැදි ජංගම සංචාර මඟින් මහජනතාව දැනුවත් කරලා තිබෙනවා.

"25, 26 දිනවල සියලු පොලිස් ස්ථානවල මහජන ආරක්ෂක කමිටු හරහා මහ ජනතාව දැනුවත් කර ඇති බව දන්වා ඇත. ත්‍රිකුණාමලයේ ශබ්ද විකාශන යන්ත්‍ර මඟින් හා පූජනීය ස්ථානවල ආගමික නායකයන් මඟින් ආපදා තත්ත්වය සම්බන්ධව ජනතාව දැනුවත් කර ඇත. ධීවර ජනතාවට ධීවර කටයුතු සඳහා නොයන ලෙස දැනුවත් කර ඇත" යනුවෙන් සඳහන්ව තිබෙනවා. කන්තලේත් එහෙම කරලා තිබෙනවා.

දැන් මෙතැනදි කිව්වා නේ, ගම්පොළ ගැනත්. "2025.11.25 දින කාලගුණ වාර්තාව ලද පසු ශබ්ද විකාශන යන්ත්‍ර මඟින් මහ ජනතාව දැනුවත් කර ඇති බවට දැනුම් දී ඇත. මහවැලි ගඟ ආශ්‍රිතව පදිංචි ජනතාව වෙත අවධානයෙන් සිටින ලෙසට ග්‍රාම නිලධාරින් හා රාජ්‍ය නිලධාරින් මඟින් දැනුවත් කිරීම් සිදු කර ඇත" යනුවෙන් ද සඳහන් වෙනවා. ඒ වාගේම, දැනුවත් කිරීම් මහනුවරත් කරලා තිබෙනවා, මාතලේත් කරලා තිබෙනවා, කන්කසන්තුරේත් කරලා තිබෙනවා. පොලීසියෙන් හැම තැනකම ඒ කටයුත්ත කරලා තිබෙනවා, ගරු සභාපතිතුමනි. ඉතින් මේවා තමයි කරන්න තිබෙන්නේ. නිල වශයෙන් ආපදා නිල නිවේදනයක් ආවාට පස්සේ මේ තිබෙන රාජ්‍ය යන්ත්‍රණය රාජ්‍ය ආයතන හරහා ඒ ගැන ජනතාව දැනුවත් කරනවා. ඊට පස්සේ ග්‍රාම නිලධාරින් සහ පොලීසිය ගිහිල්ලා ගොඩක් තැන්වල ජනතාව අයින් කළා. නාය යෑමට ලක් විය හැකි යැයි කියන ස්ථානවල පදිංචි ජනතාව අරගෙන ගිහිල්ලා ආරක්ෂිත ස්ථානවල නතර කළා. ඒ අවදානම් තැන්වලින් ඉවත් කළා. සමහර තැන්වලින් ඉවත් කරපු ජනතාව පහුවැනි දා ආපහු ගෙදරට ඇවිත් තිබුණු අවස්ථාත් තිබුණා. නිල වශයෙන් පණිවුඩය ලැබුණාට පසු, අදාළ ආයතනය ඒ නිල පුරෝකථනය ඉදිරිපත් කළාට පසුව රජය කරපු දේවල් තමයි මේවා.

විපක්ෂය මේ අවස්ථා තුන පටලවාගෙන තිබෙනවා. මේක දැනුවත්ව කරපු තක්කඩිකමක්. ආයේ කතන්දර දෙකක් නැහැ. මේක මේ ආපදාව අස්සේ disaster politics කරන්න කරපු වැඩක්. මේ, පසුගිය කාල සීමාව තුළ බෙංගාල බොක්ක ආශ්‍රිතව, සමහර විට මුහුදට විතරක් බලපාන අඩු පීඩන කලාප, කැළඹිලිසහගත තත්ත්ව තුනක් පිළිබඳ එක දිගට පටලවලා වෙනත් කතන්දරයක් හදන්න කරපු උත්සාහයක්. මම හිතන්නේ නැහැ, මේවා නොදැනුවත්ව කරන්න ඇති කියලා. නමුත් ඒකෙන් කියන්න හැදුවා, නොවැම්බර් 12වැනි දා පණිවුඩය ලැබුණා, ක්‍රියාත්මක වුණේ නැහැ කියලා. මේක පට්ටපල් බොරුවක්. මම ඒ මාධ්‍ය ආයතනයට කියන්න කැමැතියි, ඔබ විසින් මේ පළ කරන ලද ඒ විකෘතිසහගත ප්‍රවෘත්තිය නිසා, ඔබ ඒක රස කර කර කියන්න අවස්ථාවක් හදපු නිසා දැන් ඒක අරගෙන සමාජයේ මහත් ආන්දෝලනයක් හදන්න හදනවා, කරුණාකර ඒක නිවැරැදි කරන්න කියලා. ඒ ආයතනයටයි මම මේ කියන්නේ, කරුණාකරලා ඒක නිවැරැදි කරන්න කියලා. දැනුත් ඒකට අවස්ථාව තිබෙනවා. මම ඒකයි කිව්වේ, සජිත් ප්‍රේමදාස හෝ ගයන්ත කරුණාතිලක හෝ අජිත් පී. පෙරේරා හෝ හර්ෂ ද සිල්වා හෝ දයාසිරි ජයසේකර හෝ ජේ.සී. අලවතුවල හෝ ඕනෑම මන්ත්‍රීවරයෙක් ඇවිල්ලා අපට ඒ ගැන කියන්න කියලා. එහෙම දෙයක් සිදු වෙනවා කියලා නොවැම්බර් 12වැනි දාට කලින් කියපු, අප ළඟ නැති නිවේදනයක් ඔබතුමන්ලාගේ ළඟ තිබෙනවා නම් ඒක ගෙනැල්ලා ඉදිරිපත් කරන්න පාර්ලිමේන්තුවට. මෙම ආපදා තත්ත්වය පාලනය කරගන්න ආණ්ඩුව හැටියට අපි කරපු දේවල්වලට අදාළ සියලු ලේඛන මම **සභාගත*** කරනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු සභාපතිතුමනි, මේක තමයි වෙච්ච වැඩේ.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා හරි. මේක ඉතිහාසයේ අප මුහුණ දීපු දැවැන්තම ආපදාවක්. අපේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේත් සීමාසහිතකම් තිබෙනවා. ඒක ඇත්ත. අපට රේඩාර්වල ප්‍රශ්නයක් තිබෙනවා. දැන් තමයි අපි ඒකක් සවි කරගෙන යන්නේ, පුත්තලම ප්‍රදේශයේ. ඒ කටයුතු අවසන් කරන්න ටික කාලයක් යාවි. අපට මේ කිසිම වාර්තාවක වර්ෂාපතනය මිලිමීටර් 200ට වඩා පුරෝකථනය කරන්න බැහැ. මිලිමීටර් 150 තමයි පුරෝකථනය කළ හැකි ගණන. ඔය මිලිමීටර් 400ක, 500ක වර්ෂාපතනයක් ගැන පුරෝකථනය කරන්න ඇත්තටම බැහැ. ඒ නිසා මේ පහසුකම් දියුණු කරන්න ඕනෑ. ඒ ප්‍රශ්නය එක පැත්තකින් තිබෙනවා.

මේ අස්සේ කරන්න හදන ඉතාම පහත් කටයුතු අපි පිළිකෙව් කරනවා. මොකද, රටක් හැටියට අපි එකතු වෙලා මේ රට ගොඩනැඟීම - rebuild කිරීම - සඳහා දැවැන්ත පරිශ්‍රමයක් දරමින් ඉන්නවා. රජය, පෞද්ගලික අංශය, මහ ජනතාව, ව්‍යාපාරික ක්ෂේත්‍රය ඇතුළු හැම පැත්තකින්ම ඒ පරිශ්‍රමය දරනවා. එහෙම කරද්දි කීපදෙනෙක් එකතු වෙලා මේ කටයුතු විනාශ කරන්න උත්සාහ කරමින් ඉන්නවා. අපේ ගරු සභානායකතුමාත් ඒ ගැන කිව්වා.

ගරු සභාපතිතුමනි, ඔබතුමාට මතකද මේ අය පළමුවෙන්ම කරපු වැඩේ මොකක්ද කියලා? ඒක තමයි වැස්ස ටිකක් වැඩි වෙන්න ගත්තු ගමන්, "වැඩ කරන්න එපා, ඔබ ගොදුරු කර ගන්නවා, ඔබ අල්ලස් කොමිසමෙන් අරගෙන යනවා" කියලා WhatsApp groups හරහා රජයේ නිලධාරින්ට පණිවුඩ යවපු එක. අල්ලස් කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල්වරයා කිව්වාය කියලා බොරු statement එකක් දැම්මා, අර රජයේ නිලධාරින් බය කරන්න. ප්‍රාදේශීය ලේකම්වරු, දිසාපතිවරු බය කරන්න මේගොල්ලෝ වෙනම campaign එකක් අරගෙන ගියා යටින්. "එහෙම වැඩ කරන්න එපා. සල්ලි වියදම් කරලා මිනිස්සුන්ට උදවු කරලා ඔයගොල්ලන්ට හිරේ යන්න වෙයි වාගේ" කථාවක් හැදුවා. ඒක අසාර්ථක වුණා. ගරු ජනාධිපතිතුමා මැදිහත් වෙලා චක්‍රලේඛ වෙනස් කරලා ජනතාවට සහන සලසන්න දෙන්න පුළුවන් සියලු දේවල් ලබා දෙන්න ඉඩ කඩ හදලා දුන්නා. ගරු සභානායකතුමා ඒක තමයි කිව්වේ. අපි එහෙම කරන්නේ මේ වාගේ ආපදාවලදී වැඩ කරලා අත් දැකීමක් අපට තිබෙන නිසා. අපි දන්නවා, ජනතාවගේ ඇත්ත ප්‍රශ්න. කලින් වැඩ කරන කොට ආණ්ඩුවක් හැටියට ඒ ගොල්ලෝ ෆේල් වුණේ කොතැනද කියලා අපි දන්නවා. ඒ නිසා ඒවාට අපි ක්ෂණික උත්තර ලබා දුන්නා.

ඒ අයගේ උත්සාහය අසාර්ථක වනකොට අද මොකද කරන්නේ? ගරු සභානායකතුමා කිව්වා හරියටම හරි. ඇත්තටම අර දිසාපතිතුමා, ප්‍රාදේශීය ලේකම්වරුන් ඇතුළු ඒ කණ්ඩායම දවස් 5ක්, 6ක් නිදි මරාගෙන ශුද්ධ කරපු පාරේ, ගල් අයින් කරලා, පස් අයින් කරලා clear කරලා දුන්න පාරේ නුවරට ගිහිල්ලා, ඒ පෙට්‍රල් ෂෙඩ්වලින් තෙල් ගහගෙන, ඒ විදුලිය භාවිත කරලා, trip එකක් ගිහිල්ලා අර රාජ්‍ය නිලධාරියා බෙල්ලෙන් හිර කරන්න හදනවා. ඒක මොන මානසිකත්වයක්ද බලන්නකෝ. ඒ අස්සේ ඒගොල්ලන්ගේ තවත් කණ්ඩායමක් ගිහිල්ලා -නගර සභාවේද කොහේද- ආධාර එකතු කරන එක වළක්වනවා. ඒ ආධාර එකතු කරන්න තිබුණු තැන ඒගොල්ලන්ගේ කාර්යාලයක්ය කියලා ඒකේ අයිතිය ඉල්ලාගෙන එක තරුණ මාධ්‍යවේදියෙකුට තර්ජනය කරලා තිබෙනවා. ඒ වාගේ සිදුවීම් කිහිපයක් වාර්තා වෙලා තිබෙනවා. ඔහු සජබයේ නගරාධිපති අපේක්ෂයා. මේවා නේ මේගොල්ලෝ කරන්නේ. ගරු ජනාධිපතිතුමා මේ ආපදාව වෙච්ච වෙලාවේම පාර්ලිමේන්තුවට ඇවිල්ලා හැමදෙනා එක්කම සාකච්ඡා කළා. පක්ෂ නායකයන් සමඟ වෙනම සාකච්ඡා කළා. තව ඕනෑ තරම් සාකච්ඡා කරන්න අපි ලෑස්තියි.

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

දැන් මේ පාර්ලිමේන්තුවේ කාලය ගත්තේ ඔය අදහස් සහ යෝජනා ඉදිරිපත් කරන්න නොවෙයි නේ. දැන් තිබෙන්නේ බිම් මට්ටමට බැහැලා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල, දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල, ගමේ ඒ යන්ත්‍රණයත් එක්ක එකතු වෙලා වැඩ කරන එක. එහෙම කරන විපක්ෂයේ මන්ත්‍රීවරුන් මේ දිනවල පාර්ලිමේන්තුවට එන්නේත් නැහැ. විපක්ෂයේ ඉන්න සමහර අයට ඕනෑ මොකක්ද? ඒගොල්ලන් බිම් මට්ටමට යන්න අවස්ථාවක් ගන්නේත් නැහැ; බිම් මට්ටමට යන්නේත් නැහැ. ඒගොල්ලන් මේ සභාවට ඇවිල්ලා කරන්නේ mediaවල තැනක් හදා ගන්න උත්සාහ කරන එකයි. ඇත්තටම මේ ඇමතිවරු, මන්ත්‍රීවරු ගිහිල්ලා බිම් මට්ටමින් වැඩ කරන්න ඕනෑ. හැබැයි, සමහර අයට ඒ මොකක්වත් නැතුව මුළු කාලයම පාර්ලිමේන්තුවේ රැස්වීම් පවත්වාගෙන යන්න වුවමනාවක් තිබුණා. ඒ, මොකටද? ජනතාවත් එක්ක ගිහිල්ලා බිම් මට්ටමින් වැඩ කරන යන්ත්‍රණයක් තිබෙනවා. ඒ අයට එතැන අවස්ථාවක් නැති වෙනකොට තමයි මේ දේවල් කරන්නේ. 12වැනි දා සම්බන්ධ කරගෙන කියන බොරුව ජනතාවට කියන්න ගිහිල්ලා දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා එතුමාගේ ගමේ ජනතාවගෙන්ම "හූ" අහපු ආකාරය දැක්කා නේ. එහෙමයි එතුමන්ලා කටයුතු කරන්නේ. අපි ඒ දේශපාලනය නතර කරමු. හොඳ හිතින් මේ රට ගොඩනඟන්න සියලුදෙනා මේ අවස්ථාවේදී එකතු වෙන්න කියන ආරාධනාව කරමින්, ඔබ හැම දෙනාටම ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

විසර්ජන පනත් කෙටුම්පත - 2026 කාරක සභා අවස්ථාවේ විවාදය කල් තැබීම, ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු සභාපතිතුමනි, "වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය සහ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යන අමාත්‍යාංශවල වැය ශීර්ෂ පිළිබඳ කාරක සභා අවස්ථාවේ විවාදය 2025 දෙසැම්බර් මස 05වන සිකුරාදා පූ.භා. 9.00 වන තෙක් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***ඊට අනුකූලව, අ.භා. 7.05ට විවාදය කල් තබන ලදී.***
***කාරක සභාව නැවත රැස්වීම 2025 දෙසැම්බර් 05 වන සිකුරාදා.***
*அதன்படி, பி.ப. 7.05க்கு விவாதம் ஒத்திவைக்கப்பட்டது.*
*குழு மீண்டும் கூடுவது 2025 டிசம்பர் 05, வெள்ளிக்கிழமை.*
*Accordingly, at 7.05 p.m., the Debate stood adjourned.*
*Committee to sit again on Friday, 05th December, 2025.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා සහ මම මේ පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කිරීම සඳහා සූදානම්. නමුත්, මම එය ඉදිරිපත් කරන්නම්.

## පරිපූරක ඇස්තමේන්තුව: "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් ආපදාවට ලක් වූ ජනතාවට සහන
## குறைநிரப்பு மதிப்பீடு: "தித்வா" புயலால் பாதிப்புற்றவர்களுக்கான நிவாரணம்
## SUPPLEMENTARY ESTIMATE: RELIEF FOR PERSONS AFFECTED BY CYCLONE "DITWAH"

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, පසුගිය දිනවල දිවයින පුරා පැවති ඉතාම අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් දැනට පැනනැඟී ඇති අනපේක්ෂිත හදිසි ආපදා තත්ත්වය නිසා අවාසනාවන්ත ලෙස බිඳ වැටී ඇති පොදු ජන ජීවිතය යථා තත්ත්වයට පත් කිරීම සඳහා ඉක්මනින් සහන සලසා දීමට හැකි වන පරිදි පරිපූරක ඇස්තමේන්තුවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අද සවස පැවති විශේෂ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණය ප්‍රකාරව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 22 (4)හි කුමක් සඳහන්ව තිබුණ ද, සභාවේ විශේෂ අවසරය ඇතිව 2025 අංක 6 දරන පරිපූරක ඇස්තමේන්තුව මම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරමි.

මෙම පරිපූරක ඇස්තමේන්තුව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ඊට අදාළ ලිපි ලේඛනවල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ට ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා. ගරු කථානායකතුමනි, භාෂාත්‍රයෙන් වූ යෝජනාව හා පරිපූරක ඇස්තමේන්තුවත්, කැබිනට් අනුමැතිය ලබා ගත් කැබිනට් පත්‍රිකාවත් මේ සමඟ **සභාගත*** කරනවා.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

***එකල්හි වේලාව අ.භා. 6.30 පසු කර තිබුණෙන් ගරු කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 7.08ට, 2025 නොවැම්බර් 13වන දින සභා සම්මතිය අනුව, 2025 දෙසැම්බර් 05වන සිකුරාදා පූ.භා. 9.00 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 6.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 7.08க்கு, பாராளுமன்றம் அதனது 2025 நவம்பர் 13ஆந் தேதிய தீர்மானத்திற்கிணங்க, 2025 டிசம்பர் 05, வெள்ளிக்கிழமை மு.ப. 9.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 6.30 p.m., THE HON. SPEAKER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 7.08 p.m. until 9.00 a.m. on Friday, 05th December, 2025, pursuant to the Resolution of Parliament of 13th November, 2025.*

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

හැන්සාඩ් වාර්තා
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.